2015.01.08 දින පවත්වනලද ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම

මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව

මහින්ද දේශප්‍රිය

මැතිවරණ කොමසාරිස්

පෙරවදන

1978 වර්ෂයේ දී හඳුන්වාදෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිවරයා තෝරා ගැනීම සඳහා ඡන්ද විමසීමක් ප්‍රථම වරට පවත්වන ලද්දේ 1982.10.20 දින දීය. ඉන් අනතුරුව පිළිවෙලින් 1988 දෙසැම්බර් 19, 1994 නොවැම්බර් 09, 1999 දෙසැම්බර් 21, 2005 නොවැම්බර් 17 දින, 2010 ජනවාරි 20 යන වර්ෂවල දී විධායක ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම පවත්වා ඇති අතර මෙම වාර්තාවට පසුබිම් වන ජනාධිපතිවරණ ඡන්ද විමසීම 2015 ජනවාරි 08 වන දින පවත්වන ලදී.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2) ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර පහකි. තුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 31 වන ව්‍යවස්ථාව අනුව සිය ප්‍රථම ධූර කාලය ආරම්භ වී වසර හතරක් ඉකුත් වීමෙන් පසු යම් අවස්ථාවක නැවත ධුර කාලයක් වෙනුවෙන් වරමක් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයාට සිය අභිලාෂය ප්‍රකාශ කිරීමට අවකාශ සැලසේ. ඒ අනුව, නැවත ධුර කාලයක් සඳහා ජනාධිපතිවරයාගේ අභිලාෂය 2014.11.20 දින ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස් විසින් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ දෙවන වගන්තිය යටතේ නාමයෝජනා භාර ගැනීම 2014.12.08 වන දින ද ඡන්ද විමසීමේ දිනය ලෙස 2015.01.08 වන දින ද ලෙස නියම කරමින් ගැසට් පත්‍රය මඟින් නියමයක් ප්‍රකාශයට පත් කරන ලදී.

ඡන්ද විමසීමක් පැවැත්වීමෙන් අනතුරුව එයට අනුශංගික සියලුම කරුණු, තොරතුරු, සටහන්, ප්‍රතිඵල සංඛ්‍යා ලේඛන ආදිය අධ්‍යයනය කර විධිමත් පරිදි සකස් කරනු ලැබූ වාර්තාවක් නිකුත් කිරීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ අනිවාර්ය කාර්යයක් වේ. ඒ අනුව ඡන්ද විමසීමක් පැවැත්වීමෙන් අනතුරුව නිකුත් කෙරෙන මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්තාව දේශපාලන පක්ෂ සහ දේශපාලන කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන සියලු දෙනාට වැදගත් වන තොරතුරු ලබා ගැනීමට මෙන්ම ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධව පර්යේෂණ, අධ්‍යයනවල නිමග්නව සිටින්නා වූ ශිෂ්‍ය ප්‍රජාවට, පර්යේෂකයන්ට හා විද්‍යාර්ථීන්ට ඔවුන්ගේ ශාස්ත්‍රීය කටයුතුවලට බෙහෙවින් උපස්ථම්භක වී ඇති බව අප වෙත ලැබෙන ප්‍රතිචාර තුළින් විද්‍යාමාන වේ. එබැවින් මෙම වාර්තාව ද ව්‍යවස්ථාපිත කරුණු, ඡන්ද විමසීම් ක්‍රියාවලිය, නීති රීති, උපමාන, විධාන, ආචාර ධර්ම, ප්‍රතිඵල හා සංඛ්‍යා සටහන්වලින් සංගෘහිතව තිබීම ඔවුන්ගේ ශාස්ත්‍රීය පහස නිවාලන්නක් වනු ඇතැයි හඟිමි.

මෙම ඡන්ද විමසීමට අදාළ කාර්යයන් හා කර්තව්‍යයන් සංවිධාන කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස මැතිවරණ කොමසාරිස් වෙත පැවරුන ද එය අත්‍යන්තයෙන් ම සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එම සියලු නිලධාරීන්ගේ අප්‍රතිහත කැපවීම හේතු කොට ගෙන මෙම ඡන්ද විමසීම් කටයුතු සාර්ථකව අවසන් කිරීමට හැකි වූ බව ප්‍රකාශ කිරීමට මම පසුබට නොවෙමි. එකී සාමූහික ක්‍රියාවලිය සඳහා මෙන්ම මෙම වාර්තාව සකස් කිරීමේදී, යූ. අමරදාස මහතා (එවකට අතිරේක මැතිවරණ කොමසාරිස් පසුව මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්), ඇතුළු මැතිවරණ දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයම මා වෙත ලබා දෙන ලද සහයෝගය හා කැපවීම බෙහෙවින් අගය කරමි. එසේම මෙම වාර්තාවේ භාෂා පරිවර්තන කටයුතු මැනවින් සිදුකළ ලංකා මැතිවරණ වෘත්තිකයන්ගේ සංසදයේ සභාපති, විශ්‍රාමික අතිරේක ලේකම් (ආරක්ෂක අමාත්‍යාංශය) එස්. මැදවැව මහතාට සහ මැතිවරණ කොමිෂන් සභාවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු පිළිබඳ උපදේශක, විශ්‍රාමික මැතිවරණ කොමසාරිස් ජනරාල් එම්.එම්. මොහමඩ් මහතාට ද බෙහෙවින් කෘතඥ වෙමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්
(2011.03.25 – 2015.11.13)

2019.08.31 දින
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාව, රාජගිරිය.

පටුන

I වන කොටස

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන 01
- ව්‍යවස්ථා ප්‍රකාශය 02
- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමය 02
- ජනාධිපතිධුර අපේක්ෂකයෙකු වීම සඳහා වූ සුදුසුකම් 02
- මැතිවරණ කොට්ඨාස 03
- ඡන්ද ප්‍රදේශ 03
- තේරීම්භාර නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම 03

II වන කොටස

- පූර්ව නාමයෝජනා වැඩපිළිවෙල 05
- වලංගු වූ ඡන්ද හිමි නාමලේඛන 05
- ඡන්ද මධ්‍යස්ථාන 06
- පිළිගත් දේශපාලන පක්ෂ 08

III වන කොටස

- නාම යෝජනා කිරීම 10
- තැන්පත් මුදල් 11
- ඇප තැන්පත් කිරීම 11
- ව්‍යවස්ථාපිත කටයුතු 12
- ඡන්ද පත්‍රිකාවේ නම් අනුපිළිවෙල 13
- ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 14

IV වන කොටස

- ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු 15
- ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම 15
- තැපෑලෙන් ඡන්දය දීම 16
- තැපැල් ඡන්දහිමියන්ගේ නාම ලේඛනය 18
- වෙනත් ඡන්ද පොළකදී ඡන්දය දීමට අවසර ලබාදීම 19

- නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා.....19
- 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත.....19
- මැකිය නොහැකි තීන්ත.....20
- ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා ඡන්ද පොළේදී අනන්‍යතා ලේඛන භාවිතා කිරීම. 20
- මියගිය හෝ විදේශගත වූ ඡන්ද හිමියන්.....21
- නිල ලකුණේ මුද්‍රාව ඡන්ද පත්‍රිකාවේ තැබීම 22
- ශාරීරික දුබලතාවෙන් පෙලෙන තැනැත්තන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් 22
- සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම 22

V වන කොටස

- කාර්ය මණ්ඩල අවශ්‍යතා 24
- ප්‍රවාහන පහසුකම් 25
- ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු 27
- දේශීය නිරීක්ෂණ සංවිධාන 27
- විදේශීය නිරීක්ෂණ සංවිධාන.....28

VI වන කොටස

- ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම.....30
- ආරක්ෂක කටයුතු.....30
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කරන ලද මාධ්‍ය උපමාන.....31
- රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීම. 32
- මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යංශය 33
- ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාල සීමාවේදී සිදුවූ ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමට අදාල සුවිශේෂී අවස්ථා.....34

VII වන කොටස

- අපේක්ෂක හිමිකම් 37
- අපේක්ෂකයන් සඳහා ගුවන් විදුලි හා රූපවාහිනී ප්‍රචාරක පහසුකම් ලබාදීම. 37
- ඡන්දදායකයන් වෙත ගාස්තුවකින් තොරව තැපෑලෙන් සංදේශයක් යැවීමට අපේක්ෂකයන්ට ඇති පහසුකම්.....37

VIII වන කොටස

- ඡන්ද විමසීම.....39
- ඡන්ද විමසීම් දිනය.....40

IX වන කොටස

- ඡන්ද පත්‍රිකා ගණන් කිරීම. 43
- ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ විය යුතු මූලික කොන්දේසි 45
- අදියර තුනක් යටතේ සිදුවන ඡන්ද ගණන් කිරීම. 45

X වන කොටස

- ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම. 47

XI වන කොටස

- ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම් 51

XII වන කොටස

- නිරීක්ෂණ සහ නිර්දේශ 53
- රාජ්‍ය සේවය 53
- තැපෑලෙන් ඡන්දය දීම සහ එවැනි වෙනත් පහසුකම් සැලසීම. 54
- නොමැකිය හැකි තීන්ත භාවිතය හා ගැටළු 55
- දේශපාලන පක්ෂ හා ස්වාධීන අපේක්ෂකයන් 56
- මැතිවරණ ප්‍රචාරණ කටයුතු 57
- දේශපාලන පක්ෂ හා අපේක්ෂක ප්‍රචර්ධනය සඳහා රජයේ දේපළ යොදා ගැනීම 58
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතය 59
- ඡන්ද විමසීම් කාලසීමාව තුළ රාජ්‍ය උත්සව පැවැත්වීම 60
- සියලු සුදුසුකම්ලත් පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය 61

XIII වන කොටස

- ඇගයීම 64

ජනාධිපතිවරණ වාර්තාවට අදාළ සංඛ්‍යා සටහන් විස්තරය

- සටහන I

  ජනාධිපතිවරණය සඳහා යොදාගත් ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ යොදාගත් ගොඩනැගිලි පිළිබඳ වර්ගීකරණය 69

- සටහන II

  ජනාධිපතිවරණයට නාමයෝජනා භාරදීම සඳහා, ඇප තැන්පත් කරන ලද අපේක්ෂකයන්ට අදාළ විස්තර 70

❖ සටහන III

නාමයෝජනා භාරදීම සඳහා අපේක්ෂකයන්ගේ පැමිණීම හා නාම යෝජනා පත්‍ර භාරදීමට අදාළ විස්තර 71

❖ සටහන IV

ජනාධිපතිවරණය වෙනුවෙන් ලැබුණු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ප්‍රමාණය හා ඒවායින් පිළිගත්, ප්‍රතික්ෂේප සංඛ්‍යාව පිළිබඳ විස්තර 72

❖ සටහන V

ජනාධිපතිවරණයට අදාළව නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත් සම්බන්ධ විස්තර 73

❖ සටහන VI

ජනාධිපතිවරණයට අදාළව ඒ ඒ දිස්ත්‍රික්ක යටතේ ඡන්දභිමි නාමලේඛනයේ නම සඳහන් එහෙත් ඡන්ද විමසීම් දිනට පෙර මියගොස් ඇති හෝ විදේශගත බවට වාර්තා වූ ඡන්ද හිමියන් සංඛ්‍යාවට අදාළ විස්තර.....74

❖ සටහන VII

එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් ඡන්ද විමසීම සඳහා යොදා ගනු ලැබූ නිලධාරි සංඛ්‍යාවට අදාළ විස්තර 75

❖ සටහන VIII

ජනාධිපතිවරණයට අදාළව ජාතික පැමිණිලි මධ්‍යස්ථානයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාවට අදාළ විස්තර 76

❖ සටහන IX

එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාව පිළිබඳ විස්තර.....77

❖ සටහන X

ජනාධිපතිවරණයට අදාලව නිකුත් කරන ලද ඡන්දභිමි නාමලේඛනයේ තොරතුරු ඇතුළත් සංයුක්ත තැටි පිළිබඳ තොරතුරු 78

❖ සටහන XI

එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ අපේක්ෂකයන් විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාවට අදාළ විස්තර 81

❖ සටහන XII

එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ එක් එක් ඡන්ද ප්‍රදේශය අනුව එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාවට අදාළ විස්තර 82

ජනාධිපතිවරණ වාර්තාවට අදාළ උපලේඛන

❖ උපලේඛන I

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3 අ) ව්‍යවස්ථාවට අනුව වැඩිදුර කාලයක් ධූරය දැරීම පිණිස ජනවරමක් ලබා ගැනීම සඳහා තම අභිලාෂය ප්‍රකාශ කරමින් ධූරය දරන ජනාධිපතිවරයා කරනු ලැබූ ප්‍රකාශයට අදාළ ගැසට් නිවේදනය 107

❖ උපලේඛන II

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය අනුව නාමයෝජනා දිනය සහ ඡන්ද විමසීම් දිනය නියම කරමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය. 108

❖ උපලේඛන III

තේරීම්භාර නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් නම්කරමින් නිකුත් කරන ලද ගැසට් පත්‍රය. 109

❖ උපලේඛන IV

තරඟකරන අපේක්ෂකයන් පිළිබඳ විස්තර සහිත ගැසට් නිවේදනය 111

❖ උපලේඛන V

ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු, ඡන්ද විමසීමට පැය 48කට පෙර අවසන් කිරීම පිළිබඳ ගැසට් නිවේදනය. 114

❖ උපලේඛන VI

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදිය යුතු මාධ්‍ය උපමාන සම්බන්ධයෙන් මාධ්‍ය ආයතන දැනුවත් කරමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය...115

❖ උපලේඛන VII

එක් අපේක්ෂකයෙකු විසින් සිදුකරන ලද ප්‍රකාශ, වෙනත් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීමට යොදා නොගතයුතු බවට වූ අතිවිශේෂ ගැසට් පත්‍රය.....118

❖ උපලේඛන VIII

රාජ්‍ය දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වමින් සියළුම රාජ්‍ය, සංස්ථා, මණ්ඩල, ත්‍රිවිධ හමුදාපතිවරුන් වෙත යවන ලද ලිපිය. 119

❖ උපලේඛන IX

ඡන්ද විමසීම් නීති උල්ලංඝණය කිරීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව.....124

❖ උපලේඛන X

දුරකථන ජාල ඔස්සේ කෙරෙන ප්‍රචාරක දැන්වීම.....126

❖ උපලේඛන XI
පක්ෂ /අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර බෙදාදීම 127

❖ උපලේඛන XII
ඡන්දය ඔබේ අයිතියයි 128

❖ උපලේඛන XIII
ඡන්දය ප්‍රකාශ කිරීමේ පිළිවෙල 129

❖ උපලේඛන XIV
සේවා නියුක්තිකයන්ට නිවාඩු ලබාදීමට අදාල නිවේදනය.....130

❖ උපලේඛන XV
2014.11.21 දින පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්සහ නිත්‍ය නියෝජිතයින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද සාකච්ඡාවේ සටහන්. 131

❖ උපලේඛන XVI
2014.12.05 දින පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්සහ නිත්‍ය නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද සාකච්ඡාවේ සටහන්. 143

❖ උපලේඛන XVII
2014.12.12 දින තරඟ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟමැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලද සාකච්ඡාවේ සටහන්.. 154

❖ උපලේඛන XVIII
2014.12.19 දින තරඟ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලද සාකච්ඡාවේ සටහන් 166

❖ උපලේඛන XIX
2014.12.26 දින තරඟ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්. 180

❖ උපලේඛන XX
ජනාධිපතිවරණය අවසන්වීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයා නිකුත් කරන නිවේදනය 194

1 වන කොටස

හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන

වර්ෂ 1978 දී සම්මත කරගන්නා ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව,1982 ඔක්තෝබර් මස 20 දින ප්‍රථම ජනාධිපතිවරණය පවත්වන ලද අතර, හත්වන ජනාධිපතිවරණය 2015 ජනවාරි මස 08 වන දින පවත්වන ලදී.

02. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ නීතිමය ප්‍රතිපාදන මත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත හා එම පනතට ගෙනෙන ලද 1988 අංක 16 හා 35 දරන සංශෝධන පනත්ද මගින් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමට අදාළ නීතිමය විධිවිධාන සලසා ඇත.

03. ***ධූරය උසුලන ජනාධිපතිවරයාගේ නිලකාලය අවසාන වීමට පෙර එක් මසකට වඩා අඩු නොවන හා දෙමසකට වඩා වැඩි නොවන කාල සීමාවක් ඇතුළතදී හෝ ජනාධිපතිවරයාගේ වත්මන් ධූර කාලයේ වසර හතර ඉක්මවූ පසු ජනාධිපතිවරයා වශයෙන් නැවත තෝරාපත් කර ගැනීම සඳහා තම අභිලාෂය මහජනතාව වෙත ප්‍රකාශ කිරීම හේතුකොටගෙන ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක් පැවැත්වීමට නීතිමය අවකාශ තිබේ.***

04. i. ***දහ අටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(2) වන අනු ව්‍යවස්ථාව ඉවත් කොට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (3අ) (අ) (i) අනු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම මගින් එකම තැනැත්තෙකුට ජනාධිපතිධූරය දැරීමේ අවස්ථා සීමාවද ඉවත් කිරීම නිසා දෙවන වරටත් ධූරය දරමින් සිටි ජනාධිපතිවරයාට නැවත ජනාධිපති ධූරයට තෝරාපත් කර ගැනීම සඳහා තරග කිරීමට අවස්ථාව ලබාගැනීමට තම ධූර කාලයෙහි වසර හතර ඉක්මවූ පසුව තම අභිලාෂය මහජනතාව වෙත ප්‍රකාශ කිරීමට අවස්ථාව සැලසුණි.***

ii. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැවත සංශෝධනය කරමින් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 2010 සැප්තැම්බර් 09 දින සම්මත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(2) අනු ව්‍යවස්ථාව ප්‍රකාර “ජනතාව විසින් දෙවරක් ජනාධිපතිවරයෙකු ලෙස තෝරාපත් කරගනු ලැබූ කිසිම තැනැත්තෙක් ඉන් පසුව එම ධුරයට ජනතාව විසින් තෝරාපත් කර ගැනීමට සුදුස්සෙක් නොවන්නේය” යන ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයෙකුට ධූරය දැරිය හැකිව තිබූ වාර දෙකෙහි සීමාව ඉවත් කරන ලදී. වාර ගණන සීමාවකින් තොරව ජනාධිපති ධූරය සඳහා තරග වැදීමට යම් තැනැත්තෙකුට නීතිමය හැකියාව ලැබිණි.18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බල පවත්වන්නේ ඉදිරියේදී පත්වන ජනාධිපතිවරයෙකුට, එනම්, 2010.09.09 දිනෙන් පසුව පත්වන ජනාධිපතිවරයෙකුට බවත්, එම අවස්ථාවේ ධූර දරන ජනාධිපතිවරයා පැරණි ව්‍යවස්ථාව ප්‍රකාර දිවුරුම් දී ඇති නිසා ඔහුට බලපවත්වනුයේ 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර පැවති නීතිමය තත්ත්වය වන බවටද,මතයක් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන දේශපාලන පක්ෂ කිහිපයක නීතිවේදීන් පිරිසක් සහ සිවිල් සංවිධාන කිහිපයක් විසින්ද ප්‍රකාශ කරන ලදී.

III. එබැවින්, ජනාධිපතිවරයා විසින් මෙම කාරණය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරමින්, 18 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් 31(2) අනු ව්‍යවස්ථාව ඉවත් කිරීමේ හා එය බලපාන ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 ව්‍යවස්ථාව ප්‍රකාර ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිමය අර්ථ නිරූපනය විමසා සිටින ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 18 වන ව්‍යවස්ථා සංශෝධනය විමර්ශනයට ලක් කිරීමෙන් පසු 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළ 2010.09.09 දින සිට එය බල පවත්වන බවත්, ඒ අනුව ධූරය දරන ජනාධිපතිවරයාටද 18 වන ව්‍යවස්ථා සංශෝධනය අදාළ වන බවටත් තීරණය කර ඇත. ඒ අනුව තුන්වන වරට ද තරග කිරීමේ අවස්ථාව එවකට සිටි ජනාධිපතිවරයාට හිමි විය.

ව්‍යවස්ථා ප්‍රකාශය

05. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 56 (2) වන වගන්තිය යටතේ 2010 ජනවාරි මස 26 දින පවත්වනු ලැබූ ජනාධිපතිවරණයෙන් තේරීපත්ව 2010 නොවැම්බර් මස 19 වන දින සිය ධූරයේ දිවුරුම් දෙන ලද ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(3අ) ව්‍යවස්ථාව අනුව වැඩිදුර කාලයක් ධූරය දැරීම පිණිස වරමක් ලබා ගැනීම සඳහා ජනතාව වෙත සිය අභිලාෂය 2014 නොවැම්බර් මස 20 දින ප්‍රකාශයට පත් කරන ලදී. 2014 නොවැම්බර් මස 20 දින අංක 1889/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ එම නිවේදනය, මෙම වාර්තාවේ පළමුවැනි උපලේඛනය ලෙස දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(2) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර හයක් වුවද ඉහත ප්‍රකාශය පළ කරනලද අවස්ථාව වනවිට ජනාධිපතිවරයා තම ධූරය දරා තිබුණේ අවුරුදු හතරකුත් දින එකක් පමණි.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ වන නියමය

06. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3අ) ව්‍යවස්ථාව අනුව, ජනාධිපතිවරයකු විසින් ඉහත සඳහන් ආකාරයේ සිය අභිලාෂය පළකිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3අ) (II) ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයකු තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයාට කෙරෙන නියමයක් වේ. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමසාරිස්වරයාට නියමවන අවස්ථාවක, ඔහු විසින් 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, ඒ නියමය පළ කරන ලද දින සිට දින දහසයකට නොඅඩු හා දින විසි එකකට නොවැඩි ***වූ කාලය තුළ*** දිනයක් අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ දිනය ලෙසද, නාමයෝජනා කිරීමේ දින සිට සති හතරකට නොඅඩු සහ සති හයකට නොවැඩි දිනයක් ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය ලෙසද නියම කරනු ලැබිය යුතු ය. ඒ අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ වූ දැන්වීම, 2014 නොවැම්බර් මස 21 දින අංක 1889/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිණි. එම ගැසට් පත්‍රය මෙම වාර්තාවේ ***දෙවැනි උපලේඛනය*** ලෙස යාකොට ඇත.

07. **ජනාධිපතිධූර අපේක්ෂකයෙකුවීම සඳහා වූ සුදුසුකම්**

ඡන්දහිමියෙකු වීමට සුදුසුකම්ලත් සෑම තැනැත්තෙක්ම,ඒ තැනැත්තා ,

(අ) වයස අවුරුදු තිස්පහ සම්පූර්ණ කර නොසිටීම,

(ආ) 91 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ ඡේද යටතේ (ඉ) (ඊ) හෝ (උ) ඡේද යටතේ ජනාධිපතිවරයෙකු ලෙස තොරා පත්කර ගැනීමට නුසුදුස්සෙකු වීම,

(ඇ) ඔහු ජනතාව විසින් ජනාධිපතිධූරයට, දෙවරක් තෝරාපත් කොට ගනුලැබ තිබීම,

(ඈ) 38 වැනි ව්‍යවස්ථාවේ 2 වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ විධිවිධාන යටතේ, ජනාධිපති ධූරයෙන් ඉවත් කරනු ලැබ සිටීම,

යන නුසුදුසුකම්වලින් කවර හෝ නුසුදුසුකමකට යටත්ව සිටි නම් මිස, ජනාධිපතිවරයා වශයෙන් තෝරාපත් කරගනු ලැබීමට සුදුස්සෙක් වන්නේය.

08. **මැතිවරණ කොට්ඨාස**-:ඡන්ද විමසීම් පැවැත්වීමේ කාර්යයන් සඳහා, ශ්‍රී ලංකාව, මැතිවරණ කොට්ඨාස විසි දෙකකට බෙදා ඇති අතර, මෙම මැතිවරණ කොට්ඨාස නිශ්චය කොට ඇත්තේ 1978 පිහිටුවන ලද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාව විසිනි. මෙම මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවේ නිර්දේශයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනූහත් වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපති විසින් පළ කරවන ලද 1981 ජනවාරි මස 15 වන දින අංක 1233 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ඇතුළත් කර ඇත. ***මෙම නියමය අනුව ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාස විසි දෙකකට (22) බෙදනු ලැබූ අතර මන්නාරම, මුලතිව් හා වවුනියාව යන පරිපාලන දිස්ත්‍රික්ක වලින් සැදුම්ලත් වන්නි මැතිවරණ කොට්ඨාසයද,***පසුකාලීනව කිලිනොච්චිය නමින් වෙනම දිස්ත්‍රික්කයක් පිහිටුවීමෙන් පසුව යාපනය සහ කිලිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක එක්කොට සැදුම්ලත් යාපනය මැතිවරණ කොට්ඨාසයද හැර අනෙකුත් සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම විශාලත්වය ඒ නමින් වූ එකී මැතිවරණ කොට්ඨාසයටම සමාන වේ. ***අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය නමින් හැඳින්වූ අතර ඉතිරි පරිපාලන දිස්ත්‍රික්ක අයත්වන මැතිවරණ කොට්ඨාස, පරිපාලන දිස්ත්‍රික්ක නාමවලින්ම හඳුන්වනු ලැබීය.*** මෙම මැතිවරණ කොට්ඨාස විසි දෙක ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම සඳහා ක්‍රියාත්මකව පවත්නා මැතිවරණ කොට්ඨාසද විය.

09. **ඡන්ද ප්‍රදේශ**-:ඡන්ද ප්‍රදේශ සහ ඡන්ද කොට්ඨාස බෙදා වෙන්කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානයන්ට අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරියා සතු වගකීමකි. 1978 සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනූ හත්වන ව්‍යවස්ථාවට අනුව 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9 වන වගන්තිය යටතේ එලෙස බෙදා වෙන්කරන ලද ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස වලට අදාළ විස්තර 1981.02.03 දින සිට 1981.02.13 දින දක්වා වූ කාලය තුළ අති විශේෂ ගැසට් පත්‍ර නවයක පළකරනු ලැබ ඇත. පසු කාලීනව ද ඡන්ද සංඛ්‍යාවේ වැඩිවීම වැනි කරුණු සැළකිල්ලට ගෙන එම ඡන්ද ප්‍රදේශ තුළ පිහිටි ඡන්ද කොට්ඨාස සංයුතියේ හා සංඛ්‍යාවේ වෙනස්කම් සිදුකරනු ලැබීය.

තේරීම්භාර නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් පත් කිරීම.

10. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 7 වන වගන්තියට අනුව කොමසාරිස්වරයා විසින් අවස්ථානුකූලව අවශ්‍ය වන පරිදි, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා ලෙස යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත්කළ යුතු අතර, ඒ තේරීම්භාර නිලධරයාගේ කාර්ය ඉටුකිරීමෙහිලා ඔහුට සහායවීම පිණිස එක් තැනැත්තකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි වේ. එලෙස පත්කරනු ලබන එක් එක් තේරීම්භාර නිලධරයාට තමාට අදාළ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද විමසීම් පැවැත්වීමේ වගකීම පැවරේ.

11. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 7 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014 නොවැම්බර් මස 21 දින ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක 1889/36 දරන ගැසට් පත්‍රයෙන්, මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් ලේකම්වරු/ දිසාපතිවරු අතුරින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා වන්නි මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා ලෙසත්, යාපනය සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් අතුරින්, යාපනය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා යාපනය

මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරි ලෙසත්, සෙසු සියලුම දිස්ත්‍රික්කවලදිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් ලෙසත් පත්කරන ලදී. එම නිවේදනය, මෙම වාර්තාවේ ***නුන්වනඋපලේඛනය*** ලෙස දක්වා ඇත.

12. ජනාධිපතිවරණයට අදාළ මූලික කටයුතු සංවිධානයේදී එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඒ ඒ තේරීම්භාර නිලධරයාට සහායවීම සඳහා 2014 නොවැම්බර් මස 21 දින අංක 1889/36 දරන ගැසට් පත්‍රය මගින්, නිලධාරින් 29 ක් නිල නාමයෙන් සහකාර තේරීම්භාර නිලධාරින් ලෙස පත්කරනු ලැබුණු අතර, 2014 දෙසැම්බර් මස 04දින අංක 1891/33 දිනැති ගැසට් පත්‍රය මගින්නි ලධාරීන් ඔවුන්ගේ නමින් ද සහකාර තේරීම්භාර නිලධරයන් ලෙස පත්කරනු ලැබිණි.

II වන කොටස

පූර්ව නාමයෝජනා වැඩපිළිවෙල

13. ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාළ දැන්වීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.11.21 දින පළ කිරීමත් සමග ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු සංවිධානය ආරම්භ කෙරිණි. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම වෙනුවෙන් වෙනත් ඡන්ද විමසීමේ කාල පරිච්ඡේදවලට වඩා අඩු කාල සීමාවක් නියම වීමද සැලකිල්ලට ගෙන,අදාළ කාර්යන් නිශ්චිත කාල රාමුවක් තුළ අවසන් කිරීමට අවශ්‍ය පූර්වෝපායන් සියල්ල ගැනීමට තේරීම්භාර නිලධාරීන්ට හා දිස්ත්‍රික් මට්ටමේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් වන නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත උපදෙස් නිකුත් කෙරිණි.

වලංගු වූ ඡන්ද හිමි නාමලේඛන

14. 2014 නොවැම්බර් මස 21දින ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම් පනතේ 2 වන වගන්තිය යටතේ වූ නියමය මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කරන ලද අවස්ථාව වන විට, 2014 වර්ෂයට අදාළ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු අවසන් කොට, ඡන්ද හිමි නාමලේඛනය 2014 ඔක්තෝබර් මස 31 වන දින සහතික කර තිබිණි. දෙවන වගන්තිය යටතේ නියමය පළකරනු ලබන දිනයේ දී ක්‍රියාත්මකව තිබුණු ඡන්ද හිමි නාමලේඛනය, ඡන්ද විමසීම සඳහා භාවිතා කළයුතු බව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 5 වන වගන්තියේ දැක්වේ. මේ පනත යටතේ ඡන්දය දීමට යම්කිසි තැනැත්තෙකුට හිමිකම් තිබේද නැද්ද යන්න පිළිබඳ තීරණාත්මක සාක්ෂි වන්නේ එම ඡන්ද හිමි නාමලේඛනය බව පනතේ 6 වගන්තියෙහි දක්වා ඇත. කිසියම් වර්ෂයක ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීම ඊළඟ වසරේ මැයි මස 31 වන දින හෝ ආසන්න දිනයක සිදුකිරීම සාමාන්‍යයෙන් සිදුවන දෙයක් වුවද 2012 වසරේ සිට අදාළ වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය එම වසර තුළ ම සකසා අවසන් කොට සහතික කෙරේ. මේ නිසා 2014 වසරේ ඡන්දහිමි නාමලේඛනයට අනුව පැවැත්වූ මෙම ජනාධිපතිවරණයේ දී, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ අලුතින් ලියාපදිංචි වූ ඡන්දදායකයන් ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයකට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ලබාදීමට හැකි විය. ඡන්ද හිමි නාමලේඛනය පරිගණක ගතකර සැකසීම, ඊට අදාළ පරිගණක පද්ධතියේ සිදු කරනු ලැබූ වැඩිදියුණු කිරීම් මෙන්ම, 2014 වර්ෂය තුළ ජාතික මට්ටමේ ඡන්ද විමසීමක් සංවිධානය කිරීමට පැවරී නොතිබීමද මෙම ඡන්ද හිමි නාමලේඛනයේ කටයුතු ඔක්තෝබර් මස 31 දින වන විට අවසන් කිරීමට බලපෑ ප්‍රධාන හේතූන් විය.

15. එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා එක් නාමලේඛනයක් වන පරිදි ඡන්ද හිමි නාමලේඛන පිළියෙළ කොට සහතික කරනු ලැබේ. වත්මන් මැතිවරණ කොට්ඨාස තුළ පැරණි මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශ , ඡන්ද ප්‍රදේශ බවට පත්වී ඇති හෙයින් ඒවාට අදාළ නාමලේඛන, වත්මන් මැතිවරණ කොට්ඨාසයේ නාමලේඛනයෙහි වෙළුම් වශයෙන් පිළියෙළ කෙරේ. ඒවා පැරණි මැතිවරණ කොට්ඨාස නැතහොත් ඡන්ද ප්‍රදේශ 160ට සමාන වන පරිදි සැකසීම සිදුකෙරේ. ඡන්ද විමසීමක කාර්යයන් සඳහා වාර්ෂික ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත් 100 – 150ක් අතර ප්‍රමාණයක් පොත් වශයෙන් සැකසීම 2012 වසර දක්වාම සිදු කෙරිණි. වාර්ෂිකව සිදුකරන ලබන ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු, මැතිවරණ කාර්යාලයීය කටයුතු හා ඡන්ද විමසීමක දී ඡන්ද පොළ කටයුතු වෙනුවෙන් ද ඡන්ද හිමි නාමලේඛනයේ පිටපත් 15ක් පමණක් සාමාන්‍ය පොත් වශයෙන් පිළියෙල කිරීම ප්‍රමාණවත් බව, 2012,2013 වර්ෂවල පැවති පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවලදී පැහැදිලි වූ කරුණකි. ඡන්ද විමසීම් අවස්ථාවක දී අනෙකුත් සියලුම අවශ්‍යතා වෙනුවෙන් සංයුක්ත තැටි වශයෙන් සකසනු ලබන නාමලේඛන භාවිතාව සුදුසු බවද තීරණය කොට, ඒ අනුව මෙම ඡන්ද විමසීමේ දී ද අවශ්‍ය නාමලේඛන පිළියෙල කරන ලදී. තැපැල් ඡන්ද කටයුතු සඳහා තේරීම්භාර නිලධාරී කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පමණක් නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කළ අතර අනෙකුත් සියලුම නාමලේඛන ප්‍රදර්ශන ස්ථානවල ඡන්ද හිමි නාමලේඛනයේ සංයුක්ත තැටි භාවිත කොට, තැපැල් ඡන්ද හිමියන්ට අවශ්‍ය ලියාපදිංචි විස්තර ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කරන ලදී. ඊට අමතරව ඡන්ද විමසීම

වෙනුවෙන් සියලුම දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද්දේද සංයුක්ත තැටි වශයෙන් සකස් කරන ලද නාමලේඛන පමණි. සංයුක්ත තැටි භාවිතය නිසා අදාළ පුද්ගලයන් වෙත තොරතුරු ලබාදීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සිදුවිය. තැපැල් ඡන්ද හිමියන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා නාමලේඛන ප්‍රදර්ශන ස්ථානවල තාවකාලික පරිගණක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමට සහ අතිරේක කාර්ය මණ්ඩල යෙදවීමට සිදුවූ අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා මැතිවරණ මහලේකම් කාර්යාලයේ විශේෂිත ඒකක පිහිටුවා දුරකථන, ෆැක්ස්, ඊමේල් පණිවිඩ මගින් ලැබෙන ඉල්ලීම් මත අවශ්‍ය තොරතුරු,රජයේ මධ්‍යම තොරතුරු කේන්ද්‍රයේ අංක 1919 දුරකථන මගින් ලබාදීමටද කටයුතු කරන ලදී. මේ අනුව නිරීක්ෂණය වූ කරුණක් වූයේ ඡන්ද විමසීමක දී ඡන්දහිමි නාමලේඛනයේ පිටපත් විශාල සංඛ්‍යාවක් පොත් වශයෙන් පිළියෙල කිරීම, ඒවා අදාළ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම හා එම ලේඛනවල ආරක්ෂාව සපයා ගැනීම වැනි කරුණු සලකා බලන විට සංයුක්ත තැටි වශයෙන් නාමලේඛන භාවිතය ඉතා පහසු කටයුත්තක් බවය.

16. ඡන්ද පොළ අවශ්‍යතා වෙනුවෙන් පිටපත් 3ක්ද, තැපැල් ඡන්ද සඳහා නාමලේඛන ප්‍රදර්ශනය වෙනුවෙන් පිටපත් 2ක්ද, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදීමේ දී භාවිතය සඳහා පිටපත් 1ක් හා කාර්යාල අවශ්‍යතා වෙනුවෙන් පිටපත් 2ක්ද, වශයෙන් පිටපත් 8ක් හා ඉදිරි ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය හා ඊට අදාළ කාර්යාල අවශ්‍යතා වෙනුවෙන් පිටපත් 7ක් ද සමග මුළු පිටපත්, 15ක් මැතිවරණ මහලේකම් කාර්යාලය විසින් ඡන්දහිමි නාමලේඛන පොත් වශයෙන් එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා පෞද්ගලික අංශය මගින් මුද්‍රණය කරවා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ඡන්දහිමි නාමලේඛන සකස් කර සහතික කිරීමෙන් පසුව ලබා දී තිබිණි. දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයන්ගේ ඉල්ලීම් සියල්ල සඳහා නාමලේඛන සංයුක්ත තැටි, මුදල් ගෙවීමේ පදනම මත ලබාදුනි. දිස්ත්‍රික් මට්ටමින් හා ඡන්ද ප්‍රදේශ මට්ටමින් සංයුක්ත තැටි ලබාගත හැකි ආකාරය පිළිබඳව සියලුම දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් දැනුවත් කරන ලදී. ඒ අනුව ඡන්ද විමසීමට අදාළව ඡන්දහිමි නාමලේඛනයේ සංයුක්ත තැටි 161ක් විවිධ දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් විසින් මිලදී ගෙන තිබූ අතර එයින් ලද ආදායම රුපියල් 985,000.00 ක් විය.

ඡන්ද මධ්‍යස්ථාන

17. ඡන්ද පොළවල යෝග්‍යතාව හා ඒවායේ පවතින පහසුකම් පිළිබඳව නිසැකවීම පිණිස ඡන්ද විමසීමක් පැවැත්වීමට ආසන්න වකවානුවේ දී, ඡන්ද පොළවල් පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. මෙම ගොඩනැගිලිවලින් සමහරක් ස්වභාවයෙන්ම නිතර පාවිච්චි කරන ඒවා නොවීම නිසා ඒවායේ අඩුපාඩු හඳුනාගෙන කල්තබා ඒවා සුදුසු පරිදි සූදානම් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. නාමයෝජනා කිරීමේ දිනයෙහි සිට සති දෙකක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් පිහිටි ස්ථාන හා ඡන්දදායිකාවන් සඳහා වෙන් කරන ලද ඡන්ද පොළක් හෝ ඡන්ද පොළවල් ඇත්නම් ඒවා පිහිටි ස්ථානයද නිශ්චය කරමින් දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළකළ යුතුවේ. ඡන්දදායිකාවන් සඳහා වෙන් කරන ලද යම් ඡන්ද පොළක් ඇත්නම් හැර, එක් ඡන්ද කොට්ඨාසයකට තිබිය හැක්කේ එක් ඡන්ද පොළක් පමණක් බව අදාළ ඡන්ද විමසීම් පනතේ 4 වන වගන්තියේ දක්වා ඇත. මේ අනුව 2014 වසරේ ඡන්ද හිමි නාමලේඛනයට අනුව ඡන්ද කොට්ඨාස 12021ක ඉහත අවශ්‍යතාව සපුරාලීම පිණිස ඡන්ද පොළවල් 12314ක් ස්ථාපිත කෙරිණි. මෙම ඡන්ද පොළවල පිහිටීම නියම කරන, පනතේ 4(1) වගන්තිය යටතේ දැන්වීම 2014 දෙසැම්බර් මස 08දින අංක 1892/9 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලදී. ඡන්දදායිකාවන් සඳහා විශේෂයෙන් වෙන්කරන ලද ඡන්ද පොළවල් 293ක්ද ඉහත ඡන්ද පොළ සංඛ්‍යාවට ඇතුළත් වේ. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(2) වගන්තියට අනුව කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරතොත් මිස, එවැනි එක් ඡන්ද කොට්ඨාසයක් ඡන්ද හිමියන් 1500කට වැඩි ගණනක් ඇතුළත් නොවිය යුතු ය. මෙම ඡන්ද විමසීමේදී එක් ඡන්ද කොට්ඨාසයක සාමාන්‍ය ඡන්දහිමියන් සංඛ්‍යාව 1251ක් විය. කෙසේ වෙතත් ඡන්ද හිමියන් 1500ට වැඩි ඡන්ද කොට්ඨාස 3202 ක් විය.

17.1 **ඡන්ද පොළක් වශයෙන් ස්ථාන තෝරාගැනීමේ දී අවධානය යොමු කෙරෙන ප්‍රධාන කරුණු පහත දැක්වේ.**

17.1.1 එක් ඡන්ද පොළක් සඳහා උපරිම ඡන්ද හිමි සංඛ්‍යාව 1500කට සීමා කිරීමට උත්සාහ කිරීම.

17.1.2 ඡන්දදායකයකු සිය ඡන්ද පොළ වෙත පයින් ගමන්කළ යුතු දුර ප්‍රමාණය හැකිතාක් අඩු වන අන්දමට ඒවා තෝරාගැනීම් සිදු කිරීම.

17.1.3 හැකිතාක් දුරට ඡන්ද කොට්ඨාසයේ මධ්‍ය ස්ථානයක ඡන්ද පොළ පිහිටුවීම.

17.1.4 රජයේ හෝ වෙනත් සුදුසු,ස්ථිර ගොඩනැගිලි හැකිතාක් දුරට ඡන්ද පොළ වෙනුවෙන් ලබා ගැනීම.

17.1.5 ඡන්ද පොළ කරා පහසුවෙන් පිවිසිය හැකි මාර්ග තිබෙන බවට නිසැක වීම.

17.1.6 ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට සුදුසු නවාතැන් පහසුකම්, ජලය, විදුලිය වැනි මූලික අවශ්‍යතා තිබෙන බවට නිසැක වීම.

17.1.7 ආබාධිත ඡන්ද හිමියන්ට ඡන්ද පොළ වෙත බාධාවකින් තොරව ලඟාවීමට පහසුකම් තිබීම.

17.1.8 අදාළ ගොඩනැගිලි ජල ගැලීම්, නායයාම් වැනි ස්වාභාවික ආපදාවන්ට ලක්වීමේ අවදානම අවම බවට නිසැක වීම.

18. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ දී, ඡන්ද කොට්ඨාස 87 ක් සඳහා ඡන්ද කොට්ඨාසය තුළින් ඡන්ද පොළවල් වශයෙන් සුදුසු ගොඩනැගිලි සොයා ගත නොහැකිවීම නිසා, ඒවා වෙනුවට තාවකාලික මඩු ඉදිකිරීමට සිදුවූ අතර, ඒ සඳහා රජයේ ඉඩම් හෝ පළාත් පාලන ආයතන සතු ඉඩම් පාවිච්චි කරන ලදි. ඒ සඳහා ද අපහසුතා ඇති වූ අවස්ථාවල දේශපාලන කටයුතු හා සම්බන්ධ නොමැති පුද්ගලයන්ට අයත් පෞද්ගලික ඉඩම්, තාවකාලික මඩු ඉදි කිරීම් සඳහා තෝරාගන්නා ලදී.

19. ඡන්ද පොළවල් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන්ගෙන් ලබාගන්නා ලද තොරතුරු මත ඡන්ද විමසීම් කාර්ය මණ්ඩල හා ඊට අදාල භාණ්ඩ ප්‍රවාහන වැඩපිළිවෙල, ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දින ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් කිරීම, ඡන්ද පොළ වෙත ළඟාවීමේ නිවැරදි ගමන් මාර්ග විස්තර සකස් කර ගැනීම අවශ්‍ය වේ. මේ සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහායද ලබා ගැනෙන අතර අවශ්‍ය අවස්ථාවල දී දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ද අදාළ පරීක්ෂා කිරීම් කර, නිවැරදි ආකාරයට ඡන්ද පොළවල් කරා යන ගමන් මාර්ග විස්තර සැකසීම සිදු කෙරේ. ඒ අනුව එක් එක් ඡන්ද පොළට ළඟාවීමට ඇති දුෂ්කරතා හා විකල්ප මාර්ගද හඳුනා ගෙන, සුදුසු වාහන ඡන්ද පොළ වෙනුවෙන් අනුයුක්ත කිරීම සිදුකරනු ඇත. මැතිවරණ කොට්ඨාසවල පිහිටා ඇති සමහර ඡන්ද පොළ කරා ඇති සම්පූර්ණ දුර වාහනයකින් ගමන් කළ නොහැකි නිසා ඒවායේ කාර්ය මණ්ඩලවලට යම් දුරක් පයින් ගමන් කිරීමටද සිදුවූ බව වාර්තා විය. උතුරු පළාතේ දූපත්වල පිහිටි ඡන්දපොළවල් වෙත නිලධාරීන් හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා හෙලිකොප්ටර් සහ ජලයාත්‍රා භාවිතා කිරීමට ද සිදුවිය. ජනාධිපතිවරණ ඡන්ද විමසීම් දිනයේදී ගංවතුර, සුළි සුළං වැනි ස්වාභාවික ආපදා ඇති නොවීම නිසා ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයට ගුවන් මගින් ඡන්ද පොළ වෙත යාමට හෝ ආපසු පැමිණීමේ අවශ්‍යතා ඇති නොවුණි. එහෙත්, ඒ සඳහා අවශ්‍ය පෙර සූදානම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ඡන්ද පොළවල් සංඛ්‍යාව සහ ඒ සඳහා යොදාගත් ගොඩනැගිලි පිළිබඳ වර්ගීකරණය ***අංක 1 සටහනෙහි*** දක්වා ඇත.

පිළිගත් දේශපාලන පක්ෂ

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(1) ව්‍යවස්ථාව අනුව, ජනාධිපතිධූරය සඳහා තෝරාපත් කර ගැනීම සඳහා සුදුසුකම් ලබා සිටින කවර හෝ පුරවැසියකුගේ නම,

20.1. පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ,

20.2. ඔහු ව්‍යවස්ථාදායකයෙහි තෝරාපත් කරගත් මන්ත්‍රීවරයකුව සිටිනම්, නැතහොත් එසේ මන්ත්‍රීවරයකුව සිටියේ නම්, වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ යම්කිසි ඡන්දහිමි නාමලේඛනයක නම ඇතුළත් ඡන්ද හිමියකු විසින් හෝ

ජනාධිපතිධුරය සඳහා යෝජනා කරනු ලැබිය හැකි ය.

21. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත යටතේ ද එලෙසම පිළිගැනේ. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ, 2 වන වගන්තිය යටතේ වූ නියමය පළ කරන ලද අවස්ථාවේදී, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තියෙන් පිළිගනු ලැබ සිටි සියලුම දේශපාලන පක්ෂ, ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ දී දේශපාලන පක්ෂ වශයෙන් පිළිගනු ලැබීමට සුදුසුකම් ලබයි. 2015.01.08 දින පැවති ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා කැඳවන ලද දිනය වන විට,ඉහත කී විධිවිධාන ප්‍රකාරව දේශපාලන පක්ෂ 64ක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගෙන තිබුණි.

22. ඒ අතුරින් පිළිගනු ලැබීම සඳහා ප්‍රතිවිරුද්ධ ඉල්ලීම් ඉදිරිපත් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂ තුනක් විය. එම දේශපාලන පක්ෂ තුන නම්, එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ, ජාතික සංවර්ධන පෙරමුණ හා ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණයි. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 07 වන වගන්තිය අනුව මෙම දේශපාලන පක්ෂ තුන, ජනාධිපතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් පිළිගනුලැබ තිබිණි. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳව මෙම ඡන්ද විමසීමේ දී පැන නැගිය හැකිව තිබූ දුෂ්කරතා නිසා ප්‍රතිවිරුද්ධ හිමිකම්පාන පාර්ශව වෙතින් කුමන පාර්ශවයක්, පිළිවෙලින් එක් එක් පක්ෂයේ එනම්,එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ, ජාතික සංවර්ධන පෙරමුණ හා ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ ලෙස පිළිගනු ලැබිය යුතු ද යන්න පරීක්ෂා කර බලා නිගමනය කිරීම පිණිස 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 10 වන වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස් විසින් පහත පරිදි ක්‍රියා කරන ලදී.

23. එක්සත් ප්‍රජාත්‍රන්ත්‍රවාදී පෙරමුණ ලෙස පිළිගනු ලැබීම සඳහා කණ්ඩායම් දෙකක් විසින් ප්‍රතිවිරුද්ධ හිමිකම් ඉදිරිපත් කරනු ලැබූ අතර, ජාතික සංවර්ධන පෙරමුණ ලෙස පිළිගනු ලැබීම සඳහාද කණ්ඩායම් දෙකක් විසින් ප්‍රතිවිරුද්ධ හිමිකම් ඉදිරිපත් කරනු ලැබීය. ඒ හැරුණු කොට, ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණ ලෙස පිළිගනු ලැබීම සඳහා කණ්ඩායම් තුනක් විසින් ප්‍රතිවිරුද්ධ හිමිකම් ඉදිරිපත් කරනු ලැබීය.

මෙම දේශපාලන පක්ෂ තුනේ ප්‍රතිවිරුද්ධ හිමිකම් පිළිබඳ නිගමනයකට එළඹීම පිණිස ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වූයේ, ඔවුනොවුන්ගේ නියෝජනයන් ඉදිරිපත් කර සිටීමට හැකිතාක් පුළුල් අවස්ථාවක් ලබාදී, ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වල පිළිතුරුවලටද සවන්දීමට ඒ සැමට ඉඩ සලසාදීමය. ප්‍රතිවිරුද්ධ හිමිකම් පාන කණ්ඩායම් ලිඛිත හා වාචික කරුණු දැක්වීම සඳහා කැඳවා තිබූ අතර, ඔවුන් අතර එකඟතා නොවූ හෙයින් පහත සඳහන් ක්‍රියා මාර්ග ගනු ලැබීය.

23.1. වාචික වශයෙන් කරුණු කියා සිටීම පිණිස ප්‍රතිවිරුද්ධ හිමිකම් පාන කණ්ඩායම් කැඳවනු ලැබීම; හා

23.2. ප්‍රතිවිරුද්ධ හිමිකම් පාන කණ්ඩායම් එකිනෙකාට මුහුණලා වාඩිවී ඔවුනොවුන්ගේ හිමිකම් පිළිබඳ සියලු විස්තර පැහැදිලි ලෙස දක්වා අනික් කණ්ඩායම් විසින් දෙන පිළිතුරුවලට සවන්දීම පිණිස ඔවුනොවුන්ට අවස්ථාවක් සලසා දෙනු ලැබීම.

24. මැතිවරණ කොමසාරිස්වරයා ඉදිරිපිට දී වාචික වශයෙන් කරුණු දක්වා අවසානයේ දී, මෙම දේශපාලන පක්ෂ තුනෙහිම ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වල සාමාජිකයන් පහත සඳහන් කරුණු පිළිගනු ලැබූහ.

24.1. ඔවුනොවුන්ගේ හිමිකම්වලට සම්පූර්ණයෙන්ම සවන් දෙනු ලැබීමට ඔවුනොවුන්ට අවස්ථාවක් ලැබුණු බව හා

24.2. ඔවුනොවුන්ගේ අදහස් උදහස් ඉදිරිපත් කර සිටීමට ඔවුනොවුන්ට හැකිවනු පිණිස විධිවිධාන සලසා තිබුණ බවට ඔවුනොවුන් සෑහීමට පත්වූ බව

24.3. ඉහත සඳහන් ක්‍රියාමාර්ගයන් පදනම් කොට ගෙන එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි ප්‍රතිවිරුද්ධ හිමිකම් පිළිබඳ පරීක්ෂණයක් 2014 නොවැම්බර් මස 27 වන දින පවත්වන ලදී. ඒ අනුව අදාළ කිසිදු පාර්ශවයක් එම පක්ෂය වශයෙන් මෙම ඡන්ද විමසීමේදී තරග කිරීම සඳහා පිළිනොගන්නා බව තීරණය කොට, ඒ පිළිබඳව අදාළ පාර්ශව දැනුම්වත් කරන ලදී.

24.4. ඉහත පරිදිම ජාතික සංවර්ධන පෙරමුණෙහි ප්‍රතිවිරුද්ධ හිමිකම් පිළිබඳ පරීක්ෂණයක් 2014 නොවැම්බර් මස 27 වන දින පවත්වා, දෙපාර්ශවයම එකඟතාවට පැමිණෙන්නේ නම්, ඒ පිළිබඳව 2014 දෙසැම්බර් 03 දිනට පෙර ලිඛිතව දැනුම් දියයුතු බව පාර්ශවයන් වෙත දන්වන ලදී. එවැන්නක් සිදු නොවීම නිසා අදාළ කිසිදු පාර්ශවයක් සඳහා පක්ෂයක්වශයෙන් මෙම ඡන්ද විමසීමේදී තරග කිරීමට පිළිනොගන්නා බව තීරණය කොට ඒ පිළිබඳවද අදාළ පාර්ශව දැනුම්වත් කරන ලදී.

24.5. ශ්‍රී ලංකා ප්‍රගතිශීලි පෙරමුණෙහි ප්‍රතිවිරුද්ධ හිමිකම් පිළිබඳ පරීක්ෂණයක් 2014 නොවැම්බර් 27 වන දින පවත්වා, පක්ෂයේ හිමිකාරීත්වය පිළිබඳව එක් පාර්ශවයක් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් පක්ෂයේ ලේකම් ධූරය සම්බන්ධයෙන් කිසිදු තීරණයක් මෙම අවස්ථාවේ ගත නොහැකි බවත්, එම පක්ෂයට මෙම ඡන්ද විමසීම සඳහා තරග කරනු ලැබීමට අවකාශ නොදීමටත් තීරණය කරන ලදී.

III වන කොටස

නාම යෝජනා කිරීම.

25. දිනය, වේලාව සහ ස්ථානය -: 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ වූ දැන්වීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014 නොවැම්බර් මස 21 වන දින අංක 1889/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඒ අනුව 2014 දෙසැම්බර් මස 08 වන දින ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ඡන්ද විමසීම වෙනුවෙන් නාමයෝජනා භාරගැනීමටත්, 2015 ජනවාරි මස 08 දින ඡන්ද විමසීම පැවැත්වීමටත් දින නියම විය. නාමයෝජනා භාරගැනීමේ දිනය සතියේ සඳුදා දිනයක් වීම නිසා ඇප තැන්පත් කිරීම වැනි කටයුතුවල දී ගැටළු ඇතිවීම සැලකිල්ලට ගෙන නාමයෝජනා භාරගැනීම 2014 දෙසැම්බර් මස 09 වන දිනට දීර්ඝ කළ හැකිව තිබුණද එදින අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය ආරම්භ වීමට නියමිතව තිබීම හා නාමයෝජනා භාරගන්නා ස්ථානය වන මැතිවරණ මහලේකම් කාර්යාලය ආසන්නයෙන් පිහිටි විදුහල් දෙකකම විභාග මධ්‍යස්ථාන පිහිටා තිබීමත් හේතුවෙන් විභාග අපේක්ෂකයන්ට විභාගයට මුහුණදීමේ අවහිරතා ඇතිවීමේ හැකියාව සැලකිල්ලට ගෙන 2014 දෙසැම්බර් මස 08 වන දින නාමයෝජනා භාරගැනීමේ දිනය ලෙස යොදා ගන්නා ලදී.

26. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 13(1) වන වගන්තියට අනුව නාමයෝජනා දින පෙරවරු 9.00ත් පෙරවරු 11.00ත් අතර කාලය තුළ නාමයෝජනා භාරගත යුතු ය. පනතේ 14(2) වගන්තියට අනුව නාමයෝජනා දින පෙරවරු 9.00ත් පෙරවරු 11.30ත් අතර, විරෝධතා ඉදිරිපත් කළ හැකි ය. මෙම විස්තරද ඇතුළත්ව අපේක්ෂකයන් වෙනුවෙන් තැන්පත්කළ යුතු ඇප මුදල් සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ඇප තැන්පත් භාර ගැනීම සඳහා නිලධරයකු පත්කර අති බවද සඳහන් කරමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014 නොවැම්බර් මස 21 දින පුවත්පත් දැන්වීමක්ද පළ කරන ලදී.

27. නාමයෝජනා භාර ගැනීමේ ස්ථානය රාජගිරිය, සරණ මාවතේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලය විය.

28. නාමයෝජනා භාර ගැනීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 16 වන වගන්තියේ සඳහන් වේ. අපේක්ෂකයන් වෙනුවෙන් ඇප මුදල් භාරදීමට සහ නාමයෝජනා භාරදීම සඳහා, රාජගිරියේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට පැමිණෙන අයට බාධාවකින් තොරව හා ආරක්ෂාව සහිතව පැමිණීමට අවශ්‍ය පහසුකම් පොලිස්පතිවරයාගේ සහාය ඇතිව යොදන ලද අතර, නාමයෝජනා භාරගන්නා ස්ථානයට අපේක්ෂකයාටද, අපේක්ෂකයාගේ නාම යෝජනාව අත්සන් කළ තැනැත්තන් හා අපේක්ෂකයා වෙනුවෙන් තවත් එක් අයකුටද පැමිණීම සඳහා අවසරපත් නිකුත්කරන ලදී. ඊට අමතරව එක් අපේක්ෂකයකු වෙනුවෙන් ආරාධිතයන් දස දෙනෙකුට පැමිණිමටද අවසරපත් නිකුත් කළ අතර ඔවුන් සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයට යාබද කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ රැස්වීම් ශාලාවේ අවශ්‍ය පහසුකම් සලසන ලදී.

29. නාමයෝජනා භාරගැනීමේ කාර්යය, ජාතික වැදගත්කමක් ඇති අවස්ථාවක් ලෙස සලකා සජීවී ලෙස විකාශනය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට අවසර ලබාදෙන ලදී. ඊට අමතරව අනෙකුත් සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත තම නියෝජිතයන් දෙදෙනකු සහභාගි කරවීමට අවස්ථාව සලසනු ලැබූ අතර, ඔවුන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමග එක්ව තම විකාශනය බාධාවකින් තොරව නාමයෝජනා කාර්යයට සමගාමීව සිදු කරන ලදී. මෙයට පෙර පැවති ඡන්ද විමසීම්වල දී රාජ්‍ය මාධ්‍ය විසින් එක් අපේක්ෂකයෙකුට විශේෂ පක්ෂපාතීත්වයක් දැක්වීම පිළිබඳ චෝදනා එල්ල වූ බැවින් එවැනි චෝදනා/ පැමිණිලි එල්ල නොවන පරිදි ක්‍රියාකළ යුතු බවට රාජ්‍ය මාධ්‍ය වෙත (හා අදාළ වන පරිදි පෞද්ගලික මාධ්‍ය වෙතද) උපදෙස් නිකුත් කරනු ලැබීය. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හරහා, ජනාධිපතිවරණයේ නාමයෝජනා භාරගන්නා අවස්ථාව, විකාශය කිරීමේ දී, සන්නිවේදන ගැටළුවක් හේතුවෙන්, එක් පෞද්ගලික නාලිකාවක විකාශනයට කෙටි වේලාවක් බාධා

එල්ලවූ බව චාර්තා වූ නමුත්, එය සිතාමතා සිදුකරන ලද ක්‍රියාවක් නොවන බව පසුව පැහැදිලි විය. එමෙන්ම, නාමයෝජනා භාරගන්නා අවස්ථාවේ දී, කිසිදු ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්කිරීමක්, තම විකාශනය අවස්ථාවේ සිදුනොකරන ලෙසට සියලුම මාධ්‍ය ආයතන වෙත දන්වා තිබුණද, එක් නාලිකාවක් එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීමට ගන්නා ලද උත්සාහයක් නිසා, එවැනි ක්‍රියාවන්ගෙන් වැලකී සිටීමට ක්‍රියාකරන ලෙසට කොමසාරිස්වරයා උපදෙස් දෙන ලදි.

නාමයෝජනා භාරගන්නා අවස්ථාවේ දී, එක් රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතනයක්, තම විකාශනයේ දී යොදාගන්නා උපසිරැසි වැකි, එක් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන ආකාරයෙන් විකාශනය කළ බව නිරීක්ෂණය වූහෙයින්, එම අනීතික ක්‍රියාව වැලැක්වීමට මැතිවරණ කොමසාරිස්වරයා උපදෙස් දෙන ලදී.

තැන්පත් මුදල්

30. ඇප තැන්පත් කිරීම සම්බන්ධව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ, 8 වන වගන්තියේ කරුණු දක්වා ඇත. ඒ අනුව නාමයෝජනා සඳහා ඇප තැන්පත් කිරීම දෙයාකාර වේ.

30.1. අපේක්ෂකයා පිළිගත් දේශපාලන පක්ෂයකින් නාමයෝජනා කරනු ලබන අවස්ථාවක වලංගු මුදලින් රුපියල් පනස් දහසක (රු. 50,000/-) මුදලක් ද,

30.2. අපේක්ෂකයා වෙනත් යම් දේශපාලන පක්ෂයක් හෝ ඡන්ද හිමියකු විසින් හෝ නාමයෝජනා කරනු ලබන අවස්ථාවක වලංගු මුදලින් රුපියල් හැත්තෑ පන් දහසක (රු.75,000/-) මුදලක්ද තැන්පත්කළ යුතු වේ.

ඇප තැන්පත් කිරීම.

31. ඇප මුදල් තැන්පත්කිරීමේ දී පිළිගත් දේශපාලන පක්ෂයක අපේක්ෂකයකුට අදාළ නම්, එම අපේක්ෂකයා සිය පක්ෂය නියෝජනය කරන බව දැක්වෙන පක්ෂ ලේකම්ගේ ලිපියක් හෝ අපේක්ෂකයා විසින් ජනාධිපතිවරණය සඳහා තරග කිරීමේ කැමැත්ත ප්‍රකාශිත ලිපියක්ද, පනතේ 8(2) (ආ) පරිදි වෙනත් යම් දේශපාලන පක්ෂයක් හෝ ඡන්ද හිමියකු විසින් අපේක්ෂකයකුගේ නම යෝජනා කරන විට, එම අපේක්ෂකයා ව්‍යවස්ථාදායකයේ තෝරාපත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයකු වන බවට හෝ ව්‍යවස්ථාදායකයේ තෝරාපත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයකුව සිටි බව සනාථ කරන පාර්ලිමේන්තු මහලේකම්ගේ අත්සන සහිත සහතිකයක්ද ඉදිරිපත් කළ යුතු වේ. අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින්, නාමයෝජනා කිරීමේ දිනයට පෙර දින, එනම් 2014 දෙසැම්බර් මස 07 දින දහවල් 12.00ට පෙර මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඇප මුදල තැන්පත් කළ යුතුව තිබුණි. නාමයෝජනා භාරගන්නා දිනය ලෙස සඳුදා දිනයක් වූ 2014 දෙසැම්බර් මස 08 වන දිනට යොදා ගැනීම නිසා, නාමයෝජනා භාරගන්නා දිනට පූර්වයෙන් වූ දිනය නිවාඩු දිනයක් වූ ඉරිදා දින වුවද ඇප තැන්පත් භාරගැනීම සිදුකරන ලදී.

32. ඇප තැන්පත් භාරගැනීම සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී ඊ.ඒ. වීරසේන මහතාත්, ඔහුගේ සහායට ගණකාධිකාරී (ප්‍රසම්පාදන) එච්.ඩබ්ලිව්.එන්. කුමාර මහතා සහ ගණකාධිකාරී (ගෙවීම්) සුජානි යසරත්න මෙනවියද පත් කරන ලදී. අපේක්ෂකයන් වෙතින් හෝ අපේක්ෂකයන් වෙනුවෙන් වෙනත් තැනැත්තන් වෙතින් හෝ ඇප මුදල් භාරගැනීම පිණිස 2014 නොවැම්බර් මස 21 දින සිට 2014 දෙසැම්බර් මස 07 දින මධ්‍යාහ්න 12.00 දක්වා වූ කාර්යාල වේලාවන් තුළ ඉහත කී නිලධාරීන් ඒ සඳහා සුදානමින් කාර්යාලයේ රැඳී සිටින ලදී. මෙම කාලසීමාව තුළ පිළිගත් දේශපාලන පක්ෂ නියෝජනය කළ අපේක්ෂකයන් 17 දෙනකු සහ වෙනත් අපේක්ෂකයන් 02 දෙනකු විසින් ඇප තැන්පත් කරන ලදී. ඇප තැන්පත් කරන ලද අපේක්ෂකයන්ට අදාළ විස්තර ***අංක 2 සටහනෙහි*** දක්වා ඇත.

33. ඇප තැන්පත් මුදල් භාරගත් වහාම, ඇප තැන්පත්කරුවන් වෙත පහත සඳහන් ලියවිලි නිකුත් කරනු ලැබිණි.

33.1. 8 වන වගන්තිය යටතේ වූ කුවිතාන්සිය

33.2. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත

33.3. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසියෙන් වූ නාමයෝජනා පත්‍ර කට්ටල 06ක්

33.4. අපේක්ෂක වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ ආකෘතිපත්‍රයක්

33.5. නාමයෝජනා කිරීමේ ස්ථානයට ඇතුල්වීම සම්බන්ධයෙන් වූ උපදෙස්

33.6. නාමයෝජනා කිරීමේ ස්ථානය වෙත ළඟාවීමට අදාළ ඇතුල්වීමේ අවසර පත්‍ර හා මෝටර් රථ අවසර පත්‍ර

ව්‍යවස්ථාපිත කටයුතු

34. පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් සම්බන්ධයෙන් නාමයෝජනා භාරගනු ලබන්නේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හෝ ඔවුන්ගේ සහකාර තේරීම්භාර නිලධාරීන් විසිනි. එහෙත් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 13(1) වගන්තිය යටතේ නාමයෝජනා භාරගැනීම මැතිවරණ කොමසාරිස්වරයාගේ වගකීමක් වේ.

35. වෙන් වෙන් වශයෙන් වන නාමයෝජනාපත්‍ර තුනකට නොවැඩි ගණනකින් අපේක්ෂකයෙකුගේ නාම යෝජනාවක් කළ හැකි අතර ඒ සෑම නාමයෝජනා පත්‍රයක්ම පනතේ පළමුවැනි උපලේඛනයේ දක්වා ඇති "අ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර පනතේ 12 වන වගන්තියේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ද වේ.

36. නාමයෝජනා භාර ගැනීම 2014 දෙසැම්බර් මස 08 වන දින පෙරවරු 9.00 සිට පෙරවරු. 11.00 දක්වා රාජගිරියේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකරන ලද අතර, නාමයෝජනා පත්‍ර පරීක්ෂා කිරීම ආදී කටයුතු සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් වන යූ. අමරදාස, ආර්.එම්.ඒ.එල්. රත්නායක සහ අතිරේක මැතිවරණ කොමසාරිස් එම්.එම්.මොහමඩ් යන මහත්වරු ද සහාය විය. අතිරේක මැතිවරණ කොමසාරිස් එම්.එම්.මොහමඩ් මහතා නාමයෝජනා භාර ගැනීම හා පසු කටයුතුවල දී දෙමළ භාෂා පරිවර්තක ලෙසද කටයුතු කරන ලදී.

37. ප්‍රථම නාමයෝජනා පත්‍රය භාරගැනීම, පෙරවරු 9.13ටත්, අවසන් නාමයෝජනා පත්‍රය භාරගැනීම පෙරවරු 10.48ටත් සිදුවූ අතර, ඒ අතර කාලය තුළ ඇප තැන්පත් කරන ලද පිළිගත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන් 17 දෙනා මෙන්ම අනෙකුත් අපේක්ෂකයන් දෙදෙනාද වශයෙන් ඇප තැන්පත් කරන ලද අපේක්ෂකයන් 19 දෙනා විසින්ම නාමයෝජනා භාරදී තිබිණි. සමහර නාමයෝජනා පත්‍ර අපේක්ෂකයන් විසින්ම භාරදෙන ලද අතර අනිකුත් ඒවා නාමයෝජනා අත්සන් කරන ලද තැනැත්තන් විසින් භාරදෙන ලදී. අපේක්ෂකයන්ගේ පැමිණිම, නාමයෝජනා පත්‍ර භාරදීම ආදී විස්තර සඳහා ***අංක 3 සටහන*** බලන්න.

38. ජනාධිපතිධුර අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතා සහ ජනාධිපතිධුර අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍ර දෙක සඳහා පෙරවරු 9.00ත් පෙරවරු 11.30ත් අතර කාලය තුළ විරෝධතා දෙකක් ඉදිරිපත් වූ අතර, ඒවා ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ නියමයන්ට අනනුකූල බැවින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම විරෝධතාවලට ඉඩ ලබා නොදෙන ලදී.

39. ඇප තැන්පත් කරන ලද සියලුම අපේක්ෂකයන් විසින් භාරදෙන ලද නාමයෝජනා පත්‍ර භාර ගැනීමේ කාල සීමාව නිමවීමෙන් පසුව නාමයෝජනා පත්‍ර පරීක්ෂා කරනු ලැබ ඒවා පනතේ 15 වන වගන්තියේ සඳහන්

නුසුදුසුකම්වලට ලක් නොවූ ඒවා බව තහවුරු කර ගැනීමෙන් පසුව සියලුම නාමයෝජනා පිළිගැනීමට මැතිවරණ කොමසාරිස්වරයා තීරණය කරන ලදී.

40. සියලුම අපේක්ෂකයන් විසින් භාරදෙන ලද නාමයෝජනා පත්‍ර පිළිගත් බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඉන් පසුව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 20 වැනි වගන්තිය යටතේ ලකුණු වෙන්කර දිය යුතු ව තිබිණි. නාමයෝජනා කරනු ලැබ සිටි අපේක්ෂකයන් අතුරින් 17 දෙනකු පිළිගත් දේශපාලන පක්ෂවලින් වීම නිසා එම අපේක්ෂකයන් සඳහා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ එම පක්ෂවලට වෙන්කර දෙනලද අනුමත ලකුණු ඔවුන් වෙත වෙන්කර දෙන ලදී. නාමයෝජනා කරන ලද අනෙකුත් අපේක්ෂකයන් දෙදෙනා තම කැමැත්ත මත ලකුණු ඉල්ලුම් කළ අතර, එකම ලකුණු සඳහා වූ ඉල්ලීම් නොවූ බැවින්, ඉල්ලා සිටින ලද ලකුණු ඔවුන් වෙත වෙන්කර දෙන ලදී.

ඡන්ද පත්‍රිකාවේ නම් අනුපිළිවෙල

41. අපේක්ෂකයන්ට අනුමත ලකුණු වෙන්කර දෙනු ලැබීමෙන් පසුව, 20 (3) වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකාවෙහි ඔවුන්ගේ නම් සඳහන් විය යුතු ආකාරය පිළිබඳ ඔවුන්ගේ කැමැත්ත පළකොට, නාමයෝජනා පත්‍රවල සඳහන් ඔවුන්ගේ නම් අතුරින් කවර නම් අත්හැරීමට සහ කවර නම් මුල් අකුරින් පමණක් දැක්වීමට ඔවුන් කැමැත්තේද යනවග ලියවිල්ලකින් දක්වන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව සියලුම අපේක්ෂකයන් තමාගේ නම ඡන්ද පත්‍රිකාවේ ඇතුළත් විය යුතු ආකාරය සම්බන්ධයෙන් ලිඛිතව තම මනාපය පළකරන ලද අතර ඔවුන් දක්වා සිටි නම්වල පෙළපත් නාමය, පෙළපත් නාමය නොමැතිවිට "ගේ" නාමය හෝ එලෙස සඳහන් නොවන අවස්ථාවල නම සැලකිල්ලට ගෙන අපේක්ෂකයින්ගේ නම් සිංහල අකාරාදි පිළිවෙලට සකස් කර ඡන්ද පත්‍රිකාවට ඇතුළත් කළ යුතු විය.

42. 2014 දෙසැම්බර් මස 08 වන දින නාමයෝජනා භාර ගැනීම අවසන් වීම හා විරෝධතා දැක්වීමේ කාල සීමාව පෙරවරු 11.30ට අවසන් වීමෙන් පසු අපේක්ෂකයන් සියලු දෙනා පහත කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීමට හා ඔවුන්ට ඡන්ද විමසීමට අදාළ ලිඛිත තොරතුරු ලබාදීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු කරන ලදී.

42.1. ඡන්ද නියෝජිත හා බලයලත් නියෝජිතයන් පත් කිරීම.

42.2. 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව, අපේක්ෂකයන් විසින් කළ යුතු ප්‍රකාශය

42.3. ඡන්ද කාර්යාල පිහිටුවීම.

42.4. තැපැල් ගාස්තුවකින් තොරව ලියාපදිංචි ඡන්ද හිමියන්ට තැපෑලෙන් නිවේදන යැවීමට ඇති පහසුකම් හා ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන අනුව අපේක්ෂකයන්ට ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින් ප්‍රචාරණ පහසුකම් ලබාදීම.

42.5. ඡන්ද විමසීම් ප්‍රචාරණ කටයුතුවලට අදාළ විධිවිධාන

42.6. ඡන්ද පොලවල, ඡන්ද විමසීම් කටයුතු ශූන්‍ය කිරීමට අදාළ නීතිමය විධිවිධාන

42.7. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කිරීමට බැඳී සිටින මහජන නියෝජිතයන් හා රාජ්‍ය සේවකයින් ඡන්ද ප්‍රචාරක කටයුතු වෙනුවෙන් රජයේ සම්පත් භාවිතයට ඉඩ නොතැබිය යුතු බවට වූ ලේඛනය.

ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම.

43. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 21 වන වගන්තිය යටතේ නාමයෝජනා කිරීමේ දිනයෙහි සිට දින දහහතරක් ඉකුත්වීමට පෙර මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කළයුතු වන ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම 2014 දෙසැම්බර් මස 08 වන දින අංක 1892/8 දරන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ සහ භාෂාත්‍රයෙන් වූ පුවත්පත්වල ද පළ කරන ලදී. එම ගැසට් නිවේදනය උපලේඛන අංක 04 ලෙස දැක්වේ. ඡන්ද විමසීම පිළිබඳ දැන්වීමට, ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ නම්, ඔවුන්ට වෙන් කළ ඡන්ද ලකුණු, ඡන්ද පත්‍රිකාවේ මුද්‍රණය කරනු ලබන අනුපිළිවෙලට අපේක්ෂක නම් ඇතුළත් කර ඇති ආකාරය ද සඳහන් විය. ඊට අමතරව ඡන්ද විමසීම් දිනය වශයෙන් 2015 ජනවාරි මස 08 වන දිනය නියම කළ බවද එම දැන්වීමේ සඳහන් කරන ලදී.

IV වන කොටස

ඡන්ද විමසීමට අදාළ මූලික කටයුතු

44. 2014 නොවැම්බර් මස 20 වන දින ජනාධිපතිවරයා විසින් තමා තෙවන ධුර කාලයක් සඳහා තෝරාපත් කර ගැනීම වෙනුවෙන් අදාළ නියමය පළ කිරීමනිසා, මැතිවරණ දෙපාර්තමේන්තුවට අනපේක්ෂිත අවස්ථාවක මෙම ජාතික මැතිවරණයට සූදානම් වීමට සිදුවිය. කෙසේ වෙතත් 2012 වසරේ සිට 2014 වසර දක්වා වූ කාලය තුළ දිවයිනේ සියලුම පළාත් ආවරණය වන පරිදි පළාත් සභා ඡන්ද විමසීම් පවත්වා තිබීම, මෙම ඡන්ද විමසීමට අදාළ කාර්ය සංවිධානය කිරීමේදී යම් පහසුවක් විය. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතින් ඡන්ද විමසීම පැවැත්වීම සඳහා ඉතා කෙටි කාලසීමාවක් නියමව තිබීම හේතුවෙන්, මූලික සංවිධාන කටයුතු යුහුසුළුව ඉටු කළයුතු විය. එම නිසා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මෙන්ම, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වහාම කොළඹට කැඳවා මූලික කටයුතු සම්බන්ධයෙන් හා ඡන්ද නීති බලාත්මක කිරීම සම්බන්ධයෙන් ගතයුතු පියවර ගැන ඔවුන්ට උපදෙස් ලබාදෙන ලදී.

45. තැපැල් දෙපාර්තමේන්තුව සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ඡන්ද විමසීම් අවස්ථාවක ආරම්භයේ සිටම මැතිවරණ දෙපාර්තමේන්තුව සමග එක්වී කටයුතු කරන ආයතන දෙකකි. ඡන්ද විමසීමක් ආරම්භයේ දී ම මැතිවරණ මහලේකම් කාර්යාලයටත්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ටත් රාජ්‍ය ආයතන සමග අප්‍රමාදව මැතිවරණ ලියවිලි හුවමාරුකර ගැනීම, ප්‍රමුඛ සේවාවක් හා ගාස්තු අය කිරීමකින් තොරව නිදහස් තැපැල් පහසුකම් යටතේ සිදු කිරීමට, තැපැල් ඡන්ද හා නිලඡන්ද දැන්වීම්පත් බෙදාහැරීම ආදී කරුණු පිළිබඳව ද විශේෂයෙන් තැපැල්පතිවරයා සමග කටයුතු කිරීමට සිදුවිය. මැතිවරණ කටයුතු වෙනුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවට දැරීමට සිදුවන වියදම් සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීම කළයුතු ආකාරය, ඒ වෙනුවෙන් වියදම් ඇස්තමේන්තු තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීම හා ඡන්ද විමසීම අවසානයේ තැපැල් දෙපාර්තමේන්තුව දරන ලද වියදම සම්බන්ධයෙන් වාර්තා ලබාගැනීම ආදී කරුණු මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපැල්පතිවරයා ඇතුළු එම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් කැඳවා දැනුම් දෙන ලදී. ඉහත සියලු කටයුතු වෙනුවෙන් තැපැල්පතිවරයා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයේ නොමද සහාය ලැබුණු බව සඳහන් කළ යුතු ය.

46. මෙම ඡන්ද විමසීම සඳහා සූදානම් වීමට තිබූ කාල සීමාව ඉතාම අවමවීම හේතුවෙන්, ඒ සඳහා අවශ්‍ය මුද්‍රණ කටයුතු සියල්ලම පාහේ ඉටු කිරීමට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම ඉමහත්ය. මේ සම්බන්ධයෙන් නාමයෝජනා දැන්වීම නිකුත් කළ වහාම, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානී හා සෙසු ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා කරන ලදී. නාමයෝජනා ලියවිලි මුද්‍රණයේ සිට ඡන්ද ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පළ කිරීම දක්වා වූ මුද්‍රණ කටයුතුවලින්, නිල ඡන්ද දැන්වීම් පත් මුද්‍රණය කිරීම හැර අනෙකුත් සියලුම මුද්‍රණ කටයුතු ඉටු කරගන්නා ලද්දේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙනි.

47. ඡන්ද විමසීම් කාලය තුළ මැතිවරණ මහලේකම් කාර්යාලයට හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට විදුලි සම්බන්ධතා නොකඩවා ලබාදීම සඳහා විදුලි බල මණ්ඩලයත්, මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල සාමාන්‍ය දුරකථන පහසුකම් හා ප්‍රතිඵල ලබාගැනීමේ කාර්යයන් සඳහා අවශ්‍ය අතිරේක දුරකථන පහසුකම් ලබාදීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයත්, ඉටුකළ යුතු කාර්යභාරය පිළිබඳ මෙකී ආයතනවල නිලධාරීන් හා මැතිවරණ කොමසාරිස්වරයා හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ විෂයභාර නිලධාරීන් සාකච්ඡා පවත්වා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම.

48. නාමයෝජනා භාර ගැනීම අවසන් වූ ඉනික්බිතිව ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. ඒ සඳහා අපේක්ෂකයන්ගේ නම් අනුපිළිවෙල හා එක් එක් අපේක්ෂකයා සඳහා වූ ඡන්ද ලකුණු ඇතුළත් ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් මුද්‍රණාලයාධිපති වෙත ලබාදෙන ලදී. ඡන්ද පත්‍රිකාවේ සෝදුපත පරීක්ෂාකර මැතිවරණ කොමසාරිස්වරයා විසින් අනුමත කළ වහාම ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදී.

වෙනත් ඡන්ද විමසීම් සමග සසඳා බලන විට දිවයින පුරා සෑම මැතිවරණ කොට්ඨාසයක් සඳහාම ඒකාකාරී ඡන්ද පත්‍රිකාවක් මුද්‍රණය කිරීම පහසුවක් වුවද, ඉතා කෙටි කාලයක් තුළ එම කාර්යය අවසන් කිරීමට සිදුවීම ගැටළු සහගත විය. ඒ හේතුවෙන් ඡන්ද පත්‍රිකා මුද්‍රණයේ දී තැපැල් ඡන්ද සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා මුලින්ම මුද්‍රණය කර ගැනීමට සිදුවිය. විවිධ බාධාවන් මධ්‍යයේ වුවද මුද්‍රණාලයාධිපතිවරයා හා ඔහුගේ කාර්ය මණ්ඩලය මුද්‍රණ කටයුතු කලට වේලාවට ඉටුකර දීම සඳහා ගනු ලැබූ උත්සාහය ප්‍රශංසනීය වේ.

49. ඡන්ද විමසීම් කාලය ඉතා කෙටි වීම නිසා තැපැල් ඡන්ද දායකයන් සඳහා ඡන්ද පත්‍රිකා සැපයීම ඉක්මන් කළයුතු විය. ඒ අනුව තැපැල් ඡන්දදායකයන් සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ප්‍රථමයෙන් මුද්‍රණය කර වීමට පියවර ගන්නා ලදී. කෙසේ වෙතත් මෙම කාර්යය අවසන් කිරීම සඳහා දින හතරක් ප්‍රමාණවත් විය. තැපැල් ඡන්ද දායකයින් සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා ප්‍රමාණයට අදාළ විස්තර, 2014.12.09 දින වන විට මැතිවරණ කොමසාරිස්වරයා විසින් මුද්‍රණාලයාධිපති වෙත ලබාදී තිබූ අතර,සියලුම මැතිවරණ කොට්ඨාස සඳහා අවශ්‍ය එම ඡන්ද පත්‍රිකා ප්‍රමාණය, 2014.12.12 දින වනවිට මුද්‍රණය කර සපයා අවසන් කෙරිණි. ඡන්දදායකයන් 15,044,490ක් සඳහාවූ මුලු ඡන්ද පත්‍රිකා ප්‍රමාණය 2014.12.24 දින වන විට සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත භාරදී අවසන් කිරීමට මුද්‍රණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

50. ඡන්ද පත්‍රිකා මුද්‍රණය අවසන් වීමෙන් පසු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඒවා පොලිස් ආරක්ෂාව යටතේ රැගෙන ගොස් සුරක්ෂිතාගාරවල තැන්පත් කර, ඡන්ද පොළ වෙත රැගෙන යන දින දක්වා විශේෂ පොලිස් කණ්ඩායමක ආරක්ෂාව යටතේ සුරක්ෂිතව තබා ගන්නා ලදී. ඉන්පසු ඡන්ද විමසීම් දිනට පෙර ඡන්ද මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ඡන්ද පත්‍රිකා සංඛ්‍යා පරීක්ෂා කොට, ඒවා පහසුවෙන් නිකුත් කළ හැකි ආකාරයට මුද්‍රා තබා සූදානම් කොට තවදුරටත් සුරක්ෂිතාගාරයේ තබාගත යුතුවිය.

තැපෑලෙන් ඡන්දය දීම.

51. තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රියාවලිය සංවිධානය කිරීම ඡන්ද විමසීමක ඉතා බැරෑරුම් කාර්යයකී. තැපැල් ඡන්ද පහසුකම් සඳහා ඉල්ලුම්පත් භාරගැනීමේ කාලසීමාව 2 වන වගන්තිය යටතේ වන නියමය පළකිරීමේ දින සිට දින 10කට සීමාවීම ඊට එක් හේතුවකි. තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඡන්ද හිමි නාමලේඛන අඩංගු සංයුක්ත තැටි දිවයිනේ ස්ථාන විශාල සංඛ්‍යාවක කඩිනමින් ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල යෙදීමටද හදිසියේ තීරණය කිරීම නිසා අදාළ කර්තව්‍ය වඩාත් අසීරු විය.

52. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 23 (2) වගන්තිය යටතේ තැපෑලෙන් ඡන්දය දීමට හිමිකම් ඇති ඡන්දදායකයන්ට දින 10ක් වැනි කෙටි කාලයක් තුළ තම අයදුම්පත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසිය යුතු වේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන කොළඹ දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම කොළඹ නාගරික ප්‍රදේශය ආවරණය කරමින් ආරක්ෂක හමුදා මූලස්ථාන හා රජයේ කාර්යාල මට්ටමින් ස්ථාන 17ක පමණ ඡන්ද හිමි නාමලේඛනයේ සංයුක්ත තැටි ප්‍රදර්ශනයට පියවර ගන්නා ලදී. ඊට අමතරව සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඡන්ද හිමි නාමලේඛනය, පොත් වශයෙන් මෙන්ම සංයුක්ත තැටි වශයෙන්ද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සියලුම දිස්ත්‍රික් කාර්යාලවල එම ලේඛන පොත් වශයෙන්ද තබා තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට පහසුකම් සලසන ලදී.

53. තවද, ශ්‍රී ලංකා තොරතුරු කේන්ද්‍රයේ විශේෂ දුරකථනය, 1919 අංකය හරහා ලැබුණු අයදුම්කරුවන්ගේ ඉල්ලීම් අනුව, තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු අදාළ අයදුම්කරුවන්ට ලබාදීමේ ක්‍රමවේදයක් අරඹන ලදී. මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක අංශ මගින්, ඊමේල් හෝ ෆැක්ස් පණිවිඩ හෝ දුරකථන හරහා කරන ලද විමසීම් වෙනුවෙන් තොරතුරු ලබාදීමේ වැඩපිළිවෙලක්ද සංවිධානය කරන ලදී. ඉහත ආකාරවලින් තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලා සිටි අයට තොරතුරු ලබා ගැනීමේ පහසුකම සම්බන්ධයෙන් සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්

මගින් මෙන්ම විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය මගින්ද තැපැල් ඡන්ද අයදුම්කරුවන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

54. තැපෑලෙන් ඡන්දයදීමේ පහසුකම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනය වූයේ 2014.11.30දින වුවද, තරග කරනු ලබන අපේක්ෂකයින්ට ද තැපෑලෙන් ඡන්දය දීමට ලබා දී ඇති අවස්ථාවද සැළකිල්ලට ගෙන, මැතිවරණ කොමසාරිවරයා විසින් තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාරගැනීමේ අවසන් දිනය නාමයෝජනා භාරගැනීමේ අවසන් දිනය වන 2014.12.08 දින දක්වා දීර්ඝ කරන ලදී. ඒ බව සියලුම අමාත්‍යාංශ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දැනුම් දෙනු ලැබූ අතර විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින්ද ප්‍රචාරය කිරීමට කටයුතු කරන ලදී.

55. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත අනුව තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලීමට අවසර නොලත් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන නිලධාරීන්ගෙන්ද ඉල්ලීම් ඉදිරිපත් වූ අතර පනතේ නියමයන් පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි විය. විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්, සෞඛ්‍ය සේවාවල නිරත කාර්ය මණ්ඩලයට සම්බන්ධ ඉල්ලීම් ඉදිරිපත් විණි. ඡන්ද විමසීම් දින විවිධ අත්‍යාවශ්‍ය සේවාවන්හි නිරත වීමට නියමිත සේවක කණ්ඩායම් සඳහා මෙවැනි පහසුකම් නොමැතිවීම ගැටළුවක් බව පෙනීගිය ද ඒ සම්බන්ධව ක්‍රියාත්මක වීමට පනතේ ප්‍රතිපාදන නොවීය. එසේම ගුවන් තොටුපළ, වරාය, විදුලිබල මණ්ඩලය, රාජ්‍ය බැංකු, අධිවේගී මාර්ග ආශ්‍රිත සේවකයන් සම්බන්ධයෙන් ද එවැනි ඉල්ලීම් ඉදිරිපත් වුවද, එම ආයතනවල සේවකයින් සඳහා තැපැල් ඡන්ද පහසුකම් සැලසීමට නම් අදාළ මැතිවරණ නීතිය සංශෝධනය විම අත්‍යාවශ්‍ය වේ.

56. තැපැල් ඡන්ද පහසුකම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ සමහර ඡන්ද හිමියන්, තමාගේ නමට සමාන නම් ඇති පුද්ගලයන්ගේ නම්වලට අදාළව තැපැල් ඡන්ද පහසුකම් ලබා ගන්නා බව හෙළිවූ අතර, එවැනි අවස්ථා අධිකරණය වෙත යොමුකිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අයදුම්කරුවන් දැනුවත් කරන ලදී. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර ලද එවැනි පැමිණිලි සලකා, අදාළ ඉල්ලුම්කරුවන් වෙත තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් නොකොට, නිවැරදි පුද්ගලයින්ට තැපැල් ඡන්ද පහසුකම් ලබාදීමට පියවර ගන්නා ලදී. ආරක්ෂක අංශවල සේවා අනු කණ්ඩ වෙනස්වීම් මත,විවිධ සහතික කිරීමේ නිලධාරීන් මගින් අයදුම්පත් එකකට වඩා අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කළ අවස්ථාද විය. එක් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවද අනෙක් අයදුම්පත හෝ සලකා බලනු ඇතැයි අපේක්ෂාවෙන් අයදුම්පත් එකකට වඩා යොමුකරනු ලැබීම නිසාද අතිරේක ඉල්ලුම්පත් තැපැල් ඡන්ද කටයුතු සංවිධානයේ දී ගැටළුවක් විය.

57. තැපැල් ඡන්ද පහසුකම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ව ඇත්තේ ඊට අදාල සහතික කිරීමේ නිලධාරීන් මාර්ගයෙනි. සහතික කිරීමේ නිලධාරීන් යනු දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානීන් හෝ ඔවුන් විසින් යම්කිසි ඒකකයක සේවය කරන නිලධාරීන් වෙනුවෙන් පත්කරනු ලබන ඒකක ප්‍රධානීන් වේ. ස්වකීය සහතික කිරීමේ නිලධාරීන්ගේ නම් සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ඉදිරිපත් කරන මෙන්, තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබා සිටි සේවකයන් සේවය කරනු ලබන සියලුම අමාත්‍යාංශවල ලේකම්වරුන්, දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සභාපතිවරුන් දැනුම්වත් කරන ලදී.

58. තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාරගැනීම අවසන් වූ 2014.12.08 වන දින වනවිට එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලැබුණු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ප්‍රමාණය හා ඒවායින් පිළිගත් හා ප්‍රතික්ෂේප ඉල්ලුම්පත් සංඛ්‍යාව අංක ***IV සටහනෙහි*** දක්වා ඇති අතර මුළු පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව 541,452 ක් විය.

59. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් අයදුම්පත් තේරීම්භාර නිලධාරීන් වෙත යොමුකිරීම පමණක් නොව, තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂණ පැකැට්ටු භාරගැනීම හා ආරක්ෂිතව තබා ගැනීමත්, තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් පසු ඒවා තේරීම්භාර නිලධාරී වෙත යොමුකිරීමත් කළ යුතු විය. තැපැල් ඡන්ද

සහතික කිරීමේ නිලධාරීන් වෙත පැවරී ඇති මෙම කාර්යයන්හි භාරදූර බව සලකා, ඔවුන් පුහුණු කිරීම, ඒ ඒ මැතිවරණ කොට්ඨාසවල තේරීම්භාර නිලධාරීගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදී.

තැපැල් ඡන්දහිමියන්ගේ නාම ලේඛනය

60. තැපැල් ඡන්ද ඉල්ලුම්පත් භාරගෙන අවසන් වීමෙන් පසුව තැපැල් ඡන්ද නාමලේඛනය පිළියෙල කොට සහතික කිරීමෙන් පසුව එම ලේඛනසංයුක්ත තැටිවශයෙන් සකසා සියලුම අපේක්ෂකයන්ට නොමිලයේ ලබාදීමට කටයුතු කරන ලදී. තැපැල් ඡන්ද නිකුත් කිරීම පිළිබඳ දැන්වීම, තරග කරනු ලබන සියලු අපේක්ෂකයන්ගේ බලයලත් නියෝජිතයන් වෙත තේරීම්භාර නිලධාරීන් විසින් යැවිය යුතු ය. ඒ අනුව තැපැල් ඡන්ද නිකුත් කිරීම 2014.12.15 දින සිදුකරන බව හා තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ එක් කාණ්ඩයකට එක් නියෝජිතයකු බැගින් පත් කර එවන ලෙස සියලුම අපේක්ෂකයන්ගේ බලයලත් නියෝජිතයන් වෙත දන්වා යැවීමට තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. ඒ අනුව තැපැල් ඡන්ද නිකුත් කිරීම සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී 2014.12.15 දින සිදුකරන ලද අතර, අදාළ රක්ෂණ පැකැට්ටු අප්‍රමාදව සියලුම සහතික කිරීමේ නිලධාරීන් වෙත යොමු කිරීම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගන්නා ලදී. තැපැල් ඡන්ද නිකුත් කිරීමේ දී මෙන්ම, සලකුණු කිරීමේ දී දූෂණ සිදුවිය හැකි බවට හා සලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා සුරක්ෂිත නොමැති බවට දේශපාලන ක්‍රියාකාරීන් හා ස්වාධීන විචාරකයන් විසින් ඉදිරිපත් කර තිබූ චෝදනා ඒ පිළිබඳ අහේතුක බිය තුරන් කිරීම සඳහා 2013/ 2014 වර්ෂවල, පළාත් සභා ඡන්ද විමසීම්වල දී හඳුන්වාදුන් විශේෂ ආරක්ෂක ක්‍රමවේද වඩාත් වැඩිදියුණු කර, මෙම ඡන්ද විමසීමේ දී ද තැපැල් ඡන්ද සහතික කිරීමේ කාර්යාලවල දී භාවිතා කරනු ලැබිණි.

61. සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල දී තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.12.23 සහ 24 යන දෙදින වෙන් කරන ලදී. එම දෙදින තුළ තැපැල් ඡන්ද සලකුණු කළ නොහැකිවූ ඡන්ද හිමියන්ට අදාළ වූ පැකැට්ටු අවසන් දිනට පසුදින (2014.12.25) දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත රැගෙනවිත් භාරදීමට සහතික කිරීමේ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන ස්ථාන භාර සහතික කිරීමේ නිලධාරීන්,තම කාර්යාලවල ඡන්ද පත්‍රිකා සලකුණු කරන අවස්ථාව නිරීක්ෂණය කිරීම සඳහා ද එක් නියෝජිතයකු බැගින් පත්කර එවන ලෙස තරග වදින අපේක්ෂකයන්ගේ දිස්ත්‍රික් බලයලත් නියෝජිතයන් වෙත දැනුම්දිය යුතු බවට උපදෙස් ලබාදුනි. තැපැල් ඡන්ද සලකුණු කරන අවස්ථාව නිරීක්ෂණය සඳහා තේරීම්භාර නිලධාරීගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද සහභාගි කරවන ලදී. ඊට අමතරව සහතික කිරීමේ නිලධාරී කාර්යාල ආවරණය වන පරිදි ***පොලිස්*** ආරක්ෂාව යෙදීමටද පොලිස්පති මගින් සියලුම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දැනුවත් කරන ලදී. කෙසේ වෙතත් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දෙදින තුළ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල ඊට අදාළ කිසිදු විශේෂිත සිද්ධි කිසිවක් වාර්තා නොවිය.

62. 2014.12.23 හා 24 යන දෙදින අදාළ තැපැල් ඡන්දදායකයින් විසින් භාවිත නොකරන ලද තැපැල් ඡන්ද පැකැට්ටු, 2014.12.24 දින අදාළ කටයුතු නිරීක්ෂණය සඳහා යොදවා තිබූ සහකාර තේරීම්භාර නිලධාරීන් මගින් සහතික කිරීමේ නිලධාරී කාර්යාලවලින් ආපසු ලබාගෙන තේරීම්භාර නිලධාරීන් භාරයට ගැනුණි. එලෙස භාරගැනීමට නොහැකි වූ සහතික කිරීමේ නිලධාරීන් වෙත වූ පැකැට්ටු, ඔවුන් විසින්ම ඊට පසුදින තේරීම්භාර නිලධාරී වෙත රැගෙනවිත් භාරදෙන ලදී. ඒ අනුව එලෙස ආපසු භාරගත් තැපැල් ඡන්ද පැකැට්ටුවලට අදාළ තැපැල් ඡන්දදායකයින්ට සිය තැපැල් ඡන්දය පාවිච්චි කිරීම සඳහා තවත් අවස්ථාවක් සැලසිය යුතුව තිබූ බැවින්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඒවා සලකුණු කිරීමේ දිනය ලෙස, 2014.12.30 දිනය යොදා ගැණුනි. තැපැල් ඡන්දදායකයින්, එදින දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවලට පැමිණ ඡන්දය සලකුණු කිරීම කළ යුතු විය. කෙසේ වෙතත් මෙහිදී මතු වූ ප්‍රායෝගික ගැටළු ද සලකා බලා, තැපැල් ඡන්දය සලකුණු කිරීම සඳහා2015.01.03 සහ 2015.01.06 යන දෙදිනද වෙන්කර දීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු කරන ලදී.

වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීමට අවසර ලබාදීම

63. 1988 අංක 16 දරන සංශෝධන පනත මගින් ගෙන එනු ලැබූ 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය අනුව, තමාට නියමිත ඡන්ද පොළේ දී ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියකුට තම ඡන්දය වෙනත් ඡන්ද පොළක දී පාවිච්චි කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. එම ඉල්ලීම නාමයෝජනා දැන්වීමෙන් පසුව සතියක් ඉකුත්වීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

64. පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම මෙවරද මෙම පහසුකම සලසන ලද්දේ උතුරු නැගෙනහිර ප්‍රදේශයේ, පිහිටි තම ඡන්ද පොළ වෙතට යාමට සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන් වෙත ය. මෙවැනි ඉල්ලීමක්, නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත්කරන ලද 2014.11.21 දින සිට සතියක් තුළ,එනම් 2014.11.27 දින හෝ එයට පෙර ලැබෙන ලෙස අදාළ තේරීම්භාර නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු විය. මේ සම්බන්ධයෙන් ඡන්දදායකයන් දැනුවත් වීම ආදී අවශ්‍යතා සැලකිල්ලට ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම කාලය 2014.11.30 දින දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත් අදාළ කාලසීමාව තුළ කිසිඳු ඉල්ලුම්පතක් මැතිවරණ මහලේකම් කාර්යාලයට හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට නොලද බවට වාර්තා විය.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා

65. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 24 වන වගන්තිය අනුව තැපෑලෙන් ඡන්දය දීමට හෝ වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීමට අවසර ලබාගෙන ඇති ඡන්දදායකයන්ට හැර අනෙකුත් සියලුම ඡන්ද හිමියන් වෙත නිල ඡන්ද දැන්වීම් පතක් යැවිය යුතුය. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක ඡන්ද විමසීම් දිනය සහ වේලාව මෙන්ම ඡන්ද හිමියාට වෙන්කර ඇති ඡන්ද පොළට අදාළ විස්තරද අඩංගු වේ. මෙම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්ද හිමියකුට ඡන්ද විමසීම් දිනට දින 07කටවත් පෙර ලැබෙන සේ තැපැල් මගින් යැවිය යුතු වේ. එම කාලය තුළ කුමන හේතුවක් මත හෝ නිල ඡන්ද දැන්වීම්පත් නොලැබුණු ඡන්ද හිමියන්, තමාට නියමිත තැපැල් කාර්යාලය වෙත ගොස් තම අනන්‍යතාව සනාථ කර ඒවා භාරගැනීමට කටයුතු කළ යුතු වේ.

66. ඡන්ද හිමි නාමලේඛනය පරිගණක ගත කිරීම නිසා නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාද පරිගණක දත්ත භාවිතයෙන් මුද්‍රණය කිරීමට වර්තමානයේ පහසුකම් සැලසී ඇත. එසේම සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඡන්දදායකයාට අදාළ වන පරිදි ඒවා මුද්‍රණය කිරීමටද කටයුතු කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා මුද්‍රණය පෞද්ගලික අංශය මගින් සිදු කෙරෙන අතර, ඒ අනුව මිල ගණන් කැඳවා සුදුසු ආයතන වලට එම කටයුත්ත භාරදෙන ලදි. එක් එක් මැතිවරණ කොට්ඨාස අනුව ඡන්ද හිමියන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංක, තැපැල් ලිපින හා ඡන්ද පොළවල විස්තර ඇතුළත් කොට සකස් කරන ලද නිලඡන්ද දැන්වීම්පත්වල ආදර්ශ තේරීම්භාර නිලධාරීන්ගෙන් ලද පසු, මැතිවරණ මහලේකම් කාර්යාලය විසින් සුදුසුකම්ලත් මුද්‍රණ ආයතන වෙතින් ඒවා මුද්‍රණය කරවා, ඡන්දදායකයන් වෙත බෙදා හැරීම සඳහා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත භාරදෙන ලදී. මේවා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ලද පසු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී ඒවායේ නිවැරදිතාව පරීක්ෂා කිරීමත්, මියගිය හෝ විදේශගත වූ හෝ අයට හා තැපැල් ඡන්දදායකයන්ට අයත් නිල ඡන්ද දැන්වීම්පත් හඳුනා ගැනීම සඳහා ඊට අදාළ රබර් මුද්‍රා එම නිල ඡන්ද දැන්වීම්පත් මත තැබීමද සිදුකොට ඒවා ඡන්දහිමියන් වෙත බෙදා හැරීම සඳහා ප්‍රාදේශීය තැපැල් අධිකාරීන් වෙත භාරදීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව ජනාධිපතිවරණයට අදාළව නිල ඡන්ද දැන්වීම්පත් තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදීම 2014.12.20 දින සිදුකරන ලෙස හා විශේෂ බෙදා හැරීම 2014.12.28 දිනට සිදුකරන ලෙසද තවදුරටත් නියම කරන ලදී.

2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

67. 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ සුදුසුකම්ලත් දරුවන්ට,එසේ අවතැන් වීමට පෙර ඔවුන්ගේ

ස්ථිර වාසස්ථාන පිහිටි මැතිවරණ කොට්ඨාසවල දී ස්වකීය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව ඇති කරන ලදී. ඒ අනුව අදාළ අයට 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීමෙන් පසුව ඒ සඳහා පනතින් නියම වූ පරිදි පරිපූරක නාමලේඛනයෙහි ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමටසතියක කාලයක් ලබාදෙන ලදී. ඒ අනුව 2014 වසර සඳහා යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වවුනියාව, මුලතිව් සහ මඩකලපු යන දිස්ත්‍රික්කවල පදිංචි පුද්ගලයන් 316 දෙනෙකු සඳහා පරිපූරක ලැයිස්තුව යටතේ ඡන්දය දීමේ අවස්ථාව හිමි විය. එම ඡන්දදායකයන් සඳහා වෙනම වර්ණයකින් යුත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා මැතිවරණ මහලේකම් කාර්යාලය මගින් මුද්‍රණය කරන ලද අතර, දිස්ත්‍රික්ක වෙත ඒවා යවා, එම දැන්වීම්පත්වල ඇති තොරතුරු පරීක්ෂා කිරීමෙන් පසු අදාළ ඡන්දදායකයන් වෙත බෙදා හැරීමට කටයුතු කරන ලදී.

මැකිය නොහැකි තීන්ත

68. ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින කිසියම් ඡන්දදායකයකු මැකිය නොහැකි තීන්තෙන් සලකුණු කළයුතු බව ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 36 වන වගන්තියේ සඳහන් වේ. එක් ඡන්දදායකයකු එක් වාරයකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය දීම වලක්වාළීමේ පියවරක් ලෙස 1965 පාර්ලිමේන්තු මැතිවරණයේ සිට මැකිය නොහැකි තීන්තෙන් ඡන්දදායකයාගේ වම් සුළැඟිල්ල සලකුණු කිරීම ආරම්භ කරනු ලැබුවද, වර්තමානයේ ඡන්දදායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට පෙර ඡායාරූපයක් සහිත අනන්‍යතා ලේඛනයක් මගින් සිය අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්ය කර ඇති බැවින් නොමැකිය හැකි තීන්තෙන් වම් සුළැඟිල්ල සලකුණු කිරීමේ කාර්යය තවදුරටත් පවත්වාගෙන යාම අවශ්‍යද යන්න පිළිබඳ විමසන පිරිස්ද සිටිති.

69. ඡන්ද පොළක ඡන්ද සංඛ්‍යාවෙන් 350කට එක් තීන්ත ආලේපයක් වන සේ, එක් එක් ඡන්දපොළ වෙත නොමැකිය හැකි තීන්ත ආලේපන සැපයේ. නොමැකිය හැකි තීන්ත ආලේපක නිසි ලෙස ක්‍රියාත්මක නොවන බවට පැමිණිලි ලැබීම ද සමහර අවස්ථාවල දී සිදුවේ. ඡන්ද පොළ වෙත සපයනු ලබන නොමැකිය හැකි තීන්ත අඩංගු පෑන් ආනයනික ඒවා වන අතර, සමහර අවස්ථාවල ඒවා මගින් යොදන ලකුණු වර්ණවත්ව දිස් නොවූවද, ඉතා සුළු වේලාවකින් ඒවායේ නියමිත පෙනුම ලැබෙන බව පෙනීගොස් ඇත. එසේ කරනු ලබන සලකුණු කිරීම් ක්ෂණිකව තද වර්ණයකින් දිස් නොවීම නිසා මෙම තීන්ත ආලේපන පිළිබඳව ඡන්දදායකයාගේ හා දේශපාලන පක්ෂවල දෝෂ දර්ශන එල්ල විය. එලෙස වර්ණවත්ව දිස් නොවීම පවත්නා දේශගුණික තත්ත්වය අනුව ද වෙනස්වන බවක් ඒ ගැන සොයා බැලීමේ දී ආනාවරණය වී ඇත.

ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා ඡන්ද පොළේදී අනන්‍යතා ලේඛන භාවිතා කිරීම.

70. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව, ඡන්ද විමසීමක දී ඡන්ද පත්‍රිකාවක් කිසියම් ඡන්දදායකයකු වෙත ලබාදීමට පෙර ඡන්දදායකයා ජාතික හැඳුනුම්පතට අනුව හඳුනාගත යුතු වේ. එහෙත් කිසිදු බාධාවකින් තොරව ජාතික හැඳුනුම්පත මහජනතාව වෙත ලබාගැනීමට පහසුකම් සලසනතෙක් හා සියලුම ඡන්දදායකයන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම අවසන්වන තෙක්, ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා වෙනත් අනන්‍යතා ලේඛනද සලකා බැලීමට, මේ සම්බන්ධයෙන් වූ අධිකරණ ක්‍රියාමාර්ගයක දී මැතිවරණ කොමසාරිස්වරයා එකඟ වී ඇත.ඒ නිසා ජාතික හැඳුනුම්පතට අමතරව, වලංගු විදේශ ගමන් බලපත්‍රය, වලංගු රියදුරු බලපත්‍රය, රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත, වැඩිහිටි හැඳුනුම්පත හා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කරන පූජ්‍ය පූජක හැඳුනුම්පතද පිළිගත් අතර, එවැනි අනන්‍යතා ලේඛනවලින් එකක් හෝ නොමැති අයෙකුට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරෙන තාවකාලික හැඳුනුම්පතක් ලබාගැනීමට මෙම ඡන්ද විමසීමේ දී ද ඉඩ සලසන ලදී. ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර, අදාළ ඡන්ද දායකයාගේ අනන්‍යතාව තහවුරු කරගැනීම් වස් ඉහත කී හැඳුනුම්පත් අතරින් කුමන හෝ එක් අනන්‍යතා ලේඛනයක් ඡන්දදායකයා වෙත තිබිය යුතුය යන්න සම්බන්ධයෙන් ඡන්ද දායකයා දැනුම්වත් කිරීම් වස්, මැතිවරණ කොමසාරිස්වරයා විද්‍යුත් මාධ්‍ය හරහා පවත්වන සම්මුඛ සාකච්ඡා මගින්

මෙන්ම පුවත්පත් දැන්වීම් පළ කිරීම, මාධ්‍ය නිවේදන මගින් වූ පුළුල් ප්‍රචාරක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරිණි.

71. 2014 ඡන්ද හිමි නාමලේඛනය අනුව, 90% කට ආසන්න ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත්ව තිබුණි. ඡන්ද හිමි නාමලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් නොවූ පිරිස්,ග්‍රාම නිලධාරීන් මගින් දැනුම්වත් කොට ඔවුන්ට මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩපිළිවෙල ගැන අවබෝධයක් ලබාදීමට කටයුතු කරන ලදී. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ජංගම සේවා පවත්වා, අප්‍රමාදව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල සහාය ද නොමසුරුව ලැබිණි. තාවකාලික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා අවශ්‍යවන ඡායාරූප දෙක (අඟල් 1¼X1) ලබා ගැනීමටද ඡන්දදායකයන්ට නිරීක්ෂණ සංවිධානවල සහාය ලැබිණි. විශේෂයෙන්ම ජාතික හැඳුනුම්පත් නොමැති ඡන්දදායකයන්ගෙන් සැලකිය යුතු පිරිසක් කඳු ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි වතුවල පදිංචි තැනැත්තන් බැවින් මේ වැඩපිළිවෙල සඳහා වතු අධිකාරිවරුන්ගේද සහාය ලබා ගැනීමට කටයුතු කෙරිණි. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් හා ග්‍රාම නිලධාරීන් එක්ව, සෙසු පිරිස්වල ද සහාය ලබා ගනිමින්, ඡන්දදායකයන් විශාල පිරිසක් සඳහා තාවකාලික හැඳුනුම්පත් ලබාදීමට පියවර ගන්නා ලදී. ඊට අමතරව 2013 වසරේ පැවති පළාත් සභා ඡන්ද විමසීමේ දී නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත්, 2014 වසරේ ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් තොරතුරු අනුව යාවත්කාලීන කොට ඡන්දදායකයින්ට ලබාදීමේ වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කෙරිණ.

72. තාවකාලික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා ඡන්දදායකයා විසින් ඡායාරූප දෙකක්ද සමග අයදුම්පත් දෙකක් සම්පූර්ණ කොට ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු වේ. ග්‍රාම නිලධාරි විසින් ඒවා සහතික කොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ මාණ්ඩලික නිලධරයකු විසින් සහතික කොට, ආරක්ෂිත ස්ටිකරයක්ද අලවන ලද තාවකාලික හැඳුනුම්පත් ග්‍රාමනිලධාරි මගින් ඡන්දදායකයා වෙත යොමු කරන ලදී. එක් අයදුම්පතක් සෘජුවම අදාළ ඡන්ද පොළේ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත භාරදී ඡන්දදායකයන් විසින් ඉදිරිපත් කරනු ලබන හැඳුනුම්පත්වල නිවැරදිතාව තහවුරු කර ගැනීමටද වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. මේ ආකාරයෙන් දිවයින පුරා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් නිකුත් කරන ලද මුළු තාවකාලික හැඳුනුම්පත් ප්‍රමාණය 206,609 ක් වූ අතර පසුගිය පළාත් සභා ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද හා ජනාධිපතිවරණයට අදාළව යාවත්කාලීන කරන ලද අනන්‍යතා ලේඛන ප්‍රමාණය 18,134ක් විය. ඊට අදාළ විස්තර ***අංක V සටහනෙහි*** දක්වා ඇත.

මියගිය හෝ විදේශගත වූ ඡන්ද හිමියන්

73. මෙයට පූර්වයෙන් වූ ඡන්ද විමසීම්වල දී සිදුකළ ආකාරයෙන්ම ඡන්ද පොළ වෙත සපයනු ලැබූ ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් අය අතුරින් මියගොස් ඇති හා විදේශගත වූවන්ගේ නම් අදාළ නාමලේඛනයේ සලකුණු කර යැවීමේ වැඩපිළිවෙල මෙම මැතිවරණයේ දී ද ක්‍රියාත්මක කරන ලදී. ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන්ව ඇතත් 2014 .06.01 දින සිට 2014.12.13 දින දක්වා වන කාලය තුළ මියගිය අයගේ විස්තර හා 2014.12.13 දින වන විට විදේශගතවී ඇති බවට වාර්තා වූ ඡන්ද හිමියන්ගේ විස්තර ද ග්‍රාම නිලධාරීන් මගින් ලබාගෙන, ඊට අදාළ විස්තර ඡන්දදායකයා වෙත යවනු ලබන නිලඡන්ද දැන්වීම් පත්‍රිකාවෙහි සටහන් කර යැවීමට කටයුතු කරන ලදී. ඡන්ද පොළ වෙත යවනු ලබන ඡන්ද හිමි නාමලේඛනයේ සඳහන් මියගොස් ඇති අදාළ ඡන්දදායකයාගේ නමට ඉදිරියෙන් “D” අක්ෂරය යොදන ලද අතර විදේශගතව සිටින ඡන්දදායකයන්ගේ නම් හඳුනා ගැනීමට“A” අක්ෂරය යෙදීම සිදුකරන ලදී. නාමලේඛනයේ මෙවැනි අක්ෂර යොදා ඉස්මතු කර ඇති අයෙකු යම් හෙයකින් ඡන්ද පොළ වෙත පැමිණියහොත් එබඳු අය, ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද

පත්‍රිකාවක් ලබාදීමට තීරණය කරන්නේ නම් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 41 සහ 43 වගන්තිවල ඇතුළත් ප්‍රකාශ සුදුසු පරිදි අත්සන කර ගැනීමෙන් පසුව පමණක් එබඳු අයට ඡන්ද පත්‍රිකා නිකුත් කළ යුතුය යන්න සම්බන්ධයෙන් වන උපදෙස් ඡන්ද පොළ නිලධාරීන් වෙත ලබාදෙන ලදී. ඒ ඒ දිස්ත්‍රික්ක යටතේ වාර්තාවූ මියගිය හා නියමිත දිනට විදේශගත වූ බවට වාර්තා වූ 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් වූ ඡන්ද හිමියන් සංඛ්‍යාවට අදාළ විස්තර ***අංක VI සටහනෙහි*** දක්වා ඇත.

නිල ලකුණේ මුද්‍රාව ඡන්ද පත්‍රිකාවේ තැබීම.

74. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 35 වගන්තියේ, ඡන්ද පත්‍රිකා ඡන්දදායකයින් වෙත නිකුත් කළ යුතු ආකාරය දන්වා ඇත. එම වගන්තියේ 35(ඇ) උප වගන්තිය අනුව, ඡන්ද දායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර එය නිල ලකුණෙන් මුද්‍රා තැබිය යුතුය. එසේ නැතහොත් නිල ලකුණ එහි තෙරපීමට හෝ සිදුරු කිරීමට වුවද නීතිය අනුව කල හැකිවේ. සාමාන්‍යයෙන් ඡන්ද විමසීමකදී ඡන්ද පත්‍රිකාවල මුද්‍රා තැබීම සඳහා භාවිතා කරනු ලබන මෙම සලකුණු, ඡන්ද විමසීමේ දිනට ආසන්න දිනකදී, ආරක්ෂා සහිතව මැතිවරණ කොමසාරිස්වරයා විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවීමට ක්‍රියා කෙරේ. ඒ ඒ ඡන්ද පොළේ භාවිතා කිරීමට නියමිත, නිල ලකුණු පිළිබඳ තොරතුරු, ඡන්දපොළ කාර්ය මණ්ඩලවලට පවා ඡන්ද විමසීම් දිනය තෙක් දැනගත නොහැකි වන සේ, ඒවායේ රහස්‍යභාවය, මුද්‍රා තැබූ කවරයක බහා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිට භාරදෙනු ලබන අතර, එකී මුද්‍රාවලින් එක් පෝලිමක එක බැගින් ඡන්ද විමසීම් දින එම කටයුතු ඇරඹීමට පෙරාතුව, ඡන්දපොළ නියෝජිතයන්, නිරීක්ෂකයන් හා කාර්ය මණ්ඩලය ඉදිරියේ අහඹු ලෙස තෝරාගෙන භාවිතා කළ යුතුවේ.මෙම ක්‍රියාව, ඡන්දපොළේ දී භාවිතා කරනු ලබන නිල ලකුණ තෝරා ගැනීමේ විනිවිදභාවය හා එම කාර්යයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීම් වස් සිදුකරනු ලැබේ.

ශාරීරික දුබලතාවෙන් පෙළෙන තැනැත්තන් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම්

75. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ පනතේ 82 (4) (ඈ) වගන්තියට අනුව ශාරීරික දුබලතාවයෙන් පෙළෙන ඡන්දදායකයන් වෙනුවෙන් ඔවුන්ට නියමිත ඡන්ද පොළ වෙත යාම සඳහා විධිවිධාන සලසා තිබේ. මේ පිළිබඳව පුවත්පත් දැන්වීම හා මධ්‍ය නිවේදන මගින් ජනතාව දැනුම්වත් කරන ලදී. ඒ අනුව ඒ සඳහා වන ඉල්ලීමක් ඡන්ද විමසීම් දිනට දින 7කට පෙර,වෛද්‍ය නිර්දේශයද සහිතව තේරීම්භාර නිලධාරි වෙත ලැබෙන සේ එවා, අනුමැතිය ලබාගෙන අදාළ වාහනයෙන්ම ඡන්ද පොළ වෙත යාමට අවසර ලබාගත හැකි විය.

76. ශාරීරික දුබලතාවන්ගෙන් පෙළෙන ඡන්ද හිමියන් මෙන්ම වයෝවෘද්ධ ඡන්ද හිමියන් ගැනද සලකා බලා, එවැනි ඡන්ද හිමියන්ටද පහසුවෙන් ළඟාවිය හැකි ලෙස ඡන්ද මධ්‍යස්ථාන තෝරාගන්නා ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයන් වෙත ඡන්ද විමසීම් කාර්යයේ මූලික සංවිධාන කටයුතු අවස්ථාවේදීම දන්වා තිබිණි. ඒ හේතුවෙන් සමහර ඡන්ද පොළවල් වෙනස් කිරීමට තේරීම්භාර නිලධාරීන් තීරණය කළ අවස්ථාද වාර්තා විය. කෙසේ වෙතත් භූමියේ පිහිටීම අනුව හා පවතින ගොඩනැගිලිවල සීමිත බව නිසා ඉදිරිපත් වූ සියලුම ඉල්ලීම් ඉටු කිරීමට ප්‍රායෝගික හැකියාවක් නොවූ බවද සටහන් කළ යුතු ය.

සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු දීම.

77. ඡන්ද විමසීම් අවස්ථාවකදී තැපෑලෙන් ඡන්දය දීම සඳහා හිමිකම් ඇත්තේ, ත්‍රිවිධ හමුදා, පොලිස් දෙපාර්තමේන්තුව, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ඡන්ද විමසීම් රාජකාරීවල යෙදවීමට නියමිත නිලධරයන් හා මැතිවරණ කටයුතු වෙනුවෙන් යම් යම් අත්‍යාවශ්‍ය සේවා සපයනු ලබන රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතන කිහිපයක සේවක මණ්ඩල සඳහා පමණි. මෙම පහසුකම අවශ්‍ය බව දන්වමින්, නොයෙක් ආයතනවල නිලධරයන් හෝ සේවකයන් ඉල්ලීම් ඉදිරිපත් කළද, මෙතෙක් එවැනි අංශ සම්බන්ධව තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් ලබාදීමට අදාල නීති සම්පාදනය වී නොමැත.

ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ පනතේ 110 වගන්තිය අනුව, යම් සේවා නියුක්තියෙකුට, පෞද්ගලිකවම තමාට වෙන්කර ඇති ඡන්දපොළේ ඡන්දය දීමට හැකිවනු පිණිස, ඒ තැනැත්තාට ප්‍රමාණවත් යැයි සලකනු ලබන අඛණ්ඩ නිවාඩු කාලයක්, වැටුප් අහිමි වීමකින් තොරව, සේවා යෝජකයා විසින් දෙනු ලැබිය යුතුය. අවම කාලය පැය 4ක් වේ. මෙම විධිවිධාන කඩ කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියාකිරීම පැහැර හරින තැනැත්තෙකුට නඩු පැවරීමකින් පසුව, වරදකරු වූ විට, අදාල නීතිය අනුව දඩුවම් කළ යුතුවේ. මේ කරුණ පිළිබඳව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවලින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කරන ලද දැන්වීම්, **උපලේඛනඅංක 05** හි දක්වා ඇත.

V වන කොටස

කාර්ය මණ්ඩල අවශ්‍යතා

78. මෙම ඡන්ද විමසීමේ දී මැතිවරණ රාජකාරි කටයුතු සඳහා යොදවා ගැනීමට සුදුසුකම්ලත් සියලුම නිලධාරීන්ගේ හා මැතිවරණ කටයුතු සඳහා යොදවා ගත හැකි වාහන පිළිබඳ විස්තර ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2014.10.21 දින සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යවන ලදී. ඒ අනුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කය තුළ පිහිටි රජයේ කාර්යාල හා රජයේ පාසල්වල කාර්ය මණ්ඩලවිස්තර හා රජයේ වාහන පිළිබඳ විස්තර දන්වා එවන ලෙස දෙපාර්තමේන්තු, ආයතන ප්‍රධානීන් හා රජයේ පාසල්වල විදුහල්පතිවරුන් වෙත උපදෙස් දෙන ලදී. ***කොළඹ මහනගර සභා ප්‍රදේශය තුළ පිහිටි රජයේ ආයතනවලට අදාළ කාර්ය මණ්ඩල හා වාහන පිළිබඳ විස්තර මැතිවරණ මහලේකම් කාර්යාලයට එවිය යුතු බවට මැතිවරණ කොමසාරිස් විසින් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වන ලදී.***

79. මෙම ඡන්ද විමසීම දීප ව්‍යාප්ත ඡන්ද විමසීමක් වූ බැවින් විශාල කාර්ය මණ්ඩලයක් මෙන්ම වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වන නිසා, තම ආයතනවල සුදුසුකම්ලත් සියලුම නිලධාරීන්ගේ විස්තර හා වාහන පිළිබඳ විස්තර, මැතිවරණ කොමසාරිස්වරයාගේ හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් පරිදි ඔවුන් වෙත ලබාදෙන ලෙස ද, මැතිවරණ කාලයේ දී රජයේ නිලධාරීන්ගේ විදේශ ගමන් සීමාවිය යුතු බවද මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම පරිදි ජනාධිපති ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා පළාත් ආණ්ඩුකාරවරුන් වෙත දන්වා තිබුණි.

80. ඡන්ද විමසීමේ මූලික කටයුතු සංවිධානය සඳහා සහාය විය හැකි පළපුරුදු නිලධාරීන්, දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතනවලින් තාවකාලිකව මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරවා ගැනීමට අදාළ උපදෙස් ද ඊට අමතරව මැතිවරණ දෙපාර්තමේන්තුවේ සේවය කොට විශ්‍රාම ගිය මාණ්ඩලික නිලධාරීන් හා සෙසු නිලධාරීන්ද යොදවා ගැනීමට අවශ්‍ය උපදෙස් ද තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරන ලදී.

81. රාජ්‍ය ආයතනවලට අනුයුක්ත නිලධාරීන් හා ගුරුවරුන් චක්‍රලේඛ උපදෙස් මත නියමිත වැටුප් කාණ්ඩ යටතේ, සහකාර තේරීම්භාර නිලධාරීන්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්, ලිපිකරු නිලධාරීන් ලෙස වර්ගීකරණය කිරීමට අදාළව මෙන්ම, විශේෂයෙන්ම ඡන්ද පොළ අධීක්ෂණය හා මූලික කටයුතු සඳහා සහාය වන සහකාර තේරීම්භාර නිලධාරීන් හා ඡන්ද පොළවල් භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන්ගේ උපදෙස් පරිදි සංවිධානය කිරීමට අවශ්‍ය උපදෙස්ද තේරීම්භාර නිලධාරීන් වෙත යවන ලදී. ඡන්ද පොළ අධීක්ෂණය භාරව යන සහකාර තේරීම්භාර නිලධාරීන් මෙන්ම ඡන්ද පොළ භාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් පුහුණු කිරීම තේරීම්භාර නිලධාරී සහ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් විසින්ම සිදුකළ යුතු බවටද සෙසු නිලධාරීන් පුහුණු කිරීම, පළපුරුදු වෙනත් මාණ්ඩලික නිලධාරීන් යොදවා සිදු කරන ලෙසටද සියලුම තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරන ලදී.

82. සියලුම දිස්ත්‍රික්ක වෙනුවෙන් ඡන්ද විමසීමේ කටයුතු සඳහා අවශ්‍ය වූ සමස්ත නිලධාරී සංඛ්‍යාව 161,256 ක් වූ අතර ඉන් නිලධාරීන් 155,461 ක් පමණ අදාළ දිස්ත්‍රික්ක වෙතින් සපයා ගත හැකි විය. කුරුණෑගල, මහනුවර වැනි දිස්ත්‍රික්කවල කාර්ය මණ්ඩල අතිරික්තයක් පැවතීම නිසා එවැනි නිලධාරීන් සෙසු ආසන්න දිස්ත්‍රික්කවල අවශ්‍යතාව පරිදි ද යොමු කරන ලදී. ඡන්ද විමසීමේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වූ සහකාර තේරීම්භාර නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් හැර අනෙකුත් නිලධාරීන් දිස්ත්‍රික්කවලින්ම ප්‍රමාණවත් පරිදි ලබාගත හැකි තත්වයක් පවතී. කොළඹ, මහනුවර, කුරුණෑගල වැනි දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්ක වෙත ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ රාජකාරි සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන්ද දිස්ත්‍රික් කිහිපයකට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් යම් ප්‍රමාණයක්ද කොළඹ සංචිතයෙන් සැපයීමට සිදුවිය. ඡන්ද පොළ රාජකාරි සඳහා වෙනත් දිස්ත්‍රික්කවල නිලධාරීන්ද යෙදවීමට මැතිවරණ

කොමසාරිස්වරයා ගත් තීරණයකට අනුව සියලුම කාණ්ඩවල නිලධාරීන් බොහෝ දිස්ත්‍රික්ක අතර මාරුකොට යොදවන ලදී. එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් ඡන්ද විමසීම සඳහා අවශ්‍ය වූ නිලධාරි සංඛ්‍යාව පිළිබඳ විස්තර ***අංක VII සටහනෙහි*** දක්වා ඇත.

83. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමේ දී අනෙකුත් මැතිවරණවල මෙන් සංකීර්ණ වූ මනාප ගණන් කිරීමක් සිදුනොවන බැවින් ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලයෙන් වැඩි පිරිසක් ඡන්ද ගණන් කිරීම සඳහා යොදා ගැනීමට අවශ්‍ය උපදෙස් තේරීම්භාර නිලධාරීන් වෙත ලබාදෙන ලදී. එසේ වුවද, යම් හෙයකින් දෙවන / තුන්වන මනාප ගණන් කිරීමක් සිදුකල යුතු වුවහොත්, ඒ සඳහා වූ කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳව සැලකිල්ලට ගැනීමට ද උපදෙස් ලබාදෙන ලදී. ඡන්ද ගණන් කිරීම භාරව ක්‍රියාකරන ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් සඳහා පමණක් ඡන්ද ගණන් කිරීමට අදාළව පුහුණු පංති පවත්වන ලද අතර සෙසු දිස්ත්‍රික්කවල ඡන්ද ගණන් කිරීමට අදාළ රාජකාරි සඳහා කොළඹ සංචිතයෙන් යොදවන ලද නිලධාරීන් පුහුණු කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකරන ලදී.

ප්‍රවාහන පහසුකම්

84. ඡන්ද විමසීම ඇරඹෙන වේලාවට පෙර සියලුම ඡන්ද පොළවල් වෙත නිලධාරීන් හා අදාළ බඩු බාහිරාදිය සපයනු ලැබ තිබීමත්, ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පෙට්ටි සහ අනෙකුත් ආරක්ෂිත දෑ සමග නිලධාරීන් ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත වහාම ආපසු ප්‍රවාහනය කිරීමත් ඡන්ද විමසීම් කටයුතු සංවිධානයේදී ඉතා වැදගත් වේ. මීට අමතරව තේරීම්භාර නිලධාරීන්ට ඡන්ද විමසීමේ කටයුතු අධීක්ෂණයට මෙන්ම, පොලිස් දෙපාර්තමේන්තුවට ඡන්ද විමසීමේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට අවශ්‍ය ආරක්ෂාව ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම්ද සලසනු ලැබිය යුතු වේ. අනෙක් අතට ජනාධිපතිවරණය දිවයින පුරා එක් දිනකදී පැවැත්වෙන බැවින් ඉහත සඳහන් කළ අවශ්‍යතා වෙනුවෙන් විශාල වාහන සංඛ්‍යාවක් යෙදවීමට සිදුවිය.

85. ඉහත අවශ්‍යතා සැලකිල්ලට ගෙන මැතිවරණ කොමසාරිස්වරයා විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සංස්ථා මණ්ඩල ප්‍රධානීන් වෙත 2014.10.21 දිනෙන් යුතුව ලිපියක් යවමින්, තම ආයතන තුළ ඇති සියලුම වාහන සම්බන්ධ විස්තර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි වෙත සපයන ලෙසට දන්වන ලදී. කොළඹ නාගරික සීමාව තුළ පිහිටි රජයේ කාර්යාලවල වාහන සම්බන්ධ විස්තර මැතිවරණ මහලේකම් කාර්යාලයටද, දිස්ත්‍රික් මට්ටමින් ඇති වාහන විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙතද සැපයිය යුතු විය. මැතිවරණ රාජකාරීයේදී ස්වකීය ප්‍රවාහන කටයුතු සඳහා සිය නිල මෝටර් රථ වෙන්කර තබා ගැනීමේ වරප්‍රසාදයද ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට, විශේෂයෙන් අතිරේක ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලබාදෙන ලදී.

86. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද විමසීම් කටයුතු සඳහා වාහන අවශ්‍යතාව ගණන් බැලීමෙන් පසුව, රජයේ වාහන ප්‍රමාණවත් නොවීම නිසා ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ හා කුලී වාහන ලබාගැනීමටද කටයුතු කරන ලදී. මීට පෙර පැවති ඡන්ද විමසීම් වලදී මෙන්ම ජනාධිපතිවරණයේ දී ද කුලී වාහන සඳහා නව ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ ආකාරයෙන් දිස්ත්‍රික්කය තුළින් සපයාගත හැකි උපරිම වාහන ප්‍රමාණයද මුලු වාහන අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවූ දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය වාහන කොළඹ සංචිතයෙන්ද ලබාදීමට කටයුතු කරන ලදී.

87. පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවට හා තැපැල් දෙපාර්තමේන්තුවට රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් රජයේ වාහන නොමැතිවීම හේතුවෙන් අනුමත කුලී පදනම මත වාහන ලබාගැනීමට මෙම ඡන්ද විමසීම් අවස්ථාවේ දී ද අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.

88. ඡන්ද පොළවල් භාරව ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින්ට හා ඡන්ද පොළවල් කීපයක අධීක්ෂණ කටයුතු භාරව යන කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරින්ටද තම පෞද්ගලික මෝටර් රථ යොදා ගැනීමටද අවසර දෙන ලදී, කෙසේ වෙතත් ඡන්ද පොළ භාරව යන ජ්‍යේෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට ඡන්ද පෙට්ටි සහ ආරක්ෂිත ද්‍රව්‍ය ද, පොලිස් නිලධාරින් සහ තම සහායකයා ද කැටුව ගමන් කිරීමට සිදුවන නිසා ඒ සඳහා කුඩා මෝටර් රථ නුසුදුසු බැවින් විශාල කාර් රථ / වෑන් රථ/ ජීප් රථ වැනි වාහන ඇත්නම් ඒවා පමණක් යොදා ගැනීමට අනුමැතිය ලබාදිය යුතු බවට තේරීම්භාර නිලධාරින් දැනුවත් කරන ලදී.

89. ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීමද පොලිස් ආරක්ෂාව යටතේ සිදු කිරීමට තේරීම්භාර නිලධාරින් විසින් කටයුතු යොදන ලදී. ඡන්ද පොළ සෙසු කාර්ය මණ්ඩලය පොදු ප්‍රවාහන පහසුකම් උපයෝගි කර ගනිමින් ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරු 2.00ට පෙර අදාළ ඡන්ද පොළවල් වෙත වාර්තා කළ යුතු විය. එහිදි දුම්රියෙන් ගමන් කරන නිලධාරින්ට තම සේවා ස්ථානයෙන් ඒ සඳහා රාජකාරී දුම්රිය බලපත් ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී. මාර්ග දුෂ්කරතා හේතුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් උපයෝගි කරගෙන නිලධාරීන්ට ඡන්ද පොළ වෙත වාර්තා කිරීම අපහසු වන අන්දමේ ඡන්ද පොළවල් පිහිටි මහනුවර, නුවරඑළිය, මඩකලපුව, කෑගල්ල යන දිස්ත්‍රික්කවල අදාළ ඡන්ද පොළ සෙසු කාර්ය මණ්ඩලයටද තේරීම්භාර නිලධාරි විසින් ප්‍රවාහන පහසුකම් සලසන ලදී,

90. 2015 ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී ද අවතැන් වී සිටින ඡන්ද හිමියන්ට ස්වකීය ඡන්දය පාවිච්චි කිරීම සඳහා ඡන්ද පොළවල් වෙත යාමට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීමට පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරිට සිදුවිය. මන්නාරම දිස්ත්‍රික්කයේ අවතැන්වූ ඡන්ද හිමියන් විශාල ප්‍රමාණයක් පුත්තලම දිස්ත්‍රික්කයේ තාවකාලිකව පදිංචිව සිටින බැවින් සහ ඔවුන්ට පොදු ප්‍රවාහන පහසුකම් මගින් තම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යාමට තරම් ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් නොවීම ගැන තරග කරනු ලබන විවිධ දේශපාලන පක්ෂ විසින් කරන ලද ඉල්ලීම් ද සලකා බලා, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීට ඒ සඳහා වැඩපිළිවෙලක් සකසන ලෙසට උපදෙස් දෙන ලදී. ඒ අනුව පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාගේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ කිහිපයක් ඡන්ද විමසීම් දිනට පෙර දින පුත්තලම කච්චේරිය වෙත ගෙන්වා ඊට පසුදින මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි ඡන්ද පොළවල් වෙත අවතැන් ඡන්ද හිමියන් ප්‍රවාහනය කිරීමේ කටයුතු සැලසුම් කෙරිණි. එසේ වුවද ප්‍රතිවාදී දේශපාලන කණ්ඩායම්වල අනවශ්‍ය මැදිහත්වීම් හේතුවෙන් ඇති වූ අනපේක්ෂිත තත්ත්වය නිසා, එම වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළ නොහැකි වූයෙන්, පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා මැදිහත්ව පෞද්ගලික බස්රථ කිහිපයක් යොදවා ඡන්ද විමසීම් දින අදාළ ඡන්ද හිමියන් පුත්තලමේ සිට මන්නාරම දක්වා (2013 අංක 27 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විශේෂ විධි විධාන යටතේ, මන්නාරම දිස්ත්‍රික් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි, පුත්තලම දිස්ත්‍රික්කයේ සාමාන්‍ය පදිංචිය දරන තැනැත්තන්)ප්‍රවාහනය කොට ඔවුන් ආපසු රැගෙන ඒමට ද පියවර ගන්නා ලදී.

91. ඡන්ද විමසීමට අදාළ ප්‍රවාහන පහසුකම් අඩාල නොවන පරිදි සපුරාලීමට අවශ්‍ය වන ඉන්ධන තොග රැස්කර තබා ගැනීමට අවශ්‍ය උපදෙස් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලදී. ඒ සම්බන්ධයෙන් තවදුරටත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරින් දැනුවත් කරමින්,ඒ ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් කාර්යයට යොදවන වාහන සඳහා වූ ඉන්ධන අවශ්‍යතාව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත දැන්වීමට හා සම්පූර්ණ තොග ගබඩාකර තබා ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ඔවුන් සමග සාකච්ඡා කරන ලෙසට ද උපදෙස් දෙන ලදී. තේරීම්භාර නිලධාරින් මගින් ඡන්ද විමසීමට අදාළ කාර්යයන් සඳහා ඉන්ධන ලබා ගැනීමට නියමිත පිරවුම්හල් කළමණාකරුවන්ද දැනුවත් කරමින් තොග රැස්කර තබා ගැනීමේ අවශ්‍යතාව ගැන ඔවුන්ද දැනුම්වත් කරන ලදී.

92. ප්‍රවාහන පහසුකම් සැලසීමේදී අනෙකුත් වැදගත් අංශය වූයේ ඡන්දදායකයන් සඳහා පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම ය. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 82 වගන්තියේ සඳහන් කරුණු අනුව ඡන්දදායකයාට තම පෞද්ගලික වාහනයෙන් ඡන්ද පොළ වෙත යාමේ බාධා පවතින බැවින් පොදු ප්‍රවාහන පහසුකම් ශක්තිමත් කළයුතු විය. ඒ සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හා පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නිලධාරින් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවා, මැතිවරණ රාජකාරි සඳහා යෙදවීමට අවශ්‍ය වාහන ලබාදීම මෙන්ම, ඡන්ද විමසීම් දින ඡන්දදායකයාට අපහසුවෙන්

තොරව ඡන්ද පොළවෙත යාමට ප්‍රවාහන පහසුකම් සැලසීමේ ඇති වැදගත්කම පිළිබඳ කරුණු ඔවුන්ට පෙන්වා දෙන ලදී. දිස්ත්‍රික් මට්ටමේදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මගින්ද අදාළ ආයතනවල ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා තවදුරටත් කටයුතු කරන ලදී.

ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු - දේශීය නිරීක්ෂණ සංවිධාන

93. ඡන්ද විමසීම් නිරීක්ෂණ කටයුතු සඳහා අවසර ලබාදීමට කිසිදු ඡන්ද විමසීම් පනතකින් නීතිමය ප්‍රතිපාදන සලසා නොමැති නමුත් 2015 ජනාධිපතිවරණයේ දී ද පූර්ව මැතිවරණවල දී මෙන්ම තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ ඉල්ලීම හා එකඟතාව මත ඡන්ද විමසීම් නිරීක්ෂණය පිළිබඳ අත්දැකීම් සහිත නිරීක්ෂණ සංවිධානවලට ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා අවස්ථාව සලසන ලදී.

94. පසුගිය ඡන්ද විමසීම්වලට අදාළ ඒ ඒ නිරීක්ෂණ සංවිධානවල ක්‍රියාකාරකම් ගැන සැලකිලිමත්ව, පහත සඳහන් නිරීක්ෂණ සංවිධානවලට ඡන්ද පොළ තුළට ගොස් නිරීක්ෂණ කටයුතු කිරීම හෝ ඡන්ද පොළට බැහැරින් සිට සිය නිරීක්ෂණය කිරීම සඳහා අවසරය දෙන ලදී.

I. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) අංක 12/3, රොබට් ටෙරසය, රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06.

II. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) අංක 24/2, 28 වන පටුමඟ, කොළඹ 07.

III. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE) අංක 100/19, වැලිකඩවත්ත, රාජගිරිය

IV. ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL) අංක 117, තලාහේන, මාලඹේ.

V. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (MFFE) 24/ 13, විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ

VI. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL), අංක 5/1,එලිබෑන්ක් පාර,කොළඹ 05

VII. ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC) 2 වන මහළ, කාර්ල්ස්කෘ කෝර්ට්, 195, බේස්ලයින් පාර, කොළඹ 09.

95. සියලුම සංවිධානවල ජාතික මට්ටමේ නිලධරයන් වන, විධායක අධ්‍යක්ෂ, සම කැඳවුම්කරු හා සම සම්බන්ධීකාරකවරු, ලේකම්, ජාතික සංවිධායක, ජ්‍යෙෂ්ඨ කළමණාකරු යන නිලධරයන්ට දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළුව තම නිරීක්ෂණ කටයුතු සිදුකිරීමට අවසර ලබාදෙන ලද අතර, අදාළ සංවිධානවල දිස්ත්‍රික් සංවිධායකවරුන්ට දිස්ත්‍රික්කය තුළ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළුවී නිරීක්ෂණ කටයුතු කිරීමටද අවසර ලබාදීමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මැතිවරණ නිරීක්ෂණ ජාලය (NEM), ලංකා මැතිවරණ විවරණ (Lanka Polls Watch), ශ්‍රී ලංකා දෙටු පුරවැසි සම්මේලනය, ශ්‍රී ලංකා විද්‍යාර්ථීන්ගේ සහ වෘත්තිකයන්ගේ සංගමය (SLAPA) යන සංවිධාන මීට පෙර පැවති ඡන්ද විමසීම් හා පූර්ව ඡන්ද විමසීම් කාල සීමාවන්ට අදාළව සිය නිරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම හෝ දේශපාලන පක්ෂ නිත්‍ය නියෝජිත රැස්වීම්වල දී අදහස් දැක්වීමෙන් දායකවීම සිදුකර තිබූ හෙයින්, එකී සංවිධානවල නිරීක්ෂකයන්ට වුවද ඡන්ද පොළෙන් බැහැර නිරීක්ෂණ කටයුතු කිරීමට බාධාවක් නොමැති බව එම සංවිධාන වෙත දන්වන ලදී. කෙසේ වෙතත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය මුලින් සඳහන් කරන ලද නිරීක්ෂණ සංවිධාන සමග ඒකාබද්ධව ක්‍රියාකිරීමට එකඟත්වය පළ කළ අතර, ශ්‍රී ලංකා විද්‍යාර්ථීන්ගේ හා වෘත්තිකයන්ගේ සංගමය (SLAPA) සහ ශ්‍රී ලංකා දෙටු පුරවැසි සම්මේලනය යන සංවිධානවල නම් කරන ලද තැනැත්තන්ට පමණක් ඒ ඒ ඡන්ද ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන තුළට ගොස් නිරීක්ෂණය සඳහා අවසරය ලබාදෙන ලදී.

96. ***දේශීය නිරීක්ෂණ සංවිධාන අතුරින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට (CMEV)පමණක් ඡන්ද පොළ තුළ***

ස්ථිතික නිරීක්ෂකයන් රඳවා තබමින් නිරීක්ෂණයට අවසර ලබාදුන් අතර, සෙසු නිරීක්ෂණ සංවිධානවල අවසර දී ඇති අයට හැර සෙසු නිරීක්ෂකයන්ට ඡන්ද මධ්‍යස්ථානයක පරිශ්‍ර පිවිසුම දක්වා පැමිණ නිරීක්ෂණ කටයුතු කළ හැකි විය. දේශපාලන කටයුතුවලට සම්බන්ධ බවට චෝදනා නොමැති පුද්ගලයින් නිරීක්ෂණ කටයුතුවලට පත් කිරීමටත්, ස්වාධීනව ඔවුන් විසින් නිරීක්ෂණ කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ඔවුන්ට ලබාදෙන ලෙසත් ඒවායේ ප්‍රධානීන්ට දන්වන ලද අතර, එසේ නොවුනහොත් එවැනි සංවිධාන නිරීක්ෂණ කටයුතුවලින් ඉවත් කිරීමට සිදුවන බවද වැඩිදුරටත් අවධාරණය කරන ලදී. නිරීක්ෂණ කටයුතු සඳහා දිස්ත්‍රික් මට්ටමින් යෙදවීමට බලාපොරොත්තු වන නිරීක්ෂකයන්ගේ නම් ලැයිස්තු ඡන්ද විමසීම් දිනට සතියකටවත් පෙර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ලබාදෙන ලෙසත්, එසේ නොමැති වුවහොත් අදාළ නිරීක්ෂකයන්ගේ විස්තර ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත කල්වේලා ඇතිව ලබාදීමට නොහැකි වීමෙන් ගැටළු ඇතිවිය හැකි බවත් නිරීක්ෂණ සංවිධාන වෙත දන්වන ලදී. ඡන්ද විමසීම් දින ඡන්ද පොළ නිරීක්ෂණ රාජකාරිවලින් පසුව ඡන්ද විමසීමට අදාලව පවත්වා ගෙන යන ලද වාර්තාව ඡන්ද විමසීම අවසන් වූ වහාම නිරීක්ෂක විසින් ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත භාරදීමට කටයුතු කරන ලදි.

97. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL), මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) හා නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE) යන නිරීක්ෂණ සංවිධාන තම දේශීය නිරීක්ෂකයන්ට අමතරව, රටවල් කිහිපයක විදේශීය නිරීක්ෂකයන්ද යොදවමින් තම නිරීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර ඒ සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන තිබුණි.

98. මැතිවරණ ඉතිහාසයේ ප්‍රථම වරට දේශීය නිරීක්ෂණ ආයතනවලට ඡන්ද ගණන් කිරීම් කටයුතු නිරීක්ෂණයටද අවස්ථාව සලසා දීම,2015 ජනාධිපතිවරණයට අදාළව සිදුවූ විශේෂ සිදුවීමකි. ඡන්ද ගණන් කිරීමේදී නොයෙකුත් දූෂණ අක්‍රමිකතා සිදුවන බවට දේශපාලන පක්ෂ හා වෙනත් සංවිධාන දරනවැරදි මතය දුරුකරලීමද අරමුණු කර ගනිමින් ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණයකරන ආකාරයටම ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණයටද පහත සඳහන් නිරීක්ෂණ සංවිධානවලට අවසරය ලබාදෙන ලදී.

I. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය(PAFEREL)

II. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)

III. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE)

IV. ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL)

V. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (MFFE)

VI. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL)

විදේශීය නිරීක්ෂණ සංවිධාන

99. ජනාධිපතිවරණය පිළිබඳ ප්‍රකාශය පළ කිරීමෙන් පසුව, ජනාධිපතිවරණයට තරග කිරීමට බලාපොරොත්තු වන පිළිගත් දේශපාලන පක්ෂ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2014.11.21 දින පැවති පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගේ රැස්වීමේ දී දේශපාලන පක්ෂ නියෝජිතයන් විසින් කරන ලද ඉල්ලීම පරිදි ජනාධිපතිවරණ ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා විදේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වල සහාය ලබා ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු කරන ලදී. ඒ අනුව 2014.11.26 දින ලිපියක් මගින් ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංගමයේ (AAEA) සභාපතිවරයා වෙතද, 2014.11.29 දින ලිපියක් මගින් දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංසදයේ (FEMBoSA) සභාපතිවරයා වෙතද, 2015.01.08 දින

පැවැත්වෙන ජනාධිපතිවරණය නිරීක්ෂණය සඳහා වන ආරාධනය සිදු කරන ලදී. එමෙන්ම, පොදු රාජ්‍ය මණ්ඩලයීය (The Commonwealth) මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් හා යුරෝපා සංගමයේ මැතිවරණ නිරීක්ෂක කණ්ඩායම් සඳහා ඇරයුම් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ඒ අනුව පොදුරාජ්‍ය මණ්ඩලයීය (The Commonwealth) මැතිවරණ නිරීක්ෂක කණ්ඩායමට මෙම ජනාධිපතිවරණය නිරීක්ෂණය සඳහා ඇරයුම් කරන ලදී. ජනාධිපතිවරණයට තරග කිරීමට අපේක්ෂාවෙන් සිටි එක්සත් ලංකා මහා සභා පක්ෂයේ ජයන්ත කුලතුංග මහතා, යුරෝපා සංගමයේ නිරීක්ෂකයින් ඡන්ද විමසීම නිරීක්ෂණය කරන්නේ නම්, ඒ සම්බන්ධව තම විරෝධතාව දක්වන බව දැන්වීය.

100. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංගමය (AAEA) සහ දකුණු ආසියාතික මැතිවරණ කළමණාකරණ ආයතන සංසදය (FEMBoSA) යන සංවිධානවල නිරීක්ෂකයන් සෘජුවම සම්බන්ධීකරණය කරන ලදී. පොදු රාජ්‍ය මණ්ඩලීය (Commonwealth) නිරීක්ෂණ කණ්ඩායමට අවශ්‍ය තොරතුරු ලබාදීම සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ සහාය නිරීක්ෂකයින් වෙත ලබාදීමට පමණක් මැතිවරණ දෙපාර්තමේන්තුව මැදිහත් විය. තවද ඡන්ද විමසීම් හා ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ඡන්ද විමසීම නිරීක්ෂණයට අවශ්‍ය ඕනෑම ස්ථානයකට යාමට ද ඔවුන්ට අවසර දෙන ලදී.නාමයෝජනා භාරගැනීමේ කටයුතුවලින් පසුව 2015.01.05 දින දක්වා වූ කාලය තුළ ඉහත කී නිරීක්ෂණ සංවිධානවල නිරීක්ෂකයන් 60 දෙනෙකු පමණ විවිධ අවස්ථාවලදී දිවයිනට පැමිණි අතර, ඉන් 25ක් ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංගමයත්, 35ක් දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංසදයත් නියෝජනය කළ අතර, නිරීක්ෂකයින් 6 දෙනෙකු පොදු රාජ්‍ය මණ්ඩල නිරීක්ෂණ කණ්ඩායමත් නියෝජනය කරන ලදී.

101. 2014.12.14 දින දක්වා ආසියාතික මැතිවරණ කළමනාකරණ ආයතනවලින් පැමිණි නිරීක්ෂකයන් සංඛ්‍යාව සීමිත ප්‍රමාණයක් වීම සැලකිල්ලට ගෙන, ඔවුන් සඳහා කොළඹ නවාතැන් පහසුකම් සලසමින් කොළඹ සහ ආසන්න දිස්ත්‍රික්ක වන ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල නිරීක්ෂණ කටයුතු සඳහා ඔවුන් යොදවන ලදී. 2014.12.14 දිනෙන් පසුව 2015.01.05 දක්වා අතර වූ කාලය තුළ වරින් වර සෙසු දිස්ත්‍රික්ක වෙතට ගොස් ඡන්ද විමසීමට අදාළ නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට නිරීක්ෂකයින්ට අවස්ථාව සලසන ලදී. 2015.01.05 දින සිට ඡන්ද විමසීම සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු අවසන් වන තෙක් විදේශීය නිරීක්ෂකයන් සිවු දෙනෙකු නොවැඩි සංඛ්‍යාවක් ස්ථිර වශයෙන් එක් එක් මැතිවරණ කොට්ඨාසයේ නිරීක්ෂණයට යොදවන ලදී.

102. දිස්ත්‍රික්ක වෙත යොමු කරන ලද විදේශීය නිරීක්ෂකයින්ට සහාය වීම සඳහා කොළඹින් මෙන්ම අදාළ දිස්ත්‍රික්කවලින් ද සම්බන්ධීකරණ නිලධාරීන් පත්කළ අතර, ඔවුන් දිස්ත්‍රික්කය තුළ රැඳී සිටීමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන නවාතැන් පහසුකම්ද සැලසීමට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් දැනුවත් කරන ලදී. විදේශීය නිරීක්ෂකයන් ඒ ඒ දිස්ත්‍රික්කයන්ට වාර්තා කිරීමෙන් පසුව ඔවුන්ට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හමුවී මැතිවරණ සංවිධාන කටයුතු ගැන සාකච්ඡා කිරීමටත්, දේශපාලන පක්ෂ බලයලත් නියෝජිතයන්, දේශීය නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් මෙන්ම පොලිසිය සමග සාකච්ඡා කිරීමටත් අවස්ථාව සලසන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

103. 2014.12.23 දින හා 2014.12.24 යන දෙදින සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී සිදු කරන ලද තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහාද විදේශීය නිරීක්ෂකයන්සහභාගි වූ අතර 2015.01.08 දින ඡන්ද පොළවල් තුළ ඡන්ද විමසීම සිදු කෙරෙන ආකාරය නිරීක්ෂණයට මෙන්ම ඡන්ද පත්‍රිකා ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහාද ඔවුන්ට අවස්ථාව ලබාදෙන ලදී.

VI වන කොටස

ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම.

104. දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව, ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක මැතිවරණ කොමසාරිස්වරයා ඉල්ලා සිටින පොලිස් නිලධාරීන්,ඡන්ද විමසීමේ ආරක්ෂක කටයුතු සඳහා ලබාදීමටත්, එබදු නිලධාරීන් මැතිවරණ කාල සීමාව තුළ මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව ක්‍රියාකිරීමටත්, එලෙස ක්‍රියාකරන බවට සහතික වීමටත් පොලිස් දෙපාර්තමේන්තුව බැඳී සිටී. ඒ අනුව ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසු සතියක් ගතවන තෙක්ම, ඡන්ද විමසීම් නීතිය බලාත්මක කිරීම මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව පොලිස්පතිවරවයා වෙත පැවරෙන වගකීමකි. මැතිවරණ කොමසාරිස්වරයා, තේරීම්භාර නිලධාරීන් මෙන්ම තරග කරනු ලබන දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන්ද මැතිවරණ නීතිය බලාත්මක කිරීමට අදාළ රාජකාරී පොලිසිය විසින් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරති.

105. ජනාධිපතිවරණයට අදාල නීති බලාත්මක කිරීම සඳහා අදාල සියලු පාර්ශවකරුවන්ගෙන් ලද සහාය, ඉතා විශාලය. එහිදී, පොලිසිය මෙන්ම, මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා පත්කරන ලද දේශපාලන පක්ෂ නිත්‍ය නියෝජිත ස්ථාවර කමිටුව, එයට සහභාගීවූ සෑම අපේක්ෂකයෙක් වෙනුවෙන් පත්කරන ලද, නියෝජිතයන්,නීතිඥවරුන්, පිළිගත් දේශපාලන පක්ෂවල නියෝජිතයන්, නිරන්තරයෙන් ක්‍රියාත්මක වීම තුළ, මෙම ජනාධිපතිවරණ වාර්තාව මගින් ඉදිරියට විස්තර කෙරෙන අපේක්ෂක ආචාරධර්ම පද්ධතිය, මාධ්‍ය උපමාන, මැතිවරණ ආරවුල් නිරාකරණයට අදාල නීති ආදිය, නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබුණි.

106. ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කළ වහාම මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාමයෝජනා භාරගැනීම, ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම හා ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කිරීමට අදාළ රාජකාරී සඳහා අවශ්‍ය ආරක්ෂාව සැපයීම කෙසේ වියයුතුද යන්න සම්බන්ධයෙන් ලිඛිතව මෙන්ම සාකච්ඡා මගින් ද පොලිස්පති හා පොලිසියේ සෙසු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. ඊට සමගාමීව දිස්ත්‍රික් මට්ටමේ දී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් දිස්ත්‍රික්කය / පළාත තුළ සිටින ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් කැඳවා ඡන්ද විමසීමේ ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලැබිණ.

107. මැතිවරණ නීති බලාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් මැතිවරණ ව්‍යාපාරයේ දී මුහුණ දෙන ගැටළු හෝ අදාළ පාර්ශ්ව විසින් ඉදිරිපත් කළවිට ඒ සම්බන්ධයෙන් වහාම අවශ්‍ය පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙත යොමු කරන ලදී. යම් යම් දේශපාලන බලපෑම් මත පොලිස් නිලධාරීන්ගේ ස්ථානමාරුවීම් සිදුවන බවට ලැබුණු පැමිණිලි ද ඒ අතර විය. එවැනි අවස්ථාවන්හි දී ඒ සම්බන්ධව වාර්තා කැඳවා අවශ්‍ය උපදෙස් පොලිස්පතිවරයා වෙත නිකුත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු කරන ලදී.

ආරක්ෂක කටයුතු

108. ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළ නීති බලාත්මක කිරීම කඩිනමින් සිදු කිරීම සඳහා මෙන්ම, ලැබෙන විවිධ පැමිණිලි සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වීම සඳහා ඡන්ද විමසීම ආරම්භයේ සිටම, මැතිවරණ මහලේකම් කාර්යාලය තුළ නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ අධීක්ෂණය යටතේ වූ ඒකකයක් පිහිටුවන ලදී. එසේම දිස්ත්‍රික් මට්ටමේ දී, සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම, පොලිස් අධිකාරිවරයකු හෝ සහකාර පොලිස් අධිකාරි මට්ටමේ නිලධරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන පොලිස් ඒකකයක් පිහිටුවන ලදී. මීට අමතරව දිස්ත්‍රික්කයේ විශාලත්වය සහ විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතුව ඇතැයි හඳුනාගත් ප්‍රදේශ කේන්ද්‍රකර ගනිමින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ වෙනත් පොදු කාර්ය ස්ථානවල පොලිස් පරීක්ෂකවරයකු හෝ උප පොලිස් පරීක්ෂකවරයකු යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ඒකකද පිහිටුවන ලදී. මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථානගත කරන ලද ජාතික පැමිණිලි මධ්‍යස්ථානය මැතිවරණ කොමසාරිස්වරයාගේ

ප්‍රධානත්වයෙන් කටයුතු කරන ලද අතර, එය දිස්ත්‍රික් මට්ටමේදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි ප්‍රධානත්වයෙන් පිහිටුවන ලද දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථාන වල සහයෝගයද ඇතිව ක්‍රියාත්මක කරන ලදී. ජාතික හෝ දිස්ත්‍රික් මට්ටමේ පැවති පැමිණිලි මධ්‍යස්ථානවල කටයුතු සඳහා තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට මෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින්ටද සහභාගීවීමට අවස්ථාව සලසන ලදී. දිස්ත්‍රික් හෝ ජාතික මට්ටමින් ලැබුණු ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වීමේ හැකියාව මෙම මධ්‍යස්ථාන වලට ලැබිණි.

109. ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කළ දිනට පසුදින සිටම, මැතිවරණ මහලේකම් කාර්යාලයට හා සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ආරක්ෂාව සැපයීමට මෙන්ම, ඉහත සඳහන් කළ අයුරින් ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමටද පොලිසියේ ඉහළ දායකත්වයක් ලැබිණි. ඡන්ද විමසීම් දින හා ඊට පෙර දින ඡන්ද මධ්‍යස්ථානවල ආරක්ෂාව සඳහා ඡන්ද පොළ තුළ අඩුම තරමින් නිලධාරීන් දෙදෙනෙකුවත් යොදවා ඊට අමතරව ඡන්ද පොළ අවට පොලිස් ජංගම මුර සංචාර ද යොදවා, නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසිය විසින් පියවර ගන්නා ලදී. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසු ඡන්ද පෙට්ටි ඇතුළු ආරක්ෂිත බඩු බාහිරාදිය සුරක්ෂිතව තේරීම්භාර නිලධාරි කාර්යාල වෙත ප්‍රවාහනය කිරීමටත් ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන් වන තෙක් මැතිවරණ මහලේකම් කාර්යාලයට හා සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවලට ආරක්ෂාව සලසා සිය වගකීම උසස් අයුරින් ඉටුකිරීමට පොලිසිය කටයුතු කළේය.

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙත නිකුත් කරන ලද මාධ්‍ය උපමාන

110. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කරනු වස් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපතිවරණයට අදාළව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ සම්බන්ධයෙන් 2014.12.05 දිනැතිව සියලුම මාධ්‍ය ආයතන හා දේශපාලන පක්ෂ ලිඛිතව දැනුවත් කළ අතර, එම මාර්ගෝපදේශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටද කටයුතු කරන ලදී. ඒ අනුව 2014.11.24 දින අංක 1890/2 දරන ගැසට් පත්‍රයේ ඒවා පළ කරන ලද අතර, එම ගැසට්පත්‍රය මෙම වාර්තාවේ ***හයවන උපලේඛනය*** ලෙස දක්වා ඇත.

111. මාධ්‍ය ආයතන වෙනුවෙන් මඟ පෙන්වීම් නිකුත් කිරීමට පමණක් සීමා නොවී, සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන්, නියෝජිතයන් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේදී මාධ්‍ය ආයතන වෙත පැවරෙන වගකීම සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරන ලද අතර,මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලද 'මාධ්‍ය උපමාන' වලට එකඟව කටයුතු කිරීමෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට සහායවන ලෙසද ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී.

112. මාධ්‍ය උපමානවලට අනුකූල නොවන ලෙස කටයුතු කරන ආයතන සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන්, විවිධ මහජන සංවිධාන මෙන්ම පොදු ජනතාවගෙන්ද විවිධ පැමිණිලි ලැබුණු අතර ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කරමින් එවැනි ප්‍රචාර නිවැරදි කිරීමට හා සමහර ප්‍රචාරණ කටයුතු සීමා කිරීමටද අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ යටතේ තරග කරනු ලබන අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා වෙනත් අපේක්ෂකයකු විසින් කරනු ලබන කථා හෝ පළකරනු ලබන දැන්වීම් ප්‍රචාරය නොකරන ලෙස ද අදාළ ආයතන වෙත දන්වන ලදී. මෙම කරුණු ඇතුළත් අති විශෙෂ ගැසට් නිවේදනයක් 2014.12.24 දිනෙන් යුතුව අංක 1894/18 ගැසට් පත්‍රයේ පළ කිරීමට ද කටයුතු කරන ලදී. එම ගැසට් නිවේදනය, ***උපලේඛන අංක හත*** ලෙස මෙයට යා කර ඇත.

113. මෙයට පෙර පැවති ඡන්ද විමසීම් හා සසඳා බලන විට මෙම ඡන්ද විමසීමේදී මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මාධ්‍ය උපමාන කෙරෙහි බොහෝ ආයතන අනුගතවී ක්‍රියාත්මක වූ බව දක්නට ලැබුණු අතර, ක්ෂණිකව ක්‍රියාත්මක වී අදාළ කටයුතු සීමා කිරීමට ගත් පියවර නිසා, කිසියම් ප්‍රමාණයකට හෝ මාධ්‍ය කටයුතු හසුරුවා ගත හැකිවූ බවද විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීම.

114. ජනාධිපතිවරණයට පූර්වයෙන් පැවති පළාත් සභා ඡන්ද විමසීම්වල දී දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් රාජ්‍ය දේපළ අවභාවිතය කිරීම නිසා මුහුණදීමට සිදුවූ ගැටළුකාරී තත්ත්වය සැලකිල්ලට ගෙන, ජනාධිපතිවරණ ඡන්ද විමසීම ආරම්භයේදීම, මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කිරීමට පියවර ගන්නා ලදී.

115. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාවට අනුව තරග කරනු ලබන යම් අපේක්ෂකයකු තෝරාපත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් හෝ වළක්වාලීමේ කාර්ය සඳහා රජයට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් භාවිතා කිරීම වළක්වාලීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයාට බලය පැවරී ඇත. ඒ අනුව ජනාධිපතිවරණයට අදාළව රාජ්‍ය දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දක්වමින් ජනාධිපති ලේකම්වරයාට, අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්ට, විගණකාධිපති, අධ්‍යක්ෂ ජනරාල් (අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව), ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පති, සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හා සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට ***පිටපත් සහිතව***, රාජ්‍ය දේපළ භාරව සිටින රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ප්‍රධානීන් අමතා 2014.11.22 දින උපදෙස් නිකුත් කරන ලදී . අදාළ ලිපිය මෙම වාර්තාවේ ***අට වැනි උපලේඛනය*** ලෙස යාකොට ඇති අතර, මෙවැනි කරුණු පිළිබඳව මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන සියලුම විමසීම්වලට පිළිතුරු සැපයීම සඳහා වෙනම නිලධරයකු පත්කරන ලෙසත් එම නිලධරයා සම්බන්ධව තොරතුරු මැතිවරණ කොමසාරිස් වෙත දන්වා එවන ලෙසටත් රාජ්‍ය ආයතනවලට නියම කරන ලදි.

116. රාජ්‍ය සම්පත් අනිසි පරිහරණය වරදක් බව දැක්වෙන ඉහත 115 කරුණට අදාල ලිපියේ පිටපත් තවදුරටත් සියලුම පිළිගත් දේශපාලන පක්ෂ හා දේශපාලන පක්ෂ නිත්‍ය නියෝජිතයන් වෙත මෙන්ම සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වෙතද යවන ලදී. ඒ හේතුවෙන්ම විවිධ රාජ්‍ය ආයතන වෙතින් තහනම් කර ඇති ක්‍රියා සිදුවන බවට දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන මෙන්ම සාමාන්‍ය මහජනතාවගෙන්ද මැතිවරණ මහලේකම් කාර්යාලයට මෙන්ම, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල පිහිටුවා තිබූ පැමිණිලි මධ්‍යස්ථානවලටද බොහෝ පැමිණිලි ගලා එන්නට විය. එලෙස ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් අදාළ ආයතන තවදුරටත් විමසා තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසුව නිකුත් කර ඇති උපදෙස් කඩකර ඇති බව අනාවරණය වූ අවස්ථාවල දී ඒවා වහාම නතර කිරීමට අදාළ වගකිව යුත්තන්ට නියෝග කරන ලදි.

117. රාජ්‍ය ආයතන සතු සියළුම නිශ්චල හා චංචල දේපළ දේශපාලන කටයුතු සඳහා භාවිතය, රජයේ මුදල් වැය කරමින් උත්සව පවත්වා ජනතාව අතර විවිධ භාණ්ඩ බෙදා දීම හා ඔවුන්ට විශේෂ සහන සැලසීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රජයේ නිලධාරීන් දේශපාලන කටයුතු සඳහා යොදවා ගැනීම, රාජ්‍ය සේවය සඳහා පුද්ගලයින් අලුතෙන් බදවා ගැනීම් මෙන්ම නිලධාරීන්ට උසස්වීම් ලබාදීම, ස්ථානමාරු කිරීම් යනාදිය යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්කිරීම සඳහා සිදු කිරීමද තහනම් කරමින් නියෝග නිකුත් කරන ලදි.

118. දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරීන් වුවද සිය කාර්යාල වේලාව තුළ හෝ නිවාඩු පිට මැතිවරණයක් වෙනුවෙන් ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන් හෝ දේශපාලන පක්ෂ ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා නොකළ යුතු ය. සාම නිලධාරීන් ගණයට අයත් කිසිදු රාජ්‍ය නිලධාරීයෙකුට දේශපාලන අයිතිවාසිකම් නොමැත. එසේම රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන්ටද දේශපාලන අයිතිවාසිකම් හිමි නොවේ. මේ තත්ත්වය සම්බන්ධයෙන් ස්වකීය කාර්ය ස්ථානවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා උපදෙස් එම ආයතන ප්‍රධානීන් වෙත මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලදි.

119. ඡන්ද විමසීම් කාලය තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මගින් උත්සව සංවිධානය කිරීමේදී තේරීම්භාර නිලධාරිවරයාද වන දිස්ත්‍රික් ලේකම් මෙන්ම, මූලික සංවිධාන කටයුතුවල නිරත වන සහකාර තේරීම්භාර

නිලධරයන් වශයෙන් කටයුතු කරන සෙසු මාණ්ඩලික නිලධරයන් ද සහභාගි කරවා ගැනීම නතර කිරීමට උපදෙස් දීමටද මැතිවරණ කොමසාරිස්වරයාට සිදුවිය.

මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යංශය

120. ඡන්ද විමසීම් නීතිය බලාත්මක කිරීමට නම් ඡන්ද විමසීම් නීතිය හැල්ලුවට ලක්කරමින් සිදු කෙරෙන ක්‍රියා ක්ෂණිකව දැන ගැනීමේ සහ ඒ සඳහා වහාම පිළියම් යෙදීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වියයුතුවාක් මෙන්ම, එසේ නීතිය ක්‍රියාත්මක කරන බවට පැමිණිලි පාර්ශ්ව දැනුවත් කිරීමද අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව පූර්ව ඡන්ද විමසීම්වල දී මෙන්ම මෙවරද, මැතිවරණ මහලේකම් කාර්යාලයේ ජාතික පැමිණිලි මධ්‍යස්ථානයක් මැතිවරණ කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ පිහිටුවන ලදි. පසුගිය ඡන්ද විමසීම් කිහිපයක පැමිණිලි මධ්‍යස්ථානය භාරව කටයුතු කළ අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකුගේ හා විශ්‍රාමික සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් තිදෙනෙකු යටතේ වන සහාය කාර්ය මණ්ඩලයක්ද යොදා නාමයෝජනා දැන්වීම ප්‍රකාශයට පත්කිරීමත් සමගම පැමිණිලි භාරගැනීම සඳහාවූ එම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. පොලිස්පතිවරයා සමග සාකච්ඡා කොට ජාතික පැමිණිලි මධ්‍යස්ථානයට නියෝජ්‍ය පොලිස්පතිවරයකු හා පොලිස් අධිකාරිවරයකු යටතේ වන පොලිස් නිලධාරි කණ්ඩායමක්ද අනුයුක්ත කරවන ලදී. නාමයෝජනා භාරගැනිමෙන් පසුව තරග කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ටද එම කටයුතු නිරීක්ෂණයට අවසර ලබාදුන් අතර දේශීය නිරීක්ෂණ සංවිධානවලටද ඒ සඳහා සහභාගීත්වය ලබාදිය හැකි බව දන්වන ලදි. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි ප්‍රධානත්වයෙන් සහ පොලිස් අධිකාරි හෝ සහකාර පොලිස් අධිකාරි මට්ටමේ නිලධාරියකු යටතේ ක්‍රියාත්මක වන පොලිස් ඒකකයක්ද සහිතව දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථානයක් බැගින්,සෑම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලයකම ස්ථාන ගතකරනු ලැබීය. ඒ සඳහාද තරග කරනු ලබන දේශපාලන පක්ෂ නියෝජිතයන්ට මෙන්ම දේශීය නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ටද සහභාගිවීමට අවසරය ලැබුණි.

121. ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ පැමිණිලි මධ්‍යස්ථාන පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ ඡන්ද විමසීමකදී සිදුවන ප්‍රචණ්ඩකාරී ක්‍රියා හා නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි භාරගැනීමත්, ඒවාට සාධාරණ අන්දමින් විසඳුම් ලබාදීමත්ය. විශේෂයෙන්ම ඡන්දදායකයාට නිදහසේ සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබාදීමත්,දේශපාලන පක්ෂ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම හෝ ඔවුන් අගතියට පත් කිරීම අවම කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමත් මෙම වැඩපිළිවෙල මගින් අපේක්ෂා කරන ලදි. දුර බැහැර ගෙවා, වියදම් දරා පොලිස් ස්ථානවලට ගොස් පැමිණිලි ඉදිරිපත් කිරීම ඡන්දදායකයාට පහසුවෙන් කළ හැකි දෙයක් නොවේ.ඒ නිසා සියලු දෙනාටම පහසුවෙන් සිය පැමිණිලි ඉදිරිපත් කිරීමට මෙන්ම, ඒ සඳහා ඉක්මණින් විසඳුමක් ලබාගැනීමට හැකි සෑම ඉඩ ප්‍රස්තාවක්ම ලබාදීමට ද මෙම පැමිණිලි මධ්‍යස්ථාන මගින් හැකි විය. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට සුදුසු පසුබිම ගොඩනැගීම මෙහි මුඛ්‍ය පරමාර්ථය විය.

122. නාමයෝජනා භාර ගැනීම අවසන් වූ වහාම දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථානයට අමතරව දිස්ත්‍රික්කවල භූ විෂමතාව හා දුෂ්කරතා හඳුනා ගෙන, පසුගිය ඡන්ද විමසීම්වල අත්දැකීම් අනුව විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතු බවට හඳුනාගත් ප්‍රදේශ සඳහා සහකාර තේරීම්භාර නිලධරයකුගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය මට්ටමේ පැමිණිලි විමර්ශන මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී. මෙම විශේෂිත මධ්‍යස්ථානවලට අමතරව ඡන්ද විමසීම් දිනට පෙර දින හා ඡන්ද විමසීම් දින කටයුතු ආවරණය කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලද පිහිටුවනු ලැබීය. එම කාර්යාල වෙත ද ඡන්ද විමසීමට අදාළ පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව තිබුණි. බොහෝවිට මේවා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිතව ස්ථානගත කරනු ලැබීය. ප්‍රාදේශීය පැමිණිලි මධ්‍යස්ථාන සඳහා පොලිස් පරීක්ෂකවරයකු හෝ උප පොලිස් පරීක්ෂකවරයකු යටතේ පොලිස් නිලධාරි කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතු ආරක්ෂක ඒකකයක් ද පිහිටුවන ලදී.

123. මෙම සියළුම පැමිණිලි මධ්‍යස්ථාන සඳහා පැමිණිලි පහසුවෙන් යොමු කළ හැකිවන පරිදි, දුරකථන, ෆැක්ස් පහසුකම් සලසා තිබුණු අතර, මේ ස්ථාන හා ඒවායේ දුරකථන, ෆැක්ස් අංක ආදී තොරතුරු මාධ්‍ය

නිවේදන මගින් ප්‍රසිද්ධ කරන ලදී. එමෙන්ම පැමිණිලි ලිඛිතව, ෆැක්ස් මගින් හෝ අදාළ පැමිණිලි මධ්‍යස්ථාන වෙත පැමිණ හෝ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසුණි.

124. මෙම සංවිධාන ව්‍යූහය නිසා ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අප්‍රමාදව පරීක්ෂණ කටයුතු සඳහා නිලධාරීන් යෙදවීමේ හැකියාව උදාවිය. ජාතික පැමිණිලි මධ්‍යස්ථානයට කිසියම් දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබුණු විට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාද දැනුවත් කොට දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථානය හරහා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා ඍජුවම අදාළ පොලිස් ස්ථානය දැනුවත් කොට අදාළ පැමිණිල්ල සම්බන්ධ පරීක්ෂාවන් සිදු කිරීමට අවස්ථාව සලසා ගතහැකි විය. මෙම ක්‍රියාදාමය තුළින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා බාධාවිය හැකිව තිබූ ගැටළු රාශියකට අප්‍රමාදව විසඳුම් ලබාගත හැකි විය.

125. ඡන්ද විමසීම් දිනට පෙරදින හා ඡන්ද විමසීම් දින, සියලුම පැමිණිලි මධ්‍යස්ථාන සඳහා වැඩි නිලධාරීන් හා පොලිස් නිලධාරීන් පිරිසක් යොදවා අදාළ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා පියවර ගන්නා ලදී. විශේෂයෙන්ම ඡන්ද විමසීම් දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටි ජාතික පැමිණිලි මධ්‍යස්ථානය වෙනුවෙන්ද නිලධාරීන් හා අනෙකුත් අවශ්‍ය පහසුකම් වැඩි කරන ලදී. ඒ තුළින් පැමිණිලි ලබාගැනීම හා ඒවා පිළිබඳ සොයා බැලීම පහසුවෙන් කළ හැකි විය. ලැබෙන පැමිණිලි ලේඛනගත කරගැනීමත්, ඒවායේ පිටපත් දේශපාලන පක්ෂ නියෝජිතයන් වෙත හා නිරීක්ෂකයන් වෙත යොමු කිරීමත් ඒ අවස්ථාවේදීම සිදුකරන ලදී. ඒ ආකාරයෙන්ම අදාළ පැමිණිල්ල සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී හෝ පොලිසිය ක්‍රියාත්මක වූ ආකාරය හා ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් හැකි ඉක්මණින් ජාතික පැමිණිලි මධ්‍යස්ථානයට වාර්තා කළ යුතු බවට උපදෙස් ලබාදී තිබූ අතර එවැනි පිළිතුරු ලද පසු ඒවායේ පිටපත් දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධානවලට ලබාදී, ඔවුනට අදාළ තොරතුරු තහවුරු කර ගැනීමටද ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ලදී.

126. ජාතික පැමිණිලි මධ්‍යස්ථානය මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටවූ 2014.11.22 දින සිට ඡන්ද විමසීම් දින දක්වා වූ කාලය තුළ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව හා අදාළ වර්ගීකරණය අංක VIIIසටහනෙහි දක්වා ඇත.

ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාල සීමාවේ දී සිදුවූ ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමට අදාල සුවිශේෂී අවස්ථා

127.1 ජනාධිපතිවරණ ඡන්ද විමසීම පැවති 2015.01.08 දිනට පූර්වයෙන් වූ (2015.01.02 සිට 2015.01.07 දින දක්වා) කාල සීමාව තුළ රටපුරා භීෂණ තත්ත්වයක් ඇති කොට, දේශපාලඥයන් ඝාතනය කිරීමට සැලැස්මක් ඇති බව ද, නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි ලේකම් විසින් ලිඛිතව දන්වා තිබූ අතර, ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොලිස්පතිවරයා දැනුම්වත් කල අතර, පොලිස්පතිවරයා විසින් පියවර ගනු ලැබූ අතර, එකී කාලසීමාව තුළ රටේ නීතිය සහ සාමය ආරක්ෂා කිරීමට පොලිස් විශේෂ කාර්ය බලකායේ සහාය ඇතිව පොලීසිය ක්‍රියාකරන ලදී. එමෙන්ම, පොලිස්පති විසින් ජනාධිපතිවරණයට අදාල කටයුතු විපරම් කිරීම සහ කැරලි මර්ධනය සඳහා 32,000 ක පොලිස් බලඇණියක් යෙදවීමද පැසසිය යුත්තකි.

127.2 ගාල්ල වඳුරඹ ප්‍රදේශයේදී එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු මහජනතාව ඇමතීම සඳහා සකස් කරන ලද වේදිකාව රැස්වීම් පැවැත්වීමට නියමිත දිනට පෙර දින ප්‍රතිවිරුද්ධ පාර්ශ්වකරුවන් විසින් ගිනි තබා විනාශ කරන ලද අතර, එම ස්ථානයේ සිටම මහජනතාව ඇමතීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමට, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයා හා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාකරන ලදි.

127.3 හදිසි ගංවතුර හේතුවෙන් ඇතිවූ ආපදා කළමනාකරණය සඳහා,ආරක්ෂක අංශ කටයුතු කල අතර, එවැනි කටයුතුවලදී අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා එම අරමුදල් යෙදවීමට උත්සහ දරන ලද අවස්ථා පිළිබඳ ලද පැමිණිලි මත එවැනි ක්‍රියා මැඩපැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාකරන ලදි.

127.4 ජනාධිපතිවරණයට තරග කරන ලද එක් අපේක්ෂකයෙකුට, එක් ජන සමූහයක සහාය ලබාගැනීමට අත්සන් කල බවට දැක්වෙන (පසුව ව්‍යාජ ලේඛනයක් බවට වාර්තාවූ) ලියවිල්ලක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තැපැල් පහසුකම් ඔස්සේ අදාල ලිපි තැපැල් කිරීමට දරන ලද උත්සාහයක් ව්‍යාර්ථ කිරීමට ක්‍රියාකරන ලදී.

127.5 මුද්දර සහිත ලිපි කවර අපේක්ෂක ප්‍රවර්ධන පත්‍රිකාද ඇතුළත් කර ආරක්ෂක අංශ සාමාජිකයන්ගේ පවුල් ඒකක වෙත (“සුරක්ෂිත හෙටක්” හා “සුභ අනාගතයක්” යනුවෙන් සඳහන්) තැපෑලෙන් බෙදාහැරීමට ගන්නා ලද උත්සාහය, මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි, තැපැල්පතිවරයාගේ මැදිහත්වීම මත වලකා ගැනීමට හැකිවිය.

127.6 උතුරු කොළඹ මාලිගාවත්ත, සෝමාලෝක විහාරස්ථානයේ සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට, සිල් රෙදි බෙදාදීමක් පිළිබඳව පළමු වරට පැමිණිලි ලැබුණු අතර, රටේ බොහෝ ප්‍රදේශවල එවැනි කටයුත්තක් සිදුකල හැකි වූ හෙයින්, එවැනි කටයුතු මැඩ පැවැත්වීම පිළිබඳ පොලිසිය හා අනෙකුත් මැතිවරණ පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීමට කටයුතු කරන ලදි. රුපියල් මිලියන 600ක මුදලක්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබාගෙන, එම මුදලින් සිල් රෙදි බෙදාදීමට ක්‍රියාකිරීමට එරෙහිව, කොළඹ මහාධිකරණයේ මූල්‍ය අපරාධ පරීක්ෂණ කොට්ඨාසය (FCID) ගොනුකළ නඩුවෙන් විත්තිකරුවන් වැරදිකරුවන් බවට තීන්දු කිරීමෙන් අනතුරුව, ඒ තීන්දුවට එරෙහිව අභියාචනාව, උපරිමාධිකරණයේ විභාග වෙමින් තිබේ.

127.7 ජනාධිපතිවරණයට පෙර පැය 48ක් තුළ ප්‍රචාරක කටයුතු අත්හිටුවා තිබූ නිහඬ කාලසීමාව තුළ රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකා හරහා ඡන්ද සලකුණු/ අපේක්ෂක ඡායාරූප යනාදිය ප්‍රදර්ශනය කරමින් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා පූර්වයෙන් ප්‍රචාරය කරන ලද වාර්තාමය වැඩසටහන්, චිත්‍රපට, සංගීත සංදර්ශන යනාදිය පමණක් නොව ආගමික වැඩසටහන්, නක්ෂත්‍ර අනාවැකි, මත විමසුම් ප්‍රතිඵල වැනි වැඩසටහන්ද ප්‍රචාරය කිරීමේ ප්‍රයත්න වැලැක්වීමට සිදුවිය. ඒ සඳහා මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් පමණක් නොව මැතිවරණ කොමසාරිස්වරයාටද මැදිහත්වීමට සිදුවිය.

127.8 ජනාධිපතිවරණයේදී තරග කරනු ලබන අපේක්ෂකයන්ට සහාය ලබාගැනීම පිණිස පවත්වනු ලබන අවසරලත් ප්‍රචාරක රැස්වීම්වල දී හැර වෙනත් ස්ථානවල, විශේෂයෙන් අපේක්ෂකයන්ගේ ඡන්ද කාර්යාලවල ප්‍රචාරක වීඩියෝ චිත්‍රපට පෙන්වීමෙන් වැලකී සිටිය යුතුය යන නියමය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් ඡන්ද කාර්යාලයක දිගින් දිගටම කඩකරමින් සවස් කාලයේදී හා රාත්‍රියේදී වීඩියෝ දර්ශන ප්‍රදර්ශනය කරන බවට ලද පැමිණිලි සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගන්නා බවට නැවත නැවත පැමිණිලි ලැබුණි. මේ පිළිබඳව සොයා බැලීමට දිස්ත්‍රික් පැමිණිලි විමර්ශන කාර්යාංශයේ නිලධරයන් ද පොලිස් නිලධාරීන් සමග ඒ විෂය භාර සහකාර තේරීම්භාර නිලධාරීන්ට ද ත්‍රිකුණාමලය සහකාර මැතිවරණ කොමසාරිස්වරයාටද තැපැල් ඡන්ද නිකුත් කිරීමට පෙර දින රාත්‍රියේ යාමට සිදු වී තිබේ. එහිදී සිදුවෙමින් පැවති අනීතික ක්‍රියා අත්හිටුවන ලෙස දැනුම් දීමේදී ගැටුම්කාරී තත්ත්වයක් ඇති වී ඇති අතර සහකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් එම සිද්ධියට අදාලව කරන ලද පැමිණිල්ල සටහන් කර ගැනීම සඳහා පසු දින අළුයම පහ පමණ දක්වා ත්‍රිකුණාමලය පොලිස් ස්ථානයේ රැඳී සිටීමටද, පසුදින සිදුකිරීමට නියමිත තැපැල් ඡන්ද නිකුත් කිරීමේ කාර්යයේ යෙදීම වෙනුවට මැතිවරණ නිලධාරීන්ට අධිකරණ ක්‍රියාමාර්ගවලට අදාල මූලික කටයුතුවලට එළඹීමටද සිදුවිය. මෙම සිද්ධියට සම්බන්ධවූ දේශපාලනඥයෙකු විසින් නිලධාරීන්ට එරෙහිව කරන ලද පැමිණිල්ල ඉදිරියට ගෙන යාමට තරම් කරුණු නොමැති බවට පසුව පැවති නඩු දිනයකදී අධිකරණය

තීරණය කර ඇත. අනීතික ප්‍රචාරණ කටයුතුවල නිරතවීමට අදාළව මැතිවරණ නිලධාරීන් කරන ලද පැමිණිල්ලේ විභාගය තවමත් අවසන් වී නැත.

127.9 ජනාධිපතිවරණ දිනයේ දී, එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකු පිළිබඳව ප්‍රමුඛ දේශපාලනඥයෙකු කළ ප්‍රකාශයක් ප්‍රචාරය කිරීම නැවැත්වීම සඳහා, මැතිවරණ කොමසාරිස්වරයා ස්වකීය සහාය නිලධාරීන් සමග ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට ගොස් එකී ප්‍රචාරය අත්හිටුවීමට කටයුතු කරන ලදී.

127.10 සමෘද්ධි අරමුදල යොදාගනිමින් එක් ජනාධිපතිවරණ අපේක්ෂකයෙකුගේ රූප ඇතුළත් කොට මුද්‍රණය කරන ලද ලිත් බෙදාහැරීමට ගත් උත්සාහය, මැතිවරණ කොමසාරිස්වරයා මැදිහත්වී, නවතාලීමට හැකිවීය.

127.11 ඡන්ද පත්‍රිකා හා ඡන්ද පෙට්ටි නිකුත් කිරීමට පෙර දින එනම්, 2015 ජනවාරි මස 06 වැනි දින කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රදේශයේ ඡන්ද දායකයින්ට බලපෑම් කරමින්, ප්‍රදේශය පුරා සිදුකරන ලද අනීතික ක්‍රියා වැලැක්වීම සඳහා, කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයාටද මැදිහත්වීමට සිදුවිය.

127.12 2015.01.08 දින පැවති, ජනාධිපතිවරණයේ ඡන්ද විමසීමට දින තුනකට පෙර රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රදේශයේ සිද්ධ වූ කලහාකාරී සිද්ධියක් හේතුවෙන්, ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ එක් අපේක්ෂකයෙකුගේ ආධාරකරුවෙකු මියගිය අතර ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාල සීමාව තුළ සිදු වූ එම මනුෂ්‍ය ඝාතනය පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග තවමත් අවසන් වී නැත.

VII වන කොටස

අපේක්ෂක හිමිකම්

අපේක්ෂකයන් සඳහා ගුවන් විදුලි හා රූපවාහිනි ප්‍රචාරක පහසුකම් ලබාදීම.

128. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 117 වන වගන්තියට අනුව නාමයෝජනා භාරදීමේ දින සිට සතියක් ඇතුළත ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාවෙන් හා ගුවන් විදුලි සංස්ථාවෙන් ගෙවීමක් නොමැතිව ගුවන් විදුලි හා රූපවාහිනි ප්‍රචාරක පහසුකම් ඉල්ලුම් කිරීමට අපේක්ෂකයන්ට අවස්ථාව සලසා ඇත. මේ අනුව එක් අපේක්ෂකයකුට එම සංස්ථා දෙකෙන් විනාඩි 90ක් බැගින් වූ ගුවන් කාල දෙකක් භාවිතාව සඳහා ඉඩ ලැබුණි. අදාළ විනාඩි 90ක ගුවන් කාලය, විනාඩි 15කට නොඅඩු හා විනාඩි 30කට නොවැඩි වූ ගුවන් කාලයක් ඉක්මවා නොයන සේ අවස්ථා 3කදී භාවිතයට අදාළ පාර්ශ්වවලට ඉඩ ලැබේ. එසේම අදාළ නිදහස් ගුවන් විදුලි හා රූපවාහිනි ප්‍රචාරය කිරීමේ කාලසීමාව ඡන්ද විමසීම් දිනට පැය 72කට පෙර අවසන් විය යුතු බවද පනතේ සඳහන් වේ.

රූපවාහිනි ප්‍රචාරය සිදු කෙරෙන අවස්ථාවලදී අපේක්ෂකයන්ගේ ඡායාරූපය හා ඡන්ද ලකුණද ප්‍රචාරය කළ හැකි බවට ද තමාට නියමිත මිනිත්තු 90ක කාලය අවස්ථා තුනක දී ලබාගන්නේ නම් සහ එහි දී අනෙක් ජාතික භාෂාවෙන්ද කථා කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා වෙනත් කථිකයකුගේ ආධාරය ලබාගත හැකි බවටද තම ගුවන්විදුලි හෝ රූපවාහිනි ප්‍රචාරණයේ දී පක්ෂ ප්‍රතිපත්තිවලට අදාළ කරුණු හැර අපේක්ෂකයන්ගේ චරිත ඝාතනය වන ආකාරයේ අදහස් ප්‍රකාශ කරනු නොලැබිය යුතු බවත්,යම් හෙයකින් එවැනි දේ ප්‍රකාශ කළ හොත් ඒවා මාධ්‍ය මගින් විකාශය නොකරන බවද යන්න සම්බන්ධයෙන් අපේක්ෂකයන් දැනුවත් කෙරිණි.

ඒ අනුව 2014.12.11 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදී එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් පැමිණ සිටි නියෝජිතයන් හමුවේ කුසපත් ඇදීමෙන් එක් එක් අපේක්ෂකයාට හිමිවූ නිදහස් ගුවන් විදුලි හා රූපවාහිනි කාලසීමාව තීරණය කරන ලද අතර ඒ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග රූපවාහිනි සහ ගුවන් විදුලි සංස්ථාවල සභාපතිවරුන්ද සහභාගි විය. ඒ අනුව තරග කරනු ලැබූ අපේක්ෂකයන් 19 දෙනා වෙනුවෙන් වෙන්කරන ලද මුළු ගුවන් ප්‍රචාරණ කාලය පැය 28 කුත් මිනිත්තු 30ක් විය.

ඡන්දදායකයන් වෙත ගාස්තුවකින් තොරව තැපෑලෙන් සංදේශයක් යැවීමට අපේක්ෂකයන්ට ඇති පහසුකම්

129. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 114 වන වගන්තියට අනුව නාමයෝජනා භාරගැනීමේ දින සිට ඡන්ද විමසීම් දිනට දින 10කට පෙර දක්වා වූ කාලය තුළ, ඡන්ද විමසීමට අදාළ වූ සංදේශයක් තැපැල් ගාස්තුවකින් තොරව ඡන්දදායකයා වෙත යැවීමට අපේක්ෂකයන්ට හිමිකම ඇත.

130. මේ අනුව අදාළ සංදේශ යැවීමේදි තැපෑලට භාරදීම කෙසේ වියයුතුද යන්න හා සංදේශයේ ස්වරූපයට අදාළ කොන්දේසි තීරණය කිරීම තැපැල්පතිවරයා විසින් කළයුතු වේ. මේ සම්බන්ධයෙන් අපේක්ෂකයන් දැනුවත් කරමින් තැපැල්පතිවරයා විසින් 2014.11.28 දින යවන ලද ලිපියට අනුව සංදේශය බර ග්‍රෑම් 30 හෝ ඊට අඩුවිය යුතු බවත්, මිලි මීටර 300X 100 දිග, පළලින් යුක්ත වියයුතු බවටත් දන්වා ඇත. තවද අදාළ සංදේශ ඒ ඒ දිස්ත්‍රික්කවලදී භාරදිය යුතු තැපැල් කාර්යාල මොනවාද යන්නද එම ලිපියේ සඳහන් කර තිබිණි. ඡන්දදායකයන්ට මෙම සංදේශ යැවීම සඳහා ඡන්දදායකයන්ගේ ලිපින පහසුවෙන් මුද්‍රණය කර ගත හැකි තොරතුරු ඇතුළත් සංයුක්ත තැටි අපේක්ෂකයන් විසින් මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් මිලදී ගන්නා ලදී. ඡන්ද විමසීම් දිනට පෙර, දහවන දිනට පසුව මෙම සංදේශ තැපැල් කාර්යාල වෙත පිළිගනු නොලැබිය යුතු අතර, ඡන්ද විමසීම් දිනට දින පහකට පෙරාතුව වූ කාලය තුළ මෙම සංදේශ බෙදීම නතර කළ යුතු බවට නීතියේ සඳහන්ව ඇත.

131. අපේක්ෂකයන්ට ප්‍රචාරක රැළි පැවැත්වීම සඳහා ශාලා පහසුකම් හා ක්‍රීඩා භූමි වෙන් කිරීම්වල දී මහරගම, මොරටුව, පැල්මඩුල්ල ඇතුළු පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා භූමි සහ ශාලා වෙන් කිරීම් නිසි පරිදි, සියලුම අපේක්ෂකයන්ට සාධාරණව වෙන්කිරීම සිදුවන්නේදැයි සොයා බැලීමට මැතිවරණ කොමසාරිස්වරයාට ද මැදිහත්වීමට සිදුවිය. මේ කාර්ය ඉටුකිරීමේ දී දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයින්ගේ හා ලේකම්වරුන්ගෙන් ලද සහාය, එම ගැටළු විසඳා ගැනීමට බෙහෙවින් උපකාරී විය.

VIII*වන කොටස*

ඡන්ද විමසීම

132. ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ ප්‍රමුඛතම කාර්යයක් ලෙස ගැනෙන ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින්, සෙසු කාර්ය මණ්ඩලය හා ඡන්ද පත්‍රිකා ඇතුළු බඩු බාහිරාදිය ඡන්ද පොළ වෙත යැවීම ඡන්ද විමසීම් දිනට පෙරදින එනම් 2015.01.07 දින සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල මට්ටමින් සිදු කෙරිණි.

133. ඡන්ද විමසීම් දිනට පෙර දින ඡන්ද පොළවල් කරා ගමන් කරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් මෙන්ම ඡන්ද මධ්‍යස්ථාන කටයුතු අධීක්ෂණය පැවරී ඇති කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන්ද අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලය වෙත වාර්තා කළ යුතු ය. එසේ වාර්තා කරනු ලබන සියලුම නිලධාරීන්, ඡන්ද විමසීම් දින ඡන්ද පොළේ දී කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරීන් විසින් තවදුරටත් දැනුවත් කිරීමේ සාකච්ඡාවකින් පසුව එම නිලධාරීන්ට විධිමත් පත්වීම් ලිපි ලබාගැනීමට අවස්ථාව සලසන ලදී. පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම අදාළ නිලධාරීන් සේවය කරනු ලබන ඡන්ද පොළවල් පිළිබඳ විස්තර ඡන්ද විමසීම් දිනට පෙර කිසිවෙකුට දැනගැනීමට ඇති ඉඩකඩ වළක්වාලීම මෙම වැඩපිළිවෙලහි අරමුණ විය.

134. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් තමන් පත්කරනු ලැබ ඇති ඡන්ද පොළවල් අනුව අදාළ භාණ්ඩ භාරගැනීමේ මධ්‍යස්ථානයෙන් නියමිත බඩු බාහිරාදිය භාරගෙන ඔවුන් වෙත අනුයුක්ත කරන ලද වාහනවලින්, තම සහායක නිලධරයා සහ පොලිස් නිලධාරීන්ද කැටුව නියමිත ඡන්ද පොළ වෙත යැවීමට අවශ්‍ය වැඩපිළිවෙල යොදා තිබුණි. උතුරු පළාතේ සමහර ඡන්ද පොළවල් වෙත ඡන්ද පෙට්ටි ඇතුළු නිලධාරීන් ප්‍රවාහනය කිරීම සඳහාත්, ඡන්ද විමසීමෙන් පසුව ඡන්ද පෙට්ටි, බඩු බාහිරාදිය හා කාර්ය මණ්ඩලය ආපසු ගෙන්වා ගැනීම සඳහාත් නාවික හමුදාවේ සහාය ලබා ගැනීමට සිදු විය.

135. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් හැර සෙසු ඡන්ද පොළ කාර්ය මණ්ඩලය පොදු ප්‍රවාහන පහසුකම් උපයෝගි කරගෙන ඡන්ද පොළ වෙත වාර්තා කළ යුතු විය. එවැනි පොදු ප්‍රවාහන පහසුකම් දුර්වල මට්ටමක පැවති ප්‍රදේශවල ඡන්ද පොළවල් කරා අදාළ නිලධාරීන් ප්‍රවාහනය සඳහා තේරීම්භාර නිලධාරී විසින්ම ප්‍රවාහන පහසුකම් සලසන ලදී. සියලුම නිලධාරීන් ඡන්ද විමසීම් දිනට පෙර දින පස්වරු 2.00 ට පෙර අදාල ඡන්ද පොලට වාර්තා කොට, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පවත්වනු ලබන ඡන්ද විමසීම පිළිබඳ පෙරහුරුවට සහභාගිවිය යුතු බවටද කාර්ය මණ්ඩලයට උපදෙස් දෙනු ලැබිණි. ඡන්ද විමසීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් මධ්‍යස්ථාන වෙත නියමිත වේලාව වන විට වාර්තා කර, ඔවුන් පෙරහුරුවටද සහභාගි වූ බවට සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සනාථ කරන ලදී.

136. සියලුම දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතින්, පස්වරු 2.00 වන විට ඡන්ද පොළවල් වෙත වාර්තා කරන ලද බවට සහකාර තේරීම්භාර නිලධාරීන්ගේ වාර්තාවලින් තහවුරු විය. ඡන්ද පොළවල් අධීක්ෂණය භාර නිලධාරීන්ද අදාළ ඡන්ද පොළවල් අධීක්ෂණය කර අඩුපාඩු ඇත්නම් ඒවාද සම්පූර්ණ කිරීමෙන් පසු,සිය පළමුවන පණිවුඩය තේරීම්භාර නිලධාරීන්ට එවිය යුතු විය. සියලුම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් ඇතුළු කාර්ය මණ්ඩලය ඡන්ද පොළවල් කරා වාර්තා කර ඇති බව හා ඊට පසු දින ඡන්ද විමසීම් ආරම්භ කිරීම සඳහා සියල්ල සුදානම් බවතේරීම්භාර නිලධාරීන් වෙත එම පණිවිඩයෙන් වාර්තා කිරීමට නියමවී තිබුණි.

137. ඡන්ද පොළවල් සඳහා යොදාගන්නා සියලුම ගොඩනැගිලි ඡන්ද විමසීම් දිනට පෙර දිනවන විට ඡන්ද විමසීම සඳහා සූදානම්කර තබන ලෙස තේරීම්භාර නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම්වරු මගින් සියලුම ග්‍රාම නිලධාරීන් වෙත දැනුම්දී තිබූ අතර ඒ අනුව ඔවුන් විසින් ඡන්ද මධ්‍යස්ථාන පිළියෙල කරනු ලැබීය. කෙසේ වෙතත් ඡන්ද පොළ සකස් කර ඇති ආකාරය ඡන්ද දායකයාට බාධාකාරී වන බවට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට හැඟී ගියහොත් එය සුදුසු පරිදි නැවත සකස් කර ගන්නා ලෙසද උපදෙස් දෙන ලදී.

138. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයකු ඡන්ද පොළක් වෙත පැමිණීමෙන් පසු එය නිසි ලෙස සකස් කොට ඇත්ද යන්න පරීක්ෂා කිරීමෙන් පසුව,සෙසු කාර්ය මණ්ඩලයේ පැමිණීම ද සටහන් කරගත යුතු ය. තේරීම්භාර නිලධාරිගෙන් භාරගත් බඩු බාහිරාදිය නිසි ප්‍රමාණයෙන් ඇත්ද යන්න හා ඡන්ද පෙට්ටි නිසි ලෙස ක්‍රියාකාරීත්වයෙන් තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කොට සෑහීමට පත්විය යුතු ය. ඒවායේ අඩුවක් වේ නම්, තම මධ්‍යස්ථානයට අනුයුක්ත කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරි පැමිණි පසු, ඔහු දැනුවත් කර අවශ්‍ය දෑ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. මුද්‍රා තබා ලබාදෙන ඡන්ද පත්‍රිකා, නිල සලකුණු හා නොමැකෙන තීන්ත බහාලූ පැකැට්ටු විවෘත කිරීමකින් තොරව පරීක්ෂා කිරීමට නියම කොට තිබුණි. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි විසින් සියළුම නිලධාරීන් වෙත ලිඛිත උපදෙස් සපයා තිබුණද,කණිෂ්ඨ හා ලිපිකරු මට්ටමේ නිලධාරීන් සඳහා උපදෙස් පංති පවත්වා උපදෙස් ලබාදීමක් සිදු නොවූ බැවින්, එක් එක් නිලධරයා වෙත පැවරෙන කාර්ය භාරය විමසමින් ගැටළු පැහැදිලි කරදීම සඳහා පෙරහුරුවක් පැවැත්වීම, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ප්‍රධාන කාර්යයක් සේ සැළකේ. එමගින් ඡන්ද විමසීමට අදාළ නිලධාරීන්ගේ දැනුම පරීක්ෂා කිරීමට මෙන්ම අඩුපාඩු නිවැරදි කරගෙන පසුදින ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීමට මනා පිටුවහලක් විය.

139. පෙරහුරුව පැවැත්වීමෙන් පසු කාර්ය මණ්ඩලයට අයත් කාන්තා නිලධාරිණියන්ට ඔවුන් විසින් සොයාගත් නවාතැන් වෙත හෝ තම නිවෙස් වෙත යාමට අවස්ථාව සැලසීමටත්, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ඇතුළු පිරිමි නිලධාරීන් සියලු දෙනාම මධ්‍යස්ථානයේ රාත්‍රිය ගතකිරීමටත් අවශ්‍ය බවට උපදෙස් ලබා දී තිබිණි. අදාල සියලු නිලධාරීන් සඳහා අවශ්‍ය නවාතැන් පහසුකම් ඡන්දපොළේ සැකසීමත් අවශ්‍ය ආහාර පාන සැපයීමත් ඡන්ද පොළ කටයුතු භාර ග්‍රාම නිලධාරිගේ වගකීම විය.

140. ඡන්ද විමසීම් දිනට පෙර දින කලාප භාර සහකාර තේරීම්භාර නිලධාරීන් අදාළ ඡන්ද මධ්‍යස්ථාන වෙත චාර්තා කර, පසුදින ඡන්ද විමසීම නියමිත වේලාවට ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩලය මධ්‍යස්ථාන වෙත චාර්තා කර ඇත්ද යන්න හා අනෙකුත් සියළු කරුණු ද සලකා බලා, තේරීම්භාර නිලධාරි වෙත එවනු ලබන පණිවුඩය එම නිලධාරියාට ඉතා වැදගත්ය. ඊට හේතුව ඡන්ද විමසීම් දිනට පෙර සිදු කළ සියළු සංවිධාන කටයුතු සාර්ථක වූ බවට එම පණිවුඩය මගින් තහවුරු වීමයි.

ඡන්ද විමසීම් දිනය

141. ඡන්ද විමසීම් දින පෙරවරු 7.00ට එම කටයුතු ආරම්භ කළයුතු හෙයින් සියලුම කාර්ය මණ්ඩලය ඒ සඳහා සූදානම්ව පෙරවරු 6.00 වන විටත් ඡන්ද පොළ වෙත චාර්තා කොට ඊට අදාළ මූලික කටයුතු ඉටුකළ යුතු බවට තේරීම්භාර නිලධාරි විසින් කාර්ය මණ්ඩලයට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, ඡන්දදායකයන් වෙනුවෙන් වූ උපදෙස් නිසි ස්ථානවල ප්‍රදර්ශනය කිරීමටත්, ඡන්ද කුටි ආදිය නිසි ලෙස ස්ථානගත කිරීමත් ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීම සඳහා සූදානම් කිරීමටත් අවශ්‍ය කටයුතු ඉටුකළ යුතු විය. අපේක්ෂකයකු වෙනුවෙන් නියෝජිතයන් දෙදෙනෙකුට ඡන්ද පොළට පැමිණිය හැකි බවත් ඔවුනට නිරීක්ෂණ කටයුතු පහසුවෙන් සිදු කිරීම සඳහා, පෙරවරු 6.30 වනවිට ඡන්ද පොළවෙත චාර්තා කිරීම වැදගත් වන බවත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් අපේක්ෂකයන් මගින් නියෝජිතයින්ට දන්වා තිබුණි. ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර, ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමත්, ඡන්ද පොළ වෙත නිකුත් කර ඇති ඡන්ද පත්‍රිකා, නිල ලකුණු, තීන්ත හා ඡන්ද හිමි නාමලේඛන ආදිය පරීක්ෂාවත් සඳහා නියෝජිතයන්ට අවස්ථාව සලසන ලදී. ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමට පෙර ඡන්ද පෙට්ටිය තුළ කිසිවක් නොමැති බවට තහවුරු කර ගැනීමත් නියෝජිතයන්ට අවශ්‍ය නම් ඡන්ද පෙට්ටිය ඇතුළත වුවද තම මුද්‍රාවක් තැබීමටත් (ස්ටිකරයක් මගින්) අවස්ථාව සලසන ලදී. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීමෙන් පසුව නියෝජිතයන්ට ඡන්ද පෙට්ටියේ මතුපිට නැවත මුද්‍රා තැබීමටත් අවස්ථාව සලසන ලදී. නියෝජිතයන් විසින් එසේ තබන ලද සෑම මුද්‍රාවකම ආදර්ශයක්, ඒ අවස්ථාවේදීම ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාට භාරදියයුතු විය. ඊට අමතරව ඡන්ද පත්‍රිකාව පිටුපස තබනු ලබන නිල සලකුණ කුමක්ද යන්න තීරණය කරන ලද්දේද ඡන්ද විමසීම ආරම්භ කිරීමට මොහොතකට පෙර ඡන්ද පොළ තුළදීය. ඒ අනුව ඡන්ද පොළකට ඡන්ද පොළ පෝලිම් ප්‍රමාණය අනුව භාරදී ඇති නිල සලකුණු කීපයක් අතරින් අවශ්‍ය ප්‍රමාණය නියෝජිතයන් ඉදිරියේදී තෝරා ගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට උපදෙස් දී තිබුණි.ඡන්ද විමසීම

පිළිබඳ විශ්වාසය දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් අතර තහවුරු කිරීම මෙවැනි ක්‍රියා මගින් බලාපොරොත්තු විය.

142. 2015 ජනවාරි මස 08 දින පෙරවරු 7.00ට දිවයිනේ සියලුම ඡන්ද මධ්‍යස්ථානවලදී ඡන්ද විමසීම ආරම්භ විය. මෙහිදී ඡන්දදායකයන් 15,044,490ක් සඳහා ඡන්ද මධ්‍යස්ථාන 12314ක ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පහසුකම් සලසා තිබිණි. බොහෝ ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීම ආරම්භ වීමටත් පෙරසිටම ඡන්දදායකයන් එක් රොක්වී සිටි බවටද වාර්තා විය. ඡන්දදායකයන් ඡන්ද පොළවල් වෙත කල්වේලා ඇතිව යාම ඡන්දදායකයන්ට මෙන්ම ඡන්ද පොළ කාර්ය මණ්ඩලයටද පහසුවක් බව දන්වමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරන ලද දැනුම්දීමේ ප්‍රතිඵලයක් ලෙස එසේ වූවා විය හැකි ය.

143. කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් තමාට නියමිත ඡන්ද පොළවල් සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල සංචාරය කරමින්, තම නිරීක්ෂණ කටයුතුවල යෙදුනු අතර, ඊට අමතරව පොලිසියද ඡන්දපොළ තුළ රඳවා ඇති පොලිස් නිලධාරීන් මගින් මෙන්ම තම ජංගම පොලිස් රථ මගින් ඡන්ද පොළෙන් පිටත ඡන්ද විමසීමට අදාළ වැරදි සිදුවන්නේද යන්න නිරීක්ෂණය කරමින් සිය රාජකාරී කටයුතු සිදු කරන ලදී. ඒ අනුව ඡන්ද විමසීමේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යන බවට සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරීන් වාර්තා කර තිබිණි.

144. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාල පිහිටුවා,ඒවා මගින්, ඡන්ද විමසීම් දිනට පෙර දින මෙන්ම ඡන්ද විමසීම් දින ඡන්ද පොළවල් තුළ හෝ ක්ෂේත්‍රයේ සිදුවන සිද්ධීන් පිළිබඳ තේරීම්භාර නිලධාරී වෙත වාර්තා ලබාගෙන ඒවා සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. දේශපාලන පක්ෂ නියෝජිතයන්ට, නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන්ට, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාලවලට පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලද අතර, මහජනතාවටද එවැනි සිද්ධීන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට අවස්ථාව ලැබිණි. මෙම ස්ථානයට පොලිසියද අනුයුක්ත සිටි බැවින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අප්‍රමාදව අදාළ ස්ථානවලට ගොස් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කාර්යාල භාරව සිටි සහකාර තේරීම්භාර නිලධාරීන් කටයුතු කරන ලදී.

145. ඡන්දපොළ සඳහා එක් අපේක්ෂකයකු නියෝජනය කරමින් නියෝජිතයන් දෙදෙනෙකුට රැඳී සිටීමට අවස්ථාව සලසන ලද අතර ඊට අමතරව අපේක්ෂකයන්ට සහ ඡන්ද නියෝජිතයන්ට දිවයිනේ ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකද බලයලත් නියෝජිතයන්ට සහ ප්‍රාදේශීය නියෝජිතයන්ට පිළිවෙලින් දිස්ත්‍රික්කය තුළ හා අදාළ ඡන්ද ප්‍රදේශය තුළ පිහිටි ඕනෑම ඡන්ද මධ්‍යස්ථානයකටද ගොස් ඡන්ද විමසීම නිරීක්ෂණය කිරීමට පහසුකම් සලසා තිබිණි.

146. 2014 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධි විධාන) පනත මගින් ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති සියලුම තැනැත්තන් විසින් ඡන්ද පොළේදී ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටීමට පෙර අනන්‍යතා ලේඛනයක් මගින් සිය අනන්‍යතාව සනාථ කිරීම අනිවාර්ය විය. මේ නිසා හොර ඡන්ද දැමීමේ ඉඩකඩ සම්පූර්ණයෙන්ම ඉවත්වී ඡන්ද පොළවල කටයුතු සාමකාමීව පවත්වාගෙන යාමට හැකි විය.

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමට අදාල ඡන්ද විමසීම අවස්ථාවේ දී, පහත දැක්වෙන ඡායාරූපයක් සහිත අනන්‍යතා ලේඛනවලින් එකක් මගින්, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර, ඡන්ද දායකයාගේ අනන්‍යතාව පරීක්ෂා කොට, අනන්‍යතාව සනාථ කර ගැනීමෙන් පසුව, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට උපදෙස් ලබාදෙන ලදි.

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු ගමන් බලපත්‍රය
3. වලංගු රියදුරු බලපත්‍රය
4. රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත
5. වැඩිහිටි හැඳුනුම්පත

6. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පූජ්‍ය / පූජක හැඳුනුම්පත
7. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත

තවද, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධි විධාන) පනතින්, ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතට අලුතෙන් එකතු කරන ලද 46 (අ) වගන්තියට අනුව, ඡන්දපොළක කලබල ඇති වුවහොත් එහි ඡන්ද විමසීම ශූන්‍ය කොට, නැවත ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්ට බලතල පැවරීමත් සමග, ඡන්ද පොළවල කටයුතු බාධාවලින් තොරව පවත්වාගෙන යා හැකි පරිසරයක් නිර්මාණය විය.

147. 2015.01.08 දින පෙරවරු 7.00ට ආරම්භ කරන ලද ඡන්ද විමසීම, එදින පස්වරු 4.00ට අවසන් කොට ඡන්ද පෙට්ටි මුද්‍රා තබා, සෙසු ආරක්ෂිත බඩු බාහිරාදියද සමග රැගෙනවිත් තේරීම්භාර නිලධාරි වෙත භාරදීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ග ගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට නියම කර තිබුණි. රාජ්‍ය ලාංඡනය සහිත ආරක්ෂිත මැලියම් පටිවලින් මුද්‍රා තබන ලද ඡන්ද පෙට්ටි, නැවතත් මුද්‍රා තැබීමට ඡන්ද පොළ නියෝජිතයන්ටද ඉඩ සලසන ලදී. ඊට අමතරව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා මූලික වී සකසනු ලබන විශේෂ වාර්තාවක මුල් පිටපත, ඡන්ද පෙට්ටියේ පියන සහ බඳ කොටස ආවරණය වන පරිදි අලවා මුද්‍රා තැබීමට ද උපදෙස් දී තිබුණි. පිටපත් 6කින් යුක්තව කාබනීකෘත කඩදාසියක සකසන ලද එම වාර්තාවේ, ඡන්ද පොළ නියෝජිතයන්, ඡන්ද පොළ නිරීක්ෂකයන්, ඡන්දපොළ කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් මෙන්ම ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාද ඔවුන්ගේ නම්, තනතුරු, ජාතික හැඳුනුම්පත් අංක සඳහන් කර අත්සන් යොදා සැකසිය යුතු විය. එම වාර්තාවේ දෙවන පිටපත ඡන්ද පත්‍රිකා ගිණුම බහාලන කවරයට බහා මුද්‍රා තැබීමටත්, තුන්වන පිටපත ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිගේ ජර්නලය ඇතුළත් කවරයට බහාලීමටත්, ඉතිරි පිටපත් තුන අදාළ ලේඛනයේ අත්සන් තබන ලද පක්ෂ තුනක නියෝජිතයන් වෙත භාරදීමටත් අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් දේශපාලන පක්ෂවල නියෝජිතයින්ටතම අත්සන යොදා අලවන ලද ලේඛනය සහිත ඡන්ද පෙට්ටිය, ආරක්ෂිතව ඡන්ද ගණන් කිරීමේ ශාලාවට රැගෙනවිත් තිබේද යන්න තහවුරු කරගත හැකි විය. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පිටපත් 05කින් යුත් කාබනීකෘත කඩදාසියේ පිළියෙළ කරනු ලබන ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ද ඇතුළු තවත් විස්තර දැක්වෙන, ඡන්ද පත්‍රිකා ගිණුමේ පිටපතක්ද අදාළ නියෝජිතයන් වෙත භාරදීම සිදු කෙරේ.ඡන්ද විමසිම අවසන් වීමෙන් පසු මුද්‍රා තබන ලද ඡන්දපෙට්ටිය, පොලිතින් උරයක බහා ආරක්ෂිත අගුලක් යොදා එහි හඳුනා ගැනීමේ අංක නියෝජිතයන්ට සටහන් කර ගැනීමට අවස්ථාව ලබාදීම ද සිදුවිය. එසේම ඡන්ද පෙට්ටි ආපසු ගණන් කිරීමේ ශාලා කරා රැගෙන යන අවස්ථාවේ දී, කැමති ඕනෑම ඡන්ද පොළ නියෝජිතයකුට වාහනයකින් එම ඡන්ද පෙට්ටිය රැගෙන යන වාහනය පසුපසින්, ගණන් කිරීමේ මධ්‍යස්ථාන පරිශ්‍රය දක්වා ගමන් කිරීමට අවසර පත්‍රයක් ලබාදීම ද සිදු කෙරිණි. මේ සියලු ක්‍රියාමාර්ග, ඡන්ද පොළෙහි භාවිතා කරන ලද ඡන්ද පෙට්ටි ආරක්ෂාකාරීව ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානය වෙත භාරදෙනු ලබන බවට, ඡන්ද විමසීමට තරග කරනු ලබන පාර්ශවයන් සෑහීමකට පත් කිරීම සඳහා ගන්නා ලද විශේෂිත පියවර ලෙස හැඳින්විය හැක.

148. තේරීම්භාර නිලධාරිගේ උපදෙස් මත ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් විසින් ඉහත සඳහන් කළ පරිදි ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීමත්, සියලුම ප්‍රකාශන හා මුද්‍රා තබන ලද පැකැට්ටු පිළියෙළ කරගැනීමෙන් පසුව, ඡන්ද පොළට අනුයුක්ත කරන ලද වාහනයෙන් නියම කර ඇති මාර්ගයේම ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත පැමිණීමටත් නියම කර තිබුණි. දිවයිනේ සියලුම ඡන්ද මධ්‍යස්ථානවලින් සියලුම ඡන්ද පෙට්ටි හා මුද්‍රා තබන ලද පැකැට්ටු ඡන්ද විමසීම් දින පස්වරු 9.30 පමණ වන විට තේරීම්භාර නිලධාරි කාර්යාල වෙත ළඟා වූ බව වාර්තා විය. ඡන්ද විමසීම් දින පස්වරුවේ ඡන්ද ගණන් කිරීම සඳහා දේශපාලන පක්ෂ/ කණ්ඩායම් වෙත දැනුම්දී තිබූ වේලාව පසුවීමත් සමග ඡන්ද ගණන් කිරීමේ සූදානමින් ගණන් කිරීමේ කාර්ය මණ්ඩලයද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත වාර්තා කරන ලදී.

IXවන කොටස

ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

149. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 47 සිට 59 දක්වා වන වගන්තිවල ඡන්ද පත්‍රිකා ගණන් කිරීමට අදාළව හා එම පනතේ දෙවන උපලේඛනයෙහි 18 සිට 28 දක්වා වූ නියෝගවල තැපැල් ඡන්ද ගණන් කිරීම පිළිබඳ කරුණු ද සඳහන් වේ. එම පනතේ 47 වන වගන්තියට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා විසින් සිය ඡන්ද ගණන් කිරීමෙන් පසු එහි ප්‍රතිඵලය, ඡන්ද විමසීමට අදාළ සමස්ත ප්‍රතිඵලය සකස් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළයුතු වේ.

150. ඒ අනුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි විසින්, ඡන්ද ගණන් කිරීමේ ස්ථාන හඳුනා ගැනීම, ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය පත් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම මෙන්ම, ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටිය හැකි නියෝජිතයන් සම්බන්ධයෙන් තරග කරනු ලබන අපේක්ෂකයන් දැනුවත් කිරීම ද කළ යුතු විය. එක් ඡන්ද ප්‍රදේශයක පිහිටි ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක ඡන්ද පත්‍රිකා, එක් මධ්‍යස්ථානයක දී ගණන් කිරීම සිදුකළ හැකි ආකාරයට එම මධ්‍යස්ථාන සැලසුම් කරනු ලැබේ. සාමාන්‍යයෙන් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් වෙනුවෙන් ලියාපදිංචි ඡන්ද හිමියන් 12,500 සිට 15,000ක් පමණ වන සේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සැලසුම් කෙරේ. තැපැල් ඡන්ද හිමියන්ගේ තැපැල් ඡන්ද පැකැට්ටු 1500 – 2500 පමණ දක්වා වූ ප්‍රමාණයකට, එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක්ද වන ලෙස ඡන්ද ගණන්කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව මැතිවරණ කොට්ඨාසයේ සියලුම ඡන්ද කොට්ඨාසවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල භාවිතා කරන ලද ඡන්ද පෙට්ටි සහ අනෙකුත් මුද්‍රා තබන ලද කවර ආදියද නිසි පරිදි භාරගැනීමෙන් පසු, එම ඡන්ද පත්‍රිකා සහ තැපැල් ඡන්ද පත්‍රිකාද අපේක්ෂකයන්ගේ නියෝජිතයන් ඉදිරියේ ගණන් කිරීම සිදුකොට එක් එක් අපේක්ෂකයා මැතිවරණ කොට්ඨාසයෙන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව, මැතිවරණ කොමසාරිස්වරයා වෙත වාර්තා කිරීම, දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයාගේ ප්‍රධාන කාර්යය විය.

151. ගණන් කිරීමේ මධ්‍යස්ථානවල පිහිටීම හා ඒවායේ ඇති පහසුකම් අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් දන්වනු ලැබූ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යා සීමා සැලකිල්ලට ගෙන, ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට නොහැකි වූ අවස්ථා ද වාර්තා විය. එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් සඳහා ඡන්ද පොළවල් 10 – 15ක් අතර වූ සංඛ්‍යාවක් අනුයුක්ත කිරීමටත්, කාර්ය මණ්ඩලය 30 – 40 අතර ප්‍රමාණයක් හා අපේක්ෂකයන්ගේ නියෝජිතයන් 95කට පමණ පහසුකම් සැලසීමටත් සිදුවන බැවින්, එම කරුණු ද සැලකිල්ලට ගෙන ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමට තේරීම්භාර නිලධාරීන්ට සිදුවිය. තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි ඇතුළුව නිලධාරීන් 15ක් පමණ යෙදවීමටද උපදෙස් දෙන ලදි. ඒ අනුව සියලුම දිස්ත්‍රික්කවල ඡන්ද ගණන් කිරීමේ මුළු ශාලා සංඛ්‍යාව 1419 ක් විය. ඉන් 1115ක් සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ ශාලාද, 304ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලාද වශයෙන් වෙන් කරන ලදී. එක් එක් දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද ගණන් කිරීමේ ශාලා විස්තරය ***අංක IXසටහනෙහි*** දක්වා ඇත. සමහර අවස්ථාවල දී මැතිවරණ කොට්ඨාසයක ඡන්ද ගණන් කිරීමේ ශාලා සියල්ල එක් පරිශ්‍රයක පිහිටුවීමට නොහැකිවීම නිසා ඒවා පරිශ්‍ර කිහිපයක පිහිටුවීමටද සිදුවිය. එහෙයින්, සමහර දිස්ත්‍රික්කවල දී ප්‍රතිඵල වගුගත කිරීමේ මධ්‍යස්ථානයද තේරීම්භාර නිලධාරි කාර්යාලයෙන් බැහැරව ගණන් කිරීමේ ශාලා පිහිටි පරිශ්‍රවල පිහිටුවීමට සිදුවිය.

152. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ නියමයන්ට අනුව එක් එක් අපේක්ෂකයා වෙනුවෙන්, තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට නියෝජිතයන් දෙදෙනෙකු බැගින් හා සාමාන්‍ය ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මධ්‍යස්ථානයකට නියෝජිතයන් පස් දෙනෙකු බැගින් පත් කිරීමට අවස්ථාව සැලසිය යුතුය. ඒ අනුව ඡන්ද විමසීමට පෙර, තම නියෝජිතයන් පත්කර ගැනීමට හැකිවන පරිදි තේරීම්භාර

නිලධාරීන් විසින් තම දිස්ත්‍රික්කයට අදාළ ගණන් කිරීමේ ශාලාවල පිහිටීම, ඒවාට ඡන්ද මධ්‍යස්ථාන (ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාවද සමග) අනුයුක්ත කර ඇති ආකාරය හා ඒවා වෙනුවෙන් පත්කළ හැකි නියෝජිත සංඛ්‍යාවට අදාළ විස්තර සියලුම අපේක්ෂකයන්ට, ඡන්ද නියෝජිතයන්ට හා බලයලත් නියෝජිතයන් වෙත යවන ලදී. ඒ අනුව ගණන් කිරීමේ නියෝජිත පත්වීම් ලිපි තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතු දිනය මෙන්ම විධිමත් අවසර පත්‍රය ලබා ගැනීම සඳහා ඡන්ද විමසීම් දිනට පෙර වාර්තා කළයුතු දිනයද, එම ගණන් කිරීම පිළිබඳ දැනුම් දීමේ ලිපියේම සඳහන් කර යවන ලදී. එම විධිමත් අවසරය ලබාගත් නියෝජිතයන්ට ඡන්ද විමසීම් දින පස්වරුවේ ඡන්ද ගණන් කිරීමේ ශාලාවට සෘජුවම වාර්තා කිරීමටද උපදෙස් දී තිබිණි. ඡන්ද ගණන් කිරීමේදී යම් යම් අක්‍රමිකතා සිදුවේයැයි යන උපකල්පනය මත අපේක්ෂකයින්ට නීතිය අනුව ගණන් කිරීමේ ශාලාවක් සඳහා පත්කළ හැකි නියෝජිත ප්‍රමාණයට වඩා තවත් නියෝජිතයන් පත් කර ගැනීමට අවස්ථාව සැලසිය යුතු බවට දේශපාලන පක්ෂ ලේකම් රැස්වීම්වල දී මෙන්ම, පක්ෂවල නිත්‍ය නියෝජිත රැස්වීම්වල දී ද ඉල්ලීම් ඉදිරිපත් විය. එවැනි ඉල්ලීම් සලකා බලා,අපේක්ෂකයකු වෙනුවෙන් තවත් නියෝජිතයකුට ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටි පරිශ්‍රයට ඇතුළු වී පරිශ්‍රයේ සියලුම ගණන් කිරීමේ ශාලා නිරීක්ෂණයට අවස්ථාව සලසන ලදී. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම මෙවරද එක් එක් අපේක්ෂකයා නියෝජනය කරමින් එක් ගණන් කිරීමේ නියෝජිතයකුට ඡන්ද විමසීම් දින පස්වරු 3.00ට ගණන් කිරීමේ ශාලාවට පැමිණ අදාළ කටයුතු පරීක්ෂා කර බලා එහිම රැඳී සිටීමට අවස්ථාව සලසන ලදී. කැමති ඕනෑම ගණන් කිරීමේ නියෝජිතයකුට, ඡන්ද මධ්‍යස්ථානවල සිට ඡන්ද පෙට්ටි රැගෙන එන අවස්ථාවේ, පරිශ්‍රයේ නියමිත ස්ථානයක සිට ගණන් කිරීමේ ශාලා දක්වාම එම කටයුතු නිරීක්ෂණය කරමින් රැඳී සිටීමටද අවස්ථාව සලසන ලදී. ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන්ගේ කාර්ය භාරය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් උපදෙස් මාලාවක්ද නිකුත් කරන ලදී.

153. ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් රැගෙන එන ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ආරක්ෂිත දෑ මෙම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට භාර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සූදානම් කොට තිබුණි. එසේ භාරගනු ලබන බඩු බාහිරාදියෙන්, ඡන්ද ගණන් කිරීම සඳහා අවශ්‍යවන ද්‍රව්‍ය ඒ වන විටත් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පැමිණ සිටින ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරිට භාරදීමටත්, සෙසු දෑ මළුවල බහා ශාලාව තුළ ආරක්ෂිතව තැන්පත් කොට තබා, ඡන්ද ගණන් කිරීම අවසන් වීමෙන් පසුව ගණන් කරන ලද ඡන්ද පත්‍රිකාද සමග සුරක්ෂිතාගාරයේ තැන්පත් කිරීම සඳහා තේරීම්භාර නිලධාරි වෙත භාරදිය යුතු බවටත් බඩු බාහිරාදිය ආපසු භාරගැනීමේ කටයුතු භාර සහකාර තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් දී තිබිණි. ඡන්ද පෙට්ටි සහ අනෙකුත් බඩු බාහිරාදිය භාරගන්නා මධ්‍යස්ථාන ගණන් කිරීමේ පරිශ්‍ර මෙන්ම ඉන් බැහැර ආසන්න ප්‍රදේශ ආරක්ෂා කිරීම, ප්‍රාදේශීය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු විය.

154. ඡන්ද ගණන් කිරීම සඳහා අවශ්‍ය සහාය කාර්ය මණ්ඩලය බොහෝ විට දිස්ත්‍රික්කය තුළින්ම සපයාගත් අතර දිස්ත්‍රික්ක කිහිපයකට ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් මෙන්ම සහකාර තේරීම්භාර නිලධාරීන් ද කොළඹින් යවනු ලැබීය. කොළඹින් පිට දිස්ත්‍රික්ක වෙත යවනු ලැබූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුළු සෙසු සහකාර තේරීම්භාර නිලධාරීන්, කොළඹදී අදාළ රාජකාරි වෙනුවෙන් පුහුණු කරන ලදී. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතීන් සඳහා පැවති පුහුණු පංතිවලදී ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන්ද ඔවුන් දැනුවත් කළ අතර, අනෙකුත් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි විසින් ඡන්ද ගණන් කිරීම, ආරම්භ කිරීමට පෙර කළ යුතු බවට උපදෙස් දෙන ලදී.

155. අනෙකුත් ඡන්ද විමසීම්වල දී මෙන් ජනාධිපතිවරණ අවස්ථාවක දී, මැතිවරණ කොට්ඨාසයකට අදාළව ඡන්ද ගණන් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත නොවූවද, ඒ සඳහා විශාල කාර්ය මණ්ඩලයක් යොදවනු ලබන බැවින්, ඔවුන් සඳහා ඡන්ද විමසීම් දින පස්වරුවේ සිට එදිනට පසු දින දක්වා, ආහාරපාන හා පොදු පහසුකම් සැපයීමේ වගකීම තේරීම්භාර නිලධාරීන් වෙත පැවරිණි. පසුගිය ඡන්ද විමසීම්වලදී මෙන්ම, ඡන්ද ගණන් කිරීමේ කාර්ය මණ්ඩලය වෙත එදින රාත්‍රී ප්‍රධාන ආහාරවේල තේරීම්භාර නිලධාරීන් විසින් සපයනු නොලැබිණි. එම ආහාරවේල එදින රාත්‍රියේ අවශ්‍ය නිලධාරින්ට, සාධාරණ මිලකට ලබාගැනීම සඳහා

තාවකාලික වෙළඳසැල් ගණන් කිරීමේ පරිශ්‍රවල ඇති කිරීමට කටයුතු කරන ලදී. නිලධාරින්ගේ රාත්‍රී ආහාරවේල වෙනුවෙන් දරනු ලැබූ වියදම ආවරණය සඳහා ඔවුන්ට අමතර ගෙවීමක් කිරීමට තීරණය කරන ලදී.

156.ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ විය යුතු මූලික කොන්දේසි

- ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ සියලු ඡන්ද මධ්‍යස්ථානවලින් ඡන්ද පෙට්ටි භාරගෙන තිබීම.
- අපේක්ෂකයන් වෙත දන්වනු ලැබූ ඡන්ද ගණන් කිරීම ඇරඹීමේ වේලාව ඉක්ම ගොස් තිබීම .
- ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීම සඳහා තේරීම්භාර නිලධාරි නියෝගය ලැබී තිබීම.

කෙසේ වෙතත් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අපේක්ෂකයන්ගේ නියෝජිතයන් පැමිණ නොසිටියේ නම්, ගණන් කිරීමේ ශාලාව අවට ඔවුන් රැඳී සිටින්නේදැයි විමසා බලන ලෙස උපදෙස් ලබා දී තිබූ අතර, ඡන්ද ගණන් කිරීම් ආරම්භ කිරීමට සූදානම්ව නියෝජිතයන්ට ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රචාරය කොට ඔවුන් කැඳවීමට වැඩපිළිවෙලක්ද යොදා තිබුණි. ගණන් කිරීමේ මධ්‍යස්ථානයට අදාළ සියලුම ඡන්ද පෙට්ටි ලැබී ඇතිනම්, ඡන්ද පොළ භාරව ගිය ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් භාරදී ඇති ඡන්ද පොළ කලබල පිළිබඳ වාර්තාව (Z - වාර්තාව) විවෘත කර එහි ඇතුළත් තොරතුරු ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි (ZCCO) වාර්තාවේ සටහන් කර තේරීම්භාර නිලධාරි වෙත දන්වා යවා, ගණන් කිරීම ආරම්භ කිරීමට අවසර ලබාගත යුතු විය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම Z වාර්තාව මගින් ඡන්ද මධ්‍යස්ථානය තුළ නිදහස්ව හා සාධාරණව ඡන්දය පැවැත්වීමට අවශ්‍ය වාතාවරණයක් නොවූ බව වාර්තා කර තිබුණේ නම්, එම මධ්‍යස්ථානයට අදාළව, ඡන්ද පොළ තුළ රැඳී සිටි පොලිස් නිලධාරින්, ඡන්දපොළ නියෝජිතයන් හා ඡන්ද පොළ නිරීක්ෂකයින්ගේ වාර්තා මෙන්ම ඡන්දපොළට අදාළ කලාපභාර සහකාර තේරීම්භාර නිලධාරියාගේ වාර්තාවද පරීක්ෂාකර බලා ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් කරුණු තවදුරටත් තහවුරු කර ගැනීමට උපදෙස් දී තිබුණි. වාර්තා පරීක්ෂා කිරීමේදී අදාළ ඡන්ද පොළේ කටයුතුවලට බාධාවක් සිදුවී ඇති බවට පෙනී ගියහොත්, ඒ බව තේරීම්භාර නිලධාරි විසින් මැතිවරණ කොමසාරිස්වරයාට වාර්තා කළ යුතු විය. අදාළ වාර්තා මෙන්ම මැතිවරණ කොමසාරිස් වෙත ලැබී ඇති පැමිණිලි ඇති නම් ඒවාද, ඡන්ද පොළ භාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, පොලිස් නිලධාරින් හා කලාපභාර තේරීම්භාර නිලධාරිගෙන්ද ප්‍රකාශද ලබාගෙන ඒවා අනුව ඡන්ද පොළේ ඡන්ද ගණන් කළ යුතුද නැත්ද යන්න මැතිවරණ කොමසාරිස්වරයා තීරණය කරනු ඇත. ඡන්ද පත්‍රිකා පැහැර ගැනීම, බලෙන් ලකුණු කොට ඡන්ද පෙට්ටියට බහාලීම, නියෝජිතයන්ට හා කාර්ය මණ්ඩලයට බලපෑම් සිදු කිරීම වැනි බාධා සිදුව ඇති බව මැතිවරණ කොමසාරිස්වරයාට පෙනී ගියහොත් එම ඡන්දපොළේ ඡන්ද විමසීම ශූන්‍ය කොට නැවත ඡන්ද විමසීමක් පැවැත්වීමේ තීරණය ගැනීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරනු ඇත. මෙම ජනාධිපතිවරණයට අදාළව දිවයිනේ කිසිදු ඡන්ද පොළකින් එවැනි තත්ත්වයක් වාර්තා නොවුණි.

157.*අදියර තුනක් යටතේ සිදුවන ඡන්ද ගණන් කිරීම.*

- ***පළමුවන අදියර***යටතේ එක් එක් ඡන්ද පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණනය කර නිවැරදිතාව තහවුරු කර ගැනීමෙන් පසුව ඡන්ද පත්‍රිකා ධාරකයේ තැන්පත් කිරීම සිදු කෙරේ.
- ***දෙවන අදියර*** උප අදියර දෙකකින් සමන්විත වන අතර එහි පළමුවන උප අදියර යටතේ ධාරකයේ ඇති ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ මේසයට ගෙන,සම්පූර්ණ කාර්ය මණ්ඩලය යොදවා ඡන්ද පත්‍රිකා සලකුණු කොට ඇති ආකාරය අනුව, එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් සලකුණු කොට ඇති ඡන්ද පත්‍රිකා ඒ ඒ අපේක්ෂකයාට අදාළ පෙට්ටි වලට බහාලීම හා අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි වෙත යොමු කිරීමසිදු කෙරේ.

- දෙවන අදියරේ දෙවන උප අදියර යටතේ ගණන් කිරීමේ මේසයේ නිලධාරීන්, තේරීමේ කණ්ඩායම, ගණන් කිරීමේ කණ්ඩායම, පරික්ෂා කිරීමේ කණ්ඩායම, නැවත පරික්ෂා කිරීමේ කණ්ඩායම හා අභඹු පරික්ෂණ කණ්ඩායම ලෙස කණ්ඩායම් පහක් වශයෙන් බෙදී අදාළ කටයුතු සිදු කෙරෙන අතර නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව අසුන් ගන්වා ගණන් කිරීම හා පරික්ෂාව සිදුකරනු ලැබේ. මෙහිදී එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් දැනටමත් පළමුවන උප අදියර යටතේ තෝරා ඇති ඡන්ද පත්‍රිකා අඩංගු පෙට්ටිය රැගෙන ඒවා ඉහත කී කාණ්ඩ පහ යටතේ නැවත ගණන් කිරීම හා පරීක්ෂාව සිදු කරනු ලැබේ.

- ඡන්ද ගණන් කිරීමේ දෙවන අදියර අවසානයේ දී ගණන් කිරීමේ ශාලාව තුළින් එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලය ගණන් කිරීමේ නිලධාරි විසින් තේරීම්භාර නිලධාරි වෙත යැවිය යුතු ය. මෙම ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් එක් එක් පක්ෂය නියෝජනය කරමින් ප්‍රතිඵල ලේඛනයේ අත්සන් කරනු ලැබූ නියෝජිත වෙත භාරදීමද සිදු කෙරේ. මේ නිසා තම නියෝජිතයින් මගින් අපේක්ෂකයන්ටද ප්‍රතිඵල සකස් කර ගැනීමට අවස්ථාවක් උදාවූ අතර ඒවා තේරීම්භාර නිලධාරීගේ ප්‍රතිඵලය සමග සසඳා බැලීමට හැකිවීම නිසා ප්‍රතිඵල සම්බන්ධව නියෝජිතයන්ගේ හා අපේක්ෂකයන්ගේ විශ්වාසය තහවුරු කර ගැනීමට හැකි විය. එක් එක් ගණන් කිරීමේ පරිශ්‍රය තුළ දී තම නියෝජිතයින් මාර්ගයෙන් ගණන් කිරීමේ ශාලාවලින් ලැබෙන ප්‍රතිඵල ලේඛන අනුව ප්‍රතිඵලය සකස්කර ගැනීම සඳහා එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ලැප්ටොප් පරිගණකයක්ද සමග නියෝජිතයන් දෙදෙනකු ගණන් කිරීමේ ශාලා පරිශ්‍රයේ රඳවා තැබීමට අවසරය ලබාදී තිබුණි. තේරීම්භාර නිලධාරින් විසින් ගණන් කිරීමේ පරිශ්‍ර තුළ ඒ සඳහා අදාළ ස්ථාන සූදානම් කර තිබුණි.

  ඡන්ද ගණන් කිරීමේ ***තුන්වන අදියර*** යටතේ අවශ්‍යතාව පරිදි මනාප ගණන් කිරීම සිදුකරනු ලැබේ. දිවයිනේ ප්‍රකාශිත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් හරි අඩකට වැඩි සංඛ්‍යාවක් කිසිදු අපේක්ෂකයෙකු ලබාගෙන නොමැති විටක, වැඩිම හා ඊළඟට වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයන් දෙදෙනා තරගයෙන් ඉවත්කර, සෙසු අපේක්ෂකයන්ට අදාළ ඡන්ද පත්‍රිකා වලින් තරගයෙන් ඉවත්කරන ලද අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ වාසියට සලකුණු කර ඇති දෙවන හෝ තුන්වන මනාප ගණන් බැලීම මෙහිදී සිදුවේ. වෙනත් ඡන්ද විමසීම්වල මනාප ගණන් කිරීම මෙන් ජනාධිපතිවරණයට අදාළ මනාප ගණන් කිරීම සංකීර්ණ නොවන අතර එම මනාප විස්තර වෙනත් ආකෘති පත්‍රවල සලකුණු කිරීමකින් තොරව ඡන්ද පත්‍රිකා අනුවම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් මෙතෙක් පවත්වනු ලැබූ කිසිදු ජනාධිපතිවරණ ඡන්ද විමසීමකදී ජනාධිපතිවරයා තෝරාගැනීම සඳහා මනාප ගණන් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගිණි. එසේ වුවද ඡන්ද විමසීමේදී දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා එක් අපේක්ෂකයකු ලබාගෙන ඇත්ද යන්න සොයා බලනුයේ, දිවයිනේ සියලුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් ප්‍රතිඵල තේරීම්භාර නිලධාරීන් වෙත ලැබී, ඒවා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබීමෙන් පසුව පමණි.මේ නිසා ඡන්ද ගණන් කිරීමට අදාළ මුල් පියවරේ කටයුතු වේලාසනින් අවසන් කළ ගණන් කිරීමේ මධ්‍යස්ථානවල වුවද, ප්‍රධාන කාර්යාලයේ උපදෙස් ලබාගෙන නිලධාරීන් බැහැර කිරීම තේරීම්භාර නිලධාරීන් විසින් සිදුකරනු ලබයි.

X වන කොටස

ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.

158. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 55 වැනි වගන්තියට අනුව තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානද ඇතුළුව එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ගණන් කිරීමේ නිලධරයන් විසින් සපයන ලද ප්‍රකාශවලින් ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව තේරීම්භාර නිලධාරි විසින් නිශ්චය කොට, ඒ බවට ප්‍රකාශයක් පිළියෙල කොට නොපමාව මැතිවරණ කොමසාරිස්වරයා වෙත යොමුකළ යුතු විය. පනතේ විධිවිධාන අනුව ජනාධිපතිවරණ ඡන්ද විමසීමේදී ප්‍රකාශයට පත්කිරීම කෙරෙනුයේ එක් මැතිවරණ ප්‍රතිඵලයකි. පනතේ 64 වැනි වගන්තියට අනුව ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකළ යුතු වේ. පනතේ එලෙස සඳහන් වුවද අවසන් ප්‍රතිඵලය දිස්ත්‍රික් ප්‍රතිඵලය මත තීරණය වන බැවින් දිස්ත්‍රික් මට්ටමින්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීම සිදුකරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්කය සහ ජාතික මට්ටම යන දෙකේදීම සෑම ඡන්ද ප්‍රදේශයකටම අදාළව එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලයත් සෑම මැතිවරණ කොට්ඨාසයකටම අදාළ වන තැපැල් ඡන්ද ප්‍රතිඵලයත්, සෑම මැතිවරණ කොට්ඨාසයකටම අදාළ අවසාන ප්‍රතිඵලයත් ප්‍රකාශ කළ යුතු බවට තීරණය කරන ලදී.

159. දිස්ත්‍රික් මට්ටමේදී ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සඳහා ස්ථානය තෝරා ගැනීමේදී, ගණන් කිරීමේ ශාලා සියල්ලටම පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක් වීම, ගමනාගමන පහසුකම්, ආලෝකය සැපයීම, ආරක්ෂක විධිවිධාන සැලසීම, දුරකථන, ෆැක්ස් පහසුකම් සැලසීම හා සියලු කටයුතු නිරන්තර අධීක්ෂණයට ලක්කළ හැකි ස්ථානයක් තෝරා ගැනීම යන කරුණු සම්බන්ධව තේරීම්භාර නිලධාරීගේ අවධානය යොමු කරවන ලදී. ඡන්ද ගණන් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ඉතා දුර බැහැර මධ්‍යස්ථාන තෝරා ගැනීමට සිදු වූ අවස්ථාවල දී හැර සෙසු සෑම අවස්ථාවකම මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාව යොදා ගන්නා ලදී. ජාතික මට්ටමේ අවසන් ප්‍රතිඵලය වගුගත කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ ස්ථානය ලෙස පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම මෙවරද මැතිවරණ මහලේකම් කාර්යාලය තෝරාගන්නා ලදී.

160. මැතිවරණ කොට්ඨාස මට්ටමින් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමක් පිළිබඳව පනතේ සඳහනක් නොමැති බැවින්, ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රකාශය සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරි විසින් තරග කරනු ලබන අපේක්ෂකයන් වෙත දැනුම්දීමක් සිදු කිරීමේ අවශ්‍යතාවක් නැතත්, මේ සඳහා අපේක්ෂකයන්ගේ නියෝජිතයන්ට සහභාගිවීමට අවස්ථාව අහුරා තැබීම වැරදි ආරංචි පැතිරයාමට හා අනුමාන කිරීම් වලට හේතුවිය හැකි බැවින්, ප්‍රතිඵල වගුගත කිරීමේ හා ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානයට දිස්ත්‍රික් බලයලත් නියෝජිතට සහ ඔහු විසින් තෝරාගන්නා ලද තවත් එක් අයකුට පැමිණ සිටීමට හැකි බවට දැන්වීමක් කරන ලෙස තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. පෙර සඳහන් කළ පරිදිම පනතේ 64 වන වගන්තියට අනුව ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැවරෙන බැවින්, අවසන් ප්‍රතිඵල ප්‍රකාශ කෙරෙන දිනය, වේලාව සහ එම ස්ථානයට තරග කරනු ලබන අපේක්ෂකයන්ට, ඡන්ද නියෝජිතයන්ට සහ එක් එක් අපේක්ෂකයා විසින් තෝරාගත් තවත් එක් තැනැත්තකුට පැමිණිය හැකි බව දන්වමින්, දැන්වීමක් සියලුම අපේක්ෂකයන් හා ඡන්ද නියෝජිතයන් වෙත යවනු ලැබීය. මේ හැර පක්ෂ ලේකම්වරුන් හා පක්ෂ නිත්‍ය නියෝජිතයන් සමග පැවති රැස්වීම්වල දී පැමිණි එකඟතාවට අනුව, අවසන් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානය පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට තරග කරනු ලබන පක්ෂවල ලේකම්වරුන්ට සහ අපේක්ෂකයින් ඉදිරිපත් කළ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන්ගෙන් එක් තැනැත්තකුට මෙන්ම, ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා පිළිගත් නිරීක්ෂණ සංවිධාන නියෝජනය කරමින් එක් අයකුටද පැමිණ සිටීමට අවසරය ලබාදෙන ලදී.

161. (අ) අවසන් ප්‍රතිඵලය සැකසීම මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී සිදු කෙරෙන බැවින් සහ පසුගිය ජනාධිපතිවරණයට අදාළව පැතිරගොස් තිබූ මිථ්‍යාමත සැලකිල්ලට ගෙන මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රතිඵල වගුගත කිරීමේ කටයුතු නියෝජිතයින්ට වඩාත් ආසන්නව නිරීක්ෂණය කිරීමට හැකිවන ආකාරයේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. දිස්ත්‍රික් මට්ටමේදී ඒ ඒ ගණන් කිරීමේ ශාලාවලින් ලැබෙන ප්‍රතිඵල වාර්තා වගුගත කිරීමේ සිට මැතිවරණ මහ ලේකම් කාර්යාලය ප්‍රතිඵල වගුගත කිරීම තෙක් වූ ක්‍රියාවලිය, සම්බන්ධයෙන් විපක්ෂ නියෝජිතයන් තුළ පැවති සැකසංකා හා වැරදි වැටහීම් දුරුකරලීම සඳහා මාධ්‍යවේදීන්, දේශපාලන පක්ෂ නියෝජිතයන් හා ප්‍රමුඛ දේශපාලනඥයින් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයාට සිදුවූ අතර, එමගින්, ඡන්ද ගණන් කිරීමේ සිට ප්‍රතිඵල ප්‍රකාශ කිරීම දක්වා, චේතනාත්මක කිසිදු වෙනස්කමක් කළ නොහැකි බව පමණක් නොව, අත්වැරදීමකට හෝ ඉඩක් නොලැබෙන බවට ඒත්තු ගැන්වීමට හැකිවිය.

(ආ) ප්‍රතිඵල වගුගත කිරීමේ කාර්යයට තාක්ෂණික වශයෙන් සහයෝගය ලබාදෙන කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක සේවා අංශය හා ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතනවල නියෝජිතයන් සමග මූලික සාකච්ඡාවට කිහිපයක් පැවැත්වීමෙන් පසුව එය ඉටුකළ යුතු ආකාරය පිළිබඳව අවසන් තීරණවලට එළඹුණි. අදාළ තොරතුරු පද්ධතියේ ආරක්ෂාවත්, නිරවද්‍යතාවත්, රහස්‍යභාවය හා විශ්වාසනීයත්වයත් සලකා මෙම කාර්යය ඉටු කිරීම සඳහා මෙම ආයතන දෙක සමග කටයුතු කිරීම,පෙර සිටම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන්නකි.

162. මැතිවරණ මහලේකම් කාර්යාලය සිදු කරන අවසන් ප්‍රතිඵල සැකසුම් කාර්යයේ දී, මැතිවරණ මහලේකම් කාර්යාලයේදී වගුගත කර සකසන දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵල, දිස්ත්‍රික් ප්‍රතිඵලයද සමග සංසන්දනය කොට නිරවද්‍යතාව තහවුරු කර ගෙන, දිස්ත්‍රික් ප්‍රතිඵලය අනුමත කිරීම කෙරේ. ඒ අනුව දිස්ත්‍රික්කවලින් ගණන් කිරීමේ ශාලා මට්ටමේ එක් එක් අපේක්ෂකයා ලබාගත් ප්‍රතිඵල දැක්වෙන ලේඛනය ෆැක්ස් මගින් ලබාගෙන, එය දුරකථනයෙන් ද විමසා නැවත තහවුරු කර ගැනීමට අමතරව, එම ප්‍රතිඵලය පරිලෝකනය (Scan)කර ලබාගැනීමේ වැඩපිළිවෙලක්ද මෙවර අලුතින් ඇති කරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්කවලින් ෆැක්ස් මගින් ලැබෙන එක් එක් ගණන් කිරීමේ ශාලා මට්ටමේ ප්‍රතිඵල ලේඛන වල ඡායා පිටපත් දෙකක් රැගෙන එක් පිටපතක් නිලධාරීන් විසින් වගුගත කර ප්‍රතිඵල සැකසීමේ අංශයටත්, අනෙක් පිටපත මැතිවරණ මහලේකම් කාර්යාලයේම ස්ථානගත කර තිබූ කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක සේවා ඒකකය වෙත පරිගණක වැඩසටහන අනුව ප්‍රතිඵලය සැකසීමටත් යොමු කරන ලදී. ඊට අමතරව දිස්ත්‍රික්කවලින් ස්කෑන්(Scan) කරන ලද ප්‍රතිඵලය මැතිවරණ මහලේකම් කාර්යාල පරිගණක ඒකකය වෙත ලබාගෙන එම අංශය තුළ ද පරිගණකයෙන් ප්‍රතිඵල වගුගත කිරීම සිදු කිරීමටද කටයුතු කරන ලදී. මේ අයුරින්ම සියලුම තේරීම්භාර නිලධාරී කාර්යාලවල ප්‍රතිඵල වගුගත කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීමට හා ඒ සඳහා පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යෙදවීමට තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

163. දිස්ත්‍රික් මට්ටමෙන් ලැබෙන ප්‍රතිඵලයත්, මැතිවරණ මහලේකම් කාර්යාලයේ ඉහත කී අංශ තුනෙන්ම ලැබෙන ප්‍රතිඵලයත් එම අංශ භාර මාණ්ඩලික නිලධාරීන් විසින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිහිටුවන ලද අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් සහ පළපුරුදු වෙනත් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීමේ කණ්ඩායම වෙත ඉදිරිපත් කරන ලදී. නිවැරදි ප්‍රතිඵල සහතික කර ප්‍රතිඵල ප්‍රකාශය සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත යොමු කරන ලදී. කෙසේ වෙතත් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලද ප්‍රතිඵලය, නැවත සසඳා පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ස්ථානයේද මැතිවරණ කොමසාරිස්වරයාගේ සහායට තවත් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් පිරිසක් යොදවනු ලැබූ අතර ඔවුන් විසින් අවසන් පරීක්ෂාව සිදු කිරීමෙන් පසුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රතිඵල ප්‍රකාශයට කටයුතු කරනු ලැබීය.

164. එක් එක් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ගණන් කිරීමේ ශාලා මට්ටමින් ලැබෙන එක් එක් අපේක්ෂකයාට දී ඇති ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵල ලේඛනය ප්‍රධාන කාර්යාලයට ෆැක්ස් මගින් සහ පරිලෝකනය කර විද්‍යුත් තැපෑල මගින් යොමු කිරීමෙන් අනතුරුව තේරීම්භාර නිලධාරි විසින් එම ප්‍රතිඵලය ආශ්‍රයෙන් ඡන්ද ප්‍රදේශ මට්ටමේ ප්‍රතිඵලය සකස්කර මැතිවරණ කොමසාරිස්වරයා වෙත යොමු කරන ලදී. මැතිවරණ කොට්ඨාසයට අදාළ සියලුම ඡන්ද ප්‍රදේශවල ප්‍රතිඵල හා මැතිවරණ කොට්ඨාස තැපැල් ඡන්ද ප්‍රතිඵලයද සම්පූර්ණ වූ පසු මැතිවරණ කොට්ඨාසය සඳහා එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව දැක්වෙන ප්‍රතිඵලයද මැතිවරණ කොමසාරිස්වරයා වෙත යොමු කිරීම සිදු කරන ලදී. දිවයිනේ අවසන් ප්‍රතිඵලය නිකුත් කිරීමට පෙර ඒ ඒ මැතිවරණ කොට්ඨාස හා පරිපාලන දිස්ත්‍රික් ප්‍රතිඵල සැකසීම හා පරීක්ෂාව සිදුකිරීමෙන් පසු මැතිවරණ කොමසාරිස්වරයා විසින් විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සිදු විය.

165. මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවසන් ප්‍රතිඵලය නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසුව, එහි තම අත්සන යොදා සහතික කර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත හා ජනමාධ්‍ය වෙත නිකුත් කිරීමට පියවර ගනු ලැබීය. ප්‍රතිඵල ප්‍රකාශයේදී, ප්‍රතිඵල ලබා ගැනීම සඳහා විද්‍යුත් මාධ්‍ය ආයතන මැතිවරණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව තිබිය යුතු වූ අතර, මුද්‍රිත මාධ්‍ය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මාර්ගයෙන් ප්‍රතිඵල ලබාදීම සිදු කරනු ලැබීය. විද්‍යුත් මාධ්‍ය ආයතන නිල ප්‍රතිඵල විකාශන අයිතිය ලබා ගැනීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹී අතර, ඒ සඳහා එක් ආයතනයකට රුපියල් 70,000ක මුදලක් හා එම ආයතනයේ සෙසු නාලිකාවන් සඳහාද ලබා ගන්නේ නම් එක් නාලිකාවකට රුපියල් 20,000/ - බැගින්ද ගෙවීමක් කළ යුතු විය. අදාළ ගෙවීම් කිරීමෙන් පසුව ප්‍රතිඵල ලබා ගැනීමට අවශ්‍ය වන රූපවාහිනී මාධ්‍ය ආයතන 9ක්, ගුවන් විදුලි නාලිකා 8ක්, වෙබ් අඩවි 6ක්, මාර්ගගත (Online) පුවත්පත් 3ක් හා ජංගම දුරකථන කෙටි පණිවුඩ ආයතන 5ක් ලියාපදිංචි විය. ලියාපදිංචි මාධ්‍ය ආයතන සඳහා ආරක්ෂක පරිගණක ජාලයක් මගින් විද්‍යුත් ක්‍රමයට අප්‍රමාදව ප්‍රතිඵල විකාශනය සඳහා ලබාදීම සිදු කරන ලද අතර, ඒ වෙනුවෙන් අවශ්‍ය පරිගණක ජාලකරණ හා සන්නිවේදන පහසුකම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ලබාදෙන ලදී. ඉහත සඳහන් පරිදි ආරක්ෂිත පරිගණක ජාලයක් මගින් මැතිවරණ ප්‍රතිඵල එකින් එක, ඡන්ද ප්‍රදේශ හා මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලබාදීම සිදු කරන ලද අතර, ජනාධිපතිවරණයේ අවසන් ප්‍රතිඵලය නිකුත් කිරීම දක්වා පරිගණක ජාලයේ ආරක්ෂා සහිතව පවත්වා ගෙන යාම, කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක සේවා මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් සිදු කෙරිණි. මැතිවරණ කොමසාරිස්වරයා විසින් සහතික කරනලද ප්‍රතිඵලය පළමුවෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි වෙත ද දෙවනුව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වෙතද ෆැක්ස් මගින් ප්‍රකාශ කිරීම සඳහා යවනු ලැබිණි. සියලුම දේශීය හා විදේශීය පුවත්පත් ආයතන වෙත ප්‍රතිඵල ලබාදීම සිදු කරන ලද්දේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ විසිනි.

166. ප්‍රතිඵල මාධ්‍ය ආයතන වෙත මුදා හරිනු ලබන කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක සේවා මධ්‍යස්ථානයේ ජාල පද්ධතියෙන් මාධ්‍ය ආයතන විසින් දත්ත ලබා ගන්නා පරිගණක ගොණු සේවාදායකයේ බිඳ වැටීමක් ඡන්ද විමසීම් දින මධ්‍යම රාත්‍රියෙන් පසුව සිදුවූ අතර, ඒ හේතුවෙන් පැය භාගයකට ආසන්න කාලයක් විද්‍යුත් ක්‍රමයට ප්‍රතිඵල රූපවාහිනී ආයතනවලට ලබා දීමට නොහැකි විය. නමුත් එම කාලය තුළ දී ද මැතිවරණ කොමසාරිස් විසින් සහතික කරන ලද ප්‍රතිඵල ෆැක්ස් මගින් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත ලබාදෙන ලදි.මේ සම්බන්ධයෙන් කළ පරීක්ෂාවේදී අනාවරණය වූයේ, මාධ්‍ය ආයතන ප්‍රතිඵල ඉක්මණින් ලබාදීමට දක්වන ලද උනන්දුව නිසා ඔවුන් අදාළ සේවා ගොණු නැවත නැවත තත්පරයටත් වඩා කෙටි කාලයක් තුළ පරීක්ෂා කිරීමට යාම නිසා මෙය සිදු වූ බවය.

167. පසුගිය 2010 ජනාධිපතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයෙන් පසුව පැතිර ගිය විවිධ මිථ්‍යාමත හේතුවෙන් සහ තරග කරනු ලබන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ කරුණු දැක්වීම්ද සැලකිල්ලට ගෙන, මෙතෙක් කිසිදු ජනාධිපතිවරණයක දී සිදු නොකළ ආකාරයට තරග කරනු ලබන අපේක්ෂකයන්ට හා එක් අපේක්ෂකයකු වෙනුවෙන් නියෝජිතයන් දෙදෙනෙකුට හා නිරීක්ෂණ සංවිධානවල එක් නිරීක්ෂකයකුටද මැතිවරණ මහලේකම් කාර්යාලයේ ප්‍රතිඵල වගුගත කිරීම හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ ස්ථානයේ කටයුතු නිරීක්ෂණයට පැමිණීමට අවසරය ලබාදෙන ලදී. සම්ප්‍රදායක් ලෙස මෙතෙක් ක්‍රියාත්මක කරන ලද්දේ අවසන් ප්‍රතිඵලය

ප්‍රකාශ කරන වේලාව සියලුම අපේක්ෂකයන් වෙත දැනුම් දී එම වේලාවට පැමිණෙන ලෙස ඔවුන් දැනුවත් කිරීමයි. ප්‍රතිඵල ප්‍රකාශ කරන ස්ථානයේ දී ඒවා සටහන් කර ගැනීමට ද පැමිණ සිටි නියෝජිතයන්ට අවස්ථාව සලසනු ලැබීය. මේ හේතුවෙන් කිසිඳු දේශපාලන පක්ෂයකට හෝ අපේක්ෂකයකුට අවසන් ප්‍රතිඵලය සම්බන්ධයෙන් සැක සංකාවක් ඇති කර ගැනීමට අවස්ථාවක් නොවීය.

168. දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22න් අදාළ තේරීම්භාර නිලධාරීන් විසින් එවන ලද එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති මුළු ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රතිඵලය, මැතිවරණ මහලේකම් කාර්යාලයේ පිළියෙල කරන ලද ප්‍රතිඵල ලේඛනද සමග සසඳා නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව සමස්ත දිවයිනෙන් එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව හා ජනාධිපතිවරයා වශයෙන් තේරීපත්වන අපේක්ෂකයා කවුරුන්ද යන්න මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශ කළ යුතු විය. ඒ අනුව අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරණයේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව වූ 12,123,452න් හරි අඩක් වූ 6,061,726 යන සංඛ්‍යාව ඉක්මවා ඡන්ද 155,436 ක්ද සමග මුළු ඡන්ද 6,217,162ක් ලබාගෙන තිබූ බැවින්, 2015 ජනාධිපතිවරණයට අදාළවද මනාප ගණන් කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුණ අතර ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 56(2) වගන්තිය යටතේ එම ප්‍රතිඵලය අවසාන ප්‍රතිඵලය බවට පත්විය. ඒ අනුව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 64(2) වගන්තිය අනුව නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගත් බව 2015.01.09 දින පෙරවරු 9.38 පමණ මැතිවරණ කොමසාරිස්වරයා විසින් මැතිවරණ මහලේකම් කාර්යාලයේදී ප්‍රකාශ කරන ලද අතර, ඒ අවස්ථාවට අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා මෙන්ම තවත් අපේක්ෂකයන් කිහිප දෙනෙකු සහභාගි විය. නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කරගත් බවට වූ නිවේදනය 2015.01.09 දින අංක 1896/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ එදිනම පළ කරන ලදී. මෙම ජනාධිපතිවරණ ඡන්ද විමසීමට අදාළව එක් එක් අපේක්ෂකයා ලබාගන්නා ලද මුළු ඡන්ද සංඛ්‍යාව අංක VI දරන සටහනෙන් දැක්වෙන අතර එක් එක් මැතිවරණ කොට්ඨාසය යටතේ ඡන්ද ප්‍රදේශ අනුව ලබාගත් ඡන්ද සංඛ්‍යාව අංක XI සටහනෙහි දක්වා ඇත.

XI වන කොටස

ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම්

169. දිවයින පුරා පිහිටි පරිපාලන දිස්ත්‍රික්ක 25 ක පවත්වන ලද මෙම ජනාධිපතිවරණයේ දී ඡන්දහිමියන් 15,044,490 දෙනෙකු වෙනුවෙන් අදාළ පහසුකම් සලසා ඡන්ද ගණන් කිරීම සිදුකොට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලදී. ඒ වෙනුවෙන් වැය වූ මුළු මුදල රුපියල් මිලියන 2,706 කි. ඒ අනුව මෙම ජනාධිපතිවරණයේ දී එක් ලියාපදිංචි ඡන්ද දායකයකු වෙනුවෙන් දරන ලද වියදම රුපියල් 179.87 කි.

170. මෙම ජනාධිපතිවරණයේ දී පොලිස් දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දරන ලද මුළු වියදම රුපියල් මිලියන 881 කි. ජනාධිපතිවරණය වෙනුවෙන් වැය කළ මුළු මුදල වූ රුපියල් මිලියන 2,706 න් ඉතිරි රුපියල් මිලියන 1,825 (67.4%) ඍජුවම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් වියදම් කරන ලදී.

171. ජනාධිපතිවරණයේ ඡන්ද විමසීම් කටයුතු වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් රජයේ දෙපාර්තමේන්තු හතරක් වෙත මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ අනුව තැපැල්,පොලිස්, මුද්‍රණ හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ යන දෙපාර්තමේන්තු ජනාධිපතිවරණය සඳහා පිළිවෙලින් වැය කළ මුදල් ප්‍රතිශත ලෙස පහත දක්වා ඇත.

දෙපාර්තමේන්තුව	**වැය කළ මුදල රු.**	**ප්‍රතිශතය**
තැපැල් දෙපාර්තමේන්තුව	384,999,999.90	14.22%
පොලිස් දෙපාර්තමේන්තුව	373,863,605.57	13.81%
මුද්‍රණ දෙපාර්තමේන්තුව	120,623,570.69	4.45%
පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	1,719,741.95	0.06%
එකතුව	**881,206,918.11**	**32.54%**

172. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, මෙම ජනාධිපතිවරණය වෙනුවෙන් රුපියල් 120,623,570.69 ක් වැය කර ඇත. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ එම මුළු වියදමෙන් 63.5% ක් වැය වී ඇත්තේ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීම සඳහාය. මුද්‍රණ කටයුතු යටතේ වූ තවත් විශාල වියදමක් වන නිල ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර ගැනීම සඳහා වූ වියදම, රුපියල් 21,604,936.33 ක් වූ අතර එම කාර්යය මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ගෙවා පෞද්ගලික අංශයෙන් ඉටු කර ගන්නා ලදී.

173. මෙම ජනාධිපතිවරණයේ දී පොලිස් දෙපාර්තමේන්තුව දරන ලද වියදම රුපියල් 373,863,605.57 කි. ඉන් රුපියල් 23,203,200.00 ක් අදාළ වූයේ විශේෂ කාර්ය බලකාය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ය. පොලිස් දෙපාර්තමේන්තුව වෙත වෙන්කළ ප්‍රතිපාදන වලින් වියදම් වූ මුදලින් රුපියල් මිලියන 218 ක් පොලිස් නිලධාරීන්ගේ සංයුක්ත දීමනාව වෙනුවෙන් ද, රුපියල් මිලියන 90 ක් පොලිස් වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් ද වැය කර තිබුණි. මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරය ඇතිව පොලිස් දෙපාර්තමේන්තුවට මැතිවරණ රාජකාරී සඳහා අවශ්‍ය අමතර වාහන කුලී පදනම යටතේ ලබා ගැනීම සඳහා

රුපියල් මිලියන 99.4 ක් වැය කර තිබූ අතර නීති විරෝධී දැන්වීම් ඉවත් කිරීම සඳහා රුපියල් මිලියන 24 ක් වැය කර තිබුණි.

174. ඡන්ද විමසීම් අවස්ථාවල දී තැපැල් දෙපාර්තමේන්තුව මගින් ඉටු කරවා ගතයුතු විශේෂ රාජකාරී කිහිපයක් ද ඇත. ඒවා වෙනුවෙන් එම දෙපාර්තමේන්තුවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් මුදල් ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. ඒ ආකාරයට මෙම ඡන්ද විමසීම වෙනුවෙන් රුපියල් 384,000,000.00 ක් තැපැල් දෙපාර්තමේන්තුවට වෙන්කර දී තිබුණි. ඉන් රුපියල් මිලියන 216 ක් සේවක අතිකාල වෙනුවෙන් ද, රුපියල් මිලියන 138 ක් මුද්දර හා තැපැල් ගාස්තු වශයෙන් ද, රුපියල් මිලියන 13 ක් ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් ද, රුපියල් මිලියන 07 ක් ඉන්ධන වෙනුවෙන් ද ප්‍රධාන වියදම් වශයෙන් දරා ඇත.

175. මෙම ඡන්ද විමසීමේ මුළු වියදම වියදමේ ස්වභාවය අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.

වියදමේ ස්වභාවය	**වැය කළ මුදල රු.**	**ප්‍රතිශතය**
1. නීති විරෝධී ප්‍රදර්ශන ඉවත් කිරීම	24,026,298.78	0.89%
2. විදේශ නිරීක්ෂණ වියදම්	35,620,676.67	1.32%
3. ඉදිකිරීම් හා අළුත්වැඩියා	56,427,210.09	2.09%
4. විදුලිය	108,821,690.60	4.02%
5. මුද්දර හා තැපැල් ගාස්තු	137,642,661.45	5.09%
6. මුද්‍රණ වියදම්	144,009,403.32	5.32%
7. සුභසාධන වියදම්	148,084,094.76	5.47%
8. ජලය, දුරකථන ඇතුළු සේවා හා වෙනත් වියදම්	173,008,674.65	6.39%
9. වාහන කුලී	182,989,324.18	6.76%
10. ඉන්ධන	185,847,238.96	6.87%
11. ලිපි ද්‍රව්‍ය/ කාර්යාල භාණ්ඩ	207,340,925.93	7.66%
12. කාර්ය මණ්ඩලය වැටුප්, අතිකාල ගමන් වියදම් හා දීමනා	1,302,488,631.15	48.12%
එකතුව	**2,706,306,830.54**	**100.00%**

176. මේ අනුව ජනාධිපතිවරණය සඳහා වියදම් වූ මුළු මුදලින් ඉහළම ප්‍රතිශතය වූ 48.12% ක ප්‍රමාණයක් කාර්ය මණ්ඩල ගෙවීම් සඳහා දැරීමට සිදුවී ඇති බව පෙන්වා දිය හැකිය. ඊළඟට පිළිවෙලින් වැඩිම ප්‍රතිශතය වූ 7.66% ක් ලිපි ද්‍රව්‍ය හා කාර්යාල භාණ්ඩ වලටද,6.87% ක් ඉන්ධන සඳහා ද, 6.76% ක් වාහන කුලී සඳහා ද, 5.47% ක් සුබ සාධන වියදම් සඳහා ද, 5.32% ක් මුද්‍රණ වියදම් සඳහා ද, 5.09% ක් මුද්දර හා තැපැල් ගාස්තු සඳහා ද 4.02% ක් විදුලිය සඳහා ද වැය විය.

177. සේවා හා වෙනත් වියදම් යටතේ දරා ඇති මුළු වියදම රුපියල් මිලියන 173 කි. ඡන්ද පොළ කටයුතු සඳහා සේවා සැපයීම වෙනුවෙන් ග්‍රාම නිලධාරීන්ට ගෙවූ රුපියල් මිලියන 97 ක් ද, ජලය සැපයීම සඳහා රුපියල් මිලියන 11 ක් ද, සන්නිවේදන කටයුතු සඳහා රුපියල් මිලියන 08 ක් ද ඊට ඇතුළත්ව ඇත.

XII වන කොටස

නිරීක්ෂණ සහ නිර්දේශ

රාජ්‍ය සේවය

178. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවට හා තේරීම්භාර නිලධාරීන්ට සහායවීමේ වගකීම රජයේ සේවකයන් වෙත පැවරී ඇත. ඡන්ද විමසීම හා ගණන් කිරීම සඳහා රාජ්‍ය සේවයේ නිලධාරින් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරින් යොදවා ගැනෙන මුත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථාවල සේවකයන් ඊට ඇතුළත් නොවේ. දීප ව්‍යාප්ත ඡන්ද විමසීමක දී, මූලික සංවිධාන කටයුතු සඳහා මෙන්ම ඡන්ද විමසීම හා ඡන්ද ගණන් කිරීම සහ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම සඳහා විශාල රජයේ සේවකයන් ප්‍රමාණයක් අවශ්‍ය වේ. ඒ නිසාම ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ වහාම මැතිවරණ දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගේ මූලික කාර්ය භාරයක් වන්නේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ විවිධ ආයතනවල සේවයේ නියුතු රජයේ සේවකයන් හා වාහන පිළිබඳ සංගණනය කිරීම සඳහා තොරතුරු ලබාගැනීමේ දත්ත පත්‍ර අදාළ ආයතන වෙත යොමුකිරීමයි. මෙහිදී තම ආයතනය තුළ සේවයේ නියුතු සියලුම නිලධාරින් හා වාහන සම්බන්ධ විස්තර ලබාදීමට අදාළ ආයතන ප්‍රධානීන් බැඳී සිටිය ද, එම තත්ත්වය ගැන එම නිලධාරීන් එතරම් සැලකිල්ලක් නොදැක්වීමේ ප්‍රවණතාවක් මෑත කාලීනව දක්නට ලැබීම විශේෂත්වයක් ගනී. බොහෝ ආයතන මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි තම ආයතනයේ සේවයේ නියුතු සියලුම සේවකයන් හා වාහන විස්තර සැපයුවද, සමහර ආයතන ඒ කෙරෙහි නිසි අවධානය යොමු නොකරයි. තවද සමහර අවස්ථාවල මැතිවරණ කොමසාරිස්වරයා දී ඇති උපදෙස් නොතකා හැර මැතිවරණ රාජකාරි සඳහා යාමට කැමති නිලධාරීන් වෙත පමණක් දත්ත පත්‍ර ලබාදී තොරතුරු සැපයීමත්, ආයතනය සතු වාහනවලින් හැකි උපරිමය ආයතන වෙත රඳවාගෙන ඉතිරිය පමණක් මැතිවරණ රාජකාරි සඳහා යොමු කිරීමත් දක්නට ලැබේ.මේ නිසා ඡන්ද විමසීමක් සඳහා අවශ්‍ය සම්පත් සොයා ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට සෑහෙන වෙහෙසක් දැරීමට සිදුව ඇත. සමහර අවස්ථාවල ජනාධිපති ලේකම්වරයා මගින් සියලුම ආයතන සතු කාර්ය මණ්ඩල සහ වාහන විස්තර මැතිවරණ කොමසාරිස්වරයා වෙත සැපයිය යුතු බවට චක්‍රලේඛ උපදෙස් ලබාදීමටද සිදුවිය. බොහෝ රජයේ සේවකයන් මැතිවරණ රාජකාරි සතුටින් හා ආශාවෙන් ඉටු කිරීමේ තත්ත්වයක් තිබුණද, තවත් කොටසක් ඡන්ද විමසීම් සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු වෙනුවෙන් නිවෙස්වලින් බැහැරව දිනක් හෝ දෙකක් ගත කිරීමට සිදුවීම හා ඡන්ද ක්‍රමයේ මනාප ගණන් කිරීමට සිදු වුවහොත්, එහි ඇති සංකීර්ණතාව ගැන පමණක් අවධානය යොමුකොට මැතිවරණ රාජකාරියෙන් ඉවත්වීමේ ප්‍රවණතාවක්ද පවතී. මේ තත්ත්වය තුළ ඉදිරි මැතිවරණ කටයුතු සාර්ථක කර ගැනීමට නම් සියලුම ආයතනවල සුදුසුකම්ලත් සියලුම නිලධාරින් හා ආයතන සතු වාහන සියල්ල ලබා ගත හැකිවන පරිදි පරිපාලකයන් දැනුවත් කිරීමේ හා ආයතනය සතු සම්පත් මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම පරිදි ලබාදීම අනිවාර්ය අවශ්‍යතාවක් බවට නීති සම්පාදනයට අවශ්‍ය පියවර ගැනීම කළ යුතු වේ.

179. රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණි සඳහා දේශපාලන අයිතිවාසිකම් අහිමි නමුත් මාණ්ඩලික ගණයට නොවැටෙන සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් හිමිය.එතෙකුදු වුවත් අධිකරණ නිලධාරීන්ට, සන්නද්ධ සේවාවල නිලධාරීන්ට, පොලිස් නිලධාරීන්ට සහ සාම නිලධාරීන්ට ද දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් නැත. මැතිවරණ කටයුතු සංවිධානයේ දී දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන් මෙන්ම දේශපාලන අයිතිවාසිකම් අහිමි රාජ්‍ය සේවයේ නිලධාරීන්ද යොදවා ගනිමින් එම කාර්යය සිදු කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුවට සිදුවී ඇත. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන් වුවද ඡන්ද විමසීම් කාලය තුළ දේශපාලන පක්ෂ, අපේක්ෂක ප්‍රවර්ධන කටයුතුවල යෙදෙන්නේ නම් ඔවුන් ඉන්පසුව මැතිවරණ රාජකාරි සඳහා යොදාගත හැකිද යන ගැටළුව නිසැකයෙන්ම ඇති වේ. එවැනි ක්‍රියා සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් අවධානයෙන් සිටින දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන්ගෙන් මෙන්ම මහජනතාවගෙන්ද පැමිණිලි මැතිවරණ

කොමසාරිස්වරයාට ලැබේ. ඒ අනුව දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන් වුවද ඡන්ද විමසීම් කාලය තුළ රාජකාරී වේලාවෙන් බැහැරව හෝ රාජකාරියෙන් නිවාඩු ලබාගෙන හෝ රාජකාරියට මුවා වී කරනු ලබන දේශපාලන පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනයට අදාළ කටයුතුවල නොයෙදිය යුතු බවට ආයතන ප්‍රධානීන් මගින් දැනුම්වත් කිරීමටත්, මැතිවරණ රාජකාරී සඳහා තෝරාගෙන ඇති නිලධාරීන් එවැනි කටයුතුවල නිරත වන්නේ නම් ඒ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමටත් අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සකස් විය යුතු ව ඇත.

180. රාජ්‍ය සේවයේ ඉහළම ස්ථරයේ සිටින අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන්ට ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලය තුළ වුවද, දේශපාලනික බලපෑම් මත ඔවුන් අකමැති වුවද යම් යම් ක්‍රියාමාර්ග ගැනීමට සිදුවිය හැකි ය. එවැනි අවස්ථාවල ඒ සම්බන්ධ නීතිමය තත්ත්වය, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කර ඇති උපදෙස් ආදිය සම්බන්ධව අදාළ අංශ දැනුවත්කර එවැනි ක්‍රියාමාර්ග නිසා ඇතිවන ඵල විපාක පෙන්වා දී නීතියට අනුව කටයුතු කිරීමේ අවශ්‍යතාව අමාත්‍යාංශ ලේකම්වරුන් හා අනෙකුත් ආයතන ප්‍රධානීන් පෙන්වාදිය යුතු වුවද බොහෝ නිලධාරීන් එලෙස කටයුතු නොකිරීම මෙන්ම නීතියෙන් රිංගා යාහැකි ක්‍රම පෙන්වා දෙමින් මැතිවරණ ක්‍රියාවලියට බාධා පමුණුවන අවස්ථාද නැත්තේ නොවේ. එනිසා දේශපාලනික බලපෑම් මත වුවද ක්‍රියාත්මක කළ නොහැකි ඉල්ලීම් ක්‍රියාත්මක කළ නොහැකි බව පෙන්වාදීමටත් , එලෙස පෙන්වාදී තිබියදීත් කරනු ලබන ඉල්ලීම් ලිඛිත ඉල්ලීමක් නොවන අවස්ථාවක එය කෙසේවත් ඉටුකළ නොහැකි බව පෙන්වාදීමටත් ඔවුන් පසුබට නොවිය යුතු අතර, එසේ නොවුවහොත් මැතිවරණ ක්‍රියාවලිය බාධාවකින් තොරව පවත්වාගත නොහැකිවනු ඇත. එසේ නොකොට මැතිවරණ නීති නොසලකා හැර කිසියම් රජයේ නිලධරයකු කටයුතු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඔහුට / ඇයට එරෙහිව පියවර ඉදිරියේ දී ගතයුතු වනු ඇත.

තැපෑලෙන් ඡන්දය දීම සහ එවැනි වෙනත් පහසුකම් සැලසීම.

181. ඡන්ද විමසීමේ රාජකාරිවල නිරතවන රජයේ සේවකයන්ට මෙන්ම එම කටයුතු හා සම්බන්ධ සමහර අත්‍යාවශ්‍ය සේවාවල නිරතවන සේවකයන්ටද ඡන්ද විමසීම්වල දී තැපෑලෙන් ඡන්දය දීමේ හිමිකම තිබේ. ජනාධිපතිවරණ පනතේ 2 වන වගන්තිය යටතේ දැන්වීම පළකළ දින සිට දින 10ක් තුළ තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කළ යුතු බවට පනතේ සඳහන් වේ. මෙම දිනය තවත් සතියක් වැනි කාලයක් දීර්ඝ කරනු ලැබුවහොත් තැපැල් ඡන්ද සඳහා ඉල්ලුම් කරනු ලබන පිරිස ඉතා විශාල වන බැවින්, කෙටි කලක් තුළ ඊට අදාළ විශාල රාජකාරී ප්‍රමාණයක්ඉටු කිරීමට සිදුවනු ඇත. පසුගිය ජනාධිපතිවරණයට අදාළව තැපැල් ඡන්ද ඉල්ලුම්පත් 626,953ක් ලැබුණු අතර පරීක්ෂාවෙන් පසු ඒවායින් අයඳුම්පත් 541,452 පිළිගන්නා ලදී. තැපැල් ඡන්ද ඉල්ලුම්පත් බාර ගැනීම, පරීක්ෂා කිරීම, අයදුම්පත් පිළිගත් හෝ ප්‍රතික්ෂේප බව අයදුම්කරුවන් වෙත දන්වා යැවීම, තැපැල් ඡන්ද නාමලේඛනය සැකසීම, තැපැල් ඡන්ද හිමියන් වෙත ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, තැපැල් ඡන්ද සලකුණු කිරීමට අදාළ කටයුතු හා පාවිච්චි කරන ලද හා නොකරන ලද තැපැල් ඡන්දදායකයන්ගේ පැකැට්ටු තේරීම්භාර නිලධාරි වෙත ආපසු භාර ගැනීම යන කාර්යයන් රාශියක් ඉතා කෙටි කාලයක් තුළ සිදුකළ යුතු වේ. එහෙත් මෙම ක්‍රියාවලියේ දී සිදුවන යම් සුළු අතපසුවීම් හේතු කොට ගෙන පවා තේරීම්භාර නිලධාරි වෙත දෝෂාරෝපණ එල්ලවීම සිදු වේ. ඡන්ද විමසීම් පනත් මගින් ඡන්ද විමසීම් කාලසීමා තීරණය කර ඇති නිසා, තැපැල් ඡන්ද කටයුතු සඳහා වූ කාලසීමා දීර්ඝ කිරීමෙන් මීට විසඳුමක් නොලැබේ. ඊට හේතුව එලෙස කළහොත් ඡන්ද විමසීම නිසි කාලසීමාව තුළ පැවැත්විය නොහැකි වන බැවිනි. එනිසා කළ යුතුව ඇත්තේ තැපැල් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳව දැනුම්වත් කර, තැපැල් ඡන්ද හිමිකම ඇති නිලධරයන්ට මෙන්ම, අත්‍යාවශ්‍ය රාජකාරීවල නිරතවන නිලධරයන්ටද, ඒ සඳහා පුළුල් වැඩපිළිවෙලක් යෙදවීම වේ. ඒ සඳහා නිලධාරීන් පුහුණු කිරීම, දැනුම්වත් කිරීම හා නීති සම්පාදනය කිරීම කළ යුතුවේ. එමෙන්ම, ඡන්ද විමසීම් දින අත්‍යාවශ්‍ය රාජකාරී ඉටුකිරීමට නියමිත, රජයේ ශික්ෂණ රෝහල් කාර්යය මණ්ඩල, වරාය හා ගුවන්තොටුපළ සේවය කරන රජයේ නිලධරයන්ට හා සේවකයන්ට, ඡන්ද විමසීම් දින ස්වකීය සේවා ස්ථානයට ආසන්නව ස්ථාපිත ඡන්ද පොළකදී,

දීපව්‍යාප්ත ඡන්ද විමසීම් අවස්ථාවකදී, ඡන්දය පාවිච්චි කිරීම සඳහා වූ පහසුකම් සැලසීම පිළිබඳව ඉදිරි ඡන්ද විමසීම් වලදී ක්‍රියාකල යුතුව ඇත.

182. දැනට පවතින තැපැල් ඡන්ද ක්‍රමය තුළ රාජ්‍ය සේවකයන් තැපැල් ඡන්ද ඉල්ලුම් නොකිරීම හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වීම හේතුකොට ගෙන ඡන්ද රාජකාරිවලින් නිදහස් කරන ලෙස කරනු ලබන ඉල්ලීම් මෙන්ම අත්‍යාවශ්‍ය රාජකාරිවලින් නිදහස් කර සාමාන්‍ය පරිදි ඡන්ද පොළට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සලසන ලෙස කරනු ලබන ඉල්ලීම්ද නිසා ඡන්ද විමසීම් නිසි ලෙස පැවැත්වීම තේරීම්භාර නිලධාරීන්ට ගැටළුවක් වී ඇත. මෙවැනි තත්ත්වයන් තුළ අදාළ නිලධාරීන් නිදහස් කළහොත් ඡන්ද විමසීම යථා පරිදි පවත්වා ගෙන යාමට මෙන්ම අත්‍යාවශ්‍ය සේවා නිසි ලෙස පවත්වා ගෙන යාමටද ඇති කරන බලපෑම කෙබඳු වේද යන්න සැලකිල්ලට ගත යුත්තකි. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා සුදුසුකම්ලත් සියලුම ඡන්දදායකයන්ට තම ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සැලසිය යුතුව තිබියදී, තැපැල් ඡන්දය ඉල්ලුම් කිරීමට නොහැකි වීම හෝ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප වීම හේතුවෙන් ඡන්දය දීම සඳහා ඡන්ද පොළට යාමට අවකාශ සලසන ලෙස ඉල්ලුම්කරන තැනැත්තන්ට එම අවස්ථාව උදාකර දිය නොහැකි වුවහොත් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට ඇතිවන බලපෑම පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

183. තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීමේදී, විශේෂයෙන්ම ආරක්ෂක අංශවල සාමාජිකයන්, තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු වෙනත් අය හරහා ද ලබා ගනියි. එසේ අයදුම්පත් සම්පූර්ණ කර ගැනීමේ දී අදාළ කොට්ඨාස තුළම ලියාපදිංචි අයදුම්කරුවන්ගේ නමට සමාන නම් ඇති වෙනත් පදිංචි අයගේ විස්තර ලබාදීම නිසා හා යම් කිසි කෙනෙකුට අවශ්‍යතාවක් ඇත්නම් හිතාමතාම වෙනත් අයකුට අදාළ විස්තර සම්පූර්ණ කර එවා තැපැල් ඡන්දය ඉල්ලුම් කිරීමට මේ ක්‍රමය තුළ අවකාශ සැලසී ඇති බැවින් තැපෑලෙන් ඡන්දය පාවිච්චි කිරීමේ ක්‍රමය තුළ ඡන්ද පොළට ගොස් ඡන්දය පාවිච්චි කිරීමට සුදුසුකම්ලත් අයෙකුට තම ඡන්ද බලය අහෝසි වීමේ අවධානමක්ද මතු විය හැකිය. ඒ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුවට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමේ හැකියාවක් නොමැති අතර, ඡන්ද බලය අහිමි වූ පුද්ගලයාට අවශ්‍යනම් තම ඡන්දය තැපෑලෙන් ඉල්ලුම් කළ පුද්ගලයාට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගත හැකි ය. එවැනි නීතිමය ක්‍රියාමාර්ග ගත් අවස්ථා සම්බන්ධයෙන් මෙතෙක් වාර්තා වී නොමැති නමුත්, මෙවැනි අවස්ථා පාලනය කිරීමට යම් යම් ක්‍රියාමාර්ග මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබ ඇත. කෙසේ වෙතත් එසේ ගෙන ඇති ක්‍රියාමාර්ගද, සර්ව සම්පූර්ණ ඒවා නොවන බැවින් පවතින තැපැල් ඡන්ද ක්‍රමය පිළිබඳව ආපසු හැරී බැලීමක් කළ යුතු කාලය එළඹ ඇති බව සඳහන් කළ යුතු ය.

විදේශගත පුරවැසියන් සඳහා තම ඡන්දය පාවිච්චි කිරීමේ ක්‍රමවේද සකස් කිරීම මෙන්ම, විද්‍යුත් යන්ත්‍ර මගින් ඡන්ද පාවිච්චි කිරීම Electoral Voting Machine භාවිතය පිළිබඳවද මහජනතාව තුළ ඇති උනන්දුව හා උද්‍යෝගය හේතුවෙන්, එවැනි නව තාක්ෂණික මෙවලම් යොදා ගැනීම පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළ යුතුව ඇත.

නොමැකිය හැකි තීන්ත භාවිතය හා ගැටළු

184. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 36 වන වගන්තියට අනුව ඡන්දදායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර ඔහුගේ වම් අතේ සුළැඟිල්ල උචිත ලකුණින් සලකුණු කළ යුතු ය. මේ සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ආනයනික තීන්ත පෑන් භාවිතා කරන අතර මේවා භාවිතයේ දී මතුවී ඇති ගැටළු නිසා ඡන්ද විමසීම කෙරෙහි මහජන විශ්වාසය පළුඳුවන තැනට කටයුතු සැලසී ඇත. එයට හේතුව යම් යම් කාලගුණික තත්ත්වයන් මත මෙම තීන්ත නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීමේ හේතුවයි. ජනාධිපතිවරණයට අදාළව පාවිච්චි කළ තීන්ත සුළැඟිල්ලේ ආලේප කළද ඒවා නොපෙනෙන බවට හා ඒ නිසාම නැවත ඡන්දය දැමීමට ඡන්දදායකයාට අවස්ථාවක් ඇති බවට විවිධ දේශපාලන පක්ෂ මෙන්ම පුද්ගලයන්ගෙන්ද පැමිණිලි ලැබිණි. තවත් සමහර ඡන්ද මධ්‍යස්ථානවල එකදු තීන්ත පෑනක් හෝ ක්‍රියාත්මක

නොවීම හේතුවෙන් තේරීම්භාර නිලධාරීන් මගින් අළුත් තීන්ත පෑන් සැපයීමටද සිදුවිය. කෙසේ වෙතත් ඡන්දදායකයා වෙත ඡන්ද පත්‍රිකාවක් ලබාදීමට නම් ඔහු හඳුනා ගැනීමට අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කර තිබියදී එවැනි ඡන්දදායකයකු තවදුරටත් තීන්තෙන් සලකුණු කිරීමක් අවශ්‍යවේද යන පැනයද මෙහිදී යම් කිසිවකුට නැඟිය හැකි ය. අනෙකුත් රටවල් සම්බන්ධයෙන් සලකා බලන විට එම රටවල්වලද ඡන්දදායකයා හඳුනා ගැනීම සිදුකළද ඡන්දදායකයා ඡන්දය දුන් බවට සලකුණක් යෙදීම බොහෝ රටවල තවමත් සිදු වේ. එසේ වුවද මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීමත්, ඡන්දදායකයාගේ අනන්‍යතාව හෙළිකර ගැනීමෙන් පසු ඡන්දපත්‍රිකාවක් නිකුත් කිරීමත් යන කරුණු සලකා බලා දේශපාලන පක්ෂවල එකඟතාවය ලබාගැනීමෙන් පසුව හෝ ඡන්ද විමසීම් පනත්වලට අදාල සංශෝධන ඇතුළත් කිරීමෙන් මෙම ක්‍රමය නවතා දැමීම සුදුසු යැයි තර්කයක් ගොඩනැගිය හැක. එසේ නොමැතිනම් තීන්ත පෑන් ක්‍රමයේ වෙනසක් කොට වෙනත් රටවල මෙන් තීන්ත කුප්පි සහ පින්සල් භාවිතයෙන් ඡන්දදායකයාගේ සුළැඟිල්ලේ නියපොත්ත මතුපිට පමණක් කෙටි ඉරක් යෙදීම වැනි ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. ඒ මගින් දරනු ලබන වියදම අඩු කිරීමට මෙන්ම අදාළ ක්‍රියාදාමය කෙරෙහි ඡන්ද දායකයාගේ විශ්වාසය ද තහවුරු කිරීමද කළ හැකි වනු ඇත.

දේශපාලන පක්ෂ හා ස්වාධීන අපේක්ෂකයන්

185. ඡන්ද විමසීම් ක්‍රියාවලියේ දී, මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරුන්, ඔවුන්ගේ නියෝජිතයන් සහ, ස්වාධීන අපේක්ෂකයන් හෝ ස්වාධීන කණ්ඩායම් ඉදිරිපත් වන අවස්ථාවක ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් මෙන්ම ස්වාධීන කණ්ඩායම් නායකයන් සමග ද සාකච්ඡා පවත්වනු ලැබේ. මෙම ජනාධිපතිවරණයේදී තරග කරනු ලැබූ අපේක්ෂකයන් 19 දෙනා අතුරින් 17 දෙනෙකුම දේශපාලන පක්ෂ නියෝජනය කළහ.මැතිවරණ දෙපාර්තමේන්තුව මෙහිදී අපේක්ෂකයන්, ඡන්ද නියෝජිතයන් හා දිස්ත්‍රික් මට්ටමේ බලයලත් නියෝජිතයන් යන සියලුම දෙනා වෙනුවෙන් සෘජුවම සම්බන්ධතා පවත්වන ලද්දේ අදාළ දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ ඡන්ද නියෝජිතයන් සමගය.ස්වාධීන අපේක්ෂකයන් දෙදෙනා ද අදාළ රැස්වීම් සඳහා පුද්ගලිකව පැමිණීම හෝ ඔවුන්ගේ ඡන්ද නියෝජිතයින් රැස්වීම් සඳහා සහභාගී කරවීම සම්බන්ධීකරණ කටයුතු සඳහා පහසුවක් විය. පක්ෂ ලේකම්වරුන් සහ ඡන්ද නියෝජිතයන් සමග මැතිවරණ කොමසාරිස්වරයා සති දෙකකට වරක් රැස්වීම් පවත්වා මැතිවරණ සංවිධානය ගැන ඔවුන් දැනුවත් කළ අතර අදාළ පක්ෂවල නිත්‍ය නියෝජිතයන් සමග ද සතිපතා රැස්වීම් පවත්වා මැතිවරණ සංවිධාන කටයුතුවල දී අපේක්ෂකයන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට පැවරෙන කාර්යභාරය පැහැදිලි කරන ලදී. ඡන්ද විමසීම සහ ඡන්ද ගණන් කිරීමේ අවස්ථාවල නියෝජිතයන් පත් කිරීම, පනතේ විධිවිධාන අනුව අපේක්ෂකයන් කටයුතු කළ යුතු ආකාරය යනාදිය ගැන අදාළ රැස්වීම්වලදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

186. ඉහත කී ආකාරයෙන් උපදෙස් දෙනු ලැබූවද, පසුගිය ඡන්ද විමසීම්වල දී මෙන්ම මෙවර ද ඡන්ද පොළ නියෝජිතයන් මෙන්ම ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් පත්කිරීමේ දී මතුවූ ගැටළු ඡන්ද විමසීම් ක්‍රියාවලියට බාධාවක් විය. ඡන්ද ප්‍රදේශයක ඡන්ද පොළ නියෝජිතයන් පත් කිරීම එක් එක් ඡන්ද ප්‍රදේශයට පත් කරනු ලබන එක් නියෝජිතයකු මාර්ගයෙන් පමණක් කළයුතු බවටත්, ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම දිස්ත්‍රික් බලයලත් නියෝජිත වෙත පමණක් පැවරිය යුතු බවත් දන්වන ලදී. විශේෂ අවස්ථාවල දී පමණක් ඡන්ද නියෝජිතට හෝ අපේක්ෂක යන අයගෙන් එක් අයකු විසින් අදාළ පත්කිරීම කළයුතු බවට එම නියෝජිතයන් දැනුවත් කරන ලදී. එසේ වුවද එක් ඡන්ද ප්‍රදේශයක් සඳහා ඡන්ද පොළ නියෝජිතයන් පත් කිරීමට බලය පවරන ලද අපේක්ෂයා මෙන්ම බලයලත් නියෝජිතයා විසින් ද පත්වීම් කරන ලද අවස්ථා වාර්තා වූ අතර, එනිසාම අදාළ තේරීම්භාර නිලධාරීන්ට ඡන්ද විමසීම ආරම්භයේදීම ගැටළුකාරී තත්ත්වයක් මතුවිය. මෙම තත්ත්වය ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීමේදීද වාර්තා වුණි. එහිදි ගණන් කිරීමේ නියෝජිතයන් පත්කිරීමට බලයක් නොමැති අය විසින් කරන ලද නියෝජිත පත්වීම් මෙන්ම, එක් ගණන් කිරීමේ ශාලාවක් සඳහා බලයලත් නියෝජිත හා අපේක්ෂක යන දෙදෙනා විසින්ම ගණන් කිරීමේ නියෝජිතයන් පත්කරන ලද අවස්ථා ද විය. මෙවැනි සිද්ධීන් නිවැරදි කිරීම සඳහා අතිරේක කාලයක් යෙදවීමට තේරීම්භාර නිලධාරීන්ට සිදුවීම සමස්ත සංවිධාන ව්‍යූහයටම බලපෑම් ඇති කරන්නක් විය. එබැවින් මෙම තත්ත්වය ඉදිරි ඡන්ද විමසීම්වල දී සිදු නොවීම සඳහා පක්ෂ ලේකම්වරුන්ට පනතින් නියම වී ඇති සහ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබාදෙන උපදෙස් පරිදි නියමිත දින වකවානු තුළ තම නියෝජිත ලැයිස්තු

තේරීම්භාර නිලධාරි වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දිය යුතුය. ඡන්ද පොළ නියෝජිත හා ගණන් කිරීමේ නියෝජිතයන් පත්කිරීමට බලය පවරා ඇති අයගේ ලැයිස්තු, තේරීම්භාර නිලධාරීන් විසින්, සියලුම තරග කරන දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ බලයලත් නියෝජිතයන් වෙත කල්වේලා ඇතිව ලබාදී, ඔවුන්ගෙන් පරිබාහිර තැනැත්තන් මගින් නියෝජිතයන් පත් නොකෙරෙන බවට වගබලා ගතයුතු බව හා එලෙස පත්වීම් සිදුකර තිබුණොත් ඔවුන්ට කිසිසේත්ම ඡන්ද පොළට හෝ ඡන්ද ගණන් කිරීමේ ස්ථානවලට නියෝජිතයන් ලෙස ඇතුළුවීමට අවසර නොදෙන බවට දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම සුදුසු වේ.

මැතිවරණ ප්‍රචාරණ කටයුතු

187. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 68 සිට 74 දක්වා වගන්තිවලින් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, පෙරහැරවල් පැවැත්වීම, ඡන්ද විමසීමට අදාළ ප්‍රචාරක පත්‍රිකා මුද්‍රණය හා බෙදා හැරීම, දැන්වීම් ප්‍රදර්ශනය හා ඡන්ද කාර්යාල පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ඡන්ද විමසීම් කාලය තුළ යම් යම් සීමා යටතේ කටයුතු කළයුතු ආකාරය සහ ඡන්ද විමසීම් දින කටයුතු කළයුතු ආකාරයද දක්වා ඇත. ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ පසුව මැතිවරණ කොමසාරිස්වරයා සියලුම පක්ෂ ලේකම්වරුන් සමග සාකච්ඡා කොට අදාළ අණ පනත් පක්ෂ ලේකම්වරුන් වෙත ලබාදීමත්, නාමයෝජනා භාරගැනීමෙන් පසුව අපේක්ෂකයන්, පක්ෂ ලේකම්, ඡන්ද නියෝජිත, බලයලත් නියෝජිත, ප්‍රාදේශීය නියෝජිතයන් දැනුවත් කිරීම හා අදාළ අණ පනත් ලබාදී ඒ අනුව කටයුතු කිරීමේ වැදගත්කම ඔවුන්ට පැහැදිලි කරදීමද සිදු වේ. ඒ සමගම නීතිය ක්‍රියාත්මක කිරීම භාර පොලිසිය වෙතද පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් වලට පරිබාහිරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ද අදාළ අණපනත් මෙන්ම අවශ්‍ය උපදෙස් පොලිස්පතිවරයා මගින් ලබාදීම සිදු කෙරේ. කිසියම් පාර්ශවයක් විසින් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සම්බන්ධ පැමිණිල්ලක් පොලිසිය වෙත යොමුකළහොත්, ඒ සම්බන්ධව සොයාබලා අප්‍රමාදව පියවර ගැනීම පොලිසියෙන් අපේක්ෂා කෙරේ. එහෙත් දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් මෙන්ම නීතිය බලාත්මක කරන අංශද ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් පනවා ඇති සීමා ප්‍රායෝගික නොවන සේ සලකා කටයුතු කිරීම නිසා තරග කරනු ලබන අපේක්ෂකයන් මෙන්ම ඔවුන්ගේ අනුගාමිකයන්ද මැතිවරණ නීති උල්ලංඝණය කරමින් කටයුතු කිරීම සාමාන්‍ය තත්ත්වයක් බවට පත්ව ඇත. පොදු මහජනතාව ගැවසෙන ස්ථානවල කටවුට් බැනර් ප්‍රදර්ශනය තහනම් වුවද ඒවා නොසලකා හැර කටයුතු කළ අවස්ථා මෙම ඡන්ද විමසීමේදී ද වාර්තා විය .

188. කෙසේ වෙතත් නීතිය බලාත්මක කිරීමේ කාර්යය භාරව කටයුතු කරන පොලිසියට එදිනෙදා සාමාන්‍ය රාජකාරිවලට අමතරව, මාස දෙකක් පමණවන මැතිවරණ කාල පරිච්ඡේදය තුළ, මහජන නියෝජිතයන්ට සහ අපේක්ෂකයන්ට ආරක්ෂාව සැලසීම වැනි රාජකාරිද මැතිවරණ සංවිධානයට අදාළ ආරක්ෂක කටයුතු හා බැඳි රාජකාරිද ඉටු කළ යුතු බැවින්, ඡන්ද විමසීම් නීති කඩකරන අවස්ථාවල ඒ සඳහා ප්‍රමුඛත්වයක් දී කටයුතු කිරීමට යම් යම් බාධා එල්ල වන බව ද මෙහිදී නිරීක්ෂණය වේ.

189. මැතිවරණ කොමසාරිස්වරයා, පක්ෂ ලේකම්වරුන් හා පක්ෂ නියෝජිතයන් සමග පවත්වන සාකච්ඡාවල දී පොදු එකඟතාවට පැමිණ, මැතිවරණ ප්‍රචාරක කටයුතු හා සම්බන්ධ සමහර සීමා ලිහිල් කර පහසුකම් සලසා දී තිබුණ ද ඒ ගැන හෝ තැකීමක් නොකර සුපුරුදු පරිදිම කිසිදු පාලනයකින් තොරව කටයුතු කිරීමට පක්ෂ අනුගාමිකයන් පෙළඹී සිටීම ගැටළුවක් බවට පත්ව ඇත.මෙම ක්‍රියාකාරකම්, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි. මුදල් විශාල ප්‍රමාණයක් වැයකළ හැකි අපේක්ෂකයන් තම ජනප්‍රියත්වය හා බලවන්තකම ප්‍රදර්ශනය සඳහා මෙසේ ප්‍රචාරක කටයුතු මහාපරිමාණයෙන් සිදු කිරීම නිසා සෙසු අපේක්ෂකයින්ට අසාධාරණයක්ද සිදු වේ. ඊට අමතරව පොලිතින් වැනි ද්‍රව්‍ය වැඩි වශයෙන් යොදාගෙන කරනු ලබන ප්‍රචාරණ කටයුතු නිසා පරිසරයට වන බලපෑමද සුළුපටු නොවේ. මේ තත්ත්වය සැළකිල්ලට ගෙන මෙවැනි කටයුතු පාලනය සඳහා යම් පියවර ගැනීම කඩිනමින් කළ යුතුව ඇත. අපේක්ෂකයකුට ඡන්ද විමසීම වෙනුවෙන් වියදම් කළ හැකි උපරිම මුදල් සීමාවන් නියම කිරීම, සියලුම අපේක්ෂකයන්ට මැතිවරණ ප්‍රචාරණය සඳහා සමාන අවස්ථා සලසමින්, දැන්වීම්, කටවුට් ආදිය නිශ්චිත ප්‍රමාණයක් ප්‍රදර්ශනයට ඉඩ සැලසීම, මහජනතාවට හිරිහැරයක් නොවන පරිදි පොදු ස්ථානයක ඒවා ප්‍රදර්ශනය

සඳහා රජය විසින්ම ස්ථාන වෙන්කර දීම යනාදිය කළ හැකි නම් එය මෙම ගැටළු සඳහා යම් තරමක හෝ විසඳුමක් වනු ඇත. එසේ නොමැතිනම් කළයුත්තේ අදාළ නීතිය දැඩිලෙස ක්‍රියාත්මක කළ හැකි යාන්ත්‍රණයක් ඇති කිරීමට පියවර ගැනීමයි.

190. මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පැවැත්වීමට ස්ථාන වෙන්කර ගැනීමේදී ද අපේක්ෂකයන් හා දේශපාලන පක්ෂ මුහුණ දෙන ගැටළු අසීමිතය. රාජ්‍ය බලය සහිත දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින් අනෙකුත් පාර්ශ්වවල ප්‍රචාරක කටයුතුවලට බලපෑම් කරමින්, සියළු ස්ථාන තම රැස්වීම් වෙනුවෙන් වෙන්කර තැබීම පුරුද්දක් ලෙස කරනු ලබයි. මේ නිසා සියළුම අපේක්ෂකයන්ට සමාන තරග අවස්ථා අහිමිවීමක් සිදු වේ. එහෙයින් මැතිවරණ ප්‍රචාරක රැළි සඳහා ස්ථාන වෙන් කිරීමේදී ඒවායේ පාලනය භාර නිලධාරීන් දැනුවත් කොට සෑම පාර්ශ්වයකටම සම තරග අවස්ථා උදා කළ යුතුය.

දේශපාලන පක්ෂ හා අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා රජයේ දේපළ යොදා ගැනීම.

191. ඡන්ද විමසීම් කාලය තුළ රජයට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් ඡන්ද විමසීම තරග කරනු ලබන යම් පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ තෝරාගැනීම ප්‍රවර්ධනයට හෝ වලක්වාලීමට හේතුවන අයුරින් භාවිතා කිරීම තහනම් කිරීමට බලයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට ඇත. ඒ අනුව ඡන්ද විමසීම ආරම්භයේදීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපති ලේකම්වරයාට, අග්‍රාමාත්‍ය ලේකම්වරයාට, අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාට, විගණකාධිපතිට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, සියලුම අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්ට, ත්‍රිවිධ හමුදාපතිවරුන්ට, පොලිස්පතිට, සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ට ***පිටපත් සහිතව*** අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු *රාජ්‍ය දේපළ භාරකාරත්වය උසුලන නිලධාරීන්ට හා ආයතනවලට ඊට අවශ්‍ය මගපෙන්වීම් සිදු කර ඇත.* ඒ පිළිබඳව දන්වා ***"රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ ජනාධිපතිවරණ කාල සීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ජනාධිපතිවරණ කාල සීමාව තුළදී නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම/ සීමා කිරීම"***මැයෙන් වූ අංක PRE/2015/43 හා 2014.11.22 දිනැතිව චක්‍රලේඛය තැපැල් මගින් යවා ඇති අතර, එය මෙහි අංක **අට උපලේඛනය** යටතේ ඇතුලත් කර ඇත.

192. ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ඉහත චක්‍රලේඛ උපදෙස් කඩ කරමින් කටයුතු කරන බවට විවිධ සංවිධානවලින්, අපේක්ෂකයන්ගෙන් ලැබුණු පැමිණිලි භාරගැනීම සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලද පැමිණිලි භාරගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවා තිබූ අතර, ඉහත ආකාරයේ රාජ්‍ය දේපල පක්ෂ / අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගන්නා බවට වූ පැමිණිලිවලට අදාළ රජයේ ආයතන තවදුරටත් විමසා, තොරතුරු ලබා ගැනීමෙන් පසු එවැනි කටයුතු නතර කරන ලෙසට උපදෙස් දෙන ලදි.ලැබුණු පැමිණිලි අතර, රජයේ වාහන සහ ගොඩනැගිලි අනිසි ලෙස භාවිතා කිරීම රාජ්‍ය නිලධාරීන් අපේක්ෂක ප්‍රවර්ධනයට යොදා ගැනීම, රජයේ මුදල් යොදවා මිලදී ගත් බඩු බාහිරාදිය ඡන්දදායකයන් අතර බෙදා හැරීම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත නිකුත් කෙරෙන මුද්දර අපේක්ෂක ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කිරීම, රාජ්‍ය උත්සව අපේක්ෂකයන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් යොදා ගැනීම සහ රාජ්‍ය නිලධාරීන් මගින් ඡන්දදායකයාට බලපෑම් කිරීම වැනි දෑ සම්බන්ධ පැමිණිලි කැපී පෙණිනි. මෙවැනි කාර්යයන් නතර කිරීම සඳහා පොලිසිය හා මැතිවරණ කොමසාරිස්වරයා විසින් යොදවනු ලැබූ විශේෂිත නිලධාරීන් මගින් පියවර ගනු ලැබුවද, සමහර රාජ්‍ය නිලධාරීන්ගෙන් හා පොලිස් නිලධාරීන්ගෙන් ද මෙවැනි අනීතික ක්‍රියා සඳහා ලද අනුග්‍රහය නිසා ඒවා සම්පූර්ණයෙන්ම මැඩ පැවැත්වීමට හැකි වාතාවරණයක් නොවීය. එබැවින් මෙවැනි පැමිණිලි හා ඒ සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ ලේඛනයක් මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කිරීමට යෝජිතය.

193. මෙවැනි වාතාවරණයක් නිර්මාණය වීම උදෙසා, ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීම් පැවැත්වෙන ආකාරයද එක් හේතුවක් වී ඇත. ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා ඡන්ද විමසීම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම යන ඡන්ද විමසීම් වරින්වර පැවැත්වීම නිසා කුමන මට්ටමක හෝ මහජන නියෝජිත තනතුරක් දරමින් බලයේ සිටින අය, මැතිවරණයට ඉදිරිපත්ව සිටින අපේක්ෂකයන් ඉලක්ක කර ගනිමින්, එම අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා තමා භාරයේ ඇති රාජ්‍ය සම්පත් යොදා ගැනීම බොහෝ විට සිදු වේ. ශ්‍රී ලංකාවේ තවදුරටත් දැකිය හැකි ප්‍රවණතාවක් වන ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් කෙරෙන තම ඥාතීන් කෙසේ හෝ ජයග්‍රහණය කරවීම සඳහා ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට බලයේ සිටින තැනැත්තන් කටයුතු කිරීම මේ තත්ත්වය තවදුරටත් බරපතල වීමට බලපා ඇත.

194. එසේම රාජ්‍ය සම්පත් කළමණාකරණය භාරව සිටින උසස් නිලධාරීන් තම වගකීම් සම්භාරය නිසි ලෙස ඉටු නොකිරීම හා මැතිවරණ පරිපාලකයන් විසින් නිකුත් කරනු ලබන උපදෙස් පිළිනොපැදීම ද මෙවැනි වාතාවරණයක් නිර්මාණය වීම සඳහා සෘජුවම බලපා ඇත. බොහෝ නිලධාරීන් අපක්ෂපාතීව සහ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වෙනුවෙන් මැතිවරණ කොමසාරිස්වරයාට සහාය වුවද සමහර නිලධාරීන් මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පිළිගැනීමට මැලිවනවා පමණක් නොව, දේශපාලන පක්ෂවලට, අපේක්ෂකයන්ට එම උපදෙස් පිළිනොපැද කටයුතු කළ හැකි ආකාරය සම්බන්ධයෙන් ඔවුන් විසින්ම උපදෙස් ලබාදෙන අවස්ථාද නැත්තේ නොවේ. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුගත නොවී කටයුතු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් සඳහා දැඩි විනය ක්‍රියාමාර්ග ගත හැකි වන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනය කිරීම, අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය සම්පත් යොදා ගනු ලැබූ බවට තහවුරු වන යම් අපේක්ෂකයකු ඡන්ද විමසීමේදී ජයග්‍රහණය කළද ඔහුගේ මන්ත්‍රීධුරය අත්හිටුවීම මෙන්ම එවැනි අය දඬුවමට ලක්කිරීමටත්, ශ්‍රී ලංකාවේ පැවැත්වෙන සියලු ඡන්ද විමසීම් විශේෂයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණය හා පළාත් සභා ඡන්ද විමසීම එක් දිනකදී පැවැත්වීමට කටයුතු කිරීමත් යම් පිටුවහලක් විය හැකි ය.

විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතය

195. ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක ඡන්දදායකයා වෙත බොහෝ තොරතුරු සැපයීම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදුවේ. තරග කරනු ලබන දේශපාලන පක්ෂ, කණ්ඩායම් මෙන්ම අපේක්ෂකයන් තම ජයග්‍රහණයෙන් පසුව රටේ දියුණුව සඳහා ක්‍රියාත්මක කරන සැලසුම් සාමාන්‍ය ඡන්දදායකයා වෙත රැගෙනයාම මාධ්‍ය ඔස්සේ බොහෝ විට සිදුවේ. තරග කරනු ලබන පක්ෂයේ කණ්ඩායමේ අපේක්ෂකයන්ට අදාළ තොරතුරු මධ්‍යස්ථව වාර්තා කිරීම ජන මාධ්‍ය තුළින් අපේක්ෂා කෙරෙන අතර එසේ නොවී පක්ෂග්‍රාහීව කටයුතු කළහොත් එය එක් පාර්ශවයක් වෙත කරන බලවත් අසාධාරණයකි. මාධ්‍ය ආයතන රාජ්‍ය හෝ පෞද්ගලික වුවද ඒවායේ කාර්ය භාරය විය යුත්තේ ඇත්ත ඇති සැටියෙන් ඡන්දදායකයා වෙත රැගෙන යාමයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද 17 වන ව්‍යාවස්ථා සංශෝධනයෙන් රජයට අයත් මාධ්‍ය ආයතන මගින් මැතිවරණ කාලසීමාවේදී යම් පක්ෂයකට හෝ අපේක්ෂකයකුට පක්ෂව හෝ අගතියක් වන ලෙස වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හෝ ප්‍රචාරණය කිරීම සිදු කරන්නේ නම් ඒවා වැළැක්වීම සඳහා මාධ්‍ය උපමාන පැනවීමට හා ඒවා කඩවන විට නිසි බලධරයකු පත් කිරීමට ඉඩ ලබාදෙන ලදී. 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සියලුම මාධ්‍ය ආයතන වෙත උපමාන නිකුත් කිරීමට පමණක් ඉඩලබාදී ඇති අතර ඒවා කඩවන විට ගතහැකි පියවර දක්වා නැත.

196. ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාලය තුළ මාධ්‍ය හැසිරවීම සම්බන්ධයෙන් ඉහත කී පරිදි මාධ්‍ය උපමාන නිකුත් කිරීමට අමතරව, රාජ්‍ය මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන ප්‍රධානීන්, මැතිවරණ මහ ලේකම් කාර්යාලයට කැඳවා,මැතිවරණ කොමසාරිස්වරයා විසින් වාචික උපදෙස් ද ලබාදෙන ලදී. ඒ තුළින් ස්වයං වාරණයක් ඇති කර ගැනීමට අවස්ථාව ලබාදීම බලාපොරොත්තු වුණි. ඊට අමතරව මාධ්‍ය උපමාන උල්ලංඝණය වන අවස්ථා සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි අදාළ ආයතන වෙත යොමු කොට ඒ ගැන

දැනුම්වත් කිරීමද කරන ලදී. කෙසේ වෙතත් එක් රාජ්‍ය මාධ්‍ය ආයතනයක් මාධ්‍ය උපමාන උල්ලංඝණය කරමින් ඡන්ද විමසීම් දිනයේ දී කටයුතු කළ අවස්ථාවක දී මැතිවරණ කොමසාරිස්වරයාට පෞද්ගලිකවම අදාළ ආයතනයට ගොස් එම ප්‍රචාරණය වළක්වාලීමට කටයුතු කිරීමට සිදුවූ අවස්ථාවක්ද 2015 ජනාධිපතිවරණ කාලසීමාවේදී උද්ගත විය.

197. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා සහාය දැක්වීමට යම් මාධ්‍ය ආයතනයක් රජයේද එසේත් නැත්නම් පෞද්ගලික අංශයේද යන්න වැදගත් නොවන අතර, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන උල්ලංඝණය වන අයුරින් එවැනි ආයතනයක් කටයුතු කරන්නේ නම්, පළමුවන අවස්ථාවේ දී එසේ කටයුතු නොකරන ලෙස හා මාධ්‍ය උපමානවලට අනුගතවන ලෙස දැන්විය හැකිය. එසේ නොකළහොත් ඡන්ද විමසීම අවසන් වන තෙක් ඡන්ද විමසීමට අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණය අත්හිටුවීමට කටයුතු කරන බවට දැනුම්දීමටත්, ඉන්පසුද මාධ්‍ය උපමාන නොසලකා හරිමින් කටයුතු කරනු ලබන්නේ නම් ඒ ඡන්ද විමසීම අවසන් වන තෙක් ඡන්ද විමසීමට අදාළ ප්‍රවෘත්ති වාර්තාකරණය අත්හිටුවීමට හැකිවන ආකාරයේ නීති සම්පාදනය කිරීමත් මේ සම්බන්ධයෙන් වැදගත් වේ. එසේ නොමැති වුවහොත් මාධ්‍ය ආයතනවල කටයුතුවලින් අගතියට පත්වන දේශපාලන පක්ෂවලට හෝ අපේක්ෂකයන් වෙනුවෙන් මැතිවරණ කළමනාකරණ ආයතනයට කළ හැකි මැදිහත්වීම් ඉතා අඩු මට්ටමක පවතිනු ඇත.

ඡන්ද විමසීම් කාලසීමාව තුළ රාජ්‍ය උත්සව පැවැත්වීම.

198. ඡන්ද විමසීම් කාලය තුළ වුවද දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන විවිධ රාජ්‍ය උත්සව සංවිධානය කිරීම රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකළ යුතු ය. විශේෂයෙන්ම ඡන්ද විමසීමක දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාද වන දිසාපති / දිස්ත්‍රික් ලේකම්වරයා බොහෝ විට මෙම උත්සව සංවිධානයට මූලිකවම කටයුතු කරනු ඇත. මෙවැනි උත්සව සඳහා සහභාගිවන මහජන නියෝජිතයන්, රජයේ පාර්ශ්වය නියෝජනය කරමින් ඡන්ද විමසීමට තරග කරනු ලබන අපේක්ෂකයන් ප්‍රවර්ධනය කරන අයුරින් කථා පැවැත්වීම සාමාන්‍යයෙන් සිදු කෙරෙන අතර, බොහෝවිට එවැනි උත්සව සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන්ගේ සහභාගීත්වයද ලැබෙනු දැකිය හැක. මෙවැනි වාතාවරණයක් තුළ ඡන්ද විමසීම සංවිධානය කරනු ලබන නිලධාරීන්ම එවැනි උත්සව සංවිධානය කිරීම කුමන ආකාරයෙන් සාධාරණය කළ හැකිද යන්න ගැටළුවකි. එවැනි අවස්ථාවක රාජ්‍ය නිලධාරීන්ට මැතිවරණ දෙපාර්තමේන්තුවද වක්‍රාකාරයෙන් රජයේ පාර්ශ්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉඩක් ලබා දී ඇතැයි ඡන්දදායකයා තුළ වැරදි මතයක් ද ඇතිවිය හැකිය. මෙවැනි තත්ත්වයක් මෙම ඡන්ද විමසීමේ දී ද විවිධ දිස්ත්‍රික්කවල උද්ගතවීම නිසා මැතිවරණ කොමසාරිස්වරයාට ඒ සඳහා මැදිහත්ව ඒවා නතර කිරීමට හෝ කල් දැමීමටත්, එවැනි කාර්යය සඳහා ඡන්ද විමසීමේ තේරීම්භාර නිලධරයන් ලෙස කටයුතු කරන දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන් කිසිදු ආකාරයකින් සහභාගි කර නොගත යුතු බවට අදාළ අංශ දැනුවත් කිරීමටත් සිදුවිය. ඡන්ද විමසීම් කාලය තුළ උත්සව පැවැත්වීම මගින් අපේක්ෂක ප්‍රවර්ධනයක් සිදු කිරීම මැතිවරණ නීතිය අනුවද වැරදි සහගත ක්‍රියාවක් බැවින් අත්‍යවශ්‍ය, පූර්වයෙන් සැලසුම් කරන ලද උත්සවයක් වුවද දේශපාලන පක්ෂ නියෝජිතයින් හෝ අපේක්ෂකයින්ගේ සහභාගිත්වයෙන් තොරව සිදුකළ යුතු බවට නීති පැනවීම කළ යුතු විය. ඡන්ද විමසීම ප්‍රකාශයට පත්කළ පසු, ජාතික මට්ටමෙන් පැවැත්වෙන පොදු උත්සව හැර වෙනත් කිසිදු උත්සවයක් මැතිවරණ කොමසාරිස්වරයාගේ අවසරයකින් තොරව සංවිධානය කිරීම නොකළ යුතු බවටත්, ඒ අනුව කටයුතු නොකරන රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගත හැකි වන පරිදි නීති සංශෝධන කිරීමටත් ඉදිරියේදී පියවර ගතයුතු වේ.

සියලු සුදුසුකම්ලත් පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය

199. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමට අදාළ නීතිමය ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේද, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ ද සඳහන් වේ. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 107 වන වගන්තිය යටතේ ඡන්ද විමසීම පැවැත්වීම පරිපාලනය කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා සතු බලතලද විස්තර කර ඇත. ඡන්ද විමසීමක මූලික කටයුතු සංවිධානයට අදාළව මෙන්ම විශේෂයෙන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළ වැරදි, දූෂණ ක්‍රියා සහ නීති විරෝධී ක්‍රියා සහ ඒවා කඩකළ විට නියමිත දඬුවම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 66 වන වගන්තියේ සිට 87 වන වගන්තිය දක්වා වූ වගන්තිවලින් පැහැදිලි කරදී ඇත.

200. දහහත්වන සහ දහ අටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන අනුව මැතිවරණ කොමිසම පිහිටුවන තාක් ඊට අදාළ බලතල ක්‍රියාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමසාරිස්වරයාට පැවරේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාවට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථයක් වියයුතු බවට දක්වා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැහැදිලි කර ඇති අතර, යම්කිසි ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලු නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිසමේ කාර්ය භාරය වියයුතු බවටද දක්වා ඇත. ඒ අනුව නීති බලාත්මක කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවට සහයෝගය දැක්වීම, නීති බලාත්මක කිරීම භාරව සිටින රජයේ බලධාරීන්ගේ කාර්යයක් බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවේ දැක්වේ.

201. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ ව්‍යවස්ථාව යටතේ, මැතිවරණ කොමිෂන් සභාවට ඡන්ද විමසීම් අවස්ථාවකදී පොලිසිය යොදා ගැනීමට ඇති බලතල පිළිබඳව සඳහන් කර ඇත. කොමිෂන් සභාවේ උපදෙස් පරිදි කටයුතු කරමින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සෑම පොලිස් නිලධාරියකුම කොමිෂන් සභාවට වගකීමට බැඳී සිටින අතර, කොමිෂන් සභාවේ විධානයට හා පාලනයටද යටත් වේ. ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ 119 අ වගන්තියට අනුව ද මැතිවරණ කොමසාරිස්වරයාගේ විධානයට අනුව කටයුතු කළයුතු බවට දක්වා ඇත. ඉහත සඳහන් කළ නීතිමය ප්‍රතිපාදන අනුව, ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතින් පැවරී ඇති නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇති මැතිවරණ කොමසාරිස්වරයා, පොලිස්පතිවරයා සහ රජයේ බලධාරීන් යන සියල්ලන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වෙනුවෙන් කටයුතු කළ යුතු වේ. එහෙත් ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී ආරක්ෂක හමුදා සහ පොලිස් විශේෂ කාර්ය බලකාය සම්බන්ධයෙන් තරග කරනු ලබන දේශපාලන පක්ෂ වලින් පැමිණිලි ලැබීම විශේෂත්වයක් විය.විශේෂයෙන් සඳහන්කළ යුතු වන්නේ, ආරක්ෂක හමුදා මැතිවරණ සංවිධානයට අදාළ කාර්යයන් සඳහා සහභාගී කර ගැනීම අවශ්‍ය යැයි මැතිවරණ කොමසාරිස්වරයා තීරණය කරන්නේ නම් පමණක්, ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා දැනුම්වත් කර, ආරක්ෂක හමුදාවල සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීමයි. තවද පොලිස්පතිවරයා යටතේ පොලිස් විශේෂ කාර්ය බලකාය පැවතියද ඡන්ද විමසීමකට අදාළ සාමාන්‍ය රාජකාරි සඳහා ඔවුන් යෙදවීමක් සිදු නොකෙරෙන අතර, මෙතෙක් පැවති සම්ප්‍රදාය වූයේ මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත විශේෂයෙන් ආරක්ෂාව සැලසිය යුතු ස්ථාන ඇත්නම් ඒවා හඳුනාගෙන ඒවායේ ආරක්ෂාව සැලසීමට පමණක් ඔවුන් යෙදවීමයි. කෙසේ වෙතත් මහනුවර, කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික්ක වලින් ලැබුණු පැමිණිලිවලට අනුව, ආණ්ඩුවේ ප්‍රධානීන්ගේ නීත්‍යානුකූල නොවන ක්‍රියා ආවරණය කරමින් කටයුතු කිරීම, විවිධ හේතු දක්වමින් ඡන්දදායකයන් වෙත බඩු බාහිරාදිය බෙදාදීම සහ නීතිය නිසිලෙස ක්‍රියාත්මක කරන නිලධාරීන් වෙත බලපෑම් කරමින් එම කටයුතු අඩපණ කිරීමට උත්සාහ දැරීම වැනි චෝදනා එල්ල විය. මේ තත්ත්වය සැලකිල්ලට ගෙන එවැනි දෑ සිදුවන්නේනම් වහාම ඒවා වැළැක්වීමට පියවර ගන්නා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙන්ම පොලිස්පතිවරයා දැනුම්වත් කිරීමටද පියවර ගන්නා ලදී. කෙසේ වෙතත් ආරක්ෂක හමුදා සහ පොලිස් විශේෂ කාර්ය බලකාය සම්බන්ධයෙන් මහජනතාව තුළ ඇති ගෞරවය සහ විශ්වාසය ඒ අයුරින් ආරක්ෂාකර ගැනීමට හැකි අයුරින් එම ආයතන කටයුතු කිරීම ඉතා වැදගත්වනු ඇතැයි මාගේ විශ්වාසයයි.

202. ජනාධිපතිවරණ ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කොට සති 7 – 8ක් වැනි කාලයක් තුළ ඡන්ද විමසීම පවත්වා අවසන් කිරීමට නියමිත අතර මෙම ජනාධිපතිවරණයේදී නාමයෝජනා භාරගැනීමේ දින සිට සති හතරක කාලයක් තුළ ඡන්ද විමසීමේ දිනය නියම විය. ඡන්ද විමසීමක නීතිය බලාත්මක කිරීමට බලය පැවරී ඇති ඉහත කී නිලධාරීන් මෙම කාල සීමාව තුළ තම රාජකාරිය නිවැරදිව ඉටු කිරීම ප්‍රධාන වශයෙන් ඡන්ද දායකයන් සහ තරග කරනු ලබන අපේක්ෂකයන් බලාපොරොත්තුව වන ආකාරයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වෙනුවෙන් බලපෑමක් කරනු ඇත. අදාළ වගකිවයුතු නිලධාරීන් පවත්නා සාමාන්‍ය පරිපාලන රටාවට අනුගතව කටයුතු කරමින්, නිද්‍රාශීලිව සිටියහොත් ඒ තුළින් ඡන්දදායකයාට මෙන්ම තරග කරනු ලබන අපේක්ෂකයාටද අසාධාරණයක් වනු ඇත. මේ තත්ත්වය වළක්වා ගත හැක්කේ වගකීම පැවරෙන සියලුම නිලධාරීන් මනා සම්බන්ධීකරණයකින් යුතුව තම වගකීම් සම්භාරය දැඩි කැපවීමෙන් යුතුව ඉටු කරමින් සෙසු නිලධාරීන්ද ඒ සඳහා පෙළඹවීම තුළය. එසේ නොවන අවස්ථාවලදී ඡන්දදායකයන් මෙන්ම දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් හා සිවිල් සංවිධානද සිදුවන අසාධාරණයට එරෙහිව මැතිවරණ කොමසාරිස්වරයා වෙත පැමිණිලි ඉදිරිපත් කරන අතර මෙම ඡන්ද විමසීමේදීද එවැනි තත්ත්වයක් දක්නට ලැබුණි.

203.1 ආසියානු කලාපයේ සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී රටක් ලෙස ශ්‍රී ලංකාව වාර්තා අතරට එක් වූවද, ඡන්ද නීති නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට පැමිණෙන බාධා හේතුවෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය නොවීම නිසාත්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ඡන්ද විමසීම් අණ පනත්වල විශේෂයෙන්ම ඡන්ද සලකුණු කිරීමේදී අනුගමනය කළයුතු විවිධාකාර වූ උපදෙස් හේතුවෙනුත් ඡන්දය සලකුණු කිරීමේදී ප්‍රතික්ෂේප වන ඡන්ද පත්‍රිකා ප්‍රමාණය ඉහළ අගයක් ගනී. එසේම නව නීති සංශෝධනයක් අනුව ක්‍රියාත්මක වන ඡන්ද පොළේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අනන්‍යතා ලේඛන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව හේතුවෙන් මැතිවරණ ක්‍රියාදාමය වඩාත් විධිමත් වුවද ඒ සම්බන්ධයෙන් ඡන්දදායකයන් දැනුවත් නොවීම හේතුවෙන් ඡන්ද විමසීම් දින ඡන්ද පොළට ගොස් ඡන්දය ප්‍රකාශ කළ නොහැකි පිරිස් පිළිබඳවද පසුගිය ඡන්ද විමසීම්වල දී වාර්තා වූ බැවින්, 2012, 2013 හා 2014 වර්ෂවල පැවති පළාත් සභා ඡන්ද විමසීම්වලදී ක්‍රියාත්මක කළ ආකාරයට හා එහි ඉදිරි පියවරක් ලෙස ඡන්දදායකයන් දැනුවත් කිරීම සඳහා “ඡන්දය ඔබේ අයිතියයි.” යනුවෙන් වූ දැනුවත් කිරීමේ වැඩසටහනක්, ජනාධිපතිවරණ කාලසීමාවේ ක්‍රියාත්මක කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

203.2 නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා අවශ්‍ය වන පරිසරය සැකසීම, ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්දදායකයා ඡන්ද පොළ වෙත යාමේදී රැගෙන යායුතු දේ මෙන්ම ඡන්දය සලකුණු කළ යුත්තේ කෙසේද යන්න සම්බන්ධයෙන් ඡන්දදායකයා දැනුවත් කිරීම එම වැඩසටහනේ අරමුණ විය. ඡන්දදායකයාට තම නිවසේ සිට ඡන්ද පොළ දක්වා කිසිඳු බාධාවකින් තොරව යාමටත්, ඡන්ද පොළේදී තමා කැමති ආකාරයෙන් නිදහස්ව හා සාධාරණව ඡන්දය ප්‍රකාශ කිරීමටත් අවශ්‍ය පරිසරය තේරීම්භාර නිලධාරී හා පොලිසිය එක්ව නිර්මාණය කර ඇති බවට වන හැඟීමක් හැඟීමක් ඡන්දදායකයා තුළ ඇති කිරීමත් මෙහි බලාපොරොත්තුව විය. ඡන්ද පොළ වෙත ගොස් තම ඡන්දය පාවිච්චි කරන ඡන්දදායකයා මෙන්ම, තැපෑලෙන් ඡන්ද භාවිතා කරන ඡන්දදායකයා දැනුම්වත් කිරීමටත්, තැපැල් ඡන්ද ක්‍රියාවලිය සම්බන්ධයෙන් දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් මෙන්ම තැපැල් ඡන්දදායකයා තුළ ඇති සැකය/ අවිශ්වාසය දුරුකිරීම් වස් එම කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදුවන බවට අදාළ පාර්ශව දැනුම්වත් කිරීමටද පියවර ගනු ලැබීය.

203.3 ඡන්දය ප්‍රකාශකිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අඩු අවබෝධයක් සහිත උතුරු නැගෙනහිර පළාත්වල ඡන්දදායකයන් මෙන්ම වතු ආශ්‍රිත ද්‍රවිඩ ජනතාවද, නාගරික ප්‍රදේශවල රජයේ හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු පිරිස් මෙන්ම, කොළඹ මහනුවර වැනි ප්‍රධාන නගර ආශ්‍රිතව පෞද්ගලික අංශයේ රැකියා කරන අයවළුන්ද ජනාධිපතිවරණයට අදාළව ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ සෑම නගරයකම, විශේෂයෙන්ම යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්ක, හලාවත, ආරච්චිකට්ටුව, වෙන්නප්පුව, මාදම්පේ, වත්තේගම, ගම්පොළ, නාවලපිටිය,ගල්නෑව, එප්පාවල, වදුරඹ, හම්බන්තොට, අම්බලන්තොට, කොළොන්නාව, මොණරාගල, බිබිල ආදී ප්‍රදේශවල ජනතාව දැනුම්වත් කිරීමටත්, පොදුවේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ සම්බන්ධීකරණයෙන් ඡන්දදායකයන් දැනුම්වත් කිරීමේ

වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩපිළිවෙල 2014.12.27 දින සිට 2015.01.05 දින දක්වා සිදු කිරීමට සැලසුම් කළද ජනතාව දැනුම්වත් කිරීමේ කටයුතු නියමිත කාල රාමුව තුළ අවසන් කිරීමට නොහැකිවීම සැලකිල්ලට ගෙන ඡන්දදායකයන් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙල ඡන්ද විමසීම් දින පස්වරු 2.00 දක්වා ක්‍රියාත්මක කරන ලදී. ඡන්ද විමසීමට ආසන්න දිනවලදී හා ඡන්ද විමසීම් දිනයේදී ඡන්දදායකයන් දැනුම්වත් කිරීම සම්බන්ධයෙන් තරග කරන ලද සමහර අපේක්ෂකයන්ගේ පාර්ශවවලින් විවේචනද එල්ල විය. එකී ක්‍රියාමාර්ග පිළිබඳ විරෝධය දක්වමින් ඉදිරිපත් කරන ලද සමහර ඉල්ලීම් , බලපෑම් ලෙසද වර්ග කළ හැකිවිය.එසේ වුවද මෙහිදී මැතිවරණ දෙපාර්තමේන්තුවේ ස්ථාවරය වූයේ සියලුම ඡන්දදායකයන් දැනුම්වත් කොට ඡන්දහිමියන් හැකි උපරිම සංඛ්‍යාවක් ඡන්දය භාවිතා කිරීමට උනන්දු කරවීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා අත්‍යාවශ්‍ය බවයි.

203.4 “ඡන්දය ඔබේ අයිතියයි” යන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී, එවැන්නක් සංවිධානය කිරීමසම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ජනතාවගෙන් ලැබුනු ප්‍රතිචාර ඉහළ මට්ටමක පැවතිණි. මේ නිසා ඉදිරි සෑම ඡන්ද විමසීමකදීම ඡන්දදායකයා දැනුවත් කිරීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයක් බවට පත්කිරීම මෙන්ම, එහිදී මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ගම් මට්ටමේ පවතින ස්වේච්ඡා සංවිධානවල සහාය ලබාගෙන පිහිටුවන ජාලයක් හරහා මෙම කාර්ය ඉටුකිරීම අනිවාර්යයෙන්ම කළ යුතුව පවතී.

204. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඇ ව්‍යවස්ථාව අනුව, පොලිස් නිලධාරීන් වෙත පැවරෙන රාජකාරි ඉටු කිරීමේදී ඔවුන් මැතිවරණ කොමිෂන් සභාවට වගකීමට බැඳී සිටින අතර, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් අමතන ලද රජයේ සම්පත් භාවිතය වැළැක්වීමට අදාළව නිකුත් කරන ලද උපදෙස් අනුව සියලුම රජයේ නිලධාරීන්ද එම වගකීමට බැඳී ඇත. මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ද මෙවැනි මැතිවරණ නීති උල්ලංඝණය වන අවස්ථා වැළැක්වීමට කටයුතු කරන ලෙසට පොලිසියට මෙන්ම අදාළ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ටද උපදෙස් දී ඇත. එහෙත් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගෙන් මෙන්ම මහජනතාවගෙන් මැතිවරණ කොමසාරිස් වෙත ලැබුණු පැමිණිලි වලින් සනාථ වූයේ පොලිසිය මෙන්ම රාජ්‍ය නිලධාරීන්ද මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝග ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ බවයි. පොලිස් නිලධාරීන් වෙත ඡන්ද විමසීමකදී පැවරෙන කාර්යභාරය සම්බන්ධයෙන් පොලිස්පතිවරයා මෙන්ම මැතිවරණ කොමසාරිස්වරයාද අවශ්‍ය උපදෙස් ලබාදී තිබියදීත්,රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අදාළ නීතිමය ප්‍රතිපාදන සපයා තිබියදීත් දිගින් දිගටම මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් නිහඬපිළිවෙතක් අනුගමනය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයට විශාල බලපෑමක් සිදුකර ඇත. ඒ ආකාරයෙන්ම සෙසු රාජ්‍ය නිලධාරීන්ද මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් පිළිපැදීම සම්බන්ධයෙන් දක්වන උදාසීනතාවයද නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සහතික කිරීමට බාධාවක් වී ඇත. සමහර නිලධාරීන් උපදෙස් ක්‍රියාවේ යෙදවීම සිදු නොකිරීම හෝ ප්‍රමාද කිරීමෙන් නොනැවතී, එම උපදෙස් වලින් රිංගා කටයුතු කළ හැකි අයුරු දේශපාලන පක්ෂ/ අපේක්ෂකයන් වෙත පෙන්වා දී ඇති අවස්ථාද නැත්තේ නොවේ. මෙම තත්ත්වය ගැන සැලකිලිමත්ව ඡන්ද විමසීම් කාලසීමාව තුළ පොලිස් නිලධාරීන්ගේ කාර්ය භාරය නිසි ලෙස ඉටු නොවන බවට ලැබෙන පැමිණිලි භාරගැනීම හා විමර්ශනය කිරීමටත් ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වන අයට නීත්‍යානුකූල පියවර ගැනීමට අවශ්‍ය බලය පොලිස් කොමිෂන් සභාව වෙත පැවරීමත්, ඡන්ද විමසීම් කාලය තුළ මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් නොතකා කටයුතු කරන සෙසු රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම රාජ්‍ය නිලධරයන්ගේ විනය කටයුතු භාර අංශ වෙත පැවරීමත් මගින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා අවශ්‍ය වටපිටාව සකස් කළ යුතුව ඇත.

XIII වන කොටස

ඇගයීම

205. මෙතෙක් පැවති ජනාධිපතිවරණ ඡන්ද විමසීම් සමග සසඳා බලන විට ඉතා කෙටි කාලයක් තුළ සංවිධානය කළ යුතුව තිබුණු ජනාධිපතිවරණය මෙම ජනාධිපතිවරණය වුවද, සමස්ථ රාජ්‍ය සේවයේ එකමුතුව ක්‍රියා කිරීමේ ගුණාංගය නිසා ඡන්ද විමසීමට අදාළ කටයුතු සංවිධානයේදී මැතිවරණ දෙපාර්තමේන්තුවට ප්‍රබල බාධක වලට මුහුණ දීමට සිදු නොවුණි. සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම ප්‍රධානීන් සහ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් ඇතුළු සියළුම කාර්යය මණ්ඩලවල සහාය මෙම කාර්යයේදී මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ලැබිණි. ඡන්ද විමසීමක් පැවැත්වීමෙහිලා තනි තනිව මෙන්ම සාමූහික වශයෙනුත් වගකීම් භාරගෙන කටයුතු කිරීමේ වැදගත්කම මෙන්ම විවේචනවලට හෝ චෝදනාවලට අවකාශ නොතබා ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල යෙදීමද සියලු නිලධාරීන් සම්බන්ධයෙන් එකසේ වැදගත් වේ. ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල යෙදුන කිසිදු නිලධරයකුට විරුද්ධව පැමිණිලි ලැබී නොතිබීම තුළ, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා රජයේ නිලධාරීන් දැක්වූ උනන්දුව ඵලදායක බව ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලැබිණි. මෙම ඡන්ද විමසීමේදී රජයේ සේවකයන් ක්‍රියා කරන ලද ආකාරය මෙන්ම ඔවුන්ගෙන් ලද විශිෂ්ට සහයෝගය සෑම අංශයකම ගෞරවයට හා ප්‍රශංසාවට ලක් වූ බව සතුටින් සඳහන් කළ යුතු ය.

206. විශේෂයෙන්ම මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් සහාය දක්වන ලදුව, මැතිවරණ කොට්ඨාස 22ට අදාළ තේරීම්භාර නිලධාරීන් තම වගකීම පිළිබඳ උසස් හැඟීමකින් යුතුව ස්වකීය කාර්යය ඉටු කරන ලදී. ඔවුන් සියලු දෙනාම තමා වෙත පැවරුණු රාජකාරී මනාව සැලසුම් කරමින්, කල්වේලා ඇතිව කාර්ය අවසන් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පැසසිය යුතුය. දිස්ත්‍රික් මට්ටමේදී තේරීම්භාර නිලධාරීන්ගේ ප්‍රධාන සහායකයන් වන දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේද සහාය ලබා ගනිමින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් මහත් කැපවීමකින් යුතුව කටයුතු කළ අතර, ඔවුන් දිවා රෑ නොබලා කටයුතු කරමින් ඡන්ද විමසීමේ කටයුතු සාර්ථක කර ගැනීමට දක්වන ලද උනන්දුව අගය කළ යුතුය. ඡන්ද විමසීමකට අදාළ සියලු කටයුතු සංවිධානයෙහිලා සියලුම දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තේරීම්භාර නිලධරයාට අවශ්‍ය උපරිම සහාය ලබාදෙන ලදී. ඉහත සඳහන් කරනු ලැබූ රාජ්‍ය සේවයේ සියලු නිලධාරීන් සහ සංස්ථා/ මණ්ඩලවල සියලු නිලධාරීන් මැතිවරණ කටයුතු සාර්ථක කර ගැනීමට දක්වන ලද සහාය වෙනුවෙන් විශේෂයෙන් ස්තුතිවන්ත විය යුතු ය.

207. ඡන්ද විමසීම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පොලිස්පතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ වෙනම ඒකකයකද පිහිටුවා තිබූ අතර, ඡන්ද විමසීම් කාල සීමාවේ වූ මාස දෙකක් පමණ කාලය තුළ පොලිසිය වෙත පැවරෙන සාමාන්‍ය රාජකාරී ඉටු කිරීමට අමතරව, පොලිස් දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය, ඡන්ද විමසීමට අදාළ වූ නීති විරෝධී ක්‍රියා මැඩලීට, ඡන්ද විමසීමට සහ ඡන්ද ගණන් කිරීමට අදාළ රාජකාරිවල යොදවනු ලැබිණි. ඒ අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සහතික කිරීම සඳහා පොලිසිය විසින් ක්‍රියාකළ ආකාරය ප්‍රශංසනීය වේ.

208. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඡන්ද විමසීමට අදාළ සියලු මුද්‍රණ කටයුතු ඉටුකරවා ගන්නා ලද්දේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතිනි. ඡන්ද විමසීම් දැන්වීම ප්‍රකාශයට පත් කිරීමට ආසන්න කාලයේ සිට ආරම්භ කරන ලද එම කාර්ය භාරයට, සියලුම අණ පනත්, උපදෙස් පත්‍රිකා සහ ආකෘතිපත් මුද්‍රණයත්, රහස්‍යතාව සියයට සියයක් සුරකිමින් ඡන්ද විමසීමට අදාළ ඡන්ද පත්‍රිකා මුද්‍රණය ඇතුලත් වූ අතර කලට

වේලාවට සිදුකර දෙමින් රජයේ මුද්‍රණාලයාධිපතිවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය දක්වන ලද සහයෝගයට ස්තුති කරමි.

209. මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම පරිදි, ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම නිකුත් කිරීමත් සමග නිදහස් තැපැල් පහසුකම් ලබා දෙමින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්, මැතිවරණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආයතන හා වෙනත් ආයතන හා ඡන්දදායකයන් අතර හුවමාරු වන ඉතා වැදගත් ලියවිලි අදාළ අංශ වෙත ආරක්ෂිතව භාරදීමේ කාර්ය තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. ඒ යටතේ ඡන්දදායකයන් 15,044,490ක් තරම් වූ සංඛ්‍යාවක් වෙත නිල ඡන්ද දැන්වීම්පත් ඔවුන්ට අදාල ලිපින වෙත භාරදීමත්, තැපැල් ඡන්දදායකයන් සඳහා තැපැල් ඡන්ද අඩංගු ඡන්ද පත්‍රිකා 541,452ක් පමණ අදාළ සහතික කිරීමේ නිලධාරී කාර්යාල වෙත බෙදා හැරීමත්, තැපෑලෙන් ඡන්දය සලකුණු කිරීමෙන් පසුව ආපසු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාල වෙත ඒවා යොමු කිරීමත්, මැතිවරණ නිලධාරීන් 200,000 කට ආසන්න සංඛ්‍යාවකගේ පත්වීම් ලිපි කලට වේලාවට ඔවුන් වෙත යොමු කරමිනුත් ඡන්ද විමසීමේ කටයුතු සාර්ථක කර ගැනීමට තැපැල්පතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ලබාදුන් සහාය ස්තුති පූර්වකව සිහිපත් කළ යුතුය.

ගුවන් විදුලිය, රූපවාහිනිය හා මුද්‍රිත මාධ්‍ය මගින් අදහස් ප්‍රකාශ කිරීම හා තොරතුරු වාර්තා කිරීම, නිවැරදිව සහ අපක්ෂපාතීව සිදු කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් සංකේතයක් මෙන්ම මූලික ලක්ෂණයක් ද වේ. මාධ්‍ය ආයතන තම නිදහස භාවිතා කරන ආකාරය, සමස්තයක් ලෙස සමාජයට සහ ජනතාවට සේවය කිරීම උදෙසා ම විය යුතු ය. මාධ්‍ය ආයතනවල කටයුතු වෘත්තීය මට්ටමින් පවත්වාගෙන යාමට සහ ශ්‍රවනය කරන්නන්ගේ, පාඨකයන්ගේ සහ ප්‍රේක්ෂකයන්ගේ අයිතිවාසිකම් ගරු කොට සැලකිය යුතු ය. ජනතාවගේ දෛනික ජීවිතයට ගරු කොට තොරතුරු, අධ්‍යාපනික සහ විනෝදාත්මක වැඩසටහන් ඉදිරිපත් කළ යුතු ය. මහජනතාවට වැදගත් වන කරුණු ගැන සාකච්ඡා සහ වාද විවාද සාධාරණ අන්දමින් පැවැතිය යුතු ය. එසේම පුවත් වාර්තා කිරීම සහ කතු වැකි ඉදිරිපත් කිරීම ද අපක්ෂපාතී වීම වැදගත් වේ.

මතභේදාත්මක ගැටළු ගැන අදහස් ප්‍රකාශ කිරීමේ දී ගැටළුවේ ප්‍රතිවිරුද්ධ පැති දෙකම නියෝජනය විය යුතු ය. එවැනි ගැටළු සම්බන්ධයෙන් තම අදහස් ප්‍රකාශ කිරීමට පුද්ගලයන්, පක්ෂ සහ සංවිධාන විසින් අවස්ථාවක් ඉල්ලුම් කළ විට, එවැනි ඉල්ලීම්වලට ප්‍රමාණවත් කාලයක්/ඉඩක් දීම සලකා බැලිය යුතු ය.

ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රියාදාමය තුළ මහජනතාවගේ සහභාගිත්වය ධෛර්යමත් කිරීමට සහ විවිධ කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරණ අපේක්ෂකයන්ට දැනුවත් වීමට ඇති අවස්ථාව සුරක්ෂිත කිරීමට, මැතිවරණ කාලසීමාව තුළ මාධ්‍ය සතුව විශේෂ වගකීමක් ඇත.

ඉහත සඳහන් අපේක්ෂාවන් පෙරදැරි කරගෙන, පැවරී ඇති බලතල පරිදි ඉදිරියේ දී පැවැත්වෙන ඡන්ද විමසීම් කාලය තුළ දී මාධ්‍ය ආයතන විසින් පිළිපැදිය යුතු උපමාන පහතින් සඳහන් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අටවන සංශෝධනයෙන් සංශෝධිත වූ දහහත්වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (5) (අ) අනු ව්‍යවස්ථාව සහ මැතිවරණ පැවැත්වීමට අදාළ වෙනත් නීති රීති යටතේ මැතිවරණ කොමසාරිස්, මහින්ද දේශප්‍රිය වන මට පැවරී ඇති බලතල, වගකීම් සහ කාර්යය භාරය අනුව නිදහස්, ස්වාධීන හා රහස්‍ය ඡන්ද විමසීම් පැවැත්වීම සහතික කිරීම සඳහා සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන් විසින් පිළිපැදීම සඳහා පහත සඳහන් උපමාන මෙයින් නිකුත් කරමි.

1. ප්‍රවෘත්ති පත්‍රවල ඉඩ වෙන්කර දීමේ දී හෝ ගුවන් කාලය ලබා දීමේ දී කිසිම අපේක්ෂකයකුට හෝ පක්ෂ නායකයකුට හෝ වෙනස්කම් නොකළ යුතු අතර ජනාධිපතිවරණය පිළිබඳව වාර්තා කිරීමේ දී සියලුම මුද්‍රිත, රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය ආයතන සමතුලිතතාවයක් හා අපක්ෂපාතිත්වයක් දැක්විය යුතු ය ;

2. ප්‍රවෘත්ති විකාශය සහ වත්මන් තතු විකාශය කිරීමේ දී සියලුම මාධ්‍ය ආයතන නිවැරදි, සමතුලිත සහ අපක්ෂපාති විය යුතු ය ;

3. ප්‍රවෘත්ති පත්‍රවල කර්තෘ අදහස් ව්‍යාකුල මෙන්ම සමබර නොවීමට ඉඩ ඇති බැවින් කර්තෘ අදහස් විද්‍යුත් මාධ්‍ය විසින් විකාශය නොකළ යුතු ය. එසේ නමුදු කිසියම් හේතුවක් නිසා කර්තෘ අදහස් විකාශය කළහොත් ඊට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටියහොත් එම කරුණු විකාශය කිරීමට බැඳී සිටිය යුතු ය ;

4. ඡන්ද විමසීම් කාලය තුළ දී සමතුලිතභාවය නොමැති වැඩසටහන් විකාශය නොකිරීමට සියලුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රවෘත්ති අංශ හා වත්මන් තොරතුරු විකාශය භාර අංශවල වගකීම වේ ;

5. යම් සිද්ධියක් හෝ සිදුවීමක් පිළිබඳව කරුණු විකාශය කිරීමේ දී යම් අපේක්ෂකයකුගේ අදහස් ඉදිරිපත් කරන විට එම කරුණු ගැන උනන්දුවක් හෝ සැලකිල්ල දක්වන හෝ එම කරුණු මගින් බලපෑමක් ඇති විය හැකි අනෙකුත් පක්ෂවලට එම ප්‍රවෘත්ති විකාශයේ දීම හෝ වැඩසටහනේ දීම හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සලසා දිය යුතු ය. එදිනම ඒ අවස්ථාව ලබා දිය නොහැකි නම් එයට පසුදින හෝ ඒ සඳහා අවස්ථාව දිය යුතු ය ;

6. ඕනෑම වාර්තාමය වැඩසටහනක් හෝ විශේෂ වැඩසටහනක් හෝ ඡන්ද විමසීම් සමයේ දී විකාශය කිරීමේ දී පිටපත්කරු, නිවේදක හා සංස්කාරකගේ නම සඳහන් කළ යුතු ය ;

7. පෙර අවස්ථාවල දී විකාශය කළ හෝ පළකළ සාකච්ඡා, වාද විවාද සහ එබඳු වැඩසටහන් ඡන්ද විමසන දිනට පූර්වයෙන් යෙදෙන පැය 48 කාලය තුළ දී නැවත විකාශය කිරීම හෝ පළ කිරීම සිදු නොකළ යුතු ය ;

8. ජනාධිපතිවරණය අවසන් වනතුරු ජනාධිපතිවරණයට තරඟ කරනු ලබන අපේක්ෂකයන්ට විරුද්ධව ඔප්පු කිරීමට නොහැකි චෝදනා ප්‍රවෘත්ති ප්‍රකාශනවල දී හෝ වැඩ සටහන්වල දී ප්‍රචාරය නොකළ යුතු ය ;

9. රාජකාරිමය උත්සව සහ අපරාධ ආදී ඡන්ද විමසීම මත අදාළ නොමැති ප්‍රවෘත්ති විසුරුවා හැරීමේ දී වුව ද එමගින් කිසියම් අපේක්ෂකයකුට ප්‍රතිලාභයක් හෝ අගතියක් සිදු නොවන බවට සියලුම මාධ්‍ය ආයතන සුපරීක්ෂාකාරී විය යුතු ය ;

10. ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ රජයේ අමාත්‍යවරු සම්බන්ධ වන දේශපාලන මත/අදහස් ප්‍රකාශ කිරීමේ රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්වල ඔහු/ඇය අයත් වන දේශපාලන පක්ෂයේ වැඩ සටහනක් ලෙස සැලකිය යුතු අතර, එම නිසා එයට විරුද්ධ අදහස් දරන දේශපාලන පක්ෂවල නායකයන්ට ද ඒ හා සමාන වැඩ සටහන් ලබා දිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය ද ඒ අයුරින් දේශපාලන පක්ෂවලට විශේෂ සාකච්ඡා ලබා දීමේ දී පක්ෂ රැස්වීම් වාර්තා පළ කිරීමේ දී සමාන ඉඩක් හා ප්‍රමුඛතාව ලබා දිය යුතු ය ;

11. යම් අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක් දක්වා ප්‍රවර්ධනය වන අයුරින් හෝ වෙනත් අපේක්ෂකයන් හට අගතියක් වන අයුරින් හෝ ගුවන් කාලය නැතහොත් ප්‍රවෘත්ති පත්‍ර ඉඩකඩ වෙන් කිරීම නොකළ යුතු ය ;

12. ඡන්ද විමසීමට ඉදිරිපත් වී ඇති අපේක්ෂකයකු ප්‍රවර්ධනය කෙරෙන සේ රාජ්‍ය නිලධාරීන් විසින් පවත්වන දේශන, සම්මුඛ සාකච්ඡා ආදිය ප්‍රචාරය කිරීමෙන් සියලුම මාධ්‍ය වැළකී සිටිය යුතු ය.

13. කණ්ඩායම් සාකච්ඡා සඳහා සහභාගීවන්නන් තෝරා ගැනීමේ දී සියලුම විද්‍යුත් මාධ්‍ය ආයතන සාධාරණ ලෙස කටයුතු කළ යුතු අතර සාකච්ඡාවේ අඩංගු දෑ සමතුලිත විය යුතු ය. යම් වැඩසටහනකට සහභාගී වන කිසියම් නියෝජිතයකුට අදාළ භාෂාවේ මනා ප්‍රවීණතාවක් නොමැති වීම හේතුවෙන් ඔහුට/ඇයට අගතියක් වන ආකාරයට වැඩසටහන් මෙහෙයවීමෙන් වැළකිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය විසින් සම්මුඛ සාකච්ඡා ලබාගෙන ප්‍රසිද්ධ කිරීමේ දී ද භාෂා ප්‍රවීණතාව නොමැති වීම නිසා සාකච්ඡාවට සහභාගි වන දේශපාලනඥයකු අපහසුතාවට පත්වන අයුරින් ක්‍රියා නොකළ යුතු ය. අපැහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ප්‍රශ්න හරහා ලබා ගන්නා තොරතුරු ප්‍රසිද්ධ නොකළ යුතු ය ;

14. දුරකථන මාර්ගයෙන් ප්‍රශ්න හා තොරතුරු ලබා ගනිමින් පවත්වනු ලබන වැඩ සටහන්වල දී, සියලුම අමතන්නන්ට ඔවුන්ගේ ප්‍රශ්නවල හෝ යෝජනාවල අඩංගු කරුණු කුමක් වුව ද එක හා සමාන අවස්ථා දිය යුතු ය. එමෙන්ම එවැනි වැඩසටහන්වල සමබරතාවය ගැන එම වැඩසටහන මෙහෙයවන හා සම්බන්ධ වන සියලුම නිලධාරීන් වගකිව යුතු ය.

15. කිසියම් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සභාපතිවරයකු, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු හෝ සේවකයකු දේශපාලන කටයුතුවල ක්‍රියාකාරිව නිරතව සිටී නම් එවැනි නිරතවීම් සමබර විකාශනයකට බාධා වන ගැටුම්වලට හේතු වේ. එබැවින් පහත සඳහන් කරුණු කළමනාකාරිත්වයේ දැන ගැනීම සඳහා අදාළ නිලධාරීන්/සේවයක් විසින් දැනුම් දිය යුතුය ;

(අ) එවැනි පුද්ගලයන්ගේ මැදිහත්වීමේ මට්ටම

(ආ) එවැනි පුද්ගලයන්ගේ රැකියාවේ ස්වභාවය හා මට්ටම

(ඇ) වැඩසටහන් සැකසීමේ දී එවැනි පුද්ගලයන්ගේ මැදිහත් වීමේ ප්‍රමාණය

16. පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රධාන නිලයක් (නායක, සභාපති, ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, නියෝජ්‍ය නායක, උප නායක, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති හෝ ඒ සමාන බලතල ඇති) දරන තැනැත්තෙකු මාධ්‍ය ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ප්‍රධාන විධායක/ප්‍රධාන කර්තෘ වැනි ප්‍රමුඛ තනතුරක් දරන විට දී එකී තැනැත්තා ජනාධිපතිවරණ අපේක්ෂකයකු වන්නේ නම් හෝ ඔහු/ඇය ප්‍රමුඛ නිලයක් දරන පක්ෂය ඡන්ද විමසීමේ දී සෘජුවම හෝ පිළිගත් සන්ධානයකින් තරඟයට එළඹ ඇත්නම් එකී ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී ඔහු/ඇය මාධ්‍ය ආයතනයේ තනතුරේ ක්‍රියාකාරීව කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතු ය. නැතහොත් එම මාධ්‍ය මෙහෙයවීමේ කටයුතුවලින් ක්‍රියාකාරීව කටයුතු කිරීමෙන් වැළකී සිටිය යුතුය. තව ද යම් ඡන්ද විමසීමක දී තරඟ කරන පක්ෂයකට ප්‍රධාන නිලයක් දරන තැනැත්තෙකු හෝ ඡන්ද විමසීමේ දී අපේක්ෂකයකු ලෙස තරඟ කරන තැනැත්තකු එකී ඡන්ද විමසීම් කාලසීමාව තුළ රූපවාහිනී හෝ ගුවන් විදුලි මාධ්‍යවල දේශපාලනමය වැඩසටහන් මෙහෙයවීමෙන් වැලකී සිටිය යුතු අතර මුද්‍රිත මාධ්‍යයක නිත්‍ය සේවයේ නිතරව සිටින්නේ නම් එකී මාධ්‍ය හරහා ස්වකීය දේශපාලනමය ලිපි ප්‍රසිද්ධ කිරීමෙන් වැළකී සිටිය යුතු ය ;

17. කිසියම් මාධ්‍ය ආයතනයක් විසින් ඉදිරිපත් කරන සාකච්ඡාවකට හෝ සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වීම කිසියම් පුද්ගලයකු විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක සහ එසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු ඉදිරිපත් නොකෙරෙන අවස්ථාවක මාධ්‍ය ආයතනය විසින් එවැනි තත්ත්වයන්ට ගරු කළ යුතු ය. එවැනි අවස්ථාවල දී හිස් පුටුවක් ප්‍රදර්ශනය කිරීම වැනි නාට්‍ය ස්වරූප උපායක් වෙනුවට සෘජු සහ සරල නිවේදනයක් මගින් එවැන්නක් ප්‍රකාශ කිරීම යෙහෙකි.

18. මත විමසුමක ප්‍රතිඵල ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් විකාශය කිරීමේ දී හෝ මුද්‍රිත මාධ්‍යයෙන් පළ කිරීමේ දී එම මත විමසුම පවත්වන ලද සංවිධානය හඳුන්වා දීම, එම කාර්යය පවරන ලද හා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් ආයතනය හෝ තැනැත්තා භාවිතා කළ ක්‍රමය, නියැදියේ ප්‍රමාණය, දෝෂ සීමාව සහ ක්ෂේත්‍රයේ කටයුතු කළ දින වකවානු සඳහන් කළ යුතු ය. මත විමසුම පවත්වන ලද අවස්ථාවේ පැවැති මහජන මතය පමණක් මින් පිළිබිඹු වන බව විකාශක හෝ ප්‍රකාශක විසින් සඳහන් කළ යුතු ය.

19. තරඟයට එළඹ සිටින අපේක්ෂකයකු විසින් වෙනත් අපේක්ෂකයකුගේ ජයග්‍රහණය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ කරන ලද ප්‍රකාශ, විකාශය නොකළ යුතු ය. ප්‍රසිද්ධ නොකළ යුතු ය.

20. මැතිවරණ කොමසාරිස් විසින් දෙන ලද ලිඛිත අවසරයක් නොමැතිව ඡන්ද මධ්‍යස්ථානය තුළ හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථාන තුළ ඡායාරූප ගැනීම, වීඩියෝ කිරීම තහනම් කර ඇති බැවින් එසේ කිරීමෙන් වැලකී සිටීමට සියලුම මාධ්‍යවේදීන් ක්‍රියා කළ යුතු අතර, අනවසරයෙන් ලබා ගන්නා එවැනි ඡායාරූප/වීඩියෝ දර්ශන පුවත්පත්වල පළ කිරීමෙන් හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යවලින් වැලකී විකාශය කිරීමෙන් වැලකී සිටිය යුතු ය.

21. ඡන්ද විමසීම්වලට අදාළව අපේක්ෂකයකුගේ ප්‍රචාරක කටයුතුවල දී දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති සහ පොරොන්දු පිළිබඳව ඡන්දදායකයාට මධ්‍යස්ථව සලකා බැලීමට හැකිවන පරිදි නිහඬ වාතාවරණයක් ඡන්ද විමසන දිනට පෙර ඇති කිරීම වැදගත් වන බැවින් *ජනාධිපතිවරණ ඡන්ද විමසන දිනට පෙර පැය 48ක් කාලය තුළ දී, මැතිවරණයට අදාළ සාකච්ඡා, වාද විවාද, වෙළෙඳ දැන්වීම් ආදිය ප්‍රචාරය කිරීමෙන් වැළකී සිටිය යුතු ය. මුද්‍රිත මාධ්‍යයට ද මෙය අදාළ වේ.*

2015 ජනවාරි මස 08 දින පැවැත්වෙන ජනාධිපතිවරණයට අදාළ ප්‍රතිඵල නිකුත් කරන තුරු මෙම උපමානවලට අනුකූලව ක්‍රියාකිරීමෙන් එනම් එකී උපමාන පිළිපැදීමෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට සහාය ලබාදෙන ලෙස සියලුම මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය පාලනාධිකාරීන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1894/18 - 2014 දෙසැම්බර් මස 24 වැනි බදාදා - 2014.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ජනාධිපතිවරණය - 2015

යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා වෙනත් අපේක්ෂකයකු විසින් කරනු ලබන ප්‍රකාශ හා මෙයට පෙර කර ඇති ප්‍රකාශ ප්‍රචාරය කිරීම අත්හිටුවීම

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන හා 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලින් මැතිවරණ කොමිෂන් සභාවට හෙවත් මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු හෙයින් ද, එකී ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධයෙන් බලපවත්නා නීති මගින් පවරා දී ඇති හෝ පනවා දී ඇති බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කල යුතු හා ඉටු කරනු ලැබිය යුතු අතරම සිදුකරනු ලැබිය යුතු ද හෙයින් ඡන්ද විමසීම් පැවැත්වීම එකී බලතලවලට කාර්යයවලට හා කර්තව්‍යවලට ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවන හෙයින් ද යම් ඡන්ද විමසීමක් පැවැත්වීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු හෙයින් ද මෙම ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් ලෙස පැවැත්වීම සඳහා මතු සඳහන් නියම මෙයින් පනවනු ලැබේ."

* තරඟ කරනු ලබන යම් අපේක්ෂකයකු විසින් නාම යෝජනා දිනයෙන් පසුව යම් වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකරන ලබන කාර්යයන් පවත්වනු ලබන කථා සම්බන්ධයෙන් ප්‍රවෘත්ති හෝ විශේෂාංග ප්‍රචාරය කිරීමෙන් හෝ දැන්වීමක් ලෙස ප්‍රචාරය කිරීමෙන් හෝ සියලුම මාධ්‍ය ආයතන වැලකී සිටිය යුත්තේ ය.

* තව ද මෙම ජනාධිපතිවරණය සඳහා තරඟ කරන යම් කිසි අපේක්ෂකයකු විසින් නාමයෝජනා භාරදීමට පූර්වයෙන් වූ කාලය තුළ කිසියම් වෙනත් අපේක්ෂකයකු පිළිබඳව කරන ලද ඇගයීමක් ප්‍රවෘත්ති, විශේෂාංග හෝ වෙළඳ දැන්වීම් හරහා එකී ඇගැයීම සිදුකළ අපේක්ෂකයාගේ ලිඛිත එකඟතාව නොමැතිව ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටිය යුත්තේ ය.

මෙම නියම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නිකුත් කරන නියම ලෙස ද මාධ්‍ය උපමාන ලෙස ද සලකා මෙයට අනුකූලව ක්‍රියාකරන ලෙස සියලුම මාධ්‍ය ආයතන හිමිකාරිත්ව වෙත ද මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත ද කාරුණිකව දන්වමි. එසේ ක්‍රියා කිරීමෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව ගන්නා උත්සාහයට සහායවන ලෙස ඉතා ඕනෑකමින් ද කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014 දෙසැම්බර් මස 24 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියලුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්

ජනාධිපතිවරණය - 2015
රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල ජනාධිපතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ජනාධිපතිවරණ කාල සීමාව තුළ දී නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම

ජනාධිපතිවරණ ඡන්ද විමසීම් ඉදිරියේදී පැවැත්වීමට නියමිත අතර, ඒ සඳහා නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2014.11.21 දින ප්‍රසිද්ධ කර ඇත. එදින සිට ජනාධිපතිවරණය පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර අවසන්වන තෙක් වූ කාලසීමාව "ජනාධිපතිවරණ කාලසීමාව" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන්වේ. මෙම කාලසීමාව තුළදී ජනාධිපතිධූර අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට හේතුවන නැතහොත් වෙනත් ජනාධිපතිධූර අපේක්ෂකයකු අගතියට පත්වන ආකාරයේ කටයුතු සඳහා රාජ්‍ය දේපල භාවිතා කිරීමෙන් වැළකිය යුතු බව හා රජයේ නිලධරයන්/ සේවකයන් බඳවා ගැනීම් යනාදී කරුණු සීමා කළ යුතු බව රාජ්‍ය දේපල හා වර්තමාන පාලනය භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රමුඛ සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම් වස් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථාවන් අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාලපරිච්ඡේදය තුලදී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරාපත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වලක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට අයත්ය. මැතිවරණ කොමිෂන්සභාව මේවන තුරු පිහිටුවා නොමැති බැවින් මෙම බලතල වත්මන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කළ හැකිය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී.

03. මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ ආදී සියළුම වාහන සහ හෙලිකොප්ටර් සහ ගුවන් යානා යොදවා ගන්නා බවට පසුගිය මැතිවරණ අවස්ථාවල දීද මෙම දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබී ඇත. එබැවින් රජයේ වාහන භාරව සිටින සියලු නිලධාරීන් එම වාහන යම් ජනාධිපතිධූර අපේක්ෂකයකුගේ ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා නොවන ආකාරයට ජනාධිපතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු බව අවධාරණය කරමි. නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරී කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතුය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති (assigned vehicles) වාහන හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අනිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සෑහීමකට පත්විය යුතුය. රාජකාරී කටයුතු සඳහා යෙදවූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් යොදා තිබූ අවස්ථා පසුගිය ඡන්ද විමසීම්වලදී වාර්තා වී ඇති හෙයින් එවැනි ව්‍යාජ කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතුවේ.

අතිගරු ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශය සඳහා වෙන් කර ඇති වාහන දෙකකට හැර වෙන කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලැබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකිය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන ගරාජ අංකවලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිසැක විය යුතුය.

04. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජය දේපල වේ. එම නිසා එවැනි ස්ථාන දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතුය. ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින්ට රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් බව ද සැලකිය යුතුය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට ජනාධිපතිධුර අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතුය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල ජනාධිපතිධුර අපේක්ෂකයින්ගේ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය සඳහා භාවිතා කිරීමට ද කිසිසේත් ඉඩ නොදිය යුතුය.

05. (i) ජනාධිපතිවරණ කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ ජංගම සේවා, ප්‍රදර්ශන, විවෘත කිරීම් වැනි උත්සව ආදිය දේශපාලන අංශවලට සම්බන්ධ පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අතර එම අවස්ථාවල දී ජනාධිපතිවරණයට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. එබඳු ප්‍රකාශයක් ජනාධිපතිවරණ සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ අපේක්ෂකත්වයටද අනිසි ලෙස බලපානු ඇත. මෙවැනි උත්සව පැවැත්වීමෙන් යම් ජනාධිපතිධුර අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් අපේක්ෂකයකුට අගතියක් වන බවට පැමිණිලි ලැබිය හැකි හෙයින් ජනාධිපතිවරණ කාලය තුළ එබඳු උත්සව අවස්ථා පැවැත්වීමෙන් වැළකී සිටීම යෝග්‍ය බව පෙන්වා දෙනු කැමැත්තෙමි. මහජනතාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යාවශ්‍ය ජංගම සේවා මෙම ජනාධිපතිවරණ කාලසීමාව තුළ පැවැත්වීමට ජනාධිපතිවරණයට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම නිකුත් කිරීමට පෙර නියම කරගෙන ඇත්නම් එවැනි අවස්ථා පිළිබඳව වහාම මා වෙත දැන්වීමට ක්‍රියා කළ යුතු වේ. එවිට ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙනු ඇත. එසේ වුවත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් හෝ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජංගම සේවා සඳහා මෙම සීමා කිරීම බලනොපැවැත්වේ. මෙවැනි ජංගම සේවා ද රජයේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පමණක් පැවැත්වීමට වගබලා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ.

(ii) ඡන්ද විමසීම් කාලසීමාව තුළදී කිසිදු ස්ථානයක රජයේ ඉඩම් බෙදා දීම්, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/ වන්දි මුදල් ප්‍රදානය කිරීම් වැනි වැඩසටහන් අත්හිටුවිය යුතු ය. එසේ ලබාදෙන බවට රාජ්‍ය නිලධාරීන් විසින් නිවේදන නිකුත් කර ඒ සඳහා ලැයිස්තු සකස් කිරීමද මෙම කාලසීමාව තුළ නොකළ යුතුය. මක්නිසාදයත්, එවැනි කාර්යයන් මගින් ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීමේ වරද සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයින් හා මෙවැනි ව්‍යාපෘති හා වැඩසටහන් මගින් ජනාධිපතිධුර අපේක්ෂකයන් ප්‍රවර්ධනය සිදු කරන බවට පැමිණිලි ලැබෙන හෙයිනි. තවද, නිවාස ණය ආධාර ලබාදීම සඳහා ආකෘති බෙදා හැරීම, ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාදීම සඳහා ආකෘති බෙදා හැරීම වැනි කටයුතු සිදුකිරීමටද අත්හිටුවිය යුතු ය. එසේ වුවද කල්තැබිය නොහැකි හදිසි ව්‍යාපෘති/ වැඩසටහන් සඳහා දැනටමත් දින නියමකර තිබෙනම් හෝ හදිසි විශේෂිත අවශ්‍යතාවක් ඇති වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් මාවෙත දන්වා එවිය යුතු ය. එවිට ඒ පිලිබඳව සුදුසු උපදෙස් නිකුත් කරනු ලැබෙනු ඇත. එවැනි ව්‍යාපෘති/ වැඩසටහන් වුවද ක්‍රියාත්මක කළ යුත්තේ කිසිදු ජනාධිපතිධුර අපේක්ෂකයෙකුට විශේෂ වාසියක් (හෝ අගතියක්) නොවන පරිදි වන බවත්, ඒ සඳහා අදාළ නිලධාරීන් පමණක් සහභාගිවියයුතු බවත් සැලකිය යුතු ය.

06. *(i) තවද මෙම ජනාධිපතිවරණයට අදාළව රජයේ හෝ රාජ්‍ය සංස්ථා ඇතුළු ආයතනවල නිලධාරීන් කිසිවකුට කාර්යාල වේලාව තුළ හෝ කාර්යාල දිනවල රාජකාරී නිවාඩු ලබාගෙන හෝ කිසියම් ජනාධිපතිධුර අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ කිසියම් ජනාධිපතිධුර අපේක්ෂකයකුට එරෙහිව ක්‍රියා කිරීම සඳහා අවකාශ නොදිය යුතු අතර එසේ ක්‍රියා කරන නිලධාරීන් / සේවකයන් පිළිබඳව දැඩිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ.*

(ii) අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුලු දේශපාලන අයිතිවාසිකම් අහිමි රජයේ මාණ්ඩලික නිලධාරීන්,සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධාරීන්, ග්‍රාමනිලධාරීන් / වන නිලධාරීන් වැනි සාම නිලධාරීන් හා ආරක්ෂක අංශවල සාමාජිකයින් ස්වකීය කාර්යාල වේලාවල තුළ පමණක් නොව කාර්යාල වේලාවෙන් බැහැරව මෙන්ම නිවාඩු දිනවලදී වුවද වක්‍රව හෝ සෘජුව හෝ කිසිදු ජනාධිපතිධුර අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයේ නැතහොත් අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමෙන් හෝ ඒවාට අනුබල දීමෙන් හෝ වැළකී සිටිය යුතුය. එනම්, දේශපාලන අයිතිවාසිකම් රහිත සියලුම නිලධාරීන්ට දේශපාලනමය කටයුතුවල යෙදීමට අවසර නොමැති බවට වූ නියමය ඉතා තදින් බලාත්මක කළ යුතුය.

(iii) තවද සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ද මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළදී කිසිදු ජනාධිපතිධුර අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන ආකාරයේ ක්‍රියාකාරකම්වල යෙදීමෙන් වැළකී සිටිනු ඇතැයි කාරුණිකව අපේක්ෂා කරනු ලැබේ.

07. (i) 18 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන බලතල යටතට ගැනෙන කරුණු වලට 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ සීමා කිරීම් බලපානු නොලැබේ. එබැවින් එම කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවාගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා කැඳවා ඇති විටෙක, රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

(ii) ජනාධිපතිවරණ රාජකාරී සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් 2014.11.21 වන දින සිට ජනාධිපතිවරණය අවසන් වී සති 02ක් ගතවනතුරු අත්හිටුවිය යුතු අතර, ජනාධිපතිවරණ රාජකාරී සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ජනාධිපතිවරණ කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීමට සියලුම බලධාරීන් කටයුතු කිරීම යෙහෙකි.

(iii) ජනාධිපතිවරණ කාල සීමාව සේවයේ නියුතු නිලධාරීන් අත්‍යාවශ්‍ය හේතූන් මත උදාහරණ වශයෙන් ශිෂ්‍යත්ව, උසස් අධ්‍යාපනය, වෛද්‍ය ප්‍රතිකාර, වන්දනා ගමන් යනාදිය සඳහා සිදු කෙරෙන විදේශ ගමන් සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ. එබැවින් එවැනි අවශ්‍යතා සඳහා නිලධාරී විදේශ ගත වීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවක් නැත. එසේ වුවද නිලධාරීන් සමූහ වශයෙන් මෙම කාලය තුළ විදේශගත වන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ. එසේ වුවද ඉතා හදිසි හා කල් තැබිය නොහැකි හේතු නිසා විදේශගතවීම් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අනුමැතිය දීම පිළිබඳව සලකා බලනු ලබන හෙයින් එවැනි අවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් කල්වේලා ඇතිව ඉදිරිපත් කිරීම යෙහෙකි.

(iv) ජනාධිපතිවරණ ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/ උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් කල්දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතුයයි අමාත්‍යාංශ ලේකම්වරයා අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළ වන පරිදි විධිමත්ව, දේශපාලන මැදිහත්වීම්වලින් තොරව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/ උසස් කිරීම් සඳහා මෙම චක්‍රලේඛයේ සීමා කිරීම් අදාළ නොවේ.

(v) තවද, කිසියම් විශේෂිත අත්‍යාවශ්‍ය කරුණක් හේතුවෙන් (එනම් විනය ක්‍රියාමාර්ග, නිලධරයාගේ ඉල්ලීම මත සානුකම්පිතව ක්‍රියාකිරීමට සිදුවීම, යම්කිසි පාඨශාලාවකට අත්‍යාවශ්‍ය ගුරුවරුන් ලබාදීම වැනි කරුනු හේතුවෙන්) ජනාධිපතිවරණ පැවැත්වීමට නියමිත කාලසීමාවේදී

නිලධාරීන්/ ගුරුවරුන්/ විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීමට සිදුවන විට එම මාරුකිරීම් දේශපාලනමය සිද්ධීන් නිසා කරනු ලබන මාරුවීම් නොවන බවට සනාථ කළ හැකිනම් නැතහොත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි/ චෝදනා නොලැබේ නම් එවැනි මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලය දැනුවත් කරනු ලැබූ පසු ඒ සඳහා අනුමැතිය ලබාදිය හැකි ය.

08. (i) **රාජ්‍ය දේපල විශේෂයෙන්ම රජයේ ආයතන හා නිලධාරීන් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමේ ප්‍රවණතාවක් ඇති බවට පසුගිය ඡන්ද විමසීම්වල දී පැමිණිලි ලද හෙයින් එවැනි අකටයුතු සඳහා කිසිදු අවකාශයක් නොදිය යුතු ය. පසුගිය ඡන්ද විමසීම්වල දී ලද පැමිණිලිවලින් වාර්තා වූ පරිදි ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශයන්වල හදිසි රාජකාරි කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම සඳහා (නැතහොත් අගතියට පත් කිරීම සඳහා) රජයේ / රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ / රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන අනුයුක්ත කිරීම් වැනි අකටයුතු සිදු කිරීමට කිසිදු නිලධරයකුට ඉඩ නොදිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි. එමෙන්ම ජනාධිපතිවරණ කාලය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද කල් තැබිය යුතුවේ.**

09. මෙම ජනාධිපතිවරණයේදී කිසිදු අපේක්ෂකයකු තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපල භාවිතා කිරීම වළක්වාලමින් කර ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතුය. තවද, ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට ක්‍රියා කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

10. ජනාධිපතිවරණයට අදාළ සියලුම නීති බලාත්මක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට/ මැතිවරණ කොමසාරිස්වරයාට සහාය දැක්වීම අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන් පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය බව කාරුණිකව දන්වා සිටිනු කැමැත්තෙමි.

11. මෙම චක්‍රලේඛ ලිපියේ සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන බවද පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් හා සෙසු අමාත්‍යවරුන් දැනුවත් කිරීම, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන්ගේ වගකීම බවත් සලකනු මැනවි.

12. එමෙන්ම අදාළවන විට කොමිෂන් සභාවල ලේකම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් චක්‍රලේඛය පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුවේ.

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණුවලට අමතරව, ඔබේ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දීමේ නිලධාරී වශයෙන් ද රජය සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම ද අදාළ නිලධාරීන්ගේ වගකීමක් බව මෙහි ලා සඳහන් කරමි.

14. මෙම ලිපියේ සඳහන් කරුණු පිළිබඳව සුපුරුදු පරිදි පිළිගත් දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දැනුවත් කරනු ලබනු ඇති අතර "මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින්ගෙන් සමන්විත ඡන්ද විමසීම් සම්බන්ධයෙන් වූ පැමිණිලි පිළිබඳව ක්‍රියාකිරීමේ මධ්‍යස්ථානය" විසින් මෙහි සඳහන් කරුණුවලට අදාළව ලැබෙන පැමිණිලි ගැන විමර්ශනය කරනු ඇති බවත් ඡන්ද පෙත්සම්වලදී සහ අගතියටපත් පාර්ශ්ව විසින් ගනු ලබන වෙනත් අධිකරණ

ක්‍රියාමාර්ගවල දී මෙහි සඳහන් උපදෙස්වලට අනුකූල නොවන ක්‍රියා පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමට අවකාශ ඇති බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත් -

1. ජනාධිපති ලේකම් - දැනගැනීම පිණිස
2. අග්‍රාමාත්‍ය ලේකම්/ අමාත්‍ය මණ්ඩල ලේකම් - දැනගැනීම පිණිස
3. විගණකාධිපති , විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැනගැනීම පිණිස
4. අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - දැනගැනීම පිණිස
5. සියලුම අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන් - දැන ගැනීම පිණිස හා ක්‍රියාකිරීම සඳහා
6. ත්‍රිවිධ හමුදාපතිවරුන් / සිවිල් ආරක්ෂක බලකායේ අණදෙන නිලධාරි
   - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා
7. පොලිස්පති - දැන ගැනීම පිණිස සහ ඡන්ද විමසීම් නීති බලාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීම් වස්.
8. සියලුම තේරීම්භාර නිලධාරීන් වෙත
   - මෙම ලිපියේ සඳහන් උපදෙස් හා නියමයන්ට එරෙහිව සිදුවන කටයුතු පිළිබඳව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් නොපමාව මා වෙත වාර්තා කිරීම පිණිස හා එවැනි කටයුතු වළක්වාලීමට අවශ්‍ය පියවර ගැනීම පිණිස
9. සියලුම දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත
   - දැන ගැනීම සඳහා සහ ඔබ දිස්ත්‍රික්කයේ සියලුම රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් සහ නාගරික කොමසාරිස්වරුන්, නගර සභා සහ ප්‍රාදේශීය සභා ලේකම්වරුන් වෙත මෙම ලිපියේ පිටපතක් යැවීම සඳහා සහ එහි සඳහන් ආකාරයට කටයුතු කරන ලෙස දැන්වීම පිණිස

මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිවේදනයකි

ජනාධිපතිවරණය - 2015 ජනවාරි 08

1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත

ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීමෙන් වැලකී සිටීමේ අවශ්‍යතාව

01. **තරඟ කරන අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කොඩි, ධජ පතාක, දැන්වීම් පුවරු, බැනර්, ස්ටිකර්, අපේක්ෂක ඡායාරූප, ඡන්ද ලකුණු, වෙනත් සලකුණු, ආවේනික ප්‍රචාරක වැකි හෝ චිත්‍රයක් අනවසර ස්ථානවල ප්‍රදර්ශනය කිරීම තහනම් බව**

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධි විධාන අනුව පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වූ ධජ පතාක, අත් පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍ර, දැන්වීම් කොළ, අපේක්ෂකයකුගේ ඡායාරූප, ඡන්ද ලකුණු, ආවේනික වැකි, ආවේනික සංකේත හෝ චිත්‍ර යනාදිය ප්‍රදර්ශනයය කළ හැක්කේ අපේක්ෂකයාගේ ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන දිනයේදී එකී රැස්වීම් භූමියේ පමනය.

එසේ වුවද 2005 වර්ෂයේ තරඟ කරන අපේක්ෂකයන්/ පක්ෂ ලේකම්වරුන්, පොලිස්පති හා මැතිවරණ කොමසාරිස් අතර ඇතිකරගත් එකඟතාව මත අපේක්ෂකයන්ගේ අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාලවල පමණක් ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීමට ඉඩදෙන අතර, 2010 වර්ෂයේ දී ඇතිකරගත් එකඟතාවක් අනුව තරඟ කරන පක්ෂයේ නායකයා/ ජනාධිපතිධුර අපේක්ෂකයා සහභාගී වන රැස්වීම් වල දී රැස්වීම් භූමියෙන් පිටත සාධාරණ දුරක් සැරසිලි කිරීමට ද අවසර දෙනු ලැබේ. එවැනි සැරසිලි කිරීම් රැස්වීම් පැවැත්වෙන දිනට පෙරදින පස්වරුවේ ආරම්භ කර රැස්වීමට පසුදින පෙරවරුවේම ඉවත්කළ යුතුය.

මහජනතාවට ප්‍රදර්ශනය වනසේ පොදු මාර්ග වලට යාබද පෞද්ගලික නිවාසවල අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම ඇතුළු අනිකුත් සියළුම ප්‍රසිද්ධ ස්ථානවල සිදුකෙරෙන ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම් නීති විරෝධී බව සියළුම පුරවැසියන් වෙත මෙයින් කාරුණිකව දන්වා සිටිනු ලැබේ. පක්ෂ/ අපේක්ෂක කාර්යාල පිහිටුවීම යන්නට මුවා වී සැබෑ කාර්යාලයක් නොමැති ස්ථානවල හෝ කාර්යාල අසල මහාමාර්ගයේ සැරසිලි කිරීම ද සපුරා තහනම් වේ. එමෙන්ම අවසරලත් නිවේදිත කාර්යාලවල වුවද මහජනතාවට පෙනෙන සේ රූපවාහිනී නාලිකා හරහා හෝ ඩිජිටල් තිර (දැකුම් පැලැලි) හරහා පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන ක්‍රියා සිදුකිරීම ද නීති විරෝධී බව දන්වා සිටිනු ලැබේ.

02. වාහන වල පක්ෂ/ අපේක්ෂක වර්ධනය සඳහා ධජ, පතාක, ස්ටිකර් ප්‍රදර්ශනය සීමා කිරීම

ඡන්ද විමසීම් කාලසීමාව තුළ අපේක්ෂකයා හෝ අපේක්ෂකයා වෙනුවෙන් මුළු දිවයිනටම පත්කරනු ලබන ඡන්ද නියෝජිතයා ගමන් කරන වාහනයේ හැර වෙනත් අන්කිසි පොදු හෝ පෞද්ගලික වාහනයක පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා කොඩියක් හෝ පතාකයක් ප්‍රදර්ශනය කිරීම නීති විරෝධී බව ද කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සඳහා සවිකර ඇති ප්‍රචාරක පුවරු/ බැනර්/ තොරණ් යනාදිය වහාම ඉවත් කරගන්නා ලෙස එකී පුවරු/ සවිකර ඇති සියළු දෙනාම වෙත මෙයින් නිවේදනය කරනු ලබන අතර, අපේක්ෂක රුව හෝ පක්ෂ ලාංඡනය පමණක් ආවරණය වනසේ කුඩා ඉටිරෙදි තීරුවක් යෙදීම ප්‍රමාණවත් නොවන බව ද දන්වා සිටිනු ලැබේ.

එමෙන්ම රාජ්‍ය ආයතනවලින් විවිධ කාර්යයන් සඳහා සවිකර ඇති ප්‍රචාරක පුවරු හරහා පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන ක්‍රියා සිදුවන බව පෙනී යන සෑම විටකදීම එවැනි පුවරු සම්පූර්ණයෙන්ම ආවරණය කිරීමට හෝ ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ

ලේකම්වරුන්ට හා රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට දන්වා ඇති බව ද මහජනතාව වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

එමෙන්ම පෙර සඳහන් නීති විරෝධී ප්‍රචාරක පුවරු/ බැනර්/ ස්ටිකර් යනාදිය ඉවත් කරවීමට පියවර ගන්නා ලෙස පොලිස්පතිවරයා හරහා සියළුම පළාත්/ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පොලිස් බලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කර තිබේ.

03. **ඡන්ද විමසීම් කාලසීමාව තුළ පෙළපාලි හෝ පෙරහැර පැවැත්වීම සීමාකිරීම**

නාමයෝජනා දිනයේ සිට ජනාධිපතිවරණය පවත්වා ප්‍රථිපල ප්‍රකාශ කර සතියක් ගතවන තුරු පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා රථ පෙළපාලි, යතුරු පැදි හෝ පාපැදි සවාරි හෝ පෙළපාලි පැවැත්වීම සම්පූර්ණයෙන්ම තහනම්ය. එවැනි පෙළපාලි පැවැත්වීම වැළැක්වීමට හා එකී නීති උල්ලංඝණය කරන්නන්ට එරෙහිව ක්‍රියාකරන ලෙස පොලිස් නිලධාරීන්ට නිසි උපදෙස් පොලිස්පතිවරයා විසින් නිකුත් කර තිබේ.

04. අපේක්ෂකයාගේ රුව, ඡන්ද ලකුණ හෝ වෙනත් සංකේතයක් හෝ වැකියක් හෝ චිත්‍රයක් හෝ භාවිතා කරමින් පෙර සඳහන් ආකාරයේ පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වූ නීති විරෝධී ප්‍රදර්ශන කටයුතු කරන තැනැත්තන් අධිකරණයෙන් දඩුවම් ලැබිය යුතු වරදක් සිදුකරන බවත් එවැනි අනවසර ප්‍රදර්ශන ඉවත් කරන ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට දන්වා ඇති බවත් කාරුණිකව දන්වා සිටින අතර, මෙවැනි අනවසර ප්‍රදර්ශන හරහා පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන සිදුකරන තැනැත්තන් නීති උල්ලංඝනය, සාමාන්‍යකරණය කිරීම මගින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීමට බාධාකරන පුද්ගලයින් ලෙස සැලකියයුතු බවත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

05. තවද මෙවැනි නීති විරෝධී ක්‍රියා හේතුවෙන් ඡන්ද විමසීම් පිළිබඳව ජනතා විශ්වාසය බිඳවැටීමට ඇති හැකියාව තුරන් කිරීම් වස් මෙවැනි අනවසර ප්‍රදර්ශන වහාම ස්වකීය ආධාරකරුවන් ලවාම ඉවත් කරවීමට පියවර ගන්නා ලෙස සියළුම ප්‍රමුඛ දේශපාලනඥයින් වෙත දැනටමත් ම විසින් දන්වා ඇති අතර සියළුම යහපත් දේශපාලනඥයින් හා නීති ගරුක දේශපාලන ක්‍රියාකාරීන් එවැනි ප්‍රචාරක පුවරු වහාම ඉවත් කරනු ඇතැයි ඉතා ඕනෑකමින් අපේක්ෂා කරනු ලැබේ.

06. ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා සහ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා සියළුම දේශපාලනඥයින් ගේ හා සියළුම පුරවැසියන්ගේ සහාය අවශ්‍ය වේ. එබැවින් ඒ වෙනුවෙන් ස්වකීය උපරිම සහාය ලබාදෙන ලෙස උනන්දුවක් දක්වන සියළුම පාර්ශව වලින් හා සියළුම පුරවැසියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

සටහන - 01. පෙර සඳහන් ආකාරයෙන් හෝ අන් අයුරකින් හෝ සිදුවන ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෙවත් කච්චේරියේ/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පිහිටුවා ඇති මැතිවරණ පැමිණිලි සම්බන්ධීකරණ මධ්‍යස්ථානයට හා මැතිවරණ මහලේකම් කාර්යාලයේ මැතිවරණ පැමිණිලි විමර්ශන මධ්‍යස්ථානයට ද අදාළ පොලිස් ස්ථාන වෙත හා දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් වෙත මෙන්ම පොලිස් මූලස්ථානය වෙත ද පැමිණිලි කළ හැකිය.

02. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ සඳහන් ඡන්ද විමසීමට අදාළ වැරදි හා දූෂණ ක්‍රියා පිළිබඳ වගන්ති මැතිවරණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ www.slelections.gov.lk ප්‍රදර්ශනය කෙරේ.

මාධ්‍ය නිවේදන අංක - 28

ජනාධිපතිවරණය - 2015 ජනවාරි 08
දුරකථන ජාල ඔස්සේ කෙරෙන අපේක්ෂක ප්‍රචාරක දැන්වීම්

විවිධ දුරකථන ජාලවලට සම්බන්ධ දුරකථන ඔස්සේ ජනාධිපතිධුර අපේක්ෂකයන්ගේ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරය වන බවට පැමිණිලි ලැබී තිබේ. එමෙන්ම දේශපාලන පක්ෂ හා අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වන ප්‍රචාරක කෙටි පණිවුඩ එවීමේ සංවිධානාත්මක ක්‍රියා සිදුවන බවට ද පැමිණිලි ලැබේ. මෙවැනි ප්‍රචාරක කටයුතු ග්‍රාහකයන්ගේ කැමැත්තකින් තොරව දුරකථන ජාල ඔස්සේ සිදු කිරීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා බාධාවක් බවද එම පැමිණිලිවල තවදුරටත් සඳහන් වේ. එහෙයින් ග්‍රාහකයන්ගේ කැමැත්තකින් තොරව ග්‍රාහකයන්ගේ පෞද්ගලික නිදහසට හානි වන සේ දුරකථන ජාල හරහා ඡන්ද විමසීමට අදාළව ප්‍රචාරක කටයුතු සිදු කිරීමෙන් වැළකී සිටීම යෝග්‍ය බව ඡන්ද විමසීමට තරඟ කරන සියලුම අපේක්ෂකයන් වෙත හා අපේක්ෂකයන්ගේ ආධාරකරුවන් වෙත කාරුණිකව දන්වනු ලැබේ. ඡන්ද විමසීමට පැය 48 ක් ඇතුළත සිදු කෙරෙන එවැනි ප්‍රචාරක කටයුතු ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම් වේ.

02. ග්‍රාහකයන් නොදැනුවත්ව හෝ ඔවුන්ගේ කැමැත්තෙන් තොරව හෝ ස්ථාවර හා ජංගම දුරකථන සේවා සපයන පෞද්ගලික ආයතන හරහා සංවිධානාත්මක අයුරින් මෙවැනි පටිගත කළ පණිවුඩ හෝ කෙටි පණිවුඩ යැවීමෙන් වැළකී සිටින ලෙස සියලුම ස්ථාවර හා ජංගම දුරකථන සේවා සපයන සමාගම් වෙත දැන්වීමට ක්‍රියා කරනු ලබන බවද තවදුරටත් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත
රාජගිරිය
2015.01.01

මාධ්‍ය නිවේදනය **30**

ජනාධිපතිවරණය - 2015

පක්ෂ / අපේක්ෂක ප්‍රචර්ධනය සඳහා මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර බෙදා දීම.

2015 ජනවාරි 08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේදී තරඟ කරනු ලබන අපේක්ෂකයන්ගේ අපේක්ෂකත්වය ප්‍රචර්ධනය වන අයුරින් විවිධ ද්‍රව්‍යමය ආධාර බෙදා හැරීම, මූල්‍යමය ආධාර ලබා දීම සඳහා තොරතුරු රැස්කිරීම් යනාදී අනීතික ක්‍රියා දේශපාලනඥයන් විසින් හෝ සමිති සමාගම් විසින් රජයේ හෝ පෞද්ගලික ස්ථානවලදී මෙන්ම විහාරස්ථාන, කෝවිල්, දේවස්ථාන, පල්ලි යනාදී ආගමික සිද්ධස්ථාන හරහා ද සිදුකරන බවට පැමිණිලි ලැබීමේ සීඝ්‍රතාව බෙහෙවින් වැඩිවෙමින් පවතී.

රාජ්‍ය අංශයෙන් මහජනතාව වෙත ලබා දෙන සහනාධාර නිකුත් කිරීමට අදාළ කාර්යයන් පිළිබඳව ගෘහයෙන් ගෘහයට යන ක්ෂේත්‍ර නිලධාරීන් විසින් දේශපාලනමය ප්‍රචාරක කටයුතු සිදුවන අයුරින් ද්‍රව්‍යමය ආධාර, අපේක්ෂ ඡායාරූප හා අත්පත්‍රිකා බෙදාහරින බවට ද පැමිණිලි ලැබී තිබේ.

මෙම පැමිණිලිවල සත්‍ය අසත්‍යතාව කෙසේ වුවද යම් අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය ප්‍රචර්ධනය වන අයුරින් ද්‍රව්‍යමය ආධාර බෙදා හැරීම මෙන්ම ද්‍රව්‍යමය හෝ මූල්‍යමය ආධාර ලබාදීමට පොරොන්දුවීම, ඡන්ද විමසීම් නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර යම් ද්‍රව්‍යමය ආධාර බෙදා හැරීම් සිදුකරන විටදී පක්ෂ / අපේක්ෂක ප්‍රචර්ධනයට හේතු වන අත් පත්‍රිකා, ලියවිලි, ඡායාරූප බෙදා හැරීම එකී වරද තවත් තීව්‍රකරන බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

එබැවින්, මෙම සක්‍රීය ඡන්ද විමසීම් කාලය තුළ පක්ෂ / අපේක්ෂකත්ව ප්‍රචර්ධනයට හේතුවන කිසිදු ආකාරයක ද්‍රව්‍යමය හෝ මූල්‍යමය ආධාර බෙදාහැරීම හෝ බෙදා හැරීමට පොරොන්දුවීමෙන් වැළකී සිටිය යුතු බව සියලුම දේශපාලනඥයින් හා ක්‍රියාකාරී දේශපාලන ආධාරකරුවන් වෙතද, සමිති සමාගම් ක්‍රියාකාරීන් වෙතද මෙයින් දන්වා සිටිමි. තවද කිසිදු විහාරස්ථානයකදී, කෝවිලකදී, දේවස්ථානයකදී හෝ පල්ලියකදී පක්ෂ / අපේක්ෂක ප්‍රචර්ධනයට හේතුවන කිසිදු ආකාරයක ද්‍රව්‍යමය ආධාර බෙදීමකට හෝ එවැනි උත්සව පැවැත්වීමට හෝ ආගමික උත්සව හරහා දේශපාලනමය කථා පැවැත්වීමට හෝ කිසිවෙකුට අවකාශ ලබා නොදෙන ලෙස සියලුම විහාරාධිපති ස්වාමීන්වහන්සේලා ප්‍රමුඛ මහා සංඝරත්නයෙන්ද, කතෝලික / ක්‍රිස්තියානි පැවිදි උතුමන් වෙතින්ද, හින්දු පූජක උතුමන් වෙතින්ද, ඉස්ලාම් මවුලවීවරුන් වෙතින් ද ඉතා කාරුණිකව ගෞරව පූර්වකව ඉල්ලා සිටිමි.

රෙදිපිළි, ආහාර ද්‍රව්‍ය හා වෙනත් බඩු බාහිරාදිය ඇතුලු ද්‍රව්‍යමය ආධාර බෙදාදීමේ වැඩසටහන් හා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා සිදුකෙරෙන ක්ෂේත්‍ර වැඩසටහන් දැනටමත් සංවිධානය කර ඇත්නම්, එවැනි වැඩසටහන් 2015 ජනවාරි 08 දිනෙන් පසු ක්‍රියාත්මක කරන ලෙසද අදාළ සියලුම දේශපාලනඥයන් වෙත හා සංවිධාන වෙත කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රජගිරිය.
2015.01.02 දින.

සටහන:
පසුගියදා පැවති අයහපත් කාලගුණික තත්වය නිසා අවතැන් වූ හෝ ආපදාවට ලක් වූ පුරවැසියන් සඳහා සහනාධාර ලබා දීමේ කටයුතුවලට මෙම නියමය බල නොපාන නමුත් එවැනි අවස්ථාවලදී ද පක්ෂ / අපේක්ෂක ප්‍රචර්ධන ක්‍රියා කිසිසේත් සිදු නොකළ යුතු බවට කාරුණිකව අවධාරණය කෙරේ.

තැපැල් ඡන්ද දායකයින් වෙත කෙරෙනු ලබන දැනුම්දීමයි

ඡන්දය ඔබේ අයිතියයි.

1. ඔබේ ඡන්දය ඔබ කැමති අයුරින් රහසෳ ලෙස, නිදහස්ව භාවිතා කිරීමට ඔබට ඇති අයිතියට බාධා කිරීමට කිසිවකුට හැකියාවක් නැත.
2. ඔබගේ ඡන්දය පාවිච්චි කළයුතු ආකාරය සම්බන්ධයෙන් බලපෑම් කිරීමට කිසිවකුට අයිතියක් නැත. එමෙන්ම ඔබ ඡන්දය දුන්නේ කුමන අපේක්ෂකයකුට ද යන වග කිසිවකුටවත් දැනගත නොහැකිය.
3. කිසිදු අවස්ථාවක දී, සලකුනු කරන ලද ඡන්ද පත්‍රිකාව කිසිවකුට පෙන්වීම හෝ අන් අය අතට පත්කිරීමට කටයුතු නොකරන්න. එසේ කරන ලෙස ඉල්ලා සිටීම හා එසේ පෙන්වීම දඩුවම් ලැබිය හැකි වරදකි.
4. කිසිදු බියකින් හෝ සැකයකින් තොරවනියමිත දින නියමිත වේලාවට ඔබගේ කාර්යාලයට ගොස් ඔබගේ කැමැත්ත පරිදි ඡන්දය පාවිච්චි කරන්න.
5. ඡන්ද විමසීම් නිසිලෙස පවත්වා ගෙන යෑමටත්, ඔබේ ඡන්දයේ රහසෳතාව සුරකීමටත්, ඡන්ද ගණන් කිරීම නිවැරදිව සිදුකර ප්‍රතිඵල ප්‍රකාශ කිරීමටත් මැතිවරණ දෙපාර්තමේන්තුව බැඳී සිටී.

අනන්‍යතා ප්‍රකාශයේ දැක්වෙන ඡන්ද දායකයාට උපදෙස්

තම සහතික කිරීමේ නිලධාරියා හාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්ද දායකයා විසින් ප්‍රකාශය අත්සන් කිරීමට පෙර,

I. ඒ නිලධාරියා හාරයේ ඡන්ද දායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහාලූ ලියුම් කවරය,

II. අනන්‍යතා ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති, ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහු වෙත හාරදෙන ලද ඡන්ද පත්‍රිකාවේ දැක්වෙන අංකයම බව,

දැක බලාගත යුතුය.

ඉන්පසු ඡන්ද දායකයා විසින්, තම සාක්ෂිකරු වශයෙන් ක්‍රියාකළ යුතු ඒ නිලධරයා ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන්කළ යුතුය.

ඡන්ද දායකයා විසින් ඡන්දය දුන් වහාම ඡන්ද පත්‍රිකාව නවා, " ඡන්ද පත්‍රිකා කවරය" යන වචන මතුපිටින් මුද්‍රණය කරනු ලැබ, සපයා ඇති කුඩා ලියුම් කවරය තම සාක්ෂිකරුගෙන් ලබාගෙන ඒ තුළ, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් බහා ඒ ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතුය. ඉන්පසුව ලියුම් කවරය ඡන්ද දායකයා විසින් ඔහුගේ සාක්ෂිකරු/ සහතික කිරීමේ නිලධරයා ඉදිරිපිට දී මුද්‍රා තබනු ලැබිය යුතුය.

ඉන්පසුව, ඡන්ද දායකයා විසින් සම්පූර්ණ කරන ලද හා සහතික කිරීමේ නිලධාරීන් විසින් අත්සන හා නිල මුද්‍රාව තැබීමෙන් සහතික කල තම අනන්‍යතා ප්‍රකාශය සමග මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා කවරය තේරීම් හාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනික් ලොකු ලියුම් කවරය තුළ දමා ලියුම් කවරය නොගැලවෙන සේ අලවා අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට/ සහතික කිරීමේ නිලධරයාට භාරදිය යුතුය.

> අනන්‍යතා ප්‍රකාශය පිටුපස ඇති උපදෙස් කියවීම අත්‍යාවශ්‍ය වේ.
> මෙහි සඳහන් උපදෙස් පිළිබඳව සෙසු තැපැල් ඡන්ද හිමියන් ද දැනුවත් කිරීමට කාරුණික වනු මැනවි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත, රාජගිරිය.
2014 දෙසැම්බර් මස 15 දින

දුරකථන 011-2868441/42/43
ෆැක්ස් 011-2868368
ඊ-මේල් info@slelections.gov.lk

ජනාධිපතිවරණය - 2015

ඡන්ද ප්‍රකාශ කිරීමේ පිළිවෙල

2015 ජනවාරි 08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේ දී අපේක්ෂකයින් තිදෙනකුට වැඩි සංඛ්‍යාවක් තරඟ කරනු ලබන බැවින්, එක් අපේක්ෂකයකුට ඡන්දය හෙවත් පළමු වන මනාපයත්, වෙනත් අපේක්ෂකයින් දෙදෙනකුට දෙවන මනාපය සහ තුන්වන මනාපයත් ඡන්ද පත්‍රිකාවක ලකුණු කිරීමට හැකියාව තිබෙන අතර අවශ්‍යනම් ඡන්දය පමණක් ලකුණු කිරීමට ද හැකියාව තිබේ.

02. ඡන්ද පත්‍රිකාවක, ඡන්ද දායකයකු විසින් සිය දෙවැනි හෝ තුන්වැනි මනාපය සලකුණු කර නොමැති වුවද, එහි නිසියාකාරව එක් අපේක්ෂකයකු වෙනුවෙන් සලකුණු කරන ලද ඡන්දයක් වේ නම් එය වලංගු ඡන්දයක් ලෙස පිළිගැනේ. එසේ වුවත්, ඡන්දයක් සළකුණු කර නොමැති, දෙවැනි සහ තුන්වැනි මනාපය පමණක් සලකුනු කරන ලද ඡන්ද පත්‍රිකාවක්, ඡන්දය සලකුනු නොකිරීමේ හේතුව මත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

03. ඡන්ද පත්‍රිකාව සළකුනු කළයුතු පිළිවෙල ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 3 වන උපලේඛනයේ මෙසේ දැක්වේ.

3.1. " 1 " ඉලක්කම සලකුණු කිරීමෙන් අපේක්ෂකයකුට තම ඡන්දය හෙවත් පළමුවන මනාපය දිය හැකිය.

3.2. " 2 " ඉලක්කම සලකුණු කිරීමෙන් අපේක්ෂකයකුට තම දෙවන මනාපය දිය හැකිය.

3.3. "3" ඉලක්කම සලකුණු කිරීමෙන් අපේක්ෂකයකුට තම තුන්වන මනාපය දිය හැකිය.

04. ඡන්ද දායකයකු විසින් ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට බලාපොරොත්තු වනුයේ ඡන්දයක් පමණක් නම්,

4.1. එබදු ඡන්ද පත්‍රිකාවක යොදනු ලබන සලකුනෙන්, ඡන්ද දායකයාගේ අභිලාෂය ප්‍රකාශ වන්නේ නම්, එය ඡන්ද දායකයාගේ අනන්‍යතාවය ප්‍රකාශ නොවනතාක් දුරට, වලංගු ඡන්ද පත්‍රිකාවක් වනු ඇත.

4.2. ඡන්ද දායකයා විසින් ඡන්ද පත්‍රිකාවේ එසේ සටහන් කරනු ලැබූ ලකුණ, " 2 " හෝ " 3 " යන ඉලක්කම් නොවේ නම්, එවැනි ලකුණක් සහිත ඡන්ද පත්‍රිකා වුවද වලංගු ලෙස පිළිගත හැකිය.

05. එනම්, ඡන්ද දායකයකු විසින් එක් අපේක්ෂකයකුට පමණක් ස්වකීය ඡන්දය දීමට බලාපොරොත්තු වන්නේ නම්, ඉහත 03 වන ඡේදයේ සඳහන් වන පරිදි 02 වන හෝ 03 වන මනාප ලකුණු කිරීමකින් තොරව ඡන්දය පමණක් දිය හැකිය. ඒ සඳහා තමා කැමති අපේක්ෂකයාගේ නම හා ඡන්ද ලකුණට දකුණින් වූ කොටුවේ අංක " 1 " හෝ " X "සලකුණු යෙදීම යෙහෙකි.

06. යම් ඡන්ද පත්‍රිකාවක් ඡන්ද දායකයකු විසින්

6.1. කිසිම අපේක්ෂකයකුට ඡන්ද සලකුණු කර නොමැති හෝ

6.2. එක් අපේක්ෂකයකුට වඩා වැඩි සංඛ්‍යාවක් වෙනුවෙන් ඡන්දය සලකුණු කර ඇති හෝ

6.3. එන් අපේක්ෂකයකුට " 1 " හා තවත් අයෙකුට "X " සලකුණු කර ඇත්නම් හෝ

6.4. දෙවැනි මනාපය හෝ තුන්වන මනාපය පමණක් සලකුණු කර ඇත්නම් හෝ

6.5. ඡන්ද දායකයා හඳුනාගතහැකි ආකාරයේ යමක් ලියාඇත්නම් හෝ ඇඳ ඇත්නම් හෝ

එවැනි ඡන්ද පත්‍රිකා අවලංගු වන අතර, එවැනි ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ දී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මාධ්‍ය නිවේදනය - 31

ජනාධිපතිවරණය - 2015

පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ජාතික මැතිවරණ වලදී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයින් කටයුතු කළ යුතු බවට 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 110 වැනි වගන්තියෙන් විධිවිධාන සලසා ඇති අතර 2015.01.08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

රාජ්‍ය අංශයේ, නිලධරයන්ගේ විශේෂ නිවාඩු පිළිබඳව ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදයේ 12.3 ඡේදයේ දක්වා ඇති පරිදි, ජනාධිපතිවරණයක් සඳහා අවම කාලය පැය 4ක් ලෙස ද ඡන්දය ප්‍රකාශ කිරීමට යාම පිණිස අවශ්‍යයැයි හැඟෙන අඛණ්ඩ කාලයක් සඳහා වැටුප් අඩු කිරීමක් නොමැතිව විශේෂ නිවාඩු ලබා දිය යුතු බව ද දක්වා ඇත.

එසේ වුවද පෞද්ගලික අංශයේ, සේවා නියුක්තීන්ට ලිඛිත නියමයකින් පැනවූ එවැනි විශේෂ නිවාඩු ලබා දීමේ ක්‍රමවේදයක් නොමැති හෙයින් බොහෝ සේවා යෝජකයින් තම සේවා නියුක්තීන්ට ඡන්දය පාවිච්චි කිරීම සඳහා වූ නිවාඩු ලබා නොදෙන බවට පසුගිය ඡන්ද විමසීම් කිහිපයේදීම පැමිණිලි ලැබී ඇති බැවින් ඉහත කරුණට අදාළව 2014.12.22 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමසාරිස් කැඳවා කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමා, ගරු කොමසාරිස්වරු හා නීති ලේකම්වරයා ඇතුලු සෙසු නිලධාරීන් සමඟ මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වනු ලැබූ සාකච්ඡාවේදී ඇති කර ගන්නා ලද එකඟතාව අනුව පෞද්ගලික අංශයේ සේවකයින්ට ජාතික මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට යෑමට හා ඊමට නිවාඩු ලබා දීම සඳහා දුර හා කාලය අතර සම්බන්ධතාවක් සකස්කරන ලෙස ගරු කොමිෂන් සභාව විසින් කරන ලද දැන්වීම අනුව මතු සඳහන් වගුවට අනුකූලව පෞද්ගලික අංශයේ සේවය කරන්නා වූ සේවක සේවිකාවන්ට, සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වූ නිවාඩු ලබාදීමට අදාළ සේවා යෝජකයින් කටයුතු කිරීම සුදුසු බවට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබේ.

ඡන්දය පාවිච්චි කිරීම සඳහා සේවා ස්ථානයේ සිට තම ඡන්ද පොළට යා යුතු දුර ප්‍රමාණය	ලබා දියයුතු අවම නිවාඩු කාලසීමාව
කි.මී. 40 ක් හෝ ඊට අඩු නම්	දින භාගයයි.
කි.මී. 40 ත් - 100 ත් අතර නම්	දින එකයි.
කි.මී. 100 ත් - 150 ත් අතර නම්	දින 1 1/2 යි.
කි.මී. 150 ට වැඩි නම්	දින 2 යි.

ඉහත සටහනින් යෝජනා කර ඇත්තේ ලබා දිය යුතු අවම කාලය වන අතර දිවයිනේ සමහර ඡන්දදායකයින්ට ඡන්ද පොළට යෑමට හා ඊමට දින තුනක් අවශ්‍යවන අවස්ථා ද සැලකිය යුතු සංඛ්‍යාවක් තිබෙන හෙයින් අවස්ථාවෝචිතව දින තුනක් නිවාඩු දීමට සිදු වන බවද සැලකිල්ලට ගත යුතු වේ.

මෙහිදී, සේවා නියුක්තීන් විසින් ලිඛිත ඉල්ලීමක් මඟින් නිවාඩු ඉල්ලුම් කළ යුතු අතර, සෑම සේවා යෝජකයකු විසින්ම විශේෂ නිවාඩු ඉල්ලුම්කළ තැනැත්තන් හා නිවාඩු ප්‍රදානය කරන කාලසීමාව දැක්වෙන ලේඛනයක් පිළියෙළ කර එය, සේවා ස්ථානයේ ප්‍රදර්ශනය කළ යුතු ද වේ.

මානව හිමිකම් කොමිෂන් සභාවේ දී කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගෙන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල් හා මා සහභාගි වූ සාකච්ඡාවේදී ඇති කරගන්නා ලද එකඟතාවට අනුව සැකසූ පෙර සඳහන් නිර්දේශවලට අනුකූලතාව දක්වමින් ස්වකීය ආයතනයේ සේවා නියුක්තීන්ට ඡන්දය දීමට යෑමට හා ඊමට ප්‍රමාණවත් නිවාඩු ලබා දෙන ලෙස සියලුම සේවා යෝජකයන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රජගිරිය.
2015.01.05 දින.

පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ නිත්‍ය නියෝජිතයින් සමඟ පවත්වන ලද සාකච්ඡාව - 2014.11.21

පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්සහ නිත්‍ය නියෝජිතයින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්.

සහභාගීත්වය :

1.	බත්තරමුල්ලේ සීලරතන හිමි	-	ජන සෙත පෙරමුණ
2.	සුනිල් වටගල මහතා	-	ජනතා විමුක්ති පෙරමුණ
3.	චම්පානි පද්මසේකර මහතා	-	ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
4.	ශ්‍යාමිලා පෙරේරා මහත්මිය	-	නව ප්‍රජා පෙරමුණ
5.	ශලීල් මුණසිංහ මහතා	-	නව ප්‍රජා පෙරමුණ
6.	ඒ. දිසානායක මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
7.	සේපාලිකා ගමගේ වීරසිංහ මහත්මිය	-	ජනසෙත පෙරමුණ
8.	සරත් මනමේන්ද්‍ර මහතා	-	නව සිහළ උරුමය
9.	රුවිනි පතිරණගේ මහත්මිය	-	නව සිහළ උරුමය
10.	ලලිත් රෝහණ ලියනගේ මහතා	-	මහජන එක්සත් පෙරමුණ
11.	සරත් අතුකෝරළ මහතා	-	කඳුරට ජනතා පෙරමුණ
12.	ධම්මිකා ද සිල්වා මහත්මිය	-	එක්සත් සමාජවාදී පක්ෂය
13.	එම්. කේ. පියරත්න මහතා	-	එක්සත් සමාජවාදී පක්ෂය
14.	ෂාන් කුහවර්ධන් මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ
15.	පානි විජේසිරිවර්ධන මහතා	-	සමාජවාදී සමානතා පක්ෂය
16.	නිශාන්ත ශ්‍රීවර්ණසිංහ මහතා	-	ජාතික හෙළ උරුමය
17.	ලලිත හේවාගමගේ මහතා	-	ජාතික සමගි පෙරමුණ
18.	වයි. එල්. එස්. හමීඩ් මහතා	-	අඛිල ඉලංගෙයි මහජන කොංග්‍රසය
19.	ඉන්දික ගාල්ලගේ මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
20.	අයි. ඩබ්.ජී. ප්‍රියංජිත් විතාරණ මහතා	-	ජාතික නිදහස් පෙරමුණ
21.	පියසේන දිසානායක මහතා	-	ශ්‍රී ලංකා ජාතික පෙරමුණ
22.	ශාන්ත හේරත් මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
23.	එම්. විනයාගමූර්ති මහතා	-	ලංකා කම්කරු කොංග්‍රසය
24.	දුමින්ද නාගමුව මහතා	-	පෙරටුගාමී සමාජවාදී පක්ෂය
25.	සුජිත් කුරුවිට මහතා	-	පෙරටුගාමී සමාජවාදී පක්ෂය
26.	වී. නල්ලනාදර් මහතා මහතා	-	ජනනායක තමිළ් තේසිය කුට්ටනි
27.	ටී. සිද්ධාර්තන් මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී ජනතා විමුක්ති පෙරමුණ
28.	පාලිත ගමගේ මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
29.	ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
30.	පාඨලී චම්පික රණවක මහතා	-	ජාතික හෙළ උරුමය
31.	කපිල ගමගේ මහතා	-	ජාතික නිදහස් පෙරමුණ
32.	තිස්ස යාපා මහතා	-	මහජන එක්සත් පෙරමුණ
33.	දම්මික ප්‍රනාන්දු මහතා	-	මව්බිම ජනතා පක්ෂය
34.	අසංක නවරත්න මහතා	-	ශ්‍රී ලංකා මහජන පක්ෂය
35.	ජීවන්ත දිසානායක මහතා	-	ශ්‍රී ලංකා මහජන පක්ෂය
36.	එම්. අසාත් සාලි මහතා	-	ජාතීන්ගේ සමඟි සංවිධානය/ මුස්ලිම් දෙමළ ජාතික සන්ධානය
37.	රවී කරුණානායක මහතා	-	එක්සත් ජාතික පක්ෂය
38.	මනෝ ගනේෂන් මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ

මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන් :

1.	යූ.අමරදාස මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2.	ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
3.	එම්.එම්. මොහමඩ් මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1510 ට ආරම්භ වූ අතර අද දින සහභාගී වී සිටින සියලු පාර්ශ්ව මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලදී.

අද දින පවත්වන මෙම සාකච්ඡාව, පසුගිය සැසි වාරයේදී දේශපාලන පක්ෂ නියෝජිතයින් හා සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව එකඟතාවට පැමිණි පරිදි යොදා ගන්නා ලද්දක් වන බවත්, එහිදී දැනුම්දෙන ලද්දේ මැතිවරණ/ ඡන්ද විමසීම් සම්බන්ධ නීති බලාත්මක කිරීම සම්බන්ධව සහ 2014 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ ප්‍රගතිය සම්බන්ධව අද දින සාකච්ඡාවට බඳුන් කිරීමට යෝජිතව ඇති බව වුවත්, ඒ අතර වාරයේ ජනාධිපතිවරණයක් පැවැත්වීමට ස්වකීය අභිලාෂය ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැන්වීම හේතුවෙන් උදා වූ නව තත්ත්වය මත මෙම සාකච්ඡාව සඳහා සහභාගී වන ලෙසපූර්වයෙන් දැන්වීම් කරන ලද පක්ෂවලට අමතරව සෙසු පක්ෂ ලේකම්වරුන් හටද දැන්වීමට කටයුතු කරන ලද අතර එහෙයින් ඇතැම් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙතමෙම සාකච්ඡාව පිළිබඳව දැනුම්දීමට සිදුවූයේ දුරකථන ඔස්සේ ඉතා හදිසියෙන් වන බවත්,එසේ වුවද එම කෙටි දැනුම්දීමෙන් අද දින පැමිණි සියලු පාර්ශ්ව හට ස්වකීය ප්‍රශංසාව හිමි වන බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රථමයෙන් මෙහිදී සභාව වෙත දන්වා සිටියේය.එමෙන්ම ලියාපදිංචි සියලුම දේශපාලන පක්ෂ ද මෙහි කැඳවා නොමැති බවත්, පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන දේශපාලන පක්ෂ, එසේ පාර්ලිමේන්තුව නියෝජනය නොකළද නිත්‍ය නියෝජිතයින් විසින් නියෝජනය කරනු ලබන පක්ෂ සහ 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී නියෝජිතයින් පත් කරන ලද දේශපාලන පක්ෂ වැනි සැබෑ උනන්දුවකින් යුත් සක්‍රීය දේශපාලන පක්ෂ පමණක් අද දින කැඳවීමට කටයුතු කරන ලද බව ද තව දුරටත් දන්වා සිටින ලදී.

02. අනතුරුව පසුගිය සාකච්ඡා වාරයේ සටහන් වෙත සභාවේ අවධානය ගෙන එමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලද්දේ, වර්තමානයේ ප්‍රකාශයට පත්වී ඇති ජනාධිපතිවරණය හේතුවෙන්,එම සභාවේදී සාකච්ඡාවෙන් එකඟතාවට පැමිණි ඇතැම් කරුණු කාරණා මේ අවස්ථාවේදී ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොවන බවත් එනම් එහිදී අවධානයට යොමු වන ලද විදේශගත අයවලුන්හට සිය ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම සඳහා යම් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණෙහි නියෝජිත සුනිල් වටගල මහතා විසින් ගෙන එන ලද යෝජනාව සම්බන්ධව මේ අවස්ථාවේදී සලකා බැලීමට හැකියාවක් නොවන බව යි.

අත්‍යාවශ්‍ය සේවාවල යෙදී සිටිනඅයවලුන්හට සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් සලසා දීම සම්බන්ධයෙන් යෝජනාවක් පාර්ලිමේන්තුවේදී සම්මත වී නම් ඒ සම්බන්ධව මේ අවස්ථාවේ වුවද ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතින අතර ඒ සම්බන්ධයෙන් වන දළ කෙටුම්පතක් මේ වන විටත් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් සකස් කොට ඇති බවත් එය පක්ෂ ලේකම්වරුන් හට යොමු කොට ඇති බවත් මෙහිදී දන්වන ලදී. දුම්රිය, ගමනාගමන මණ්ඩලය යනාදියට ලබා ඇති පහසුකම අධිවේගී මාර්ගයේ දොරටුවල සේවයේ නිරත අයවලුන් සඳහා තැපැල් ඡන්දය ලබා දීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට ඇති හැකියාව සොයා බලන බව මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

03. ජනාධිපතිවරණය සඳහා මේ වන විට ඇප මුදල් තැන්පත් කර ඇති දේපාලන පක්ෂ සංඛ්‍යාව එකක් පමණක් වන බවත් එහෙත් වත්මන් ඡන්දය ඉල්ලා සිටීමේ ස්වකීය අභිලාෂය දන්වමින් ඉහක කී පරිදි ජනාධිපතිවරයා විසින් තමන් වෙත නිකුත්කරන ලද ගැසට් නිවේදනය ප්‍රකාරව වත්මන් ජනාධිපතිවරයා ඉදිරි ජනාධිපතිවරණයේදී ජනාධිපති අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට නියමිත බැව් මැතිවරණ කොමසාරිස් සභාව වෙත දන්වා සිටි අතරඑතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව සිටි බැවින් පිළිගත් පක්ෂ ලාංඡනයක් රහිතව ස්වාධීනව වුවද වත්මන් ජනාධිපතිවරයා හට ජනාධිපතිවරණයේදී තරඟ කිරීමට අවස්ථාව පවතින බැව් ද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. සෙසු දේශපාලන පක්ෂ කිසිවක්ඉදිරි ජනාධිපතිවරණයේදී ස්වකීය පක්ෂය තරඟ කරන හෝ නොකරන බැව් මේ වන තෙක් දන්වා නොමැති බව ද මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

සෙසු පක්ෂ විසින් ඉදිරි ජනාධිපතිවරණයේදී තරඟ කිරීමට අපේක්ෂකයකු ඉදිරිපත්කිරීම හෝ එසේකිරීමට අපේක්ෂා කරන බව හෝ නැතහොත් තරඟ කරනු ලබන අපේක්ෂකයකුහට සහාය ලබා දීම

හෝ සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට කටයුතුකරන ලෙසට ලිඛිතව දැනුම් දීම අපේක්ෂා කරනු ලබන බවද මැතිවරණ කොමසාරිස් තව දුරටත් දන්වා සිටි අතර යම් කිසි දේශපාලන පක්ෂයක් මධ්‍යස්ථව කටයුතු කිරීමට අපේක්ෂා කරන්නේ යැයි යම් හෙයකින් දන්වා සිටින්නේ නම් එවැනි පක්ෂ ඉදිරියේදී පැවැත්වීමට නියමිතව ඇති රැස්වීම්/ සාකච්ඡා සඳහා කැඳවීමට හැකියාවක් නොමැති බැව් ද කෙසේ වුවද ඔවුන් සිය අභිලාෂය සෘජුවම මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත දන්වා එවීමට කටයුතු කළ යුතුව ඇති බව ද මෙහිදී දන්වා සිටින ලදී. එසේ වුවද එවැනි පක්ෂවලින් දැනට පත් කර ඇති නිත්‍ය නියෝජිතයන්ට පැමිණිලි විමර්ශන කමිටුවේ කාර්යයන්ට සහභාගී වීමට හා ලේකම්වරුන්ගේ රැස්වීම්වලට සහභාගී වීමට හැකි බව ද දන්වා සිටින ලදී.

04. වතු ආශ්‍රිත හෝ වෙනත් පෞද්ගලික අංශවල සේවය කරනු ලබන ඡන්ද දායකයින්හට ජාතික මැතිවරණ අවස්ථාවකදී ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගම් බිම් වෙත යෑමට අවශ්‍ය ප්‍රමාණවත් නිවාඩු ලබා දීම සම්බන්ධව ක්‍රමවේදයක් සැකසීම සම්බන්ධයෙන් ද යටකී සාකච්ඡාවන්හිදී සැලකිල්ලට භාජනය වූ කරුණක් වන බවත් ඔවුන් සඳහා තැපැල් ඡන්ද ක්‍රමවේදයක් සකස් කිරීමේ හැකියාවක් නොවන නමුත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම පාර්ශ්ව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් දන්වන ලදී. එමෙන්ම වතුආශ්‍රිත කම්කරුවන් සේවයෙහි යොදවා ඇති ස්ථානවලට ගොස් එම සේවකයින්ගේ/ කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරකිමින් ඔවුන්හට සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබා දිය යුතු බවට කම්කරු අමාත්‍යාංශය හරහා දැනුම්දීමට ක්‍රියා කිරීමට අපේක්ෂිත බව ද මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කළ අතරලංකා කම්කරු කොංග්‍රසයේ (දේශපාලන අංශය) නියෝජිත කේ. මාරිමුත්තු මහතා මේ පිළිබඳව අවස්ථා කිහිපයකදීම කරුණු දක්වා ඇති බවත් ඒ මහතා විසින් මේ සම්බන්ධයෙන් කරුණු ඇතුළත් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමට ද නියමිතව ඇති බවත්අත්‍යාවශ්‍ය සේවාවල නියැලෙන තැනැත්තන් ඡන්ද අයිතිය සුරැකීම් වස් ඔවුනට ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මැතිවරණ දෙපාර්තමේන්තුවේ අදහස් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යැවීමට යෝජිත බවත් සඳහන් කරන ලදී.

05. යම් අපේක්ෂකයකු ඉදිරි ජනාධිපතිවරණයේදී තරඟ කිරීමට අපේක්ෂා කරන්නේ නම් එක්කෝ ඔහු/ ඇය පිළිගත් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් විය යුතු බවත් නැතහොත් හිටපු හෝවර්තමානපාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු බව හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් ක්‍රියා කර තිබිය යුතු බව මෙහිදී මැතිවරණ කොමසාරිස් අවධාරණයෙන්යුතුව පැහැදිලි කර සිටියේය.

06. පෙර සඳහන් සාකච්ඡාවලට සහභාගී වූ ජාතික හෙළ උරුමයේ නියෝජිත උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා කරුණු දක්වමින්,මැතිවරණ/ ඡන්ද විමසීම් සම්බන්ධ නීති බලාත්මක කිරීමේ දී මතුවන විශාල ගැටළුවක් වී ඇත්තේ අපේක්ෂකයින්ගේ ප්‍රචාරක කටවුටි සහ වාහනවල ප්‍රදර්ශනය කරනු ලබන ඡායාරූප ඉවත් කිරීමේ ක්‍රියාවලිය බව ප්‍රකාශ කළ බවත්,තරඟ කරනු ලබන ඕනෑම පක්ෂයක අනුමත පක්ෂ කාර්යාලවලට අනුමැතිය ලබා දෙන ලිපියට අමතර වශයෙන් ප්‍රදර්ශනය කළ හැකි බැනරයක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ හැකි නම් එය වඩා සාර්ථක ක්‍රමවේදයක් වන බවත් පෙන්වා දෙන ලදී. එම යෝජනාව කෙරෙහි අවධානය යොමු කරමින් අවසරලත් පක්ෂ කාර්යාල වෙත එවැන්නක් නිකුත් කිරීමට අපේක්ෂා කරනු ලබන බවත් මෙහි දී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ ය.

තවද ඒ ඒ අපේක්ෂකයින් හට දිස්ත්‍රික් මට්ටමින් යම් කිසි සීමිත කටවුටි ප්‍රමාණයක් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට අවකාශ සැලසිය හැකි නම් මේ සම්බන්ධව පවතින නීති උල්ලංඝනය වීම් වලක්වාලිය හැකි බවට උදය ගම්මන්පිල මහතා විසින් යෝජනා කරන ලද බවත්, මේ වන විට පවත්වා ඇති නිත්‍ය නියෝජිත සැසි වාර කිහිපයකදීම ඒ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට යෙදුන බවත්, එහි දී දේශපාලන පක්ෂවල එකඟතාවයෙන් සෑම පක්ෂයකටම සමාන කටවුටි සංඛ්‍යාවක් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා අනුමත කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීම කෙරෙහි විශේෂ අවධානය යොමු වූ බවත් මැතිවරණ කොමසාරිස් සඳහන් කර සිටි අතර මෙපරිද්දෙන්ම 2005 වර්ෂයේ දී සම්මත වූ යෝජනාවක් මත අනුමත පක්ෂ කාර්යාලවල පමණක් මේවා ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය ලබා දීමට හැකි වූ බවත් කෙසේ වුවද මේ සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව තීන්දු තීරණ ගැනීමට හැකියාව ඇති බවත් දන්වා සිටින ලදී.

07. යට කී සාකච්ඡා මාලාවේදී සැලකිල්ලට ලක් වූ තවත් සුවිශේෂී කරුණක් වෙත සභාවේ අවධානය යොමු කරමින් කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස් ජාතික හැඳුනුම්පත් නොමැති ඡන්ද දායකයින් හට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ත්‍රිකුණාමලය, බදුල්ල ආදී දිස්ත්‍රික්කවල මැතිවරණ දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ CaFFEසංවිධානය එක්ව අදාළ ජංගම සේවා සංවිධානය වෙමින් පවතින බවත් එමෙන්ම PAFFRAL, CMEV සහ NPOC යන මැතිවරණ නිරීක්ෂණ සංවිධාන දිවයිනේ සෙසු පළාත්වල මෙම ජංගම සේවා පැවැත්වීමට ක්‍රියා කරනු ඇති බව ප්‍රකාශ කරන ලදී.

2014.11.07 දින පවත්වන ලද සාකච්ඡාවේ දී ඡන්ද හිමි නාමලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංක සඳහන්ව නොමැති අයවලුන්ගේ සංඛ්‍යාව ආදී අදාළ සියලු සංඛ්‍යා සටහන් ඊට සහභාගී වී සිටි පාර්ශ්ව වෙත ලබා දීමට කටයුතු කර ඇති බව දන්වා සිටි මැතිවරණ කොමසාරිස්, ලියාපදිංචි සමස්ත ඡන්ද දායකයින් මිලියන 15 ක් පමණ වන බවත් ඉන් මිලියනයක් පමණ වන ඡන්ද දායකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක ඡන්ද හිමි නාමලේඛනයේ නොමැති බැව් වාර්තා වන බවත් මෙහි දී ප්‍රකාශ කර සිටියේ ය. එහෙත් මෙම මිලියනයක් පමණ වන සමස්ත සංඛ්‍යාවටම ජාතික හැඳුනුම්පත් නොමැති යැයි නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි බවත් නිදසුනක් වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ඡන්ද දායකයින් අතුරින් ජාතික හැඳුනුම්පත් අංක සටහන්ව නැති ඡන්ද දායකයින් සංඛ්‍යාව 98,000 ක් වන නමුත් ඉන් අඩකටත් වඩා ජාතික හැඳුනුම්පත්, වලංගු රියදුරු බලපත්‍ර හෝ ගමන් බලපත්‍ර තිබෙන බව අනුමාන කළ හැකි බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් තවදුරටත් ප්‍රකාශ කර සිටියේ පසුගිය පළාත් සභා ඡන්ද විමසීම් හා අනුපාත වශයෙන් සසඳා බැලීමේ දී දළ වශයෙන් ඡන්ද දායකයින් ලක්ෂ 4 කට පමණ වලංගු හැඳුනුම්පතක් නොමැති යැයි සැලකිය හැකි වුවත් එයින් ද ඡන්ද දායකයින් ලක්ෂයක් පමණ වන පිරිසක් වෙත පසුගිය පළාත් සභා ඡන්ද විමසීමේ දී භාවිතා කිරීම සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත පවතින බවයි. දිනපතා පූර්ණ කාලීනව රාජකාරි ඉටු කරමින් දෙමසක් තුළ නිකුත් කළ හැක්කේ ජාතික හැඳුනුම්පත් ලක්ෂ 2 ක් පමණක් වන බැව් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර ඇති බැවින් ස්වකීය ජාතික හැඳුනුම්පත කඩිනමින් ලබා ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධව පොදු මහජනතාවඋනන්දු කිරීම සඳහා දේශපාලන පක්ෂ මට්ටමින් ක්‍රියා කරන ලෙස දන්වා සිටි අතර හැකි උපරිම ප්‍රමාණයක් ජාතික හැඳුනුම්පත් ඡන්ද දායකයින් වෙත ලබා දීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත සහාය වන ලෙස සියලු මැතිවරණ නිරීක්ෂණ සංවිධානවලින් ඉල්ලා සිටින ලදී. කෙසේ වුවද ජාතික මැතිවරණ අවස්ථාවක දී කිසිදු සැබෑ ඡන්ද දායකයකු හට සිය ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව අහිමි නොවිය යුතු බැවින් මෙම කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා සියලු පාර්ශ්ව කැපවීමෙන් හා උනන්දුවෙන් යුතුව ක්‍රියා කරනු ලැබිය යුතු බවත් මැතිවරණ කොමසාරිස් මෙහි දී අවධාරණය කරන ලදී. මැතිවරණ/ ඡන්ද විමසීම් දිනයේ දී යම් ඡන්ද දායකයකුගේ/ දායිකාවකගේ ජාතික හැඳුනුම්පත/ වලංගු හැඳුනුම්පත අස්ථානගත වුවහොත් එම ඡන්ද දායකයා/ දායිකාව ඉල්ලා සිටින විටක දී තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීමට පෙර පරිදිම මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබන බවත් මෙවැනි අවස්ථාවන් අතීත මැතිවරණ/ ඡන්ද විමසීම් අවස්ථාවලදී ද උද්ගත වී ඇති අතර සාධාරණ යැයි ඔප්පුවන එවැනි අවස්ථාවලදී තරාතිරම නොසලකමින් අදාළ ඡන්ද දායකයා/ දායිකාව වෙත මෙම තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කර ඇති බව ද මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය. වලංගු හැඳුම්පතක් ඉදිරිපත් නොකිරීම හේතු කොට ගෙන ඡන්ද මධ්‍යස්ථානයේ දී ඇතැම් මන්ත්‍රීවරුන්ගේ/ මන්ත්‍රීවරියන්ගේ පවා ඡන්දය ප්‍රකාශ කිරීම වලක්වාලීමට ද කටයුතු කර ඇති බවත් සිහිපත් කර සිටි මැතිවරණ කොමසාරිස් වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිදු ඡන්ද දායකයෙකු/ ඡන්ද දායකාවක හට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා කිසිදු ඉඩකඩක් නොදෙන බවත් එහෙයින් ජාතික හැඳුනුම්පත හෝ විධිමත් වෙනත් වලංගු හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා පොදු මහජනතාව දැනුවත් කිරීමට දේශපාලන පක්ෂ විසින් ක්‍රියා කිරීම අත්‍යාවශ්‍ය බවත් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන ලෙසත් සියලුම නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටින ලදී.

08. සාකච්ඡාව සඳහා අද දිනප්‍රථම වරට එක්වන පාර්ශ්වවල දැනගැනීම සඳහා 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ ප්‍රගතිය පිළිබඳව නැවත දැනුම් දෙමින් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටියේ 2014.10.31 දින ප්‍රවර්ථන වර්ෂයේ නාමලේඛනය සහතික කොට අවසන් කරන ලද බවත් එමෙන්ම උතුරු නැගෙනහිර පළාත්වලින් අවතැන් වූ ඡන්ද දායකයින් සඳහා සකස් කර ඇතිපරිපූරක

නාමලේඛනය ද මේ වන විට සකසා අවසන්ව ඇති බවයි. ඉදිරි ජනාධිපතිවරණයේදී අවතැන් ඡන්ද දායකයින් ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව හිමි වන්නේ මෙම පරිපූරක නාමලේඛනයෙහි නම් සඳහන් අයවලුන්හට පමණක් වන බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී විශේෂයෙන් අවධාරණය කර සිටින ලදී. ඉදිරි ජනාධිපතිවරණයේ දී තරඟ කරන බවට ප්‍රකාශ කරනු ලබන පක්ෂ විසින් ඉල්ලා සිටිය හොත් එහි සංයුක්ත තැටිය (CD) නිකුත් කිරීමට හැකියාව පවතින බවත්, එමෙන්ම එහි දී එම පක්ෂවලින් එක් අපේක්ෂකයකු පමණක් තරඟ කරන බව නිශ්චිතව සනාථ කර තිබීම අවශ්‍ය බවත් දැන්වූ මැතිවරණ කොමසාරිස් වෙනත් ඕනෑම පක්ෂයක් ඊට තරඟ කරනු ලබන විට ඒ බව ලිඛිතව දන්වා සිටී නම් සහ ඇප තැන්පත් කිරීමෙන් අනතුරුව ඔවුන් වෙත මෙම සංයුක්ත තැටි නිකුත් කිරීමට හැකියාව පවතින බව ද තවදුරටත් සඳහන් කර සිටියේ ය.

09. පසුගිය පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවලදී 2013 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය භාවිතා කරන ලද ආකාරයෙන් ඉදිරි ජනාධිපතිවරණයේදී ද එම ඡන්දහිමි නාමලේඛනය භාවිත කිරීමෙන් තොරව 2014 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද නව ඡන්දහිමි නාමලේඛනය භාවිතා කරනු ලබන්නේ මන්දැයි ඇතැම් පාර්ශ්ව විසින් තමන් වෙතින් විමසීම් කරනු ලබන බව මෙහිදී ප්‍රකාශ කර සිටී මැතිවරණ කොමසාරිස්2013 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්ද දායකයින්ගේ සංඛ්‍යාවට වඩා 2014 වර්ෂයේ ලියාපදිංචි ඡන්ද දායකයින්ගේ සමස්ථ වැඩි වීම ලක්ෂ තුනක් පමණ වන බැවින් මෙම නව ඡන්ද දායකයින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක් වන ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය උල්ලංඝනය කිරීම සඳහා කිසිදු ආකාරයක නීතිමය බලයක් හෝ සදාචාරමය අයිතියක් මැතිවරණ දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් සහ හෘදය සාක්ෂිය ප්‍රකාරව ද එවන් වූ ක්‍රියාවකට ඉඩ කඩ තැබිය නොහැකි බැවින් ද ඉදිරි ජනාධිපතිවරණයේදී 2014 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය භාවිතා කිරීමට කටයුතු කරනු ලබන බව වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

10. අනතුරුව යටෝක්ත සාකච්ඡාවලදී ප්‍රමුඛ වශයෙන් සාකච්ඡාවට භාජනය වූ මැතිවරණ/ ඡන්ද විමසීම් කාලපරිච්ඡේදවලදී ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීම සඳහා ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කරවා ගැනීමේදී මතු වන ගැටළුකාරී තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කරමින් මැතිවරණ කොමසාරිස් මෙහිදී තව දුරටත් කරුණු දක්වා සිටින ලද්දේ පසුගිය පළාත් සභා ඡන්ද විමසීම් කාලපරිච්ඡේදය තුළදී මෙම ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කරවා ගැනීමේදී බහුල වශයෙන් ගැටළුවලට මුහුණ දෙන ලද්දේ එක්සත් ජාතික පක්ෂය සහ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය වන බවත්, ඇතැම් අවස්ථාවලදී මෙම ක්‍රීඩාභූමි/ පිට්ටනි වෙන් කරවා දීම සඳහා මැතිවරණ කොමසාරිස් වශයෙන් තමන්ට ද මැදිහත් වීමට සිදුවූ බවත් එහෙත් ඉදිරියේදී කිසිදු අවස්ථාවකදී එවන් වාතාවරණයක් යළි උදා නොවන ආකාරයෙන් සියලු පාර්ශ්ව කටයුතු කළ යුතුව ඇති බවත් ය. යම් සාධාරණ හේතුවකින් තොරව ක්‍රීඩා භූමි/ පිට්ටනි දීර්ඝ කාලයක් පුරා රඳවා තබා ගැනීමට කවර පාර්ශ්වයක් විසින් හෝ කටයුතු කරනු ලබන්නේනම් එම ස්ථාන මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරනු ලබන බවත් මේ අවස්ථාවේදී දන්වා සිටී මැතිවරණ කොමසාරිස් පසුගිය පළාත් සභා ඡන්ද විමසීම් අවස්ථාවේදී මහරගම ප්‍රදේශයේ එක්තරා පිට්ටනියක් මල් ප්‍රදර්ශන පැවැත්වීම වෙනුවෙන් පූර්ණ කාලීනව වෙන් කර තිබූ බවත්, ජාතික මැතිවරණයක් ප්‍රකාශයට පත්වී ඇති මෙම අවස්ථාවේදී ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාව දිය යුත්තේ අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මිස වෙනත් ප්‍රදර්ශන සඳහා නොවන බව අදාළ පාර්ශ්ව වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරනු ලබන බවත් දන්වා සිටින ලදී. ජනාධිපතිවරයා සහභාගී වන ප්‍රචාරණ රැස්වීම් කාලසටහන කල්වේලා ඇතිව මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මැතිවරණ කොමසාරිස් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් සුසිල් ප්‍රේමජයන්ත් මහතාගෙන් ඉල්ලා සිටින ලදී.එමගින් සෙසු අපේක්ෂකයින්ගේ ප්‍රචාරණ රැස්වීම් අදාළ ක්‍රීඩා භූමියෙහි/ පිට්ටනියෙහි එම දිනවලදීනොපැවැත්වීමට ක්‍රියා කිරීමට හැකියාව ලැබෙන බැවින් උද්ගත වන ගැටළු අවම කර ගැනීමට ඉන් හැකිවන බවත් දන්වා සිටින ලදී. කෙසේ වුවද මැතිවරණයක් හෝ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කිසිදු උනන්දුවක් නොදක්වන පක්ෂ/ පාර්ශ්ව විසින් උපාය මාර්ගිකව මෙම ක්‍රීඩා භූමි/ පිට්ටනි දීර්ඝ කාලයක් පුරා වෙන් කර රඳවා තබා ගැනීමට කටයුතු කරන්නේ නම් එවැනි පක්ෂ/ පාර්ශ්වවලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කරනුලබන බවත් එමෙන්ම ප්‍රධාන ක්‍රීඩා භූමි/ පිට්ටනි අවට ඇති සෙසු භූමි ප්‍රදේශ නිකරුණේ වෙන් කර තබා ගනිමින් ප්‍රධාන භූමියෙහි/ පිට්ටනියෙහි ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීමට හිතාමතාම අවහිර කරනු ලැබීමටත් ඉඩකඩ

නොතබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී අවධාරණය කර සිටින ලදී. එසේ වුවද තම තමන්ගේ ප්‍රචාරක කටයුතු සඳහා අවශ්‍ය ක්‍රීඩාංගන, රැස්වීම් ශාලා කල්වේලා ඇතිව වෙන්කර ගැනීමට දේශපාලන පක්ෂ ක්‍රියා කරන්නේ නම් තමන් වෙත ලැබෙන පැමිණිලි අඩුවනු ඇතිබව තවදුරටත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

නාමයෝජනා භාර දීමෙන් අනතුරුව තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ කවරේද යන්නත්, ප්‍රධාන පක්ෂවලට සහාය පළ කර සිටින සෙසු ආධාරක පක්ෂ (Proxy Party)කවරේද යන්නත් නිශ්චිතව දැනගැනීමට හැකියාව ලැබෙන බැවින් මෙම පිටිටනි වෙන් කිරීමේ ක්‍රමවේදය නිසි ලෙස අධීක්ෂණයෙන් යුතුව ඉටු කිරීම පිණිස ඒ ඒ පක්ෂවල මැතිවරණ ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීමට යෝජිත දින වකවානු සහ ස්ථාන විශේෂයෙන්ම ජනාධිපතිවරයා සහභාගී වන රැස්වීම් තොරතුරු ඇතුළත් සුදුසු කාලසටහනක් සකස් කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී සභාව වෙත දන්වා සිටින ලදී.

මෙහිදී නියෝජිතයකු විසින් විමසීමක් කරමින් පිටිටනි වෙන් කිරීම සම්බන්ධව අක්‍රමිකතා කොළඹ මහ නගරසභා ආශ්‍රිතව ද සිදු වූ බව ප්‍රකාශ කළ අතර එවැනි ක්‍රියා වැළැක්වීමට මෙවර පියවර ගන්නේ කෙසේ දැයි විමසා සිටින ලදී. එහිදී කරුණු දක්වමින් මැතිවරණ කොමසාරිස් එවැන්නක් සම්බන්ධයෙන් කිසිඳු පාර්ශ්වයක් විසින් ලිඛිත පැමිණිල්ලක් තමන් වෙත යොමු කොට නොමැති බවත්, එසේ යොමු කරනු ලැබුයේ නම් එවැනි අක්‍රමිකතා සිදු කිරීම සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව වෙතින් කරුණු විමසා සිටීමට පියවර ගැනීමට හැකියාව තිබූ බව ප්‍රකාශ කළේය. මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් පැමිණිලි කිරීමෙන් හෝ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කර සිටීමෙන් කිසිඳු ප්‍රතිඵලයක් නොලැබෙන්නේ යැයි මේ සම්බන්ධව මතුපිටින් විමසා බලන ඇතැමුන්ගේ මතය වුවද, මානව හිමිකම් කොමිෂම ලද පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමෙන් ඇතැම් අවස්ථාවලදී ඉතා වැදගත් තීන්දු තීරණ ගැනීමට හැකියාව ලැබී තිබෙන බව ප්‍රකාශ කළ මැතිවරණ කොමසාරිස් මෙම ක්‍රීඩා භූමි/ පිටිටනි වෙන් කරවා ගැනීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් නොපමාව තමා වෙත හෝ අදාළ තේරීම්භාර නිලධාරී වෙත දැනුම්දීමට ක්‍රියා කරන ලෙස දැඟිල්ලා සිටියේය.

11. පුදුකුඩිඉරිප්පු සහ මුහුදුබඩපත්තු යන ප්‍රාදේශීය සභාවල ඡන්දය පැවැත්වීම සම්බන්ධයෙන් වූ නඩුව 2014.11.12 දින එමවිභාගයට ගනු ලැබූ අතර ඒ අවස්ථාවේදී පැමිණිලිකරුවන් හා ඔවුන් වෙනුවෙන් පෙනී සිටින නීතීඥයින්ගේ නොපැමිණීම මත නැවතත් කල් තබන ලද අතර මෙම තත්ත්වය කණගාටුවට කරුණක් වන බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

12. මේ අවස්ථාවේදී අදහස් දක්වමින් එක්සත් ජාතික පක්ෂයේ නියෝජිත රවී කරුණානායක මහතා, මැතිවරණ කොමසාරිස්වරයා ඉතා ස්වාධීනව කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්වකීය සතුට මෙහිදී පළ කර සිටින බවත් ජනාධිපතිවරණය 2015.01.08 වන දින නොපවත්වන ලෙස ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ඉදිරියේදී එළැඹෙන ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා දේශීය මෙන්ම යුරෝපීය, ආසියානු මෙන්ම ඉන්දීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් යෙදවීමට කටයුතු කරන ලෙසද රවී කරුණානායක මහතා ඉල්ලා සිටින ලදී. තව දුරටත් කරුණු පැහැදිලි කරමින් රවී කරුණානායක මහතා පෙන්වා දෙනු ලැබුයේ ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව සිටම වත්මන් ජනාධිපතිවරයාගේ දැවැන්ත කටවුට් බොහෝ ප්‍රදේශවල සෑම විදුලි පහන් කණුවකම පාහේ ප්‍රදර්ශනය කර ඇති ආකාරය දක්නට ලැබෙන බවත් මැතිවරණ සමයේදී මෙම තත්ත්වය තව දුරටත් උග්‍ර විය හැකි බවත්ය. තවද එම පක්ෂයේ විවිධ ක්‍රියාකාරීන් විසින් අත්තනෝමතික ලෙස පක්ෂ කාර්යාල පවා විවෘත කරමින් මේ ආකාරයෙන් නීති කඩ කරමින් කටයුතු කිරීම පිළිබඳව ස්වකීය අසතුට ප්‍රකාශ කළ රවී කරුණානායක මහතා සෑම අපේක්ෂකයකුහටම ජනමාධ්‍ය භාවිතා කිරීමේ සමාන අයිතිවාසිකම් හිමි විය යතු බවත් එම අවස්ථා සියලු දෙනාටම ඉතා සාධාරණ පරිදි ලබා දිය යුතුබවත් පෙන්වා දෙන ලදී. තවද මැතිවරණ කොමසාරිස්තුමන් ප්‍රමුඛ මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය ඉතා කාර්යශූර ලෙස රාජකාරී ඉටු කරනු ලබන පිරිසක් වන නමුත් සියලු ක්‍රියාමාර්ග ගත යුත්තේ යමක් සිදු වීමට පෙරාතුව වන බවත් ඇතැම් කරුණු කාරණා කෙරෙහි පසුව සලකා බැලීමෙන් එතරම් ප්‍රතිඵල අත් නොවන බව තමන්ගේ අදහස වන බවත් එහෙයින් මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින බව ඒ මහතා ප්‍රකාශ කළේය.

මෙම කරුණු දැක්වීම පිළිබඳව තමා සටහන් තබා ගනු ලබන අතර මැතිවරණ දිනය සම්බන්ධයෙන් මේවන විට විවිධ පාර්ශ්ව විසින් විවිධ මත ඉදිරිපත් කර ඇති බවත්, කෙසේ වුවද ශුද්ධෝත්තම පාප් වහන්සේගේ ලංකා සංචාරයට බාධා නොවන සේ මැතිවරණය පැවැත්වීම සඳහා කටයුතු ඉටු කිරීමට ලබා ගත හැකි උපරිම දින ගණන ලබා ගනිමින් ඡන්ද විමසීම පැවැත්විය හැකි දිනයේදී එය පැවැත්වීමට අවශ්‍ය නිවේදනය සකසා ඇති බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම විදුලි පහන් කණු ආශ්‍රිතව කටවුටි ප්‍රදර්ශනයට කටයුතු කිරීම සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලද්දේ නාමයෝජනා කාලසීමාවේදී වෙනත් ඕනෑම අපේක්ෂකයකු හට වුවද ඒ ආකාරයෙන් තම කටවුටි ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලැබෙන බවයි. එමෙන්ම ඒවා මුදල් නොගෙවා ප්‍රදර්ශනය කරනු ලබන ඒවා නම් කවර පාර්ශ්වයකගේ ඒවා වුවද ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ඒ ඒ මහ නගර සභා වෙත දැනුම්දීමට ක්‍රියා කරනු ලබන බවත් නිදසුනක් ලෙස කොළඹ නගරයේ ප්‍රදර්ශනය කරනු ලබන කටවුටි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය පවතින්නේ නගරාධිපතිවරයාට වන බවද මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී. එමෙන්ම මැතිවරණ කොමසාරිස් වශයෙන් පොලිසිය මඟින් ඒවා ඉවත් කිරීමට තමන්හට බලය හිමි වන්නේ නාමයෝජනා දිනයෙන් පසුව වන බවත් එසේ බලය ලද වහාම සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවත් තව දුරටත් ප්‍රකාශ කර සිටියේ ය.

මේ අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණෙහි නියෝජිත මනෝ ගනේෂන් මහතා අදහස් දක්වමින් ඒ සම්බන්ධයෙන් අදාළ ආයතනවලට ලිඛිතව දැන්විය යුතු බව ප්‍රකාශ කරන ලදී. අදාළ අපේක්ෂකයා වෙනුවෙන් ඇප තැන්පත් කිරීමෙන් පසුව මේ පිළිබඳව අදාළ ආයතන වෙත ලිඛිතව දැනුම් දීම් යවන බව මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

එහිදී සුනිල් වටගල මහතා දන්වා සිටියේ පරිසර පනත, ජාතික මංමාවත් පනත ආදී අණපනත් යටතේ කටයුතු කරමින් ඊට නිසි පියවර ගත යුතු බවයි.

යළිත් සිය අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලද්දේ මෙම සියලු ක්‍රියාවන් රඳා පවතින්නේ හුදෙක් අණපනත් නීති රෙගුලාසි ආදිය මත පමණක් නොවන බවත් සැබෑ ලෙස විමසා බැලීමේදී පෙනී යන්නේ බොහෝ කරුණු කාරණා මිනිසුන්ගේ හෘදය සාක්ෂියට සහ සදාචාර පැවැත්මට කොතෙක් එකඟ වේද යන්න මත රඳා පවතින බවත්ය.කෙසේ වුවද යම් ආකාරයකින් නීති උල්ලංඝනය වීමක් සිදු වන්නේ නම් ඊට ගත යුතු නිසි පියවර ගැනීමට කටයුතු කරනු ලබන බවත් මෙහිදී දන්වා සිටින ලදී.

රවී කරුණානායක මහතා විසින් මතු කරනු ලැබූ මාධ්‍ය භාවිතය සම්බන්ධ ගැටළුවට පිළිතුරු ලබා දෙමින්ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වැනි සංශෝධනය ප්‍රකාරව මැතිවරණ කොමසාරිස් හට හැකියාව පවතින්නේ මාධ්‍ය උපමාන ඉදිරිපත් කිරීම පමණක් වන බවත් ඇතැම් අවස්ථාවලදී රජයේ මාධ්‍යවලට ද වඩා පෞද්ගලික මාධ්‍ය පක්ෂග්‍රාහීව කටයුතු කරනු ලබන බව පෙනී යන අතර එහෙයින් රාජ්‍ය මාධ්‍ය වෙත පමණක් පක්ෂග්‍රාහීව ක්‍රියා කරනු ලැබීම හේතුවෙන් චෝදනා එල්ල කිරීමට හැකියාවක් නොවන බවත් කෙසේ වුවද ඉදිරියේදී මැතිවරණ කටයුතු ආරම්භ වූ වහාම මැතිවරණ අවස්ථාවකදී මාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධව රජයේ මෙන්ම පෞද්ගලික මාධ්‍ය ද දැනුවත් කිරීමට අපේක්ෂා කරන බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මාධ්‍ය භාවිතයේදී සියලු අපේක්ෂකයින්හට සමාන අවස්ථා ලබා දෙන ලෙස මාධ්‍ය වෙත කරුණු දැක්වීම සඳහා පක්ෂ ලේකම්වරුන්ට හා අපේක්ෂකයින්හට වුවද හැකියාව පවතින බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලදී.

ඉදිරි ජනාධිපතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා නිරීක්ෂණ කණ්ඩායම් ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් අදහස් දක්වා සිටිමින් මැතිවරණ කොමසාරිස් යළිත් ප්‍රකාශ කර සිටින ලද්දේ ශ්‍රී ලංකාවේ මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවලදී විදේශීය නිරීක්ෂකයින් ගෙන්වා ගැනීම 20 වන සියවස අගභාගයේදී එනම් 1988 වර්ෂයේදී පැවැති භීෂණකාරී වාතාවරණය තුළදී ආරම්භ වූවක් වන අතර එවන් කළහකාරී වාතාවරණයක් නොමැති වත්මන් කාලයේදී ද එය සාම්ප්‍රදායක් වශයෙන් සලකමින් විදේශීය නිරීක්ෂකයින් ගෙන්වා ගැනීම එක්තරා අයුරකින් කණගාටුවට කරුණක් වන බවත්ය. තවද විදේශීය නිරීක්ෂකයින් පැමිණීම හෝ නොපැමිණීම මත මැතිවරණ ප්‍රතිඵලවල කිසිදු හෝ වෙනස් වීමක් සිදු නොවන බවද මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. කෙසේ වුවද මේ ඉල්ලීම් ගැන සලකා බලා

විදේශීය නිරීක්ෂකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා දකුණු ආසියා මැතිවරණ බලධාරීන්ගේ සංගමයට මෙන්ම අදාළ සෙසු ආයතනවලට ලිඛිතව දන්වා සිටින බව මැතිවරණ කොමසාරිස් තව දුරටත් දන්වා සිටින ලදී. කෙසේ වුවද දේශීය මෙන්ම විදේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සහභාගී කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් නාමයෝජනා දැන්වීම නිකුත් කළ දින සිටම පටන් නිරීක්ෂණ කණ්ඩායම් යොදවන ලෙස එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් තිස්ස අත්තනායක මහතා විසින් ඉල්ලීම් කර ඇතත් එදින සිට නිරීක්ෂණ කණ්ඩායම් යොදා ගැනීමට ප්‍රායෝගිකව හැකියාවක් නොමැති වුවත් ඉන් පසුව හැකි උපරිම කාලයක් මෙම කිරීක්ෂණ කණ්ඩායම් යෙදවීමට අපේක්ෂා කරනු ලබන බව ද මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී.

ඒ අවස්ථාවේදී යළිත් කරුණු දක්වමින් රවී කරුණානායක මහතා ඉල්ලා සිටින ලද්දේ බොහෝ අවස්ථාවලදී ගැටළු ඇතිවන බවට වාර්තා වන්නේ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන ආශ්‍රිතව වන බැවින් මෙම නිරීක්ෂකයින් ඒවායේ යෙදවීමට කටයුතු කරන ලෙසයි.

මැතිවරණයේ ඡන්ද ගණන් කිරීමේ කටයුතුවලදී යම් කිසි බාහිර බලපෑමක් නිරීක්ෂකයින්ට/ නිලධාරීන්ට තර්ජන කිරීමක් සිදු වූ බව නිසැකවම පෙනී ගිය හොත් නියත වශයෙන්ම ඡන්ද ගණන් කිරීම අත්හිටුවීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් පැවසීය. මැතිවරණ ක්‍රියාපරිපාටියේ හෝ ඡන්ද ගණන් කිරීමේ කටයුතු කෙරෙහි විපක්ෂයේ ක්‍රියාකාරීන් නිරතුරුව ප්‍රකාශ කරන අවිශ්වාසය විපක්ෂයේ ආධාරකරුවන් තුළ ද ගැටලු සහගත තත්ත්වයක් ඇති කරනු ලබන බව පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් යම් පක්ෂයක් මැතිවරණ ක්‍රමය හා දෙපාර්තමේන්තුව විවේචනය හරහා සිදුවන්නේ ස්වකීය අධාරකරුවන් ද ඡන්ද පොළට නොපැමිණ සිටීමේ ප්‍රවණතාවක් ඇති වන බව යැයි වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මැතිවරණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා දේශීය මෙන්ම විදේශී නිරීක්ෂකයින් යොදවා ගනු ලබන්නේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් අක්‍රමිකතා සිදු කරනු ලබන නිසාවෙන් නොවන අතර පොදු මහජනතාවගේ සිත් තුළ විශ්වාසය ඇති කිරීම, " Vote is your right "යන්නෙන් ප්‍රකාශිතඔවුනගේ ඡන්ද අයිතිය සුරැකීම සහ මැතිවරණ කටයතුවල විනිවිදභාවය පෙන්වා දීම සඳහා වන බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් අවධාරණය කර සිටින ලදී.කිසිදු දේශපාලන පක්ෂයක් කෙරෙහි විශේෂත්වයක්, විරුද්ධභාවයක් හෝ පක්ෂපාතීත්වයක් මැතිවරණ කොමසාරිස් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව තුළ නොමැති අතර ආණ්ඩුව සුරැකීම හෝ පෙරලීම මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්යය නොවන බවත්, "රාජ්‍යය" යන්න සුරැකීම වෙනුවෙන් පමණක් මැතිවරණ කොමසාරිස් මෙන්ම මැතිවරණ දෙපාර්තමේන්තුවද පෙනී සිටින බවත් විශේෂයෙන් මෙහිදී අවධාරණය කර සිටින ලදී.

දේශීය නිරීක්ෂකයින් ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණ කටයුතු සඳහා විශේෂයෙන් මනාප ගණන් කිරීමේ අවස්ථාව නිරීක්ෂණය කිරීම සඳහා යෙදවීමට අපේක්ෂා කරනු ලබන බවත් ඇතැම් අවස්ථාවලදී ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවලට පහර දීම් වාර්තාවී ඇති බවත් එනම්එවැනි අවස්ථා පිළිබඳව මාතලේ, අනුරාධපුර, කුරුණෑගල යන ප්‍රදේශවලින් වාර්තා වී ඇති නමුත් එම අවස්ථාවලදී ඒ සම්බන්ධ පැමිණිලි ලැබී ඇත්තේ සියලු කටයුතු අවසන් වූ පසුව වන බවත් ඇතැම් සිදුවීම් පිළිබඳව විධිමත්ව වාර්තා වී නොමැති බවත් ඉදිරියේදී එවැනි වාතාවරණයක් ඇති නොවේ යැයි විශ්වාස කරනු ලබන බවත් කෙසේ වුවද එවැනි තත්ත්වයක් උදා වීම වළක්වාලීමට හැකි සියලුම ක්‍රියාමාර්ග ගනුලබන බවත් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලදී.එමෙන්ම ආධාරක පක්ෂවල අපේක්ෂකයින්(Proxy Candidates) අනවශ්‍ය ප්‍රමාණයෙන්ඡන්ද ගණන් කිරීමේ ශාලාවලට යෙදවීමෙන් වළකින ලෙස මෙහිදී ඉල්ලා සිටි මැතිවරණ කොමසාරිස් මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වල නියෝජිතයින්, මැතිවරණ කොමසාරිස්ගේ අනුදැනුම මත පෞද්ගලික නිලධාරියෙකු සහ දිස්ත්‍රික් ලේකම්ගේ නිලධාරියෙකු බැගින් ඒ ඒ දිස්ත්‍රික්කවල පැමිණිලි භාර ගැනීම සඳහා යෙදවීමට අපේක්ෂිත බවත් වැඩි දුරටත් සඳහන් කර සිටින ලදී.

13. දිස්ත්‍රික් ලේකම්වරුන් කිහිප දෙනෙකු අයවැය යෝජනා හරහා රාජ්‍ය නිලධාරීන්ට ලැබෙන ප්‍රතිලාභ හේතුවෙන් ආණ්ඩුව සුරැකීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා ඇති බවට පසුගිය සාකච්ඡාවේදී මතු වූ කරුණක් පිළිබඳව අවධානය යොමු කරමින් අදහස් දක්වා මැතිවරණ කොමසාරිස් ඒ පිළිබඳව සොයා බැලූ බවත් රාජකාරිවලට අදාළ වන්නා වූ නිල කටයුත්තක් හැර වෙනත්

කිසිදු අක්‍රමිකතාවක් එහිදී සිදුවී නොමැති බව අනාවරණය වූ බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ඉදිරියේදී අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ තමා සාකච්ඡා පැවැත්වීමට නියමිත බැව් ද, එමඟින් මැතිවරණ කටයුතු යහපත්ව ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලුම උත්සාහයන් දරනු ලබන බැව් ද මෙහිදී දන්වා සිටියේය.

14. මේ අවස්ථාවේදී ගැටළුවක් මතුකරමින් සුනිල් වටගල මහතා පෙන්වා දෙන ලද්දේ මැතිවරණ සමය තුළදී සිදුවන පොලිස් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අක්‍රමිකතා සිදු වන බැවින් මේ පිළිබඳව සුවිශේෂී අවධානය යොමු විය යුතු බවත් එවැනි අක්‍රමිකතා සිදුවීම වැළැක්වීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේගේ සිට පොලිස් ස්ථානාධිපතිවරුන් දක්වාම නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් ගෙන්වා ගැනීමට කටයුතු යෙදිය යුතු බවත්ය.

ඊට අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලද්දේ ඒ පිළිබඳව මේ වන විටත් කටයුතු සිදු කොට ඇති අතර එම තොරතුරු ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් අද දින (2014.11.21) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කිරීමට නියමිතව ඇති බවත් ය. මේ වන විට පොලිස් ස්ථානාධිපතිවරුන් හැත්තෑ පහක් පමණ ස්ථාන මාරු කර ඇති අතර පොලිස්පති මෙන්ම සහකාර පොලිස් අධිකාරීවරුන් සහ ඉන් ඉහළ තනතුරුවල නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් බලය හිමි වන්නේ අමාත්‍යාංශ ලේකම්වරයාහට වන බවත් ඉන් පහළ තනතුරු දරන නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය අමාත්‍යාංශලේකම්වරයාගේ එකඟතාව මත පොලිස්පතිවරයාහට හිමි වන බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටින ලදී. එමෙන්ම මේ සම්බන්ධයෙන් යම් පාර්ශ්වයක් හට කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබේ නම් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ද පැමිණිලි කිරීමට හැකියාව පවතින බවත්, තවද මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ නීති ලේකම් නිමල් පුංචිහේවා මහතාගේ ද සහභාගීත්වය ඇතිව ඒ ඒ පළාත්වල පොලිස් ස්ථානාධිපතිවරුන් හමුවී සාකච්ඡා කිරීමට ඉදිරියේදී අපේක්ෂා කරනු ලබන බවත් දන්වා සිටින ලදී.

තවද කිසිදු පොලිස් නිලධාරියකු විසින් හෝ මෙම ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් මේ වන තෙක් ඉදිරිපත් කර නොමැති අතර වෙනත් කිසිදු පාර්ශ්වයක් විසින් හෝ ඊට විරුද්ධත්වය ප්‍රකාශ කර නොසිටින්නේ නම් මැතිවරණ කොමසාරිස්හට පමණක් මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොවන බව ද මැතිවරණ කොමසාරිස් විසින් මෙහිදී පෙන්වා දෙන ලදී.

මේ අවස්ථාවේදී මනෝ ගනේෂන් මහතා විමසා සිටින ලද්දේ මේ වන විටත් ස්ථාන මාරු වීම් ලබා ඇති පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරාකාරද යන වගයි. 2014.11.22 දින සිට පොලිසියේ ස්ථාන මාරුවීම් කිසිදු ගැටළුවකින් තොරව අත්හිටුවීමට හැකියාව තිබෙන බවත් එහෙත් මේ වන විට ස්ථාන මාරු ලබා ඇති පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොවන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී විශේෂයෙන් දන්වා සිටින ලදී.

මේ අවස්ථාවේදී මනෝ ගනේෂන් මහතා යළිත් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටින ලද්දේ ස්වකීය පක්ෂය වගකිව යුතු දේශපාලන පක්ෂයක් වශයෙන් මෙවැනි ස්ථාන මාරු වීම් කෙරෙහි දැඩි විරෝධය දක්වා සිටින බවයි. එහිදී ස්වකීය අදහස් දක්වමින් සුනිල් වටගල මහතා ද ප්‍රකාශ කර සිටින ලද්දේ තම පක්ෂය ද මෙම ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් විරෝධතාව ප්‍රකාශ කර සිටින බවත් මැතිවරණ කොමසාරිස්හට හිමිව තිබෙන බලතල ප්‍රකාරව මේ සඳහා ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින බවත් ය.

එහිදී කරුණු පැහැදිලි කරන ලද මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධයෙන් PAFFREL සංවිධානය විසින් ද තමන් වෙත පැමිණිලි කර තිබෙන බවත් කෙසේ වුවද මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරියේදී සුදුසු පරිදි කටයුතු කිරීම සඳහා මනෝ ගනේෂන් සහ සුනිල් වටගල යන මහත්වරුන් විසින් සහ PAFFREL සංවිධානය විසින් මේ සම්බන්ධයෙන් විරෝධය දක්වා සිටින ලද බව මේ අවස්ථාවේදී විශේෂයෙන් සටහන් තබා ගැනීමට කටයුතු කරනු ලබන බව ද දන්වා සිටින ලදී. කෙසේ වෙතත් මැතිවරණ කාලපරිච්ඡේදයේදී මෙවැනි අක්‍රමිකතා සිදු වන්නේ නම් ඒ සම්බන්ධයෙන් කුමන හෝ පාර්ශ්වයක් වෙතින් පැමිණිලි ඉදිරිපත් නොකළද ඊට නිසි ක්‍රියාමාර්ග ගැනීමට මැතිවරණ කොමසාරිස් වශයෙන් තමන් විසින් කටයුතු කරනු ලබන බව ද දන්වා සිටින ලදී.

15. කෙසේ වුවද මැතිවරණ කාලපරිච්ඡේදය තුළදී ඉදිරිපත් වන ඇතැම් කරුණු කාරණා සම්බන්ධයෙන් තමන් විසින් ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා නොකරන බැව් ද මේ අවස්ථාවේදී දන්වා සිටි මැතිවරණකොමසාරිස්, නිදසුන් වශයෙන් අනියම් කම්කරුවන් වශයෙන් සේවයේනිරත වන්නන් ස්ථීර කිරීම සඳහා අයවැය යටතේ සහන සළසා ඇති බැවින් ඊට අදාළ චක්‍රලේඛය මේ වන විට නිකුත් වී ඇති අතර මෙම ස්ථීර කිරීමේ කටයුතු විනිවිදභාවයෙන් යුතුව සහ විධිමත්ව සිදු වන්නේනම් ඒවා අත්හිටුවීමටහෝ රජය විසින් පොදු මහජනතාව වෙත අය වැය හරහා නිශ්චිතව ලබා දෙනු ලබන සහන ආදිය අත්හිටුවීමට ක්‍රියා කිරීමට තමන් විසින් අපේක්ෂා නොකරන බැව් මෙහිදී දන්වා සිටින ලදී. මේ වන විටත් අදාළ ජංගම සේවා පවත්වමින් පොදු මහජනතාවගේ ගැටළු විසඳා අවසන්ව ඇත්තේ වුවත් ජංගම සේවා පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරන ලෙස එක්තරා ප්‍රමුඛ දේශපාලනඥයකු විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දන්වා ඇති බැව් දේශපාලන පක්ෂ දෙකක් විසින් තමන් වෙත පැමිණිලි කර ඇති බව මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ජාතික මැතිවරණයක් ප්‍රකාශයට පත් කොට ඇති මෙම අවස්ථාවේදී ජංගම සේවා පැවැත්වීම සුදුසු නොවන බැව් අවධාරණය කර සිටින ලදී. විශේෂයෙන්ම රටක ජනාධිපතිවරණයක් යනු ඉතා සුවිශේෂී අවස්ථාවක් වන හෙයින් එය අත්‍යාවශ්‍යයෙන්ම නිදහස් හා සාධාරණ මැතිවරණයක් විය යුතු බවත් එමෙන්ම එය නිදහස් හා සාධාරණ මැතිවරණයක් වන බැව් පැහැදිලිව දෘෂ්‍යමාන විය යුතු බවත් පැහැදිලි කර සිටි මැතිවරණ කොමසාරිස් යම් මැතිවරණයක්/ ඡන්ද විමසීමක් ඉතා විනිවිදභාවයෙන් යුතුව පැවැත්වීම හේතුවෙන් ඉන් රටට කීර්තිය අත් වන බවත් ඉන්දීය මැතිවරණ කොමිසම සතු බලතල ශ්‍රී ලංකා මැතිවරණ කොමසාරිස් වශයෙන් තමන්හට නොමැති වුවද මැතිවරණ කොමසාරිස් වශයෙන් සියලු ආකාරයේ මැතිවරණ නීති බලාත්මක කරමින් මනා විනිවිදභාවයෙන් යුත් ජාතික මැතිවරණයක් වශයෙන් ඉදිරි ජනාධිපතිවරණය පැවැත්වීමට හැකි උපරිම ක්‍රියාමාර්ග ගනු ලබන බවද මෙහිදී අවධාරණය කර සිටින ලදී.

නක්ෂත්‍ර කරුවන්ට අවශ්‍ය පරිදි ඡන්ද විමසීම් දින තීරණය කරන බවට එල්ල වූ චෝදනා ගැන කරුණු පැහැදිලි කළ මැතිවරණ කොමසාරිස් රටෙහි පොදු මහජනතාව නක්ෂත්‍රය විශ්වාස කරන මෙන්ම විශ්වාස නොකරන යන දෙ කොටසටම අයත් වන හෙයින් මෙහිදී බලවත් වන්නේ නක්ෂත්‍රය නොව මහජනතාවගේ ඡන්දය වන බවත් නක්ෂත්‍රානුකූලව සිය මැතිවරණ/ ඡන්ද විමසීම් කටයුතු මෙහෙයවනු ලැබූ ඇතැම් පාර්ශ්ව එම මැතිවරණ/ ඡන්ද විමසීම් පරාජයට පත්වූ අයුරු ඉතිහාසයේ ඕනෑතරම් සාක්ෂි පවතින බවත් පෙන්වා දෙන ලදී.

16. සුනිල් වටගල මහතා විසින් ගැටළුවක් මතු කරමින්, පසුගිය සැසි වාරවලදී සාකච්ඡාවට භාජනය වූ කරුණක් වන පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් හට හිමි වන බලය සම්බන්ධයෙන් විමසා සිටින ලද අතර විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත්වල මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා බහුල වශයෙන් මැදිහත් වනු ලබන්නේ හමුදා නිලධාරීන් වන බැවින් එහි බලපැවැත්විය යුත්තේ හමුදා නිලධාරීන්ගේ බලයද නැතහොත් පොලිසියේ බලයද යන ගැටළුව පැන නඟින බවත් දන්වා සිටින ලදී. දේශපාලන පක්ෂ වශයෙන් ඇතැම් අවස්ථාවලදී මැතිවරණ/ ඡන්ද විමසීමේ ආරක්ෂක කටයුතු සඳහා හමුදාව යොදවා ගන්නා ලෙස නියෝජිතයින් විසින්ද ඉල්ලා සිටීමට ක්‍රියා කරන නමුදු, එහි අනිටු ප්‍රතිඵල වශයෙන් විවිධ අක්‍රමිකතා ඇති විය හැකි බවත් මැතිවරණ පනතේ 119 වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්හට පැවරී තිබෙන බලතල ප්‍රකාරව පොලිස් බලතල මැතිවරණ කොමසාරිස් හරහා ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතින බැවින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් මැතිවරණ කොමසාරිස්ගේ බලතල ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙසත් ඒ මහතා මෙහිදී ඉල්ලා සිටින ලදී.

ඊට අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලද්දේ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡාවට බඳුන් කිරීමට නියමිත බවත්, උතුරු සහ නැගෙනහිර පළාත්වල මැතිවරණ කාලපරිච්ඡේදයේදී හමුදාව යොදවීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් මතු නොවනු ඇතැයි විශ්වාස කළ හැකි බවත් ය. පෙර පැවති මැතිවරණ/ ඡන්ද විමසීම් අවස්ථාවලදී හමුදාව අනුයුක්ත කර සිටින ලද ප්‍රදේශවල ජයග්‍රහණය රජයෙන් බැහැරව විපක්ෂ වෙත හිමි වූ අවස්ථා පවතින හෙයින් විශේෂයෙන්ම උතුරු පළාත්සභාවේ බලය විපක්ෂය සතු වී තිබෙන බැවිනුත් හමුදාව යෙදවීම තුළින් යම් පාර්ශ්වයක් හට ජයග්‍රහණය හෝ පරාජය අත්වීම සිදුවෙතැයි පූර්ව නිගමනවලට එළැඹීමට හැකියාවක් නොවන බව ද ප්‍රකාශ කර සිටින ලදී. එමෙන්ම යම් ප්‍රදේශයක ජනතා

ක්‍රියාකාරීත්වය සාර්ථකව පැවතෙන්නේ නම් මතුවන ගැටළු අවම කර ගැනීමට හැකියාව පවතින බැවිද ප්‍රායෝගික අත්දැකීම් මත ප්‍රකාශ කළ හැකි බව ද මෙහිදී දන්වා සිටින ලදී.

ඡන්ද විමසීම්වල පූර්ව හා පශ්චාත් අවස්ථාවලදී ආරක්ෂාව සඳහා මෙයට පෙර ද හමුදාව යොදවා ගෙන ඇති බව දැන්වූ මැතිවරණ කොමසාරිස් යුද හමුදාවේ සහාය ලබා ගැනීම නිසා ඡන්ද විමසීමක ජය පරාජය තීරණය වීමට අවකාශ නැති බව ද පෙන්වා දෙන ලදී. එසේ වුවද කිසිදු හමුදා කණ්ඩායමක් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමකට බාධාවන අයුරින් හැසිරෙන බව වාර්තා වූ සැනෙකින් ඒ පිළිබඳව ක්‍රියා කරන බව මැතිවරණ කොමසාරිස් දැන්වීය.

17. මේ අවස්ථාවේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිත චම්පානි පද්මසේකර මහතා විමසා සිටින ලද්දේ පසුගිය පළාත්සභා ඡන්ද විමසීමේදී ඡන්ද දායකයින් විසින් භාවිතා කරනු ලැබූ තාවකාලික හැඳුනුම්පත් ඉදිරි ජනාධිපතිවරණයේදී ද භාවිතා කිරීම සඳහා හැකි වන පරිදි වලංගු කිරීමට කටයුතු කරන්නේද යන වගයි.

ඊට කරුණු පැහැදිලි කරමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ 2012, 2013 සහ 2014 යන වර්ෂවලදී භාවිතා කරනු ලැබූ තාවකාලික හැඳුනුම්පත්වල ස්ථිකරයක් යොදා නැවත වලංගු කිරීමට කටයුතු කරනු ලබන බවයි.

මේ අවස්ථාවේදී සුනිල් වටගල මහතා විසින් විමසා සිටින ලද්දේ මැතිවරණ කාලපරිච්ඡේදයේදී ක්‍රියාත්මක වන පැමිණිලි විමර්ශන කමිටුව ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරන්නේද යන බව වන අතර මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ එය සුපුරුදු පරිදි මෙවර ද ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදන බවයි.

වතු ආශ්‍රිත මෙන්ම කොළඹ ප්‍රදේශයේ නැවත ස්ථානගත කරවන ලද පදිංචිකරුවන්ගේ තොරතුරු සොයා බලා වාර්තා කරන මෙන් එම කටයුතු මේ වන විටත් ඉටු කරමින් සිටින ජාතික නිදහස් පෙරමුණේ නියෝජිත කපිල ගමගේ මහතා වෙත දැනුම් දුන් මැතිවරණ කොමසාරිස් සුනිල් වටගල මහතා වෙතද දන්වා සිටියේ මෙම ඡන්ද දායකයින් පිළිබඳව සොයා බලා තොරතුරු සැපයීමට කටයුතු කරන ලෙසයි.

18. අනතුරුව ඉදිරි ජනාධිපතිවරණයේ කටයුතු කෙරෙහි සභාවේ අවධානය ගෙන එමින් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලද්දේ ඉහත කී පරිදිම මෙවර අවතැන් ඡන්ද දායකයින් වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට හැකියාව ලැබෙන්නේ පරිපූරක නාමලේඛනයෙහි නම් සඳහන් අයවලුන්හට පමණක් වන බවත් එනම් මන්නාරම, වවුනියා සහ මුලතිව් යන ප්‍රදේශවල ලියාපදිංචි වී ඇති ඡන්ද දායකයින්හට පමණක් වන බවත් එම ඡන්ද දායකයින් අතුරින් එක් ඡන්දයක් පමණක් යම් හෙයකින් මේ සඳහා භාවිතා වන්නේ නම් ඡන්දයක ඇති රහස්‍යභාවය සුරකිනු වස් එම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද පෙට්ටියක් ලබා දීමට හැකියාවක් නොමැති බැවින්,එවන් අවස්ථාවකදී ඡන්දය ලියාපදිංචි කර ඇති ප්‍රදේශයේදී අදාළ ඡන්ද දායකයා විසින්ස්වකීයඡන්දය ප්‍රකාශ කළ යුතුව ඇති බවත් ය.

එමෙන්ම වෙනත් අයවලුන්ගේ ජාතික හැඳුනුම්පත් භාවිතා කරමින් ව්‍යාජ ආකාරයෙන් ඡන්ද ප්‍රකාශ කිරීමට ද කිසිදු පාර්ශ්වයක්හට අවකාශ නිමි නොවන අතර, එවන් ක්‍රියා සිදු කරනු ලබන අයවලුන් පොලිසිය භාරයට පත් කිරීමට කටයුතු කරනු ලබන බව ද එමෙන්ම ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පැමිණෙන ඕනෑම අයෙකු පිළිබඳව යම් සැකයක් ඇති වන අවස්ථාවකදී එම තැනැත්තා වෙතින් අත්සන සහිත ප්‍රකාශයක් ලබා ගැනීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (SPO) හට බලය පවතින අතර මේ සම්බන්ධයෙන් පවතින නීති රීති ඉතා තදින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බවද මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී.

19. ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේදී තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින වන්නේ 2014.12.04 දින වන බවත් මැතිවරණයේ සියලුම කටයුතු සංවිධානය කර ගැනීම සඳහා ඇත්තේ ඉතා සීමිතකාල පරිච්ඡේදයක් පමණක් වන හෙයින්එදිනට පසුව ලැබෙන කිසිදු තැපැල් ඡන්ද අයදුම්පත්‍රයක් භාර ගැනීමට කටයුතු කිරීමට හැකියාවක් නොවන බවත් මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී. 2014.12.15 දින තැපැල් ඡන්ද නිකුත් කිරීමට අපේක්ෂිත දිනය වන අතර මෙ දින දැනට පවතින තත්ත්වය මත සුලු වෙනස් වීම්වලට ලක් විය හැකි බවත් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමේ අවසන් දිනය 2014.12.31 දින වන බවත් දන්වා සිටින ලදී.

එමෙන්ම නාමයෝජනා භාර ගැනීමේ අවසන් දිනය තීරණය කිරීමේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වෙන දින පිළිබඳව සලකා බැලූ අතරමැතිවරණ දෙපාර්තමේන්තුව අවට ද පාසැල් පිහිටා තිබෙන බැවින් 2014.12.09 දින එම පාසැල් වල අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග පැවැත්වෙන බැවින් යම් හෙයකින් එදින නාමයෝජනා භාර ගැනීමේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කළහොත්, මැතිවරණ මහලේකම් කාර්යාලයේදී නාමයෝජනා භාර දීමෙන් අනතුරුව දේශපාලන පක්ෂ ආධාරකරුවන් විසින් මහලේකම් කාර්යාලය අවට පෙළපාලි පැවැත්වීමට ක්‍රියා කිරීම වළක්වාලීමට නොහැකි වුව හොත් විභාග අපේක්ෂකයින්හට ඉන් අගතියක් සිදු වන බැවින් එනම්රටක අනාගතය වන් දරුවන්ගේ අධ්‍යාපනයට කිසිඳු හෝ අයුරකින් හානියක් සිදුවීමට ඉඩකඩ නොතැබිය හැකි බැවින් නාමයෝජනා භාරගන්නා දිනය 2014.12.08 දිනට නියම කර ඇති බවත් විශේෂයෙන් අවධාරණය කර සිටින ලද මැතිවරණ කොමසාරිස් මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් නාමයෝජනා භාර ගැනීමේ අවසන් දිනය තීරණය කරනු ලැබූ බවත්, මැතිවරණ දිනය තීරණය කිරීමේදී ශුද්ධෝත්තම පියතුමාගේ ලංකා සංචාරයට බාධා නොවන සේ ඒ සඳහා ලබා ගත හැකි උපරිම දින ගණන ලබා දීමට ක්‍රියා කරනු ලැබූ බව ද තව දුරටත් කරුණු දක්වමින් පැහැදිලි කර සිටින ලදී.

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය ගැටළු අවම කර ගනිමින් නිදහස් හා සාධාරණවත් ඉතා යහපත් ආකාරයෙනුත් පැවැත්වීම සඳහා සියලු පාර්ශ්ව වගකීමෙන් හා උනන්දුවෙන් යුතුව කටයුතු කරනු ලබනු ඇතැයි තමන් විශ්වාස කරනු ලබන බවත් මෙහිදී සඳහන් කර සිටි මැතිවරණ කොමසාරිස් වෙනත් ගැටළු හෝ යොමු කළ යුතු කරුණු වෙත් නම් ඉදිරිපත් කරන ලෙස සභාව වෙත කාල වේලාව ලබා දුන් අතර එවැන්නක් නොමැති බැව් පෙනී ගියෙන් අද දින සහභාගීත්වය දැක්වූ සැමට ස්වකීය ස්තුතිය නැවතත් පලකර සිටිමින් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1630 ට අවසන් කරන ලදී.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ නිත්‍ය නියෝජිතයින් සමඟ
පවත්වන ලද සාකච්ඡාව - 2014.12.05

පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්සහ නිත්‍ය නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්.

සහභාගීත්වය :

1.	චම්පානි පද්මසේකර මහතා	-	ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
2.	කේ.මාරිමුත්තු මහතා	-	ලංකා කම්කරු කොංග්‍රසය (දේශපාලන අංශය)
3.	ශාන්ත හේරත් මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
4.	ශ්‍යාමිලා පෙරේරා මහත්මිය	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
5.	උදය ගම්මන්පිල මහතා	-	ජාතික හෙළ උරුමය
6.	ශ්‍රීනාත් පෙරේරා මහතා	-	එක්සත් සමාජවාදී පක්ෂය
7.	එස්.විජේසන්දිරන් මහතා	-	කඳුරට ජනතා පෙරමුණ
8.	සරත් අතුකෝරළ මහතා	-	කඳුරට ජනතා පෙරමුණ
9.	එස්.අජිත් කුමාර මහතා	-	කඳුරට ජනතා පෙරමුණ
10.	ජී.රාජකුමාර් මහතා	-	ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
11.	වී.තිරුණාවුක්කරසු මහතා	-	නව සමසමාජ පක්ෂය
12.	එස්.මහේන්ද්‍රන් මහතා	-	නව සමසමාජ පක්ෂය
13.	සුරනිමල රාජපක්ෂ මහතා	-	එක්සත් ජාතික පක්ෂය
14.	දයා පැල්පොල මහතා	-	එක්සත් ජාතික පක්ෂය
15.	ජෝසප් මයිකල් පෙරේරා මහතා	-	එක්සත් ජාතික පක්ෂය
16.	ආර්.යෝගරාජා මහතා	-	එක්සත් ජාතික පක්ෂය
17.	සුනිල් ද සිල්වා මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
18.	ආනන්ද මානවඩු මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
19.	ඉන්දික ගාල්ලගේ මහතා	-	ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
20.	මංජුල සේනානායක මහතා	-	අපේ ජාතික පෙරමුණ
21.	සේනක ද සිල්වා මහතා	-	අපේ ජාතික පෙරමුණ
22.	ලලිත් රෝහණ ලියනගේ මහතා	-	මහජන එක්සත් පෙරමුණ
23.	තිස්ස යාපා මහතා	-	මහජන එක්සත් පෙරමුණ
24.	වයි. එල්. එස්. හමීඩ් මහතා	-	අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය

මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන් :

1.	යූ.අමරදාස මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2.	ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
3.	එම්.එම්. මොහමඩ් මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1510 ට ආරම්භ වූ අතර අද දින සහභාගී වී සිටින සියලු පාර්ශ්ව මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලදී.

2014 .11.21 දින දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ නිත්‍ය නියෝජිතයින් සමඟ පවත්වන ලද සාකච්ඡාවේ සටහන් සාරාංශය කෙරෙහි ප්‍රථමයෙන් සභාවේ අවධානය යොමු කරමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ එහිදී සාකච්ඡාවට ලක් වූ පරිදි සෞඛ්‍ය සේවයේ සහ අධිවේගී මාර්ගවල සේවයෙහි නිරත වන්නන් හට තැපැල් ඡන්දය ලබා දීමට හැකි ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව මේ අවස්ථාවේ දී ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොවීම කණගාටුවට කරුණක් වන බවයි.මන්ද එම යෝජනා විධිමත් ආකාරයෙන් පනතක් හරහා සම්මත කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අදාළ අයවලුන්හට ඉදිරි ජනාධිපතිවරණයේ දී තැපැල් ඡන්දය

භාවිතා කිරීමට අවස්ථාවක් උදාකර දීමට හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවකාශ නොලැබෙන බැව් තවදුරටත් දැන්වීය.

02. තව ද කොළඹ සහ ආශ්‍රිත ප්‍රදේශවල රැකියාවන්හි නිරත වන වතු සහ සෙසු ග්‍රාමීය ප්‍රදේශවල පදිංචිකරුවන්ට ජාතික මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවකදී ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගම්බිම් වෙත යෑමට ප්‍රමාණවත් පරිදි නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් සකස් කිරීම පිළිබඳව සියලු පාර්ශවවල අවධානය යොමු විය යුතු බවත් වතු ආශ්‍රිත ජනතාව නියෝජනය කරන පක්ෂ සමග සහයෝගයෙන් ක්‍රියාකරනඉදිරි ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයන් ඉදිරිපත් කරමින් තරඟ කරනු ලබන එක්සත් ජනතා නිදහස් සන්ධානය සහ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ යන පක්ෂ හා එම පක්ෂවලට සහාය දක්වන නැතහොත් සන්ධානගත එම පක්ෂ ද්විත්වය සමග ක්‍රියා කරනු ලබන සෙසු පක්ෂ/ පාර්ශ්ව ද මේ කරුණ සම්බන්ධයෙන් සිය විශේෂ අවධානය යොමු කළ යුතුව ඇති බව ද මැතිවරණ කොමසාරිස් මෙහිදී අවධාරණය කරන ලදී. එසේම දැනටමත් ඇප තැන්පත් කර ඇති සෙසු අපේක්ෂකයන් නියෝජනය කරන පක්ෂවල නියෝජිතයින් ද මේ සම්බන්ධයෙන් ස්වකීය අවධානය දැක්වීම අත්‍යවශ්‍ය බව ද මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කළේය.

රට තුළ ජාතික මැතිවරණයක් පැවැත්වෙන අවස්ථාවන්හිදී ඇඟලුම් කර්මාන්ත ශාලා ඇතුළු සෙසු කර්මාන්ත ශාලාවල සේවයෙහි නිරත සේවක/ සේවිකාවන් හට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ගම් ප්‍රදේශවලට යාමට ප්‍රවාහන පහසුකම් අදාළ කර්මාන්ත ශාලාවේ පාලන අධිකාරිය විසින් සාමාන්‍යයෙන් සපයනු ලබන අතර එහෙත් හෝටල් ආශ්‍රිතව රැකියාවෙහි නියැලෙන පාර්ශ්ව හට එවැනි අවස්ථාවක් නොවීම හේතු කොට ගෙන අවහිරතා පැන නගින බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කළේය. කෙසේ වුවද කොළඹ, මහනුවර සහ ගාල්ල වැනි ප්‍රදේශවල සේවය කරන්නන් හට මැතිවරණ/ ඡන්ද විමසීම් පැවැත්වෙන අවස්ථාවලදී සිය ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි ඔවුන්හට නිවාඩු ලබා දීම පිළිබඳව පිළිවෙයි අන්තෝනිමුත්තු මහතා විසින් පෙර අවස්ථාවලදී යම් වැඩපිළිවෙලක් දියත් කරන ලද බැව් මේ අවස්ථාවේදී සිහිපත් කර සිටි මැතිවරණ කොමසාරිස් මෙවර ජනාධිපතිවරණය උදෙසා ද එවැනි ක්‍රමවේදයක් දියත් කිරීම සඳහා ද ඒ මහතා කැඳවා සාකච්ඡා කිරීම සුදුසු බැව් මෙහිදී පෙන්වා දෙන ලදුව සභාවේ එකඟතාව ද ඊට හිමිවිය.

මේ අවස්ථාවේදී මැතිවරණ කොමසාරිස් කරුණු පැහැදිලි කරමින් මැතිවරණ දෙපාර්තමේන්තුව සහ කම්කරු අමාත්‍යාංශය එක්ව මෙම ගැටළුව පිළිබඳව වැඩිදුර සාකච්ඡා කොට මේ සම්බන්ධයෙන් උනන්දුව දක්වන සෙසු පාර්ශ්ව වන, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිතයකු හා නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ නියෝජිතයකු ද සමඟ නිත්‍ය නියෝජිතයන් වූ නීතීඥ ශ්‍රීනාත් පෙරේරා මහතා ද ජනාධිපති නීතීඥ ඒ.එස්.එම්.පෙරේරා මහතා ද කේ.මාරිමුත්තු මහතා ද ආර්.යෝගරාජා මහතා, ශාන්ත හේරත් මහතාගේ දසහඟාගීත්වයෙන් යුතු කම්ටුවක් මඟින් මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතුව ඇති බවත් නිදහස් වෙළඳ කලාපවල සේවයේ නියුතු සේවක සේවිකාවන් හට ජාතික මැතිවරණයක දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහාගම්ප්‍රදේශවෙතයෑමටසුදුසුවැඩපිළිවෙලක්දියත්කිරීමසම්බන්ධයෙන්අනුරජයසිංහමහතාහා සුරනිමල රාජපක්ෂ මහතා විසින් සොයා බලා කටයුතු කිරීම මැනවි යයි මැතිවරණ කොමසාරිස් මෙහිදී යෝජනා කරන ලදී.

03. මැතිවරණ/ ඡන්ද විමසීම් දිනයේ දී රෝහල්වල රාජකාරිවල නියැලෙන වෛද්‍යවරුන් හා සෙසු වෘත්තිකයන් සඳහා නියමිත කෘත්‍ය ලේඛනයක් (Roster) හරහා නිශ්චිතව සේවයේ නිරත කරවීම හා එහිදී දුර බැහැර පළාත්වල පදිංචි අයවලුන් සේවයෙන් නිදහස් කිරීම හා රෝහල් පිහිටි ප්‍රදේශවල පදිංචි කරුවන් සේවයේ යොදවා ඡන්දය දීමට යෑමට සේවයෙන් නිදහස් කල නොහැකි තැනැත්තන් ඡන්ද විමසීම් දින ප්‍රථමාධාර ඒකකවලට අනුයුක්ත කර තැපැල් ඡන්ද හිමිකම ලබා දීමට හැකි ලෙසට කටයුතු සලස්වන ලෙස ඒ ඒ රෝහල් අධිකාරීන් හා දිස්ත්‍රික් ත්‍රේරීම්භාර නිලධාරීන් දැනුවත් කිරීමට අපේක්ෂා කරන බව ද මැතිවරණ කොමසාරිස් දන්වන ලදී.

04. ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා භාර ගනු ලබන 2014.12.08 දිනෙන් පසු, මැතිවරණය සම්බන්ධයෙන් මධ්‍යස්ථ ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ ද නැතහොත් යම් අපේක්ෂකයකු හට සෘජුව සහාය දක්වන්නේ ද යන්න දන්වා එවන ලෙස තරඟ නොකරන සියලු දේශපාලන පක්ෂවලට ලිඛිතව දන්වා යැවීමට අපේක්ෂා කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ ය. තවද ප්‍රමුඛ අපේක්ෂකයින්ගේ ප්‍රචාරක

රැස්වීම් අමතා කථා පවත්වනු ලබන කිසිදු පාර්ශ්වයක් විසින් ආධාරක පක්ෂවල අපේක්ෂකයින්ගේ ප්‍රචාරක රැස්වීම්වල කථා පවත්වන ලද බවට ඔප්පුවන විටක දී එසේ රැස්වීම් ඇමතීම සඳහා අදාළ පාර්ශ්වය/ කථිකයා හට ලබා දී තිබෙන වරප්‍රසාදය අහිමි කිරීමට කටයුතු කරනු ලබන බව ද මේ සම්බන්ධයෙන් නීති රීති ඉතා දැඩි ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව ද මැතිවරණ කොමසාරිස් මෙහිදී අවධාරණය කර සිටියේ ය.

05. පක්ෂ කාර්යාල පිහිටුවීම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරමින් මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලද්දේ පසුගිය ඡන්ද විමසීම් අවස්ථාවලදී සෑම ඡන්ද කොට්ඨාසයකටම එකක් වශයෙන් පක්ෂ කාර්යාල පිහිටුවීමට හැකියාව තිබුණ බවත් අපේක්ෂකගේ නිවසේ හෝ කාර්යාලයක් පිහිටුවීමට අවස්ථාව තිබූ අතර මෙම මැතිවරණයේ දී ප්‍රමුඛ කාර්යාල පිහිටුවීමට හැකියාව පවතින්නේ දිස්ත්‍රික්කයකට එකක් පමණක් වන බවත් එබැවින් ඡන්ද දායකයින් හට සහ අපේක්ෂකයින් යන දෙපිරිසටම වැදගත් වන හෙයින් ඡන්ද ප්‍රදේශ 160 ක ප්‍රමාණයට දිස්ත්‍රික් කාර්යාල පිහිටුවීමට අපේක්ෂකයින්ගේ ද එකඟතාවය ඇතිව අවස්ථාව සලසා දීමට හැකි දැයි පක්ෂ කිහිපයකම නියෝජිතයින් විසින් තමන් වෙතින් විමසා ඇති බවත්ය. එහෙත් මැතිවරණ කාල පරිච්ඡේදයේ දී අදාළ අපේක්ෂකයින් විසින් මේ සම්බන්ධයෙන් තීරණය කළ යුතුව ඇති බවත් නිතා නියෝජිතයින් හට ඊට බලය ලබා දිය නොහැකි බවත් කෙසේ වුවද මෙය සුදුසු හෝ නුසුදුසු ද යන්න සම්බන්ධව නිර්දේශ ලබා ගත හැකි නම් සහ සියලු පාර්ශ්වවල එකඟතාව පවතින්නේ නම් මේ සම්බන්ධව තීරණයකට එළඹීමට හැකි බව ද දන්වන ලදී.

කෙසේ වුවද මේ වන විට පක්ෂ 17 ක් සහ ස්වාධීන අපේක්ෂකයින් දෙදෙනෙකු විසින් ජනාධිපතිවරණ අපේක්ෂකත්වය සඳහා ඇප මුදල් තැන්පත් කර ඇති බැවින් මේ සියලු පාර්ශ්ව විසින් මේ අවස්ථාව ඉල්ලා සිටීම හෝ නොසිටීම සම්බන්ධයෙන් පූර්ව නිගමනයන්ට එළඹිය නොහැකි වුවත් මේ සම්බන්ධයෙන් යම් විරුද්ධතාවක් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් එය සටහන් තබා ගැනීමට කටයුතු කරන බවත් මැතිවරණ කොමසාරිස් තවදුරටත් පැහැදිලි කරන ලදී.

ඒ අවස්ථාවේදී පැමිණ සිටි නියෝජිතයින් කිහිප දෙනෙකු විසින් අදහස් දක්වන ලද්දේ යම් අපේක්ෂකයකු විසින් මැතිවරණ කොමසාරිස් වෙතින් මේ සඳහා ලිඛිතව අවසර ඉල්ලා සිටින්නේ නම් එවැනි විටක දී අදාළ පක්ෂ කාර්යාල පිහිටුවීමට අවසර ලබා දීම සුදුසු වන බවයි. එහිදී මැතිවරණ කොමසාරිස් යලිත් පැහැදිලි කර සිටියේ පක්ෂ කාර්යාල තුළ බැනර් ප්‍රදර්ශනය කිරීමේ අවසරය, අතීත අවස්ථාවක දී එක්සත් සමාජවාදී පක්ෂයේ නියෝජිත සිරිතුංග ජයසූරිය මහතාවිසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් ලැබී ඇති බවත් මේ සම්බන්ධයෙන් ද අපේක්ෂකයින්ගේ සහ නිතා නියෝජිතයින්ගේ එකඟතාව ලැබීම වඩා වැදගත් වන බවත් ය. එමෙන්ම මෙම පක්ෂ පිහිටුවීමෙන් ඒ හරහා අපේක්ෂකයාගේ සක්‍රීය නියෝජිතයෙක් සිටීමත් නිශ්චිත ඡන්ද ප්‍රදේශයකට එක් පක්ෂ කාර්යාලයක් තිබීම නිසා අපේක්ෂකයින් වෙත යොමු කළ යුතු පණිවිඩ/ දැන්වීම් ආදිය යොමු කිරීමට පහසු වීම මැතිවරණ දෙපාර්තමේන්තුවට වැදගත් වන බව ද පෙන්වා දෙන ලදී.

මේ අවස්ථාවේදී නියෝජිතයකු විසින් ප්‍රකාශ කරන ලද්දේ මේ වන විටත් දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ වත්මන් ජනාධිපතිතුමන්ගේ ප්‍රචාරණය සඳහා පක්ෂ කාර්යාල ස්ථාපිත කොට අවසන් වන අතර සෙසු අපේක්ෂකයින් ද ප්‍රචාරණය විය යුතු බැවින් පක්ෂ කාර්යාල පිහිටුවිය යුතුව ඇති බවයි. එහි දී කරුණු දක්වමින් මැතිවරණ කොමසාරිස් අවධාරණය කරන ලද්දේ පනත ප්‍රකාරව මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට මැතිවරණ කොමසාරිස් හට බලය හිමි වන්නේ නාමයෝජනා දිනෙන් පසුව වන බවත් 2014.12.07 වන දින මධ්‍යම රාත්‍රී 12.00 වනවිට සැරසිලි, කටවුට්, නීති විරෝධී කාර්යාල ඉවත් කළ යුතු බව මේ වන විටත් සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, සියලුම පොලිසි වෙත දැනුම් දීමට කටයුතු කර ඇති අතර විශේෂයෙන්ම මෙවා ඉවත් කිරීම සම්බන්ධව පොලිසිය වගකීමෙන් යුතුව ක්‍රියා කළ යුතුව ඇති බව ද දන්වා සිටීමට එහිදී පියවර ගත් බවත් ය.

එහිදී නියෝජිතයින් කිහිප දෙනෙකු විසින් පෙන්වා දෙන ලද්දේ මෙම සැරසිලි, බැනර්, කටවුට් ප්‍රදර්ශනය කරනු ලබන්නේ රාජ්‍ය උත්සව හරහා ඒවාට යොදා ගනිමින් වන බවයි. මැතිවරණ කොමසාරිස් කරුණු පැහැදිලි කරන ලද්දේ රාජ්‍ය උත්සව පවත්වන්නේ නම් ඒ සඳහා ජාතික කොඩිය පමණක් භාවිතා කළ යුතු බව දන්වමින් සියලුම ආයතන වෙත ලිඛිතව දන්වා ඇති බවයි.

06. මේ අවස්ථාවේදී එක්සත් සමාජවාදී පක්ෂයේ නියෝජිත නීතීඥ ශ්‍රීනාත් පෙරේරා මහතා විමසා සිටියේ පනත ප්‍රකාරව සලකා බැලීමේ දී මැතිවරණ/ ඡන්ද විමසීම් කාල පරිච්ඡේදවලදී සංග්‍රහ කිරීම් ආදිය සපුරා නීති

විරෝධී වන බවයි. මැතිවරණ කොමසාරිස් එහිදී පෙන්වා දෙන ලද්දේ මෙවැනි නීති උල්ලංඝනය වීමේ අවස්ථා විවිධ අවස්ථාවලදී පැහැදිලිවම වාර්තා වී ඇති නමුත් මේ වන තෙක් කිසිඳු පාර්ශ්වයක් විසින් ඊට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන නොමැති බවයි. නිදසුනක් වශයෙන් උෂව පළාතේ පළාත් සභා ඡන්ද විමසීමේ දී එක්තරා අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයෙන් ශීල සමාදානයේ සිටි උවැස උවැසියන් හට සිල් රෙදි බෙදා දීමට කටයුතු කරන ලද බව ඉතා පැහැදිලිවම මාධ්‍ය හරහා ද වාර්තා වූ නමුත් කිසිඳු පාර්ශ්වයක් විසින් ඒ සම්බන්ධව නීති ප්‍රකාරව කටයුතු කිරීමට ඉදිරිපත් නොවූ බව පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් තවදුරටත් දන්වා සිටියේ යම් පාර්ශ්වයක් විසින් ඒ අවස්ථාවේ දී අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු වී නම් අදාළ මන්ත්‍රීවරයා පළාත් සභාවට තේරී පත්වුවද ඔහු මන්ත්‍රී ධුරයෙන් ඉවත් කිරීමට (Unseat) හැකියාවක් පැවති බවයි.

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉන්දික ගාල්ලගේ මහතා එහිදී ප්‍රකාශ කර සිටියේ ඇතැම් කරුණු කාරණා සම්බන්ධව නීතිපතිගේ අවසරය රහිතව අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු වීමට හැකියාවක් නොවන බව වන අතර මැතිවරණ කොමසාරිස් මෙහිදී පෙන්වා දෙන ලද්දේ නීතිපති හරහා නඩු පැවරිය යුත්තේ රාජ්‍ය ආයතන වන බවත් ඕනෑම පුද්ගලයකු හට මෙවැනි දෑ සම්බන්ධව උපරිමාධිකරණය මගින් නීති පියවර ගැනීමට හැකියාව පවතින බවත් ය. යලිත් ඉන්දික ගාල්ලගේ මහතා පෙන්වා දෙන ලද්දේ අනවසර කටවුට්, තොරණ් ආදිය ඉවත් කළ යුතුව ඇති බවත් එමෙන්ම රාජ්‍ය මාධ්‍යවල පාලනයක් තිබිය යුතු බවත් තවද ඇතැම් මාධ්‍ය ඉතා අවිනීත ආකාරයෙන් ක්‍රියා කරනු ලබන බව පෙනී යන බවත්ය. ඊට කරුණු පැහැදිලි කරමින් මැතිවරණ කොමසාරිස් දන්වන ලද්දේ මැතිවරණ කොමසාරිස් වෙත පවරා තිබූ රාජ්‍ය මාධ්‍ය පාලනය කිරීමේ බලය 18 වන ව්‍යවස්ථා සංශෝධනයේ දී ඉවත් කර ඇති හෙයින් ජනාධිපතිවරණ පනතේ 117 වගන්තිය පරිදි මැතිවරණ කොමසාරිස් හට ඊට බලය හිමි වන්නේ නාමයෝජනා භාර ගනු ලබන දිනයේ පටන් වන බැවින් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග සියල්ල ගනු ලබන බවත් ගුවන්විදුලිය හා ජාතික රූපවාහිනියේ විකාශය වන මැතිවරණයට අදාළ වන වැඩසටහන් පාලනය කිරීමට හැකියාවක් ඇති නමුත් ස්වාධීන රූපවාහිනී සේවය සමාගමක් යටතට ගැනෙන්නේ යැයි සැලකෙන බවයි. කෙසේ වුවද මේ වන තෙක් කිසිඳු හෝ පාර්ශ්වයක් විසින් රාජ්‍ය මාධ්‍ය පක්ෂපාතීව හෝ අවිනීත ආකාරයෙන් ක්‍රියා කරනු ලබන බවට ලිඛිත පැමිණිල්ලක් හෝ කරුණු දැක්වීමක් එම මාධ්‍ය ආයතන වෙත යොමු කිරීමට කටයුතු කර නොමැති බවත්, හුදෙක් අදහස් දැක්වීම පමණක් අක්‍රමිකතා වැළැක්වීම උදෙසා පිළියමක් නොවන බවත් රාජ්‍ය මාධ්‍ය වශයෙන් වඩා ශික්ෂිත හා වගකීමෙන් යුතුව ක්‍රියා කරන ලෙසට එම ආයතන වෙත දන්වා සිටීමට ඕනෑම පාර්ශ්වයකට හැකියාවක් තිබෙන බව ද මැතිවරණකොමසාරිස් තව දුරටත් පහදන ලදී.

නාවික හමුදාව මගින් යම් ආකාරයක ව්‍යාජ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කිරීමේ අක්‍රමිකතාවක් සිදු කිරීමට සැලසුම් සහගත රහස් වැඩපිළිවෙලක් දියත් කරමින් පවතින බැව් අවිධිමත් ආකාරයෙන් තොරතුරු ලැබී තිබෙන අතර හුදෙක් ඒ සම්බන්ධයෙන් විවේචන/ ප්‍රකාශන ඉදිරිපත් කරනවා හැර නාවික හමුදාපති විමසා ඒ පිළිබඳව තහවුරු කර ගැනීමට හෝ කිසිඳු පාර්ශ්වයක් මේ වන තෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් මෙම තත්ත්වය මැතිවරණයේ විශ්වසනීයත්වය කෙරෙහි ඉතා තදින් බලපෑම් එල්ල කරන්නක් වන බැවින් මැතිවරණ කොමසාරිස් වශයෙන් ඒ සම්බන්ධයෙන් නාවික හමුදාපති ලිඛිතව විමසීමට කටයුතු කරනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී පැහැදිලි කරන ලදී. තවද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සතුව තිබූ හැඳුනුම්පත් මුද්‍රණ යන්ත්‍රයක් අස්ථානගත වී ඇති බවට එපරිද්දෙන්ම තොරතුරු වාර්තා වූ අවස්ථාවේ දී තමන් ඒ සම්බන්ධයෙන් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විමසන ලදුව එවැන්නක් සිදු වී නොමැති බවට පැහැදිලිව තහවුරු කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් කටයුතු කළ බවත් එහෙත් වෙනත් කිසිඳු පාර්ශ්වයක් විසින් ඒ සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමකට යොමු වී නොමැති බව මෙහි දී පෙන්වා දෙන ලද මැතිවරණ කොමසාරිස් මෙවැනි දෑ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව ඒ ඒ පාර්ශ්ව වෙත දෝෂාරෝපණය කිරීම පමණක් විසඳුමක් නොවන බව අවධාරණය කරන ලදී.

නාවික හමුදාව ආශ්‍රිතව එවැනි අක්‍රමිකතාවක් සිදු නොවන බවට තමන්ගේවිශ්වාසය වන නමුදු යම් හෙයකින් එවැනි නීති විරෝධී කටයුත්තක් සිදු වන්නේ නම් එය වළකාලීම සඳහාත් මැතිවරණය පිළිබඳව සැකයට තුඩු දෙනු ලබන කරුණක් වෙතොත් එය නිසැක වශයෙන්ම වළක්වාලීමට පියවර ගත යුතු බැවිනුත්මේ සම්බන්ධයෙන් නාවික හමුදාපතිවරයා වෙත ලිඛිතව දැනුම්දී, ලිඛිත කරුණු පැහැදිලි කිරීමක් ලබා ගැනීමට අපේක්ෂිත බව ද දන්වා සිටින ලදී.

මේ අවස්ථාවේදී දයා පැල්පොල මහතා විසින් ප්‍රකාශ කර සිටින ලද්දේ රජයේ මුද්‍රණාලය ආශ්‍රිතව ඉතා බරපතල මට්ටමින් සිදුවූ ස්ථාන මාරු වීමක් සම්බන්ධව තොරතුරු වාර්තා වන බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කළ යුතුව ඇති බවත් ය. මැතිවරණ කොමසාරිස් එහිදී පෙන්වා දෙන ලද්දේ සැබැවින්ම එම අභ්‍යන්තර ස්ථාන මාරු වීම ගැටළු සහගත ස්ථාන මාරු වීමක් වන බැව් පෙනී ගිය බවත් එසේ වුවද ඊට මැදිහත් වෙමින් අදාළ ගැටළුව විසඳාලීමට මේ වන විට පියවර ගෙන ඇති බවත් ය.

ෂර්මිලා පෙරේරා මහත්මිය විසින් ගැටළුවක් නගමින් විමසා සිටින ලද්දේ රජයේ මුද්‍රණාලයේ රහස්‍ය අංශය වෙත නවක සේවකයින් බඳවා ගෙන ඇති බවට වාර්තා වන බැවින් ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නයි.

රජයේ මුද්‍රණාලයේ රහස්‍ය අංශය වෙත නවක සේවකයින් බඳවා ගෙන ඇත්නම්, මැතිවරණ කටයුතු ඔවුන් යොදවා ගැනීමෙන් තොරව පළපුරුදු සේවකයින් යොදවාගෙන ඉටු කරන ලෙසත් ජාතික මැතිවරණයකදී විශ්වසනීයත්වය බිඳවැටෙන ආකාරයේ කට කථා පැතිරීමට ඉඩ කඩ තැබීම ඉතා භයානක තත්ත්වයක් දක්වා වර්ධනය විය හැකි බැවින් විශ්වසනීයත්වය සුරකිමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම උදෙසා සහාය දක්වන ලෙස රජයේ මුද්‍රණාලය වෙත ලිඛිතව දන්වා සිටීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් ඊට පිළිතුරු ලබා දෙමින් පැහැදිළි කර සිටින ලදී.

07. මැතිවරණ දිනයේ දී ඡන්ද කොට්ඨාස මට්ටමින් පක්ෂ කාර්යාල විවෘතව තැබීමට පනත ප්‍රකාරව ඉඩ කඩ ඇතත් ඡන්ද පොළට මීටර් 500 ක් ඇතුළත පිහිටුවා ඇති සියලුම පක්ෂ කාර්යාල නියමිත දිනට වසා තැබීමට කටයුතු කළ යුතු බවත් මින් ඉහත මැතිවරණ/ ඡන්ද විමසීම් අවස්ථාවලදී ද මේවා විවෘතව තැබීමට ඉඩ දී නොමැති බවත් මේවා විවෘතව තැබීමට යම් හෙයකින් ඉඩ තැබුවහොත් ඒ ඒ ස්ථානවල දී ඡන්ද දායකයින් හට බලපෑම් සිදුවන අයුරින් අත් පත්‍රිකා බෙදීම්, මැර ක්‍රියා සිදු කිරීම්, තර්ජන කිරීම් ආදී අක්‍රමිකතා සිදු වීමට ඉඩ ඇති බවත් පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් මහ ජනතාවගේ ස්වාධීන මතයට බලපෑමක් සිදුවන අයුරින් යම් පාර්ශ්වයක් විසින් මෙම කාර්යාල විවෘතව තැබීමට ක්‍රියා කිරීම හේතුවෙන් යම් ආකාරයක ගැටළු මතු වුවහොත් එම ඡන්ද ප්‍රදේශයෙහි ඡන්ද විමසීම ශූන්‍ය කිරීමට කටයුතු කරනු ලබන බව ද අවධාරණය කර සිටින ලදී.

මේ අවස්ථාවේදී ගැටළුක් නගමින් එක්සත් ජාතික පක්ෂයේ දයා පැල්පොල මහතා විමසා සිටියේ මෙම පක්ෂ කාර්යාල පිහිටුවීම සඳහා අවසර ඉල්ලා සිටිය යුත්තේ කවුරුන් විසින් ද යන්නයි. නියෝජිතයින් පත් කරන තෙක් මෙම පක්ෂ කාර්යාල නීත්‍යානුකූල නොවන පක්ෂ කාර්යාල හැටියට පවතින බවත් 2014.12.08 දින නාමයෝජනා භාර දීමෙන් පසුව එම පක්ෂ කාර්යාල නීත්‍යානුකූල එවා බවට පත් කිරීමට පක්ෂ ලේකම්වරුන්ගේ ඉල්ලීම මත අවසර ලබා දෙන අතර 2014.12.12 දිනෙන් පසු මෙම පක්ෂ කාර්යාලවල නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට කටයුතු කරන බවත් මැතිවරණ කොමසාරිස් එහිදීපෙන්වා දෙන ලදී. එමෙන්ම ජනාධිපති අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත් වීම සඳහා ඇප මුදල් තැන්පත් කරන ලද අපේක්ෂකයින් හට ඔවුනගේ නියෝජිතයින් පත් කිරීම සඳහා නිසි අයදුම්පත්‍රයක් ලබා දීමට පියවර ගෙන ඇති බව ද ඒවා ඒ ඒ දිස්ත්‍රික්කයට අවශ්‍ය ප්‍රමාණයෙන් නිකුත් කරනු ලබන බවත් 2014.12.08 දින පස්වරු 2.00 න් පසුව මෙවා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබා ගැනීමට අපේක්ෂකයින් හට හැකිවන බවත් දන්වන ලදී.

08. මැතිවරණ ආශ්‍රිත අක්‍රමිකතා වලක්වාලීමට සහ නීති උල්ලංඝනය වීම් වලක්වාලීමට මැතිවරණ කොමසාරිස් විසින් නිසි පියවර නොගන්නේ යැයි ඇතැම් පාර්ශ්ව විසින් ප්‍රකාශ කරනු ලබන අතර මැතිවරණ නීති බලාත්මක කිරීම/ සුරැකීම උදෙසා සහ සිදුවන අක්‍රමිකතා අවම කිරීම/ වලක්වාලීම උදෙසා තමන් විසින් මේ වන විටත් බොහෝ ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වවල දැනගැනීම සඳහා අවශ්‍ය නම් මෙම ක්‍රියාමාර්ග/ උපදෙස්/ නියෝග සම්බන්ධ තොරතුරු සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වගකීම් සහිත පාර්ශ්ව කවරේද යන්නත් සංක්ෂිප්ත වශයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හරහා ප්‍රසිද්ධ කිරීමට හැකියාව පවතින බව ද මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ඒ සම්බන්ධයෙන් සභාවේ අදහස් ද මේ අවස්ථාවේදී විමසා සිටින ලදී.

09. සමුපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස) වෙත නව රථ වාහන 93 ක් මිල දී ගෙන ඒවා භාවිතයෙන් ග්‍රාමීය ප්‍රදේශවල අඩු මිලට භාණ්ඩ අලවි කරනු ලබන බවත් එහෙත් එම වාහනවල වත්මන් ජනාධිපතිතුමන්ගේ දැවැන්ත පින්තූර ප්‍රදර්ශනය කරනු ලබන බවත් මේවා ඉතා නීති විරෝධී කටයුතු වන බවත් දයා පැල්පොල මහතා මේ අවස්ථාවේ දී ගැටළුවක් නගමින් පෙන්වා දෙන ලදී.

එහි දී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බවත් අදාළ වාහන උපයෝගී කොට ගෙන අඩු මුදලට භාණ්ඩ අලවි කරන්නේ නමුදු ඒවා භාවිතයෙන් අපේක්ෂක ප්‍රචාරක කටයුතු ඉටු නොකළ යුතු බවත් වෙළඳ අමාත්‍යාංශයෙහි ලේකම් ජී.කේ.ඩී.අමරවර්ධන මහතා වෙත මේ සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දීමට සටහන් කරගනු ලබන බවත් ය.

10. දිවයිනේ බොහෝ ස්ථානවල ඩිජිටල් පුවරු භාවිතයෙන් ජනාධිපති අපේක්ෂකයකු වන වත්මන් ජනාධිපතිතුමන් ප්‍රචර්ධනය වන ආකාරයට දැන්වීම්/ ප්‍රවෘත්ති ප්‍රදර්ශනය කරනු ලබන බවත් නියෝජිතයකු විසින් මෙහිදී පෙන්වා දෙන ලදුව මැතිවරණ කොමසාරිස් එහිදී අවධාරණය කරන ලද්දේ මෙම ඩිජිටල් පුවරු භාවිතයෙන් ස්වකීය දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට ඕනෑම ආයතනයකට හැකියාව පවතින නමුත් ඒ හරහා දේශපාලන පක්ෂවල දැන්වීම්/ ප්‍රවෘත්ති සහ අපේක්ෂක රුව දර්ශනය කිරීම සපුරා තහනම් වන බවත්ය.මෙවැනි ක්‍රියා සිදු කිරීම මැතිවරණ නීතිය කෙරෙහි ඉතා හානිදායක ආකාරයෙන් බලපාන බවත් අදාළ පාර්ශ්ව විසින් මේවා ඉවත් නොකළ හොත් ඒවා ප්‍රසිද්ධියේ ඉවත් කිරීමට සිදුවන බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස්එමෙන්ම මෙම ඩිජිටල් පුවරු දර්ශනය වන ස්ථාන පිළිබඳව තොරතුරු ඇත්නම් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමට ඕනෑම දේශපාලන පක්ෂයකට හැකි අතර එවිට ඒවා ඉවත් කිරීම සඳහා පොලිසිය වෙත දැන්වීමට කටයුතු කරනු ලබන බව ද ප්‍රකාශ කර සිටින ලදී.

යලිත් අදහස් දක්වමින් ඉන්දික ගාල්ලගේ මහතා ප්‍රකාශ කරන ලද්දේ විදුලි පහන් කණුවල එල්ලා ඇති දැවැන්ත කටවුට් ගමනා ගමන කටයුතුවලට මහත් හිරිහැරයක් වන බවත් මැතිවරණ කොමසාරිස් නොව මේවා ඉවත් කිරීමට පොලිසිය විසින් කටයුතු කළ යුතුව ඇති බවයි. පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් ප්‍රකාශ කරනු ලබන්නේමේවා ඉවත් කිරීමට පොලිසිය වෙත බලයක් නොවන බව වන අතර එම ප්‍රකාශයට අභියෝග කරමින්, එම බලය ජාතික මංමාවත් පනත යටතේ පොලිසිය සතු වන බව පෙන්වා දීමට කිසිදු පාර්ශ්වයක් විසින් ක්‍රියා කර නොමැති බවත් එහෙත් මැතිවරණ කොමසාරිස් වශයෙන් තමන් මේ බව කොළඹ හා කෝට්ටේ මහනගර සභා වෙත හා සෙසු පළාත් පාලන ආයතන වෙත දන්වා ඇති බවත් සහ නීතීඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය මහතා ද මෙම කටවුට් ඉවත් කළ යුතු බව මහ නගර සභා වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇති බව වාර්තා වන බවත් මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී. කෙසේ වුවද 2014.12.08 දින වන විට අදාළ පාර්ශ්ව විසින් මෙම කටවුට් ඉවත් කිරීමට කටයුතු කරන බව තමන් ප්‍රකාශ කර ඇතැයි මැතිවරණ කොමසාරිස් දැන්වීය. ඉහත කී පරිදිම මැතිවරණ කොමසාරිස් වශයෙන් මේවා ඉවත් කිරීම සඳහා තමන් හට බලය හිමි වන්නේ නාමයෝජනා දිනෙන් පසු වන අතර කෙසේ වුවද ජනාධිපති අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමේ ස්වකීය අභිලාශය යම් පාර්ශ්වයක් විසින් දැනුම් දීමෙන් පසුව මෙම කටවුට් ප්‍රදර්ශනය කිරීම සුදුසු නොවන බවත් එමෙන්ම ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසුව යම් අපේක්ෂකයකු පැහැදිලි අපේක්ෂකයකු (Obvious Candidate) වන බවත් සිදු කළ යුතු ක්‍රියා සහ නොකර හැරිය යුතු ක්‍රියා කවරේද යන්න සම්බන්ධයෙන් සියලු අපේක්ෂකයින් මේ වන විටත් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව ද තවදුරටත් දන්වන ලදී. එමෙන්ම 2014.12.07 දින මධ්‍යම රාත්‍රියෙන් පසු වැලිකඩ හන්දියේ සිට රාජගිරිය හන්දිය දක්වා වූ ප්‍රචාරක පුවරු ඉවත් කරවීමට තමා ක්‍රියා කරන බව ද මැතිවරණ කොමසාරිස් දැන්වීය.

මෙවැනිඅනවසර ප්‍රදර්ශනය කිරීමේ ක්‍රියා දිගින් දිගටම සිදු වන්නේ නම් එය නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධාවක් බව තමන් විසින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරනු ලබන බවත් අදාළ සියලු පාර්ශ්ව වෙත මේ වන විටත් දන්වා ඇති අතර ආණ්ඩු සුරැකීම හෝ ආණ්ඩු පෙරළීම වෙනුවෙන් මැතිවරණ කොමසාරිස් වශයෙන් තමන් පෙනී නොසිටින බවත් ‘‘රාජ්‍යය’’ යන්න සුරැකීම උදෙසා දිවි හිමියෙන් කටයුතු කරනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී අවධාරණයෙන් යුතුව ප්‍රකාශ කරන ලදී.

11. 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංක සටහන් වී නොමැති ඡන්ද දායකයින් හට ජාතික හැඳුනුම්පත් හෝ වෙනත් වලංගු හැඳුනුම්පතක් ලබා ගැනීම උදෙසා සොයා බලා කටයුතු කරන ලෙස

පසුගිය සාකච්ඡාවලදී අදාළ පාර්ශ්ව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබූ අතර එහිදී ඇතැම් දේශපාලනඥයින් විසින් ජංගම සේවා පැවැත්වීමට උත්සාහ කළ අතර ඒවා නවත්වාලීමට ක්‍රියා කිරීමට සිදුවූ බවද මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් මැතිවරණ සමයේ දේශපාලන පක්ෂවල හෝ ආණ්ඩුවේ මුලිකත්වයෙන් ජංගම සේවා පැවැත්වීම නුසුදුසු වන බැවින් එහිදී ඇති විය හැකිගැටුම් වලක්වාලීම සඳහා එසේ ක්‍රියා කළ බව ද දැන්වීය.

12. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රැස්වීම් පැවැත්වීමට ක්‍රීඩාභූමි/ පිට්ටනි වෙන්කිරීම ආශ්‍රිත පැමිණිලි දෙකක් මේ වන විටත් ලැබී ඇති අතර කොළඹ නගර සභා ක්‍රීඩාංගනය මැතිවරණ ප්‍රචාරණයට අදාළ නොවන කටයුත්තක් වෙනුවෙන් වුවද වෙන් කර ගැනීමට හැකියාවක් ජාතික හෙළ උරුමයේ සභාපති අතුරලියේ රතන හිමි හට අවස්ථාව නොලැබීම ඉතා කණගාටුවට කරුණක් වන බව ද මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී. ජාතික හෙළ උරුමයේ නියෝජිත උදය ගම්මන්පිල මහතා එහිදී ප්‍රකාශ කර සිටියේ එම ගැටළුකාරී තත්ත්වය පැනනඟින ලද්දේ මැතිවරණයට අදාළ ක්‍රියාදාමයකදී නොවූ නිසාවෙන් මැතිවරණ කොමසාරිස් වෙත ඒ පිළිබඳව පැමිණිලි කිරීමට තම පක්ෂය විසින් කටයුතු නොකරන ලද බවයි. මැතිවරණ කොමසාරිස් එහිදී දන්වා සිටින ලද්දේ දිගින් දිගටම මෙවැනි දෑ සිදු වන්නේ නම්, කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කිරීමට ඕනෑම පාර්ශ්වයක්හට හැකියාව පවතින බවයි.

මෙහිදී අපේ ජාතික පෙරමුණෙහි සභාපති සේනක ද සිල්වා මහතා විසින් කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින ලද්දේ අසාධාරණ අයුරින් ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කර තබා ගැනීම් වළක්වාලීමට ස්වකීය පක්ෂය විසින් හැකි සෑම උත්සාහක්ම දරනු ලබන බවත් එසේ වුවද ක්‍රීඩා භූමි/ පිට්ටනි තබා කුඩා හෝටල් ශාලාවක් හෝ තම පක්ෂයට වෙන් කර ගැනීමට මේ වන විටත් අපහසු වී ඇති බවයි.ක්‍රීඩා භූමි / පිට්ටනි සහ ශාලා ආදිය සාධාරණ හේතුවකින් තොරව වෙන් කර ගැනීමට ඉඩ නොදෙන ස්ථානවල ඒවා මැතිවරණ දෙපාර්තමේන්තුව යටතට පවරා ගැනීමට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලන බව මෙහිදී දන්වා සිටින ලද මැතිවරණ කොමසාරිස් හෙට දිනයේ එනම් 2014.12.06 දින පැවැත්වීමට කටයුතු යොදා ඇති සාකච්ඡාවේදී මේ සම්බන්ධයෙන් වැඩි දුර සාකච්ඡාවට බඳුන් කිරීම වඩාත් සුදුසු වන බව මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.තවද මෙම රැස්වීමේදී විශේෂයෙන්ම නාමයෝජනා දිනයේදී යොදනු ලබන ආරක්ෂක වැඩ පිළිවෙල සහ රථවාහන වැඩ පිළිවෙල සම්බන්ධයෙන් පැහැදිලි කෙරෙන අතර යම් ගැටළු වෙතොත් එහිදී ඉදිරිපත් කිරීමට ද හැකියාව උදා වෙන බැව් පහදන ලදී. අදාළ සාකච්ඡා 2014.12.06 දින පෙ.ව 10.30 ට නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ සමඟ ද පෙ.ව 11.30 ට එක්සත් ජනතා නිදහස් සන්ධානය සමඟ ද ප.ව 12.30 ට සෙසු සියලුම පක්ෂ සමඟ ද පැවත්වීමට යෝජනා වූ බැව් ද මැතිවරණ කොමසාරිස් මෙහිදී පෙන්වා දෙන ලදී. ක්‍රීඩා භූමි/ පිට්ටනි ආදිය වෙන් කිරීම මෙන්ම වෙනත් කරුණු සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව ද මෙම සාකච්ඡාවලදී අවධානය යොමු කළ හැකි බවත් සියලු ගැටළු සාකච්ඡා සම්මුතියෙන් සහ එකඟතාවෙන් යුතුව විසඳා ගැනීම නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම උදෙසා වඩා වැදගත් වන බවත් පෙන්වා දෙන ලදී.

තවද ජනාධිපතිවරයා සහභාගී වනු ලබන රැස්වීම් දින සහ ස්ථාන ආදී තොරතුරු ඇතුළත් කාලසටහනක් කල් වේලා ඇතිව මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත යෙමු කිරීමට හැක්කේ නම් සෙසු අපේක්ෂකයින් හට අදාළ දින වලදී එම ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් නොකිරීමට කටයුතු කිරීම සඳහා වඩාත් වැදගත් වනු ඇති බව ද මෙහිදී පෙන්වා දෙනලදී.

13. අනතුරුව පොලිස් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද ස්ථාන මාරු වීම් කෙරෙහි සිය අවධානය යොමු කරමින් මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලද්දේ 2014.11.19 දිනට පෙරාතුව සිදුවූ ස්ථාන මාරු වීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට හැකියාවක් නොවන නමුත් ඉදිරියේදී කිසිඳු ආකාරයක ස්ථාන මාරුවීමක් සිදු කිරීමට ඉඩ නොතබන බවත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් මත සිදු කරන පොලිස් ස්ථානාධිපති තනතුරුවල ස්ථාන මාරු ද අත්හිටුවා ඇති බවයි.

එමෙන්ම පොලිස් ස්ථානාධිපතිවරුන් ස්ථාන මාරු කර යවා ඇත්තේ නම් එම නිලධාරීන් කලින් අනුයුක්ත කර සිටින ලද්දේ කුමන ස්ථානයටද යන්න සහ නව අනුයුක්ත කිරීම සිදු කර ඇතිතේ කවර ස්ථාන සඳහා ද යන්න සම්බන්ධ තොරතුරු ලබා දෙන ලෙස පොලිස්පතිවරයා වෙතින් ඉල්ලීම් කර ඇති බවත් ඒ

තොරතුරු ලද වහාම අවශ්‍ය පාර්ශ්වවල දැනගැනීම සඳහා ඉදිරිපත් කළ හැකි බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වන ලදී.

14. මේ අවස්ථාවේදී කරණු පෙන්වා දෙමින් නියෝජිතයකු විසින් විමසා සිටින ලද්දේ අමාත්‍යාංශ ලේකම්වරුන් දේශපාලන වේදිකාවල ප්‍රචාරක කටයුතුවල නියැලීම වලක්වාලීමට මැතිවරණ කොමසාරිස් වශයෙන් මැදිහත් වී ක්‍රියා කළ හැකිද යන්නයි.එහිදී මෑත කාලයේදී ද එවැනි සිදුවීම් වාර්තා වන බවත් පෙන්වා දෙන ලදුව අතර මැතිවරණ කොමසාරිස් එහිදී ප්‍රකාශ කරන ලද්දේ මෙම ගැටළුව අද දින සභාවේදී මතු වූ බව සටහන් තබා ගනු ලබන බවත් එසේම වනවිටත් එවැනි අවස්ථා සඳහා මැතිවරණ කොමසාරිස් වශයෙන් මැදිහත් වී ඇති බවත් ය.

15. මේ අවස්ථාවේදී පැනයක් මතු කරමහින් අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසයෙහි වයි. එල්. එස්. හමීඩ් මහතා පෙන්වා දෙන ලද්දේ ඇතැම් මාධ්‍ය ඉතා අසාධාරණ සහ සදාචාර විරෝධී ආකාරයෙන් ස්වකීය වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන බවයි. එක්තරා මාධ්‍ය නාලිකාවක නියෝජිතයකු වන දේශපාලන පක්ෂයකට සම්බන්ධ මාධ්‍යවේදියකු විසින් තම භාෂණයේ නිදහස අයුතු ලෙස පාවිච්චි කරමින් එක්තරා දේශපාලන වැඩසටහනක් සඳහා ආරාධිතයකු වශයෙන්කැඳවා තිබූ අමාත්‍යවරයා දිගින් දිගටම අපහසුතාවට හා විවේචනයට ලක් වන පරිද්දෙන් ප්‍රශ්න කිරීමටත් කරුණු දැක්වීමටත් කටයුතු කරනු ලැබූ බව යි. මෙම තත්ත්වය සැබැවින්ම මාධ්‍ය අයුතු ලෙස යොදා ගැනීමක් වන අතර මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව ඇති බව ද ඒ මහතා මෙහිදී පෙන්වා දෙන ලදී.

අදාළ දේශපාලන වැඩසටහන හරහා දේශපාලන පක්ෂ අපහසුතාවට පත් කරන්නේ නම් ඒ පිළිබඳව ස්වකීය නොසතුට පළ කර සිටි මැතිවරණ කොමසාරිස් මෙහිදී පැහැදිළි කරන ලද්දේ මේ සම්බන්ධව අදාළ මාධ්‍යවේදියා වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනුලබන බවත් මැතිවරණ කාලපරිච්ඡේදයේදී මාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාධ්‍ය උපමාන අද දින සියලු මාධ්‍ය ආයතන වෙත යොමු කිරීමට ද කටයුතු සළස්වා ඇති බවත් ය.

16. මෙහිදී නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණෙහි ලේකම් ශ්‍යාමිලා පෙරේරා මහත්මිය ප්‍රකාශ කර සිටින ලද්දේ ස්වාධීන රූපවාහිනී සේවයේ (ITN) එක්තරා වැඩසහනක් මඟින් තමන් හට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරමින් සිටිනු ලබන බවත් සිය නාමය සෘජුවම භාවිතා කරමින් අපහාස වන පරිද්දෙන් එම ක්‍රියාවලිය සිදු කරනු ලබන බවත් ය.

එහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටින ලද්දේ මෙම තත්ත්වය සම්බන්ධයෙන් ස්වාධීන රූපවාහිනී සේවයේ සභාපති සමඟ සාකච්ඡා කිරීමට සටහන් කර ගන්නා බවත් මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍ය පියවර ගනු ලබන බවත්ය.

17. අය වැය යෝජනා හරහා සම්මත වූ පරිදි දින 180 ක් නොකඩවා අනියම් පදනම යටතේ සේවයෙහි නියැලි සේවක සේවිකාවන් ස්ථීර කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමට තමන් විසින් ක්‍රියාමාර්ග නොගන්නා බවත්, විශේෂඥ දැනුමැති සහ වෘත්තීය සුදුසුකම් සහිත තනතුරු සඳහා කරනු ලබන බඳවා ගැනීම් සඳහා ද අවසර ලබා දෙන බවත් මැතිවරණකොමසාරිස් දන්වා සිටියේය. එමෙන්ම ඇතැම් තරඟ විභාග ආශ්‍රිතව බඳවා ගනු ලබන පත්වීම් සඳහා ද අවසර ලබා දෙන අතර ඇතැම් බඳවා ගැනීම් ආශ්‍රිතව විවිධ අක්‍රමිකතා සිදු වන බවට වාර්තා වන හෙයින් මාණ්ඩලික නොවන යම් යම් ශ්‍රේණිවල නවක බඳවා ගැනීම්/ පත්කිරීම් අත්හිටුවීමට ද ක්‍රියාකිරීමට සිදු වන බව ද එනම් විභාග දෙපාර්තමේන්තුව සහ වෙනත් වෘත්තීය ආයතන පවතිවනු ලබන තරඟ විභාග හැර සෙසු විභාගද අත්හිටුවීමට කටයුතු කළ යුතුව ඇතැයි ද පහදන ලදී.මෙහිදී යළින් ගැටළුවක් නඟමින් නියෝජිතයකු ප්‍රකාශ කර සිටින ලද්දේ වත්මන්ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් සෞඛ්‍ය සේවයෙහි පත්වීම් පිරිනමන ලද විශාල සංඛ්‍යාවක් සේවයෙන් පහ කරනු ලැබ ඇති බවත්, නැවත ඔවුන් සේවයෙහි අනුයුක්ත කිරීම සිදු වීමට ඉඩ ඇති බව ද ආරංචි මාර්ග ඔස්සේ සැළ වී ඇති බවටතොරතුරු ලැබී ඇති බවත් ය.

යම් හෙයකින් අක්‍රමිකතා සිදු වුව හොත් ඡන්ද විමසීමේ සුජාතභාවයට ඉන් හානි පැමිණිය හැකි බැව් ද අදාළ පාර්ශ්ව වෙත දැනුම් දී ඇති බවත් යම් ආකාරයකින් ඉහත සඳහන් කරන ලද පරිදි ඉවත් කරනු ලැබූ සේවක/ සේවිකාවන් නැවත සේවයෙහි පිහිටුවන්නේ නම් ඒ අවස්ථාව සඳහා වන රැස්වීම්/ උත්සව පැවැත්වීමෙන් තොරව අත්‍යාවශ්‍ය නිලධාරීන් පමණක් සහභාගී වීම සුදුසු බවට අදාළ පාර්ශ්ව වෙත දැන්වීමට කටයුතු කරනු ලබන බවද දන්වා ඇති බව මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

18. ජනාධිපතිවරණයේදී තරඟ නොකළ ද සාකච්ඡා සඳහා සැබෑ ලෙසම දායකත්වයක් ලබා දුන් නිත්‍ය නියෝජිතයින් අදාළ සියලු රැස්වීම් සඳහා කැඳවනු ලබන බවත්, ඒ අතර වාරයේ සාමාන්‍ය රැස්වීම් වාර ද පවත්වාගෙන යනු ලබන බවත් මෙහිදී සභාව වෙත දන්වා සිටි මැතිවරණ කොමසාරිස්එසේ නොවුනහොත් රටෙහි ප්‍රමුඛ විපක්ෂය හට රැස්වීම් සඳහා සහභාගී වීමේ අවස්ථාව අහිමි වී යා හැකි බවත් කෙසේ වුවද තරඟ කරනු ලබන පක්ෂවලට අදාළ රැස්වීම් වෙනම පැවැත්වීමට අපේක්ෂිත බව ද දන්වා සිටින ලදී.

19. මේ අවස්ථාවේදී මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ නිදහස් සේවක සංගමයේ සභාපති විසින් ඩිපෝ කළමණාකාරීත්වය වෙත සේවකයින්ගේ තැපැල් ඡන්දය ලබා ගැනීම සම්බන්ධයෙන් යොමු කරන ලද නීති විරෝධී ලිපියක් සභාව වෙත ගෙන හැර දක්වමින් මෙවන් අක්‍රමිකතාවල ඇති භානිකර භාවය සුරනිමල රාජපක්ෂ මහතා විසින් පෙන්වා දෙනු ලදුව ඒ මහතාගේ ඉල්ලීම පරිදි එහි පිටපත් සියලු පාර්ශ්ව වෙත ලබා දෙන ලදී. සේවකයින්ගේ තැපැල් ඡන්දය අනිවාර්යයෙන්ම ලබා ගැනීම සඳහාඩිපෝ කළමනාකාරීත්වය උපයෝගීකොට ගෙන අදාළ සේවකයින් නිවෙස්වලින් කැඳවාගෙන ඒමේ වැඩ පිළිවෙලක් සම්බන්ධයෙන් එම ලිපියෙහි ඇතුළත් වන බවත් මෙවන් තත්ත්වයක් මින් පෙර කිසිදු අවස්ථාවක ඇතිවී නොමැති බවත් කෙසේ වුවද මධ්‍යම ගමනාගමන මණ්ඩයේ තැපැල් ඡන්ද කටයුතු වෙනුවෙන් මැතිවරණ නිලධාරීන් යෙදවීමට පියවර ගනු ලබන බවත් යම් හෙයකින් එය නිදහස් හා සාධාරණ තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමක් නොවන බැව් ඔප්පු වන විටකදී එම ඡන්ද විමසීම ශූන්‍ය කිරීමටත් කටයුතු කරනු ලබන බව ද මේ පිළිබඳව සාකච්ඡා කිරීමේ දී මැතිවරණ කොමසාරිස් අවධාරණය කර සිටින ලදී.

20. මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා දේශීය මෙන්ම විදේශීය නිරීක්ෂකයින් යෙදවීම සම්බන්ධව කරුණු පෙන්වා දෙමින් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලද්දේ පූර්ව නිරීක්ෂණ කණ්ඩායමක් (Advance Party)මෙරටට එවන ලෙස පොදු රාජ්‍ය මණ්ඩලය වෙත දන්වා ඇති බවත් ඒ අනුව නියෝජිතයින් පස්දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පූර්වයෙන් පැමිණෙනු ඇති බවත්, මැතිවරණය ආසන්නයේ තවත් නියෝජිතයින් පස් දෙනෙකුගෙන් සැදුම් ලත් නිරීක්ෂණ කණ්ඩායමක් දෙවනුව පැමිණෙනු ඇති බවත් ය. ඊට පරිබාහිර වශයෙන් දකුණු ආසියානු මැතිවරණ කළමනාකාරීත්ව ආයතන සංසදය FEMBOSA හා ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංගමය AAEA වෙතින් නිරීක්ෂකයින් 60ක් මෙරටට එවන ලෙස ඉල්ලීම් කර ඇති බවත් දේශීය නිරීක්ෂණ සංවිධානයක් වූ PAFFRAL සංවිධානය විසින් ඔවුන්ගේ නිරීක්ෂකයින් 35 දෙනෙකු මෙරටට ගෙන්වීමට අවසර ඉල්ලා ඇති අතර ඊට අවසර ලබා දෙමින් රාජකාරි මට්ටමින් නිල ලිපියක් නිකුත් කිරීමට කටයුතු කරනුලබන බව ද තව දුරටත් ප්‍රකාශ කර සිටින ලදී.

විදේශීය නිරීක්ෂකයින් මෙරටට ගෙන්වීම සඳහා ඉතා විශාල මුදලක් වැයවන හෙයින් එහෙයින් වඩා වැඩි පිරිසක් එකවර මෙරටට ගෙන්වීම අපහසු කාර්යයක් වන බවත්, මෙවර විදේශීය නිරීක්ෂකයින් සහ සෙසු නිරීක්ෂණ කණ්ඩායම්වලට අමතර වශයෙන් මැතිවරණ නිරීක්ෂකයින් වශයෙන් කටයුතු කිරීමට පාර්ශ්ව කිහිපයක් එනම් විශ්ව විද්‍යාල විද්‍යාර්ථයින්ගේ හා වෘත්තිකයන්ගේ සංවිධානය, ශ්‍රී ලංකා නීතීඥ සංගමය ද මේ සඳහා මැදිහත් වීමට අපේක්ෂිත බව දන්වා ඇති බවත්මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.නිරීක්ෂණ කාර්යය ඡන්ද විමසීම් නිරීක්ෂණය සඳහා පමණක් ලබා දෙන්නේ ද නැතහොත් ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීමට ඉඩ ලබා දෙන්නේ ද සහ ගණන් කිරීමේ ශාලා තුළට නිරීක්ෂකයින් හට ඇතුළුවීමට අවසර ලැබෙන්නේ ද යන්න නියෝජිතයින් විසින් මතු කරන ලද ගැටළුවකට පිළිතුරු සපයමින් ගණන් කිරීමේ ශාලා තුළට නිරීක්ෂකයන් යම් සීමිත සංඛ්‍යාවක් හට ඇතුළු වීමට අවසර ලබා දීමට බලාපොරොත්තු වන බවත් ඒ පිළිබඳව පසුව දැනුම් දෙන බව මැතිවරණ කොමසාරිස් වැඩිදුරටත් දන්වා සිටින ලදී. තවද සමස්ත ඡන්ද ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාව 1,200 ක් පමණ වන අතර එය නිරීක්ෂණයට නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් 300 ක්

පමණ ප්‍රමාණයකට සියලු සංවිධානවලට සාධාරණ ක්‍රමවේදයක් අනුව ඉඩ කඩ සැලසීමට අපේක්ෂා කරන බව ද දැන්වීය. නිරීක්ෂණ සංවිධාන විසින් ඡන්ද ප්‍රකාශ කිරීමේ හෝ ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම හෝ නොකිරීම මත මැතිවරණයේ නිරවද්‍යභාවය රඳා නොපවතින බවත් හුදෙක් විනිවිදභාවය උදෙසා මෙවන් ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන බව ද මැතිවරණ කොමසාරිස් මෙහිදී වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඡන්ද මධ්‍යස්ථාන ගණන් කිරීමේ ශාලා ආදිය සම්බන්ධව වගකීම මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිසැක වශයෙන්ම දරනු ලබන බවත් අක්‍රමිකතා සිදුවන්නේ නම් ඒවා පාලනය කිරීම හෝ වලක්වා ගැනීම සඳහා සියලු පාර්ශ්ව වෙත මෙහිදී වගකීම පැවරෙන බව ද පෙන්වා දෙන ලදී.

21. ශ්‍යාමිලා පෙරේරා මහත්මිය පැනයක් මතු කරමින් විමසා සිටියේ පසුගිය මැතිවරණ/ ඡන්ද විමසීම් අවස්ථා සඳහා යොදා ගැණුනු ඡන්ද පත්‍රිකා (Ballot Papers) විවිධ ස්ථානවල තිබූ බවත් මෙය ගැටළුවකට තුඩු දෙන බවත්ය. එහිදී මැතිවරණ කොමසාරිස් පැහැදිලි කරන ලද්දේ ඒ සම්බන්ධයෙන් කිසිදු අක්‍රමිකතාවක් සිදු වී නොමැති බවට පැහැදිලිවම තමන් සහතික වන බවත් යම් නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුකොට ගෙන අතපසු වීමෙන් සිදුවූ වරදක් නිසාවෙන් අදාළ ඡන්ද පත්‍රිකා මහා මාර්ගයේ සහ ගණන් කිරීමේ ශාලාවක තිබියදී සොයා ගැණුනු අතර ඒවා සියල්ලම ප්‍රකාශිත සහ ගණන් කරන ලද ඒවා වූ බවත් අවශ්‍ය මොහොතක සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා දිස්ත්‍රික් තුනක ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා තමා සන්තකයේ ඉතා සුරැකිව තිබෙන බවත් ය.

මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි අවිශ්වාසය ජනිත වන ආකාරයේ ප්‍රකාශ නිකුත් කිරීමේ අවාසිය මැතිවරණ දෙපාර්තමේන්තුවට, මැතිවරණ කොමසාරිස්ට හෝ රජයට නොවන බව ද ඉන් අවාසි සහගත තත්ත්වයක් උදා වන්නේ අපේක්ෂකයින් හට වන බව ද කිසිදු අවස්ථාවක මැතිවරණ කොමසාරිස් හෝ මැතිවරණ දෙපාර්තමේන්තුව කෙරෙහි අවිශ්වාසයක් ඇතිකර නොගන්නා ලෙස ද දන්වා සිටි මැතිවරණ කොමසාරිස් යම් ගැටළුවක් වෙතොත් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් අනුගමනය කිරීම මිස ඒවා ප්‍රසිද්ධියේ විවේචනය කරමින් රටේ මහජනතාවගේ විශ්වාසය පළුදු වන ආකාරයෙන් කටයුතු නොකරන ලෙස ද සියලු පාර්ශ්ව වෙතින් ඉල්ලා සිටින ලදී. හැකියාවක් පවතින්නේ නම් විවිධ වෙබ් අඩවි හරහා විවේචන එල්ල කරන පාර්ශ්ව ද මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටින ලදී.

22. මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයෙහි නියෝජිතසුරනිමල රාජපක්ෂ මහතා විමසා සිටියේ මැතිවරණ සමයේ දී ආණ්ඩුවේ පාක්ෂිකයන් විසින් සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳව ගතහැකි ක්‍රියාමාර්ග කවරේද යන්නයි. එහිදී කරුණු දක්වමින් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලද්දේ එය කාලීන ප්‍රශ්නයක් වශයෙන් සටහන් කර ගනු ලබන බවත් මේ සම්බන්ධයෙන් මේ වන විටත් පොලිසිය වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කර ඇති බවත් ය. තවද මාවතගම සහ බේරුවල සිදු වූ කණගාටුදායක සිදුවීම් කෙරෙහි සභාවේ අවධානය යොමු කරමින් පෙන්වා දෙන ලද්දේ මෙම සිදුවීම් පැහැදිලිවම පොලිසිය විසින් වලක්වා ගත හැකිව තිබූ සිදුවීම් බව පෙනී යන බවත් විශේෂයෙන්ම මාවතගම සිදුවූ සිදුවීමේ දී ඊට සම්බන්ධ ප්‍රධාන සැකකරු පැහැදිලිවම හඳුනාගත හැකිව තිබියදීත් ඔහු අත්අඩංගුවට ගැනීමට පොලිසියට නොහැකි වීම ඉතා පුදුමයට කරුණක් වන බවත් මේ සම්බන්ධයෙන් පොලිසිය වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත් අවධාරණය කරන ලදී. තවද මේ සම්බන්ධ කරුණු පැහැදිලි කිරීමක් එවන ලෙස අද දින ද පොලිසිය වෙත නැවත දැන්වීමක් යොමු කිරීමට නියමිත බවත් ප්‍රකාශ කර සිටින ලදී.

23. ඉදිරියේ දී පැවැත්වෙන නිත්‍ය නියෝජිත රැස්වීම් සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ද, නියෝජ්‍ය පොලිස්පති (නීති) ගාමිණී දිසානායක මහතා ද කැඳවීමත් රැස්වීම්වලදී පොදු එකඟතාවලට පැමිණිය හැකි නම් වඩාත් සුදුසු වන බවත් මැතිවරණ කොමසාරිස් දැන්වූ අතර කෙසේ වුවද ජනාධිපතිධුර අපෙක්ෂකයන්/ ඡන්ද නියෝජිතයන්/ ලේකම්වරුන් සඳහා කැඳවන රැස්වීම්වලට හා සෙසු රැස්වීම්වලට සහභාගීවන්නන් විනයවත් ආකාරයෙන් සහ පාලනයෙන් යුතුව ස්වකීය අදහස් සහ ගැටළු එහිදී ඉදිරිපත් කළ යුතු බවත් දන්වා සිටින ලදී.

24. 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය අඩංගුසංයුක්ත තැටි (CD) නිකුත් කරනු ලබන්නේ අපේක්ෂකයින් හට වන බවත් ජනාධිපතිවරණය සඳහා තරඟ නොකළ ද ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන සඳහා සක්‍රීය දායකත්වයක් දැක්වූ බැවින් එක්සත් ජාතික පක්ෂය වෙත ද මේවා නිකුත් කිරීමට හැකියාව පවතින බව ද මෙහිදී මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලදී.

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය ඉතා යහපත් ආකාරයෙන් පැවැත්වීම සඳහා සියලු පාර්ශ්ව වගකීමෙන් හා උනන්දුවෙන් යුතුව කටයුතු කරනු ඇතැයි තමන්ගේ විශ්වාසය වන බවත් නිත්‍ය නියෝජිතයන්ගේ සහාය තමන්ට සුපුරුදු පරිදි ලැබෙනු ඇතැයි නිසැකව දන්නා බවත් මෙහිදී සඳහන් කර සිටි මැතිවරණ කොමසාරිස් වෙනත් ගැටළු හෝ යොමු කළ යුතු කරුණු ඇත්නම් ඉදිරිපත් කරන ලෙස සභාව වෙත කාල වේලාව ලබා දුන් අතර එවැන්නක් නොමැති බැව් පෙනී ගියෙන් අද දින සහභාගීත්වය දැක්වූ සැමට ස්වකීය ස්තුතිය නැවතත් පලකර සිටිමින් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1650 ට අවසන් කරන ලදී.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

ජනාධිපතිවරණය - 2015
තරග කරනු ලබන අපේක්ෂකයින් / නියෝජිතයින් සමඟ
පවත්වන ලද සාකච්ඡාව - 2014.12.12

තරඟ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟමැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්.

සහභාගීත්වය :

1. ඇස්.වී.සී. ඇලෙක්සැන්ඩර් මහතා	-	ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
2. ශාන්ත හේරත් මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
3. ශලීල මූණසිංහ මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
4. නාමල් රාජපක්ෂ මහතා	-	අපේ ජාතික පෙරමුණ
5. සරත් මනමේන්ද්‍ර මහතා	-	නව සිහළ උරුමය
6. රුවන් තිලක පේදුරු ආරච්චි මහතා	-	එක්සත් ලංකා පොදුජන පක්ෂය
7. එම්.එස්.එම්. කබීර් මහතා	-	ජනාධිපති අපේක්ෂක අයිදුරුස් මොහමඩ් ඉල්ලියාස් මහතාගේ නියෝජිත
8. සිරිතුංග ජයසූරිය මහතා	-	එක්සත් සමාජවාදී පක්ෂය
9. ඩබ්.ඒ. සුනිල් මහතා	-	සමාජවාදී සමානතා පක්ෂය
10. සේපාලිකා ගමගේ වීරසිංහ මහත්මිය	-	ජනසෙත පෙරමුණ
11. ජයන්ත කුලතුංග මහතා	-	එක්සත් ලංකා මහාසභා පක්ෂය
12. සරත් අතුකෝරාල මහතා	-	කඳුරට ජනතා පෙරමුණ
13. දසුන් නාගස්ගේන මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
14. සේනාධීර ගුණතිලක මහතා	-	පෙරටුගාමී සමාජවාදී පක්ෂය
15. එස්.එම්. ක්‍රිශාන්ත ප්‍රියදර්ශන මහතා	-	පෙරටුගාමී සමාජවාදී පක්ෂය
16. රවී කරුණානායක මහතා	-	එක්සත් ජාතික පක්ෂය
17. විජයදාස රාජපක්ෂ මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
18. කේ. රස්මාන් මහතා	-	එක්සත් සාම පෙරමුණ
19. අයි. මිෆ්ලාර් මහතා	-	එක්සත් සාම පෙරමුණ
20. බී.ජේ. නස්මුල්ලා මහතා	-	ජනාධිපති අපේක්ෂක අයිදුරුස් මොහමඩ් ඉල්ලියාස් මහතාගේ නියෝජිත

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන්

1. ගාමිණි නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති(පරිපාලන/මැතිවරණ)
2. ගාමිණි දිසානායක මහතා	-	නියෝජ්‍ය පොලිස්පති (නීති)

මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන්

1. යූ. අමරදාස මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2. ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
3. එම්.එම්. මොහමඩ් මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)

(සාකච්ඡාව අතරතුරදී සහභාගීත්වය)

සුසිල් ප්‍රේම්ජයන්ත් මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1635 ට ආරම්භ වූ අතර අද දින සහභාගී වී සිටින සියලු පාර්ශ්ව මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලදී.

02. 2015.01.08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා තරඟ කරනු ලබන අපේක්ෂකයින්/ ඔවුනගේ නියෝජිතයින් අද දින සාකච්ඡාව සඳහා කැඳවා ඇති බවත් චත්මන් ජනාධිපති, ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතා නියෝජනය කිරීම සඳහා නියෝජිතයකු වශයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් මහතා අද දින සහභාගී වන්නේදැයි එක්සත් ජනතා නිදහස් සන්ධානයේහි නියෝජිතයකු ලෙස සහභාගී වී සිටි ශාන්ත හේරත් මහතා විසින් මැතිවරණ කොමසාරිස් විමසා සිටි අතර මෙම සාකච්ඡාවේදී චත්මන් ජනාධිපතිතුමා නියෝජනය කිරීම සඳහා කිසිවෙකු සහභාගීවී නොමැති බව සුසිල් ප්‍රේමජයන්ත් මහතා වෙත දැනුම් දෙන ලෙස ද මෙහිදී ශාන්ත හේරත් මහතා වෙත දන්වන ලදී. එහිදී ශාන්ත හේරත් මහතා විසින් ප්‍රකාශ කර සිටින ලද්දේ ජනාධිපති අපේක්ෂක චත්මන් ජනාධිපතිතුමා නියෝජනය කිරීම සඳහා පත් කොට ඇත්තේ සුසිල් ප්‍රේමජයන්ත් මහතා වන අතර අද දින නොවැළැක්විය හැකි රාජකාරි කටයුත්තක් පැවතීම හේතුවෙන් එතුමා නියෝජනය කිරීම සඳහා මෙම රැස්වීම සඳහා සහභාගී වන ලෙස තමන්හට එතුමා විසින් දන්වා ඇති බවය.

මෙහිදී මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලද්දේ එසේ පත් කරන ලද ලිපිය ශාන්ත හේරත් මහතා සතු වුවද ජනාධිපතිතුමා නියෝජනය කිරීම සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් නියෝජිතයකු පත් කළ යුතුව ඇති බවත් පක්ෂයේ ලේකම් සහ ඡන්ද නියෝජිතයා මෙන්ම තවත් එක් නියෝජිතයකු පත් කිරීමට හැකියාව පවතින බවත්ය. එමෙන්ම අද දින මෙම රැස්වීම පැවැත්වෙන බව සියලු අපේක්ෂකයින් වෙත ලිඛිතව ද වාචිකව ද දන්වා ඇති බවත් එමෙන්ම සුසිල් ප්‍රේමජයන්ත් මහතා ද දැනුවත් කර ඇති බවත් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් සුසිල් ප්‍රේමජයන්ත් මහතා ප්‍රමාදවී හෝ පැමිණෙනු ඇතැයි මෙහිදී ප්‍රකාශ කර සිටියේය.

මෙහිදී ශාන්ත හේරත් මහතා නැවතත් ප්‍රකාශ කරන ලද්දේ අද දින හදිසි අවශ්‍යතාවක් පැන නැගුණ බැවින් මෙවැනි තත්ත්වයක් උදාවූ නමුදු ඉදිරියේ එවැන්නක් යළිත් සිදු නොවන බවයි. මෙම සාකච්ඡා සභාවේදී ගනු ලබන තීන්දු තීරණ කිසිඳු පාර්ශ්වයකගේ නොපැමිණීම මත යටපත් නුවූවද සියලුම පාර්ශ්ව මෙවැනි රැස්වීම් සඳහා සහභාගීවන්නේ නම් එය වඩාත් යෝග්‍ය බවද එමෙන්ම යම් අපේක්ෂකයෙකුට වෙනත් අපේක්ෂකයකු වෙනුවෙන් පෙනී සිටීමට හැකියාවක් නොමැති අතර යම් තරඟ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙක් තමන් වෙනුවෙන් තරඟ කළ යුතු බවද මෙහිදී අවධාරණය කර සිටි මැතිවරණ කොමසාරිස් යම් හෙයකින් යම් අපේක්ෂකයෙකු විසින් තමන් වෙනත් අපෙක්ෂකයෙකු වෙනුවෙන් පෙනිසිටින බැව් ප්‍රකාශ කරයි නම් ඔහුහට පක්ෂ කාර්යාල පිහිටුවීම ආදි අයිතිවාසිකම් ලබාදීමට හැකියාවක් නොවන බවත් දන්වන ලදී.

තවද මෙම සාකච්ඡා සභාවේදී විවිධ විවේචන, අදහස්, යෝජනා, චෝදනා මතුවිය හැකි අතර විවිධ කරුණු කාරණා සම්බන්ධව තීන්දු තීරණ ගැනීමට සහ යම් යම් එකඟතාවන්ට පැමිණීමට අවස්ථාව උදාවන බවත් එමෙන්ම මෙම සාකච්ඡාවේදී විවාද වන කරුණු මාධ්‍ය වෙත ලබා දීම සුදුසු නොවන බවත් එසේ විවාද කරනු ලබන්නේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා සියලු පාර්ශ්වවල අවබෝධය, දැනුවත් භාවය හා එකඟතාව ලබා ගැනීම උදෙසා වන බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් තවදුරටත් දන්වා සිටියේය. එසේ වුවද ඇති කරගන්නා එකඟතා තමන් ඉදිරිපත් කළ කරුණු යනාදිය පිළිබඳව සමබර අදහස් ප්‍රකාශ කිරීමට බාධාවක් නැති බව මැතිවරණ කොමසාරිස් දැන්වීය.

03. 2014.12.14 දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා ස්වකීය බලයලත් නියෝජිතයන් පත් කිරීමට අපේක්ෂකයින්හට හැකියාව පවතින බවද ඒවායේ දෘඩ පිටපත (Hard Copy) මැතිවරණ කාර්යාලය වෙත ලබා දිය යුතු බවත් අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට ඒවායේ පිටපත්/ ෆැක්ස් යොමු කළ යුතු බවද කල්වේලා ඇතිව කර ඇති පත්වීම් වලංගු නොවන බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධයෙන් සෑම අපේක්ෂකයෙකුම දැනුවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලද අතර අදාළ දිනයෙන් අනතුරුව කෙරෙන පත්වීම් වලංගු භාවයෙන් තොර සේ සැලකෙන බව ද දැන්වීය. යම් අපේක්ෂයෙකුහට මෙම පත්කිරීම් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් වෙත යැවීමට කාල වේලා ප්‍රමාණවත් නොවේයැයි හැගෙන්නේ නම් එවැනි විටක දී අදාළ දෘඩ පිටපත (Hard Copy) මැතිවරණ මහ ලේකම් කාර්යාලය වෙත භාර දී එහි පිටපතක් ෆැක්ස් මඟින් අදාළ දිස්ත්‍රික් ලේකම් වෙත යැවීමට හැකි බවද එහිදී මැතිවරණ මහ ලේකම් කාර්යාලය වෙත

භාර දෙනු ලබන දෘඩ පිටපත ඉතා කඩිනමින් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කරනු ලබන බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටියේය.

04. තවද අපේක්ෂකයින්ගේ ප්‍රාදේශීය නියෝජිතයින් පත් කිරීම 2014.12.21 දින ඉකුත්වීමට පෙර සිදු කළ යුතු බවත් මේ වන විට අදාළ පත් කිරීම් කර ඇත්තේ ජනාධිපති අපේක්ෂක වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් පමණක් වන හෙයින් ඉදිරියේ දී තැපැල් ඡන්ද නිකුත් කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය සඳහා නිරීක්ෂකයන් එවන ලෙස දන්වා යැවීමට හැක්කේ එම දෙපාර්ශ්වයට පමණක් වන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී පෙන්වා දෙන ලද අතර ඒ ඒ නිකුත් කිරීමේ මධ්‍යස්ථාන වෙත යෙදවිය හැකි නියෝජිතයින් සංඛ්‍යාව කොපමණද යන්න ඡන්ද නියෝජිතයින් ලෙස පත්කර ඇති නියෝජිතයින්ගට ලබා දීමට කටයුතු කරනු ලබන බවත් දන්වා සිටින ලදී. අනතුරුව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා පත් කළ හැකි නියෝජිතයින් සංඛ්‍යාව කවරේද යන්න සභාව වෙත ඉදිරිපත් කර සිටි මැතිවරණ කොමසාරිස් මුලතිව්, මන්නාරම, කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද නිකුත් කිරීම සිදු කළද තැපැල් ඡන්ද පෙට්ටි එහිදී මුද්‍රා නොතබන බවත්කිලිනොච්චි දිස්ත්‍රික්කය යාපනය මැතිවරණ කොට්ඨාසයට අයත් වන බැවින්එම දිස්ත්‍රික්කයේ සලකුණු කළ තැපැල් ඡන්ද පත්‍රිකා යාපනය මැතිවරණ කොට්ඨාසයේ තේරීම්හාර නිලධාරී වෙත යැවෙන බවත් එමෙන්ම මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද සලකුණු කිරීමෙන් අනතුරුව වවුනියා මැතිවරණ කොට්ඨාසයේ තේරීම්හාර නිලධාරී වෙත යොමු කෙරෙන බවත් එහෙයින් මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද ගණන් කිරීමක් සිදු නොවන බවත් මෙහිදී දැන්වීය.

2014.12.23 සහ 24 යන දින තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන බවත් එම ස්ථාන අපේක්ෂකයින්ගේ නියෝජිතයින්ගට නිරීක්ෂණය කිරීමට හැකි බවත් එම නිරීක්ෂකයින් අදාළ බලයලත් නියෝජිතයා විසින් පත් කළ යුතුව ඇති බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දැන්වීය. තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමේ දී මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ ඩිපෝ ආශ්‍රිතව යම් අක්‍රමිකතා සිදු කිරීමට සූදානමක් පවතින බැව් වාර්තා වන හෙයින් ද ලංගම සේවයේ නියුතු සියලු තැපැල් ඡන්ද දායකයින් තැපැල් ඡන්දය සලකුණු කරන ආකාරය පරීක්ෂා කිරීමට එක්තරා වෘත්තිය සමිතියක ප්‍රධානියකු උත්සාහ කරන බව වාර්තාවී ඇති හෙයින්දඒ සම්බන්ධයෙන් විශේෂයෙන් සොයා බලන බවත් එවැනි අක්‍රමිකතා සිදුවීමට කිසිදු ඉඩකඩක් නොතබන අතර එහි තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු සඳහා මැතිවරණ නිලධාරීන් අනුයුක්ත කිරීමට පියවර ගනු ලබන බවත් තවදුරටත් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් අද දින එනම් 2014.12.12 දින මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ සභාපති සමඟ සාකච්ඡා කළ බවත් එම සාකච්ඡාවේ දී එකඟ වූ පරිදි සියලුම ඩිපෝවල සහ බස්රථවල (CTB) ප්‍රදර්ශනය කරනු ලබන කටවුට්/ පෝස්ටර්/ බැනර් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දීමට ද අපේක්ෂා කරනු ලබන බවත් දන්වා සිටින ලදී. එහිදී සුසිල් ප්‍රේමජයන්ත් මහතා පවසා සිටියේ අදාළ වෘත්තිය සමිති ප්‍රධානීගේ ලිපි පිළිබඳව නොසලකා හරින ලෙස අදාළ ඩිපෝවලට දැන්වීමට කටයුතු කරන ලෙස ප්‍රවාහන අමාත්‍යතුමා වෙත දැනුම් දීමට තමන් විසින් පියවර ගන්නා බවයි. එමෙන්ම නිසිලෙස තැපැල් ඡන්දය සලකුණු කිරීම පැවැත්වීමට අවශ්‍ය උපරිම සහාය ලබාදීමට ස්වකීය පාක්ෂිකයන් දැනුවත් කරන බවද සුසිල් ප්‍රේමජයන්ත් මහතා පැවසීය.

මෙහිදී එක්සත් ජාතික පක්ෂයේ නියෝජිත විජයදාස රාජපක්ෂ මහතා පෙන්වාදෙන ලද්දේ මහරගම ඩිපෝව ආශ්‍රිතවද තැපැල් ඡන්දය සලකුණු කිරීමේ අක්‍රමිකතා සිදු වීමට හැකි බැව් තොරතුරු ලැබී ඇති බවත් එනම්, ලකුණු කරනු ලබන තැපැල් ඡන්දය පාලනාධිකාරියට පෙන්වා ලකුණු කළ යුතු බවට විශාල බලපෑමක් එහි සේවකයින් හට එල්ලවන බැවින් මහරගම ඩිපෝවේ තැපැල් ඡන්දය සලකුණු කිරීම මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සිදු කිරීමට හැකිනම් යෝග්‍ය වන බවයි.

නාරාහේන්පිට මධ්‍යම ගමනා ගමන මණ්ඩල මූලස්ථානයේ ද (Head Quarters) මින් පෙර කවරදාක හෝ නොවූ පරිදි සියලුම සේවකයින්ලවා තැපැල් ඡන්ද අයදුම් කරවීමට කටයුතු කර ඇති බවත්, තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දී පාලන අධිකාරියට පෙන්වා සලකුණු කලයුතු බවට බලපෑම් සිදු කරනු ලබන බවට ද තොරතුරු ලැබී ඇති බවත් දැන්වූ මැතිවරණ කොමසාරිස් ඩිපෝ ආශ්‍රිතව තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා මැතිවරණ නිලධාරීන් යෙදවීමට අපේක්ෂිත බවත් යම් හෙයකින් ඡන්දය ප්‍රකාශ කිරීමට බලපෑමක් සිදු වුවහොත් එහි ඡන්දය අත්හිටුවීමට කටයුතු කරනු ලබන බවත් දන්වා සිටින ලදී.ජ්‍යෙෂ්ඨ

නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා මෙහිදී දන්වා සිටියේ සෑම තැපැල් ඡන්ද සලකුණු කිරීමේ මධ්‍යස්ථානයකටම පොලිස් නිලධාරීන් යෙදවීමට ක්‍රියා මාර්ග ගන්නා බවත් මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් හා නියෝග පරිදි සියලු කටයුතු ඉටු කරන අතර කිසිඳු පාර්ශ්වයක් ඒ සම්බන්ධයෙන් සැකයක් හෝ බියක් තබා ගත යුතු නොවන අතර යම් ගැටලුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් දුරකථන මාර්ගයෙන් හෝ දැනුම් දීමට කටයුතු කරන ලෙසත් ඒ අනුව නිසි පියවර ගැනීමට පොලිසිය සැදී පැහැදී සිටින බවත්ය.

මේ අවස්ථාවේදී විජයදාස රාජපක්ෂ මහතා විසින් විමසා සිටියේ හමුදා කඳවුරුවල හා ලංගම සේවකයින් සිය තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමෙන් පසුව ඒවා ගණන් කරන දිනය වනතුරු රඳවා තබනු ලබන්නේ කුමන ස්ථානයකයද යන්නයි. එහිදී මැතිවරණ කොමසාරිස් පිළිතුරු සපයමින් දන්වන ලද්දේ තැපැල් මගින් ලැබෙන ඡන්ද පත්‍රිකා අඩංගු කවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ (කච්චේරිය) ඇති සුරක්ෂිතාගාරයේ තැන්පත් කරන බවත් 2014.12.23/ 24 දින සලකුණු කරන තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු මුද්‍රා තැබූ කවර එදින ම තැපැලට භාරදීමට නියමිත බවත් 2014.12.23 දින හා 2014.12.24 දින තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ පාර්ශ්වහට ඒවා 2014.12.30 වන දින කච්චේරියේ දී සලකුණු කිරීමට හැකියාව පවතින බවත්ය. සලකුණු නොකරන ලද සෙසු තැපැල් ඡන්ද දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඉතිරි වන බවද මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ සියලුම ස්ථාන සඳහා නියෝජිතයින් යෙදවීමට හැකි බව දැන්වූ අතර තැපැල් ඡන්දය ප්‍රකාශ කරන ලද්දේ කවර අපේක්ෂකයාට ද යන්න කිසිවිටකත් අනාවරණය කර ගැනීමට නොහැකි වන බවට ද පොදු මහජනතාව දැනුවත් කරන ලෙස ද මෙහිදී ඉල්ලා සිටියේය.

මුලතිව් ප්‍රදේශයේ තැපැල් ඡන්ද හිමිකරුවන් අතරින් 1200ක ප්‍රමාණයක් සිවිල් ආරක්ෂක ගොවිපල කම්කරුවන් වන අතර ඔවුනගේ තැපැල් ඡන්ද පාලනාධිකාරය වෙත පෙන්වා සලකුණු කිරීමට සිදුවෙතැයි අනියත බියක් පවතින බවට වාර්තා වන බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් එවැන්නකට කිසිඳු විටක ඉඩ නොතබන බවට එම ස්ථාන සඳහා ද මැතිවරණ නිලධාරීන් යෙදවීමට කටයුතු කරනු ලබන බවත් අවධාරණය කර සිටියේය.

05. ජනාධිපතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා විදේශීය නිරීක්ෂණ සංවිධාන කිහිපයකටම ආරාධනා කර සිටින ලද නමුත් යුරෝපා සංගමයෙන් මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා නිරීක්ෂකයන් ගෙන්වීම සම්බන්ධයෙන් තරඟ කරන අපේක්ෂකයින් සිව්දෙනෙකු විසින් කරුණු සහිතව සිය විරෝධතාව ප්‍රකාශ කර ඇති හෙයින් එම සංවිධානය මෙරටට ගෙන්වීමට පියවර නොගන්නා බව මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටියේය. ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරනු ලබන ආසියානුමැතිවරණ බලධාරීන්ගේ සංවිධානය(AAEA), දකුණු ආසියානු මැතිවරණ කළමණාකාරීත්ව සංසදය (FEMBoSA) පොදුරාජ්‍ය මණ්ඩලය වැනි සංවිධානවල නිරීක්ෂකයන් එකඟතාවකින් තොරව මෙරටට ගෙන්වීමට හැකි වුවත් ශ්‍රී ලංකාව සාමාජිකත්වය නොදරන බැවින් යුරෝපා සංගමයේ නිරීක්ෂකයන් මෙරටට ගෙන්වීමට පොදු එකඟතාවක් අවශ්‍ය හෙයින් අපේක්ෂකයින්ගේ විරෝධතාව සලකා බලමින් එම සංවිධානය වෙත ආරාධනා නොකළ බැව් ද දැන්වීය. එහෙත් එම සංවිධානයේ තානාපතිවරුන් ඉල්ලා සිටියහොත් ඡන්ද මධ්‍යස්ථාන හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ඇතුළුවීම හැර සාමාන්‍ය පරිදි ජංගම නිරීක්ෂණ කටයුතු ඉටුකිරීමට යුරෝපීය සංගමයේ තනාපතිවරුන් වෙත අවසර දීමට සලකා බලන බවද තවදුරටත් පැහැදිලි කර සිටියේය.

ඡන්ද ගණන් කරනු ලබන මධ්‍යස්ථානවලට යම් සීමිත ප්‍රමාණයක් නිරීක්ෂකයින්හට නිරීක්ෂණය සඳහා සහභාගී වීමට ඉඩ දිය හැකි වුවත් ඡන්ද ගණන් කිරීමේ කටයුතුවලදී එහි නිරවද්‍යතාව වෙනුවෙන් කිසිඳු නිරීක්ෂණ සංවිධානයක සහතිකය අවශ්‍ය නොවන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී අවධාරණය කරන ලද අතර එහිදීප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් ගණන් කිරීමේ ක්‍රියාවලිය අවසානයේ දී නිකුත් කරනු ලබන ප්‍රතිඵලය කෙරෙහි නියෝජිතයන් එකඟ නොවුවහොත් නියෝජිතයන්ගේ ඉල්ලීම පරිදි දෙවතාවක උපරිමයකට යටත්ව නැවත ගණන් කිරීමක් සිදු කරන බවත් එසේ නොවන්නේනම් එය අවසාන ප්‍රතිඵලය ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බවත් නිරීක්ෂණ සංවිධානවලට ගණන් කිරීමේ ශාලා තුළට ඇතුළු වීමට අවස්ථාව ලබා දෙන්නේ නෛතික බලයක් මත නොවන අතර හුදෙක් මැතිවරණයේ විනිවිදභාවය උදෙසා වන බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.යම් ගණන් කිරීමේ ශාලාවක ප්‍රතිඵලය පළමු වන ස්ථානය හා දෙවන ස්ථානය අතර වෙනස කුඩා සංඛ්‍යාවක් නම් හෝ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීට අවශ්‍ය යැයි

හැඟේනම් හෝ නියෝජිතයන්ගේ ඉල්ලීමකින් තොරව නැවත ගණන් කිරීම් සිදු කරන ලෙස ද උපදෙස් දී ඇති බව ද මැතිවරණ කොමසාරිස් දැන්වීය. ඡන්ද ගණන් කිරීමේ දී විපක්ෂයට එරෙහිව හෝ අත්හිටුවීමට පක්ෂව කිසිදු හෝ අක්‍රමිකතාවක් සිදු නොවන බවට සහතික වන බවත් එවන් අක්‍රමිකතා සිදුවන්නේ නම් කොළඹ මහනගර සභාව එක්සත් ජාතික පක්ෂය විසින් ජයගැනීමද උතුරු පළාත් සභාව ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂය විසින් ජය ගැනීම ද සිදුවන්නේ කෙසේ දැයි මැතිවරණ කොමසාරිස් විමසා සිටියේය. ගණන් කිරීමේ කටයුතු ආශ්‍රිතව අක්‍රමිකතා සිදු වෙතැයි විවිධ පාර්ශ්ව සහ වෙබ් අඩවි විසින් ප්‍රචාරය කරමින් සිටින නමුත් මැතිවරණ/ ඡන්ද විමසීම් ජයග්‍රහණය තීරණය වන්නේ පොදු මහජනතාව සිය ඡන්දය ප්‍රකාශ කරන අයුරින් පමණක් වන බවත් ජනතාව විසින් ප්‍රකාශිත ඡන්දය හෙවත් කැමැත්ත වෙනස් කිරීමට කිසිවිටක නිලධාරීන් ක්‍රියා නොකරන බවත් ප්‍රකාශ කරන ලදී.

අපේක්ෂකයින්ගේ නියෝජිතයින් ගණන් කිරීමේ ශාලා සඳහා යොදන හෙයින්ද ඔවුන් විසින් ප්‍රතිඵල ලේඛන පවා අත්සන් කරනු ලබන බැවින්ද ගණන් කිරීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාව පිළිබඳව අනියත බියක් හෝ සැකයක් ශේෂ කර නොගන්නා ලෙසත් තවදුරටත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් මතුවන සැකය පොදු මහජනතාව තුළ ශ්‍රී ලංකාවේ ඡන්ද ක්‍රමය පිළිබඳව අවිශ්වාසය ගොඩනගන බවත් මැතිවරණ නීති උල්ලංඝනය කරන්නන් වෙතින් මෙන්ම මැතිවරණ ක්‍රමය කෙරෙහි අවිශ්වාසය ඇති කරන්නන් වෙතින්ද එකසේ මැතිවරණ නීති කඩවන බැවින් එහි අවාසිය සියලු පාර්ශ්ව වෙත අත්වන අතර මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හෝ වෙනත් කිසිදු මැතිවරණ නිලධාරියකු විසින් වංචා හෝ අක්‍රමිකතා සිදු කරතැයි පවතින මානසිකත්වයෙන් අත්මිදීම අත්‍යාවශ්‍ය කටයුත්තක් වන බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.

06. ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ 117 වගන්තිය ප්‍රකාරව මැතිවරණයකදී මාධ්‍ය ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ජාතික රූපවාහිනී සේවය, ගුවන් විදුලි සංස්ථාව වැනි මාධ්‍ය ආයතන වෙත මේවන විටත් දන්වා ඇති බවත් එම නිවේදනයෙහි පිටපත් තරඟ කරන දේශපාලන පක්ෂ වෙත හා පැමිණිලි විමර්ශන කමිටුව වෙත ද යොමු කරන බවට අදාළ ආයතනවල සභාපතිවරුන් වෙත දන්වා යැවීමට අපේක්ෂිත බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලදී.

07. පක්ෂ කාර්යාල පිහිටුවීම සඳහා නිසි අවසරයක් මේ දක්වා කිසිදු පාර්ශ්වයක් විසින් ලබා ගෙන නොමැති වුවද ප්‍රධාන ලෙස කාර්යාල වශයෙන් පෙනී යන ස්ථානවල කටවුට් ඉවත් කිරීමට කටයුතු නොකරන අතර දිවයිනේ විවිධ ප්‍රදේශවල ප්‍රදර්ශනය කරනු ලබන කටවුට් ඉවත් කිරීමට පොලිසිය හරහා නිසි වැඩ පිළිවෙලක් සකස් කොට ඇති බවත් එනම් කම්කරුවන් යොදවා අදාළ පොස්ටර්/ කටවුට් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ඒ සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා විසින් සියලුම රාජ්‍ය නිවේදිත පොලිස් නිලධාරීන් හා ස්ථානාධිපතිවරුන්ට උපදෙස් ලබා දී තිබේ. කුඩා පොලිස් ස්ථාන සඳහා කම්කරුවන් තිදෙනෙකු ද, මධ්‍යම ප්‍රමාණයේ පොලිස් ස්ථාන සඳහා කම්කරුවන් සිව්දෙනෙකු ද විශාල නාගරික ප්‍රදේශවල පිහිටා ඇති පොලිස් ස්ථාන සඳහා කම්කරුවන් පස්දෙනෙකු ද එමෙන්ම පොලිස් අධිකාරීවරයකු හට කම්කරුවන් දෙදෙනෙකු හා සහකාර පොලිස් අධිකාරිවරයකු සඳහා කම්කරුවන් දෙදෙනෙකු ද වශයෙන් අනියම් සේවකයන් බඳවා ගැනීමට අනුමැතිය දී ඇති බවද පොලිසිය මඟින් මෙම නීතිවිරෝධී බැනර්/ කටවුට් ඉවත් කරනු ලබන්නේ කිසිදු බලපෑමකින් තොරව නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වෙන බැව් පොදු මහජනතාවට විද්‍යාමාන විය යුතු බැවින් වන බව දජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

කෙසේවුවද පොලිස් ස්ථාන ද ඇතුළත්ව විවිධ අපේක්ෂකයින්හට තුති පුද කිරීම් සුභ පැතුම් ආදී මුද්‍රිත බැනර්/ කටවුට් රජයේ කාර්යාලවල ප්‍රදර්ශනය කරන අතර මේවා ඉවත් කරවීමට නියෝග නිකුත් කරනු ලබන බවද ඒ සම්බන්ධව සියලු අපේක්ෂකයින් දැනුවත් කිරීමට අපේක්ෂිත බව ද මැතිවරණ කොමසාරිස් මෙහිදී දැන්වීය. තවද මෙවැනි බැනර්/ කටවුට් ආදිය ප්‍රදර්ශනය කර ඇති ස්ථාන පිළිබඳව පැමිණිලි කරන ලෙස ද මැතිවරණ කොමසාරිස් ඉල්ලා සිටින ලදී.

මේ අවස්ථාවේදී ජනාධිපති අපේක්ෂක සිරිතුංග ජයසූරිය මහතා ප්‍රකාශ කර සිටියේ මෙවැනි බැනර්/ කටවුට් දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ දක්නට ලැබෙන බවත් ඒවා ඉතා අශෝභන අයුරින් නීති උල්ලංඝනය කරමින් ප්‍රදර්ශනය කරනු ලබන ඒවා වන බවත් මේවා ඉවත් කිරීම සඳහා විශේෂයෙන් පැමිණිලි කිරීමක් අවශ්‍ය යැයි තමා නොසිතන බවත්ය.

මේ අවස්ථාවේදී පෝස්ටර්/ කටවුට් ඉවත් කිරීම සඳහා පොලිසියට බලයක් නොමැති යැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් කර ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට ලක්වූ අතර එහිදී අදහස් දක්වමින් ජනාධිපති අපෙක්ෂක සිරිතුංග ජයසුරිය මහතා ප්‍රකාශ කරන ලද්දේ පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් මෙවැනි ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම ඉතා කණගාටුවට කරුණක් බවත් රටෙහි ජනාධිපතිවරණයක් පැවැත්වෙන මෙවන් අවස්ථාවක මෙවැනි ප්‍රකාශ නිකුත් කිරීම තුළින් පොලිසිය කෙරෙහි ඇති මහජනයාගේ ගරුත්වයට ද හානි පැමිණෙන බවත්ය. මෙහිදී කරුණු දක්වමින්ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා පෙන්වාදෙන ලද්දේ බැනර්/ කටවුට් ප්‍රදර්ශනය මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් වන බවත් ඒවා ප්‍රදර්ශනය වනතාක් එමඟින් වරදක් සිදුවන අතර එම වරද සම්බන්ධයෙන් නිසැක වශයෙන්ම කටයුතු කළ යුත්තේ පොලිසිය වන බවත්ය. මෙහිදී සභාවේ පොදු එකඟතාව වූයේ එක් නිලධාරියකුගේ ප්‍රකාශයක් හේතුවෙන් සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවම අපකීර්තියට පත්විමට ඉඩකඩ සැලසිය නොහැකි බවත් එහෙයින් පොලිස් මාධ්‍ය ප්‍රකාශකගේ මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඔහු විසින් පැහැදිලි කිරීමක් කළ යුතු බවත්ය. ඒ අනුව මෙවැනි ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් නොකරන ලෙසට පොලිස් මාධ්‍ය ප්‍රකාශක වෙත දන්වා යැවීමට කටයුතු කරන බව මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී.ඒ අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ප්‍රකාශ කරන ලද්දේ නිසැක වශයෙන්ම පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් ස්වකීය ප්‍රකාශය නිවැරදි කළ යුතුව ඇති බවයි.

08. ඩිපෝවල මෙන්ම අධිවේගී මාර්ගයේ ගේට්ටුවල (Tall Gates) ද වත්මන් ජනාධිපතිවරයාගේ ප්‍රවර්ධනයට තුඩු දෙන පෝස්ටර්/ කටවුට් දක්නට ලැබෙන බවත් මෙය අපේක්ෂකයාගේ රුව ප්‍රදර්ශනය කිරීමේ නීතිය යටතේ වරදක් බවත් ඉන්දික ගාල්ලගේ මහතා විසින් ප්‍රකාශ කළ අතර මේ සම්බන්ධයෙන් තවදුරටත් ඉතා විශාල පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති බවත්දිගින් දිකටම සිදු කෙරෙන අනවසර ප්‍රදර්ශන සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්ගේ වාර්තාවට ද ඇතුළත් කිරීමට සිදුවන බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් මේවා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස මෙම බැනර්/ කටවුට් ප්‍රදර්ශනයට ක්‍රියා කළ පාර්ශ්ව වෙත දැනුම් දෙන ලෙස සුසිල් ප්‍රේමජයන්ත් මහතාගෙන්ඉල්ලා සිටින ලදී. එමෙන්ම අධිවේගී මාර්ගය දෙපස පිහිටා ඇති පෞද්ගලික නිවාසවල වත්මන් ජනාධිපතිවරයාගේ කටවුට් ප්‍රදර්ශනය කරනු ලබන බවත් ඒවා මහජනයාට පෙනෙන ලෙස ප්‍රදර්ශනය කිරීම නීති උල්ලංඝනය කිරීමක් වන බවත් පුරවැසියන් කිහිපදෙනෙකු මේ සිද්ධිය ඉතා දැඩි ලෙස හෙලා දකිමින් තමා වෙත පැමිණිලි කළ බවත් මැතිවරණ කොමසාරිස් දැන්වීය. එකී පුවරු ඉවත් කරවන ලෙස මැතිවරණ කොමසාරිස් පොලිස් නිලධාරීන් වෙත දන්වා සිටින ලදී.

09. මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කිරීම සම්බන්ධව ද සාකච්ඡාවේ දී විජයදාස රාජපක්ෂ මහතා මතු කළ පැනයකට පිළිතුරු දෙමින්,විජයදාස රාජපක්ෂ මහතා විසින් මහරගම නගර සභාවට අයත් ක්‍රීඩාංගනය ඉල්ලා සිටි අවස්ථාවේදී ඊට අවසර දෙන ලෙස දන්වා මහරගම නගර සභාව වෙත මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ලිපියක් නිකුත් කර තිබුණ ද එය නොතකා අදාළ ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ජාතික පෙරමුණ සඳහා එනම් ජනාධිපති අපේක්ෂක විමල් ගීගනගේ මහතාගේ රැස්වීමක් වෙනුවෙන් වෙන් කර දීමට මහරගම නගර සභාව කටයුතු කර ඇති බවත් සියලු පාර්ශ්ව වෙත මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සමාන ඉඩකඩ ලැබිය යුතු බවත් ප්‍රචාරක කටයුතු සඳහා අපේක්ෂකයන්ට කිසිදු අවස්ථාවක් ලබා නොදෙන්නේ නම් එම මැතිවරණ කොට්ඨාසයේ ඡන්දය කල් තබන ලෙස තමා වෙත කර ඇති ඉල්ලීම යටපත් කිරීමට අපහසු බව මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කරන ලදී.තවද විමල් ගීගනගේ මහතා ජනාධිපති අපේක්ෂක වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා වෙනුවෙන් පෙනීසිටින බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් විමල් ගීගනගේ මහතා වෙතින් කරුණු විමසන ලෙස සුසිල් ප්‍රේමජයන්ත් මහතාගෙන් ඉල්ලා සිටි මැතිවරණ කොමසාරිස් බියගම, කැළණිය වැනි ප්‍රදේශ ද ඇතුළුව කුරුණෑගල, අනුරාධපුරය, කොත්මලේ, අත්තනගල්ල, කෝට්ටේ, මහරගම, වැල්ලවාය, තිස්ස, තංගල්ල, මුල්කිරිගල සහ කොළඹ නගරයේ මෙම ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කිරීම සම්බන්ධයෙන් දිනපතා ඉතා විශාල පැමිණිලි සංඛ්‍යාවක් වාර්තාවන බවත් මෙහිදී

අවධාරණය කරන ලදී. මෙවැනි තත්ත්වයක් දිගින් දිගටම උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් දැඩි පියවර ගැනීමට සිදුවන බවද එනම් යථාතත්වයට පත්වන තෙක් ඡන්ද විමසීම අඩාලව කල් තැබීමට සිදුවන්නේ යැයි ප්‍රකාශයක් නිකුත් කිරීමට වුව සිදුවිය හැකි බව ද තවදුරටත් දැන්වීය.

එහිදී විජයදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කර සිටියේ මැතිවරණ කොමසාරිස්ගේ ලිපිය ලැබී තිබියදීත් මහරගම නගර සභා පිටිය විමල් ගීගනගේ මහතා වෙත වෙන් කර දීම ඉතා අසාධාරණ ක්‍රියාවක් බවය. මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස් මහරගම නගර සභාවටහා එහි ලේකම්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවත් මෙවැනි අවස්ථාවලදී නිසි ක්‍රියාමාර්ග නොගැනීමෙන් සියලු පාර්ශ්වහට ගැටලු වලට මුහුණ පෑමට සිදුවන අතර රටක නීතියක් පැවතිය යුතු සේම නීති බලාත්මක කිරීමට ද සියලු පාර්ශ්ව වගකීමෙන් කටයුතු කළ යුතුව ඇති බවත් ප්‍රකාශ කළේය. එහිදී සුසිල් ප්‍රේමජයන්ත් මහතා මෙම කරුණ සම්බන්ධයෙන් විමල් ගීගනගේ මහතා දැනුවත් කිරීමට ඉතා ඉක්මණින් කටයුතු කරන බව ප්‍රකාශ කර සිටින ලදී.

රවී කරුණානායක මහතා මෙහිදී ප්‍රකාශ කර සිටියේ සාධාරණ මැතිවරණයක් උදෙසා මැතිවරණ කොමසාරිස් ගන්නා උත්සාහයට ස්තුතිවන්ත වන බවත් එමෙන්ම ප්‍රදර්ශනය කරනු ලබන බැනර්/ කටවුට් පොලිසිය විසින් ඉවත් නොකල හොත් කළ යුත්තේ කුමක්ද යන්නත් විමසා සිටින ලදී. එහිදී මැතිවරණ කොමසාරිස් පැහැදිලි කරන ලද්දේ ඒවා ඉවත් කිරීමට විපක්ෂය ඉදිරිපත් නොවිය යුතු බවත්නීති විරෝධී ලෙස ප්‍රදර්ශනය වන ස්ථාන සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමෙන්තුවට මෙන්ම පොලිස්පතිවරයාටද පැමිණිලි කරන ලෙසත්ය. එමෙන්ම මේ පිළිබඳව අධිකරණයට පැමිණිලි කිරීමට හැකි බව ද මැතිවරණ කොමසාරිස් දැන්වීය.

10. මේ අවස්ථාවේදී කරුණු දක්වමින් සිරිතුංග ජයසූරිය මහතා ප්‍රකාශ කරන ලද්දේ ජාතික රූපවාහිනී සේවය සහ ස්වාධීන රූපවාහිනී සේවය (ITN)ඔස්සේ ජනාධිපතිවරයා සහභාගී වූ අනුරාධපුරයේ දී පවත්වන ලද ජනරැලිය සජීවීව විකාශනය කිරීමට කටයුතු කරන ලද අතර CSN නාලිකාව ඔස්සේ ද මෙය විකාශය වූ බවයි. CSN නාලිකාව පෞද්ගලික නාලිකාවක් වන හෙයින් ඊට මැදිහත් විය නොහැකි වුවද රාජ්‍ය මාධ්‍යයක් ලෙස ජාතික රූපවාහිනිය හා රජයට අයත් සමාගමක් වන ස්වාධීන රූපවාහිනී සේවයේ ක්‍රියාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී.***මෙම ක්‍රියාඡන්ද විමසීමේ සුජාතභාවයට අභියෝගයක් විය හැකි බැවින් මේ සම්බන්ධයෙන් අධිකරණයේ දී විමසීමකට ලක් කරන විටක දී තමා සතුව ඇති තොරතුරු ද සැපයීමට සිදුවන බව*** ද සියලු අපේක්ෂකයින් සහ අපේක්ෂයින් ප්‍රවර්ධනය කරන පාර්ශ්වවලට දැන්වීමටතමා කටයුතු කරන බව ද මැතිවරණ කොමසාරිස් දැන්වීය.

තවද මේ සම්බන්ධව අද දින උදැසන ජනාධිපති නීතිඥ ශ්‍රීනාත් ම. පෙරේරා මහතා, එක්සත් ජාතික පක්ෂයේ නියෝජිත දයා පැල්පොල මහතා ඇතුළු පාර්ශ්ව විසින් තමන් වෙත පැමිණිලි කරන ලද බවත් එමෙන්ම මෙම සාකච්ඡා සභාවේදී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි බවත් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් ඒ අනුව ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන් විදුලි සේවය විසින් මෙම වැඩසටහන මුදල් අය කර ප්‍රචාරය කරන ලද්දේ නම් එම අයකරන ලද මුදල කොපමණද යන්නත් නොමිලයේ විකාශය කරන ලද්දේ නම් සෙසු පාර්ශ්ව හට ද එම අවස්ථාව ලබා දෙන ලෙසත් අදාළ නාලිකාව වෙතින් ඉල්ලා සිටින ලෙසද එමෙන්ම සෙසු අපේක්ෂකයින්ගේ රැස්වීම් ද මේ ආකාරයෙන් මුදල් ගෙවා විකාශනය කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස CSN නාලිකාව වෙතින් ද ඉල්ලා සිටින ලෙස මැතිවරණ කොමසාරිස් මෙහිදී දැන්වීය. එහිදී රවී කරුණානායක මහතා ප්‍රකාශ කර සිටියේ ස්වාධීන රූපවාහිනී සේවය මෙම රැස්වීම කොපමණ මුදලක් අය කර විකාශය කළේද යන්න සම්බන්ධව අද දින පාර්ලිමේන්තුවේ දී තමන් විසින් ප්‍රශ්න කරන ලදුව අමාත්‍යාවරයෙකු ඊට පෙනී නොසිටි අතර මෙම ගැටලුවට පිළිතුරු දීම සඳහා දෙමසක කලක් කල් ඉල්ලා සිටි බවයි.

11. මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සහභාගී වීමට නාගරික සංවර්ධන අධිකාරියේ සේවකයින් හට 2014.12.13 දින පෙ.ව. 9.30ට මරදාන දුම්රිය පොළට රැස්වන ලෙස බල කිරීම් කරනු ලබන බවත් එම බල කිරීම් පැහැර හැරීමට ඔවුන්ට අවකාශ නොවන බවද වාර්තා වන බවත් මෙහිදී රවී කරුණානායක මහතා විසින් දන්වා සිටින ලදී. 2014.12.13 දින රජයේ නිවාඩු දිනයක් වන බැවින් එය නවතාලීමට හැකියාවක් නොවන

බවත් කෙසේ වුවද මෙය පැමිණිල්ලක් ලෙස් ලෙස සටහන් කර ගනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් එහිදී ප්‍රකාශ කරන ලදී.

12. 2014.12.25 දින එනම් නත්තල් දින මාතර ප්‍රදේශයේ ජනාධිපතිතුමන් සහභාගී වනු ලබන ජනරැලියක් අතර තුර ගොවි සංවිධාන රැස්වීමක් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා පාක්ෂිකයන් ගෙන්වා ගැනීමට එක් බස් රථයකට රු. 5000.00ක් බැගින් ගෙවා ලංගම (CTB) බස්රථ 200ක් යෙදවීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කරනු ලබන බවට තොරතුරු වාර්තා වන බවත් මෙහිදී නියෝජිතයකු විසින් දන්වා සිටිනු ලදුව එදිනට පැවැත්වීමට නියමිත කෘෂිකර්ම රැස්වීම වෙනත් දවසක පැවැත්වීමට කටයුතු කරන ලෙසත් මේ පිළිබඳව පැමිණිලි ලැබී ඇති බවත් දන්වමින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස්වරයා මෙහිදී ප්‍රකාශ කර සිටියේය.

13. රජයේ මුද්‍රණාලයේ රහස්‍ය අංශයට නවක සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් රජයේ මුද්‍රණාලයාධිපතිහට ඉතා බරපතල ලෙස චෝදනා එල්ල කරමින් කරුණු දැක්වීමට පිළිතුරු දුන් මැතිවරණ කොමසාරිස් තමා මේ පිළිබඳව විමසා බලන බවත් මානව හිමිකම් කොමිෂන් සභාව ද මේ සම්බන්ධයෙන් රජයේ මුද්‍රණාලයාධිපති විමසා ඇති බවත් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය.

14. මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම සඳහ 2014.12.14 දින වන විට අවසර ලබා ගන්නා ලෙසත් 2014.12.14 දින සිට මෙම කාර්යාල පරීක්ෂා කිරීම ආරම්භ කරන බවත් එමෙන්ම මහා මාර්ගවල ඩිජිටල් තිර හරහා කෙරෙන ප්‍රදර්ශන සපුරා තහනම් වන බවත් මේ වන විට "ආකේඩ්" සුපිරි වෙළඳ සැලෙහි නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ඇති ඩිජිටල් තිරය ඉවත් කරන ලෙස ලැබී ඇති පැමිණිලි පිළිබඳව ක්‍රියා කරන බවත් ඒ පිළිබඳව අදාළ පාර්ශ්ව වෙත දැන්වීමට කටයුතු කරනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලදී.

කාර්යාල පවත්වාගෙන යෑමේ අවසරය බලයලත් නියෝජිතයාහට (දිස්ත්‍රික් කාර්යාලය) මැතිවරණ කටයුතු අවසන් වන තාක්ද ඡන්ද කොට්ඨාසයට එක් අපේක්ෂකයෙකුගේ එකක් වශයෙන් ස්ථාපිත කොට ඇති කාර්යාල 2015.01.06 දින මධ්‍යම රාත්‍රිය දක්වාද ඡන්ද ප්‍රදේශයකට එකක් වශයෙන් පිහිටුවනු ලබන කාර්යාලය 2015.01.07, 08 සහ 09 යන තෙදිනෙහිද ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතින බැව් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් ඡන්ද ප්‍රදේශයේ කාර්යාල ආරම්භයේ සිට ඡන්ද විමසීම අවසානය තෙක් ද පවත්වා ගෙන යෑම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් යොමු වී ඇති බවත් එසේ කළ හැකි නම් අදාළ ඡන්ද ප්‍රදේශයේ යම් පාර්ශ්වයකට ලිපි/ පණිවුඩ ආදිය යොමු කිරීම මෙම කාර්යාල හරහා සිදු කළ හැකි බැවින් ඒය මැතිවරණ දෙපාර්තමේන්තුවට පහසුවක් වන අතර කෙසේ වුවද ඒ සම්බන්ධයෙන් සභාවේ අදහස් ප්‍රකාශ කරන ලෙසත් දන්වා සිටියේය.

එහිදී මේ පිළිබඳව සභාව තුළ සාකච්ඡාවට ලක්වූ අතර ඊට සියලු පාර්ශ්වවල එකඟතාව හිමි විය.

15. ජනාධිපතිවරණයේ පනත ප්‍රකාරව ප්‍රචාරණ ධජ, පතාක සහ පෝස්ටර් ආදිය ප්‍රදර්ශනය කළ හැක්කේ ජනාධිපති අපේක්ෂකයින් ගමන් ගන්නා රථ සහ ඡන්ද නියෝජිතයන් ගමන් ගන්නා රථයේ පමණක් වන අතර බලයලත් නියෝජිතයන් හා ඡන්ද ප්‍රදේශ නියෝජිතයන් විසින් පක්ෂ නායකයින්ගේ සහභාගිත්වයෙන් තොරව ද රැස්වීම් පවා පවත්වනු ලබන බැවින් ඔවුන් ගමන් ගන්නා රථ සඳහා ද මෙම නීත්‍යානුකූල අවසරය ලබා දීමට හැකි නම් සුදුසු යැයි පෙනී යන බවත් කෙසේ වුවද මේ සම්බන්ධයෙන් සියල්ලන්ගේ එකඟතාව ලැබිය යුතු බවත් ඒ සම්බන්ධයෙන් දරන අදහස් කවරේද යන්නත් මැතිවරණ කොමසාරිස් විසින් සභාවෙන් විමසා සිටින ලදී. එහිදී රවී කරුණානායක මහතා ප්‍රකාශ කර සිටියේ එවැනි අවස්ථාවක් ලබා දුන හොත් යම් වියවුලකට පත් විය හැකි බවයි. එමෙන්ම සිරිතුංග ජයසූරිය මහතා ද ප්‍රකාශ කර සිටියේ මෙම අවසරය දිස්ත්‍රික් මට්ටමින් පැවතීම ප්‍රමාණවත් වන බවත් එනම් දිස්ත්‍රික් නියෝජිතයාට පමණක් මෙම අවසරය තිබිය යුතු බවත්ය.

මෙහි අවසාන නිගමනය වූයේ මෙම නීතිය ලිහිල් කිරීමකින් තොරව තවදුරටත් පවතින මට්ටමින් ම ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වන බවයි.

16. රවී කරුණානායක මහතා අදහස් දක්වමින් ඡන්ද මධ්‍යස්ථාන වෙතින් ගණන් කිරීමේ ශාලා වෙත ඡන්ද පෙට්ටි ගෙන යනු ලබන බස් රථවලට අපේක්ෂකයින්ගේ නියෝජිතයින් යෙදවීමට හැකියාවක් පවතින්නේ ද යනුවෙන් විමසන ලදී. එහිදී මැතිවරණ කොමසාරිස් කරුණු දක්වමින් කිසිදු අවස්ථාවක ඡන්ද පෙට්ටි ප්‍රවාහනය ආශ්‍රිතව වංචා, අක්‍රමිකතා සිදු නොවන බවත් එම ඡන්ද පෙට්ටි, ව්‍යවස්ථාපිතව පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් විසින් ගෙන එනු ලබන බවත් ඔවුන් ගෞරවනීය සේවයක් ඉටු කරන රාජ්‍ය සේවකයින් වන අතර කිසිදු පාර්ශ්වයකගේ ජයග්‍රහණය හෝ පරාජය සිදු කිරීමට රජයේ නිලධාරියකුහට කිසිදු හෝ අවශ්‍යතාවක් නොමැති බවත් අවධාරණයෙන් ප්‍රකාශ කරන ලදී. මැතිවරණ දෙපාර්තමේන්තුව මෙන්ම මැතිවරණ නිලධාරීන්ද නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් වෙනුවෙන් සෑම මොහොතකම ඇප කැප වී සිටින බවත් ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වශයෙන් සහතික විය හැකි අතර ඡන්ද පෙට්ටි මාරු කරන්නේ යැයි පවතින්නේ හුදෙක් මිත්‍යා මතයක් පමණක් වන බවත් මෙහිදී තවදුරටත් දන්වා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ සිරිතුංග ජයසූරිය මහතා ජනතාවගේ මතය වෙනස් කරමින් ජනතාව නම්මවා ගැනීම සඳහා කරනු ලබන ආණ්ඩුවේ මැදිහත් වීම ඉතා අසීමිත වන බවත් ඡන්ද පෙට්ටිය ගැන සලකා බැලීමට ප්‍රථම ඊට පෙර සිදුවන අක්‍රමිකතා පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත් ඡන්ද විමසීමට පෙර ජනතාවට කරන බලපෑම් ඉතා කණගාටුදායක වන බවත් ප්‍රකාශ කළේය.

17. විශ්‍රාමිකයින්/ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්හට ජංගම දුරකථන ලබා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන බව වාර්තා වී ඇති හෙයින් පක්ෂ/ අපේක්ෂකයන් ප්‍රවර්ධනයෙන් තොරව එම දුරකථන ලබා දීමට කටයුතු කිරීමට දන්වා ඇති නමුත් ඒ සම්බන්ධයෙන් මොබිටෙල් සමාගම විසින් යොමු කර ඇති ලිපිය මඟින් අපේක්ෂක ප්‍රවර්ධනයක් සිදු කෙරෙන බැව් අද දින පැමිණිලි ලැබූ බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

18. නාවික හමුදාව විසින් ගෙන්වා ඇති මුද්‍රණ යන්ත්‍රය මඟින් ව්‍යාජ ඡන්ද පත්‍රිකා මුද්‍රණය කරමින් යම් අක්‍රමිකතාවක් සිදු කිරීමට සැළසුම් සහගත වැඩපිළිවෙලක් ඇතැයිතොරතුරු වාර්තා වූ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් නාවික හමුදාපති විමසීමට කටයුතු කළ බවත් ඒ සම්බන්ධයෙන් වාර්තා කරන ලෙස දැනුම් දෙන ලද බවත් නාවික හමුදාව එවැනි අනීතික ක්‍රියාවක නිරත නොවන බවට තමා දැඩි ලෙස විශ්වාස කරන බවත් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය. තව ද ජාතික හැඳුනුම්පත් ව්‍යාජව මුද්‍රණය කිරීම සඳහා යම් ප්‍රයත්නයක් දරමින් පවතින බවට ද තොරතුරු ලදින් ඒ පිළිබඳව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙතින් විමසා එවැන්නක් සිදු නොවන බැව් තහවුරු කර ගැනීමට ද කටයුතු කරන ලද බවත් එමෙන්ම අදාළ කරුණු සම්බන්ධයෙන් සියලුම දේශපාලන පක්ෂ ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවත් දන්වන ලදී.

එමෙන්ම මැතිවරණ කිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ද ඕනෑම අවස්ථාවක දී සොයා බැලීමට අපේක්ෂකයින්ට සහ නියෝජිතයින්ට හැකියාව පවතින බව ද මෙහිදී මැතිවරණ කොමසාරිස් තවදුරටත් දන්වන ලදී.

19. අපේක්ෂකයාහට මුලු දිවයිනටම බලපාන පරිදි ශබ්ද විකාශන යන්ත්‍ර උපයෝගී කොට ගෙන ප්‍රචාරක කටයුතු ඉටු කිරීමට අවස්ථාව දීමට හැකි නම් වඩා වැදගත් වන බවත් එනම්විශාල රැස්වීම් සඳහා නොව කුඩා වතු රැස්වීම් සඳහා මෙම ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කළ හැකි බවත් ප්‍රකාශ කළ සිරිතුංග ජයසූරිය මහතා එවැනි බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. එහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ප්‍රකාශ කරන ලද්දේ නීතිප්‍රකාරව ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගත හැක්කේ අවසරලත් රැස්වීම් භූමිවල පමණක් වන බවත් එහෙයින් අවසර දිය හැක්කේ නිශ්චිත ස්ථානයක පවත්වනු ලබන රැස්වීම් සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කිරීමට පමණක් වන බවය. එනම් දිවයිනටම බලපැවැත්වෙන බලපත්‍ර නිකුත් කළ නොහැක.

මෙහිදී වැලිගම ප්‍රදේශයේ සිද්ධියක් සම්බන්ධයෙන් පැවති 38/2005 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව කෙරෙහි ගාමිණී දිසානායක මහතා විසින් පෙන්වා දුන් කරුණු පිළිබඳව සභාවේ අවධානය යොමු කරවූ මැතිවරණ කොමසාරිස් දීප ව්‍යාප්තව ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා අවසරය ලබා දීමට පොලිසියට බලයක්

නොමැති බව අගවිනිසුරුතුමන්ගේ නියෝගයෙහි දැක්වෙන බවත් එහෙයින් අදාළ අවසරයප්‍රාදේශීය පොලිස් කාර්යාලවලින් ලබා ගත යුතු බවත් දන්වා සිටින ලදී. අත්පත්‍රිකා බෙදමින් යම් ප්‍රචාරණයක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ආසන්න පොලිස් ස්ථානය වෙත දැනුම් දී මෙගා දුරකතනයක් භාවිතයෙන් පිරිස ඇමතීමට හැකියාව පවතින බවද දන්වා සිටි මැතිවරණ කොමසාරිස් අපේක්ෂකයා විසින් ඉල්ලා සිටි අවස්ථාවකදී ඒ සඳහා අවස්ථාව සහ ආරක්ෂාව දිය හැකි නම් වඩා සුදුසු බවද පෙන්වා දෙන ලදී. එහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ප්‍රකාශ කර සිටියේ මෙවැනි ස්ථානවල විපක්ෂ ක්‍රියාකාරීන්ද සිටිය හැකි බැවින් බොහෝ ගැටලු උද්ගතවිය හැකි බවයි. යළිත් මැතිවරණ කොමසාරිස් පෙන්වාදෙන ලද්දේ සිරිතුංග ජයසූරිය මහතාගේ ඉල්ලීම පිළිබඳව සලකා බලමින් අත්පත්‍රිකා බෙදා දීම සඳහා ඉඩකඩක් ඇති හිස් භූමියක් යොදාගත හැකි නම් එවැනි ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයට ඉඩ දීමට සලකා බැලීමට හැකි බවත් කෙසේ වුවද ඒ පිළිබඳව පූර්ව දැනුම්දීමක් සහ අවසරක් ලබා ගෙන තිබිය යුතු බවත්ය.

මෙහිදී යළිත් සිරිතුංග ජයසූරිය මහතා පෙන්වා දෙන ලද්දේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සහ ඇමතිවරු විසින් ශබ්ද විකාශන යන්ත්‍ර යොදා ගනිමින් නීති විරෝධී ලෙස දිවයිනේ නන් ප්‍රදේශවල මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කරන ආකාරය දක්නට ලැබෙන බවත් තමන්ගේ ඉල්ලීම සම්බන්ධයෙන් නීති නිසි පරිදි ක්‍රියාත්මක කරන්නේ නම් එවැනි ක්‍රියා වලක්වාලීමට කටයුතු කළ යුතු බවයි. නීත උල්ලංඝනය කිරීම වැලැක්වීමට පොලිසිය ක්‍රියාත්මක නොවීම කණගාටුවට හේතුවක් බවද සිරිතුංග ජයසූරිය මහතා ප්‍රකාශ කළේය. නීති උල්ලංඝනය සඳහා කිසිවෙකුට ඉඩ නොදෙන බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා දැන්වීය.

20. රවී කරුණානායක මහතා මෙහිදී විමසා සිටියේ දේශීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වල නියෝජිතයින්ට පොලිස්පතිවරයා ද මැතිවරණ කොමසාරිස්වරයා ද සමඟ ඉදිරි මැතිවරණයේ කටයුතු සහ ක්‍රියාකාරීත්වය පිළිබඳව සාකච්ඡා කිරීමට අවශ්‍යව ඇති බවයි. PAFFREL සහCaFFEවැනිමැතිවරණ නිරීක්ෂණ සංවිධානවලට මෙම ජනාධිපතිවරණයේ ප්‍රචාරණ කටයුතු, නීති රීති සම්බන්ධව සහ අපේක්ෂකයින්ගේ/ සහායකයින්ගේ ක්‍රියාකලාප ආදී පිළිබඳ ප්‍රකාශ කර සිටීමට අදහස්/ යෝජනා/ චෝදනා ආදී දෑ පවතින බැව් දැනුම් දී ඇති හෙයින් එවැනි සාකච්ඡාවක් පැවැත්වීමට අත්‍යවශ්‍යව ඇති බවත් ඒමහතා මෙහිදී වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින ලද අතර එහිදී මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටින ලද්දේ PAFFREL සහCaFFEවැනිමැතිවරණ නිරීක්ෂණ සංවිධාන නිරන්තරයෙන්ම විවිධ අවශ්‍යතා සඳහා තමන් හමුවී සාකච්ඡා කිරීමට මැතිවරණ මහලේකම් කාර්යාලයට පැමිණෙන බවත් එහෙත් ඒ කිසිදු අවස්ථාවකදී එවැනි කරුණු කාරණා / යෝජනා / චෝදනා ඉදිරිපත් කර සිටීමට විශේෂ අවස්ථාවක් අවශ්‍ය බැව් දන්වා නොමැති බවත් ය ඔවුන් පෙන්වා දී ඇතියම් කරුණු කාරණා වෙත් නම් ඉදිරිපත් කරන ලෙස ද මෙහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය. කෙසේ වුවද රවීකරුණානායක මහතා විසින් ඉදිරිපත්කරන ලද ඉල්ලීම සලකා බලමින් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටියේ අදාළ පාර්ශ්ව සමඟ යමක් සාකච්ඡා කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අවස්ථාව ලබා දීමට හැකි බවත් එම සාකච්ඡාව මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී පැවැත්වීම සඳහා සුදුසු දිනයක් හා වේලාවක් වෙන් කරවා ගෙන ඒ බව දැනුම් දෙන ලෙසයි. එහෙත් තම නිරීක්ෂණ සංවිධානනියෝජිතයින්හට ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා සෑම ගණන් කිරීමේ ශාලාවක් තුළම රැඳී සිටීමට අවකාශ ලබා දුන්නේ නම් ඡන්ද ගණන් කිරීමේදී සිදුවන අක්‍රමිකතා වළක්වා ගැනීමට හැකියාව තිබූ බවද එක්තරා අවස්ථාවකදී මාධ්‍ය නිවේදන පවා නිකුත් කිරීමට මෙම නිරීක්ෂණ සංවිධාන විසින් කටයුතු කර ඇති බව ද මෙහිදී සිහිපත්කර සිටි මැතිවරණ කොමසාරිස්, කිසිදු හෝ නිරීක්ෂණ සංවිධානයක් විසින් ඡන්ද ගණන් කිරීම කටයුතු අධීක්ෂණයට ලක් කොට ඒ සම්බන්ධයෙන් නිරවද්‍යතාව පිළිබඳව සහතික නිකුත්කිරීමට අවශ්‍ය නොවන බවත් නිසැක වශයෙන්ම ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරවද්‍යභාවයෙන් යුතුව ඉටු කරනු ලබන බවත් මෙහිදී රවී කරුණානායක මහතා ඡන්ද ගණන් කිරීම සඳහා නිරීක්ෂකයන් යෙදවීමේ අපේක්ෂාව ගැන කරන ලද ප්‍රකාශයට පිළිතුරු ලෙස අවධාරණයෙන් යුතුව පැහැදිලි කර සිටින ලදී.

21. රාජ්‍ය සේවකයින් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නියැලෙන බවට පැමිණිලි ලැබෙමින් පවතින බවත් හෝමාගම ප්‍රදේශයේදී පවත්වන ලද දේශපාලන රැස්වීමක් ඇමතීම සඳහා

ආරක්ෂක ලේකම්වරයා සහභාගී වී ඇති බවට එක්තරා පුවත්පතක ද වාර්තා වී තිබූ බවට පැමිණිලි ලැබී ඇති හෙයින් මෙම කරුණු කාරණා සම්බන්ධයෙන් ජනාධිපති ලේකම්වරයා වෙත ලිඛිතව දැනුම්දීමට කටයුතු කරනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් දන්වන ලදී.

22. මේ වන විටත් සමාජවාදී සමානතා පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා හැරුණු කොට සෙසු සියලු ජනාධිපති අපේක්ෂකයින් විසින් මේ වන විටත් සිය වත්කම් බැරකම් ප්‍රකාශ භාර දී අවසන් බව දන්වා සිටි මැතිවරණ කොමසාරිස්, 2014.12.15 දින වන විට ඒ මහතා විසින් ද සිය වත්කම් බැරකම් ප්‍රකාශය භාර දීමට කටයුතු කරනු ලබනු ඇතැයි විශ්වාස කරනු ලබන බවත් මෙහිදී ප්‍රකාශ කර සිටියේය.

23. මේ අවස්ථාවේදී ජනාධිපති අපේක්ෂක බත්තරමුල්ලේ සීලරතන හිමියන්ගේ නියෝජිත සේපාලිකා ගමගේ මහත්මිය විසින් දන්වා සිටියේ බත්තරමුල්ලේ සීලරතන හිමිගේ ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරීන් මේ වන විටත් ලැබී නොමැති අතර පසුගිය දිනක සිරස නාලිකාවේ “සටන” වැඩසටහනට සහභාගී වීම සඳහා රත්මලාන මැදිරි සංකීර්ණය වෙත ගමන් ගනිමින් සිටි අවස්ථාවේ දීසීලරතන හිමියන් අතර මගදී නවතා පොලිසිය විසින් පරීක්ෂාවට ලක් කරන ලද බවත් එහෙයින් එම ස්ථානයේ සැලකිය යුතු වේලාවක් රැඳී සිටීමට සීලරතන හිමියන්ට සිදුවූ බවත්ය.

මේ අවස්ථාවේ දී මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටියේ ඒ ඒ ජනාධිපති අපේක්ෂකයින් වෙත පවතින තර්ජන ආදිය සලකා බලමින් අවශ්‍ය ප්‍රමාණයේ ආරක්ෂාවක් එනම් අවම වශයෙන් ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකුගේවත් ආරක්ෂාවක් සියලුම අපේක්ෂයින්හට සැපයීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත් එමෙන්ම අපේක්ෂකයින් පදිංචි ප්‍රදේශයෙන් බැහැරව වෙනත් ප්‍රදේශයකදී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගී වන්නේ නම් එම ප්‍රදේශය ආශ්‍රිතව තවදුරටත් ආරක්ෂාව සැපයිය යුතු බව ද දන්වා ඇති බවත්ය.

සරත් මනමේන්ද්‍ර මහතා මේ අවස්ථාවේදී අදහස් දක්වා ප්‍රකාශ කර සිටියේ දිනකට ප්‍රචාරණ රැස්වීම් කිහිපයක් ඇමතීමට සුදානම් කර තිබෙන අතර මංමාවත්වල පවතින අධික වාහන තදබදය නිසා එම ප්‍රචාරක රැස්වීම් වෙත ළඟා වීමට ඉතා විශාල කාල වේලාවක් ගතවන බවත් එම හේතුවෙන් තම ප්‍රචාරණ කටයුතුවලට බාධා එල්ලවන බැවින් ඉතා ඉක්මනින් අදාළ ස්ථාන වෙත ළඟා වීමට මෝටර් බයිසිකලයක් ලබා දීමට කටයුතු කිරීමට හැකි නම් වඩා උචිත වන බවත්ය.

මේ අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා ප්‍රකාශ කර සිටියේ අපේක්ෂකයින් රැස්වීම් සඳහා හෝ මාධ්‍ය වැඩසටහන් සඳහා සහභාගී වීමට බැහැර යන විට ඒ අවස්ථාවලදී පොලිසිය දැනුවත් කරන ලෙසත් එවිට අවහිරයකින් තොරව අදාළ කටයුතු ඉටු කර ගැනීමට අවකාශ සලසා දිය හැකි බවත්ය. එමෙන්ම එවන් අවස්ථාවකදී අවශ්‍ය නම් මෝටර් බයිසිකලයක් සැපයීමට ද හැකියාව පවතින බව ද තවදුරටත් ප්‍රකාශ කර සිටියේය.

අපේක්ෂකයින්හට ගමනා ගමන සම්බන්ධ ගැටලු පවතින්නේ නම් දන්වන ලෙසත් එවිට එම ප්‍රවාහන අපහසුතා මග හරවා ගැනීමට පිළියම් යෙදීමට හැකි බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී යළිත් පැහැදිලි කර සිටින ලද අතර එහෙත් වෙනත් අපේක්ෂකයෙකුහට සහාය දක්වන්නේ යැයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටින අපේක්ෂකයින්හට එවැනි අවස්ථා ලබාදීමට හැකියාවක් නොවන බවත් කෙසේ වුවද මේ වරප්‍රසාද ලබාදිය හැක්කේ සම්බන්ධයෙන් ඉල්ලීම් කරනු ලබන අපේක්ෂකයින්හට පමණක් වන බවද දන්වන ලදී.

යම් අපේක්ෂකයෙකු ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී ආරක්ෂාව සැපයීමේ හැකියාව පොලිසිය සතු බවත් නිල ඇඳුමින් සැරසුණු ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු අවම වශයෙන් සෑම අපේක්ෂකයෙකුහට ම සපයනු ලබන බවත් ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ ආරක්ෂාව සඳහා අනුයුක්ත කරන ලද ආරක්ෂක නිලධාරීන් දසදෙනා අතුරින් නිලධාරීන් පස්දෙනෙකු ආපසු හරවා එවා ඇති බවත් යම් අපේක්ෂකයෙකු විසින් සිය මනාපය පරිදි ආරක්ෂක නිලධාරීන් ඉල්ලා සිටින්නේ නම් එම නිලධාරීන් සපයා දීමට කටයුතු කිරීමට හැකියාව පවතින බවද මෙහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා පැහැදිලි කර සිටින ලදී.

ඉදිරියේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණව මැතිවරණයක් ලෙස පැවැත්වීම සඳහා සියලු පාර්ශ්වවල සහයෝගය අවශ්‍ය වන බවත් ඒ සඳහා වගකීමෙන් හා උනන්දුවෙන් යුතුව සියලු පාර්ශ්ව කටයුතු කළ යුතු බව මෙහිදී සඳහන් කර සිටි මැතිවරණ කොමසාරිස් වෙනත් ගැටළු හෝ සාකච්ඡා කළ යුතු කරුණු කාරණා වෙත් නම් ඉදිරිපත් කරන ලෙස සභාව වෙත කාල වේලාව ලබා දුන් අතර එවැන්නක් නොමැති බැවි පෙනී ගියෙන් අද දින සහභාගීත්වය දැක්වූ සැමට ස්වකීය ස්තුතිය නැවතත් පලකර සිටිමින් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1840 ට අවසන් කරන ලදී.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

ජනාධිපතිවරණය - 2015

තරග කරනු ලබන අපේක්ෂකයින් / නියෝජිතයින් සමඟ පවත්වන ලද සාකච්ඡාව - 2014.12.19

2014.12.19 දින පැය 1030ටතරඟ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්.

සහභාගීත්වය :

1. සිරිතුංග ජයසුරිය මහතා	-	එක්සත් සමාජවාදී පක්ෂය
2. චම්පානි පද්මසේකර මහතා	-	ශ්‍රී ලංකා නිදහස් පක්ෂය/ එක්සත් ජනතා නිදහස් සන්ධානය
3. එම්.කේ. පියරත්න මහතා	-	එක්සත් සමාජවාදී පක්ෂය
4. අනුර ජයසිංහ මහතා	-	එක්සත් ජනතා නිදහස් පක්ෂය
5. ජයන්ත කුලතුංග මහතා	-	එක්සත් ලංකා මහා සභා පක්ෂය
6. ගාමිණි රණසිංහ මහතා	-	එක්සත් ලංකා මහා සභා පක්ෂය
7. කපිල ගමගේ මහතා	-	ජාතික නිදහස් පෙරමුණ
8. ආර්.අයි.එම්. ඉල්යාස් මහතා	-	ජනාධිපති අපේක්ෂක
9. ශ්‍යාමිලා පෙරේරා මහත්මිය	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
10. ශලීල මූණසිංහ මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
11. සපුමල් වලව්වත්ත	-	ශ්‍රී ලංකා ජාතික පෙරමුණ
12. අයි. මිෆ්ලාර් මහතා	-	එක්සත් සාම පෙරමුණ
13. රුවන් තිලක පේදුරුආරච්චි මහතා	-	එක්සත් ලංකා පොදුජන පක්ෂය
14. විජයදාස රාජපක්ෂ මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
15. නීතීඥ දසුන් නාගස්හේන මහතා	-	නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
16. ඒ.එස්.පී. ලියනගේ මහතා	-	ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
17. ඇස්.වී.සී. ඇලෙක්සැන්ඩර් මහතා	-	ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
18. ආර්. යෝගරාජන් මහතා	-	එක්සත් ජාතික පක්ෂය
19. ඩබ්.ඒ. සුනිල් මහතා	-	සමාජවාදී සමානතා පක්ෂය
20. එච්.ඩබ්. නිහාල් ප්‍රේමකුමාර මහතා	-	එක්සත් ලංකා පොදුජන පක්ෂය
21. වයි.එල්.එස්. හමීඩ් මහතා	-	අඛිල ඉලංගෙයි මහජන කොංග්‍රසය
22. සුමින් විජේසිංහ මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
23. සුසිල් ප්‍රේමජයන්ත මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
24. පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි	-	ජනසෙත පෙරමුණ
25. කබීර් හෂීම් මහතා	-	එක්සත් ජාතික පක්ෂය
26. පාලිත ගමගේ මහතා	-	එක්සත් ජනතා නිදහස් සන්ධානය
27. එම්.ඒ. සුමන්තිරන් මහතා	-	ඉලංකෙයි තමිල් අරසුකච්චි
28. දයා පැල්පොල මහතා	-	එක්සත් ජාතික පක්ෂය

දේශීය නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින් (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාකච්ඡාවක් හේතුවෙන් සම්පූර්ණ සාකච්ඡාවට සහභාගී වූයේ නැත)

1. කීර්ති තෙන්නකෝන් මහතා	-	නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE)
2. රසංග හරිස්චන්ද්‍ර මහතා	-	ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
3. රෝහණහෙට්ටිආරච්චිමහතා	-	නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
4. මංජුල ගජනායක මහතා	-	මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන්

1.	ගාමිණි නවරත්න මහතා	-	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන/ මැතිවරණ)
2.	ගාමිණි දිසානායක මහතා	-	නියෝජ්‍ය පොලිස්පති (නීති)
3.	පී.බී. නිකහැටිය මහතා	-	නියෝජ්‍ය පොලිස්පති (ප්‍රවාහන හා සංදේශ)
4.	එල්.එච්.පී. කුරේ මහතා	-	පොලිස් අධිකාරී - අණදෙන නිලධාරී ක්ෂෙත්‍ර බලකාය

මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන්

1.	යූ.අමරදාස මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2.	ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
3.	එම්.එම්. මොහමඩ් මහතා	-	අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1635 ට ආරම්භ වූ අතර අද දින සහභාගී වී සිටින සියලු පාර්ශ්ව මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලදී. එමෙන්ම ඒ ඒ ජනාධිපති අපේක්ෂකයින් නියෝජනය කරමින් මේ සඳහා සහභාගී වන්නේ කවර පාර්ශ්ව ද යන්න සභාවේ දැනගැනීම සඳහා මේ විමසා බලන ලදුව ඒ අනුව බහුතර නියෝජනයක් දක්නට ලැබීම සතුටක් වන බැව් ද මෙහිදී මැතිවරණ කොමසාරිස් විසින් ප්‍රකාශ කර සිටියේය.

02. ඉදිරි ජනාධිපතිවරණයේ කටයුතු වෙනුවෙන් අදාළ ජනාධිපති අපේක්ෂකයින්ගේ බලයලත් නියෝජිතයින් සහ ඡන්ද නියෝජිතයින් මේ වන විටත් පත් කර අවසන්ව ඇති බව මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස්, ඡන්ද ප්‍රදේශ නියෝජිතයින් 2014.12.21 දිනට පෙරාතුව පත්කර දැනුම්දීමට කටයුතු කරන ලෙස ද දැන්වීය.

03. පූර්ව සාකච්ඡා වලදී තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් දැනුම්දෙන ලද කරුණු කාරණා සම්බන්ධයෙන් සංශෝධනයක් නිකුත් කර ඇති බවත් ඒ අනුව තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින ලෙස නම් කර තිබූ 2014.12.23 සහ 2014.12.24 යන දෙදිනට අමතර වශයෙන් ප්‍රාදේශීය පොලිස් ස්ථානාධිපති වරුන් මෙන්ම දිස්ත්‍රික් බලධාරීන් ගේ මතය සහ විවිධ පාර්ශ්වවල යෝජනා පරිදි පොලිස් දෙපාර්තමේන්තුවේතැපැල් ඡන්ද සලකුණු කිරීම 2014.13.26 දිනට යොදා ඇති බව මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වන ලදී.

අදාළ දෙදින තුළදීම තැපැල් ඡන්දය සලකුණු කිරීම සිදු කළහොත් සෙසු තැපැල් ඡන්ද මධ්‍යස්ථාන සඳහා විශේෂයෙන්ම ගැටළුවලට තුඩු දී ඇති ඩිපෝ ආදී ස්ථාන සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීම අඩාල වීමට ඉඩ ඇති හෙයින්ද අදාළ දෙදිනෙහි දේශපාලන ප්‍රචාරණ රැස්වීම් ද අත්හිටුවා නැති බැවින් ද රටෙහි ආරක්ෂාව ප්‍රමුඛ විය යුතුය යන්න පදනම්ව සහ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු වඩා නිවැරදිව ඉටු විය යුතු බැවින් ද මෙම වැඩ පිළිවෙල ක්‍රියාත්මකකරනු ලබන බැව් දන්වා සිටියේය.

එහෙත් දස වන සුනාමි සැමරුම වෙනුවෙන් පැවැත්වෙන නිල උත්සවය එනම් “ 2015 වසරේ රාජ්‍ය ආරක්ෂිත දින උළෙල ” ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2014.12.26 දින හම්බන්තොටදී පැවැත්වීමට නියමිතව ඇති නිසා මෙම රාජ්‍ය නිල උත්සවය සඳහා ප්‍රමාණවත් පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් සේවයේ යෙදවීමට අවශ්‍ය වන හෙයින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන මීට අයත් නොවන බවත් ඔවුන් නියමිත පරිදි සිය තැපැල් ඡන්දය 2014.12.24 දින සලකුණු කිරීමට නියමිත බවද පැහැදිලි කරන ලදී.

මෙහිදී තව දුරටත් කරුණු පැහැදිළි කරමින්, සිවිල් ආරක්ෂක බලකා මූලස්ථානය, ජනාධිපති සහ ඇමති ආරක්ෂක කොට්ඨාසය වැනි ක්‍රියාකාරී (Functional Divisions) ස්ථානවලද තැපැල් ඡන්ද 2014.12.23 සහ 2014.12.24 දෙදින සලකුණු කරනු ලබන බවත් තැපැල් ඡන්ද සලකුණු කිරීමේ අධීක්ෂණ කටයුතු සඳහා සහභාගී වන හෙයින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන්ගේ තැපැල් ඡන්ද 2014.12.26 දින ද මැතිවරණ කාර්යාලවල නිලධාරීන්ගේ තැපැල් ඡන්ද 2014.12.30 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී

ද සලකුණු කිරීමට නියමිත බව මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය.එසේම යම් කිසි හමුදා කඳවුරක කාර්යාලයක හෝ ආයතනයක නිළධාරීන්හට ස්වකීය තැපැල් ඡන්දය 2014.12.23 හෝ 2014.12.24 යන දිනවලදී සලකුණු කිරීමට අපොහොසත් වුව හොත් 2014.12.30 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සලකුණු කිරීමට අවස්ථාව සලසා දිය හැකි බවද මෙහිදී ප්‍රකාශ කර සිටින ලද අතර මෙම ක්‍රියාවලියසම්බන්ධයෙන් අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙස ද මෙහිදී සියලු පාර්ශ්වයෙත දන්වන ලදී.

04. තැපැල් ඡන්දය ප්‍රකාශ කරන ලද්දේකවර අපේක්ෂකයා හටද යන්න අනාවරණය කර ගැනීමට හැකියාව ලැබෙතැයි යන්න ජනතාව තුළ පවතින දුර්මතය බිඳලිය යුතු හෙයින්, තැපැල් ඡන්දය පිළිගැනීම දන්වමින් තැපැල් ඡන්ද දායකයා වෙත යවන සාමාන්‍ය ලිපියට අමතර වශයෙන් මෙවර විශේෂ දැන්වීම් පත්‍රිකාවක් යොමු කිරීමට පියවර ගත් බව ද විශේෂයෙන්ම ඩිපෝ වැනි පැමිණිලි ලැබී ඇති ස්ථානවල මේවා බෙදා දීමට කටයුතු කරන ලද බවත් PAFFRAL වැනි මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ද මෙම දැන්වීම හැකි තාක් ජනතාව අතරට ගෙන යාමට සහාය වූ බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී.

05. මේ අවස්ථාවේදී ඉලංකෙයි තමිල් අරසුකච්චි පක්ෂයේ නියෝජිත එම්. ඒ සුමන්තිරන් මහතා විසින් මතුකළ පැනයකට පිළිතුරු සපයමින් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කරන ලද්දේ මුලතිව් සහ කිළිනොච්චි යන ප්‍රදේශවලින් පුනරුත්ථාපනය කිරීමෙන් අනතුරුව සිවිල් ආරක්ෂකයින් ලෙස සේවයට බඳවා ගෙන ඇති අයවලුන් සඳහා පසුගිය පළාත්සභා ඡන්ද විමසීමේදී තැපැල් ඡන්ද හිමිකම් ලබා නොදෙන ලද්දේ ඔවුන් සිවිල් ආරක්ෂක සේවයේ වැටුප් ලබන්නන් වුවද එවකට ගොවිපොළ සේවයේ නිරතව සිටි බැවින්බවයි.

එම අවස්ථාවේදී සීමිත දිස්ත්‍රික්ක සංඛ්‍යාවක පැවැති ඡන්ද විමසීමක් වූ හෙයින් ඔවුන් රාජකාරි සඳහා යොදවා ගැනීමට අවශ්‍යතාවක් මතු නුවූ නමුදු ජාතික මැතිවරණයක් ක්‍රියාත්මක වන මේ අවස්ථාවේදී පොලිසියේ ආරක්ෂක කටයුතු සඳහා ඔවුනගේ සහාය අවශ්‍ය විය හැකි බව පොලිස්පති විසින් දන්වා ඇති හෙයින්, ඔවුනට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව සලසා දීම සඳහා මෙවර තැපැල් ඡන්ද හිමිකම් ලබා දීමට කටයුතු කර ඇති බවද මෙහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය. මෙම සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ තැපැල් ඡන්දය සලකුණු කිරීම මැතිවරණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉතා නිවැරදිව සිදු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් එමෙන්ම තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දිනට පෙර මෙම සිවිල් ආරක්ෂකයින්හට ඒ සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම පිණිස මැතිවරණ නිලධාරීන් එම ස්ථාන වෙත යොමු කිරීමට නියමිත බවත් එහෙයින් මෙම ක්‍රියාවලිය ඒ සම්බන්ධයෙන් කිසිදු හෝ සැකයක් තබා නොගන්නා ලෙසද මැතිවරණ කොමසාරිස් විසින් ඉල්ලා සිටින ලදී.

මේ අවස්ථාවේදී නැවතත් එම්. ඒ. සුමන්තිරන් මහතා කරුණුදක්වමින් මෙම සිවිල් ආරක්ෂක නිලධාරීන් මැතිවරණ කටයුතු සඳහා පොලිසියට සහාය ලෙස යොදා ගනු ලබන්නේ නම් ඔවුන්ගේ තැපැල් ඡන්දය එම හමුදා කඳවුරුවලදී නොව අදාළ පොලිස් ස්ථානවලදී සලකුණු කළ යුතු බවත් එසේ නොකිරීමට ඇති හේතු කවරේද යන්නත් ප්‍රශ්න කළේය. එමෙන්ම පසුගිය වතාවේ ඔවුනට තැපැල් ඡන්දය ලබා නොදීම සාධාරණ වන බවත් මොවුන් යටත් මානසිකත්වයෙන් යුත් පුනරුත්ථාපනය කරන ලද්දවුන් වන හෙයින් හමුදා කදවුරු වලදී තැපැල් ඡන්දය සලකුණු කිරීමට සිදු වීම නිසා යම් බලපෑමකට යටත් වන්නට සිදු නොවෙතැයි සහතික විය හැක්කේ කෙසේද යන්නත් මෙහිදී විමසා සිටින ලදී.

එහිදී කරුණු පැහැදිළි කරමින් මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලද්දේ මෙම සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ තැපැල් ඡන්දය සඳහා යම් බලපෑමක් එල්ල වන බවට පැමිණිලි ලැබී තිබෙන බැවින් එවැන්නක් සිදු වීම වැළැක්වීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇති බවත් ය. කෙසේ වුවද අදාළ ඕනෑම පාර්ශ්වයක් මෙම සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ තැපැල් ඡන්දය සලකුණු කිරීම නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂකයින් යෙදවීමට හැකියාව ඇති බවද එමෙන්ම ඔවුනගේ ඡන්දයට බලපෑම් වන ආකාරයේ යම් හෝ අක්‍රමිකතාවක් සිදු වූ බවට ඔප්පු වන විටකදී අදාළ ඡන්ද විමසීම ශූන්‍ය කිරීමට කටයුතු කරනු ලබන බවදමෙහිදී දැන්වීය.

මේ සම්බන්ධයෙන් සභාව තුළ දිගින් දිගමට සාකච්ඡාවට ලක්වූ අතර විවිධ අදහස් සහ යෝජනා ද මතු විය. එහිදී එක්සත් සමාජවාදී පක්ෂයෙහි සිරිතුංග ජයසූරිය මහතා පෙන්වා දෙන ලද්දේ මෙම සිවිල්

ආරක්ෂකයින්ගේ තැපැල් ඡන්ද අදාළ හමුදා කඳවුරුවලදී සලකුණු කිරීම සම්බන්ධයෙන් සාධාරණ සැකයක් මතු වන බවත් එහෙයින් එම හමුදා කඳවුරුවලින් බැහැරව වෙනත් ස්ථානවලදී අදාළ තැපැල් ඡන්ද සලකුණු කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම වඩා යෝග්‍ය වන බවත් ය.

මෙහිදී අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස්,මේ පිළිබඳ බොහෝ දුරට සාකච්ඡා කිරීමෙන් අනතුරුව මොවුන්හට තැපැල් ඡන්ද හිමිකම ලබා දීමට තීරණයකරන ලද බවත් පදවිය - කන්තලේ ප්‍රදේශයේ ද සිවිල් ආරක්ෂක නිලධාරීන්හට තැපැල් ඡන්ද හිමිකම ලබා දීමට කටයුතු කර ඇති බැවින් මෙම නිලධාරීන්හට පමණක් එම අවස්ථාව ලබා නොදීම අධිකරණයේ වුවද ප්‍රශ්න කිරීමට ලක් විය හැකි බවත් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම වෙනත් ස්ථානයකදී ඔවුන්ගේ තැපැල් ඡන්දය සලකුණු කිරීමට හැකි ක්‍රමවේදයක් පිළිබඳව සලකා බැලීමට කටයුතු කරනු ලබන බව ද දැන්වූ අතර කෙසේ වුවද ඔවුනගේ තැපැල් ඡන්දය නිදහස්ව හා සාධාරණව ප්‍රකාශ කිරීමට හැකි පරිදි සියලු ක්‍රියාමාර්ග ගන්නා බව ද වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියේය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා මෙහිදී ප්‍රකාශ කර සිටින ලද්දේ මැතිවරණ කාලසීමාව තුළදී පොලිස් ජංගම රථ සඳහා මෙම සිවිල් ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු බැගින් යෙදවීමට සැළසුම් කර ඇති හෙයින් ඔවුන් සඳහා තැපැල් ඡන්ද හිමිකම ලබා දෙන ලෙස පොලිස්පති විසින් මැතිවරණ කොමසාරිස් වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව මෙය ක්‍රියාත්මක වන බවයි.

මේ අවස්ථාවේදී මැතිවරණ කොමසාරිස් විසින්, මෙම තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු විනිවිදභාවයෙන් යුතුව ඉටු කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙල කවරාකාරද යන්න සභාවේ දැනගැනීම සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) සභාව වෙත කැඳවා පැහැදිලි කරවීමට කටයුතු යොදන ලදී. එහිදී එම ප්‍රදේශ වෙත මැතිවරණ නිලධාරීන් අනුයුක්ත කර ඇති ආකාරය පිළිබඳව සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) විසින් පහැදිළි කර සිටින ලද අතර දමිළ භාෂාවෙන් රාජකාරි ඉටු කළ හැකි නිලධාරීන් කිහිප දෙනෙකු ද (අවම වශයෙන් 05 දෙනෙකු) මෙම ස්ථාන සඳහා යොදවන ලෙස මැතිවරණ කොමසාරිස් මෙහිදී උපදෙස් ලබා දෙන ලදී.

තවද යාපනය දිස්ත්‍රික්කයේ ද තැපැල් ඡන්ද හිමිකම ලබා දී ඇති සිවිල් ආරක්ෂකයින් ද තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම අවසන් වූ පසුව පොලිස් ජංගම සේවා සඳහා අනුයුක්ත කිරීමට හැකියාව පවතින බැව් ද පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් එමඟින් ආරක්ෂක වැඩපිළිවෙල වඩාත් පුළුල් කිරීමට හැකි බැව්ද දන්වන ලදී.මැතිවරණ කොමසාරිස් තවදුරටත් කරුණු දක්වමින් කවර හෝ තැපැල් ඡන්ද මධ්‍යස්ථානයක හෝ යම් අක්‍රමිකතාවක් සිදු වූ බවට සනාථ වන්නේ නම් " නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම උදෙසා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට මැතිවරණ කොමසාරිස්වරයා හට හැකියාව පවතී " යන්න පනතේ සඳහන් වගන්ති ප්‍රකාරව නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බව ප්‍රකාශ කරන ලදී.

06. මානව හිමිකම් කොමිෂන් සභාව විසින්, මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ සභාපති, රජයේ මුද්‍රණාලයාධිපති මෙන්ම තැපැල්පති ද, මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ඇතුළු පාර්ශ්ව කරුණු විමසීම සඳහා ඊයේ දින (2014.12.18) දින කැඳවන ලද බවත් එහිදී ලංගම බස්රථවල ප්‍රදර්ශනය කරනු ලබන පෝස්ටර් / බැනර් ඉවත් කිරීමේ වගකීම එහි සභාපති විසින් භාර ගන්නා ලද බව මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලදී.

මැතිවරණ කොමසාරිස්, ලංගම බස්රථ වත්මන් ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් සොයා බැලූ බවත් එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් එම බස්රථ යොදා ගැනීම වෙනුවෙන් මධ්‍යම ගමනාගමන මණ්ඩලය වෙත රුපියල් මිලියන 25 ක් ගෙවා ඇති අතර ඒවා බැංකු ප්‍රකාශනයෙහි එපරිද්දෙන්ම සටහන් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම බස්රථ එක් රැළියකට උපරිම බස්රථ 1000 ක සංඛ්‍යාවකට යටත්ව මුදල් ගෙවා වෙනත් සැබෑ ලෙස තරඟ කරන අපේක්ෂකයකුහට වුවද ලබා ගැනීමට අවස්ථාව පවතින බව ද දන්වා සිටියේය.

07. මෙහිදී යළිත් අදහස් දැක්වීමට එක්වූ සිරිතුංග ජයසූරිය මහතා ප්‍රකාශ කරන ලද්දේ මැතිවරණ නීති එකහෙළාම උල්ලංඝනය කරමින් ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථා පරිශ්‍රයේ වත්මන් ජනාධිපතිවරයාගේ දැවැන්ත පෝස්ටරයක් ප්‍රදර්ශනය සඳහා තබා ඇති බවත් මේ ආකාරයෙන් නීති උල්ලංඝනය කිරීම සම්බන්ධව අතිශය

කණස්සල්ලට පත් වන බවත් එහිදී තමන් විසින් අදාළ පාර්ශ්ව වෙත මේ පිළිබඳව වාචිකව දන්වා සිටීමට කටයුතු කරන ලද බවත් ය.

එහිදී කරුණු පැහැදිළි කරසිටි මැතිවරණ කොමසාරිස්,පැමිණිලි කිරීම කළ යුත්තේ ලිඛිතව වන බවත්,ප්‍රතිඵල රහිතවේ යැයි පූර්ව නිගමනයෙන් යුතුව කිසිදු පියවරක් නොගෙන සිටීමෙන් කිසිවක් සාක්ෂාත් කර ගැනීමට හැකියාව නොලැබෙන බවත් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම මෙය පැමිණිල්ලක් වශයෙන් සටහන්කර ගැනීමට කටයුතු කරන බැව් ද මේ අවස්ථාවේදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත මැතිවරණ නිලධාරියකු යවා මේ බව සනාථ කර ගැනීමට ද කටයුතු කරනු ලබන බැව් ද තව දුරටත් දැන්වීය.

මෙහිදී දයා පැල්පොල මහතා විසින් විමසා සිටින ලද්දේ මේවා ඉවත් කිරීමට පොලිසිය විසින් ක්‍රියාමාර්ග නොගන්නේ මන්දැයි යන්නයි. මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් මිලියන 50 ක මුදලක් මේවා ඉවත්කිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබියදීත් ඔවුන් මේවා ඉවත්කිරීමට කටයුතු නොකිරීම යුක්ති සහගත නොවන බවද එමෙන්ම පොලිසිය මේසඳහා වගකිව යුතු බැව් ද පොලිසිය ඊට ක්‍රියාමාර්ග නොගන්නේ නම් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පවත්වන්නේ කෙසේද යන්න ගැටළුකාරී වී ඇති බවත් ඒ මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

ඒ අවස්ථාවේදී කරුණු පැහැදිළි කර සිටි මැතිවරණ කොමසාරිස් දිවයිනේ සියලු ස්ථානවල ඇති සියලු පෝස්ටර් / කටවුට්/ බැනර් / දැන්වීම් එක රැයින් ඉවත්කිරීමට ප්‍රායෝගිකව ක්‍රියා කිරීමට පොලිසියට හැකියාවක් නොවන බව ප්‍රකාශ කර සිටියේය.

මේ අවස්ථාවේදී කරුණු දැක්වූ දයා පැල්පොල මහතා මොණරාගල දිස්ත්‍රික්කය පුරා දක්නට ඇති නීති විරෝධී පෝස්ටර් / කටවුට්/ බැනර් සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ රංජිත් මද්දුමබණ්ඩාර මහතා විසින් පැමිණිලි කරන ලද අවස්ථාවේදී ඒවා ඉවත්කිරීමට කම්කරුවන් නොමැති බැව් පොලිසිය විසින් දන්වා තිබීම ඉතා කණගාටුවට කරුණක් වන බැව් ද දන්වා සිටියේය.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස මෙහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා වෙතින්මැතිවරණ කොමසාරිස් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම දඹුල්ල, දිවුලපිටිය, හෝමාගම, මිනුවන්ගොඩ, රත්නපුර යන ප්‍රදේශවලද මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් බොහෝ වාර්තා වන බව ද මේ සම්බන්ධයෙන් පොලිසිය හා මැතිවරණ දෙපාර්තමේන්තුව ඇතුලු වගකිව යුතු සියලු පාර්ශ්වවල අවධානය යොමු විය යුතු බැව් ද ශලීල මුණසිංහ මහතා දන්වා සිටින ලදී.

එහිදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා අදහස් දක්වමින් පොලිසිය විසින් මෙවැනි අක්‍රමිකතා වලක්වාලීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා බවත්, මේ වන විටත් ඒ සඳහා උපරිම ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

එක්සත් ජාතික පක්ෂයෙහි නියෝජිත ආර්. යෝගරාජා මහතා කරුණු දක්වමින් විවිධ ස්ථානවල ප්‍රදර්ශනය වන අපේක්ෂක ප්‍රචාරණයට තුඩුදෙන ඩිජිටල් පුවරු ඉතා දැඩිව මැතිවරණ නීති රීති උල්ලංඝනය කරමින් පවතින බව ප්‍රකාශ කළේය. මහින්ද චින්තන වැඩපිළිවෙලෙහි කටයුතු යැයි පෙන්වා දෙමින් නිදහස් චතුරස්‍රය ආසන්නයේ ද පාර්ලිමේන්තු වටරවුම අසළද මෙවැනි පුවරු දක්නට ලැබෙන බවත් මේවා වහා ඉවත්කිරීමට කටයුතු කළ යුතු බවත් ඒ මහතා මෙහිදී පෙන්වා දෙන ලදී. එහිදී කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස්, නිදහස් චතුරස්‍රය ආසන්නයේ තිබූ ඩිජිටල් පුවරුව මැතිවරණ කොමසාරිස්ගේ දැනුම්දීම පරිදි මේ වන විටත් ඉවත්කර ඇති බවත් පාර්ලිමේන්තු වටරවුමේ ප්‍රදර්ශනය වන පුවරුවද ඉදිරියේදී ඉවත්කරනු ඇති බවත් ප්‍රකාශ කර සිටින ලදී.

කෙසේ වුවද ඇතැම් ඩිජිටල් පුවරු සඳහා පොලිස් ආරක්ෂාව පවා ලැබෙන බැව් වාර්තා වී ඇති බවත් මේවා ඉවත් කිරීමට අදාළ පාර්ශ්ව විසින් පියවර නොගන්නේ නම් ඒවා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ගලවා ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බවද මැතිවරණ කොමසාරිස් තව දුරටත් දැන්වීය.

එමෙන්ම මෙවැනි ක්‍රියා වලින් වැලකී සිටින ලෙස සිය පක්ෂයේ ආධාරකරුවන් සහ සෙසු අදාළ පාර්ශ්ව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් සුසිල් ප්‍රේමජයන්ත් මහතා වෙත මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වන ලදී.

08. විදේශීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් තුනක් මෙවන විටත් නිරීක්ෂණ කටයුතු සඳහා මෙරටට පැමිණ සිටින බවත් දේශපාලන ක්‍රියාකාරීන් විසින් මෙයට පෙර පැමිණිලි කර ඇති අන්දමේ මැතිවරණ නිරීක්ෂණය සම්බන්ධ දැනුම රහිත නුසුදුස්සන් ඔවුන් අතර සිටින බව පෙනී යන්නේනම් ඔවුන් එම නිරීක්ෂණ කටයුතුවල නොයෙදවීමට අපේක්ෂා කරන බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ගම්පහ ප්‍රදේශයේ කටවුට් / පෝස්ටර් ඉවත් නොකිරීමට යම් විශේෂිත හේතු ඇත්දැයි එක්තරා නිරීක්ෂකයකු විසින් ගම්පහ දිස්ත්‍රික් ලේකම් විමසා ඇති බවත් මෙම නිරීක්ෂකයින් විසින් ශ්‍රීලංකාවේ මැතිවරණ ක්‍රමය, දේශපාලන බලය බෙදීම ආදී බොහෝ ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිරීක්ෂණයට පැමිණෙන බවත් ඔවුන් ඒ පිළිබඳව දැනුවත් බවත් එහෙයින් මෙම නීති විරෝධී ප්‍රචාරණ කටයුතු නවතාලීමට ඔවුන්ගේ නිරීක්ෂණ ප්‍රයෝජනවත් වන බවත් තවදුරටත් පැහැදිළි කර සිටින ලදී.

09. සිරිතුංග ජයසූරිය මහතාගේ විමසුමකට පිළිතුරු දුන් මැතිවරණ කොමසාරිස්, සමබර නොවන ආකාරයෙන් අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා මාධ්‍ය භාවිතා කිරීම සම්බන්ධයෙන් ස්වාධීන රූපවාහිනී සේවය (ITN) වෙත දැන්වීමට කටයුතු කරන ලද බවත් ඒ අනුව ඉදිරියේදී එම මාධ්‍ය නාලිකාව විසින් සමබර ලෙස සිය වැඩසටහන් ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂිත බවත් එසේ කිරීමට ඔවුන් අපොහොසත් වුවහොත් එම නාලිකාව පක්ෂපාතීව ක්‍රියා කරනු ලබන බවට මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමට පියවර ගන්නා බව ප්‍රකාශ කර සිටියේය. යමක් සිදු වූ පසුව කෙරෙන පසු විමර්ශනවලින් පලක් නොවන බවත් මේවාට එරෙහිව ඉදිරියට එන ලෙස මහජනතාවට දන්වා සිටිය යුතු බව තමන්ගේ මතය වන බවත් සිරිතුංග ජයසූරිය මහතා තව දුරටත් දැන්වීය. මැතිවරණ කොමසාරිස් වශයෙන් එවැන්නක් ප්‍රකාශ කිරීමට තමන්හට හැකියාවක් නොවන බවත් මෙහිදී පෙන්වා දුන් මැතිවරණකොමසාරිස්,දිගින් දිගටම දැනුම්දී තිබියදීත් යම් පාර්ශ්වයක් මෙවැනි ක්‍රියා තව දුරටත් සිදු කරනු ලබන්නේ නම් එකී නීති උල්ලංඝණය කිරීම් හරහා ප්‍රවර්ධනය කෙරෙන අපේක්ෂකයින් විසින් එමඟින් මැතිවරණ නීති උල්ලංඝනය කරනු ලබන බැව් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීමට සිදු වන බවද අවධාරණය කරන ලදී.

10. ඇතැම් ක්‍රීඩා භූමි / පිටිවනි විවිධ පාර්ශ්ව විසින් ඉතා අසාධාරණ ලෙස දිගු කලක් පුරා වෙන් කර තබා ඇති බවට මෙහිදී පළමු අදහස් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී පැල්මඩුල්ල බස් නැවතුම්පළ භූමිය 2014 දෙසැම්බර් මස 08 වන දින සිට 2015 ජනවාරි මස 07 දින දක්වා එක්තරා පාර්ශ්වයක් විසින් වෙන්කර තිබීම නිසා යම් හෙයකින් එහි රැස්වීමක් පැවැත්වීමට අවසර ලබා ගැනීමට නොහැකි වුවහොත් ඒ බව දැනුම්දෙන ලෙසත් එහිදී එවිට එය වෙන්කර දීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවත් එමෙන් ම ඊට අවසර දෙන ලෙස පොලිසිය වෙතද දැන්වීමට කටයුතුකරනු ලබන බවත් ඒ පිළිබඳව විමසූ දයා පැල්පොල මහතාට මැතිවරණ කොමසාරිස් දැන්වීය.

11. මෙහිදී යළිත් කරුණු දැක්වූ සිරිතුංග ජයසූරිය මහතා, සිය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා බලපා ඇති අපහසුතා පිළිබඳව දන්වා සිටි අතර වැල්ලවත්ත පොදු වෙළෙඳ සංකීර්ණය ඉදිරිපිට ඇති භූමිය ඉල්ලා සිටි අවස්ථාවේදී මාර්ගය අවහිර වන බැව් පවසමින් ඊට අවසර නුදුන් අතර කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් පශු වෛද්‍ය වාර්තාවක් තමන් වෙතින් ඉල්ලා සිටින ලද බව මෙහිදී දන්වා සිටින ලදී.

ඒ සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර සිටිමින්, මේ පිළිබඳව විමසමින් විශේෂ ලිපියක් කොළඹ නාගරික කොමසාරිස් වෙත යොමු කිරීමට කටයුතු කිරීමට සටහන් තබා ගන්නා බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලදුව කොළඹ නාගරික කොමසාරිස් විසින් නිකුත් කළ අදාළ ලිපියේ පිටපතක් ඉදිරිපත්කරන ලෙස සිරිතුංග ජයසූරිය මහතා වෙත දන්වා සිටියේය. එමෙන්ම මෙවන් අවස්ථාවක් සම්බන්ධයෙන් මීන් පෙර ද වාර්තා වූ බවත් මාර්ගය හරස් වේ යැයි තමා වෙත ලබා නොදුන් භූමියක් ජනාධිපතිවරයා සහභාගී වූ නිවාස අධිකාරියේ රැස්වීමක් සඳහා ලබා දී තිබූ බවත් රවී කරුනානායක මහතා පෙන්වා දෙන ලද අතර ඒ සම්බන්ධයෙන් අදාළ අදාළ සියලුම දෙනා වෙත ලිඛිතව දන්වා ඇති බවත් ඒ

මහතා වැඩිදුරටත් දැනුම්දෙන ලදී. මේ සම්බන්ධයෙන් යම් පාර්ශ්වයක් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මැතිවරණ කොමසාරිස් ද වගඋත්තරකරු ලෙස නම්කොට පැමිණිලි කරන විටකදී ඒ සම්බන්ධව කරුණු දැක්වීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටියේය. පළාත් පාලන ආයතනවල සභාපති වරුන් විපක්ෂයේ රැස්වීම් පැවැත්වීමට ඉඩ කඩ වෙන් කර නොදෙන බවට පැමිණිලි ලැබී ඇති බවත්, ඡන්ද විමසීම් කටයුතු සාධාරණව පැවැත්වීම සඳහා රැස්වීම් සඳහා ඉඩ කඩ ලබා දීම අත්‍යාවශ්‍ය හෙයින් මේ සම්බන්ධයෙන් ස්වකීය පක්ෂයේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය දේශපාලනඥයින්ට දැනුම්දීමක් කරන ලෙස සුසිල් ප්‍රේමජයන්ත් මහතා වෙතින් මෙහිදී මැතිවරණ කොමසාරිස් ඉල්ලා සිටියේය.

12. ඉකුත් දිනකදී මාධ්‍යවේදී පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රී රංගා මහතා විසින් මෙහෙයවන ලද දේශපාලන සාකච්ඡාවකදී ආරාධිතයකු ලෙස ඊට සහභාගී වූ ගරු රිෂාඩ් බදුර්ඩීන් අමාත්‍යවරයා හිතාමතා අපහසුතාවට පත් කිරීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී කරුණු දක්වා සිටි අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසයෙහි ලේකම්වයි.එල්.එස්. හමීඩ් මහතා ප්‍රකාශකර සිටියේ ඔහු මාධ්‍යවේදියකු පමණක් නොව පාර්ලිමේන්තුව නියෝජනය කරනුලබන දේශපාලන පක්ෂයක නියෝජිතයකු ද වන හෙයින් මෙවන් මාධ්‍ය සාකච්ඡා සඳහා පෙනී සිටීමට අවසර ලබා දීමෙන් මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කර ඇති මාධ්‍ය උපමාන උල්ලංඝනය වන බවයි.

මෙහිදී අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටියේ අද දින ජනමාධ්‍ය ආයතන සාකච්ඡාවට පැමිණෙන සිරස මාධ්‍ය ජාලයේ නියෝජිතයින්ට මේ බව නැවත දන්වන බවත් මේ සම්බන්ධයෙන් ඔවුන් වෙත මෙයට පෙර ලිඛිතව දැනුම්දී ඇති බවත් ය.

13. මැතිවරණ නීති රීති උල්ලංඝනය වන ආකාරයෙන් අපේක්ෂකයින් ප්‍රවර්ධනය කරමින් ප්‍රදර්ශනය කරනු ලබන පෝස්ටර් / කටවුටි ඉවත් කිරීම සඳහා පොලිසියට බලයක් නැතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් කර ඇති ප්‍රකාශය ඒ මහතා විසින් නිවැරදි කළ යුතුව ඇතැයි පසුගිය සාකච්ඡා වාරයේදී කතිකාවට ලක් වූ නමුත් මේ වන විටත් එවැන්නක් සිදු කර නොමැති අතර එය නිවැරදිකිරීමට පියවර ගත යුතු බැව් විජයදාස රාජපක්ෂ මහතා විසින් පෙන්වා දෙන ලදී. එහිදී කරුණු දක්වමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණි නවරත්න මහතා ප්‍රකාශ කර සිටියේ ඒ මහතා ප්‍රකාශ කිරීමට උත්සාහ දරා ඇත්තේ නාමයෝජනා දිනට පෙර ප්‍රදර්ශනය කෙරුණු පෝස්ටර් මැතිවරණ වැරදි නොවන බවත් එහිදී වැරදීමකින් මෙවැන්නක් ප්‍රකාශ වී ඇති බවත් ය. එහිදී කරුණු දැක්වීමට එක්වූ මැතිවරණ කොමසාරිස්, පසුගිය සැසි වාරයේ සාකච්ඡා සටහන උපුටා දක්වමින් පෙන්වා දෙන ලද්දේ මෙම ප්‍රකාශය නිසැක වශයෙන්ම පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් නිවැරදි කළ යුතුව ඇති බවට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණි නවරත්න මහතාඑහිදී පැවසූ බවයි. ඒ අනුව මෙම ප්‍රකාශය පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව ද දන්වන ලදී.

14. නව සමසමාජ පක්ෂයේ අපේක්ෂකයකු වන සුන්දරම් මහේන්ද්‍රන් මහතා විසින් පෙන්වා දෙන ලද්දේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා ඒ ඒ අපේක්ෂකයින්හට සිංහල, දමිළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම භාෂාවකින් ජනතාව ඇමතීම සඳහා අවකාශ ලබා දෙන ලෙස දන්වා තිබුණද ඔවුන් සිංහල භාෂාවෙන් පමණක් ප්‍රචාරණ කටයුතු සිදු කරන ලෙස ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව විසින් තමන් වෙත දන්වා සිටින බවයි. එහිදී අදහස් දක්වමින් ඒ සම්බන්ධයෙන් සොයා බලන බවත්, ***අදාළ අපේක්ෂකයින්හට ස්වකීය ප්‍රචාරණ කටයුතු දමිළ භාෂාවෙන්ද සිදු කිරීමට අවස්ථාව දෙන ලෙස දැන්වීමට කටයුතු කරන බවත් යම් හෙයකින් එවැනි ප්‍රකාශයක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව විසින් විකාශය කළ නොහැකි නම් දමිළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කළහැකි නාලිකාවක් භාවිතා කිරීම සඳහා අදාළ අපේක්ෂකයින්හට වැය වන බර පැන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව විසින් දැරිය යුතු බැව් එහි සභාපති වෙත දන්වා සිටින බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටින ලදී.***

එමෙන්ම දමිළ භාෂාවෙන් ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට ඉඩ ලබා දිය නොහැකි යැයි ගුවන්විදුලි සංස්ථාව විසින් අපේක්ෂකයන් වෙත ලිඛිතව දන්වන්නේ නම් එසේ දන්වනු ලබන නිලධාරියාට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිදි කටයුතු කළ හැකි බැව් ද මැතිවරන කොමසාරිස් පෙන්වා දෙන ලදී.

15. තමන් වත්මන් ජනාධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටින බැව් ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනෙකු විසින් මෙවන විටත් ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව එම අපේක්ෂකයින් විසින් මැතිවරණය සම්බන්ධයෙන් සිදු කරනු ලබන වැරදිකිරීයා / අක්‍රමිකතා සහ ප්‍රකාශ සම්බන්ධ වගකීම ද වත්මන් ජනාධිපතිවරයා වෙත පැවරෙන බවත් අදාළ අපේක්ෂකයින් එසේ පෙනී නොසිටින්නේ නම් ඒ සම්බන්ධයෙන් වත්මන් ජනාධිපතිවරයාට හෝ එතුමාගේ නියෝජිතයින්ගට ප්‍රකාශයක් නිකුත් කිරීමට හැකියාව පවතින බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කර සිටියේය. කෙසේ වුවද එම අපේක්ෂකයින් දෙදෙනා හට පක්ෂ කාර්යාල පිහිටුවීමට අවසර නොදෙන බව දැන්වූ මැතිවරණ කොමසාරිස් ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් මොවුන්හට වෙන් කර දී ඇති ගුවන් කාලය වෙනත් පාර්ශ්ව ප්‍රවර්ධනයට යොදා නොගත යුතු අතර ස්වකීය ප්‍රචාරණය ඉටු කර ගැනීම සඳහා පමණක්ම භාවිතා කළ යුතුව ඇති බවද දන්වන ලදී. මේ අතර සිටින ඇතැම් අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයන්ගට මාධ්‍ය හරහා ප්‍රසිද්ධ රැස්වීම් හරහා අපහාස කරමින් සිටින බව ද මෙය ඉතා කණගාටුවට කරුණක් වන බව ද තව දුරටත් ප්‍රකාශ කරසිටි මැතිවරණ කොමසාරිස් ***මාධ්‍ය හරහා ජනාධිපති අපේක්ෂකයින්ගට ප්‍රචාරණ කටයුතු සඳහා අවස්ථාව ලබා දීමේදී සෙසු අපේක්ෂකයින් නිර්දය ලෙස හා අපහාසාත්මක ලෙස වෙරී භාෂාවෙන් විවේචනය කිරීමට අවකාශ නොදෙන ලෙසත් අදාළ අපේක්ෂකයාගේ කථාව සඳහා පමණක් ඉඩකඩ සළසන ලෙසත් ජාතික රූපවාහිනී සේවය සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වෙත ලිඛිතව දැනුම්දීමට සටහන් කර ගනු ලබන බවද මැතිවරණ කොමසාරිස් මෙහිදී සඳහන් කර සිටියේය.***

16. රජයේ කාර්යාලවල සහ පාඨශාලා ආයතනවල කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ඡන්දය ආයාචනා කර සිටීම සඳහා එම ස්ථානවල ප්‍රචාරණ කටයුතු වල නොයෙදෙන ලෙස මැතිවරණ කොමසාරිස් විසින් සියලු අපේක්ෂකයින් වෙත දන්වා සිටින ලදී. එමෙන්ම ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් උපයෝගී කොට ගෙන ඡන්දය ප්‍රකාශ කළ යුතු ආකාරය රජයේ සේවකයින්ගට පෙන්වා දීමට ඇතැම් පාර්ශ්ව කටයුතු කරමින් පවතින බැව් තොරතුරු ලැබී ඇති බවත් මෙවන් ක්‍රියා සිදුවීම වහා වළක්වාලිය යුතුව ඇති බව ද දන්වන ලදී.

17. ඡන්ද නියෝජිතයින් 2014.12.21 දිනට ප්‍රථම පත් කිරීමට පියවර ගන්නා ලෙස සියලු පාර්ශ්ව වෙත මෙහිදී යළිත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධයෙන් ස්වකීය කඩිනම් අවධානය යොමු කරන ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්, වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ නියෝජිත ලෙස සහභාගී වන සුසිල් ප්‍රේමජයන්ත් මහතාගෙන් සහ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නියෝජිත වශයෙන් සහභාගී වන විජයදාස රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටි අතර සෙසු අපේක්ෂකයන් ද ඡන්ද නියෝජිතයන් ද මේ සඳහා ස්වකීය අවධානය වහාම යෙදවීම අත්‍යාවශ්‍ය බව ද පෙන්වා දෙන ලදී.

18. සමහර මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයින් පක්ෂපාතී බැව් ශ්‍රීලංකා නිදහස් නීතීඥ සංගමයේ සභාපති පී. සී. මෙන්ඩිස් මහතා විසින් ලිඛිතව දන්වමින්එවැනි නිරීක්ෂණ සංවිධානවල හැසිරීම පිළිබඳව සිය විරෝධතාව දන්වා ඇති බැව් මේ අවස්ථාවේදී සභාව වෙත දන්වා සිටි මැතිවරණ කොමසාරිස්එම සභාපතිවරයා,එම සංවිධානයේ ලේකම් චම්පානි පද්මසේකර මහතා, භාණ්ඩාගාරික සාලිය මැතිව් මහතා සහ සාමාජිකයන් වන අනුර ජයසිංහ, පාලිත ගමගේ සහ සුමිත් විජේසිංහ යන මහත්වරුන්ගේ ද මෙමසියලුම නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන්ගේ ද සහභාගීත්වයෙන් සාකච්ඡා කිරීමෙන් මෙම ගැටළුව විසඳා ගැනීමට අපේක්ෂා කරන බවමෙහිදී දැන්වී ය.

19. විජේදාස රාජපක්ෂ මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් වත්මන් ජනාධිපතිවරයාගේ ඉතා දැවැන්ත පෝස්ටර්/ කටවුටි එසේම පවතින විට ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රචාරණ රැස්වීමක් නිවේදනය කිරීම සඳහා විවිධ ස්ථානවල ප්‍රදර්ශනය කළ ඉතා කුඩා ප්‍රමාණයේ පෝස්ටර් ඉවත් කිරීමට මහරගම සහ කොට්ටාව යන පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් විසින් කටයුතු කර ඇති බවත් එය බෙහෙවින් පක්ෂපාතී ක්‍රියාවක් බව පැවසීය. මේ සම්බන්ධයෙන් විමසීම සඳහා අදාළ පොලිස් ස්ථානාධිපතිවරුන් දෙපළ මැතිවරණ මහ ලේකම් කාර්යාලයට කැඳවන ලෙස ඒ අවස්ථාවේදී මැතිවරණ කොමසාරිස් විසින් උපදෙස් ලබා දෙන ලදී.

මේ පිළිබඳව කරුණු දක්වමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණි නවරත්න මහතා ප්‍රකාශ කර සිටියේ එම පෝස්ටර්වල අපේක්ෂක රුව ප්‍රදර්ශනය වී තිබීම හේතුවෙන් අදාළ ස්ථානාධිපතිවරුන් විසින් ඒවා ඉවත් කිරීමට කටයුතු කර ඇති බවයි.

එහිදී මැතිවරණ කොමසාරිස් තව දුරටත් පැහැදිලි කර සිටින ලද්දේ ප්‍රචාරණ රැස්වීම් සම්බන්ධයෙන් ප්‍රදර්ශනය කරනු ලබන නියමිත ප්‍රමාණයකින් යුතුව සකස් කරනු ලබපෝස්ටරයක අදාළ රැස්වීම පැවැත්වෙන දිනය, වේලාව, ස්ථානය සහ සහභාගී වන කථිකයින් පිළිබඳ තොරතුරු වලට අමතර වශයෙන් අපේක්ෂකයාගේ රුව ප්‍රදර්ශනය කිරීම වරදක් නොවන බවට පොදු එකඟතාවකට පැමිණිය හැකි නම් සියලු පාර්ශ්ව කෙරෙහි එය පහසුවක් වනු ඇති බවය. එහිදී සභාවේ එකඟතාව ද ඊට හිමි විය.

තවද හලාවත ප්‍රදේශයේ මැතිවරණ කාර්යාලයක් විවෘත කරනු ලබන අවස්ථාවේදී එම ප්‍රදේශයේ පොලිස් සිථානාධිපති විසින් එම උත්සව සභාවේ පහන් සිළු දල්වාලූ බවට තොරතුරු සනාථ වී ඇති අතර බවත් මේ සම්බන්ධයෙන්පරීක්ෂණයක් පවත්වන ලෙසත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණි නවරත්න මහතා වෙත දන්වන ලදී. එහිදී ඒ මහතා විසින් ප්‍රකාශ කරනු ලැබුයේ මේ වන විටත් ඒ සඳහා පරීක්ෂණයක් ආරම්භකොට ඇති බවයි.

20. අනතුරුව අදහස් දැක්වීමට එක්වූ ජනාධිපති අපේක්ෂක පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි විසින් පෙන්වා දෙන ලදදේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා පොලිසිය වෙතින් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය සඳහා අවසර ඉල්ලා සිටින විටදී එම අවසර නිකුත් කිරීමට දින ගණනාවක්ම ලබා ගන්නා බැවින් එහිදී තමන්හට අපහසුතාවන්ට මුහුණ පෑමට සිදුවන බවත්ය.

එහිදී කරුණු පැහැදිලි කර සිටි මැතිවරණ කොමසාරිස්, බත්තරමුල්ලේ සීලරතන හිමිගේ යෝජනාවක අනුව මෙම රැස්වීමේදී තීරණය වූ පරිදි මැතිවරණ කාලසීමාවේදී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා අපේක්ෂකයින්/ නියෝජිතයින් විසින් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතයට ගැනීමට අවසර ඉල්ලා සිටින විට ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දීකටයුතු කරන ලෙස සියලුම පොලිස් ස්ථාන දැනුවත් කිරීමට කටයුතු කරනුලබන බව ප්‍රකාශ කර සිටින ලදී.

තවද මාවනැල්ල ප්‍රදේශයේ පොදු බස් නැවතුම්පළ භූමිය දේශපාලන පක්ෂයක් විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී එය ලබා නොදීම සම්බන්ධව ජනමාධ්‍ය විසින් ඉතා පුළුල් ලෙස වාර්තා කර තිබුණද සත්‍ය වශයෙන්ම අදාළ ස්ථානය ලබා දී නොමැත්තේ මින් පෙර කිසිදු හෝ අවස්ථාවකදී එය මැතිවරණ ප්‍රචාරණය සඳහා රැස්වීම් පැවැත්වීම සඳහා යොදාගෙන නොමැති නිසාත් එම ප්‍රදේශයේසාමාන්‍යයෙන් එසේ ලබා දෙන්නේ පාසැල් ක්‍රීඩාභූමිය වන බවත් එදින විභාග පැවැත්වුණ බැවින් ක්‍රීඩා භූමිය ලබා දීමට ද හැකියාවක් ලැබී නොමැති බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටියේය. අනතුරුව අදාළ රැස්වීම වෙනත් ස්ථානයකපවත්වා ඇති බවත් රැස්වීම පැවැත්වීම සඳහා ස්ථානයක් ලබා ගැනීම සඳහා කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ද මැදිහත් වී ඇති බවත් දැන්වූ මැතිවරණ කොමසාරිස් මෙම සිද්ධියෙන් ද මාවනැල්ල ප්‍රාදේශීය සභාවට දෝෂාරෝපණය කිරීම යෝග්‍ය නොවන බව දැන්වීය.

21. අශක්නුතාවන්ට ලක්වූ ඡන්ද දායකයින් හට සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පනත ප්‍රකාරව ඡන්දපොළට සහායකයකු කැටුව යාමට අවස්ථාව ඇති අතර එසේම අදාළ ඡන්ද දායකයාගේ ඡන්ද පත්‍රිකාව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති ඉදිරියේදී සලකුණු කිරීමට එසේ කැටුව පැමිණෙන සහායකයාට හැකි වුවත් එවැනි සහායකයින් රහිතව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති (SPO)මඟින් සිය ඡන්දය සලකුණු කිරීම සඳහා ද ඇතැම් අශක්නුතාවන්ට ලක් වූවන් පැමැණෙන බැවින් තවත් නිලධාරියකු ද ඉදිරියේ එසේ පැමිණෙන පුද්ගලයාගේ ඡන්දය සලකුණු කිරීමට ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිහට හැකියාව පවතින බවට වෙනත් මැතිවරණ / ඡන්ද විමසීම් අවස්ථාවල මෙවැනි සාකච්ඡා සභාවකදී පොදු එකඟතාවකට පැමණෙන බැවින් මෙවරද එවැන්නකට එළඹීමේ අවශ්‍යතාව මෙහිදී මහැතිවරණ කොමසාරිස් විසින් පෙන්වා දෙන ලද අතර ඊට සියලු පාර්ශ්වවල එකඟතාව සුපුරුදු පරිදි ලැබිණි.

22. සේවා නියුක්තියන්හට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පදිංචි ගම් බිම් වෙත යාමට හැකි වන පරිදි නිවාඩු ලබා දෙන ලෙස අදාළ ආයතන / සේවා ස්ථාන / වැඩ බිම් හිමිකරුවන් වෙතින් ඉල්ලා සිටීමට පුවත්පත් දැන්වීමක් පළ කිරීමට පියවර ගන්නා බව මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් එපරිද්දෙන්ම දැන්වීම් පළ කරමින් අදාල අයවලුන්හට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සළසා දීමට සියලු දෙනාම කටයුතු කිරීමේ ඇති වැදගත් කම මෙහිදී පෙන්වා දෙන ලදී. තවද මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව ද මැදිහත්වීමට අපේක්ෂා කරන බව දන්වා ඇති බවත් කමිකරු කොමසාරිස් ජනරාල්වරයා ද සමඟ මේ සම්බන්ධයෙන් සමීපව කටයුතු කිරීමට යෝජිත බවත් මැතිවරණ කොමසාරිස් දැන්වීය.

23. ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ මහලේකම්ව සිටියදී වත්මන් ජනාධිපතිවරයා අගය කරමින් පවත්වන ලද කථාවක් දිගින් දිගටම මාධ්‍ය හරහා විකාශය වූ හෙයින් එය නවත්වාලන ලෙස විජේදාස රාජපක්ෂ මහතා විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඒ බැව් අදාළ මාධ්‍ය ආයතන වෙත දන්වා සිටීමෙන් අනතුරුව විකාශය නැවැත්වීමට කටයුතු කළ මාධ්‍ය ආයතන වෙත ස්වකීය ස්තුතිය හිමි වන බැව් මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් මෙම විකාශය අත්හිටුවීමට උපදෙස් ලබාදෙන ලෙස ඒ අවස්ථාවේදී ජනාධිපතිවරයා ද දැනුවත් කිරීමට කටයුතු කළබව ද දැන්වීය.එසේ වුවද තවමත් සමහර ආයතන එකී දැන්වීම ප්‍රචාරය කරන විට ශාමිලා පෙරේරා මහත්මිය දැන්වීය.

24. මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලදී සියලුම මාධ්‍ය අපක්ෂපාතීව ක්‍රියා කරතැයි යන්න තම විශ්වාසය වන බවත් විශේෂයෙන්ම ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන්විදුලි සේවාව පෙරට වඩා සමබර ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන බැව් ද මෙහිදී සඳහන් කර සිටි මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධව සුපරීක්ෂාකාරී වීමට අදාළ නිළධාරීන් පත් කර ඇති බවද දන්වා සිටියේය. ඊට පරිබාහිරව විවිධ ස්වේච්ඡා සංවිධාන සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ද තත්වය නිරීක්ෂණය සඳහා නියෝජිතයින්පත් කර ඇති බව ද පැවසීය. එමෙන්ම පක්ෂපාතී ප්‍රචාර සම්බන්ධයෙන් පැහැදිලි වාර්තා පක්ෂ නියෝජිතයන් තමා වෙත ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳ පියවරගත හැකි බව මැතිවරණ කොමසාරිස් දැන්වීය.

25. යම් ඡන්දදායකයකුහට ඇති බිය හේතුවෙන් තම ඡන්දපොළේදී ඡන්දය ප්‍රකාශ කිරීමට අපහසු වන්නේ නම් එම ඡන්දය මැතිවරණ කොමසාරිස් විසින් නියම කරනු ලබන ස්ථානයකදී ප්‍රකාශ කළ හැකි බවට පනතේ පවතින වගන්තිය පරිද්දෙන්ම, රැකියාවේ අත්‍යවශ්‍යතාව හේතුකොටගෙන සිය ඡන්දය ප්‍රකාශ කිරීමට ඡන්දපොළට යාමට නොහැකි වෙතැයි සිතන අයවලුන් හටද ජාතික මැතිවරණයකදී එම ඡන්දය මැතිවරණ කොමසාරිස් විසින් නියම කරනුලබන ස්ථානයකදී ප්‍රකාශ කළ හැකි බවට පනතට සංශෝධන එක් කළ හැකිනම් වඩා අගනේ යැයි මෙහිදී මැතිවරණ කොමසාරිස් විසින් පෙන්වා දෙන ලද අතර එය සභාවේ පොදු එකඟතාව ලැබුණි. එසේ වුවද ක්‍රියාත්මක කිරීම සඳහා මේ සංශෝධන පාර්ලිමේන්තුව හරහා සිදු කරනු ලැබීම අත්‍යාවශ්‍ය බව මැතිවරණ කොමසාරිස් පෙන්වාදෙන ලදී.

26. රජයේ පාසල්වල මහින්දෝදය විද්‍යාගාර විවෘත කිරීම, තැපැල් කාර්යල විවෘත කිරීම යනාදිය ඇතුලු විවිධ විවෘත කිරීම් සඳහා වත්මන් ජනාධිපතිතුමා සහභාගී වීම හා එකී රැස්වීම් හරහා එතුමන්ගේ අපේක්ෂකත්වය ප්‍රවර්ධනය කිරීමට එරෙහිව ශලීල මුණසිංහ මහතා කරුණු දැක්වූ අතර මේ පිළිබඳව තමා වෙත වෙනත් පැමිණිලි ද ලැබී ඇති බව මැතිවරණ කොමසාරිස් දැන්වීය. ස්වකීය නිල තත්ත්වය මත අත්‍යවශ්‍යයෙන්ම සහභාගීවිය යුතු රාජ්‍ය උත්සව සඳහා හා අති විශේෂිත සංවත්සර/ අවස්ථා සැමරීමේ උත්සව සඳහා හැර වෙනත් රාජ්‍ය උත්සව සඳහා වත්මන් ජනාධිපතිතුමා සහභාගී නොවනු ඇතැයි තමා අපේක්ෂා කරන බවත් අනවශ්‍ය උත්සව සඳහා එතුමාට ආරාධනා කිරීමෙන් වැලකී සිටින ලෙස අමාත්‍ය ලේකම්වරුන්ට දන්වා ඇති බවත් මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මහින්දෝදය උත්සව හා සෙසු රාජ්‍ය උත්සව වීඩියෝ කිරීමටත් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධන ක්‍රියා සිදු වන බව පෙනී ගියහොත් එවැනි අවස්ථා/ උත්සව කල් තැබීමට නියම කරන බව ද මැතිවරණ කොමසාරිස් දැන්වීය.

27. සංවර්ධන කාර්යයන් සඳහා වුවද වත්මන් ජනාධිපතිවරයාගේ රුව ප්‍රදර්ශනය කිරීම් මැතිවරණ කාලපරිච්ඡේදයේදී නීති විරෝධී වන අතර එමඟින් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමේ වරද ස්ථාපනය කරනු ලබන බවත් මේ අවස්ථාවේදී අවධාරණය කළ මැතිවරණ කොමසාරිස් දිවයිනේ විවිධ ප්‍රදේශවල මෙවැනි

ප්‍රදර්ශන දක්නට ලැබෙන බවත් නීතිය රැවටීමට උත්සාහ කිරීමෙන් තොරව අදාළ පාර්ශ්ව විසින් මේවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුව ඇති බව හලාවත ප්‍රදේශයේ ප්‍රදර්ශනය කෙරෙන පෝස්ටරයක් පළිබඳව නිදසුන් ඉදිරිපත්කරමින් මෙහිදී පැහැදිලි කර සිටින ලදී. එසේ නොවුවහොත් මේවා ඉවත් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා බවද මෙහිදී දන්වා සිටින ලදී.

තවද වත්මන් ජනාධිපතිවරයාගේ සහ අධ්‍යාපන අමාත්‍යවරයාගේ රූ දැක්වෙන කටවුට් / බැනර් / පාසැල් පරිශ්‍ර තුළ බොහෝසෙයින් දක්නට ලැබෙන බවත් බොහෝ පාසැල්,තැපැල් ඡන්ද සළකුණු කිරීමේ මධ්‍යස්ථානය ලෙස යොදා ගන්නා ස්ථාන වන බැවින් 2014.12.22 දිනට පෙර මේවා ඉවත් කිරීමට පියවර ගත යුතු බවත් නැතහොත් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඒවා ඉවත් කිරීමට කටයුතු කරන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දැන්වීය. එමෙන්ම සෙසු පළාත්වල ඇති ප්‍රදර්ශන පුවරු ඉවත් කරවන ලෙස අධ්‍යාපන බලධාරීන් හරහා විදුහල්පතිවරුන්ට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරනුලබන බවත් එමෙන්ම ජාතික පාසැල් අධ්‍යක්ෂ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වරුන් මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවා සාකච්ඡා කිරීමට ද අපේක්ෂිත බැව් මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටියේය. තවද මෙම පෝස්ටර් / කටවුට් උපදෙස් ලබා දී ඇති පරිදි අදාළ පාර්ශ්ව විසින් ගැලවීමට කටයුතු නොකරන්නේ නම් ඡන්ද විමසීම පැවැත්වීමට බාධාවීම වැලැක්වීම පිණිස ඒවා මැතිවරණ දෙපාර්තමේන්තුවන විසින් ගලවා ඉවත් කරනු ලබව බවත් තව දුරටත් දැන්වීය.

ඡන්ද විමසීම් නීති පිළිබඳව දැනුවත් කිරීම් / උපදෙස් දීම් කර තිබියදීත් යම් පාර්ශ්වයක් විසින් නීති පිළිබඳව හා සදාචාරය පිළිබඳව තැකීමෙන් තොරව දිගින් දිගටම මැතිවරණ නීති උල්ලංඝනය කරමින් කටයුතු කරන්නේ නම් එකී නීති විරෝධී ක්‍රියා මඟින් ප්‍රවර්ධනය කෙරෙන එම අපේක්ෂකයින් විසින් නීති උල්ලංඝනය කරනු ලබන බවට ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීමට වුවද සිදු විය හැකි බව මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටි අතර මේ සම්බන්ධයෙන් සෙසු පාර්ශ්ව ද දැනුවත් කරන ලෙස ද සියලු දෙනා වෙත දන්වන ලදී.

28. ඕනෑමපාර්ශ්වයක්හටයම්ගැටළුවක්ඇත්නම්මැතිවරණකොමසාරිස්හමුවීසාකච්ඡාකිරීමටහැකිසෑමවිට වඅවස්ථාවවිවෘතව ලබා දී තිබියදීත්, එවැනි ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමෙන් තොරව මැතිවරණ මහලේකම් කාර්යාලය ඉදිරිපිටදී පසුගිය දා සිදු කරන ලද උද්ඝෝෂණය පිළිබඳව ස්වකීය කණගාටුව ප්‍රකාශ කර බව මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටියේය. මෙවැනි ක්‍රියා හේතුවෙන් සිදුවන්නේ මැතිවරණය කෙරෙහි මහජනතාව තුළ පවතින යහපත් ප්‍රතිමාන බිඳවැටීමෙන් ඔවුන් සිය ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටී බැව් තව දුරටත් පෙන්වා දෙන ලදී.

29. මේ අවස්ථාවේදී දයා පැල්පොල මහතා ප්‍රකාශ කර සිටන ලද්දේ විදේශගත ඡන්ද දායකයින් 130,000 ක් පමණ ඉදිරි ජනාධිපතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මෙරටට පැමිණීමට නියමිත බැව් පුවත්පත් වාර්තා කර තිබූ බවත්, එපමණ පුරවැසියන් සංඛ්‍යාවක් මෙරටට පැමිණීමට නම් ඉතා විශාල ගුවන් යානා සංඛ්‍යාවක් භාවිතා කළ යුතු බවත් එහෙයින් පෙනී යන්නේ සැබැවින්ම මෙම ඡන්ද දායකයින් මෙරටට පැමිණෙනවා නොව ඔවුනගේ ඡන්දය ව්‍යාජ ලෙස ප්‍රකාශ කිරීම සඳහා සැළසුම් සහගත වැඩපිළිවෙලක් ආණ්ඩුව විසින් දියත් කරමින් පවතින බැව් වන බවයි.

මේ පිළිබඳව ස්වකීය අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස් දන්වා සිටින ලද්දේ එවැනි අක්‍රමිකතාවක් සිදු වීමට කිසිඳු ආකාරයක ඉඩක් නොතබන බවත් විදේශගත ඡන්දදායකයින්ගේ නම් අදාළ ඡන්දපොළ වෙත යැවෙන ඡන්දහිමි නාමලේඛනයේ ***විදේශගත ඡන්ද දායකයකු ලෙස*** සටහන් කර යැවෙන බවත් ඒ අනුව “A” (Abroad) වශයෙන් එහි සලකුණක් යොදන බවත්ය. යම් ඡන්ද දායකයකු එසේ සලකුණු කිරීමෙන් පසුව මෙරටට පැමිණෙන්නේ නම් සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඔහුගේ / ඇයගේ වලංගු ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුව ඇති බව ද මැතිවරණ කොමසාරිස් මෙහිදී තව දුරටත් පැහැදිලි කර සිටියේය.

ඒ අනුව මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටින ලද්දේ, ඡන්දපොළ වෙත සපයා ඇති ඡන්දහිමි නාමලේඛනයේ ස්වකීය නම ඉදිරිපිට “A” සඳහන් සියලුම ඡන්ද දායකයින් විසින් සිය ඡන්දය ඡන්දපොළේදී

ප්‍රකාශ කිරීම සඳහා වලංගු ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතු බවට අදාළ පාර්ශ්ව දැනුවත් කිරීමට සටහන් තබා ගන්නා බවයි.

30. ගල්නෑව ප්‍රදේශයේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වූවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගැනීමට පොලිසිය ක්‍රියා කර තිබීම සතුටට කරුණක් වන බැව් මෙහිදී පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් මෙවැනි ක්‍රියා පිළිබඳව අවධානයෙන් පසුවීම සම්බන්ධව මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙතද සිය සතුට පළ කර සිටියේය. සෙසු ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ද කඩිනමින් ක්‍රියා කිරීමට අත්‍යාවශ්‍ය බව මැතිවරණ කොමසාරිස් දැන්වීය. එමෙන්ම වත්මන් ජනාධිපතිවරයා වෙත සහාය පළ කරමින් බෙරුවල ප්‍රදේශයේදී පැවැති පෙළපාලිය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වූ බෙරුවල පොලිස් ස්ථානාධිපතිවරයා වෙතින් ඒ පිළිබඳව කරුණු විමසා සිටීමට මැතිවරණ මහලේකම් කාර්යාලය වෙත කැඳවීමට කටයුතු කරනු ලබන බැව් ද දැන්වීය.

තවද තම පාක්ෂිකයින් / ආධාරකරුවන් මැතිවරණ ප්‍රචන්ඩ ක්‍රියාවන්හි නිරත වීම හේතුවෙන් පොලිස් අත්අඩංගුවට පත් වූ විට ඔවුන් නිදහස් කිරීම සඳහා පොලිසිය වෙත බලපෑම් කිරීමට එක්තරා දේශපාලනඥයකු විසින් ක්‍රියා කර තිබීම ඉතා කණගාටුදායක තත්ත්වයක් වන බැව් මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටින ලදී. මෙය සැබැවින්ම නීතියට අභියෝගයක් වන බවත් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම උදෙසා මෙවැනි ක්‍රියා වළක්වාලීම සඳහා සියලු පාර්ශ්ව වගකීමෙන් යුතුව කටයුතු කළ යුතු බවත් දන්වා සිටි අතර දේශපාලනඥයින් විසින් මෙවැනි ක්‍රියා සිදු කිරීම හේතුවෙන් නීතියට සිදුවන කැළල සුළුපටු නොවන බැවිනුත් මෙවන් ක්‍රියාවන්ට එරෙහිව නීති ඉතා තදින් බලාත්මක කළ යුතු බවද දන්වා සිටින ලදී.

31. මේ අවස්ථාවේදී කරුණු පැහැදිළි කරමින් ඉලංකෙයි තමිල් අරසුකච්චි පක්ෂයෙහි එම්.ඒ. සුමන්තිරන් මහතා ප්‍රකාශ කර සිටියේ යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ප්‍රධාන අමාත්‍යතුමා හා ඩග්ලස් දේවානන්ද අමාත්‍යතුමා ද සෙසු මහජන නියෝජිතයන්ද දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමට සහභාගී වී

සිටියදී, මැතිවරණ කොමසාරිස් විසින් දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්මේදී දේශපාලන කටයුතු සාකච්ඡා නොකරන ලෙසට දන්වා ඇති ලිපිය දිස්ත්‍රික් ලේකම් විසින් ඉදිරිපත් කල පසුව ඩග්ලස් දේවානන්ද අමාත්‍යතුමා දේශපාලනමය කථාවක් පැවැත්වීමට එරෙහිව ස්වකීය පක්ෂයේ ක්‍රියාකාරීන් විසින් දක්වන ලද විරෝධතාව හේතුවෙන් ආණ්ඩු පාක්ෂිකයන් විසින් සභාව තුළ නොසන්සුන් වාතාවරණයක් ඇති කල බවයි.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කර සිටි මැතිවරණ කොමසාරිස් අදාළ කරුණ සම්බන්ධයෙන් යාපනය දිස්ත්‍රික් ලේකම් විමසීමට කටයුතු කරනු ලබන බවත් පැමිණිල්ලක් ලෙස මෙය සටහන් කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් ප්‍රකාශ කළේය.

දයා පැල්පොළ මහතා ද මේ අවස්ථාවේදී අදහස් දන්වමින් ඉල්ලා සිටියේ දස වසරකටත් වඩා අධික කාලපරිච්ඡේදයක් විපක්ෂ ක්‍රියාකාරීන් වශයෙන් කටයුතු කර ලබා ඇති අත්දැකීම් ද වර්තමාන තත්ත්වය ද සැලකිල්ලට ගත් විට යම් ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් ඉදිරියේදී ඇති වීමෙහි අඳුරු සෙවණැලි දක්නට ඇති බවත් එහෙයින් එවන් වාතාවරණයක් උද්ගත වීම වලක්වාලීම සඳහා ගත හැකි උපරිම ක්‍රියාමාර්ග වහ වහා ගත යුතුව ඇති බවයි.

එහිදී අදහස් දක්වමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා දන්වා සිටියේ දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ මාර්ග බාධක, ආරක්ෂක මුරපොළ ආදිය නිසි පරිදි ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇති බවත් අක්‍රමිකතා සිදුවීම හැකි උපරිමයෙන්වළක්වාලීම උදෙසා ගත යුතු සියලු ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇති බවත් ඒ සම්බන්ධයෙන් අවිශ්වාසයක් ඇතිකර නොගන්නා ලෙසත් ය.

32. මෙහිදී යළිත් කරුණු දැක්වීමට එක්වූ විජයදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කර සිටියේ පොළොන්නරුවේ විශේෂ කාර්ය බලකා කඳවුරු 05 ක් හා හමුදා කඳවුරු 2ක් හදිසියේම ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇති

බවත් ජනතාවගේ ඡන්දය ප්‍රකාශ කිරීමේදී මෙම කඳවුරු වලින් යම් හෝ බලපෑමක් ඇති වේයැ'යි සැකයක් පවතින බවත් ය.

ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කර සිටි මැතිවරණ කොමසාරිස් පොළොන්නරුව රාජකීය විද්‍යාලයේප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කළකට පෙර ස්ථාපිත කොට තිබූ හමුදා කඳවුර මේ වන විටත් එහි පවතින බවත් පැමිණිල්ලේ සඳහන් අනෙක් ස්ථානයේ හමුදා කඳවුරක් නැති බවත් ප්‍රකාශ කරන ලදී.එසේ වුවද විශේෂ කාර්ය බලකා කඳවුරු පහක් අලුතින් පිහිටුවා ඇති බැවින් ද එම කඳවුරු පොලිස්පතිවරයා යටතේ නොව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් යටතේ පාලනය වන බවට පැමිණිලි ලැබී ඇති බැවින් ද එම කඳවුරු හේතුවෙන් යම් බලපෑමක් ඇතිවිය හැකි බවට විපක්ෂයේ ක්‍රියාකාරීන් තුළ පවතින සැකය හේතුවෙන් ද මෙවැනි කඳවුරු මැතිවරණ සමය තුළ අදාළ ප්‍රදේශයේ පවත්වාගෙන යෑමේ ඇති අවශ්‍යතාව පිළිබඳවනීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් මහින්ද බාලසූරිය මහතා වෙතින් විමසා ඇති බව මැතිවරණ කොමසාරිස් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

33. ගම් මට්මින් කුඩා රැස්වීමක් (Pocket Mee ng) වුවද පැවැත්වීමට කටයුතු කරන්නේ නම් ඒ සම්බන්ධව පොලිසිය දැනුවත්කරමින් අදාළ ආරක්ෂාව ලබා ගැනීමට කටයුතු කරන ලෙස මෙහිදී මැතිවරණ කොමසාරිස් විසින් සියලු පාර්ශ්ව වෙත දන්වා සිටියේය. එහිදී විජේදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කර සිටියේ යම් රැස්වීමක් පැවැත්වීමට ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා බලපත්‍ර ලබා ගත් විට අදාළ ස්ථානය සඳහා පොලිස් ආරක්ෂාව සැපයීමට මින් පෙර පොලිසිය කටයුතු කළ නමුත් වර්තමානයේ එවන් තත්ත්වයක් නොවන බවයි.

යළිත් අදහස් දැක්වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණි නවරත්න මහතා වර්තමානයේ සාමය කඩවීමක් කුමන හෝ අවස්ථාවකදී බලාපොරොත්තු විය හැකි බවත් එබැවින් ඒ පිළිබඳව අවධානයෙන් කටයුතු කල යුතු බවත් රැස්වීම් පැවැත්වෙන්නේ නම් ඒ පිළිබඳව කල්වේලා ඇතිව පොලිසිය දැනුවත් කර ආරක්ෂාව සපයා ගැනීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කර සිටියේය.

එහිදී මැතිවරණ කොමසාරිස් අදහස් දක්වමින් අපේක්ෂකයින් විසින් පවත්වනු ලබන රැස්වීම් සඳහා ප්‍රමාණවත් පරිදි ආරක්ෂාව සපයන ලෙසත්, ජංගම ප්‍රචාරණ කටයුතු (Canvasing) සිදු කරනු ලබන්නේ නම් ඒ සඳහා ජංගම ආරක්ෂක සේවා වල ආරක්ෂාව සපයා දීමට ක්‍රියා කරන ලෙස දිවයිනේ සියලුම පොලිස් ස්ථාන වෙත ලිඛිතව දැනුම්දීමට කටයුතු කරනු ලබන බව ප්‍රකාශ කර සිටින ලදී.

34. ඇතැම් ආසන සංවිධායකවරුන් විසින් තමන්ගේ අභිමතය පරිදි පොලිස් ස්ථානාධිපතිවරුන් ස්ථාන මාරුකර ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව විජේදාස රාජපක්ෂ මහතා මෙහිදී ප්‍රකාශ කර සිටියේය. එහිදී කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස් පොලිසියේ ස්ථාන මාරු වීම් සම්බන්ධව ක්‍රියා කාරීමට තමන්හට බලය හිමි වූ නාමයෝජනා දැන්වීමේ දින සිට එනම් 2014.11.21 දින සිට එවැනි ක්‍රියා කිසිවක් සිදු නුවූ බවත් ඉදිරියේදී ද එවැන්නක් සිදු වීමට කිසි සේත්ම ඉඩ නොමැති බවත් දන්වා සිටින ලදී.

මේ අවස්ථාවේදී එම්.ඒ. සුමන්තිරන් මහතා විසින් පනතේ 104 සී වගන්තිය උපුටා දක්වමින් මැතිවරණ කාලසීමාවේදී සිය අභිමත පරිදි පොලිසිය යෙදවීම සඳහා මැතිවරණ කොමසාරිස්හට හැකියාව පවතින බැව් පෙන්වා දෙන ලද අතර පනත ප්‍රකාරව පැහැදිලි වශයෙන්ම මැතිවරණ කොමසාරිස්ගේ නියෝග පරිදි අදාළ කාලසීමාවේදී පොලිසිය ක්‍රියා කළ යුතුව ඇති බවද ප්‍රකාශ කර සිටින ලදී. එහිදී විජයදාස රාජපක්ෂ මහතා ද පනතෙහි 119 බී වගන්තිය උපුටා දක්වමින් මැතිවරණ කොමසාරිස්ගේ නියෝග පරිදි මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් පොලිසිය ක්‍රියාත්මක විය යුතු බැව් පෙන්වා දෙන ලදී.

මෙම ජනාධිපතිවරණය නිදහස්ව ත් සාධාරණවත් පැවැත්වීම උදෙසා සියලු පාර්ශ්වවල සහාය මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය වන බවත් එමෙන්ම කිසිඳු හෝ බලපෑමකින් තොරව මහජනයාට සිවකීය ඡන්දය අභිමත පරිදි ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දිය යුතු බවත් ඒ වෙනුවෙන් වගකීමෙන් හා උනන්දුවෙන් යුතුව සියලු පාර්ශ්ව කටයුතු කළ යුතු බව මෙහිදී සඳහන් කර සිටි මැතිවරණ කොමසාරිස් වෙනත් ගැටළු හෝ සාකච්ඡා කළ යුතු කරුණු කාරණා වෙත් නම් ඉදිරිපත් කරන ලෙස සභාව වෙත කාල

වේලාව ලබා දුන් අතර එවැන්නක් නොමැති බැව් පෙනී ගියෙන් අද දින සහභාගීත්වය දැක්වූ සැමට යළිත් ස්තුතිය පලකර සිටිමින් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1245 ට අවසන් කරන ලදී.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්.

ජනාධිපතිවරණය - 2015
තරග කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟ
පවත්වන ලද සාකච්ඡාව - 2014.12.26

2014.12.26 දින පැය 1530 ටතරහ කරනු ලබන අපේක්ෂකයින්/ නියෝජිතයින් සමඟ මැතිවරණ මහලේකම් කාර්යාලයේශ්‍රවණාගාරයේදී පවත්වන ලදසාකච්ඡාවේ සටහන්.

සහභාගීත්වය :

1.	අටළුගමගේ රංජිත් මහතා	- නව සම සමාජ පක්ෂය
2.	කේ.මහේන්දිරන් මහතා	- ද්‍රවිඩ ඊළාම් විමුක්ති සංවිධානය
3.	වීරසිංහ ආරච්චිගේ සුනිල් මහතා	- සමාජවාදී සමානතා පක්ෂය
4.	ඒ.ශ්‍රීනාත් ම.පෙරේරා මහතා	- එක්සත් ජාතික පක්ෂය
5.	හේමන්ත වික්‍රමසිංහ මහතා	- අපේ ජාතික පෙරමුණ
6.	අනුරුද්ධ පොල්ගම්පොල මහතා	- ජනාධිපති අපේක්ෂක
7.	ඉන්දික ගාල්ලගේ මහතා	- ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
8.	ඒ.යූ.එම්.මව්ෆිර් මහතා	- නියෝජිත (අයි.එම්.ඉල්යාස් මහතා)
9.	එච්.පී.තුසිත මහතා	- නියෝජිත (අනුරුද්ධ පොල්ගම්පල මහතා)
10.	ශ්‍රීනාත් පෙරේරා මහතා	- නියෝජිත (සිරිතුංග ජයසූරිය මහතා)
11.	රුවන් එෆ්.ගුරුගේ මහතා	- අපේ ජාතික පෙරමුණ
12.	සංඛ ද සිල්වා මහතා	- අපේ ජාතික පෙරමුණ
13.	නිශාන්ත ශ්‍රීවර්ණසිංහ මහතා	- ජාතික හෙළ උරුමය
14.	චම්පානි පද්මසේකර මහතා	- ශ්‍රී ලංකා නිදහස් පක්ෂය/ එක්සත් ජනතා නිදහස් සන්ධානය
15.	අනුර ජයසිංහ මහතා	- එක්සත් ජනතා නිදහස් පක්ෂය
16.	ජයන්ත කුලතුංග මහතා	- එක්සත් ලංකා මහා සභා පක්ෂය
17.	ගාමිණි රණසිංහ මහතා	- එක්සත් ලංකා මහා සභා පක්ෂය
18.	කපිල ගමගේ මහතා	- ජාතික නිදහස් පෙරමුණ
19.	ශ්‍යාමිලා පෙරේරා මහත්මිය	- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
20.	ශලීල මූණසිංහ මහතා	- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
21.	සපුමල් වලව්වත්ත	- ශ්‍රී ලංකා ජාතික පෙරමුණ
22.	අයි. මිෆ්ලාර් මහතා	- එක්සත් සාම පෙරමුණ
23.	රුවන් තිලක පේදුරුආරච්චි මහතා	- එක්සත් ලංකා පොදුජන පක්ෂය
24.	විජයදාස රාජපක්ෂ මහතා	- නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
25.	ඇස්.වී.සී. ඇලෙක්සැන්ඩර් මහතා	- ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
26.	ආර්. යෝගරාජන් මහතා	- එක්සත් ජාතික පක්ෂය
27.	සුසිල් ප්‍රේමජයන්ත මහතා	- එක්සත් ජනතා නිදහස් සන්ධානය
28.	සේපාලිකා ගමගේ වීරසිංහ මහතා	- ජනසෙත පෙරමුණ
29.	දයා පැල්පොල මහතා	- එක්සත් ජාතික පක්ෂය
30.	කේ.මාරිමුත්තු මහතා	- ලංකා කම්කරු කොංග්‍රසය (දේශපාලන අංශය)
31.	නිහාල් ප්‍රේමකුමාර මහතා	- එක්සත් ලංකා පොදුජන පක්ෂය
32.	සරත් මනමේන්ද්‍ර මහතා	- නව සිහළ උරුමය
33.	හරේන්ද්‍ර ගුණතිලක මහතා	- ජාතික හෙළ උරුමය
34.	එස්.එම්.ක්‍රිෂාන්ත මහතා	- පෙරටුගාමී සමාජවාදී පක්ෂය
35.	නුවන් බෝපගේ මහතා	- පෙරටුගාමී සමාජවාදී පක්ෂය
36.	අසාත් සාලි මහතා	- ජාතික සමඟි පෙරමුණ
37.	උපුල් ජයසූරිය මහතා	- ශ්‍රී ලංකා නීතීඥ සංගමය

38. අජිත් පතිරණ මහතා - ශ්‍රී ලංකා නීතීඥ සංගමය
39. වෛද්‍ය නන්ද විජේරත්න - ශ්‍රී ලංකා දෙටු පුරවැසි සම්මේලනය
40. එස්.සී.මායාදුන්න මහතා - ශ්‍රී ලංකා වෘත්තීයවේදීන්ගේ සංගමය

දේශීය නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින්

1. කීර්ති තෙන්නකෝන් මහතා - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE)
2. හර්ෂ ගුණසේන මහතා - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ව්‍යාපාරය (CaFFE)
3. රෝහණ හෙට්ටිආරච්චි මහතා - නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
4. රසංග හරිස්චන්ද්‍ර මහතා - ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
5. දයා හේරත් මහත්මිය - ලක්බිමේ මව්වරු සහ දියණියෝ
6. ශාන් විජේතුංග මහතා - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකා (TISL)
7. චන්ද්‍රසිරි ද සිල්වා මහතා - ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය
8. මංජුල ගජනායක මහතා - මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන්

1. ගාමිණි නවරත්න මහතා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන/ මැතිවරණ)
2. ගාමිණි දිසානායක මහතා - නියෝජ්‍ය පොලිස්පති (නීති)
3. පී.බී. නිකහැටිය මහතා - නියෝජ්‍ය පොලිස්පති (ප්‍රවාහන හා සංදේශ)
4. එල්.එච්.පී. කුරේ මහතා - පොලිස් අධිකාරී - අණදෙන නිලධාරී ක්ෂේත්‍ර බලකාය

මැතිවරණ දෙපාර්තමේන්තු නිලධාරීන්

1. යූ.අමරදාස මහතා - අතිරේක මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු)
2. ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා - අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)
3. එම්.එම්. මොහමඩ් මහතා - අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1530 ට ආරම්භ වූ අතර අද දින සහභාගී වී සිටින සියලු පාර්ශ්ව මැතිවරණ කොමසාරිස් විසින් පිළිගන්නා ලදී. එමෙන්ම අද දින සහභාගීත්වය දක්වන්නේ කවර අපේක්ෂකයින්/ නියෝජිතයින්දැයි යන්න ද සභාවට දන්වා සිටියේය.

අද දින සාකච්ඡාව සඳහා සුපුරුදු නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින්ට අමතර වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආචාර්ය හේමසිරි කුරුප්පු මහතා විසින් සංවිධානය කරනු ලබන ‘‘දෙටු පුරවැසි සංවිධානයේ’’ ද, හිටපු විගණකාධිපති සරත් මායාදුන්නේ මහතාගේ මූලිකත්වයෙන් පිහිට වූ විද්‍යාර්ථීන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ නියෝජිතයින් ද කැඳවා ඇති බවත් කවරාකාර පෞද්ගලික දේශපාලන මතිමතාන්තර දැරුවද මෙම සංවිධාන ත්‍රිත්වය නිර් දේශපාලනික සංවිධාන වන බැව් විශ්වාස කරනු ලබන බවත් මේ අවස්ථාවේදී පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් මෙම සාකච්ඡාවේදී යම් කිසි කරුණු දැක්වීමක් සිදු කිරීම ඔවුන්හට අවශ්‍ය වන්නේ නම් ඒවා ලිඛිතව ලබා දීමට හැකි නම් ඒ සම්බන්ධයෙන්මෙහිදී සාකච්ඡා කළ හැකි බව ද දැන්වීය.

02. ඒ ඒ අපේක්ෂකයින්ට සහාය දැක්වීම සඳහා විවිධ පාර්ශ්ව විසින් පක්ෂ මාරු කිරීම රාජකාරී කටයුතුවලදී මැතිවරණ දෙපාර්තමේන්තුවට විශාල ගැටළුවක් වී තිබෙන බවත් මේ හේතුවෙන් ගණන් කිරීමේ ශාලා සඳහා නියෝජිතයින් පත් කර ගැනීමේ දී ගැටළු පැන නගින අතර එම නියෝජිතයින්ගේ අවසාන ලැයිස්තු පිළියෙල කළ යුතුව ඇති බැවිනුත් මෙම මාරු වීම් නිශ්චිත දිනයක දී අවසන් කරන ලෙසත් මැතිවරණ කොමසාරිස් ඉල්ලා සිටි

අතර එදිනෙන් අනතුරුව සිදුවන කිසිදු පක්ෂ මාරුවීමක් ලියාපදිංචි කිරීමට කටයුතු නොකරන බව ද දැන්වීය. මේ සම්බන්ධයෙන් අපේක්ෂකයින් දැනුවත් කරන ලෙසත් 2014.12.29 දින පැවැත්වීමට නියමිත මාධ්‍ය සාකච්ඡාවේදී ද මේ බව ප්‍රකාශ කිරීමට අපේක්ෂිත බවත් තවදුරටත් දන්වා සිටින ලදී. තවද මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම ප්‍රධාන ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනාට සහ පක්ෂ ලේකම්වරුන් දැනුවත් කරන මෙන් සියලු පාර්ශ්ව වෙතින් ඉල්ලා සිටින ලදී.

03. 2015 ජනාධිපතිවරණයේ තැපැල් ඡන්ද සලකුණු කිරීම සියලුම රාජ්‍ය ආයතනවල 2014.12.23 සහ 24 යන දෙදින තුළ සිදු වූ බවත් ඒ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාණයේ ගැටළු වාර්තා නොවීම සතුටට කරුණක් බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් හෝමාගම ප්‍රදේශයේ පමණක් එක් සිද්ධියක් වාර්තා වූ බවත් ඡන්ද විමසීම් දින මෙන් බලයලත් නියෝජිතයින්ට/ ප්‍රාදේශීය නියෝජිතයින්ට/ අපේක්ෂකයින්ට ඡන්ද පොළින් පොළට යාමට අවසර නොමැති වුවත් ඒ බව නොදැන සිටි යම් පාර්ශ්වයක් විසින් එසේ ක්‍රියා කිරීම හේතුවෙන් එය සිදු වූ බවත් කෙසේ වුවද එම තත්ත්වය සමථයකට පත් කිරීමට හැකි වූ බවත් දැන්වීය.

තවද මෝටර් රථයක් ආධාරයෙන් එක්තරා දැන්වීම් පත්‍රිකාවක් බෙදා හරිමින් සිටි පාර්ශ්වයක් පිළිබඳව ප්‍රබල දේශපාලනඥයකුගෙන් ලද පැමිණිල්ලක් මත ක්‍රියාත්මක වෙමින් එම දැන්වීම් පත්‍රිකා සමඟ අදාළ මෝටර් රථය අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව ද මෙහි දී ප්‍රකාශ කළ මැතිවරණ කොමසාරිස් මෙවැනි ක්‍රියා සම්බන්ධව සිය අප්‍රසාදය පළ කර සිටියේ ය. රත්නපුර, මොරටුව සහ අලව්ව වැනි මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවලද තැපැල් ඡන්ද සලකුණු කිරීම සම්බන්ධව යම් යම් බලපෑම් සිදු කිරීමට ඇතැම් පාර්ශ්ව විසින් උත්සාහ දරා තිබුණද ඒවා ව්‍යර්ථ කිරීමට හැකි වී ඇති බව ද මෙහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය.

2014.12.26 දින එනම් අද දින ක්‍රියා කාරී කොට්ඨාසවල සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවල තැපැල් ඡන්ද සලකුණු කිරීමට නියමිතව තිබුණ ද පොලිස් දෙපාර්තමේන්තුවේ යම් අතපසුවීමකින් සිදුවූ සන්නිවේදනයක් හේතුවෙන් නුවරඑළිය, බදුල්ල වැනි ප්‍රදේශවල පොලිස් ස්ථානවලත් අද දින තැපැල් ඡන්ද සලකුණු කිරීමට කටයුතු කර ඇති බවත් මැතිවරණ කොමසාරිස් දැන්වීය. එහෙත් එම ස්ථානවල තැපැල් ඡන්ද සලකුණු කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා නියෝජිතයින් හෝ නිරීක්ෂණ කණ්ඩායම් පැමිණ නොමැති නම් ඔවුන් පැමිනෙනතෙක් ඡන්ද සලකුණු කිරීම සිදු නොකරන ලෙසට උපදෙස් දීමට කටයුතු කළ බවද සඳහන් කර සිටි අතර අදාළ දිස්ත්‍රික්කවල සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් එම ස්ථාන වෙත මැතිවරණ නිලධාරීන් යොමු කර කටයුතු නිසි පරිදි ඉටු කිරීමට පියවර ගත් බව ද මෙහිදී ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මැතිවරණ දෙපාර්තමේන්තුව ඇතුළු තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ සෙසු රාජ්‍ය ආයතනවල තැපැල් ඡන්ද සලකුණු කිරීම 2014.12.30 දින සිදු කිරීමට නියමිත බවද මෙහිදී ප්‍රකාශ කරන ලද අතර සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම ද කිසිදු හෝ පැමිණිල්ලක් රහිතව අවසන් වූ බවත් එසේ වුවද එම නිලධාරීන් සියලු දෙනාම අසල ගම්වල පදිංචිව සිටින්නන් වන බැවින්ද ඔවුන්හට පහසුවෙන්ම ඔවුනගේ ඡන්දපොළ වෙත ළඟා වීමට හැකියාව ඇති බැවින් ද එමෙන්ම ඔවුන් පොලිස් නිල ඇඳුමෙන් රාජකාරී සඳහා අනුයුක්ත කිරීමටහැකි මට්ටමක නොසිටින බැවින් ද අදාළ නිලධාරීන් සඳහා තැපැල් ඡන්දය ලබා දීම සඳහා දරන වියදම නිශ්ඵල වන බැව් පෙනී යන අතර ඔවුන් හට මීළඟ අවස්ථාවේදී තැපැල් ඡන්ද ලබා දෙන්නේ නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිගේ නිර්දේශය මත පමණක් ලබා දීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් අදහස් දක්වමින් පැවසීය.

තවද එම ප්‍රදේශවල තැපැල් ඡන්ද සලකුණු කිරීමට පෙර දින ඒ සඳහා උපදෙස් ලබා දෙමින් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දැනුවත් කිරීමේ දේශනයක් පවත්වන ලද බවත් එම ප්‍රදේශයේ නිරීක්ෂණ කටයුතුවල නියැළුණ ගරු රජීව් විජේසිංහ සහ ගරු වසන්ත සේනානායක යන මහත්වරුන් ඒ සම්බන්ධයෙන් සිය සතුට පළ කර ඇති බැව් වාර්තා වන බවත් ද මැතිවරණ කොමසාරිස් පැහැදිලි කර සිටියේ ය.

ඒ අනුව සිවිල් ආරක්ෂක සේවයේ නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු මනා අධීක්ෂණයෙන් සහ විධිමත්ව සිදු කිරීමට හැකි වීම පිළිබඳව මෙම සාකච්ඡා මාලාවේ දී ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වූ ඉලංකෙයි තමිල් අරසුකච්චි පක්ෂයෙහි එම්.ඒ.සුමන්තිරන් මහතා හට ද මැතිවරණ කොමසාරිස් සිය ස්තුතිය මෙහිදී පළ කර සිටියේය.

04. ඇතැම් ලංගම බස්රථවල මේ වන විටත් වත්මන් ජනාධිපතිවරයා ප්‍රවර්ධනය වන ආකාරයේ පෝස්ටර් දක්නට ලැබෙන බවට පැමිණිලි ලැබෙන බැවින් ඒ සම්බන්ධව මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ මේ පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශ්වයක් හට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට හැකි බවත් හොරණ, මතුගම, කළුතර වැනි දිස්ත්‍රික්කවල මෙවන් තත්ත්වයක් වාර්තා වන බැවින් මේවා වලක්වා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු බවත්ය. එමෙන්ම තැපැල් ඡන්ද සලකුණු කිරීමේ රාජකාරි සඳහා නිලධාරීන් ප්‍රවාහනය කිරීමට ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත සපයා තිබූ ලංගම බස්රථ තුළ පෝස්ටර් ඇලවීම සඳහා භාවිතා කරන ලද බුරුසු මෙන්ම පාප්ප බඳුන් ද දක්නට තිබුණු බවත් මෙය ඉතා කණගාටුදායක තත්ත්වයක් බවත් මැතිවරණ කොමසාරිස් දැන්වීය.

05. ජනාධිපතිධුර අපේක්ෂක ප්‍රසන්න ප්‍රියංකර මහතාගේ නියෝජිත ලෙස කටයුතු කරනු ලබන අනුර සොයිසා මහතාට යම් පහර දීමක් සිදුවී ඇති බවට වාර්තා වී ඇති බවත් එහෙත් මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශ්වය වෙතින් පැමිණිල්ලක් ඉදිරිපත් වී නොමැති බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් තව දුරටත් අදහස් දක්වන ලද්දේ කෙසේ වුවද මේ සම්බන්ධයෙන් ගාල්ල පොලිසිය වෙතින් විමසා සිටීම සඳහා කටයුතු කරනු ලබන බවයි.

06. විශාල ප්‍රමාණයේ කටවුට් ප්‍රදර්ශනය කරමින් නිට්ටඹුව ප්‍රදේශයේ පවත්වාගෙන ගිය ව්‍යාජ පක්ෂ කාර්යාලයක ලියාපදිංචිය අවලංගු කරමින්,ඊට අනුමැතිය ලබා දී තිබූ අවසර පත්‍රය ඉන් ඉවත් කර ගන්නා ලෙස වාචිකව දන්වා තිබියදී එම නියෝගය නොතකා හැර අදාළ කාර්යාලය එලෙසම පවත්වාගෙන යාමට එක්තරා දේශාපලනඥයකු විසින් කටයුතු කර ඇති අතර ඒ අවස්ථාවේදී එය ඉවත් කිරීම සඳහා එහි ගිය නිලධාරීන් ඔහු හාරයේ රඳවා තබා ගැනීමට ඔහු විසින් ක්‍රියා කර තිබීම ඉතා ලැජ්ජා සහගත කරුණක් බව මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් එසේම බහුල වශයෙන් පෝස්ටර්/ කටවුට් සහ අනවසර තොරණ් දක්නට ලැබෙන ගම්පහ වැනි ප්‍රදේශවල ද ඒවා ඉවත් කිරීමට ඉතා ඉක්මනින් කටයුතු නොකළ හොත් ඉදිරි සතිය තුළ දී මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ඒවා ගලවා ඉවත් කිරීමට කටයුතු කරන බව පැවසීය.

මැතිවරණ නිලධාරීන් යොදවා පෝස්ටර්/ කටවුට්/ දැන්වීම් ආදියෙහි ප්‍රදර්ශනය වන අපේක්ෂකයින්ගේ මුහුණු ආවරණය කිරීම හෝ ඒවා ඉවත් කිරීමට කටයුතු නොයොදන ලෙසත් ඉන් එම ප්‍රභූන් මෙන්ම මැතිවරණ නිලධාරීන් ද අපහසුවට පත් වන බවත් සඳහන් කරමින් ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ ජේ. පී. ගමගේ නම් අයකු විසින් තමන් වෙත ලිපියක් යොමුකොට ඇති බව දන්වා සිටිමැතිවරණ කොමසාරිස් මේ අවස්ථාවේදී පෙන්වා දෙන ලද්දේ ඉහත දැක්වූ සිදුවීම සහ මෙම ලිපිය අතර යම් සබඳතාවක් ඇත්දැයි සැක සහිත බව බවත් අද දින ඇතුළත දී මෙම තත්ත්වය යථා තත්ත්වයට පත් නුවුව හොත් මෙම ලිපිය පැමිණිල්ලක් වශයෙන් පොලිසිය වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන බවත් ය.

07. විදේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන කිහිපයක්ම මේ වන විටත් මෙරටට පැමිණ ඇති අතර ඔවුන්හට උතුරු පළාතේ නිරීක්ෂණ කටයුතුවල නියැලීම සඳහා අවශ්‍ය වන අවසර (MOD Clearance)ලබා දීමට ක්‍රියා කරන ලද බව මෙහිදී මැතිවරණ කොමසාරිස් විසින් දන්වා සිටින ලද අතර දකුණු ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංගමයේ (Fembosa) නිරීක්ෂණ සංවිධානයේ නිලධාරීන් 30 දෙනෙකු සහභාගී වන බවත් එම කණ්ඩායමේ නායකත්වය නේපාලයේ ප්‍රධාන මැතිවරණ කොමසාරිස් සභාඛිපති යකුබ් කුරේෂි මහතා විසින් දරනු ලබන බවත්, පොදුරාජ්‍ය මණ්ඩලීය මැතිවරණ නිරීක්ෂණ සංවිධානයේ නිරීක්ෂකයින් සඳහා ගයනාවේ හිටපු ජනාධිපතිවරයා විසින් නායකත්වය සපයනු ලබන බවත්මෙහිදී දන්වන ලදුව දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වනPFFRAL සහ CMEV සංවිධාන විසින්ද විදේශීය නිරීක්ෂණ කණ්ඩායම් කිහිපයක් මෙරට ගෙන්වීමට නියමිතව ඇති බව ද සඳහන් කරන ලදී. තවද මින්පෙර පැවැති මැතිවරණ/ ඡන්ද විමසීම් අවස්ථා වලදී ශ්‍රීලංකාවේ මැතිවරණ/ඡන්ද විමසීම් කටයුතු කෙරෙහි ප්‍රසාදය පළ කර සිටි තායිවානයේ මැතිවරණ නිරීක්ෂණ සංවිධානය වෙත මෙවර ජනාධිපතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා මෙරටට පැමිණීමට මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ආරාධනා කරන ලද නමුදු “One China” නම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මකව පැවතීම හේතුවෙන්එම සංවිධානයට මෙරටට පැමිණීමට අවකාශ නුවූ බව ද සඳහන් කරන ලදී.

පොදු රාජ්‍ය මණ්ඩලීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමේ නියෝජිතයන්ගේ නිරීක්ෂණ කටයුතු කෙරෙහි මැතිවරණ දෙපාර්තමේන්තුවේ සෘජු සබඳතාවක් නොමැති අතර ඔවුන් හට උතුරු ප්‍රදේශයේ නිරීක්ෂණ කටයුතුවල නිරත වීමට අවශ්‍ය අවසර ලබා දීම පමණක් මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ බවත්

ඔවුන් මැතිවරණ දෙපාර්තමේන්තුවේ වාහන හෝ භාෂා පරිවර්ථකයන් පවා ඔවුනගේ කටයුතු සඳහා යොදා නොගන්නා බවත් එහෙයින් ඔවුන් සමඟ කටයුතු කිරීමට අවැසි පාර්ශ්වයක් වේ නම් එම සම්බන්ධීකරණය මැතිවරණ දෙපාර්තමේන්තුව හරහා නොව ස්වාධීනව පවත්වා ගන්නා ලෙසත් මැතිවරණ කොමසාරිස් මෙහිදී සභාවේ සියලු පාර්ශ්ව වෙත දැන්වීය.

08. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් ස්වාධීන රූපවාහිනී සේවයේ සහ සෙසු මාධ්‍යවල ක්‍රියාකාරීත්වය පිළිබඳව සුපරීක්ෂණයෙන් සිට වාර්තා කරන ලෙස තමන් විසින් සියලු පාර්ශ්ව දැනුවත්කර ඇති බවත් එහෙත් කිසිදු පාර්ශ්වයක් විසින් එවන් කරුණු පෙන්වා දීමක් මේ වන තෙක් සිදු කර නොමැති බවත් මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධයෙන් ස්වාධීන රූපවාහිනී සේවයේ සභාපති වෙතින් විමසන ලද අතර, තම නාලිකාව භාෂණයේ නිදහස ක්‍රියාත්මක කරමින් පවතින බවත් මැතිවරණ කොමසාරිස් වෙත ලැබී ඇති චෝදනා කවරේද යන්න සහඒ පිළිබඳව විමසීමට මැතිවරණ කොමසාරිස්හට ඇති නීතිමය බලය කවරාකාරද යන්නත් එහිදී එම නාලිකාවේ සභාපතිවරයා විසින් ප්‍රශ්න කර ඇති බවත් දන්වන ලදී. කෙසේ වුවද ඡන්ද විමසීමේ පාරිශුද්ධත්වය හා සුජාතභාවය වෙනුවෙන් තමන්හට කටයුතු කිරීමට සිදුවන බැව් අදාළ නාලිකාව වෙත දන්වා යැවීමට අපේක්ෂිත බව ද එමෙන්ම අදාළ නාලිකාවෙහි අපේක්ෂක ප්‍රවර්ධන ක්‍රියාකාරීත්වය පිළිබඳව සුපරීක්ෂණයෙන් පසුවී නිරීක්ෂණ ලිඛිතව දන්වා එවන ලෙස ද මෙහිදී යළිත් සභාව වෙත දන්වා සිටියේය.

මෙහිදී අදහස් දැක්වීමට එක් වූ නීතීඥ ශ්‍රීනාත් පෙරේරා මහතා පෙන්වා දුන්නේ ස්වාධීන රූපවාහිනී සේවය මෙන්ම ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ද ඉතා දැඩි පක්ෂග්‍රාහී ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරමින් සිටින බවත් සාධාරණ ශිෂ්ඨ ජනතාව විසින් එවන් මාධ්‍ය භාවිතා නොකර සිටිය යුතු බවත් ය. එහිදී ස්වකීය අදහස් දක්වා සිටි මැතිවරණ කොමසාරිස් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මාධ්‍ය පාලනයට සහ නිසි බලධරයා පත් කිරීමට මැතිවරණ කොමසාරිස් හට තිබූ බලය ඉවත් කොට ඇති බවත් 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට දායකත්වය දැක්වූ සියලු පාර්ශ්ව ඊට ද දායක වී ඇති බවත් දන්වා සිටියේය.

09. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙන් කර ගැනීමේදීපැනනගින ලද විවිධ අවහිරතා ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් මැදිහත්වී කටයුතු කිරීම පිළිබඳව එත්සත් ජනතා නිදහස්සන්ධානයේ ලේකම්, ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ නියෝජිත සුසිල් ප්‍රේමජයන්ත් මහතා හටත් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිත අනුර ජයසිංහ මහතාහටත් ස්වකීය ස්තුතිය මේ අවස්ථාවේදී පළ කර සිටි මැතිවරණ කොමසාරිස් ඇතැම් පිට්ටනි/ ක්‍රීඩා භූමි වෙන් කර දීමට නොහැකියැයි පොලිසිය විසින් දන්වා තිබූ ස්ථානවල මතු වූ ගැටළු ද ඒ මහත්වරුන්ගේ මැදිහත් වීමෙන් නිරාකරණයට ලක් කර ගැනීමට හැකිවූ බැව් මෙහිදී පෙන්වා දුන්නේ ප්‍රසාදයෙනි.

ඇතැම් දේශපාලන ක්‍රියාකාරීන්හට යම් යම් ස්ථානවල ක්‍රීඩා භූමි/ පිට්ටනි වෙක් නර ගැනීමට අපහසු වූ අවස්ථා වලදී තමන් මැදිහත්ව ඒවා ලබා දීමට කටයුතු කරන ලද බවත් එසේ වුවද පසු කාලීනව එම දේශපාලනඥයින් විසින් මෙම කරුණු සාවද්‍ය ලෙස දක්වමින් ඒවා මැතිවරණ කොමසාරිස්වරයා ඉදිරියෙහි දැඩි ක්‍රියාමාර්ගවලට යමින් සාක්ෂාත්කර ගත් ලෙස මාධ්‍ය වෙත වාර්තා කරන බව පෙනී යන බැවින් මෙවන් ප්‍රකාශ කිසියම් හෝ පාර්ශ්වයක් විසින් දිගින් දිගටම සිදු කරන්නේ නම් ක්‍රීඩාභූමි/ පිට්ටනි වෙන් කරවා දීම සම්බන්ධයෙන් ඉදිරියේදී තමන් මැදිහත් නොවන බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් දැන්වීය.

නීතීඥ ශ්‍රීනාත් පෙරේරා මහතා මෙහිදී පෙන්වා දෙන ලද්දේ මෙම ක්‍රීඩාභූමි/ පිට්ටනි වෙන්කරවා ගැනීම සම්බන්ධයෙන් සෑම පාර්ශ්වයකයටම ගැටළුවලට මුහුණ දීමට සිදුවන බවත් ජනාධිපතිතුමන්ගේ රැස්වීම් හැරුණු කොට වෙනත් කිසිදු පාර්ශ්වයකගේ රැස්වීම් සඳහා ක්‍රීඩාභූමි/ පිට්ටනි ලබා නොදෙන බවට ඇතැම් ප්‍රාදේශීය සභා සභාපතිවරුන් සෘජුවම ප්‍රකාශ කරනු ලබන බවත් ඇහැලියගොඩ, වැල්ලවත්ත ආදී ස්ථානවලද මෙවැනි අර්බුද පවතින බවත්ය. මෙහිදී අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස් එසේ අසාධාරණ ලෙස ක්‍රීඩාභූමි ලබා නොදෙන්නේ නම් ඒ බව පුවත්පත් හරහා ප්‍රසිද්ධ කිරීමට වුවද හැකි බවත් කෙසේ වුවද එවැනි ගැටළු ඇති ස්ථාන වෙත්නම් ලිඛිතව දන්වන ලෙසත් එවිට ඒවා ලබා ගැනීමට අවකාශ සලසා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ප්‍රචාරණ රැස්වීම් සඳහා විශාල ප්‍රමාණයේ පිට්ටනි වෙන් කර ගැනීමේ දී ඒ සඳහා සහභාගී වන පිරිස පිළිබඳව සැලකිලිමත් වන ලෙසත් සැලකිය යුතු පිරිසක් සහභාගී නොවන්නේ නම් ඉතා විශාල පිට්ටනි වෙන් කර නොගන්නා ලෙස ද මැතිවරණ කොමසාරිස් මෙහිදී සියලු පාර්ශ්ව වෙතින් ඉල්ලා සිටින ලදී.

10. මැතිවරණ නීති උල්ලංඝනය කරමින් බොහෝ රථ වාහනවල අපේක්ෂක ප්‍රවර්ධනයට තුඩු දෙන පෝස්ටර් ප්‍රදර්ශනය කරනු ලබන බවත් එහිදී එම පෝස්ටර් ප්‍රදර්ශනය කරනු ලබන ආධාරකරුවා විසින් පමණක් නොව අදාළ අපේක්ෂකයා විසින් ද නීති උල්ලංඝනය කරනු ලබන්නේ යැයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට වුව සිදුවිය හැකි බවත් කෙසේ වුවද නීති බලාත්මක කිරීම සඳහා ගතයුතු සියලු ක්‍රියාමාර්ග ගන්නා බවත් මෙහිදී මැතිවරණ කොමසාරිස් මතු කළ කරුණ විය.

11. ඇතැම් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන පක්ෂපාතීව ක්‍රියා කරතැයි දන්වමින් ශ්‍රී ලංකා නිදහස් නීතීඥ සංගමයේ සභාපති ඩී.පී.මෙන්ඩිස් මහතා විසින් යොමු කරන ලද ලිපිය පසුගිය සාකච්ඡාවේදී ද සාකච්ඡාවට ලක් වූ පරිදි සම්බන්ධයෙන් සලකා බලමින් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඩී.පී.මෙන්ඩිස් මහතා, ශ්‍රී ලංකා නිදහස් නීතීඥ සංගමයේ ලේකම් චම්පානි පද්මසේකර මහතාසහ එහි භාණ්ඩාගාරික සාලිය මැතිව් මහතා, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිත අනුර ජයසිංහ මහතා, ශාන්ත හේරත් මහතා, සුමිත් විජේසිංහ මහතා සහ පාලිත ගමගේ මහතා ඇතුළුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ගාමිණී නවරත්න මහතා (පරිපාලන හා මැතිවණ) සමඟ සාකච්ඡා කිරීමට අපේක්ෂිත බවත් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් අවශ්‍ය බව මින් පෙර දන්වා ඇති බැවින් රවී කරුණානායක මහතා ද එහි කැඳවීමට හැකි වන බවත් ඒ සඳහා දිනයක් සහ වේලාවක් වෙන් කර ගැනීම උචිත බවත් මැතිවරණ කොමසාරිස් පැහැදිලි කරන ලදී. එහිදී ශ්‍රීනාත් පෙරේරා මහතා පවසා සිටියේ කවර මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් පක්ෂපාති ක්‍රියා පිළිවෙතක් ගෙන යන්නේ දැයි දැනගැනීම වැදගත් වන හෙයින් සෙසු නියෝජිතයන්ට ද මෙම දේශීය/ විදේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ සිදු කෙරෙන මෙම සාකච්ඡාවට සහභාගී වීමට අවස්ථාව ලැබේ නම් වඩා උචිත බවයි. එහෙත් බොහෝ පිරිසක් එකවර කැඳවා සාකච්ඡා කිරීම දීර්ඝ කාලවේලාවක් ගතවන ක්‍රමවේදයක් වන බැවින් එහිදී මතු වූ කරුණු කාරණා සම්බන්ධව නිසැක වශයෙන්ම සෙසු පාර්ශ්ව පසුව දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන බව මැතිවරණ කොමසාරිස් ප්‍රකාශ කරන ලදී. විදේශීය නිරීක්ෂකයින් සමඟ සාකච්ඡා කිරීම සඳහා අවශ්‍යතාව පවතින අයවලුන් වෙත්නම් අදාළ කරුණු ලිඛිතව ඉදිරිපත් කරන ලෙස මින් පෙර අවස්ථාව ලබා දී තිබුණ ද එක් පක්ෂයක් හැරුණු කොට වෙනත් කිසිදු පාර්ශ්වයක් විසින් එවැන්නක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැති බවත් ඊට පිළිතුරු සපයමින් මැතිවරණ කොමසාරිස් පැවසීය. විදේශීය නිරීක්ෂණ සංවිධාන අටක් (08) සාකච්ඡා සඳහා සහභාගී වූ බවත් ඔවුන් සමඟ සාකච්ඡාවට සහභාගී වූයේ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ජනාධිපති අපේක්ෂකගේ නියෝජිත නීතීඥ විජයදාස රාජපක්ෂ මහතා සහ ජනාධිපති නීතීඥ රෝලන්ස් පෙරේරා මහතා පමණක් වන බව ද දැන්වීය. එහිදී රෝලන්ස් පෙරේරා මහතා ද පසුව මේ සඳහා සහභාගී වූ ශාන්ත හේරත් මහතා ද කරුණු ඉදිරිපත් කර සිටි අතර කවර පාර්ශ්වයකට හෝ කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම් ඒවා සිංහල භාෂාවෙන් නම් 2014.12.22 දින ද, ඉංග්‍රීසි භාෂාවෙන් නම් 2014.12.22 දිනට පෙර දයොමු කරන ලෙස ද දන්වා තිබුණ නමුත් එවැන්නක් ඉදිරිපත් නොවූයෙන් අදාළ නිරීක්ෂණ කණ්ඩායම් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දීමට හැකි වූයේ සාකච්ඡාව සඳහා සහභාගීවීමට සිය අභිලාශය පළ කළ පාර්ශ්ව වෙත පමණක් බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී දන්වා සිටියේය.

12. මහින්දෝදය පාසල් විවෘත කිරීමේ උත්සවවලදී දේශපාලන ප්‍රවර්ධන කටයුතු සිදු වීමට අවකාශ නොතබන ලෙස මැතිවරණ කොමසාරිස් විසින් අධ්‍යාපන අමාත්‍ය බන්ධුල ගුණවර්ධන මහතා වෙතින් කරන ලද ඉල්ලීමක් මත මහින්දෝදය පාසල් විවෘත කිරීමේ උත්සව සියල්ල මැතිවරණ කටයුතු අවසන් වන තෙක් කල් තැබීමට ඒ මහතා විසින් කටයුතු සලස්වා තිබීම ඉතා ප්‍රසංශනීය බවත් ඒ පිළිබඳව ස්වකීය ස්තුතිය ගරු අධ්‍යාපන අමාත්‍යාවරයා වෙත පළ කර සිටින බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධව විමසීම් කර තිබූ බවත් විභාගයෙන් ඉහල සාමාර්ථ ලද සිසු සිසුවියන් ජනාධිපතිවරයා වෙත කැඳවාගෙන යෑමේදී ඉන් වත්මන් ජනාධිපතිවරයා ප්‍රවර්ධනයට ලක් කෙරෙන යමක් සිදු නොවන්නේ නම් විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ කිසිදු හානියක් නොවන බව එහිදී තමන් විසින් දැන්වීමට කටයුතු කළ බවත් මැතිවරණ කොමසාරිස් විසින් සභාව වෙත දන්වා සිටින ලදුව සභාවේ ඒකමතික තීරණය වූයේ මැතිවරණයක් හේතුවෙන් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවීමට අවශ්‍ය නොවන බවත් ඉන් සිසු දරු දැරියන් අපහසුතාවට පත් නොකළ යුතුය යන්නත් ය.

13. මෙහිදී කරුණු දක්වමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නියෝජිත අනුර ජයසිංහ මහතා විමසා සිටින ලද්දේ වර්තමානයේ ඇති වී තිබෙන ගංවතුර සහ නායයෑම් තර්ජන හේතුවෙන් ජාතික හැඳුනුම්පත්

නොමැති ඡන්ද දායකයින් සඳහා ලබා දෙන තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමේ දින දීර්ඝ කිරීමට හැකියාවක් පවතී ද යන්නයි.

ජාතික හැඳුනුම්පත් නොමැති ඡන්ද දායකයින් සඳහා තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීම 2014.12.31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණ ද වර්තමාන තත්ත්වය සලකා බලා එම දින මේ වන විට 2015.01.03 දින තෙක් දීර්ඝ කර ඇති බව මැතිවරණ කොමසාරිස් ඊට පිළිතුරු සපයමින් ප්‍රකාශ කර සිටියේය.

14. මෙහිදී ගැටළුවක් නැගූ අනුර ජයසිංහ මහතා, පක්ෂ කාර්යාලවල ඩිජිටල් තිර ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් විමසා සිටින ලද අතර දිස්ත්‍රික් කාර්යාලවල පමණක් ඩිජිටල් තිර භාවිතා කිරීමට අවසර දිය හැකි නම් එය වඩා පහසු වන බවත් සෙසු දේශපාලන පක්ෂවලද මතය විමසා මේ සම්බන්ධයෙන් නිගමනයකට එළඹීම සුදුසු බවත් විමසා සිටින ලදී. මෙම තිර අදාළ දිස්ත්‍රික් කාර්යාල ඇතුළත පමණක් ප්‍රදර්ශනයට කටයුතු කිරීමට වගබලා ගන්නා බව ද ඒ මහතා තවදුරටත් සඳහන් කර සිටියේය. එහිදී අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස්, මෙම ඩිජිටල් තිර අනුමත දිස්ත්‍රික් කාර්යාලවල පමණක් භාවිතා කිරීම හානිදායක නොවූවත් මේවා මහජනයාට සහ රියදුරන්හට බාධාවක් නොවන පරිදි භාවිතා කිරීමට සිදුවන අතර යම් හෙයකින් එසේ බාධාවක් වන බව පෙනී යන්නේ නම්ඒවා ඉවත් කිරීමට යටත්ව මේ සඳහා අවසර ලබා දිය හැකි බව දැන්වීය. කෙසේ වුවද මෙම ඩිජිටල් තිරවල වත්මන් ජනාධිපතිතුමාගේ හෝ සෙසු අපේක්ෂකයින්ගේ රූව හෝ පක්ෂ ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට ඉඩ නොදෙන බවත් තවදුරටත් දැන්වීය. මෙහිදී මේ සම්බන්ධයෙන් සභාව තුළ සාකච්ඡාවට ලක් වූ අතර මෙම ඩිජිටල් තිර ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය නොවන බව ද ඇතැම් පාර්ශ්ව අදහස් දක්වන ලදී. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් ඉදිරියේදී තවදුරටත් සාකච්ඡා කිරීමට අවසානයේදී යෝජනා විය.

කොළඹ නගර ආශ්‍රිතව ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු (Bill Boards) මගින් වත්මන් ජනාධිපතිවරයා ප්‍රචර්ධනය කිරීමට අනුබල සපයන ආකාරයේ දැන්වීම් ප්‍රදර්ශනය කරන ලදින් ඒවා ඉවත් කරන්නට සිදුවූ බව ද මෙහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේය.

15. අනතුරුව අද දින සාකච්ඡාව සඳහා නියමිතව ඇති වන කරුණු කෙරෙහි සභාවේ අවධානය ගෙන එමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ ඉතා දීර්ඝ කාලයක් පුරා පවත්වාගෙන එනු ලබන අභාවප්‍රාප්ත ගාමිණී අතුකෝරළ මහතාණන්ගේ ගුණ සමරුව වෙනුවෙන් අභ්‍යාස පොත් බෙදා දීමේ උත්සවය පැවැත්වීම සඳහා අවසර ඉල්ලා ඇති බවත් ඒ සඳහා අවසර ලබා දෙන බවත්ය.

16. එමෙන්ම ඉතා වැදගත් කරුණක් කෙරෙහි සභාවේ අවධානය ගෙන එමින් මැතිවරණ කොමසාරිස් දන්වන ලද්දේ නිස්ස අත්තනායක මහතා එක්සත් ජාතික පක්ෂ මහ ලේකම් ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය එතුමාගේ පාර්ලිමේන්තු මුද්දරවලින් තැපැල් කර යැවීම සඳහා ජාතික තරුණ සේවා සභාව තුළ දී සූදානම් කරමින් තිබූ අතර එම ලිපි තොගය ඒවා ලියමින් සිටියදීම අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවත් මේ සම්බන්ධයෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ පැමිණිලි අංශයේ ප්‍රධානී රජීව් සෙනෙවිරත්න මහතා මෙන්ම PAFFRAL සංවිධානය සහ වෙනත් නිරීක්ෂණ සංවිධාන විසින් ද මේ සම්බන්ධයෙන් පැමිණිලි කරන ලද බවත් ඒ අනුව මෙසේ අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවත්ය.

එමෙන්ම මේ සම්බන්ධයෙන් තවදුරටත් කරුණු දැක්වූ මැතිවරණ කොමසාරිස් එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තර ආරවුල් ඇතැයි පෙනෙන ආකාරයේ පොතක් මහරගම ප්‍රදේශයේ මුද්‍රණාලයක දී මුද්‍රණය කරමින් සිටියදී අත්අඩංගුවට ගැනීමට හැකි වූ බවත් එහිදී එම පොත් පනස් දහසක (50,000) පමණ ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඉදිරි අධිකරණ ක්‍රියාමාර්ග සඳහා මහරගම පොලිසිය භාරයේ රඳවා තබා ඇති බවත් තවදුරටත් දැන්වීය.

ආසන්න වශයෙන් රුපියල් කෝටි සියයක වටිනාකමින් යුතු සිල් රෙදි තොගයක් එළඹෙන පොහෝ දින දී බෙදා දීමට සූදානම් ඇති බවට පැමිණිලි ලැබී ඇති බවත්, එය ඉතා ප්‍රකට භික්ෂූන් වහන්සේ නමක විසින් සිදු කරන ආකාරයට පෙනීයන සේ මෙම කටයුතු කර්මාන්ත, විද්‍යා හා වාණිජ අමාත්‍යාංශය මගින් මුදල් වැය කොට සිදු කිරීමට අපේක්ෂිත බව ද එහිලා වාර්තා වී ඇති බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස්, එම සිල් රෙදි බෙදා දීම 2015 ජනවාරි මස එළඹෙන පොහෝ දින සිදු නොකරන ලෙසත් එය පසුවට කල් තබන ලෙසත් දන්වා සිටීමට කටයුතු කරනු ලබන බවතවදුරටත් ප්‍රකාශ කරන ලදී.

නුවරඑළිය නගරයේ අත්හැර ඇති රජයට අයත් ගොඩනැගිලි කිහිපයක් අමාත්‍ය සී. බී. රත්නායක මහතාගේ කාර්යාල පිහිටුවීමට භාවිතා කර තිබීම සම්බන්ධව පැමිණිලි ලැබී ඇති බවත් මේ සම්බන්ධයෙන් සොයා බලා එම කාර්යාල රජයට අයත් ගොඩනැගිලි වලින් ඉවත්කර ගැනීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශ්ව වෙත දන්වා සිටින ලෙසත් මෙහිදී මැතිවරණ කොමසාරිස් සුසිල් ප්‍රේමජයන්ත් මහතාගෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම යුධ හමුදාව විසින් අපේක්ෂක ප්‍රචාරණයට හේතු වන ආකාරයේ යම් ලිපියක් තැපැල් මාර්ගිකව යොමු කිරීමට සූදානමක්පවතීය යන්න ලද පැමිණිල්ල විශේෂ අවධානයට බඳුන් විය යුත්තක් වන බවත් මේ පිළිබඳව PAFFRAL සංවිධානය විසින් මෙන්ම TI (Transparency International) සංවිධානය වෙතින්ද පැමිණිලි ලැබී ඇති බවත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් වෙනත් හමුදා නොවන සිවිල් සංවිධානයකට ද මෙම ලිපිය යොමු වී ඇතත් එහිදී ඔවුන් එය යොමු කිරීමෙන් වැළකී සිටීමට තීරණය කර ඇතැයි වාර්තා වන බවත් පැහැදිලි කර සිටිමින් මේ සම්බන්ධයෙන් තැපැල්පතිවරයා දැනුවත් කරමින් මෙම ලිපි මැතිවරණ කාලසීමාවෙන් පසුව යැවීමට කටයුතු කරන ලෙස දන්වනු ලබන බව ප්‍රකාශ කළේය.

17. රාජගිරිය HSBC අසළ වත්මන් ජනාධිපතිවරයාගේ රුව ප්‍රදර්ශනය කරමින් පවත්වාගෙන යනු ලබන කාර්යාලයක් පිළිබඳව මේ අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කර සිටි නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නියෝජිත ශාමිලා පෙරේරා මහත්මිය, එම කාර්යාලය නීති විරෝධී ආකාරයෙන්පවත්වා ගෙන යනු ලබන්නේ නම් එය ඉවත්කිරීමට වහා ක්‍රියාමාර්ග ගත යුතු බැව් පෙන්වා දෙන ලදී. ඒ සම්බන්ධයෙන් සොයා බලා එය අනුමත කාර්යාලයක් නොවන්නේ නම් එය ඉවත් කරවීමට කටයුතු යොදන ලෙස සහකාර මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු) වෙත මැතිවරණ කොමසාරිස් විසින් උපදෙස් ලබා දෙන ලදී.

එහිදී තව දුරටත් කරුණු පෙන්වා දුන් ශාමිලා පෙරේරා මහත්මිය, නීති ප්‍රකාරව ප්‍රචාරණ පෝස්ටර් ප්‍රදර්ශනය කිරීමට හැකියාව ඇත්තේ අපේක්සකයා ගමන් ගන්නා රථ වාහනවල පමණක් වුවද වෙනත් රථ වාහනද අපේක්ෂක ප්‍රචාර්ධනයට හේතු වන පරිදි ස්ටිකර්/ පෝස්ටර් ආදිය ප්‍රදර්ශනය කරනු ලබන බවත් දන්වා සිටි අතර GG-2872 දරන රථය ද එවැනි ආකාරයේ නීති වාරෝධී ප්‍රචාරණ පෝස්ටර් ප්‍රදර්ශනය කරමින්ගමන් ගත් ආකාරය තමන් විසින් නිරීක්ෂණය කරන ලද බවත් දන්වා සිටියාය.

විවිධ රථ වාහනවල අපේක්ෂක ප්‍රචාර්ධනයට තුඩු දෙන පෝස්ටර්/ ස්ටිකර් ප්‍රදර්ශනය කරනු ලබන බවට පැමිණිලි කිරීම හැර මේ වන තෙක් කිසිදු පාර්ශ්වයක් විසින් එවන් රථ පිළිබඳ තොරතුරු වාර්තා කර නොමැති බවත් ශාමිලා පෙරේරා මහත්මිය විසින් මේ සම්බන්ධයෙන් සුපරීක්ෂණයෙන් පසුවී වාර්තා කිරීම අගය කරනු ලබන බවත් මැතිවරණ කොමසාරිස් මෙහිදී ප්‍රකාශ කළේය. මෙවන් නීති විරෝධී ක්‍රියාවන්හි නියැලෙන රථවාහන වෙතොත් ඒ සම්බන්ධයෙන් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිල වෙඩ් අඩවියට හෝ Tell Commissioner හරහා හෝ දුරකථන ඔස්සේ හෝ නැතහොත් ෆැක්ස් මගින් හෝ දැනුම් දෙන ලෙස සියලු පුරවැසියන් වෙත පුවත්පත් නිවේදනයක් හරහා දැනුම් දී ඇති බවත් මෙහිදී තවදුරටත් පැහැදිලි කරන ලදී.

මේ අවස්ථාවේදී ආර්.යෝගරාජා මහතා විසින් ප්‍රකාශ කර සිටියේ තමන් විසින් 2014.12.07 දින මේ ආකාරයෙන් පැමිණිල්ලක් මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වෙත යොමු කරන ලද නමුත් ඒ වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැති බවයි.

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධව මැතිවරණ කොමසාරිස් හට බලය ලැබෙනුයේ නාමයෝජනා භාර ගන්නා දිනෙන් පසුව වන අතර එනම් 2014.12.08 දින සිට බවත් එදිනෙන් පසු ලද සියලු පැමිණිලි සම්බන්ධව ගත හැකි උපරිම ක්‍රියාමාර්ග මේ වන විටත් ගෙන ඇති බව මැතිවරණ කොමසාරිස් දැන්වීය.

18. 2014.12.19 දින මඩකලපු නගරයේ කෙවිලියාමඩු ගම්මානයේ ජනතාව විසින් සිය ඡන්ද අයිතිය ඉල්ලා සාමකාමී විරෝධතාවක් පවත්වමින් සිටියදී ඔවුන්හට නින්දිත අයුරින් පහර දීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් වෙත පැමිණිලි කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් ජාතික හෙළ උරුමයේ නියෝජිත නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මහතා විසින් විමසා සිටින ලදී. එහිදී සිය අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ මේ සම්බන්ධයෙන් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මහතාට අමතරව අක්මීමන දයාරතන හිමියන් විසින් ද පැමිණිලි කර ඇති බවත් කෙවිලියාමඩු ගම්මානයේ ජනතාව විසින් වත්මන් ජනාධිපතිවරයා වෙත ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සිය ඡන්ද අයිතිය ලබා දෙන ලෙස ඉල්ලා විරෝධතාව

සංවිධානය කර තිබූ බැවින් මැතිවරණ කොමසාරිස් වශයෙන් පක්ෂග්‍රාහී ක්‍රියාවකට මැදිහත් වීමට තමන් හට හැකියාවක් නොවන බවයි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගනිමින් පොලිසිය ද දැනුවත් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇති බව දන්වා සිටි මැතිවරණ කොමසාරිස් ඡන්ද අයිතිය ලබා ගැනීම සඳහා කටයුතු කළ යුත්තේ 2015 වර්ෂයේ ජුනි මාසයේ සිට වන බවත් කෙසේ වුවද යම් අයකුට අවමන් සහගත ලෙස සැලකීම හේතුවෙන් ප්‍රමාණවත් සාක්ෂි සහ තොරතුරු ද සමඟ අධිකරණයේ නඩුවක් ගොනුකළ හැකි බව ද ප්‍රකාශ කළේය. එමෙන්ම මේ සම්බන්ධයෙන් සොයා බැලීමේ දී නිරීක්ෂණය වූයේ පුද්ගලයන් හය දෙනෙකුගේ පමණ නම් 2014 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති බවත් සෙසු අයවලුන් අම්පාර වැනි ප්‍රදේශවල ස්ථිර පදිංචිය සහිත අයවලුවන් වන බවත් යන්න ද මෙහිදී දැන්වීය. එහෙයින් ඔවුනගේ සත්‍ය පදිංචිය අම්පාර දිස්ත්‍රික්කයේ වන බැවින් මඩකලපු දිස්ත්‍රික්කයේ ලියාපදිංචි වී නොමැති බව ද දැන්වූ මැතිවරණ කොමසාරිස් කවර පාර්ශ්වයක් වුවද නියමිත කාලයේදී ඡන්ද හිමි නාමලේඛනයේ ස්වකීය ලියාපදිංචි වීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බව ද දැන්වීය.

19. මෙහිදී අසාත් සාලි මහතා පෙන්වා දෙන ලද්දේ එක්තරා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් මැතිවරණ කොමසාරිස් විසින් ජීල්මාට් කරනු ලබන බවත් මෙවර ජනාධිපතිවරණය ද එවැනි ක්‍රමවේදයක් ඔස්සේ නිසැක වශයෙන්ම තම පක්ෂයේ අපේක්ෂක වත්මන් ජනාධිපතිවරයා විසින් ජයග්‍රහණය කරනු ලබන බවත් ප්‍රකාශ කර සිටි බවත් එය ඉතා කණගාටුදායක ප්‍රකාශයක් වන අතර මැතිවරණ කොමසාරිස්වරයා හට ද එල්ල වූ චෝදනාවක් වන බවත් ය. එහිදී අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස් අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් කර ඇති ප්‍රකාශය පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලද අතර එම නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අත්සනින් පත් කරනු ලබන නියෝජිතයින් කිසිදු පාර්ශ්වයක් ඡන්ද පොළ කටයුතු සඳහා යොදා නොගන්නා බවත් අදාළ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පත්වීම ප්‍රත්‍යාදිෂ්ඨ කොට වෙනත් පාර්ශ්වයක් ඒ සඳහා පත් කරන ලෙසත් සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙතින් ඉල්ලා සිටියේය. මෙවන් ප්‍රකාශ තුළින් සිදුවන්නේ ඡන්ද විමසීම කෙරෙහි පොදු මහජනතාව තුළ පවතින විශ්වාසය පළුදු වීමත් ඒ තුළින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධා එල්ලවීමක් බවත් තවදුරටත් ප්‍රකාශ කර සිටියේය.

20. ශ්‍රී ලංකාවේ ගරු විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ ජනාධිපතිධුර අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතා වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් කබීර් හෂීම් මහතා විසින් අත්සන් කරන ලද ලිපියක් විජයදාස රාජපක්ෂ මහතා විසින් යොමු කරමින් දන්වා ඇත්තේ ගරු විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සහ මෛත්‍රීපාල සිරිසේන මහතා අතරේ අත්සන් කළේයැයි තිස්ස අත්තනායක මහතා විසින් ප්‍රකාශයට පත් කර ඇති ගිවිසුම ව්‍යාජ ගිවිසුමක් වන බවත් එය මේවන විට ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් මැතිවරණ කොමසාරිස් විසින් මෙහිදී දන්වන ලදුව මෙම ගිවිසුමේ මුල් පිටපත සියැසින් දුටුවේද, එමෙන්ම එහි නිරවද්‍යතාව පිළිබඳව සහතික වන්නේ ද යන කරුණු සනාථ කරන ලෙස තිස්ස අත්තනායක මහතා වෙත දන්වා සිටීමට ක්‍රියා කරනු ලබන බව ද ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මේ සම්බන්ධයෙන් වාර්තා කරන ලද කොළඹ 10, ටී.බී.ජයා මාවතේ අංක 301 දරන ස්ථානයේ ක්‍රියාත්මක වන එක්සත් ව්‍යාප්තීය සමිති සංවිධානය විසින් මුද්‍රිත මාධ්‍ය හරහා මෙම තොරතුරු වාර්තා කිරීමේ දී ප්‍රශ්නගත ගිවිසුමෙහි මුල් පිටපත දුටුවේද, එහි නිරවද්‍යතාව පිළිබඳව සෑහීමකට පත්විය හැකි ද සහ එසේ සෑහීමකට පත්විය නොහැකි නම් මාධ්‍ය ආචාරධර්ම උල්ලංඝනය කරමින් මෙවා පළ කිරීමෙන් වලකින ලෙස අදාළ එක්සත් ව්‍යාප්තීය සමිති සංවිධානය වෙත දැන්වීමට කටයුතු කරනු ලබන බවද තව දුරටත් දන්වා සිටි මැතිවරණ කොමසාරිස් යම් අක්‍රමිකතාවක් සිදු වන සෑම විටකදීම ඊට එරෙහිව ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගත යුතු බැව් ද අවධාරණයෙන් යුතුව සඳහන් කර සිටියේය.

මේ අවස්ථාවේදී සිරිකොත එක්සත් ජාතික පක්ෂ කාර්යාලයට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් අසාත් සාලි මහතා විසින් කරුණු පෙන්වා දෙනු ලදුව මැතිවරණ කොමසාරිස් අදහස් දක්වා සිටියේ මහාමාර්ග, දේශපාලන පක්ෂ/ කාර්යාල ඉදිරිපිට සහ රාජ්‍ය ආයතන වැනි ස්ථානවල උද්ඝෝෂණ නොපවත්වන ලෙසට ඉතා කාරුණිකව මහ ජනතාවගෙන් ඉල්ලා සිටින බවයි.

21. 2014.12.25 දින මතුගම ප්‍රදේශයේ යම් සිද්ධියක් වාර්තා වන බවත් එනම් නව සම සමාජ පක්ෂයේ නියෝජිතයා සහ ප්‍රාදේශීය සංවිධායකයින් වර්ෂාව පවතින අවස්ථාවේදී ත්‍රීරෝද රථයකින් ගමන් ගනිමින් සිටියදී ඊට පසුපසින් පැමිණි රථයක් විසින් හිතා මතාම ත්‍රීරෝද රථයෙහි ගැටී ඇති බවත් එයින් ත්‍රීරෝද රථයෙහි

ගමන්ගත් අයවලුන් හට සුළු තුවාල සිදු වූ බවත් මේ සම්බන්ධයෙන් මතුගම පොලිසියේ පැමිණිල්ලක් ද කර ඇති අතර සැක කටයුතු වාහනයේ අංක කිසිවක් සටහන් කර ගැනීමට හැකි වී නොමැති බවත් නියෝජිතයකු විසින් පෙන්වා දෙන ලද අතර මැතිවරණ කොමසාරිස් එහිදී දන්වා සිටියේ මේ සම්බන්ධයෙන් මතුගම පොලිසියෙන් විමසා සිටීමට කටයුතු කරන බවයි. එහිදී සභාවේ නියෝජිතයින් කිහිප දෙනෙකු විසින්ම දන්වා සිටියේ නිවටඹුව ප්‍රදේශයේ එකම අංක තහඩුව සහිත ඩිපෙන්ඩර් රථ 10 ක් පමණ ධාවනයේ පවතින බවයි. එහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ මේවායේ ඡායාරූප සමඟ ලිඛිතව තොරතුරු වාර්තා කරන ලෙසත් එවිට ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගත හැකි බවත් ය.

එහිදී විජයදාස රාජපක්ෂ මහතා ප්‍රකාශ කර සිටියේ මෙවැනි ක්‍රියා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට වගකීමක් පොලිසිය වෙත පවතින බවත් එම වගකීම පැහැර හැරීම පොලිස් ආඥා පනත යටතේ වරදක් වන බවත් ය. ශ්‍රීනාත් පෙරේරා මහතා ද එහිදී අදහස් දක්වමින් දන්වා සිටියේ පළාත් පාලන ඡන්ද විමසීම් කාල පරිච්ඡේදයේදී පක්ෂ කාර්යාල පිහිටුවීමට අවසර දෙන ලද්දේ නිශ්චිත ස්ථාන සඳහා පමණක් වුවත් වර්තමානයේ සෑම හිස් ඉඩමකම පාහේ විශාල දැන්වීම් සහිත කාර්යාල දක්න ලැබෙන බවයි.

මැතිවරණ කොමසාරිස් මෙහිදී අදහස් දක්වමින් මෙම මැතිවරණය සඳහා ඇත්තේ ඉතා සීමිත කාල පරාසයයක් වන බැවින් මැතිවරණ නිලධාරීන් මේ සියලු කටයුතු සඳහා එකවිට යෙදවීම අපහසු වන බවත් කෙසේ වුවද මෙම කාර්යාල අවසරලත් කාර්යාල ද නැතහොත් නීති විරෝධී කාර්යාල ද යන්න මැතිවරණ දෙපාර්තමේන්තුව සහ පොලිසිය විසින් භෞතිකව පරීක්ෂාකොට තහවුරු කර ගත යුතුව ඇති බවත් ය.

22. ඉන් අනතුරුව මැතිවරණ කොමසාරිස් විසින් ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ සිට ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලිය සහ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන ආකාරය පිළිබඳව මතු සඳහන් පරිදි කරුණු පැහැදිලි කරන ලදී.

i. නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ දී ඡන්ද පෙට්ටි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු වෙත නිකුත් කරනු ලබන අතර මෙම ඡන්ද පෙට්ටිවල ඒවාට අයත් අනුක්‍රමික අංක (Serial Numbers) සටහන් වන අතර එම අංක සියල්ල අපේක්ෂකයින්ගේ නියෝජිතයින් විසින් ද සටහන් තබාගනු ලැබේ.

ii. ඡන්ද පත්‍රිකා ඉන් එක් ඡන්ද පෙට්ටියක් තුළට බහාලනු ලබන අතර එහි පිටුපස Seal 03 ක් අතුරින් අහඹු ලෙස තෝරාගත් Seal එකක් භාවිතාකොට එහි නිල සලකුණ තබනු ලැබේ. අවශ්‍ය නම් නියෝජිතයින්ගේ ද මුද්‍රා මෙහි තැබිය හැකිය.

iii. ඡන්ද පත්‍රිකා ගිණුමෙහි පිටපතක් නියෝජිතයින් හට ද ලබා දෙනු ලැබේ.

iv. ඡන්ද පොළේ සිට ඡන්ද පෙට්ටි ගෙන එන විට ද ඉතා සුපරික්ෂාකාරී ක්‍රමවේදයක් අනුගමනය කරනු ලබන අතර සෑම පෙට්ටියකම කාබනයිස් පිටපතෙහි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති විසින් සිය අත්සන යොදනු ලබන අතර අහඹු ලෙස තෝරාගත් කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගේ ද අත්සන යොදනු ලැබේ. එමෙන්ම නියෝජිතයිගේන් ද අත්සන් සහිත පත්‍රිකාවක් එහි අලවනු ලැබේ.

v. ඡන්ද පෙට්ටි භාර ගැනීම ද ඡන්ද පෙට්ටි නිකුත් කරන ස්ථානයේදීම වන අතර එසේ ගෙන එන ඡන්ද පෙට්ටි මුද්‍රා තබා, ප්ලාස්ටික් බෑගයක බහා එහි අගුලක් දමා ඉතා ආරක්ෂිත ලෙස ගෙන එනු ලැබේ. ඡන්ද පොළේ සිට මෙම ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ පරිශ්‍රය දක්වා ගෙන එන විට එය අදාළ ඕනෑම පාර්ශ්වයක් හට නිරීක්ෂණය කිරීමට හැකි අතර ගණන් කිරීමේ ශාලා පරිශ්‍රවල තම නියෝජිතයන් රඳවා තැබීමට ද අවකාශ හිමිවේ. එහෙයින් ඡන්ද පොළට සහ ගණන් කිරීමේ ශාලා පරිශ්‍ර තුළට නියෝජිතයන් පත් කර යැවීම ඉතා වැදගත් වේ.

vi. ගණන් කිරීමේ ශාලාවේදී එක් එක් ඡන්ද පෙට්ටිය අයත් ඡන්ද පොළේ නම හඬ නගා කියවනු ලැබේ. අනතුරුව ආරක්ෂිත අගුල් විවර කර සියලු පාර්ශ්ව හට ඡන්ද පෙට්ටිය පරීක්ෂා කිරීමට ඉඩ කඩ සැලසේ. අනතුරුව ඡන්ද පෙට්ටිය ඇතුළත සටහන් කර ඇති අනුක්‍රමික අංකය (Serial Numbers) හඬ නගා කියවනු ලැබේ. ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ දී නියෝජිතයින් විසින් මෙම අංක සටහන් තබාගෙන ඇති බැවින් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ගෙන එනු ලැබුවේ නිකුත් කළ ඡන්ද පෙට්ටිම වන බව තහවුරු කර ගැනීමට ඉන් හැකියාව ලැබේ.

vii. සෑම පක්ෂයකටම අපේක්ෂකයින් පස් දෙනෙකු සිටින බැවින් සියලු කටයුතු නිරීක්ෂණය කිරීමට ඔවුන්ට ඉඩ කඩ සැලසේ.

viii. ගණන් කිරීමේ කාර්යය ආරම්භයේ දී ප්‍රධාන මේසය මතට ඡන්ද පත්‍රිකා සියල්ල දමා වර්ගීකරණය කරනු ලැබේ. (ඒ ඒ පක්ෂ අනුව) මෙහිදී තම පක්ෂයට අඩු ඡන්ද සංඛ්‍යාවක් ලැබී තිබේ යැයි පෙනී ගිය ද ගණන් කිරීමේ ශාලා පරිශ්‍රයෙන් ඉවත් නොවී නියෝජිතයින් එහි තවදුරටත් රැඳී සිටින්නේ නම් වඩා යෝග්‍ය වේ.

ix. ඡන්ද පත්‍රිකා නියෝජිතයින් අතටකිසිදු විටෙක පත් නොවන අතර යම් ඡන්ද පත්‍රිකාවක් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් මතු වන විටකදී ඒ සම්බන්ධ තීරණය කිරීමේ බලය ඒ ඒ පක්ෂවල කැපී පෙනෙන නියෝජිතයින්ගේ ද අදහස් විමසීමෙන් අනතුරුව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී සතු වේ.

x. කිසිදු නියෝජිතයකු / නිරීක්ෂකයකු නොමැති වුවද ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් අදාළ කටයුතු නිරවද්‍යභාවයෙන් සහ විශ්වාසදායකව ඉටු කරනු ලැබේ.

xi. ඉහත කී පරිදි ඡන්ද පත්‍රිකා වර්ගීකරණයට ලක් කළ පසු වෙනත් පක්ෂවල ඡන්ද පත්‍රිකා ඒ ඒ ගොඩවල් වල මිශ්‍ර වී ඇත්දැයි පරීක්ෂා කරමින් දෙවනවර ද වර්ගීකරණයට ලක්කර නිරවද්‍යතාව නැවත සහතික කරගනු ලැබේ.

xii. වර්ගීකරණයෙන් අනතුරුව ඡන්ද පත්‍රිකා 50 බැගින් සකසනු ලැබේ. තවත් කණ්ඩායමක් විසින් ඒවා කළවම් නොවන පරිදි රබර්පටියක් යොදනු ලැබේ. තෙවන කණ්ඩායම විසින් ඒවා නැවත පරීක්ෂා කරනු ලැබේ. අනතුරුව සහකාර තේරීම්භාර නිලධාරීන් දෙදෙනෙකු විසින් සුපිරි පරීක්ෂාවට ලක් කරනු ලැබේ. ඒවා නැවතත් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී විසින් පරීක්ෂා කරනු ලැබේ. (විවිධ පාර්ශ්ව තුළ ඇති මිථ්‍යා මත ප්‍රකාරන ඡන්ද පත්‍රිකා 45 බැගින් වලට හෝ 55 බැගින් වලට වෙන් කිරීමක් කිසිදු විටෙක සිදු නොවේ.)

xiii. අනතුරුව ප්‍රතිඵල සටහන් සකස් කරනු ලබන අතර සෑම නියෝජිතයකු විසින් ම තම අපේක්ෂකයාගේ නම ඉදිරියේ අත්සන යොදනු ලැබේ.

xiv. මෙම ප්‍රතිඵල ලේඛන අතින් සැකසුම් අංශය සහ පරිගණක අංශයේ වෙන වෙනම සකස් කරනු ලබන අතර තේරීම්භාර නිලධාරී විසින් ද වෙනම සකස් කරනු ලැබේ. අනතුරුව අතින් සැකසුම් ප්‍රතිඵල සහ පරිගණක පිටපත අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන් විසින් නැවත පරීක්ෂා කර බලනු ලැබේ.

xv. ඉන් අනතුරුව අවසාන ප්‍රතිඵල ලේඛනය මත මැතිවරණ කොමසාරිස්ගේ අත්සන යොදනු ලැබේ. එම ප්‍රතිඵල ලේඛනය තේරීම්භාර නිලධාරී වෙත ෆැක්ස් මගින් යවනු ලැබීමෙන් විනාඩි 03 කට පසු මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වෙත මුද්‍රා හරිනු ලබන අතර සියලුම මාධ්‍ය වෙත ද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ද ෆැක්ස් මගින් යවනු ලැබේ.

23. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ලක් වූ සියලුම ප්‍රදේශවල "Vote is Your Right"යන්න පැහැදිලි කරමින් නාට්‍යක් පෙන්වීමට අපේක්ෂිත බවත් මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ද දැනුවත් කර ඇති බවත් මෙහිදී දන්වා සිටි මැතිවරණ කොමසාරිස් අතීතයේ දී කොළොන්නාව ප්‍රදේශයේදී සිදුවූ භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතාගේ ඝාතනය පිළිබඳ වන අඳුරු මතකය සිහිපත් කරමින් එවැනි කණගාටුදායක සිද්ධියක් නැවත සිදු වීමට කිසිසේත්ම ඉඩ දිය නොහැකි බව මෙහිදී ප්‍රකාශ කර සිටියේය. මෙම වැඩසටහන කොළොන්නාව ප්‍රදේශයේ විශේෂයෙන්ම ක්‍රියාත්මක කරනු ලබන බවත් සිදුවූ හීඝණකාරී ක්‍රියා කිහිපයක් හේතුවෙන් කොළොන්නාව ප්‍රදේශයේ ඡන්ද දායකයින් බියට පත්වී සිටින බවත් බස්නාහිර පළාත් සභා මන්ත්‍රී එස්.එම් මරික්කාර් මහතාගේ කාර්යාලයට අද දින ද වෙඩි ප්‍රහාරයක් එල්ල වී ඇති බවත් එහෙයින් එම ප්‍රදේශයට විශේෂ කාර්ය බලකා හමුදා සාමාජිකයින් අනුයුක්ත කිරීමට අපේක්ෂිත බව ද දැන්වීය.

24. ගණන් කිරීමේ ශාලා පරිශ්‍ර තුළ පක්ෂ කාර්යාල පිහිටුවීම සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ එක් පරිශ්‍රයක් තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානය සඳහා එක් කාර්යාලයක් ද නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ සඳහා එක් කාර්යාලයක් ද වාමාංශික අපේක්ෂකයින් සඳහා එක් කාර්යාලයක් ද සෙසු සියලුම අපේක්ෂකයින් සඳහා එක් කාර්යාලයක් ද වශයෙන් කාර්යාල වෙන් කර දීමට කටයුතු යොදා ඇති බවයි. එමෙන්ම මෙම මැතිවරණයේදී මනාප ගණන් කිරීමක් සිදු නොවන බැවින් ලැප්ටොප් පරිගණක සහ ජංගම දුරකථන ගණන් කිරීමේ ශාලා පරිශ්‍රයට ගෙන ඒමට අවසර නැති බව ද, මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන CDMA දුරකථන භාවිතයෙන් සන්නිවේදන අවශ්‍යතා ඉටු කර ගත හැකි බව ද අවශ්‍ය ගණනය කර ගැනීම් සඳහා ගණක යන්ත්‍ර (Calculators) භාවිතා කිරීමට අවසර ලබා දෙන බවද තවදුරටත් දන්වා සිටියේය.

එහිදී ආර්.යෝගරාජා මහතා ඉල්ලා සිටියේ ප්‍රතිඵල සටහන්වල මුද්‍රණ පිටපත් (Print Outs) ලබා ගැනීම ආදියට පහසු වන බැවින් ලැප්ටොප් පරිගණකයක් ගෙනයාමට අවසර ලබා දෙන ලෙසයි. මෙහිදී අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස්, මේවන විටත් කුඩා මට්ටමේ විවිධ මාධ්‍ය ජාල විසින් ඔවුන්ගේ නියෝජිතයන් හරහා මැතිවරණ ප්‍රතිඵල ලබා ගෙන මැතිවරණ දෙපාර්තමේන්තුවේ ප්‍රතිඵලයට පෙරාතුව ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් සහගත වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරනු ලබන බවට තොරතුරු වාර්තා වී ඇති බැවින් ජංගම දුරකථන හෝ ලැප්ටොප් පරිගණක ගණන් කිරීමේ ශාලා පරිශ්‍ර තුළට ගෙන යාමට අවසර ලබා දීමට හැකියාවක් නොවන බව දැන්වීය. ජංගම දුරකථනයක් භාවිතා කළ හැක්කේ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීහට පමණක් බවත් එය ද පෙර පරීක්ෂාවකට ලක්කොට මුද්‍රා තැබීමෙන් අනතුරුව ගණන් කිරීමේ ශාලා පරිශ්‍රයට ගෙන යාමට අවසර ලබා දෙන බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

25. ජනාධිපති නීතීඥ ශ්‍රීනාත් පෙරේරා මහතා මෙහිදී විමසා සිටියේ ඡන්ද ගණන් කිරීමේ අවසාන ප්‍රතිඵලය ජනාධිපති කාර්යාලය හරහා නිකුත් කෙරෙන බවට මතයක් පවතින බවත් ඒ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කළ හැකි නම් වඩා යෝග්‍ය වන බවත්ය. එමෙන්ම 2015.01.15 දින තෛපොංගල් උත්සවය යෙදී තිබෙන බැවින් කොළඹ නගරයේ සේවයේ

නියුතු දමිළ ජනතාව හට ඡන්ද විමසීම් දිනයේ දී නිවාඩු ලබා නොදී තෙපෝංගල් දින නිවාඩු ලබා දීමට සංවිධානාත්මක වැඩ පිළිවෙලක් ක්‍රියාවේ පවතින බවට වාර්තා වන බවත් ඒ මහතා මෙහිදී දන්වා සිටියේය.

මේ සම්බන්ධව අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ ජනාධිපති කාර්යාලය හරහා කිසිදු අවස්ථාවක මැතිවරණ/ ඡන්ද විමසීම් ප්‍රතිඵල නිකුත් කිරීමක් සිදු නොවන බවත් එය හුදු ව්‍යාජ මතයක් පමණක් වන බවයි. එමෙන්ම ඡන්ද විමසීම් දින සේවයෙහි යෙදී සිටින අයවලුන් හට නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් තීරණ ගෙන ඇති බවයි. මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ද ඒ සඳහා ලබා දී ඇති බවත් ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් ඒ අනුව 40 km ඇතුළත සීමාවේ පදිංචිකරුවන් සඳහා වරුවක නිවාඩු කාලයක් ද, 40km – 120km අතර දුර සීමාවේ පදිංචිකරුවන් සඳහා එනක් දිනක නිවාඩු කාලයකුත්, එමෙන්ම 120km ට වඩා වැඩි දුර සීමාවේ පදිංචිකරුවන් සඳහා දින දෙකක නිවාඩු කාලයකුත් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත කර ඒ බව නිවේදනය කර ඇති බව ද දන්වන ලදී.

ඒ අනුව තවදුරටත් අදහස් දැක්වූ මැතිවරණ කොමසාරිස් පැහැදිලි කරන ලද්දේ අදාළ සේවකයින් හට සිය ඡන්දය ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් පරිදි නිවාඩු ලබා දෙන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශ්ව වෙත ලිඛිතව දැනුම් දෙනු ලබන බවත් මෙම නිවාඩු කාලසීමාව පිළිබඳව බොහෝ පාර්ශ්ව විසින් විමසන බැවින් ඒ සම්බන්ධව පුවත්පත් දැන්වීමක් පළ කිරීමට ද මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබන බවයි.

26. මෙහිදී අදහස් දැක්වූ දයා පැල්පොල මහතා විමසා සිටියේ වත්මන් කාලගුණ තත්ත්වය ඉතා හානිදායක අයුරින් ජනජීවිතය කෙරෙහි බලපා ඇති බැවින් බොහෝ දිස්ත්‍රික්ක ජල ගැල්මට සහ නායයෑම්වලට ලක්වී ඇති බවයි. මෙම ප්‍රදේශවල පදිංචි ජනතාව සිය ඡන්දය ප්‍රකාශ කරන්නේ කෙසේද යන්න එහිදී ඒ මහතා විමසා සිටියේය. එහිදී මැතිවරණ කොමසාරිස් දන්වා සිටියේ මේ සම්බන්ධව 2014.12.27 දින දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ සාකච්ඡා කිරීමට යෝජිත බවයි. එමෙන්ම ඒ මහතා තවදුරටත් ප්‍රකාශ කර සිටියේ සිරිකොත මූලස්ථානයට පහරදීම වැනි සිදුවීම් ඉදිරියේදී වුව සිදුවිය හැකි බවත් මෙවැනි ක්‍රියා වලක්වාලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද යන්නත් එමෙන්ම පොලිස් ජංගම සේවා ක්‍රියාත්මක වන්නේ කෙදින පටන්දැයි පොලිසියෙන් විමසා සිටින බවත් භීෂණකාරී ක්‍රියා හමුවේ පොලිසිය දරන නිහඬ ප්‍රතිපත්තිය කෙරෙහි පොදු මහජනතාව සැබැවින්ම කලකිරී සිටින බවත්ය. මෙහිදී අදහස් දැක්වූ ජ්‍යෙෂ්ඨ නියෝජය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා පවසා සිටියේ සිරිකොත සිදුවීම සම්බන්ධව අදාළ පොලිස් ස්ථානාධිපති සහ දිස්ත්‍රික්භාර සහකාර පොලිස්පති වෙතින් වාර්තා කැඳවා ඇති බවත් ඉතා ඉක්මනින් එම වාර්තා තමන් වෙත යොමු වනු ඇති බවත් ය.

27. යළිත් අදහස් දක්වමින් අසාත් සාලි මහතා පෙන්වා දෙන ලද්දේ අතීතයේ එක්තරා අවස්ථාවකදි ජනාධිපති අපේක්ෂකයකුව සිටි ගාමිණී දිසානායක මහතා ඇතුළු පිරිස ඝාතනයට ලක්වූ බවත් එමෙන්ම පෙර සඳහන් කළ පරිදිම භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා ද මහ මගදී අමානුෂික ලෙස ඝාතනය වූ බවත් මෙවැනි සිදුවීම් සිදුවන විට මානව හිමිකම් දක්නට ඇත්තේ කොහේද යන්න සාධාරණ ගැටළුවක් මතුවන බවත්ය. එමෙන්ම පොලිසියේ නිලධාරීන්හට ඔවුනගේ රාජකාරි කිසිදු හෝ පාර්ශ්වයකගේ මැදිහත්වීම්වලින් තොරව ඉතා සාධාරණව සහ නිදහස්ව ඉටු කිරීමට අවස්ථාව නිසැක වශයෙන්ම තිබිය යුතු බවත් ඒ මහතා මෙහිදී තවදුරටත් ප්‍රකාශ කර සිටියේය.

එහිදී උපුල් ජයසූරිය මහතා ද පෙන්වා දෙන ලද්දේ මැතිවරණ කොමසාරිස්හට පොලිසියේ රාජකාරිය ඉටු කළ නොහැකි බවත් පොලිස්පති ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුව කැප වී සිටින්නේ ඒ සඳහා වන අතර මැතිවරණ කටයුතු සම්බන්ධව මැතිවරණ කොමසාරිස්ගේ උපදෙස් හා නියෝග ප්‍රකාරව ක්‍රියා කිරීමට පොලිසිය කටයුතු කළ යුතු බවත් එමෙන්ම අවම වශයෙන් මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා හෝ පොලිසිය මෙයට වඩා සක්‍රීය මට්ටමින් ක්‍රියා කළ යුතු බවත්ය. තවද පෝස්ටර් සහ කටවුටි සපුරා මැතිවරණ නීති උල්ලංඝනය කරන ඒවා වන අතර පොලිසිය විසින් මේවා ඉවත් කිරීමට මෙයට වඩා වගකීමෙන් කටයුතු කළ යුතු බව ද ඒ මහතා මෙහිදී සඳහන් කර සිටියේය.

මේ පිළිබඳව අදහස් දක්වමින් මැතිවරණ කොමසාරිස් පෙන්වා දෙන ලද්දේ මෙම කරුණු සම්බන්ධයෙන් පොලිසිය සමඟ වෙනම සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවත් කෙසේ වුවද නීති බලාත්මක කිරීම සම්බන්ධව පොලිසියට පමණක් තනිව ක්‍රියා කිරීමට හැකියාවක් නොවන අතර සියලු පාර්ශ්වවල සහාය ඒ සඳහා දැක්විය යුතු බවත්ය. මැතිවරණ කටයුතු නිදහස්වත්, සාධාරණයත් එමෙන්ම විනිවිදභාවයෙනුත් ඉටු කිරීම සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ග ගනු ලබන බවත් ගැටළු ඇතොත් ඒ පිළිබඳ සාකච්ඡා කරමින් අදාළ ක්‍රියාමාර්ග කරා යොමුවිය හැකි බවත් තවදුරටත් මෙහිදී පෙන්වා දෙන ලදී.යම් හෙයකින් පොලිසිය විසින් නිසි ක්‍රියාමාර්ග නොගන්නේ නම් ඒ පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග කරා යොමු වීමට ඕනෑම පාර්ශ්වයකට හැකියාව පවතින බවත් නීති බලාත්මක කිරීමට පොලිසිය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නේ යැයි චෝදනා එල්ල කිරීම සාධාරණ හා නිවැරදි නොවන බව මැතිවරණ කොමසාරිස් මෙහිදී පැහැදිලි කර සිටියේය.

යළිත් අදහස් දක්වමින් ජ්‍යෙෂ්ඨ නියෝජය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) ගාමිණී නවරත්න මහතා පෙන්වා දෙන ලද්දේ සමස්ථ දිවයින තුළම ප්‍රදර්ශනය කරනු ලබන පෝස්ටර්/ කටවුට්/ ඩිජිටල් තිර එකවර ඉවත් කිරීමට හැකියාවක් නූවූවද හැකි උපරිම ප්‍රමාණයෙන් මේවා ගලවා ඉවත් කිරීමට මෙවන විටත් කටයුතු කර ඇති බවත්ය. එමෙන්ම විපක්ෂයේ ජනාධිපතිධුර අපේක්ෂකයා විසින් ද මේ හා සමානව පෝස්ටර් හා කටවුට් ප්‍රදර්ශනය කළේ නම් මේවා ඉවත් කිරීම මෙයට ද වඩා සංකීර්ණ කාර්යයක් වීමට ඉඩ තිබූ බවත් දන්වන ලදී.

28. අනතුරුව ඡන්ද පත්‍රිකාව මත ඡන්දය සලකුණු කළ යුතු ආකාරය පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් මතු සඳහන් කරුණු දක්වා සිටින ලදී.

i. වලංගු ඡන්ද පත්‍රිකාවක් ලෙස හාර ගනු ලබන්නේ X , 1 හෝ √ යොදා ඇති ඡන්ද පත්‍රිකා පමණි.
එහෙත් ඡන්ද සලකුණ වටා රවුමක් ඇඳ තිබේනම් සහ සලකුණ යටින් ඉරක් ඇඳ තිබේනම් ඒවා ද වලංගු ඡන්ද පත්‍රිකා ලෙස හාරගනු ලැබේ.
ii. මනාප සලකුණු කරන්නේ නම් පමණක් 1, 2 සහ 3 අංක භාවිත කළ හැකිය.
iii. X සමඟ කිසිවිටකත් 1,2 හෝ 3 යෙදිය නොහැක. එමෙන්ම කතිරය සමඟ 2 සහ 3 ද භාවිතා කළහොත් එම ඡන්ද පත්‍රිකාව අවලංගු කරනු ලැබේ.
iv. ඡන්ද පත්‍රිකාව පුරා සලකුණු කරනු ලබන විශාල ප්‍රමාණයේ කතිරය මගින් ඡන්ද පත්‍රිකාව අවලංගු වේ.
v. හඳුනාගැනීමේ සලකුණු යොදා තිබෙන ඡන්ද පත්‍රිකා ද අවලංගු ඡන්ද පත්‍රිකා සේ සැලකේ.
vi. සිය ඡන්දය සලකුණු කිරීමේ දී හැකිතාක් X පමණක් යොදා ගැනීමට හැකිනම් වඩා යෝග්‍ය වේ. එම X අදාළ කොටුව තුළ පමණක් ඇඳ තිබිය යුතුය.
vii. පනතේ නිශ්චිත වගන්ති ප්‍රකාරවම ඡන්ද පත්‍රිකා වලංගු/ අවලංගු ලෙස තීරණය කෙරේ.

29. 50% ක ඡන්ද ප්‍රතිශතයක් ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාගෙන් කිසිවකුට හෝ නොමැති නම් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න විවිධ පාර්ශ්ව විසින් ප්‍රශ්න කරනු ලබන බවත් එවන් විටකදී එම අපේක්ෂකයින් සඳහා සෙසු අපේක්ෂකයින්ගේ ඡන්ද පත්‍රිකා මත සටහන් කර ඇති මනාප සංඛ්‍යාව අදාළ අපේක්ෂකයින් දෙදෙනා වෙත එකතු කරනු ලැබීමෙන් අනතුරුව වැඩි ඡන්ද සංඛ්‍යාව ලබා ගත් අපේක්ෂකයා තෝරා ගනු ලබන බව මැතිවරණ කොමසාරිස් මෙහිදී පෙන්වා දෙන ලදී.

30. මේ අවස්ථාවේදී අදහස් දැක්වූ ආර්.යෝගරාජා මහතා ප්‍රකාශ කරන ලද්දේ ඉදිරිපත් වූ මේ සියලු කරුණු කාරණා අනුව පෙනී යන්නේ ඡන්දය ප්‍රකාශ කිරීමේ දී, ඡන්ද පෙට්ටි ගණන් කිරීමේ පරිශ්‍රය වෙත ගෙන යන විටදී හෝ ගණන් කිරීමේ ක්‍රියාවලිය තුළදී ඒ සම්බන්ධයෙන් කිසිදු හෝ අක්‍රමිකතාවක් සිදු නොවන බව වන අතර එය පොදු මහජනතාවගේ ද දැනගැනීම පිණිස ඡන්ද විමසීම් දිනට පෙරාතුව දැනුම් දීමට හැකි නම් වඩා යෝග්‍ය බවයි.

මැතිවරණ දෙපාර්තමේන්තුව කෙරෙහි එවන් විශ්වාසයක් ගොඩ නැගී තිබීම පිළිබඳව සිය සතුට පළ කළ මැතිවරණ කොමසාරිස් මේ සම්බන්ධව මාධ්‍ය හරහා සිංහල දමිල සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් පැහැදිලි කිරීමක් සිදු කිරීමට ඉදිරියේදී බලාපොරොත්තු වන බව දන්වා සිටියේය.

31. ගාල්ලේ නීතීඥ සංගමය විසින් නිකුත් කරන ලද යෝජනාවක් අනුව ස්වාධීන රූපවාහිනී සේවය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, ලේක් හවුස් ආයතනය, රජයේ මුද්‍රණාලය සහ මැතිවරණ දෙපාර්තමේන්තුව නීති විරෝධී ලෙස ක්‍රියා කරන්නේ යැයි ද එය වලක්වාලීම සඳහා සියලු උතසාහ දැරිය යුතු බවත් දක්වා ඇති බව මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් මැතිවරණ දෙපාර්තමේන්තුව හෝ මැතිවරණ නිලධාරීන් හෝ කිසිදු අවස්ථාවක අක්‍රමිකතාවන්හි නිරත නොවන බවත් කිසිදු අවස්ථාවක ඡන්ද පෙට්ටි මාරු කිරීම වැනි ක්‍රියා සිදු නොවන බවත් ඒ සම්බන්ධයෙන් පවතින්නේ හුදෙක් මිත්‍යා මතයක්ම පමණක් වන බවත් එමෙන්ම ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස් වශයෙන් සහතික වන බවත් මෙහිදී තවදුරටත් දැන්වීය.

32. ගණන් කිරීමේ ශාලා සඳහා පත් කර එවන නියෝජිතයින් දිවා කාලයේ දී ඡන්ද මධ්‍යස්ථානවල කටයුතු සඳහා වෙහෙසුන අය නොවන්නේ නම් වඩා යෝග්‍ය වන බවත් එමෙන්ම මත්පැන් භාවිතා කර සිටින නියෝජිතයින් ගණන් කිරීමේ ශාලා තුළට නොයවන ලෙසත් මැතිවරණ කොමසාරිස් සියලු පාර්ශ්ව වෙත දන්වා සිටියේය. ගණන් කිරීමේ ශාලා තුළදී තම අපේක්ෂකයාට කොපමණ ඡන්ද ප්‍රමාණයක් ලැබී තිබුණේදැයි සටහන් කර ගෙන ඡන්ද පත්‍රිකා ගිණුම හා සසඳා බලමින් නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට ක්‍රියා කරන ලෙස අදාළ නියෝජිතයින්හට උපදෙස් ලබා දෙන ලෙස ද මෙහිදී දන්වන ලදුව එසේ වුවද ගණන් කිරීමේ ශාලා පරිශ්‍ර තුළ කිසිදු නියෝජිතයකු පත් නොකළ ද, කිසිදු නිරීක්ෂණ සංවිධානයක් සහභාගී නොවූවද ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලිය ඉතා නිවැරදිව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් අතින් ඉටු වන බවත් මෙහිදී පෙන්වා දුන් මැතිවරණ කොමසාරිස් වෙනත් කිසිදු පාර්ශ්වයකගේ සහතිකයක් ඡන්ද විමසීම් ක්‍රියාවලියේ නිරවද්‍යතාව පිළිබඳව මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය නොවන බවත් මෙහිදී පෙන්වා දෙන ලදී.

33. ඉදිරි ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණව විනිවිද භාවයෙන් යුතුවත් එමෙන්ම ඒ බව පොදු මහජනතාවට ප්‍රදර්ශනය වන ආකාරයෙනුත් පැවැත්වීම සඳහා සියලු පාර්ශ්ව වගකීමෙන් යුතුව ද එමෙන්මඟන්ද විමසීමේ සුජාතභාවය සහ සුපිරිසිදුභාවය ආරක්ෂා වන පරිදි කැපවීමෙන් ක්‍රියා කරනු ඇතැයි ද අපේක්ෂා කරනු ලබන බවත් මෙහිදී ප්‍රකාශ කර සිටි මැතිවරණ කොමසාරිස් සාකච්ඡාවට ලක් කළ යුතු වෙනත්කරුණු වෙත්නම් ඉදිරිපත් කරන ලෙස සභාව වෙත කාල වේලාව ලබා දුන් අතර එවැන්නක් නොමැති බැව් පෙනී ගියෙන් අද දින සහභාගීත්වය දැක්වූ සියලු පාර්ශ්ව වෙත සිය ස්තුතිය නැවතත් ප්‍රකාශ කර සිටිමින් සාකච්ඡා සභාවේ කටයුතු පැය 1810 ට අවසන් කරන ලදී.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මාධ්‍ය නිවේදන අංක 37

ජනාධිපතිවරණය - 2015 ජනවාරි 08
මැතිවරණ කොමසාරිස්ගේ නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම,ඡන්ද දායකයින් 15,044,490ක් උදෙසා ඡන්ද මධ්‍යස්ථාන 12,314කදී 2015.01.08 දින පෙ.ව.7.00 සිට ප.ව. 4.00 දක්වා පවත්වන ලදී. ජනාධිපතිවරණයක් පැවැත්වීම සඳහා ස්වකීය අභිලාෂය අතිගරු ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබූ 2014.11.20 දිනෙන් ආරම්භවූපූර්ව ඡන්ද විමසීම් කාල පරිච්ඡේදයෙහි සමහර දේශපාලන පක්ෂවල ආධාරකරුවන් ප්‍රචණ්ඩකාරී ලෙස කටයුතු කරමින් ඡන්ද විමසීම් නීති මෙන්ම සාමාන්‍ය නීති උල්ලංඝනය කරමින් දේශපාලන කටයුතුවල යෙදීම පිළිබඳව ලද පැමිණිලි සංඛ්‍යාව හා එම කාලසීමාව තුළ සිදු වූ බවට පැමිණිලි ලද අනීතික ක්‍රියා පිළිබඳව සලකා බලන විට දී ඡන්ද විමසීම් දින බැනර්, කටවුට්වලින් තොර සහඡන්ද මධ්‍යස්ථානපරිශ්‍ර තුළ පමණක් නොව ඉන් බාහිරව ද ගැටුම් ඇති වීමෙන් තොරසාමකාමී වාතාවරණයක් මධ්‍යයේ ඡන්ද විමසීම පවත්වන්නට හැකි වීම පිළිබඳව බෙහෙවින් සතුටු වෙමි.පූර්ව ඡන්ද විමසීම් කාලසීමාව තුළ වූ නීති විරෝධී ක්‍රියාවලට වග කිවයුතු තැනැත්තන්ට එරෙහිව නීති මගින් ක්‍රියා කිරීමත්, ඉදිරියේදී මෙවැනි සිද්ධි ඇති වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපායන් ගැනීමත්,සක්‍රීය ඡන්ද විමසීම් කාලසීමාවේ දී හාපශ්චාත් ඡන්ද විමසීම් කාලසීමාව තුළ මහජන පෙළපාලිහා රථ පෙළපාලි පැවැත්වීම වැළැක්වීමට දැඩි පියවර ගැනීමත් අත්‍යාවශ්‍ය බව ද ප්‍රකාශ කර සිටිනු රිසියෙමි.මේපිළිබඳව පොලිස්පතිවරයා වෙත විශේෂ ඉල්ලීමක් මගින්දැන්වීමට අපේක්ෂා කරනු ලැබේ. කෙසේ වුවද සමස්ත දිවයිනෙහිම ඡන්ද දායකයන්ට ඡන්ද පොළට පැමිණීමේ දී හා ස්වකීය ඡන්දය ඡන්ද පොළේ දී නිදහස්ව හා රහස්‍ය ලෙස භාවිතා කිරීමේ දී කිසිදු බාධාවක් වූ බවට පැමිණිලි නොලැබීම මාගේ සතුටට හේතු වේ.

ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීම සඳහා සියලුම දිස්ත්‍රික්කවලදිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හාප්‍රාදේශීය ලේකම්වරුන් හා සෙසු නිලධාරීන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ග්‍රාම නිලධාරීන් මෙන්මඡන්ද විමසීමට අදාළව සම්බන්ධීකරණ හා මෙහෙයුම් කාර්යයන්හි නිරත වූ සියලුමරජයේ නිලධාරීන් සහ මැතිවරණ වෘත්තිකයින් විසින් ඉටුකළ සේවය අතිශයින් අගය කළ යුතුය. විශේෂයෙන්ම දිස්ත්‍රික් මට්ටමේ දී ඡන්ද විමසීමට අදාළ සියලුම කාර්යයන්

භාරව ක්‍රියා කළ තේරීම්භාර නිලධාරීන් හා ඔවුන්ගේ සහායක කාර්ය මණ්ඩලයේ මිල කළ නොහැකි කාර්යය භාරය මෙම ජනාධිපතිවරණය නියමිත කෙටි කාලසීමාව තුළ සාර්ථකව නිමකර ගැනීමට බෙහෙවින් උපකාරී විය.අමාත්‍යාංශ ලේකම්වරුන් හා ඒ සමාන තනතුරු දරණ රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ගේ සිට අනියම් සහායකයන් දක්වා වූ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන්ගේ, විදුහල්පතිවරුන්ගේ/ ගුරුවරුන්ගේ හා සෙසු කාර්යය මණ්ඩලයේ සහාය නොමැති වූයේ නම්ඡන්ද විමසීමට අදාළ කාර්යයන් නිසි ලෙස ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත. රාජ්‍ය සේවයේ ගෞරවය හා කීර්තිය ආරක්ෂා කරමින් ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීමට සහාය දුන් ඒ සියලුම දෙනා මාගේස්තුතියට හිමිකම් ලබති. පසුගිය ඡන්ද විමසීම්වලදී මාතර, මඟියංගනය, කැස්බෑව, හෝමාගම, මහර යනාදි ප්‍රදේශයන්හි සිදුවූ අප්‍රසන්න සිදුවීම් හේතුවෙන් සහ ඡන්ද ගණන් කිරීමේ දී හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේදී මැතිවරණ නිලධාරීන් වංචාසහගත අයුරින් අනීතිකව ක්‍රියාකරන බවටනිරන්තරයෙන්ම කරනු ලැබූ චෝදනා හේතුවෙන් කනස්සල්ලට පත්ව සිටිමින් වුවද,ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතුවල හා ව්‍යවස්ථාපිත කටයුතුවල නිරත වීමට අමතරව ඡන්ද ප්‍රචාරක රැස්වීම් සඳහා ස්ථාන වෙන් කර ගැනීමේ ගැටලු, නීති විරෝධී ප්‍රචාරක කටයුතු පිළිබඳ ගැටලු, රජයේ නිලධාරීන් දේශපාලන කටයුතුවල නිරතවීම හා රාජ්‍ය දේපළ අයුතු පරිහරණය පිළිබඳ පැමිණිලි විමර්ශනය යනාදී සියලු කරුණුවලදීනිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීම පිණිස මවිසින් දෙන ලද උපදෙස්වලට අනුකූලවක්ෂණිකව මැදිහත් වෙමින් නොබියව හා නොපැකිලිව මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ඡන්ද විමසීම් නීති ආරක්ෂා කිරීම සඳහා විශේෂ උත්සාහයක් ගනිමින් හා ඡන්ද විමසීම නිසිලෙස පැවැත්වීම සඳහා අමිල කාර්යයක් ඉටු කරනු ලැබූ මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස්වරුන්ගේ, සෙසු මාණ්ඩලික නිලධාරීන්ගේහා සමස්ත කාර්යය මණ්ඩලයේද දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේමෙන්මඔවුන්ගේ කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ ද,මැතිවරණ දෙපාර්තමේන්තුවේ අනියම් සහායක කාර්ය මණ්ඩලයේ ද හා දෙපාර්තමේන්තුවට නිරතුරුව සහාය වන නිලධාරීන්ගේද රියදුරන්ගේ ද සහායකයන්ගේ දසේවය අතිශයින් අගය කරමි. ඔවුනට මාගේ ස්තුතිය මෙන්ම ප්‍රශංසාව ද හිමි වේ.

සක්‍රීය ඡන්ද විමසීම් කාලසීමාවේ මුල් සති කිහිපය තුළ ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා ක්‍රියා කිරීමට සිදු වූයේ මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා සහාය වූ සිවිල් නිලධාරීන්ටත් තේරීම්භාර නිලධාරීන්ට අනුයුක්ත කර තිබූ සීමිත පොලිස් නිලධාරීන් පිරිසකටය. එකී නිලධාරීන් සිදු කරනු ලැබූ කටවුට්/ බැනර් ඉවත් කිරීමේ ක්‍රියාවලිය නිසා ඡන්ද විමසීම කෙරෙහි ජනතා විශ්වාසය ඇති කිරීමට බෙහෙවින් දායක වූ බැවින් තර්ජන හා ගර්ජනවලට අභීතව මුහුණ දෙමින් එම කටයුතුවල නිරත වූ සියලුම සිවිල් නිලධාරීන්ට, පොලිස් නිලධාරීන්ට, රියදුරන්ට හා සහායකයන්ට විශේෂ ස්තුතිය හිමි වේ.

ඡන්ද විමසීම් නීතිදැඩිලෙස ආරක්ෂා කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබුවේ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් නැතහොත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීමට හෝ නොවන අතර, එය කිසිදු ආකාරයකින් ද්වේශ සහගත අරමුණකින් සිදු කරන ලද ක්‍රියාවක් නොවන බව වැඩිදුරටත් මෙහි සටහන් කරනු කැමැත්තෙමි. මැතිවරණ දෙපාර්තමේන්තුව ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා අවැසි සියලු කාර්යයන් ඉටුකිරීම් වස් හැකි උපරිම උත්සාහය දරන ලද්දේ,දිවයින තුළ ඡන්ද විමසීම් නීතිය ස්ථාපිත කිරීම යුගයේ අවශ්‍යතාවක් නිසා බව සටහන් කිරීම අත්‍යාවශ්‍යය.එමෙන්ම ඉදිරියේදී ද ඒ අරමුණ වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව නොපැකිළිව ක්‍රියා කරනු ඇති බව ද ප්‍රකාශ කරනු ලැබේ.

ඡන්ද විමසීමේදී වලංගු අනන්‍යතා ලියවිල්ලක් මගින් සිය අනන්‍යතාව සනාථ කළ යුතු යැයි යන නීතිමය තත්ත්වය නියම ආකාරයෙන් ආරක්ෂා කරමින් ජනතාවගේ ඡන්ද බලය සුරක්ෂිත කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන නියමානුකූලව පවත්වාගෙන යමින්, අත්‍යාවශ්‍යම පෞද්ගලික පහසුකම් පවා අසීරුවෙන් සපයා ගැනීමට සිදුවූ දුෂ්කර ඡන්ද මධ්‍යස්ථානවලදීවුවද මැසිවිලි නැගීමකින් තොරව,සතුටින් හා ප්‍රසන්නව සේවයේ යෙදෙමින් ස්වකීය රාජකාරි ඉටු කළ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළුඡන්ද මධ්‍යස්ථානවල සේවය කළ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සේවය මුදලින් මැනිය නොහැකිය. ඔවුන්ගේ සේවය සියලුම ශ්‍රී ලාංකිකයන් විසින් අගයනු ඇතැයි හඟිමි. තවද අතිශයින් වෙහෙසකර ව්‍යායාමයක් වූ ඡන්ද විමසීමේ උච්චතම අවස්ථාව වන ඡන්ද ගණන් කිරීමේ කාර්යයේ නිරත වූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන්ට හා සහායකයන්ටමාගේ ස්තුතිය හිමිවේ. ඡන්ද විමසීමේ කාර්යය, ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ හා භාර

ගැනීමේ කාර්යය හා ඡන්ද ගණන් කිරීමේ කාර්යය යන ඡන්ද විමසීම් ක්‍රියාදාමය හා සෘජුවම බැඳි කාර්යයන්ට අමතරව සුභසාධන, ප්‍රවාහන, ශාලා පහසුකම්, පොදු පහසුකම්, තැපැල් ඡන්ද කටයුතු,කාර්යමණ්ඩල පත් කිරීම් හා ප්‍රතිඵල වගුගත කිරීම යනාදී සෙසු කාර්යයන් භාරව ක්‍රියා කළ හා ඔවුනට සහාය වූ නිලධාරීන් වෙත පවරනු ලැබූ වගකීම් නිසි ලෙස ඉටු කිරීම මෙම ඡන්ද විමසීම සාර්ථකත්වයට හේතු වූ අදෘශ්‍යමාන කරුණු අතරට ගැනේ. ඒ සියලුම නිලධාරීන්ට මාගේ කෘතඥතාව හිමි වේ.

අපේක්ෂකයින්ගේ ආධාරකරුවන් අතුරින් කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් සිදු කළ ප්‍රචණ්ඩකාරී මැර ක්‍රියාවන් සහ නීත්‍යානුකූල නොවන ඡන්ද ප්‍රචාරක කටයුතු පිළිබඳව බෙහෙවින් කණගාටු වන අතරම ප්‍රචාරක කටයුතු සඳහා වේදිකා ඉදි කරමින් සිටියදී වෙඩි තැබීමක් හේතුවෙන් තුවාල ලබා ජීවිතක්ෂයට පත්වූ රත්නපුර කහවත්ත ප්‍රදේශයේ විපක්ෂයේ ආධාරකරුවකු වන ශාන්ත දොඩම්ගොඩ මහතාගේ අභාවය පිළිබඳව මාගේ සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටිමි. එමෙන්ම ප්‍රචණ්ඩ ක්‍රියා නිසා තුවාල ලබා රෝහල් ගතව සිටින සියලුම දෙනාට කඩිනම් සුවය ප්‍රාර්ථනා කරමි.

සාමකාමීව හා නීතිගරුකව ඡන්ද ව්‍යාපාරයේ යෙදුණු සියලුම අපේක්ෂකයන් සහ එම අපේක්ෂකයන් අයත් පක්ෂවල ලේකම්වරුන් හා එකී දේශපාලන පක්ෂවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා ක්‍රියාකාරී ආධාරකරුවන්ද පැමිණිලි විමර්ශන කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයින් මෙම ඡන්ද විමසීම සාර්ථකව අවසන් කිරීම සඳහා දක්වන ලද සහයෝගය පිළිබඳව ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට එකී යහපත් දේශපාලනඥයන්ගේ සහාය අතිශයින් ප්‍රයෝජනවත් විය.

ඡන්ද විමසීමට ආසන්න දින කිහිපය තෙක් ප්‍රදේශ කිහිපයක පොලිස් නිලධාරීන් නීතිය බලාත්මක කිරීමට මන්දෝත්සාහී ස්වභාවයක් පෙන්වූ නමුත් ආරම්භයේ සිටම නොපැකිලිවමා වෙත සහායවූ පොලිස්පතිවරයා සහ මැතිවරණ විෂයභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ද අවශ්‍ය අවස්ථාවලදී ස්වකීය සහාය ලබා දුන් පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුහා සෙසු නියෝජ්‍යපොලිස්පතිවරුන් හා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු මෙම ඡන්ද විමසීම සඳහා දායක වූ

සියලුම නීතිගරුක මෙන්ම නීතිය බලාත්මක කිරීමට කැපවී ක්‍රියා කළ පොලිස් නිලධාරීන් හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් විසින් දක්වන ලද සහයෝගය බෙහෙවින් අගය කරන අතර ඒ සියලුම දෙනාට අතිශයින් කෘතඥ වෙමි. ඡන්ද විමසීම් දිනයේදී මෙන්ම එයට පෙර ද ක්‍රියාත්මක වූ ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථාන භාරව කටයුතු කළ සියලුම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා එම නිලධාරීන්ට සහාය දැක්වූ පොලිස් නිලධාරීන් වෙතින් ඉටු වූ සේවය ද බෙහෙවින් අගය කොට සලකමි. ඡන්ද විමසීමට පෙර දින, ඡන්ද විමසීම් දින හා ඡන්ද ගණන් කිරීමේ දින ඡන්ද මධ්‍යස්ථානවල හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ආරක්ෂාව සැපයීමේ දී වෙහෙස හා සපයන ලද පහසුකම් පිළිබඳව තැකීමක් නොකර සේවයේ යෙදුණු සියලුම පොලිස් නිලධාරීන්ට හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ට මාගේ විශේෂ ස්තුතිය හිමි වන බව මෙහි සටහන් කිරීම මාගේ යුතුකමකි. වගකීමකි. තවද අවශ්‍ය ඕනෑම විටක පොලිස් දෙපාර්තමේන්තුවට සහායවීමට අපේක්ෂාවෙන් සුදානම්ව සිටි ත්‍රිවිධ හමුදාපතිවරු ඇතුළු සියලුම නිලධාරීන්ට ද මාගේ කෘතඥතාව හිමිවේ. එමෙන්ම උතුරු පළාතේ ඡන්ද මධ්‍යස්ථානවලට මුහුදෙන් හා ගුවනින් ප්‍රවාහන පහසුකම් සපයාදීම වෙනුවෙන් නාවික හා ගුවන් හමුදාපතිවරුන්ට ද ඔවුන්ගේ කාර්යය මණ්ඩලයට ද ස්තුතිවන්ත වෙමි.

ඡන්ද විමසීම් පැවැත්වූ කාල සීමාව තුළ සෑම විටම මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වන අවස්ථා පිළිබඳව සොයා බලා වාර්තා කිරීමෙන්ද, අපේක්ෂකයන් හා දේශපාලන ක්‍රියාකාරීන් ඡන්ද විමසීම් නීතියට අනුගත කරවීමට උත්සාහ කිරීමෙන්ද දක්වන ලද සහයෝගය සහ උනන්දුව සම්බන්ධයෙන්ද මාගේ ස්තුතිය ඔවුන්ට හිමි වේ.පැමිණිලි හා වාර්තා ඉදිරිපත් කිරීමේ දී සනාථ කළ හැකි කරුණු සම්බන්ධයෙන් පමණක් තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමට ක්‍රියා කරන ලෙස මා විසින් කරනු ලැබ තිබූ ඉල්ලීමට අනුකූලතාව දැක්වීමට උත්සාහ කළ නිරීක්ෂණ සංවිධානවලට ඒ පිළිබඳව විශේෂ ස්තුතියක් හිමි වේ. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අපක්ෂපාති නිරීක්ෂණ සංවිධානවල ක්‍රියාකාරීත්වය අත්‍යාවශ්‍ය වන හෙයින් මැතිවරණ දෙපාර්තමේන්තුව ඉදිරියේ දී ද නිරීක්ෂණ සංවිධානවල සහාය ඉතා ඕනෑකමින් අපේක්ෂා කරනු ලැබේ.

මෙම ඡන්ද විමසීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා මාගේ ඇරයුමෙන් විදේශීය නිරීක්ෂණ සංවිධානවල එනම් දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංසදය සහ ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංසදය යන ආයතනවල නියෝජිතයන් මෙරටට පැමිණුනි. එකී නිරීක්ෂකයන් පූර්ව ඡන්ද විමසීම් කාලසීමාව තුළ දිවයින පුරා මැතිවරණ නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ඡන්ද විමසීම් නීති ක්‍රියාත්මක කිරීමට මෙන්ම අපේක්ෂකයන් හා දේශපාලන ක්‍රියාකාරීන් ඡන්ද විමසීම් නීතිවලට අනුගත කරවීම ට මෙම විදේශ නිරීක්ෂකයින්ගේ පැමිණීම මනා පිටුවහලක් වූ බව මාගේ විශ්වාසයයි. එහෙයින් ජනාධිපතිවරණ ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා මෙරටට පැමිණ ඒ සඳහා ක්‍රියාකාරීව සක්‍රීය දායකත්වය ලබා දීම වෙනුවෙන් එම නිරීක්ෂණ සංවිධාන හා ඒවායේ නියෝජිතවරුන්ට මාගේ ගෞරවනීය ස්තුතිය හිමි වේ.

සමස්තඡන්ද විමසීම් ක්‍රියාදාමය පුරාම ඉතා කෙටිකාලයක් තුළ ඡන්ද පත්‍රිකා ඇතුළු සෙසු ලියවිලි කඩිනමින් මුද්‍රණය කරදුන්රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිවරයා ඇතුළු සියලුම නිලධාරීන්ට සහ සහායක කාර්ය මණ්ඩලයටද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම, තැපැල් ඡන්ද පිළිබඳව ක්‍රියා කිරීම හා හදිසි මැතිවරණ ලිපි බෙදා හැරීම යන කාර්යයන් නිසිලෙස ඉටු කරනු ලැබූ තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පතිවරයා ඇතුළු සියලුම නිලධාරීන්ට සහ සහායක කාර්යය මණ්ඩලයට ද, හැඳුනුම්පත් අභිමිඡන්දභිමියන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යය කඩිනම් කරනු ලැබූ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට හා එහි කාර්ය මණ්ඩලයට ද, ලංකා විදුලිබල මණ්ඩලයේ, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් හා කාර්යය මණ්ඩල සහායකයන් විසින් දක්වන ලද සහයෝගය පිළිබඳවද, මැතිවරණ කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා පහසුකම් සලසා දුන් ශ්‍රී ලංකා දුම්රිය සේවයටත්, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයටත්, පෞද්ගලික බස්ප්‍රවාහකයන්ගේ සියලුම සංවිධානවලට හා එකී පෞද්ගලික බස්රථවල සේවයේ නිරත සැමටත්, කුලී පදනම මත සේවය සැපයූ පෞද්ගලික වාහන හිමියන්ට හා රියදුරන්ටත් මගේ ස්තුතිය පිරිනමමි. වලංගු හැඳුනුම්පතක් නොමැති වූ ඡන්ද දායකයින් වෙත විකල්ප පියවරක් වශයෙන් තාවකාලික හැඳුනුම්පත් ලබා දීමට කටයුතු කළ සියලුම ග්‍රාම නිලධාරීන් සහ වතු අධිකාරීවරුන් වෙතත් ඒ සඳහා සහාය වූ නිරීක්ෂණ සංවිධානවලටත්මාගේ ස්තුතිය හිමි වේ.

ඡන්ද විමසීම් කටයුතු සඳහා හා ඡන්ද ගණන් කිරීමේ කටයුතු සඳහා රජයේ පාඨශාලා ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රමුඛ නිලධාරීන්ට ද සියලුම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්ට දපළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල ලේකම්වරුන්ට ද එකී පාසල්වල අත්‍යාවශ්‍ය පහසුකම් ලබා දීමට සහාය වූ පාසල් ප්‍රධානීන්ට ද ස්තුතිවන්ත වෙමි. එමෙන්ම ඡන්ද ගණන් කිරීම සඳහා කාර්මික විද්‍යාල ඇතුළු වෙනත් ස්ථාන ලබා දුන් රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්ට ද අපගේ ස්තුතිය හිමිවන අතර ඡන්ද මධ්‍යස්ථාන සඳහා ස්වකීය භාරකාරීත්වයේ ඇති විහාරස්ථාන හා ආගමික ස්ථාන ලබා දුන් විහාරාධිපති ස්වාමීන් වහන්සේලාට හා අන්‍යාගමික පූජක උතුමන් වෙත ගෞරව පූර්වකව ස්තුතිවන්ත වෙමි. තවද ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමට ස්වකීය ගොඩනැගිලි/ ඉඩම් ලබා දුන් එකී දේපල හිමිකරුවන්ට ද මාගේ කෘතඥතාව හිමිවේ.

ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලද සහාය සම්බන්ධයෙන් එහි ගරු සභාපතිතුමා ඇතුළු කොමසාරිස්වරුන්ටත්, ලේකම්වරුන් ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත් අතිශයින්ම කෘතඥ වෙමි.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ සියලුම නිවේදන මාධ්‍යවලට මුදාහැරීමේදී ද අවශ්‍ය සෑම විටම ජනමාධ්‍ය සම්බන්ධීකරණයේදී ද අමිල කාර්ය භාරයක් ඉටු කළ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලය සහ නාම යෝජනා දැන්වීම පළ කළ දින සිට මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී නිවැරදි තොරතුරු ලබා දීමට හා ඡන්ද හිමියන් දැනුවත් කිරීමට කටයුතු කළ මාධ්‍ය ආයතන සහ එම මාධ්‍ය ආයතන නියෝජනය කරනු ලබන මාධ්‍යවේදීන්දැක්වූ සහයෝගයද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සකස් කරනු ලබන මැතිවරණ ප්‍රතිඵල මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී නැවත පරීක්ෂා කිරීම සඳහා සහාය දැක්වූ සියලුම රාජ්‍ය නිලධාරීන් වෙත සහ අනුමත ප්‍රතිඵලය මාධ්‍ය ආයතන වෙත මුදා හැරීම සඳහා අනුග්‍රහය දැක්වූ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යනාංශයේ සියලුම නිලධාරීන් වෙත ද ඒ සඳහා අවශ්‍ය විද්‍යුත් සන්නිවේදන පහසුකම් සලසා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම් වෙත ද මගේ කෘතඥතාව පළ කරමි.

ඡන්ද විමසීමක් නිසි ලෙස පැවැත්වීම සඳහා ප්‍රමාණවත් නීති රීති හා බලතල සියල්ලක්ම පැවතියද, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්විය හැක්කේ දේශපාලන පක්ෂ නායකයන්ගේ, පක්ෂ ලේකම්වරුන්ගේ, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ගේ සහ ඡන්ද දායකයන්ගේ සහාය ලදහොත් පමණකි.එබැවින් මෙම ඡන්ද විමසීමෙහි සාර්ථකත්වය සඳහා කිසියම් ගෞරවයක් හිමි විය යුතු නම් එහි වැඩි කොටසක් නීති ගරුකව ක්‍රියා කළ දේශපාලනඥයන්ට හා නොබියව නිදහස්ව ස්වකීය ඡන්දය පාවිච්චි කළ ඡන්ද දායකයන්ට හිමි වේ. ලියාපදිංචි ඡන්ද හිමියන්ගෙන් 80% කට අධික ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කර තිබීම ඕනෑම තත්ත්වයක් යටතේ ඉහළම ප්‍රතිශතයක් ලෙස සැලකිය හැකිය. එබැවින් ස්වකීය ඡන්ද අයිතිය භාවිතා කළ දිවයිනේ සියලුම ඡන්ද දායකයන්ට මාගේ ගෞරවය, ස්තුතිය හා ප්‍රණාමය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

පසුගිය ඡන්ද විමසීම්වලට අදාළව ප්‍රචාරය කරනු ලැබූ පදනමක් නොමැති පදනම් විරහිත චෝදනා, විශේෂයෙන්ම ඡන්ද පෙට්ටි මාරු කිරීම්, ඡන්ද ගණන් කිරීමට අදාළ අකටයුතු, ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානවලදී ප්‍රතිඵල වෙනස් කිරීම් හා නව තාක්ෂණය ඇසුරෙන් සිදුකළ හැකි බව ප්‍රකාශිත කූට උපක්‍රම,ඡන්දය දාන්නේ කවරෙකුට ද යන්න සොයා ගත හැකි බව යනාදිය සම්බන්ධයෙන් ද ඌව පළාතේ මන්ත්‍රීධුර ගණනය කිරීමට අදාළව පැවති ප්‍රචාර හේතුවෙන් ද මැතිවරණ දෙපාර්තමේන්තුව හා මැතිවරණ නිලධාරීන් කෙරෙහි ඇතිව තිබූ අවිශ්වාසය ජනමාධ්‍ය හරහා කරනු ලැබූ දැනුවත් කිරීම් හරහා ජනාධිපතිවරණ දිනය අවසන් වන විට දී අවම මට්ටමට පත්ව තිබීම හා ඡන්ද විමසීමේ දිනයද ඇතුළු ආසන්න දිනවලදී නොබියව ඡන්දය භාවිතා කරන ලෙස ප්‍රචාරය කරනු ලැබූ නිවේදන, ජනතාව දැනුවත් කිරීමේ වීදි නාට්‍ය යනාදිය ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය ඉහළ යෑමට හේතුවී ඇතැයි හඟිමි.

ජනාධිපතිවරණය නිසිලෙස පැවැත්වීම පිළිබඳව මැතිවරණ දෙපාර්තමේන්තුවට හා කොමසාරිස්වරයා වශයෙන් මට දැන් බොහෝ පැසසුම් ලැබෙමින් පවතී. එසේ ප්‍රසංශා කරන සැමටම මාගේ නොවක් ස්තුතිය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. මා විසින් කරනු ලැබුවේ දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබූ රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම හෙවත් මහජන මතය නිසි ලෙස නොබියව ප්‍රකාශ කිරීමට අවශ්‍ය වාතාවරණය ඇති කිරීම හා එම මහජන මතය ප්‍රකාශිත ඡන්ද පත්‍රිකා නිසි ලෙස ගණන් කොට නිවැරදිව ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම පමණක් බවත් මා වෙත

ලැබෙන පැසසුම්, මෙයට පෙර ලද විවේචන සේමඋපේක්ෂාවෙන් භාර ගන්නා බවත්කාරුණිකව දන්වා සිටිමි.

සාමාන්‍යයෙන් ඡන්ද විමසීමට අදාළ අතුරු වාර්තාවේදී හා ප්‍රධාන වාර්තාවේදී හැර මෙවැනි මාධ්‍ය නිවේදනයකට ඇතුළත් නොකරන කරුණු කිහිපයක් අදාළ සියලුම පාර්ශ්වල දැන ගැනීම සඳහා සහ නිසි බලධාරීන්ගේ කාරුණික අවධානය යොමු කරන ලෙස ඉල්ලීම් වස් මෙහි සඳහන් කරනු රිසියෙමි.

- ඡන්ද විමසීම් කාලසීමාව තුළ රාජ්‍ය දේපල අයුතු පරිහරණය එනම්, පක්ෂ/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා නැතහොත් වෙනත් අපේක්ෂකයකු අගතියට පත් කිරීම සඳහාරජයේ දේපල වක්‍රව පමණක් නොව සෘජුවම ද යොදා ගැනීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවක් ඇතිවී තිබීම බෙහෙවින් කණගාටුදායකය. මෙම කටයුතු සිදුවන්නේ අදාළ ප්‍රමුඛ දේශපාලනඥයන්ගේ අනුදැනුමකින් තොරව බවට පෙනී යන අවස්ථාද ඇති අතර පෙර සඳහන් ආකාරයේ පැමිණිලි සියල්ලම සත්‍යයෙන් තොර සේ සලකා බැහැර කළ නොහැකිය. එබැවින් ඉදිරි ඡන්ද විමසීම්වලදී මෙම තත්ත්වය පාලනය කිරීමට කඩිනම් හා නිශ්චිත ක්‍රියාමාර්ග ගත යුතුව තිබේ. ඒ සඳහා මෙවැනි පැමිණිලි පිළිබඳව විමර්ශන කටයුතු පශ්චාත් ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී ද සිදු කිරීම අවශ්‍ය යැයි ඉදිරිපත් වී ඇති යෝජනා කෙරෙහි සැලකිල්ලක් දැක්වීම අත්‍යාවශ්‍යය.
- වත්මන් සමාජයේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන අතිමහත් වෙනස්කම් හා නව ප්‍රවණතා හේතුවෙන් සක්‍රීය ඡන්ද විමසීම් කාලසීමාව තුළ "මාධ්‍ය භාවිතාව පිළිබඳව නියාමන සිදු කිරීම" කළ නොහැකි හෝ අනවශ්‍ය හෝ දෙයක් බව යමෙකුට පෙනී යා හැකිය. එසේ වුවත් තවමත් අප සමාජයේ වැඩි ජනතා ප්‍රතිශතයක් මුද්‍රිත මාධ්‍ය එනම් පුවත්පත්, විද්‍යුත් මාධ්‍ය එනම් ගුවන් විදුලිය සහ රූපවාහිනිය කෙරෙහි විශ්වාසයක් තබා ඇති හෙයින් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා දේශපාලන පක්ෂවල මතය ජනතාව අතරට ගෙන යෑම සම්බන්ධයෙන් මාධ්‍ය අතිශයින් වැදගත් භූමිකාවක් උසුලයි. එබැවින් සියලුම රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාධ්‍ය උපමානවලට අනුකූලව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුව

තිබේ. මේසඳහා ඇෆ්ගනිස්ථානය වැනි රටවල හඳුන්වා දී ඇති ඡන්ද විමසීම් කාලය තුළ පමණක් බලපැවැත්වෙන විශේෂිත මාධ්‍ය කොමිසමක් පත් කිරීම වැනි කරුණු පිළිබඳව ද සලකා බැලීම මැනවි යැයි යෝජනා කරනු ලැබේ.

- සෘජුවම රජය සතුආයතන වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ද රජය සතු සමාගම් වූ ස්වාධීන රූපවාහිනී සේවය (ITN) හා එහි අනුබද්ධ ආයතන ද සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස් ආයතනය) දඡන්ද විමසීම් කාලසීමාව තුළ පමණක් නොව අන්කාල සීමාව තුළ ද ආණ්ඩු පක්ෂයේ ආයතන ලෙස නොව රාජ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කරනු ලැබීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අත්‍යාවශ්‍ය බවට ප්‍රකාශිත මතය සමඟ මම ද පූර්ණ වශයෙන්ම එකඟවෙමි. ඒ වෙනුවෙන් සෑම විටම පෙනී සිටිමි.

- ඇතැම් අමාත්‍යාංශ ලේකම්වරුන් හා ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රධානීන් දේශපාලන ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම, ඔවුන් පක්ෂ/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමට නැතහොත් අගතියට පත් කිරීමට හේතු වන ආකාරයේ ප්‍රකාශ සිදු කිරීම යනාදිය නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඉමහත් බාධාවකි. "අමාත්‍යාංශ ලේකම්වරුන් අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන පිරිසක් හෙයින් ඔවුන් දේශපාලන අයිතිවාසිකම් හිමි පිරිසක් වේ."යන අදහස සමහර දේශපාලනඥයින් විසින් ප්‍රකාශ කර තිබීම නිසා සහ සෘජුවම දේශපාලනය හා සම්බන්ධ පුද්ගලයින් අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස පත් කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බව පෙනී යයි. එබැවින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමටමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්මට බාධා වන ආකාරයේ ක්‍රියා සිදුවීම වැලැක්වීම පිණිස අමාත්‍යාංශ ලේකම්වරුන් දේශපාලන කටයුතුවලින් සම්පූර්ණයෙන්ම දුරස්වී සිටිය යුතු බවට නියම පැන වීම හා අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස දේශපාලන ක්‍රියාකාරකම් හා නොබැඳි නිලධාරීන්/ විශේෂඥයින් පත් කිරීමට උපරිම උත්සාහ දැරීම මැනවි යැයි ද කාරුණිකව පෙන්වා දෙනු කැමැත්තෙමි.

- ඡන්ද විමසීම් හා බැඳි නීති රීති සංශෝධනය කරන්නේ නම් එසේ කළ යුත්තේ අදාළ සියලුම පාර්ශ්වවල අදහස් විමසීමක් හරහා සිදු කරනු ලබන පුළුල් සංවාදයකින් බවත් එවැනි භාර දුර

කටයුත්තක් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් ඉතා කෙටිකාලසීමාවක් තුළ සිදු කිරීම ප්‍රඥාගෝචර නොවන බවත් කාරුණිකව පෙන්වා දෙනු රිසියෙමි.

2015 ජනවාරි 08 දින පවත්වනු ලැබූ ජනාධිපතිවරණය නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීමට සහාය වූ සැමට නැවතත් ස්තුතිවන්ත වෙමින් එහි ගෞරවය ඒ සඳහා දායක වූ සැමට හිමි විය යුතු බවත් යම් සුළු හෝ අතපසුවීමක් හෝ ප්‍රමාද දෝෂයක් වී ඇත්නම් එහි වගකීම මා විසින් භාර ගනු ලබන බවත් ප්‍රකාශ කරමින් මෙම සටහන මෙයින් සමාප්ත කරමි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම්කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2015.01.12

පසු සටහන :

සැලකිය යුතු කාලයක් තිස්සේ මැතිවරණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ නිරත වූ යතුරු පැදි ධාවක පොලිස් කොස්තාපල් ජී.ඩබ්.අයි.කේ. ප්‍රනාන්දු මහතා පශ්චාත් ඡන්ද විමසීම් රාජකාරි සඳහා වූ නිල ගමනක යෙදෙන අතරතුර, හදිසි අනතුරකට ලක්වී ජීවිතක්ෂයට පත් වීම පිළිබඳ මාගේ සානිශය සංවේගය මෙහි සටහන් කරමි.